සිළුමිණ
The Silumina

- ආරම්භය - 1930 මාර්තු 30
- 92 වැනි කාණ්ඩය 13 වැනි පත්‍රය
- ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී
- ශ්‍රී බුධ වර්ෂ 2564ක් වූ මීන රවි 14 භාග මැදින් පුර පසළොස්වක ඉරිදා
- වර්ෂ 2021ක් වූ මාර්තු මස 28 වැනි ඉරිදා

සිළුමිණට මාර්තු 30දාට වසර 91යි

අද පත්‍රය පිටු 112 | මිල රුපියල් 80.00

කැගල්ලේ පාසලකට ශ්‍රමය දෙන්න ගිය පියා පෙට්ටියෙන් ගෙදර එයි

09 ▸▸

පස්සර බේදවාචකයේ තුවාලකරුවන් සොයා ගිය ගමන

16 ▸▸

පැණි ධම්මික වෙදමහත්තයා බංකොලොත් වෙලාද

24 ▸▸

භාග්‍ය නොදන්න සිංහරාජය

25 ▸▸

ග්‍රාම නිලධාරීන්ට

පරිසර බලතල

ප්‍රාදේශීය ලේකම් සහ සහකාර ප්‍රා.ලේකම්ටත් උපරිම බලතල

වසර 20කට පසු පරිසර පනතට සංශෝධන 42ක්

(නිහාල් පී. අබේසිංහ)

මෙරට සිදුවන පාරිසරික විනාශයන් වැළැක්වීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරුන් සහ සහකාර ප්‍රාදේශීය ලේකම්වරු 662 දෙනකුට හා 14,022ක් වන ග්‍රාම නිලධාරීන්ට 'විශේෂ පරිසර නිලධාරී' බලතල ලබා දෙමින් ජාතික පාරිසරික පනතට වසර විස්සකට පසු සංශෝධන 42 ක් එක් කිරීමට පරිසර අමාත්‍යාංශය කටයුතු අරඹා තිබේ.

මේ පිළිබඳව කරුණු දක්වන පරිසර ඇමැති මහින්ද අමරවීර මහතා 'සිළුමිණ' ට පැවසුයේ දැනට වසර විස්සක් පැරණි ජාතික පාරිසරික පනත යටතේ පවතින බලතල පාරිසරික සුරක්ෂිතතාව උදෙසා ප්‍රමාණවත් නොවන බැවින් එම පනත සංශෝධනය කර ඊට ශක්තිමත් නෛතික බලයක් ලැබෙන පරිදි අලුත් වගන්ති 42 ක් එක් කිරීමට තීරණය කළ බවයි.

විශේෂයෙන් පරිසරයට හානි කරන පුද්ගලයන්ට දැඩි දඬුවම් ලබාදිය හැකිවන පරිදි හා දැනට ඇති දඩ ප්‍රමාණය 200% ක් දක්වා වැඩිවන පරිදි තිබෙන වගන්ති සංශෝධනය කරන අතර පරිසර දූෂණය වැළැක්වීමට අදාළ අලුත් වගන්ති ගණනාවක් ද පනත සඳහා එක් කෙරේ.

ආසන 10ට වැඩි නම් මඟී ප්‍රවාහන බලපත්‍රයක්

(තාරක වික්‍රමසේකර)

ආසන 10ට වඩා මඟීන් ප්‍රවාහනය කරනු ලබන සියලුම වෑන් රථ, බස් රථ ඇතුළු මෝටර් වාහන සඳහා අනිවාර්යෙන්ම මඟී ප්‍රවාහන බලපත්‍රයක් ලබා ගත යුතු බවට තීරණය කර ඇතැයි වාහන නියාමනය, බස් රථ ප්‍රවාහන සේවා හා දුම්රිය මැදිරි හා මෝටර් රථ කර්මාන්ත රාජ්‍ය අමාත්‍ය දිලුම් අමුණුගම සිළුමිණට කීය. 7 වැනි පිටුවට

සිසුන් කොටස් වශයෙන් පාසලට

(සුභාෂිණී ජයරත්න)

මාර්තු 29 සඳුදා සිට ලංකාවේ 10,165ක් වන සියලු පාසල් විවෘත වන අතර, පුද්ගල දූරස්ථභාවය ආරක්ෂා වන පරිදි පන්ති පැවැත්විය යුතු ආකාරය පිළිබඳ මාර්ගෝපදේශ සටහනක් ද අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කොට ඇත. 2021 වර්ෂය සඳහා බස්නාහිර පළාතේ පිහිටි රජයේ පාසල් හා රජයේ 7 වැනි පිටුවට

'ලූසී' ඇතින්නගේ හිමිකම් කඩවීම ගැන කැනඩා රජයට විරෝධය

මානව හිමිකම් කඩවීම පිළිබඳව ශ්‍රී ලංකාවට එරෙහිව චෝදනා නඟන රටවල් අතර කැනඩාවද මුල් තැනක් ගනී. එය එසේ වුවද වසර 44ක් තිස්සේ කුඩා බිම්කඩක හිර කරගෙන සිටින වයස අවුරුදු දෙකේදී ශ්‍රී ලංකාවේ සිට කැනඩාවට ගෙන ගිය ලූසී ඇතින්න කැනඩාවේ එඩ්මන්ඩ්ටන් සත්වෝද්‍යානයේ අඳුටත් අපා දුක් විඳියි. ලූසී ඇතින්න එම රැඳවුමෙන් නිදහස් කර වෙනත් නිදහස් අලි රැඳවුමකට යොමු කරන ලෙස ඉල්ලා කැනඩා රජයට බලකරමින් පැවැති ශ්‍රී ලාංකික සත්ත්වවේදීන්ගේ විරෝධතාවක් මාර්තු 26 සිකුරාදා පස්වරුවේ ශ්‍රී ලංකාවේ කැනඩා මහ කොමසාරිස් කාර්යාලය ඉදිරිපිටදී පැවැත්වුණි. මේ එහි එක් අවස්ථාවකි. විරෝධතාකරුවන් පසුව ලූසී ඇතින්න වෙනුවෙන් සිය ඉල්ලීම් ඇතුළත් ලිපියක් කැනේඩියානු අගමැතිට බාරදීම සඳහා කැනේඩියානු මහ කොමසාරිස් කාර්යාලයට බාර දෙනු ලැබිය. (ජායාරූපය- දුෂ්මන්ත මායාදුන්නෙ)

පිලිප් ගුණ සැමරේ

ලාංකීය සමාජවාදී ව්‍යාපාරයේ නිර්මාතෘ පිලිප් ගුණවර්ධනයන්ගේ 49 වන ගුණ සැමරුම මාර්තු 27 වැනිදාට යෙදේ. ඒ නිමිත්තෙන් ගුණසමරු උත්සවයක් එදින කොළඹ 07 පදනම් ආයතනයේදී පැවැත්වේ. ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කුලපති ආචාර්ය ඉත්තෑපාන ධම්මාලංකාර මහ නා හිමියෝ එහි මුලසුන හොබවති.

ඇමැති ඩලස්ගෙන් 'දැයට එළිය' සූර්ය විදුලි බලාගාර 7,000ක්

(නිහාල් පී. අබේසිංහ)

ඉදිරි වසර තුන ඇතුළත දීප ව්‍යාප්තව සූර්ය විදුලි බලාගාර 7,000 ක් ස්ථාපිත කර ජාතික විදුලිබල පද්ධතියට මෙගා වොට් 700 ක් ලබාදෙන 'ගමට බලාගාරයක්' වැඩසටහන දැන් අරඹා ඇති බව විදුලිබල ඇමැති ඩලස් අලහප්පෙරුම සිළුමිණ ට පැවසීය.

මේ මඟින් සෑම ගමකටම සූර්ය බලාගාරයක් ලැබෙන බවත්, රටේ නව ව්‍යවසායකයන් 7,000 කට ආයෝජන අවස්ථා මෙන් ම තවත් පුද්ගලයන් 10,000කට පමණ රැකියා අවස්ථා ද ලබාදීමට නියමිත බවත් මේ යටතේ සූර්ය බලාගාර 880 ක් දැනටම ආරම්භ කර ඇති බවත් ඇමැතිවරයා කීවේය.

දැයට එළිය සමඟ ගමට බලය ලබාදෙන මේ නව වැඩපිළිවෙළ, ජනාධිපති ගෝඨාභය රාජපක්ෂයන්ගේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රකාර වසර 2030 වනවිට 7 වැනි පිටුවට

කොරෝනා යළි යාපනයේ හිස ඔසවයි

(තාරක වික්‍රමසේකර)

යාපනයේ කොරෝනා රෝගීන් 77කට අධික සංඛ්‍යාවක් හමුවීම නිසා ප්‍රදේශ කිහිපයක් හුදකලා කිරීමටත් යාපනය පොදු වෙළෙඳ පොළ ආශ්‍රිත වෙළෙඳ සල් රැසක් තාවකාලිකව වසා දැමීමටත් යාපනය මහ නගර සභාව තීරණය කර තිබේ. යාපනය නගරාධිපතිවරයාටද කොවිඩ් 19 වැළැඳී ඇති බවට මේ වන විට සෞඛ්‍ය අංශ විසින් අනාවරණය කරගෙන තිබේ. 7 වැනි පිටුවට

කුරගල චෛත්‍යයට ඉරිදා මුල් ගල

බළන්ගොඩ කුරගල කඳු මුදුනේ ඉදි වන අඩි 100ක උසකින් යුක්ත 'අස දිසි ශාක්‍ය සුගත මහා සෑය' ඉදි කිරීමේ මුල්ගල් තැබීමේ 'විශේෂ මෞලි මංගල්‍යය' 28 වැනිදා මැදින් පුන් පොහෝ දින පස්වරු 4.00ට සිදු කෙරේ.

නෙල්ලිගල හාමුදුරුවන් විසින් සිදු කෙරෙන මේ පින්කම් මාලාවට මුද්‍රිත මාධ්‍ය දායකත්වය ලබා දෙනුයේ ලේක්හවුස් ආයතනය මඟිනි.

• තිරිකුණාමලේ ආනන්ද මහ නාහිමි



උතුරුතර මහ නා සමිඳු සඳ

අතිපූජ්‍ය කොටුගොඩ ධම්මාවාස මහ නාහිම්පාණෝ

හෙළ දිව සසුන'ඔරෙහි දවහත් තරුවක් ලෙසින් ද, විටෙක සුපුන් සඳ මඬලක් සෙයින් ද වොරුළුණු ශ්‍රී ලංකා අමරපුර මහානිකායයේ උත්තරීතර මහානායක පදවිය හොබවූ අග්ගමහාපණ්ඩිත අතිපූජ්‍ය කොටුගොඩ ධම්මාවාස සංඝනේතෘවරයාණෝ පසුගිය 25 වැනිදා, කොළඹ නිදහස් චතුරස්‍රයෙහි දී ස්වකීය ශෝභාවත් රූපකායෙන් මිදී සදහට ම දැයෙන් සමුගත්තෝ ය.

ගම්පහ දිස්ත්‍රික්කයේ මිනුවන්ගොඩ මැනිවරණ බල ප්‍රදේශයට අයත් කොටුගොඩ නම් වූ මනරම් ගම් පියසෙහි පසු කලෙක දහම් කොටු ගෙයකට වාසනා ගුණ රැගෙන ආ පින්වත් කුල කුමරෙක් මෙ ලොව එළිය දුටුයේ 1933 ජනවාරි 26 වැනිදා ය. නමින් 'සිරිමෙවන්' නම් වූ මේ කුල දරුවා ගේ මවුපියන් වූවාහු ඇඳවිතාරණගේ සෙලෙස්තිනා රුද්‍රිගෝ - ඇඳවිතාරණගේ හරමානිස් රුද්‍රිගෝ යන දම්පතීහු ය.

එම ගම් පියසට සබඳකම් ඇති ව වැඩ විසූ අතිගරු මිහිරිපැන්නේ ජෝතිපාල නාහිමිපාණන් වහන්සේ ගේ ද, අතිගරු කොටුගොඩ විමලරතන නාහිමිපාණන් වහන්සේ ගේ ද මෙහෙයවීම මත ගල්කිස්සේ ධර්මපාලාරාමාධිපති ව වැඩ විසූ අතිගරු උණවටුනේ ධම්මපාල මාහිමියන් ගේ හෙවණට "සිරිමෙවන්" නව යොවුන් දරුවා පමුණුවන ලද්දේ පෙර කළ පින් මහිමයක එල දීමක් වශයෙනි. 1948 අගෝස්තු මස 17 වැනිදා උතුම් පැවිදි දිවියට "කොටුගොඩ ධම්මාවාස" නමින් සිරිමෙවන් දරුවා හෙරණ පැවිද්ද ලබන්නේ යට කී උණවටුනේ ධම්මපාල මාහිමියන් ගේ ආචාර්යත්වයෙනි.

පැවිදි දිවියට ඇවැසි මූලික බණ දහම් හා වත පිළිවෙත සිය ගුරු හිමියන්ගෙන් ද ශතක පොත් සියල්ල ම කටපාඩමින් දැන සිටි කොටුගොඩ පේමානන්ද නාහිමියන්ගෙන් ද ලද මේ හෙරණපාණන් 1954 ජූලි 10 වැනි දින කළුගං දිය වට සීමා මාලකයෙහි දී උපසම්පදා භාවය ලබන්නේ අතිපූජ්‍ය බේරුවල සිරිනිවාස මහ නාහිමිපාණන් උපාධ්‍යාය කොටගෙන ය. ප්‍රාචීන පාණ්ඩිත්‍යයෙන් සුදීප්ත වූ අම්බලන්ගොඩ ධම්මකුසල, මොරටුවේ සාසනරතන, මොරටුවේ පේමරතන යන මහා යතීන්ද්‍රයන් වහන්සේ උන් වහන්සේට කර්මවාගාචාර්යවරු වූහ.

තරුණ ධම්මාවාස හිමියෝ රත්මලානේ පරමධම්ම චේතිය පිරුවනින් ප්‍රථම අධ්‍යාපනය ලද පසු කොළඹ මාලිගාකන්දේ විදුදය පිරුවනින් ද්විතීයික අධ්‍යාපනය ලැබූහ. තව ද ධර්මදූත පුනුණුව ඇතුළු ව ඉංග්‍රීසි නිපුණතාව අතිරේක ඉගැනුමක් ලෙස ප්‍රගුණ කෙළේ කොළඹ මරදානේ පධානඝර විහාර අභ්‍යාස ආයතනයෙනි. මේ තුන් තැන්හි දී වැලිවිටියේ සෝරත, කළුකොඳයාවේ පඤ්ඤාසේඛර, පලන්නොරුවේ විමලධම්ම, කරඳන පඤ්ඤාලංකාර, වලානේ සටධිස්සර, යටිපව්වේ මේධානන්ද, මාහෝ සුමේධ, පරවාහැර වජිරඤාණ, පරවාහැර පඤ්ඤානන්ද, වජිරාරාමාධිපති නාරද ආදී සම්භාවනීය වියත් මහ තෙරුන් වහන්සේලා ඇසුරෙහි ධර්ම ශාස්ත්‍රෝද්ග්‍රහණය කළ දහම්වස් හිමියනට එමගින් ලැබුණු ශාස්ත්‍රීය පන්නරයත් ධර්ම අභ්‍යාසයත් පණ්ඩිත සේවනයත් සිය පසු අවදියෙහි ජීවිතය ආලෝකවත් කැර ගැනීමට බෙහෙවින් ම උපස්තම්භක වූ බව උන් වහන්සේ ම ප්‍රකාශ කැර ඇත.

කොටුගොඩ නාහිමියන් ගේ ගුණ කථෝපකථනයෙහි ලා මූලික ව සඳහන් වන කරුණක් නම් උන් වහන්සේ මෙරට දම් දෙසුම් ආරේ ඇති කළ නව දේශනා ශෛලිය යි. පැළෑණේ සිරි වජිරඤාණ, හීනටියන ධම්මාලෝක, නාරද, මඩිහේ පඤ්ඤාසීහ, පියදස්සි, හේන්පිටගෙදර ඤාණසීහ, හෙණ්ඩියගල සීලරතන, කොටිකාවත්තේ සද්ධාතිස්ස, නාඋයනේ අරියධම්ම, කටුකුරුන්දේ ඤාණානන්ද ආදී ප්‍රකට ධර්මධර මහා යතීන්ද්‍රයන් වහන්සේලාගෙන් ශෝභමාන වූ නූතන ලාංකේය දේශනා සම්ප්‍රදාය තුළ මතු වන විශිෂ්ටාදර්ශයක් ලෙස කොටුගොඩ මහ නාහිමියෝ සම්භාවනයට පාත්‍ර වෙති.

> **"අන්‍ය නිකායික මහ තෙරවරුන් ගේ ද අන්‍යාගමික ප්‍රධානීන් ගේද ප්‍රසාදය එකහෙළා දිනගැනීමට උන් වහන්සේ සමත් වූයේ ශාසනය, දේශය හා සමාජය පිළිබඳ ව පැවැති නිරහංකාර, අව්‍යාජ, අපක්ෂපාතී ආකල්ප නිසා ය."**

ධර්ම දේශනයෙහි අරමුණ හොඳින් දැන හැඳින, ශ්‍රාවක ජනතාව සද්ධර්ම මාර්ගයට අනුගත කරවීමේ කරුණාධ්‍යාශයෙන් යුතු ව, අත්තුක්කංසන හා පරවම්භන දුගුණයන් ගෙන් බැහැර ව බුද්ධ භාෂිතයෙන් ම ධර්මාසනය හොබවමින්, ඉතා සරල ව, මෘදු මොළොක් ස්වරයෙන් එහෙත්, හදවතට කිඳා බසින අයුරින්, එසේ ම ධර්මය පුද්ගලයා ගේ ජීවන අත්දැකීමක් වන අයුරින් උන් වහන්සේ සිදු කළ සද්ධර්ම දේශනය වර්තමානයේ කාලීන බණ දෙසුම් පවත්වන තරුණ ධර්ම කථිකයනට ද ආදර්ශ සපයන්නකි. කොටුගොඩ මාහිමියන් ගේ බණ දෙසුම් ආර උන් වහන්සේට ම අනන්‍ය වූවකි. එය අසන්නන් ගේ සිත් තුළ සැදැහැ - බැති සිතිවිලි උතුරුවන්නකි. උගත් - නුගත් හැම දෙනාට ම ප්‍රසාදකර වූවකි.

අමරපුර මහානිකායයේ අමරපුර පාර්ශ්වයේ සංඝනේතෘවරයාණ කෙනකුන් වූ කොටුගොඩ නාහිමියන් පියවරින් පියවර එම නිකායයේ මුඳුනට ම පැමිණියේ සංඝ ප්‍රසාදය ඉහළින් ම දිනාගත් නිසා ය. එ ලෙසින් ම ශ්‍රී ලංකා අමරපුර මහානිකායයේ ද අභිවෘද්ධියට මහත් කැප වීමෙන් ක්‍රියා කිරීමෙන් දිනාගත් සමස්ත සංඝ ගෞරවය නිසා එහි උත්තරීතර මහානායක පදවියට පත් වන්නට උන් වහන්සේට හැකි විය. එ මතු නොව, අන්‍ය නිකායික මහ තෙරවරුන් ගේ ද අන්‍යාගමික ප්‍රධානීන් ගේද ප්‍රසාදය එකහෙළා දිනගැනීමට උන් වහන්සේ සමත් වූයේ ශාසනය, දේශය හා සමාජය පිළිබඳ ව පැවැති නිරහංකාර, අව්‍යාජ, අපක්ෂපාතී ආකල්ප නිසා ය. පක්ෂ දේශපාලනයට ගොදුරු නොවුණු අදේශපාලනික චරිතයක් වූ හෙයින් සියලු දේශපාලනිකයෝ උන් වහන්සේ ගේ ඇසුරත් උපදේශත් අභිශයින් ප්‍රිය කළහ.

තමා ඉහළට ඔසොවාගෙන කතා කරන අත්තුක්කංසනයත් අනුන් තළා පෙළා හෙළන පරවම්භනයත් කොටුගොඩ මාහිමියන් ගේ සිරිත තුළ අප කිසි දිනෙක දුටුවේ නැත. ඇතැම් තීරණවල දී දෝෂාරෝපණ නැගෙන අවස්ථාවක දී වුව ද සිනා මුසු මුහුණින් ඒවාට ඇහුම්කන් දීම උන් වහන්සේගේ උපේක්ෂා ගුණය හෙළි කරන්නකි. සංඝ සභාවේ මුඳුනට ම පැමිණිය ද විවිධ තනතුරු ගෞරව නාම ලැබුණ ද උන් වහන්සේ ගේ අපිස් පැවැත්මත් අනතිමානී කමත් ඒවායින් තවත් ඔපවත් කැරුණේ ය. කුඩා දරුවකුට, හෙරණ නමකට වුව ද දක්වන කරුණා සිනහවත් ඉහළ තනතුරෙක සිටින කෙනකුට දක්වන සිනහවත් එක සමාන විය.

කොටුගොඩ ධම්මාවාස මහ නාහිමියන්ගේ මෙයෙවීමෙන් සිදු කළ තවත් උත්තරීතර සේවාවක් මෙහි දී සිහිපත් කළ යුතුමය. ශ්‍රී ලංකා අමරපුර මහා නිකායත් ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකාය ඒකාබද්ධ කරමින් "ශ්‍රී ලංකා අමරපුර රාමඤ්ඤ සාමග්‍රී මහා සංඝ සභාව" පිහිටුවීමට උන් වහන්සේ මූලිකව කටයුතු කළ සේක. ඒ එවකට රාමඤ්ඤ නිකායේ මහ නායක ධුරන්දර නාපාන පේමසිරි මහ නාහිමියන් සමඟ අදාළ කටයුතු මෙහෙයවීමෙනි.

මෙ රට තුළ හැම පුරවැසියකුට ම හැම ආගමිකයකුට ම ඔවුන් ගේ ජාතික හා ආගමික අනන්‍යතාවන් දේශීය හා විජාතික විවිධ අන්තවාදයන්ගෙන් විනාශ නොවී සුරැකෙන

ශ්‍රී ලංකා අමරපුර මහා නිකායත් ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකාය ඒකාබද්ධ වෙමින් "ශ්‍රී ලංකා අමරපුර රාමඤ්ඤ සාමග්‍රී මහා සංඝ සභාව" පිහිටුවනු ලැබූ අවස්ථාවේදී රාමඤ්ඤ නිකායේ මහ නායක නාපාන පේමසිරි මහ නාහිමියන් සහ අමරපුර මහා සංඝ සභාවේ උත්තරීතර මහ නායක කොටුගොඩ ධම්මාවාස මහ නා හිමියන් අදාළ සන්නස් පත්‍ර හුවමාරු කර ගත් අවස්ථාව මෙහි දැක්වේ.

සමත් වූයේ ශාසනය, දේශය හා සමාජය පිළිබඳ ව පැවැති නිරහංකාර, අව්‍යාජ, අපක්ෂපාතී ආකල්ප නිසා ය. පක්ෂ දේශපාලනයට ගොදුරු නොවුණු අදේශපාලනික චරිතයක් වූ හෙයින් සියලු දේශපාලනිකයෝ උන් වහන්සේ ගේ ඇසුරත් උපදේශත් අභිශයින් ප්‍රිය කළහ.

තමා ඉහළට ඔසොවාගෙන කතා කරන අත්තුක්කංසනයත් අනුන් තළා පෙළා හෙළන පරවම්භනයත් කොටුගොඩ මාහිමියන් ගේ සිරිත තුළ අප කිසි දිනෙක දුටුවේ නැත. ඇතැම් තීරණවල දී දෝෂාරෝපණ නැගෙන අවස්ථාවක දී වුව ද සිනා මුසු මුහුණින් ඒවාට ඇහුම්කන් දීම උන් වහන්සේගේ උපේක්ෂා ගුණය හෙළි කරන්නකි. සංඝ සභාවේ මුඳුනට ම පැමිණිය ද විවිධ තනතුරු ගෞරව නාම ලැබුණ ද උන් වහන්සේ ගේ අපිස් පැවැත්මත් අනතිමානී කමත් ඒවායින් තවත් ඔපවත් කැරුණේ ය. කුඩා දරුවකුට, හෙරණ නමකට වුව ද දක්වන කරුණා සිනහවත් ඉහළ තනතුරෙක සිටින කෙනකුට දක්වන සිනහවත් එක සමාන විය.

කොටුගොඩ ධම්මාවාස මහ නාහිමියන්ගේ මෙයෙවීමෙන් සිදු කළ තවත් උත්තරීතර සේවාවක් මෙහි දී සිහිපත් කළ යුතුමය. ශ්‍රී ලංකා අමරපුර මහා නිකායත් ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකාය ඒකාබද්ධ කරමින් "ශ්‍රී ලංකා අමරපුර රාමඤ්ඤ සාමග්‍රී මහා සංඝ සභාව" පිහිටුවීමට උන් වහන්සේ මූලිකව කටයුතු කළ සේක. ඒ එවකට රාමඤ්ඤ නිකායේ මහ නායක ධුරන්දර නාපාන පේමසිරි මහ නාහිමියන් සමඟ අදාළ කටයුතු මෙහෙයවීමෙනි.

මෙ රට තුළ හැම පුරවැසියකුට ම හැම ආගමිකයකුට ම ඔවුන් ගේ ජාතික හා ආගමික අනන්‍යතාවන් දේශීය හා විජාතික විවිධ අන්තවාදයන්ගෙන් විනාශ නොවී සුරැකෙන අයුරින් නිදහස් ව නොවහල් ව සාමකාමී ව සුහද වාසයක් ඇති කැර ගැනීමටත් දුප්පත්කම, විරැකියාව ආදි දැවෙන ගැටලු නිරවුල් වී රටට ගැළැපෙන ධරණීය සංවර්ධනයක් ඇති කර ගැනීමටත් ධර්මතාන්ත්‍රික සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් උදා කැරගැනීමටත් අවංක වූ අධ්‍යාශයෙන් මහනීය ශාසනික හා සමාජීය සේවාවක් සිදු කළ අග්ගමහාපණ්ඩිත අතිපූජ්‍ය කොටුගොඩ ධම්මාවාස මහනා සමිඳුන්ට ජාතිය විසින් කළ හැකි අත්‍යුදාර ප්‍රත්‍යුපහාර පූජාව වන්නේ රට වෙනුවෙන් රටේ සංස්කෘතික උරුමය වෙනුවෙන් එසේම පොදුවේ සමස්ත මානව වර්ගයා වෙනුවෙන් පෞද්ගලිකව තමතමන්ට කළ හැකි කුදු මහත් කාර්ය භාරය නො පිරිහෙළා ඉටු කිරීමට ස්වකීය හෘදය සාක්ෂිය සමඟ ගිවිස ගැනීම බව අවසන් වශයෙන් මෙහි ලා සඳහන් කරනුයේ අපවත් වී වදාළ උතුරුතර මහ නා හිමිපාණන්ට ඊට වැඩියෙන් කළ හැකි අනෙක් ගෞරවයක් නැති හෙයිනි.

brandix®
inspired solutions

ජීවයේ උල්පත ජලයයි

ජලය යනු ජීවයයි. එබැවින් ජල සම්පතේ වටිනාකම ඇගයීම යනු මිනිතලයේ ජීවය ඇගයීමයි. ජලය, බ්‍රැන්ඩික්ස් අපගේ සමාජ සත්කාරයේ ප්‍රමුඛත ම සාධකයක් වී ඇත්තේ එබැවිනි. නිබඳ යහපත් අරමුණු පෙරදැරිව, මිනිසාට පිරිසිදු සහ සුරක්ෂිත පානීය ජලය හිමිකර ගැනීමට ඇති හැකියාවට වඩා ලොව වෙනත් වැදගත් යමක් නැති තරම් යන්න අවබෝධයෙන් යුතුව කටයුතු කරන්නෙමු.

වෙනස ඇරඹෙන්නේ අප තුළින්මය යන විශ්වාසයෙන් ඉදිරියට ගමන් කරන අපි, සෑම ක්‍රියාවකදී මෙන් අපගේම පිබිදුනු මානව සම්පත හා අප ජීවත්වන, මෙහෙයුම් කටයුතු සිදුකරන සමාජ තුලින් ජලයට නිසි වටිනාකම් ලබා දීමේ මෙහෙවර ආරම්භ කළෙමු.

අනුෂා අලස්

ප්‍රධානි -
සමාජ සත්කාර අංශය

බ්‍රැන්ඩික්ස් සහ ජලය අතර පවතින සබඳතාව

අපගේ ව්‍යාපාරික මෙහෙයුම් කටයුතු වර්ධනය වන විට අප භාවිත කරන ජල ප්‍රමාණය ද ඉහළ යන බව අපි දනිමු. ජලය අපතේ යාම මුළුමනින් ම නතර කිරීමේ ප්‍රයත්නයට සමගාමීව අපි ජල පරිභෝජනය අවම කිරීම, ජල කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සහ අපජලයේ ගුණාත්මක බව වර්ධනය කිරීම සඳහා නව තාක්ෂණය සහ යටිතල පහසුකම් හඳුන්වා දීම වෙනුවෙන් අබණ්ඩව ආයෝජන සිදු කරමු. වැසිජල ගොවිතැන ආදී ව්‍යාපෘති මෙන්ම ජල උපාංග නවීකරණය කිරීම හරහා ජලය ලීටර මිලියන 300 ක් ඉතිරිකර ගැනීමට බ්‍රැන්ඩික්ස් අපට හැකි වී ඇත.

මෙහෙවරට දියවර වැඩසටහන

බ්‍රැන්ඩික්ස් පවුලේ සාමාජිකයෝ විවිධ සමාජ මට්ටම් නියෝජනය කරති. අපගේ 'පිබිදුනු විසඳුම්' පිරිනැමීම සඳහා වෙහෙසෙන 35,000 කට අධික සාමාජික-සාමාජිකාවන් පිරිස අතරින් බහුතරයක් දෙනා, ජල හිඟය නමැති දුෂ්කර යතාර්ථය රජයන ප්‍රදේශය වලට අයත් වූවෝ වෙති.

මෙහෙවරට දියවර යනු, සුරක්ෂිත සහ පිරිසිදු ජලය දුර්ලභ සම්පතක් බවට පත්ව ඇති ප්‍රදේශවල සිට සේවයට වාර්තා කරන සාමාජික-සාමාජිකාවන් දෙනිකව මුහුණ දෙන එම යතාර්ථය වෙනස් කිරීම සඳහා අප ගන්නා උත්සාහයයි. 2006 වසරේ සිට අපගේ ප්‍රජා සත්කාරක මෙහෙවරේ ප්‍රමුඛත ම අංගය බවට පත්ව ඇති එම වැඩසටහන, අපගේ පිබිදුනු සාමාජිකයන් ජීවත්වන අඩු වර්ප්‍රසාදලාභී ප්‍රදේශ සඳහා පිරිසිදු ජලය ලබා දීම වෙනුවෙන් කැපවී සිටී.

වර්තමානයවන විට, බ්‍රැන්ඩික්ස් අපගේ මෙහෙවරට දියවර වැඩසටහන දියත් කරමින් දිවයින පුරා 5,000 කට ආසන්න ප්‍රජාවකට සුරක්ෂිත සහ පිරිසිදු ජලය හිමිකර ගැනීමේ අවස්ථාව උදා කිරීමට අපට හැකි වී ඇති බව සිහිපත් කරන්නේ හදපිරි සතුටිනි.

ආදර්ශ ගම්මාන ව්‍යාපෘතිය

අතීතයේ පැවති 'ගමයි, පන්සලයි-වැවයි, කෙතයි' යන සංස්කෘතිමය සම්බන්ධය අනුව පන්සලත්, පාසලත්, වැවත් කේන්ද්‍රකර ගත් බ්‍රැන්ඩික්ස් ආදර්ශ ගම්මාන ව්‍යාපෘතිය, බ්‍රැන්ඩික්ස් කර්මාන්තශාලාවක කිලෝමීටර් 5ත් 10ත් අතර වපසරියක ජීවත්වන ජනතාවගේ ජල සහ සනීපාරක්ෂක අවශ්‍යතා විසඳීම ඉලක්ක කර ගනිමින් දියත් කෙරේ. 2015 වසරේදී ආරම්භ කරන ලද එම ව්‍යාපෘතිය හරහා නිවෙස්වලට මෙන්ම පාසල්, රෝහල්, ආගමික ස්ථාන සහ ප්‍රජා ගොඩනැගිලි ආදී පොදු ස්ථානවලට ද බාධාවකින් තොර ජල සැපයුමක් පිරිනැමීමට අපට හැකි වී ඇත.

වර්තමානයවන විට බ්‍රැන්ඩික්ස් අපි දිවයින පුරා ආදර්ශ ගම්මාන ව්‍යාපෘති 340 කට ආසන්නව සම්පූර්ණ කර ඇත්තෙමු. පොළොන්නරුවේ සිට කටුනායක දක්වාත්, සීදුවේ සිට මඩකලපුව දක්වාත්, කහවත්ත, කොග්ගල සහ වැලිසර ඇතුළු ප්‍රදේශ රැසක ජීවත්වන අපගේ ම සහෝදර ජනතාව වෙනුවෙන් පිරිසිදු ජලය හිමිකර දෙමින් අපගේ සාමාජික-සාමාජිකාවන්ගේත් ඔවුන්ගේ ප්‍රජාවගේත් ජීවන තත්ත්වය උසස් කිරීමට අපට හැකි වී ඇත.

ආයතනයේ සමාජ සත්කාර වැඩපිළිවෙත් ගැන වැඩි විස්තර සඳහා www.brandix.com වෙත පිවිසෙන්න

රු. බිලියන 35කට
අධික ආයෝජනයක්

ශ්‍රී ලාංකේය ටයිල් කර්මාන්තය

දේශීය ආර්ථිකය බල ගන්වන සවිය

වසර 3ක්
මුළුල්ලේ
ස්ථාවර මිලක්

රු. බිලියන 6කට
අධික වාර්ෂික
බදු ගෙවීම්

රටවල් 20කට
අධික ප්‍රමාණයක්
සඳහා අපනයනය

මිල ගණන්
වර්ග අඩියට
රු. 131න්
ආරම්භ වේ

ශ්‍රී ලංකා ටයිල් කර්මාන්තය රොසෙල්, ලංකා ටයිල්ස් සහ මැක්ටයිල්ස් නම් වූ ප්‍රධාන සන්නාම තුනකින් සමන්විත වන අතර වර්ග අඩි මිලියන 220කට වැඩි ටයිල් නිෂ්පාදනය කිරීමේ සාමූහික වාර්ෂික ධාරිතාවකින් සමන්විත වේ. දශක 4කට අධික කාලයක් මුළුල්ලේ ජාතික ආර්ථිකයේ දියුණුවට සැලකිය යුතු දායකත්වයක් ලබා දීමට මෙම සන්නාම කටයුතු කරන ලදී.

- ශ්‍රී ලාංකිකයන් 27,500කට අධික පිරිසක් වෙනුවෙන් රැකියා අවස්ථා
- ඉහළ යන පිරිවැය සහ දැඩි ආර්ථික තත්ත්වයන් මධ්‍යයේ වුවද පසුගිය වසර 3 තුළ කිසිදු මිල වැඩි කිරීමක් සිදු කර නොමැත. (මිල - වර්ග අඩියට රු.131/- සිට)
- වාර්ෂිකව රු. බිලියන 6කට අධික රජයේ බදු ගෙවමින් සිදු කළ රු. බිලියන 35කට අධික ආයෝජනය
- රටවල් 20කට අධික ප්‍රමාණයකට උසස්ම ප්‍රමිතියේ ටයිල් අපනයනය කරමින් වටිනා විදේශ විනිමය මෙරට ට උපයා දීම
- දිවයින පුරා ක්‍රියාත්මක වූ විවිධ දැවැන්ත මහජන හා පෞද්ගලික ව්‍යාපෘති සමඟ ඒකාබද්ධ ව කටයුතු කිරීම
- ගුණාත්මකභාවයේ ඉහළම ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව, විවිධ ප්‍රමාණවලින් වූ නව්‍යතම මාදිලි 1800කින් සමන්විතයි
- දිවයින පුරා අළෙවිසැල් 150ක් සහ අළෙවි නියෝජිත මධ්‍යස්ථාන 500ක් හරහා ක්‍රියාත්මක වේ

අපි සැමදා දේශීය ආර්ථිකය නිරන්තරයෙන් බල ගැන්වීමේ සවියක් වූයෙමු. එය සුබවාදී අනාගතයක් වෙනුවෙන් අප විසින් ආඩම්බරයෙන් ඉටු කරන වගකීමක් ලෙස සලකන්නෙමු.

LANKATILES
The Fine Art of Living

Rocell
Eternal elegance

විල්පත්තුවේ අක්කර 2,065 කැපූ බව කියන රිෂාඩ්ට යහපාලන සමයේ ඇමැති තනතුරු 4 ක්

පරිසරය විනාශ කරන ඇටක නාටක

පරිසරය විනාශ කරන අයට දැඩි දඬුවම් දෙන්න රජයෙන් අලුත් පියවර රැසක්

අපේ රටේ දිනෙන් දින සිදුවන වනාන්තර කැපීම් හා පරිසර විනාශ වැළැක්වීම පිණිස ජාතික පාරිසරික පනත සංශෝධනය කර එයට අලුත් වගන්ති 42ක් ඇතුළත් කිරීමට තීරණය කළ බව පරිසර ඇමැති මහින්ද අමරවීර සිළුමිණට පැවසීය.

වර්තමානයේ පරිසරයට හානි කරන පුද්ගලයන්ට දැඩි දඬුවම් ලබාදීමට හැකිවන පරිදි මෙම වගන්ති ඇතුළත් කර පරිසර පනත සංශෝධනය කරන බවත් ඇමැතිවරයා කීය.

පරිසර ඇමැති මහින්ද අමරවීර

වායු දූෂණය ජල දූෂණය සම්බන්ධව දැන් පවතින නීති යාවත්කාලීන විය යුතු බවත් වසර 20 ක් පමණ පැරැණි ජාතික පාරිසරික පනත කාලානුරූපව සංශෝධනය කිරීමේ වෙනස් කළ යුතු බව කෝප් කාරක සභාවේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී මහාචාර්ය චරිත හේරත් ද සිළුමිණට පැවසීය.

වායු දූෂණය සිදුකරන අය විසින්ම දූෂණය පිරිසිදු කිරීම වෙනුවෙන් ගෙවිය යුතු බවත්, කැලණි හා මහවැලි ගංගාවල විවිධ අයුරින් සිදුවන ජල දූෂණය වැළැක්විය යුතු බව ද මහාචාර්යවරයා පවසයි.

ඒ අනුව පසුගිය 9 වැනිදා පැවැති ශ්‍රී ලංකාවේ ප්ලාස්ටික් ආනයනය භාවිතය හා පසුභාවිත කළමනාකරණයට අදාළ පරිසර විගණන වාර්තාව සම්බන්ධයෙන් පැවැති කෝප් කාරක සභා රැස්වීමේදී පරිසර අමාත්‍යාංශ ලේකම් විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ මහතාට මහාචාර්ය චරිත හේරත් මහතා උපදෙස් දී ඇත්තේ ජාතික පාරිසරික පනත වෙනස් කිරීමට කාලානුරූපීව කටයුතු කළ යුතු බවයි.

ජාතික පාරිසරික පනතේ සංශෝධන පිළිබඳව දිගටම සාකච්ඡා කළ ද එය ප්‍රායෝගිකව මෙතෙක් ක්‍රියාත්මක නොවීම ගැටලුවක් බවත් මහාචාර්ය චරිත හේරත් පවසයි.

● නිහාල් පී. අබේසිංහ

පරිසර විනාශය පිළිබඳව අද සමාජ මාධ්‍ය හා සමහර මාධ්‍ය විවිධ චෝදනා කරයි. සිංහරාජය, නකල්ස් හා මුතුරාජවෙල රක්ෂිත ප්‍රදේශවල ද පරිසර විනාශයක් සිදුවන බවට ද පරිසරවේදීහු රජයට පෙන්වා දෙති.

එසේ වුවත් වත්මන් රජය පත්වී පසුගිය මාස 8 ඇතුළත සිදුවී ඇති පරිසර හානියත් 2015 – 2019 වසරවල සිදුවූ පරිසර හානිය හා කැලෑ විනාශයත් පිළිබඳ සොයා බලන විට පරිසර විනාශ පිළිබඳව කෑගසන අය නිරුත්තර වනු ඇත.

ජවිපෙ විල්පත්තුවට ගොස් පවසා ඇත්තේ විල්පත්තුවේ ලොකු කැලෑ කැපිල්ලක් සිදුවී නොමැති බවයි. නමුත් පාරිසරික යුක්ති කේන්ද්‍රය පැවරූ නඩුවට ගරු අධිකරණය ලබාදුන් තීන්දුව අනුව සඳහා ගරු අධිකරණය තීරණය කර ඇත්තේ රිෂාඩ් බද්යුද්දීන් විසින් විල්පත්තු උතුර මායිමේ කල්ලාරු රක්ෂිත වනාන්තරයේ අක්කර 2065ක් (හෙක්ටයාර 825) විනාශ කර ඇති බවයි. නමුත් ඔහුට යහපාලන ආණ්ඩුව විසින් ඇමැති තනතුරු හතරක්ම දී තිබිණි.

විශේෂයෙන් වාණිජ හා කර්මාන්ත වැනි රටට ආර්ථික ලෙස බලපාන ඇමැති තනතුරු ඔහුට ලබාදී තිබීම අවධානය යොමු කළ යුතු කරුණකි.

පරිසර යුක්ති කේන්ද්‍රයේ විධායක අධ්‍යක්ෂ පරිසර විද්‍යාඥ හේමන්ත විතානගේ උපදෙස් මත පැවරූ නඩුවේ තීරණය මත රිෂාඩ් හිටපු ඇමැතිවරයා මේ කැලෑ කැපීම වෙනුවෙන් රුපියල් මිලියන 1075 ක් ගෙවීම හෝ ඉහත අක්කර ප්‍රමාණය වැවීම කළ යුතු ය. නමුත් තවම මේ කිසිවක් සිදු නොවුණු බව පරිසර යුක්ති කේන්ද්‍රයේ විධායක අධ්‍යක්ෂ හේමන්ත විතානගේ පවසයි. හේමන්ත විතානගේ 2019 දී ප්‍රකාශ කළේ කල්ලාරු වනාන්තරය පිළිබඳව පරිසරවේදී සජීව චාමිකර ඇතුළු පරිසරවේදීන් සමඟ එහි යනවිට සජිත් ප්‍රේමදාස මහතාගේ උපදෙස් පරිදි නිවාස අමාත්‍යාංශය මඟින් එහි කොටසක උදාගමක් සැදීමට කටයුතු කරමින් තිබූ බවයි.

මේ අතර පසුගියදා ප්‍රවෘත්ති සාකච්ඡාවකට එක්වූ හිටපු ඇමැති ලක්ෂ්මන් කිරිඇල්ල මහතා සිය අස්සනින් යුතුව හන්තාන ඉඩම තමාට පෞද්ගලික අයිතිය ඇති ඉඩමකි යනුවෙන් නිවේදනයක් නිකුත් කර ඇත.

ඒ අනුව ඒ හන්තාන ඉඩම තමාගේ බවත් ඉඩම් අක්කර 8 ක් බවත් පිළිගෙන ඇත. මීට පෙර තේ හා ගම්මිරිස් වගාකර තිබූ එම ඉඩමට ඇතුළුවීමට ඇති අපහසුතාව නිසා උස තණකොළ කපා දැමූ බවත් මන්ත්‍රීවරයා පවසයි.

එම ලිපියේ සඳහන්ව ඇත්තේ මෙම ඉඩම 1990 නොවැම්බර් 30 දින ඇමැතිවරයා විසින් සින්නක්කරව මිලදී ගත් ඉඩමක් බවයි. නමුත් ඔහුගේ දියණිය පසුගියදා ප්‍රවෘත්ති සාකච්ඡාවකදී පැවසුවේ තම පියා නීතිඥවරයකු ලෙස කටයුතු කරන සමයේ මේ ඉඩම මිලදී ගත් බවයි. නමුත් ලක්ෂ්මන් කිරිඇල්ල මහතා දේශපාලනයට පැමිණ ඇත්තේ 1985 දීය.

හන්තාන සුරැකීමේ සංවිධානයේ ලේකම් අමිත් සේනානායක පවසන පරිදි දැන් කිරිඇල්ල තමා මෙම ඉඩම ආණ්ඩුවට දෙන්නට කැමැති බව පවසා ඇතත් ඔහු එහි වගාවන් කිරීමට හන්තාන පාරිසරික ආරක්ෂණ කළමනාකරණ කමිටුවේදී ඉල්ලීමක් කර තිබේ. මෙම ඉඩම් මාස 3 – 4 කට ඉදිරිපත් කර ඇතැයිද අමිත් සේනානායක පවසයි.

ඒ සමගම මීට වසර දෙකකට පෙර කිරිඇල්ල මහතා විසින් හන්තාන රක්ෂිතයේ මුහුදු මට්ටමට අඩි 2500 - 2000 අතර පිහිටි අක්කර 2.5ක ඉඩමක් කෑලි කඩා විවිධ අයට දීමට හන්තාන පාරිසරික ආරක්ෂණ හා කළමනාකරණ කමිටුවට ඉල්ලුම්පතක් ඉදිරිපත්කර ඇත. එයට කමිටුවේ අවසරය ලැබී නොමැති අතර ඒ සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ මහනුවර කාර්යාලයේ භූ විද්‍යාඥයන්ගේ විරෝධය පළකර ඇත. ඊට අමතරව මේ ඉඩම් කැබලි කිරීමට අදාළව මූලික පාරිසරික ඇගැයීම් වාර්තාවත් සකස් කර තිබුණත් එහි බරපතළ වැරැදි ඇති බවද පාරිසරික විද්‍යාඥයෝ හා හන්තාන සුරැකීමේ සංවිධානය පවසයි. කිරිඇල්ල මහතාගේ දියණිය පවසන පරිදි ඇයට ඇති අක්කර 8ට අදාළ ඔප්පුව නීත්‍යානුකූල එකක් බවට ඇය මාධ්‍ය ඉදිරියේ පෙන්විය යුතු බවද අමිත් සේනානායක පවසයි. ඒ ඔප්පුව පිළිබඳව විවිධ සැක පහළ වී ඇති බවද ඔහු කීය. මේ ඉඩම අතීතයේ ජනවසම ඉඩමක් බවද සමහරු කියන බව අමිත් පවසයි.

හබරණ හිරිවඩුන්නේදී මරා දමා තිබුණු ඇතින්නකගෙන් පැටවකු කිරි බීමට උත්සාහ කරන අයුරු

2019 හබරණදී ඇතින්නියන් 9 දෙනකු මරා දැමීම ගැන පරීක්ෂණ කර නැහැ

ණයක් මොරගහකන්ද හා යාන්ඔය වාරි ව්‍යාපෘති නිසා විනාශ වී තිබේ. මහා පරිමාණ වගාකරුවන් බඩඉරිඟු, කෙසෙල් හා උක් වැනි වාණිජ බෝගශය බවත් සජීව චාමිකර එම ලිපියෙන් පෙන්වා දී ඇත.

2009 පෙබරවාරි 17 වැනිදා දරන අංක 1549/09 දරන ගැසට් පත්‍රය මඟින් හෙක්ටයාර 38274ක් වන කුඹුක්කන සංරක්ෂිත වනාන්තරය ප්‍රකාශයට පත්කර තිබිණි.

මීට අමතරව 2017 දී යාල අභයභූමියේ අක්කර 75ක් හොරට අල්ලාගෙන උක් වවා ඇති බවත් ඇල්ලූ තිදෙනකු මුදා හැරීමට පොලිස් ලොක්කෙකු බලපෑම් කළ බවත් වාර්තා වී තිබිණි.

මුතුරාජවෙලට කුණු දැමීම ආරම්භ කර ඇත්තේ 2017 යහපාලන රජය විසිනි. ඒ දිනවල ඒ පිළිබඳව කොළඹ අගරදගුරු මැල්කම් කාදිනල් රංජිත් පියතුමා ද එයට විරෝධය දක්වා ඇත.

උතුරු නැගෙනහිර පළාත් දෙකේ පමණක් අක්කර 16508ක වන විනාශ වලට කැලෑ එළිපෙහෙළි කිරීමත් මේ කැලෑ විනාශයට තවත් හේතුවකි. 2017 දී නොවැම්බර් 23 සිංහල පුවත්පතක් වාර්තා කර ඇත්තේ මොනරාගල කුඹුක්කන සංරක්ෂිත වනාන්තරය විනාශ කර ඇති බවයි. එහි අක්කර 200ක් පමණ බැකෝ යන්ත්‍ර යොදා ගනිමින් වගා බිම් සඳහා 2017 එළිපෙහෙළිකර ඇතැයි එම පුවත්පත ගෙනහැර දක්වා ඇත්තේ පරිසරවේදී සජීව චාමිකර ලියූ ලිපියක් අනුවය. මේ අනුව අලි මිනිස් ගැටුම් උග්‍රවූ බවත් මෙම වනාන්තරය කුඹුක්කන් ඔයේ ජල පෝෂක ප්‍රදේශය බවත් සජීව චාමිකර එම ලිපියෙන් පෙන්වා දී ඇත.

2009 පෙබරවාරි 17 වැනිදා දරන අංක 1549/09 දරන ගැසට් පත්‍රය මඟින් පසුගිය වසර 5 ඇතුළත සිදුවූ බව වන පරිසර සංවිධාන සංරක්ෂණ හා පරිසර අමාත්‍යාංශය කළ අලුත්ම සමීක්ෂණවලින් පෙන්නුම් කර ඇත.

ඒ අනුව කරුන්කාලිපුරම් වන රක්ෂිතයේ අක්කර 5000 වන විනාශයක් සිද්ධ කරමින් ජනාවාස පිහිටුවීම, මරිච්චුමික්ඩි කරමික්කුලි වන රක්ෂිතයේ අක්කර 3000ක වන විනාශයක් සිදු කරමින් ජනාවාස පිහිටුවීමට බක්මිටියාව තිඹිරිගොල්ල රක්ෂිතයේ අක්කර 1000ක් විනාශ කිරීම සිදුකර ඇත්තේ යහපාලන සමයේදී බව ගවේෂණවලින් පෙන්නුම් කරයි.

මේ අතර හිටපු නිවාස ඇමති හා වත්මන් විපක්ෂ නායක සජිත් ප්‍රේමදාසගේ අනුමැතිය යටතේ වනජීවී වන සංරක්ෂණ හා සංරක්ෂිත වනාන්තර රැසක උදාගම් ඉදිකිරීමට කටයුතු යොදා තිබිණි. ඒ සඳහා අදාළ ආයතනවලත් කිසිම අවසරයක් ලබාගෙන නැත.

"මාධ්‍යවේදීන් පිරිසක් සමඟ රිෂාඩ් බදියුදීන් හිටපු ඇමැතිවරයා 2019 දී පැවසුවේ කැලෑව කැපුවයි කියලා මට චෝදනා කළාට උදාගම් ඉදිකිරීමට ඊට වඩා කැලෑ කපන බවයි. ඊට අමතරව පසුගිය පාලන සමයේ පුරාවිද්‍යා ස්ථාන රැසක් විනාශ කර තිබේ. දාගැබ බුල්ඩෝසර් කර මිරිස් සිටුවීමේ වාර්තා ද ඇත. විජිතපුර බළකොටුව ඇතුළත උදාගමක් ඉදිකිරීමට කටයුතු කිරීම හා මුහුදු මහ විහාරය ප්‍රදේශයේ සංරක්ෂිත ප්‍රදේශ විනාශ කර ජනාවාස පිහිටුවීමද ඒ අතර ප්‍රධාන තැනක් ගනී.

මීට අමතරව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂයන් පසුගියදා ජනපති ගම සමඟ පිළිසඳර වැඩසටහනේදී පැවසූ ආකාරයට 2015 - 2019 වකවානුවේදී අක්කර 1000කට වඩා වන විනාශය කර තිබේ. ඒ අනුව අනුරාධපුරයේ අක්කර 274ක්, මොනරාගල අක්කර 100ක්, පුත්තලම අක්කර 278ක් හා කුරුණෑගල දිස්ත්‍රික්කයේ අක්කර 77ක් වනාන්තර කපා විනාශ කර තිබේ. මීට අමතරව මාතලේ, ලග්ගල, රිදීගම, වැලිකන්ද හා මයිලෑව ඇතුළු දිස්ත්‍රික්ක ගණනාවකම වන විනාශය 2015 - 2019 දී ජයටම කෙරී ඇත.

මේ අතර 2020 ජනවාරි පළමුවැනිදා සිට 2021 මාර්තු දෙවැනි සතිය දක්වා රක්ෂිත එළිකිරීම් සිදුවීම 270ක් වාර්තා වී ඇත. ඒ අනුව ඊට සම්බන්ධ පුද්ගලයන් 294ක් විශේෂ කාර්ය බළකාය මඟින් අත්අඩංගුවට ගෙන තිබේ.

කිරිඇල්ල පවුලට හන්තාන රක්ෂිතයේ ඉඩම් 3 ක්?

රක්ෂිත එළිකිරීම් 270ක් ගැන සැකපිට 294 දෙනෙකු අත්අඩංගුවට

මේ අතර පසුගියදා විවෘත කළ උණවටුන සුපිරි හෝටලයේ ඉදිකිරීමේදී වගුරු බිම් ගොඩකර ඇති බවද, රුමස්සල රක්ෂිත ප්‍රදේශවලට අහිතකර බලපෑම් කර ඇති බවද පරිසරවේදීහු හා ප්‍රදේශවාසීහු පෙන්වා දෙති. කෙසේ වුවත් සමහර මාධ්‍ය හා සමාජ මාධ්‍ය පැරණි හා පිටරටවල ඡායාරූප යොදා ගනිමින් රජයට පරිසරය විනාශ කිරීම පිළිබඳව චෝදනා කරන බව පරිසර ඇමැති මහින්ද අමරවීර මහතා පවසයි.

මේ අනුව යහපාලන රජය කළත් වත්මන් රජය කළත් පාරිසරික විනාශය නිසා ඉදිරියේදී ගංවතුර, නියඟ, නායයාම් බහුලව ඇතිවීමට මෙම වන විනාශය හේතුවිය හැකි බව පාංශු කාලගුණ භූ ගර්භ විද්‍යාඥයෝ ද පරිසරවේදීහු ද අවධාරණය තරති.

සජිත් ප්‍රේමදාස සංස්කෘතික හා නිවාස ඇමැති වශයෙන් සිටි පසුගිය 'යහපාලන' සමයේදී අපගේ පුරාවිද්‍යා ස්ථාන රැසක් විනාශයට පත්විය. ඒ අතරින් විජිතපුර පූජාභූමි ප්‍රදේශයේ උදාගමක් සෑදීමත්, අනුරාධපුර යුගයේ ලොකුම චෛත්‍යය ලෙස සැලකූ මඩකලපුවේ එරාවුර් ප්‍රදේශයේ චෛත්‍යයක් බුල්ඩෝසර් කර මිරිස් සිටුවීමත්, සාගම චෛත්‍ය දෙපළ කර විනාශ කිරීමත් ප්‍රධාන වේ.

වර්තමානයේ පරිසර විනාශය ගැන කථා කරන යහපාලනයේ හිටපු මැති ඇමැතිවරු කිසිවෙක් 2019 ඔක්තෝබර් මස හබරණ හිරිවඩුන්නේදී සිදුවූ ඇතින්නියක් 9 දෙනෙකුගේ මරණ පිළිබඳව කිසිම වගවිභාගයක් සිදු කළේ නැත. එකල එම අපරාධයට එජාපයේ අනුරාධපුර දිස්ත්‍රික් මන්ත්‍රීවරයෙකුගේ ද නම පටලැවී තිබිණි. එජාප රජය 2019 ඔක්තෝබර් 30 මාස 10ක් ආණ්ඩුව ගෙන ගියත් මේ ඇතින්නියන්ගේ මරණ ගැන කිසිම අවධානයක් යොමු නොකළ බව මතක් කළ යුතුමය.

'යහපාලන' යුගයේ කැලේ අක්කර 17,508 ක් විනාශ කරලා

ලක්ෂ්මන් කිරිඇල්ල මහතාගේ දියණියට අයත් යැයි කියන හන්තානේ ඉඩම සම්පූර්ණයෙන් සුද්ද කර තිබූ අයුරු

වමේ සිට හිටපු ඇමැතිවරුන් වන වත්මන් පාර්ලිමේන්තු මන්ත්‍රී ලක්ෂ්මන් කිරිඇල්ල, රිෂාඩ් බදියුදීන්, පරිසර යුක්ති කේන්ද්‍රයේ විධායක අධ්‍යක්ෂ හේමන්ත විතානගේ, හන්තාන සුරැකීමේ සංවිධානයේ ලේකම් අමිත් සේනානායක

පෙර සම්පූර්ණයෙන් ශුද්ධ කළ බවත් යටි වන වගාව සම්පූර්ණයෙන් ඉවත් කළ බවත් අමිත් සේනානායක පවසයි. මීට අමතරව හන්තාන රක්ෂිතයේ මීට යාබද ඉඩම අයිතිවන්නේ ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීවරයාගේ බිරියට බවත් හන්තාන සුරැකීමේ සංවිධානය පෙන්වා දෙයි.

අක්කර 16 ක් විශාල එම ඉඩමේ ගොඩනැගිල්ලක් සෑදීමට හා වගාවන් කිරීමට හන්තාන පාරිසරික ආරක්ෂණ කළමනාකරණ කමිටුව වෙත එම ඉඩම අයත් චාමින් කිරිඇල්ල ඉල්ලුම් පත්‍රයක් පසුගියදා පැවැති ප්‍රවෘත්ති සාකච්ඡාවකදී ලක්ෂ්මන් කිරිඇල්ල මහතාගේ දියණිය තම පියාට අයිති මේ අක්කර 8ක ඉඩම තමාට තෑගි ඔප්පුවකින් ලැබුණු බවයි. එම ඉඩම හන්තාන රක්ෂිතය ඇතුළත ඇති බව පිළිගත් ඇය එහි තවම කිසිම ඉදිකිරීමක් කර නොමැති බවද පැවසීය.

මේ අතර පරිසර යුක්ති කේන්ද්‍රයේ සංඛ්‍යා ලේඛන අනුව 2019ට පෙර වසර 10ක් ඇතුළත වකවානුවේදී ශ්‍රී ලංකාව පුරා වනාන්තර අක්කර 48,000ක් පමණ විනාශ වී ඇත. ඉන් වැඩි ප්‍රමාණයක් මොරගහකන්ද හා යාන්ඔය වාරි ව්‍යාපෘති නිසා විනාශ වී තිබේ. මහා පරිමාණ වගාකරුවන් බඩඉරිඟු, කෙසෙල් හා උක් වැනි වාණිජ බෝග

කොළඹ - කතරගම 'දිනමිණ ශීඝ්‍රගාමී' බස් රථ සේවාව යළි ඇරැඹීමට ලේක්හවුසියෙන් නව බස් රථ දෙකක්!

දශක ගණනාවක් තිස්සේ ජනතා විශ්වාසය දිනූ කොළඹ - කතරගම 'දිනමිණ ශීඝ්‍රගාමී' බස් රථ සේවාව යළි ආරම්භ කිරීම පිණිස නව බස් රථ දෙකක් ලේක්හවුස් ආයතනය විසින් මිලදී ගන්නා ලදී.

එම බස් රථ දෙක ආයතනය වෙත ගෙන ඒම ලේක්හවුස් සභාපති ජනාධිපති නීතිඥ ඩබ්ලිව්. දයාරත්න, මෙහෙයුම් අධ්‍යක්ෂ නීතිඥ කනිෂ්ක විතාරණ, නීති හා පාලන අධ්‍යක්ෂ නීතිඥ රබිත අබේගුණවර්ධන, කර්තෘ මණ්ඩල අධ්‍යක්ෂ ප්‍රවීණ මාධ්‍යවේදී ධර්ම ශ්‍රී කාරියවසම්, මුදල් අධ්‍යක්ෂ නිතිඥ ජනක රණතුංග. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී චන්දන බණ්ඩාර, ජ්‍යෙෂ්ඨ ප්‍රවාහන කළමනාකරු තිස්ස ධම්මික ඇතුළු පිරිසකගේ සහභාගිත්වයෙන් සිදු විය. පළමු සේයාරුවේ දැක්වෙන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය බස් රථයට නැඟ එහි සුවපහසු ආසන හා සෙසු පහසුකම් පිළිබඳව සතුට පළ කළ ආකාරයයි.

දෙවන සේයාරුවෙන් දැක්වෙන්නේ බස් රථ ඉදිරිපිට මෙහෙයුම් අධ්‍යක්ෂ නීතිඥ කනිෂ්ක විතාරණ, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී චන්දන බණ්ඩාර ඇතුළු ලේක්හවුස් සේවකයන් පිරිසක් සමූහ සේයාරුවකට පෙනී සිටි ආකාරයයි.

සේයාරුව - සමන් ශ්‍රී වෙදගේ.

සෙලින්කෝ ලයිෆ්
ෆැම්ලි සවාරි වෙතින් මෙදා සැරේ රත්තරන්
FAMILY SAVARI
FROM
CEYLINCO LIFE®
A Relationship For Life™
මාස 2කට වරක්
රුපියල් ලක්ෂ 50ක්
වටිනා රත්තරන්
සෙලින්කෝ ලයිෆ් ෆැම්ලි සවාරියෙන් ලෝකේ වටේ සංචාරවල සුන්දර අත්දැකීම් ලැබූ ඔබට, මෙදා සැරේ රුපියල් ලක්ෂ 50ක් වටිනා රත්තරන්! මාස දෙකකට වරක් සිදුකරන දිනුම් ඇදීමෙන් අවුරුද්දක් පුරාවටම රත්තරන් දිනාගන්න. මොනදේ වුණත් ඔබ වෙනුවෙන් තෑගි දෙන්නේ සෙලින්කෝ ලයිෆ් ෆැම්ලි සවාරියෙන්ම විතරයි.
දැන්ම අයැදුම් කරන්න. වැඩි විස්තර සඳහා 0112 461 461 අමතන්න.
WP/GT/5415
Best Life Insurance Company in Sri Lanka for 7 consecutive years.
MOST VALUABLE LIFE INSURANCE BRAND IN SRI LANKA
2020 විශ්වාසී ශ්‍රී ලංකාවේ ජීවිතවේ සාමාජිකයන් පසු ශ්‍රී ලංකාවේ
ලංකාවේ වැඩි 14ක් පසුවුණු රක්ෂක සමාගම
2020 සිලෙන් Great Place සිදු ලක්ෂ සමාජිකයන් පැවති ලක්ෂ
සෙලින්කෝ ලයිෆ් රක්ෂණ සමාගම වෙතින් නිකුත් කිරීමක්. (PB5183) * කොන්දේසි සහිතයි
CEYLINCO LIFE®
ජීවිතය පුරාවට සබැඳියාවක්™
සෙලින්කෝ ලයිෆ් රක්ෂණ සමාගම, සෙලින්කෝ ලයිෆ් ටවර්, 106, හැව්ලොක් පාර, කොළඹ 05. සමාගම් ලියාපදිංචි අංකය PB5183 දුරකථනය: (011) 2461461 ඊමේල්: service@ceylife.lk වෙබ් අඩවිය: www.ceylincolife.com

Mahindra Rise.
DIMO THE PERFECT PARTNER
මෙදා යලට
වාසි වැස්සක්
සෑම Mahindra YUVO
2WD සහ 4WD ට්‍රැක්ටරයක් සමඟ
තෝරා ගැනීමට වාසි කට්ටල 2ක්
DIMO වෙතින්
නොමිලේ
රොටරියක්
හෝ
වටිනා STIHL ටිලර් එකක් සමගින්
කොකු නගුලක් සහ තැටි නගුලක්
කොන්දේසි සහිතයි
අදම අමතන්න 011 244 97 97
සීමිත කාල සීමාවක් සඳහා පමණයි.
දශක 8ක අසමසම DIMO විශ්වාසය හා වගකීම සමඟ

UP TO
70%
අලුත් අවුරුදු ජයයි!
HNB කාඩ්ස් එක්ක සතුට පිරුණු අලුත් අවුරුද්දක්!
HNB කාඩ්ස් වෙතින් වෙළෙඳ නාම 300කට අධික ප්‍රමාණයකට 70% දක්වා ලබා දෙන සුවිශේෂී වට්ටම් සමග මිල දී ගැනීම් කර, මේ අලුත් අවුරුද්ද ජයට සමරන්න!
දැන් HNB කාඩ් සමග, #Happyinside
කාඩ්පතක් අයැදුම් කිරීමට 0112 462 462 අංකයට කතා කරන්න. වැඩි විස්තර සඳහා පිවිසෙන්න www.hnb.net
HNB Cards
ඔබේ ප්‍රගතියේ සහකරු
QR කෝඩ් එක ස්කෑන් කර HNB නවතම දීමනා ගැන දැනගන්න, සතුට වැඩි කරගන්න!
*කොන්දේසි සහිතයි.
ඊවි රේටිං: AA-(lka) හැටන් නැෂනල් බැංකුව ශ්‍රී ලංකා මත බැංකුව විසින් අධීක්ෂණයට ලක් කරනු ලබන වාණිජ බැංකුවකි. Hatton National Bank PLC - PQ 82

පැන්න පිම්ම වැරදී ජීවිතයෙන් වන්දි ගෙවූ ගුවන් නිලධාරියා

බළඟණ නායක මනෝජ් පද්මතිලක

අඩි 3500 සිට පැනීමට පෙර අඩි 1000 ක ඉහළින් 15 වතාවක් පැන තිබුණා

මහනුවර විද්‍යාර්ථ විද්‍යාලයේ ආදි ශිෂ්‍යයෙක්

කොතලාවල ආරක්ෂක විද්‍යා පීඨයට බැඳුණේ 2008 දී

● හර්ෂා සුගතදාස

ගෙනහිර පළාතේ පිහිටි අම්පාර ප්‍රදේශයට පසුගිය 20 වැනි සෙනසුරාදා ද හිරු නැඟුණේ තවත් දවසක් උදා වූ බව කියාපෑමට ය. විහඟුන්ගේ මියුරු නාදය හාත්පස පැතිර යද්දී අඳුරට ගාල් වුණු ගවරැළ අහර සොයා යෑමට පටන් ගත්තේ දෛනික රාජකාරිය ආරම්භ කරමිනි.

මේ අතරවාරයේදී අම්පාර ගුවන් හමුදා කඳවුරේ පුහුණුවකට පැමිණ සිටි බළඟන නායක මනෝජ් පද්මතිලකට විශේෂ කටයුත්තක් තිබිණි. ඒ, මවගෙන් අතරමං වී සිටි ගව පැටවකුට කිරි බෝතලයක් ලබා දීමයි. තණ කෑමට තරම් වයසක නොවූ මෙම ගව පැටවාට ආදරයෙන් සලකමින් සෑම උදැසනකම කිරි බෝතලයකින් සංග්‍රහ කිරීම, මනෝජ් පද්මතිලකගේ දින චර්යාවේ කොටසක් විය. 20 වැනි සෙනසුරාදා ද එය ඉටු කළ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ බළඟණ නායක මනෝජ් පද්මතිලක, ගුවන් හමුදාවට අයත් Y 12 වර්ගයේ ගුවන් යානාවට නැඟුණේ උදැසන 7.15ට පමණ ය. පුහුණුව ලබන නිලධාරිහු හත්දෙනෙක් සහ පුහුණු උපදේශකවරුන් එහි සිටියහ. ඔවුන්ට මූලික පැරෂුට් පුහුණුවෙන් පසු නිදහස් ආර පිම්ම පළමු වතාවට පැනීමට තිබුණේ එදාය.

පැරෂුට් මූලික පුහුණුවීම්වලදී පිම් 10ක් පැන සිටි බළඟණ නායක මනෝජ් පද්මතිලකගේ අවසාන පිම්ම මෙය බව ඔහුට එදා නිකමටවත් නොසිතෙන්නට ඇත. අබේකෝන්ගේ පැරෂුටය මනෝජ් පද්මතිලකගේ පැරෂුටය සමඟ පැටලී එකට ගුළි විය. අඩි 500ක ඉහළ සිට දෙදෙනාම පොළව මත ඇද වැටුණේ මනෝජ්ගේ 11 වැනි පිම්ම මාරක පිම්මක් බවට පත් වෙමිනි. ගුවන් හමුදා පුහුණු කඳවුරට අයත් භූමියකට පතිත වූ මොවුන් දෙදෙනාව ගුවන් හමුදාවට අයත් ගිලන් රථයකින් ඒ මොහොතේම අම්පාර රෝහලට රැගෙන ගිය ද ඒ වන විට මනෝජ් පද්මතිලක මෙලොව හැර ගොස් තිබුණි. සැරයන් අබේකෝන්ගේ දෙපාවල අස්ථි බිඳීමකට ලක් වී තිබුණු අතර ඔහුව රෝහලේ දැඩි සත්කාර ඒකකයට ඇතුළත් කරනු ලැබීය.

"Y 12 ගුවන් යානයෙන් පැරෂුට් පුහුණුවට ගිය කණ්ඩායමෙන් බළඟණ නායක මනෝජ් සහ සැරයන් අබේකෝන් පැන්නේ 4 වෙනියා හා 5 වෙනියා ලෙසටයි. මමත් බලාපන්ති සැරයන් ගුණතිලකත් නිරීක්ෂණය කරමින් සිටියා. පොළොවට අඩි 500ක් පමණ තිබියදී පැරෂුට් දෙක එකට පැටලුණා. පැරෂුට් දෙකම ගුළිවී පොළොවට වැටුණහම අපි දෙන්නා එතැනට ගියා. අබේකෝන් ළඟට ගිහින් කතා කළාම මුළු ඇඟම රිදෙනවා කියලා කිව්වා. මනෝජ් ළඟට ගියහම ඔහුගේ කට සහ ඇස් ඇරී තිබුණා. පැරෂුට් දෙක පැටලීමෙන් සිදුවූ අනතුරෙන් මෙම මරණය සිදුවූ බව මම විශ්වාස කරනවා." යනුවෙන් බළඟණ නායක දිනේෂ් කුමාර කිරිවන්දෙනිය උහන පොලීසියට පවසා තිබුණි.

බළඟණ නායක මනෝජ් පද්මතිලක විවාහ වූ දා

බළඟණ නායක මනෝජ් පද්මතිලක පැරෂුට් ආධාරයෙන් අඩි 3500ක ඉහළ අහසේ සිට බිමට පැනීමට පෙර අඩි 1000ක ඉහළ අහසේ සිට 15 වතාවක් සාර්ථක ලෙස බිමට පතිත වූ නිලධාරියෙකි. බළඟණ නායක මනෝජ් පද්මතිලක සහ සැරයන් අබේකෝන් පැරෂුට් පුහුණුව සඳහා අම්පාර ගුවන් හමුදා කඳවුරට අනුයුක්ත කර තිබෙන්නේ ජනවාරි මාසයේදීය. ඊට පෙර ඔවුන් දෙදෙනාම වන්නි ගුවන් හමුදා කඳවුරට අනුයුක්තව සේවය කර ඇත. බළඟණ නායක මනෝජ් පද්මතිලක 2008 සැප්තැම්බර් 20 කොතලාවල ආරක්ෂක විද්‍යා පීඨයෙන් කැඩෙට නිලධාරියකු වශයෙන් ගුවන් හමුදාවට එක් වූ අයෙකි. ගුවන් හමුදාවට බැඳුණු දා පටන් පුහුණු වැඩසටහන් රාශියකට සහභාගී වූ මනෝජ් පද්මතිලක ඒවායින් විශිෂ්ට ලෙස සමත් වී තිබේ. මෙය ඔහුගේ අවසාන පුහුණුව විය. අවසාන පුහුණුව ඔහුගේ අවසාන ගමන යන පුහුණුව වූයේ දෛවයේ සරදම්කින් විය හැකිය. ඔහු ජීවිතයෙන් සමු ගැනීමට පෙර, ඊට පෙර දවසේ (19) සිය මාමාට දුරකතන ඇමතුමක් ගෙන තිබුණේ ලොකු මාමාගේ තුන් මාසයේ පිංකම ගැන විමසා බැලීමටය. මනෝජ්ගේ මවගේ වැඩිමහල් සොහොයුරාගේ තුන්මාසයේ පිංකම ගැන විමසූ ඔහු, "මාමේ, මම පිම් 10ක් පැන්නා. ඉතුරු ටිකත් පැනලා අප්‍රේල් මාසයේ ගෙදර එනවා." යැයි සඳහන් කළේ ආඩම්බරයෙනි.

මහනුවර විද්‍යාර්ථ විදුහලේ ආදි සිසුවකු වන මනෝජ් පද්මතිලක විදුහලේ කීර්තිමත් සිසුවකු ලෙස කා අතරත් ජනප්‍රිය අයෙකි. ඔහු විදුහලේ උප ප්‍රධාන ශිෂ්‍ය නායකයා ලෙසත් ජනාධිපති බාලදක්ෂයකු ලෙසත් චෙස් කණ්ඩායමේ සාමාජිකයකු ලෙසත් පාසලට ගෞරවයක් අත්පත් කර දී ඇත. අ.පො.ස. උසස් පෙළ කලා විෂය ධාරාවෙන් හැදෑරූ මනෝජ් පද්මතිලක කොතලාවල ආරක්ෂක විද්‍යා පීඨයේ 26 වැනි කණ්ඩායමේ බී.ඒ. (D.E.F.S.T.U) උපාධිධාරියෙකි.

1986 ඔක්තෝබර් මස 19 වැනි දින මහනුවර පොල්ගොල්ල වීරකොටුව අඹ සෙවණ නිවසේ උපත ලැබූ මනෝජ් පවුලේ වැඩිමහල් දරුවාය. ඔහුගේ පියා පී.ජී.ආර්.ඩබ්ලිව්.එම්. චන්ද්‍රතිලක වන අතර පියා විශ්‍රාමික බැංකු නිලධාරියෙකි. මනෝජ්ගේ පියා මීට දෙවසරකට පෙර මිය ගියේ හෘදයාබාධයකිනි. ආර්. එම්. ආරියලතා රණතුංග මනෝජ්ගේ මව වන අතර ඔහුට බාල මල්ලී කෙනෙක් සහ නංගී කෙනෙක් සිටිති. ඔහු විවාහ දිවියට ඇතුළත් වූයේ මීට වසරකට පෙරය. ඔහු අතිනත ගෙන තිබුණේ බණ්ඩාරවෙල පදිංචි කථිකාචාර්යවරියක සමඟිනි. ඔහුගේ අවසන් කටයුතු 22 වැනි දින මහනුවර මහයියාව පොදු සුසාන භූමියේදී පූර්ණ ගුවන් හමුදා උත්තමාචාර මැද සිදු කෙරිණි.

ස්තුති කිරීමයි

02 11 1968

08 03 2021

G. S. NESAKUMAR

Old boy of St. John's College, Jaffna.
(Business Development Manager - North & East. Cargills (Ceylon) PLC)

සර්වබලධාරී දෙවියන්වහන්සේගේ හස්තය තුළ නිවාඩුව සඳහා ගොස් සිටින්නා වූ අපගේ ආදරණීය නේසකුමාර් (නේසන්) අප අතරින් වියෝ වූ ශෝකජනක අවස්ථාවේදී අප වෙත කණගාටුව ප්‍රකාශ කරමින් ශෝක පණිවිඩ, මල් වඩම් එව්වා වූද, නොයෙකුත් අයුරින් අපව සනසවන ලද්ද වූද, සියලුම දෙනා වෙත අපගේ කෘතඥතාවය හදපතුලේන් පුද කරමු.

අපගේ මේ පිඩාකාරී මොහොතේදී යාඥාවෙන් අපව දරාගත්තා වූ ලංකා පෙන්ත කොස්ත සභාවට (ශ්‍රී ලංකාව සහ විදේශ) අයත් සියලුම දේව සේවක සේවිකාවන්, දහිලිවතුන් වෙත ද අපගේ විශේෂ කෘතඥතාව පුද කරන්නෙමු.

අපගේ විශේෂ හෘදයාංගම ස්තුතිය කාර්ගිල්ස් සමාගමේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී රන්ජන් පේ්‍රම මහතා සහ එම පවුලේ සියලුම සාමාජිකයින් වෙත පිරිනමන්නෙමු. එසේම අපගේ විශේෂ ස්තුතිය කාගිල්ස් සමාගමේ සියලුම සේවක සේවිකාවන් වෙතද පිරිනමන්නෙමු.

අප වෙනුවෙන් යාඥා කලාවූ, ශෝකය ප්‍රකාශ කලාවූ අනෙකුත් දේව සභාවන්ට අයත් දේව සේවක සේවිකාවන්ද අප කෘතඥතා පූර්වකව සිහි කරමු.

මෙරට සහ විදේශයන්හි පදිංචි යාපනය ශාන්ත ජෝන් විද්‍යාලයේ සහ චුන්ඩුකුලි බාලිකා විද්‍යාලයේ ආදි ශිෂ්‍යයන්, විදුහල්පතිවරුන් ඇතුළු වර්තමාන සිසුන් සහ අධ්‍යාන සහ අනධ්‍යාන යන කාර්යමණ්ඩලය වෙත ද අපගේ ගෞරව පූර්වක ස්තුතිය පුද කරමු.

එලෙසම ඔහු රෝහල් ගතව සිටි කාලය තුළ සත්කාර කලා වූ වෛද්‍යවරුන් ඇතුළු රෝහල් කාර්ය මණ්ඩලය වෙත ද අපගේ ස්තුතිය පුද කරමු.

අවමංගල කටයුතු සුදනම් කිරීම ඇතුළු අනෙකුත් සියලුම කටයුතු සංවිධානය කරමින් අප හට ඉමහත් උපකාරයක් වූ දයාබර රාජන් තයිල්ස්, ජෙයන තයිල්ස්, සදගෝපන් සහ වාගීසන් යන සහෝදරයින් වෙත අපගේ විශේෂ ස්තුතිය පුද කරමු.

වජීරා නේසකුමාර් (බිරිඳ) එබනේසර් (පුතා) හෙප්සිබා (දියණිය) සහ ඥානසේගරම් පවුලේ සාමාජිකයින්.

අවමංගල්‍ය ස්තූතිය

අපගේ ආදරණීය මෑණියන් වන

චන්ද්‍රානි ප්‍රේමසීලි දැඩිගම මැතිනියගේ

අවමංගල්‍ය උත්සවයට වැඩම කළ අතිපූජනීය මහා සංඝරත්නයට,
අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට,
ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාට,
විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මැතිතුමාට,
සියලුම මැති ඇමතිවරුන්ට,
පොලිස්පතිතුමා, නියෝජ්‍ය පොලිස්පතිතුමා සහ
මහරගම පොලිස් ස්ථානාධිපතිතුමා ඇතුළු ආරක්ෂක අංශයට,
මහරගම නගර සභාවේ ගරු නගරාධිපතිතුමා
ඇතුළු කාර්ය මණ්ඩලයට,
ජගත් සුමතිපාල මහතා සහ තිලංග සුමතිපාල මහතා
ඇතුළු සුමතිපාල පවුලේ සැමට,
මහරගම ඇතුළු දීපව්‍යාප්ත ව්‍යාපාරික ප්‍රජාවට,
දැඩිගම සමූහ ව්‍යාපාරයට අනුබද්ධ,

ස්වර්ණාභරණ අංශය
උකස් අංශය
දේපළ වෙළඳාම් අංශයන්හි
හෝටල් අංශය
වැවිලි අංශය

සියලුම කාර්ය මණ්ඩලයට,
ශෝකී අවස්ථාවේ සංවේගය පළ කළ දෙස් විදෙස්
සියලු ඥාතීන් සහ හිතමිත්‍රාදීන්ට,

දැඩිගම පවුලේ දූ පුතුන් ඇතුළු සියලුම සාමාජිකයන්ගේ හෘදයාංගම ස්තූතිය පුද කරමු.

චන්ද්‍රානි ප්‍රේමසීලි දැඩිගම මැතිනිය
හිටපු සභාපතිනි - දැඩිගම සමූහ ව්‍යාපාරය

කොවිඩ් -19 රෝගයට ගොදුරු වූ ලේක්හවුස් ආයතනයේ සේවකයන්ට භාණ්ඩ මිලදී ගැනීම සඳහා වවුචර්පත් ලබා දීම ලේක්හවුස් ආයතනයේ සභාපති ජනාධිපති නීතිඥ ඩබ්ලිව්. දයාරත්න හා අධ්‍යක්ෂ මණ්ඩලයේ සහභාගීත්වයෙන් ලේක්හවුස් ආයතනයේදී මාර්තු 25දා සිදු කෙරිණි. එහිදී ආයතනයේ සේවකයන්ගේ සුබසාධනය වෙනුවෙන් ඉදිරියේදී ගෙන ඇති ක්‍රියාමාර්ග ගැනද සභාපතිවරයා පිරිස දැනුම්වත් කළ අතර එහිදී සේවකයකුට වවුචර්පත් ප්‍රදානය කළ අවස්ථාව මෙහි වේ. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි චන්දන බණ්ඩාරද පසෙකින් සිටී. සේයාරුව - චින්තක කුමාරසිංහ

‘ගාල්ල මහින්දේ 9 කල්ලියක්’ නැති බව විදුහල්පති කියයි

මාර්තු 21 සිළුමිණ පුවත්පතේ 7 පිටුවේ පළවූ ‘ගාල්ල මහින්දේ 9 කල්ලිය’ ලිපිය පිළිබඳව කරුණු පැහැදිලි කිරීමක් එහි වැඩ බලන විදුහල්පති ගාමිණී ජයවර්ධන විසින් සිළුමිණ වෙත යොමුකර තිබේ. එම ලිපිය ලබන සතියේ පළවනු ඇත. ඒ සමගම එම ලිපියට පාදක වූ කරුණු පිළිබඳව සිළුමිණ පුවත්පතේ පැහැදිලි කිරීමද එක්වනු ඇත.

1 වැනි පිටුවෙන්

සිසුන් කොටස් ...

අනුමත පෞද්ගලික පාසල්වල පළමු ශ්‍රේණිය ඇතුළු මෙතෙක් ආරම්භ නොකළ අනෙකුත් ශ්‍රේණි 2021/03/29 වැනි දින ආරම්භ කිරීමට අදාළ විශේෂ චක්‍රලේඛයට අනුව කොවිඩ් සෞඛ්‍ය නිර්දේශයන්ට අනුකූලව පන්තියක සිසුන් කාණ්ඩ කර පාසල් ගෙන්වා ගැනීමට අපේක්ෂිතය.

ඒ අනුව 29 වැනි සඳුදා සිට සිසුන් 15 දක්වා සිටින පන්ති සතියේ සෑම දිනකම පැවැත්විය යුතු වෙයි. සිසුන් 16 සිට 30 දක්වා සිටින පන්ති කණ්ඩායම් දෙකකට බෙදා සතියක් හැර සතියක් පන්ති පැවැත්විය යුතු වේ.

සිසුන් 30 ට වැඩියෙන් සිටින පන්ති කණ්ඩායම් තුනකට බෙදා සමාන දින සංඛ්‍යාවක් වන සේ පන්ති පැවැත්විය යුතු වෙයි.

ඇමැති ඩලස්ගෙන් ...

ජාතික විදුලිබල පද්ධතියට පුනර්ජනනීය දායකත්වය 70% දක්වා වර්ධනය කිරීමේ ඉලක්කය හඹා යමින් ක්‍රියාත්මක වෙයි.

පසුගිය දා ගිරිබාවෙන් ආරම්භ කළ දැයට එළිය ජාතික වැඩසටහන මගින් සිංහල අලුත් අවුරුද්දට පෙර පවුල් 37,363 කට විදුලිබල සබඳතා නොමිලේ ලබාදීමට කටයුතු කරන බවත්, ඊට අමතරව පවුල් 99,862 කට දැයට එළිය වැඩසටහනින් මේ වසර අවසානයට පෙර නොමිලේ විදුලි බලය ලබාදීමට කටයුතු කරන බවත් විදුලිබල ඇමැති ඩලස් අලහප්පෙරුම පවසයි.

ආසන 10ට...

ඒ අනුව පොදු මගී ප්‍රවාහන බස් රථ, කාර්යාල සේවක ප්‍රවාහන බස් රථ ඇතුළු අනෙකුත් සේවා බස් රථ හා පාසල් වෑන් රථ ඇතුළු අනෙකුත් සියලු මගී ප්‍රවාහන සේවා වෑන් රථ රියැදුරන් අනිවාර්යෙන්ම මේ විශේෂ මගී ප්‍රවාහන බලපත්‍රය ලබා ගත යුතු බව ඇමැතිවරයා කීවේය. සති 3ක පුහුණුවකින් පසුව ස්ථාන භාර පුහුණු නිලධාරීන් විසින් අදාළ රියැදුරා මගී ප්‍රවාහනයට සුදුසු බවට නිර්දේශ කිරීමෙන් පසුව ජාතික ගමනාගමන කොමිසම විසින් අදාළ මගී ප්‍රවාහන රියැදුරු බලපත්‍රය ලබා දෙනු ඇත.

කොරෝනා...

දකුණේ ජනතාව මේ දිනවල යාපනය ඇතුළු උතුරේ නගර කරා පැමිණීමේ විශාල අඩුවක් දක්නට ඇතත් උතුරේ සැලකිය යුතු ජනතාවක් සෞඛ්‍ය උපදෙස් නොතකා කටයුතු කිරීම නිසා රෝගය පැතිර යාමේ අවදානමක් මතුව තිබෙන බව සෞඛ්‍ය අංශ විසින් පෙන්වා දී තිබේ.

ඉන්දියාවේ සිට නීති විරෝධී ලෙසින් සංක්‍රමණය වීමත් ඉන්දීය ධීවරයන් හා මෙරට ධීවරයන් ගනු දෙනු කිරීමත් හරහා උතුරු ප්‍රදේශයට කොවිඩ් අවදානම වැඩි බවද සෞඛ්‍ය අංශ විසින් පෙන්වා දී තිබේ.

අවමංගල්‍ය දැන්වීම්

වයි.ඒ. ද සිල්වා - අමරසේන, විශ්‍රාමික සහකාර කම්කරු කොමසාරිස්, නැසීගිය එම්.ඩී. පත්මා ද සිල්වාගේ ආදරණීය ස්වාමිපුරුෂයා වූද, තිස්ස, දමිත්, චමත් සහ කිත්මිණිගේ ආදරණීය පියාණන්වූද, ලේඛා, ප්‍රියංකා, කාංචනා සහ සරාජ්ගේ ආදරණීය මාමණ්ඩිය වූද වයි. අමරසේන ද සිල්වා මහතා අභාවප්‍රාප්ත විය. **අවසන් කටයුතු** අභුන්ගල්ල ආදාහනාගාරයේදී මාර්තු 27 වෙනි සෙනසුරාදා සවස 4.00 ට සිදුකෙරේ. 023329

සිංහල අලුත් අවුරුදු සති පිරිත් පිංකම 2021

කොරෝනා වසංගතය රටින් තුරන් වී රටවැසියනට යහපත් වූ හෙට දවසක් උදාවේවායි ප්‍රාර්ථනා කරමින් පුරා වසර 88 ක් අඛණ්ඩව පවත්වාගෙන එන සති පිරිත් දේශනාව මෙවර ද අප්‍රේල් මස 01 වැනි දින ආරම්භකොට 09 වැනි දින දහවල් දේවාල මහා දානයෙන් අවසන් වේ.

උදේ 6.00 ට සවස 3.00 ට සහ රාත්‍රී 8.00 ට මහ පිරිත් දේශනා පැවැත්වේ.

අප්‍රේල් 07 වැනි දින රාත්‍රී සූත්‍ර දේශනාව, 08 වැනි දින රාත්‍රී දොරකඩ අස්න, අනුශාසනාව සහ ආටානාටිය සූත්‍ර දේශනා පැවැත්වේ.

ආශිර්වාද පතා තැබීම පිණිස තෙල්, බෙහෙත්, යන්ත්‍ර, මුහුදු වැලි, ගඟේ වැලි, පැන්, නූල් ආදී ආරක්ෂක දේ

අප්‍රේල් 01 දාට ප්‍රථම විහාරස්ථානයට ගෙනැවිත් භාරදෙන්න.

විමසීම් : දොඹගොඩ මහතා - 0714454411
ප්‍රියන්ත මහතා - 0712142747
ගංගාරාම විහාරස්ථානය, 61, ශ්‍රී ජිනරතන පාර, කොළඹ 02.

පින සහ කුසල - පව සහ අකුසල

සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, කිතුණු, බෞද්ධ, හින්දු ආදී ලොව සිටිනා සියලු දෙනාටම සිතින් පින් හෝ පව් කිරීමට හැකි කමක් නැත. ඒ කිසිවෙකුට සිතින් යහපත් ක්‍රියාවක් කිරීමට නොහැකි බැවින් සිතින් පින් කිරීමට නොහැක. එසේම ලොව කිසිවෙකුටත් සිතින් නරක අයහපත් වැඩක්, ක්‍රියාවක් කරන්න බැරි බැවින් සිතින් පව් කිරීමට නොහැක.

ලොව සෑම දෙනාගේ සිතේ ඇති වන්නේ සිතිවිලි එම සිතිවිලි හොඳ හෝ නරක සිතිවිලි වේ. හොඳ සිතිවිලිවන කරුණාව, දයාව, මෛත්‍රිය වැනි යහපත් සිතිවිලි වේ. නරක සිතිවිලිවන තණ්හා, ඊර්ෂ්‍යා, ක්‍රෝධ, වෛර, කාම රාග වැනි නරක සිතිවිලි වේ.

සිංහල, දෙමළ, මුස්ලිම් ආදී ලොව කිසිවෙකුටවත් කය හා වචනින් යහපත් සිතිවිලිවන කුසල් කිරීමට නොහැක. එසේම ලොව කිසිවෙකුට කය හා වචනින් නරක සිතිවිලිවන අකුසල් ඇතිකර ගැනීමට නොහැක.

කය හා වචනින් කළ හැක්කේ පින් පව් පමණි. සිතේ ඇතිවන සිතිවිලිවලින් සිතින් කළ හැක්කේ කුසල් හෝ අකුසල් පමණි.

සිතින් ඕනෑතරම් පින් කිරීමට සිතිය හැකිය. පව් කිරීමටද සිතිය හැකිය. එහෙත් සිතින් පින් පව් කරන්න හැකිකමක් ඇත්තේ නැත. කය හා වචනින් කුසල් අකුසල් කිරීමට හැකි කමක් ඇත්තේ නැත. බොහෝ බෞද්ධයන්ද පින් පව් කුසල් අකුසල් නිවැරදිව දන්නේ නැත.

පින් පව් කුසල් අකුසල් ගැන දැන ගැනීමට පොත්

- පින් සහ පව් - කුසල් සහ අකුසල් 120/-
- ලොව සැමට සිත නිවාගන්න දහම් දුනුම 125/-
- හොඳ - නරක, පින් - පව්, කුසල් - අකුසල් 100/-
- සිතිවිලි සහ සිතින් සිතීම 150/-
- සිත සහ මනසින් කුසල් අකුසල් - කය හා මනසින් පින් පව් 100/-
- සිතෙහි සතුට ඇති කරගැනීමට කුසල් කරන්න අකුසලෙන් මිදෙන්න 125/-
- චිත්ත නියාම ධර්මය 125/-
- සිත මනස සහ ආගම් 80/-
- සිත ගැන දැනගන්න 125/-
- දූ දරුවන්ගේ සාර්ථකම අත්පොත 100/-

සී/ස ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම
661, 665, 675 පී.ද සොයිසා මාවත, කොළඹ 10.
දුරකථන: (011) 2685369, 2686925 ෆැක්ස්: 2674187

නාස්තිකාර පළාත් සභා වෙනුවට වෙනත් ආදේශකයක්

පසුගිය වසර තුනකටත් වැඩි කාලයක් තිස්සේ මෙරට පළාත් සභා පැවතුණේ අපරාජිතවය. එය තවදුරටත් පැහැදිලි කළ හොත් කිව හැක්කේ හැම පළාත් සභාවක්ම කවන්ධ ස්වරූපයකින් දිස් වූ බවයි. එසේ වූයේ එම සියලුම පළාත් සභාවල ප්‍රධාන අමාත්‍යවරයා ඇතුළු ඇමති මණ්ඩලයේත්, සෙසු මන්ත්‍රීවරුන්ගේත් නිල කාලය අවසන්වීම හේතුවෙනි.

එසේ වුවද පළාත් සභා මගින් සිදු විය යුතු සේවා අඛණ්ඩව සිදු කෙරුණේය. එහෙයින් ඒ හැම පළාත් සභාවකම මුදුන් මට්ටමේ දේශපාලන බලධාරීන් නොසිටින බව ප්‍රදේශවාසීන් කිසිවකුට හෝ නොදැනිනි. ඒ සඳහා මුල් වූ එක් හේතුවක් වූයේ පළාත් සභාවලට පහළින් තිබෙන පළාත් පාලන ආයතන මගින් අදාළ කර්තව්‍යයන් අඩු වැඩි වශයෙන් ඉෂ්ට සිද්ධ වීමයි.

කෙසේ වෙතත් පළාත් සභා ඡන්දය දිනෙන් දිනම ප්‍රමාද වීම නිසා මෙරට ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය යම් අයුරකින් උල්ලංඝනය වූ බව පිළිගත යුතු සත්‍යයකි. එසේ වුවද එම නිසා මහජන මුදල් රුපියල් කෝටි ගණනක් මකර කටට නොගොස් මැනවින් සුරැකුණු බවක්ද ඒ සමගම කිව යුතුය. ඒ පළාත් සභා මන්ත්‍රීවරුන්ගේත්, සෙසු ඇමතිවරුන් ඇතුළු සියලුම පළාත් සභා මන්ත්‍රීවරුන්ගේත් පඩි නඩි ඇතුළු වෙනත් වරප්‍රසාද සඳහා වැයවන මුදල් කන්දරාව ඉතිරි වූ බැවිනි. ඒ නිසාම ඔවුන්ගේ කොමිස් මුදල් ගැරීම ද නතර වී තිබුණේය.

මෙහිදී අපගේ මතකයට නැගෙන්නේ බස්නාහිර පළාත් සභාවේ සියලුම මන්ත්‍රීවරුන්ගේ සුව පහසුව සඳහා එකක් රුපියල් හය ලක්ෂයක් පමණ වන පුටු මිලදී ගැනීමට පසුගිය පළාත් සභාවේ බලධාරයන් පිරිසක් විසින් ගන්නා ලද උත්සාහය ගැනය. එදා එම සිද්ධියට ජනමාධ්‍ය ඔස්සේ අනාවරණය වීම නිසා අවසන් මොහොතේ නතර කෙරුණේය.

ඉකුත් වසර තුනකටත් වැඩි කාලවකවානුව තුළ මෙරට කිසිදු පළාත් සභාවක දේශපාලන බලධාරින් පත් නොවීම නිසා එවැනි මහා පරිමාණ මට්ටමේ කොමිස් ගැහිලිවලටද වැට බැඳුණේය.

මෙහිදී අප විසින් මතු කරන ප්‍රධානතම ප්‍රශ්නය වන්නේ මුළු රටේම මුදල් කාබාසිනියා කෙරෙන පළාත් සභා ක්‍රමය තවදුරටත් පවත්වා ගෙන යා යුතුද යන්නය. අප එසේ කියන්නේ මෙරට කිසිදු පළාත් සභාවක දේශපාලන නායකත්වයක් ක්‍රියාත්මක නොවූ පසුගිය තුනක් වසරකටත් වැඩි කාලය තුළ දේශපාලන බලධාරීන් නොසිටීමේ අඩුවක් ජනතාවට නොවැටහුණු බැවිනි. අපට පෙනෙන අන්දමට නම් නිලධාරි පාලනයක් යටතේ පළාත් සභා ක්‍රියාත්මක කෙරුණු එම කාලය තුළ මෙරට හැම පළාත් සභාවකින්ම ප්‍රමාණවත් ජනතා සේවයක් ඉටු වී තිබුණේය.

අනෙක් අතට 1987 වසරේදී එවකට පැවැති ජේ.ආර්.ආණ්ඩුව මගින් මෙරටට ප්‍රථම වරට පළාත් සභා ක්‍රමයක් හඳුන්වා දෙන ලද්දේ උතුරේ කොටි ත්‍රස්තවාදීන්ට යම් සීමිත පාලන බලයක් ලබා දී ප්‍රභාකරන් ඇතුළු කොටි සංවිධානය ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවාහයට යොමු කරවා ගැනීමේ උපක්‍රමයක් වශයෙනි. එයටද ජේ.ආර්.ජයවර්ධන ජනාධිපතිවරයා පෙලඹී ගොස් තිබුණේ ඉන්දීය රජයේ බලපෑමටය. එසේ වුවද කොටි නායකයා එකී පළාත් සභා ක්‍රමය පිළි නොගත්තේය. අන්තිමේදී එම කරුමයටද කර ගැසීමට සිදු වූයේ සෙසු පළාත් වල විසූ ජනතාවටය. අප එසේ කියන්නේ ජේ.ආර්.ආණ්ඩුව මගින් 1987 දී හඳුන්වා දෙන ලද පළාත් සභා ක්‍රමය තනිකරම සුදු අලියකුගේ තත්ත්වයට පත් වී ඇති බැවිනි. කෙසේ වෙතත් පළාත් සභා ක්‍රමය මැනවින් සහ නිසි අයුරින් ක්‍රියාත්මක කරන තත්ත්වයක්

● මුරුත්තෙට්ටුවේ ආනන්ද හිමි

යටතේ නම් එමගින්ද ප්‍රදේශවාසීන්ට යම් සෙතක් සලසා ගත හැකිව තිබුණ බව අපගේ ද විශ්වාසයයි. එසේ වන්නේ ඒ ඒ පළාත් වලට ආවේණික ස්වභාවික සම්පත්, එම ප්‍රදේශ වල පවතින ප්‍රශ්න සහ දුෂ්කරතා පමණක් නොව ඒවාට ලබා දිය යුතු නිශ්චිත විසඳුම් ආදිය පිළිබඳව ඉතා හොඳ අවබෝධයක් ඇත්තේ අදාළ ප්‍රදේශවල වෙසෙන ජනතාවට බැවිනි.ඒ අනුව ඔවුන් මුහුණ පා සිටින ප්‍රශ්න සහ දුෂ්කරතා මග හරවා ගැනීම සඳහා යෙදිය යුතු නිශ්චිත විසඳුම් ගැන ඉතා හොඳ දැනුමක් ඇත්තේ ඔවුන්ටය. ඒ ඔවුන්ට අදාළ ප්‍රශ්න සහ දුෂ්කරතා පිළිබඳ ප්‍රායෝගික අත්දැකීමක් ඇති බැවිනි. එහෙත් මධ්‍යම ආණ්ඩුව යටතේ කොළඹින් එවනු ලබන විශේෂඥයන්ට හෝ ඉංජිනේරුවන්ට ඒ පිළිබඳව ඇත්තේ පොත පතට පමණක් සීමා වන දැනුමකි. එම තත්ත්වය යටතේ අදාළ ප්‍රශ්න වලට නිවැරදි සහ සාර්ථක විසඳුමක් ලබා දිය හැක්කේ මුලින් සඳහන් කළ පරිදි ඒ ඒ පළාත්වල ජනතාවටය.

ඇතැම් විට 13 වැනි ව්‍යවස්ථාවෙන් හඳුන්වා දෙන ලද පළාත් සභා ක්‍රමය මගින් එවැනි සාර්ථක ක්‍රමවේදයක් ක්‍රියාත්මක කරවීමට එදා ජේ. ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාද සිතන්නට ඇතුවාට සැක නැත. එහෙත් ප්‍රශ්නය වී ඇත්තේ පළාත් සභා ක්‍රමය මගින් සපුරා ගැනීමට බලාපොරොත්තු වූ එම උතුම් පරමාර්ථ ආරම්භක යුගයේදීම යටපත් වී දේශපාලන බල අධිකාරියක් පළාත් සභා ක්‍රමය තුළ ක්‍රියාත්මක වීම ය.

බලයට පත්ව සිටින ආණ්ඩුවේ උදවුකරුවන්ට රැකියා සැපයීම එවැනි එක් අරමුණකි. ඒ හැර එම පිරිසට තමන්ගේ ආණ්ඩුවේ පාලනය යටතේ විවිධ ව්‍යාපෘති අරඹා එමගින් කොමිස් ගැසීමට ඉඩදීම තවත් ප්‍රතිලාභයකි. බස්නාහිර පළාත් සභාව මගින් එකක් රුපියල් ලක්ෂ හයක් පමණ වටිනා සුව පහසු ආසන තොගයක් මිලට ගැනීමට සූදානම් වීම ඒ සඳහා කදිම උදාහරණයක් ලෙස දැක්විය හැකිය. තමන්ගේ පාක්ෂිකයන්ට රැකියා සැපයීම තවත් එවැනි ප්‍රතිලාභයකි. තමන්ගේ පාලනය යටතේ තිබෙන පළාත් සභා මගින් ඉහත සඳහන් ඵල ප්‍රයෝජන 1987 සිට මේ දක්වා පත්වූ හැම ආණ්ඩුවක්ම ලබා ගෙන ඇති බව විශේෂයෙන් ම සඳහන් කළ යුතුය.

එනයින් බලන විට මෙරට පැවති හැම පළාත් සභාවක්ම මහජන මුදල් කාබාසිනියා කළ සුදු අලියෙකු බවට පත් වී තිබුණේය. එමගින් ලැබෙන ඵල ප්‍රයෝජන වලට වඩා සිදු වී තිබෙන මහජන මුදල් නාස්තිය වැඩිය. පළාත් සභා පිහිටුවීමේ දී සැලකිල්ලට ගැනුණු මූලික පරමාර්ථයන් ද එමගින් ඉටු නොවූ බව පිළිගත යුතු සත්‍යයකි.

කෙසේ වෙතත් අපගේ අදහස වන්නේ වසර 34 කට ආසන්න කාලයක් තිස්සේ දිගින් දිගටම අසාර්ථක වූ සහ මහජන මුදල් කාබාසිනියා කළ පළාත් සභා ක්‍රමවේදය අවලංගු කළ යුතු බවය. එමගින් යම් පරිපාලනමය අඩුවක් ඇති වුවහොත් වසර 150 කට ආසන්න කාලයක් තිස්සේ මෙරට ක්‍රියාත්මකව පවතින පළාත් පාලන ආයතන සතු බලතල වැඩි කිරීමෙන් එය පිරිමසා ගත හැකි බව අපගේ අදහසයි.

එමගින් පළාත් ප්‍රධාන අමාත්‍යවරුන් ඇතුලු පළාත් ඇමති මණ්ඩල සහ ඔවුන්ගේ පෞද්ගලික කාර්ය මණ්ඩල ඉබේටම අහෝසි වන බැවින් එම අමතර මුදල් නාස්තිය ද අවම කෙරේ. ඒ අනුව සිදු කළ යුතු ව ඇත්තේ දැනට පවතින මහ නගර සභා ඇතුළු සියලුම පළාත් පාලන ආයතන සතු බලතල වැඩි කිරීමය. පළාත් පාලන ආයතන සතු බලතල වැඩි කිරීම සඳහා මෙරට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීමට ද අවශ්‍ය නොවන බව අපගේ විශ්වාසයයි. ආණ්ඩුවට පළාත් සභා සුදු අලියා කැළයට පලවා හැරීමට සැබෑ අවශ්‍යතාවක් ඇත්නම් ඒ සඳහා කළ යුත්තේ පළාත් පාලන ආයතන සතුව තිබෙන බලතල ප්‍රමාණය වැඩි කර මෙරට සියලුම පළාත් සභා සදාකාලික නිද්‍රාවට පත් කිරීමයි.

35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස්, කොළඹ 10.
දුරකථන පොදු: 011-2429429, 011-2421181, 011-2331181
කර්තෘ: 011-2429261 ජ්‍යෙෂ්ඨ සම කර්තෘ: 011-2429263
කර්තෘ මණ්ඩලය: 011-2429262-3-4-5
ෆැක්ස්: 011-2429260 (සිළුමිණ)
ඊ-මේල්: edmediaunit@gmail.com
දැන්වීම් කළමනාකරු: 011-2429351
ලුහුඬු දැන්වීම් කළමනාකරු: 011-2429341-2

වෂී 2021ක් වූ මාර්තු මස 28 වැනිදා ඉරිදා

අභිමානවත් 91 වසරක්

ලංකාවේ පරිණතම ඉරිදා පුවත්පත වන සිළුමිණට මාර්තු 30 වැනිදාට වසර 91 ක් පූර්ණය වේ. සති අන්ත පුවත්පත් අතර එදා සිට අද දක්වා අවිච්ඡින්නව පැවත එන එක ම ජාතික පුවත්පත වන්නේ සිළුමිණයි. අනූ එක් වසරක් යනු පුද්ගල ජීවිතයක නම් ඇසුපිරූ තැන් ඇති පරිණතම අවදියයි. පුවත්පතක් විෂයයෙහි එය තවත් යමක් එකතු වෙයි. එනම් ඇසු පිරූ තැනින් නොනැවතී පාඨක සමාජය සමඟ ස්වකීය දැනුම් සම්භාරය බෙදා හදා ගැනීමයි. පාඨකයාට කිසිවක් ප්‍රධානය කිරීම සේම යළිත් පාඨකයාගෙන් කිසිවක් ලබා ගැනීම ද ඵලදායී පුවත්පත් කලාවේ සම්ප්‍රදායයි. ඒ පෝෂණ - ප්‍රතිපෝෂණ සම්ප්‍රදානය මැනවින් එදා සිට රැකි පුවත්පතක් වශයෙන් සිළුමිණ සිය ලකුණ සටහන් කරයි.

සිළුමිණ බිහිවෙන 1930 වර්ෂය යනු පුවත්පතකට කළ හැකි විස්මිත හා ප්‍රහාසම්පන්න සමාජ මෙහෙවරෙහි විහිවය කෙරෙහි අපමණ විශ්වාසයක් තැබිය හැකි කාලයකි. තොරතුරු සන්නිවේදනය වාණිජ මට්ටමට රැගෙන යෑමේ සමාරම්භකයා ලෙසින් අවිවාදිත ව හඳුන්වා දිය හැකි ලේක්හවුස් නිර්මාතෘ ඩී. ආර්. විජයවර්ධනයන් සිළුමිණ බිහිකරන අවදිය එතරම් ම ප්‍රබල ය. අමාරුවෙන් ආරම්භ කළ බොහෝ පුවත්පත් වැසෙන, අධිරාජ්‍යවාදයේ කළු සෙවණැලි හොල්මන් කරන පසුබිමක ලේක්හවුස් ආයතනය ආරම්භ කරමින්, වැහෙන්නට ගිය පුවත්පත් මිලට ගනිමින් ඔහු කළ පුවත්පත් විප්ලවය හා සම කළ හැකි විප්ලවයක් ආසියානු කලාපය ඇතුළත සොයාගත නොහැකි තරම් ය. ඒ විප්ලවයේ අසමසම ආලෝක කදම්බය සිළුමිණයි.

සිළුමිණ 91 වැනි වියට පාතබද්දී එය බිහිකිරීමේ ලා අපමණ වෙහෙස ගත් නියමුවාණන් සිහි කරන්නේ ගෞරවයෙනි. ඩී. ආර්. විජයවර්ධනයන් හා එක් ව සිළුමිණ බිහි කිරීමේ බර කරට ගත් සිළුමිණ ප්‍රථම කර්තෘ පියසේන නිශ්ශංකයන් ද; සිළුමිණ නාමය තැබූ රත්මලානේ ධර්මාරාම හිමියන් ද; ඉරහඳ පවතිනා තාක් කල් පවතින්නට නැකත සෑදූ බෙන්තර වළල්ලාවිට කෝරලයේ සංඝනායක මහ නාහිමියන් ද අවසෙස් ව මේ පුණ්‍යානුමෝදනාවේ කොටස්කරුවන් ය.

සිළුමිණ බිහි වූ 19 වැනි ශතවර්ෂයට අයත් වකවානුවේදී ලංකාවේ නිදහස සම්බන්ධ විවිධ කතාබහ හා විචාර ඇතිවෙමින් පැවැතිණි. උගත් ස්වදේශික ජනතාව විවිධ මට්ටමේ සංවිධාන පිහිටුවා ගනිමින් ලේ වැගිරීම්, සන්නද්ධ අරගලවලින් තොර සංස්කෘතික නිදහසක් වෙනුවෙන් පෙළ ගැසෙමින් සිටියහ. ලෝකය පුරා ම එකී වකවානුව වෙන විට යටත් විජිත වාදයට එරෙහි සංස්කෘතික අරගලයක් පිළිබඳ ගිනිසිළු නැඟෙමින් පැවතිණි. එවන් වකවානුවක පවතින සමාජ, ආර්ථික, සංස්කෘතික කාරණා සැලකිල්ලට ගැනීමේදී සිළුමිණ වන් සතිඅන්ත පුවත්පතක් ආරම්භ කිරීමේ දුෂ්කරත්වය ගැන අටුවාටීකා අවැසි නැත.

අකුරු කියා සංකේත පද්ධතියක් තිබූ පලියට හා ඒවා කඩදාසි මත යකඩින් සැඳි මුද්‍රණ යන්ත්‍රයකින් මුද්‍රණය වූ පමණින් එහි සහෘදය ගැටලු හා සංවාද නැත්නම් ජනරංජනීය හා ජනතාකර්ෂණීය පුවත්පතක් බිහිවන්නේ නැත. අධ්‍යාපනය, විනෝදාස්වාදය, තොරතුරු සම්පාදනය හා පෙලඹවීම යන මූලික සන්නිවේදන අවශ්‍යතා සියල්ල පුවත්පතක සංගෘහිත නොවන්නේ නම් එය පාඨකයා වෙතින් ප්‍රතික්ෂේප වේ. රටේ ලොකු - කුඩා, උගත් - නූගත් සෑම තරාතිරමක ම කියවන පිරිස අත රැඳෙන; ඔවුන්ට සමීප පුවත්පතක් වන්නට නම් එහි ලියැවෙන අන්තර්ගතය පාඨකයාට සමීප විය යුතු ය. කමලා ළමා සමාජයේ සිට, නවා පොතක් සේ සකසා ගත හැකි ශාස්ත්‍රීය අතිරේකය දක්වා සිළුමිණ පාඨක විවිධත්වයට ගරු කළේ ය. ඒ අතින් මෙරට පුවත්පත් අඹර තුළ විශිෂ්ටත්වයේ කීර්තිය ලද එක ම පුවත්පත සිළුමිණ බව තහවුරු කරන හොඳ ම ලකුණ වන්නේ එය මෙරට ජනතාව අතරේ සත දහයේ විශ්වවිද්‍යාලය ලෙස ලත් විරුදාවලිය නිසා ය. දේශීය විශ්වවිද්‍යාල බිහි වී නැති වකවානුවක, බලවත් හා ධනවත් එක් පිරිසක් විදෙස් විශ්වවිද්‍යාලවල අධ්‍යාපනය ලබද්දී ඒකභාෂික දේශීය පාඨකයන්ට විශ්වවිද්‍යාලයක දැනුම් පරාසය ලබා දුන්නේ සිළුමිණ යි. එකී බුද්ධිමය දානයට ප්‍රතිගෞරව කරනු වස් ජනතාව සිළුමිණට ජනතා සම්මානය දුන්නේ දෙවරක් නොසිතා ය. හින්න රුචිකත්වයට ගරු කරන සිළුමිණ අදත් ඒ සම්ප්‍රදායට ගරු කරන්නේ පාඨක ප්‍රතිපෝෂණයට ගරු කරමිනි. මාර්තු 30 දා සිළුමිණ පා තබන නවවැනි දශකයේ මුල්භාගය වූ කලී පුවත්පත් කලාවට පොදුවේ අභියෝග රැසක් එල්ල කරන වකවානුවකි. මේ වකවානුව සිළුමිණ බිහි වූ 30 දශකය මෙන් තොරතුරු සොයා ගැනීමේ මාධ්‍ය විරල වකවානුවක් නොවේ. තොරතුරු සම්පාදනයේ, බෙදාහදා ගැනීමේ මහා තරගයක් නිර්මිත වකවානුවකි. එදා මෙන් මාධ්‍ය විරල නැත; ඇත්තේ පළමුවැන්නා වීමේ තරගයකි. ඒ තරගයට තරගයක් දීමට නම් සිළුමිණ ද යාවත්කාලීන තොරතුරු සංගෘහිත සන්නිවේදන මාධ්‍යයක් විය යුතු ව තිබේ. පවතින ප්‍රවණතා හමුවේ වෙනස් වෙමින් වුව ද සදාචාර සම්පන්න මාධ්‍ය කලාවක් පවත්වා ගෙන යෑමේ ලා වත්මනෙහි සිළුමිණ ඉදිරියේ දැවැන්ත අභියෝගයක් තිබේ. කවර සමාජාර්ථික හෝ දේශපාලනික වෙනසක් වුව ද සිළුමිණ ජනතාව වෙත සමීප කර වූ එහි ආරම්භක අධිෂ්ඨාන වෙත අනවරත ව කාල තරණයක යෙදෙන්නට පත්තර මහගෙදරින් එළිදකින සිළුමිණ ශක්තිමත් බැව් කිව යුතු ම ය. සිළුමිණ මාධ්‍ය ලොව ඇතුළත සිළුමිණක් ව වැජඹෙන්නේ මෙකී උත්තුංග ශක්තිය නිසා ය.

පවතින දහසක් අභියෝග මැද වුව පාඨක විශ්වාසය රැක ගැනීමත් එකී විශ්වාසයට ගරු කිරීමත් අදටත් සිළුමිණ දැන මන පොබයන පුවත්පතක් වීමෙහි රහසයි. සිළුමිණ සන්නාමයක් ව එදා මෙදා තුර බිහි වූ සියගණන් පුවත්පත් අතරේ බැබළෙන්නේ හා ඒවාට ද පූර්වාදර්ශයක් වෙන්නේ එය වටා අද දක්වා රැඳී සිටින සුවහසක් පාඨක සහෘදය ප්‍රජාව නිසා ය. පුවත්පතේ ජීවය රඳවන මේ සමස්ත පාඨක ප්‍රජාවට අපගේ ප්‍රණාමය නිබඳ ව ම හිමි විය යුතුය.

අනූඑක්වසරක් යනු පුවත්පතකට පරිණතම අවදියකි. පාඨක සහෘදය ප්‍රජාව හා අර්ථ සම්පන්න සහසබඳතාවක් දශක නවයක් තිස්සේ අවිච්ඡින්නව පවත්වා ගෙන යෑම පහසු කරුණක් නොවේ. සිළුමිණට 91 සපිරෙද්දී එය මෙරට මාධ්‍ය කලාවේ සන්නාමයක් බවට පත්වෙන්නේ එබැවිනි.

‘ආර්ථික සමිහාධක පනවන්න ඉඩක් නෑ’

මහාචාර්ය ගාමිණී සමරනායක

● **සුහද්‍රා දේශප්‍රිය**

මෙවර ජිනිවාහිදී පැවැතියේ 46වැනි මානව හිමිකම් කවුන්සිලයයි. 40 වැනි මානව හිමිකම් කවුන්සිලයට ඉදිරිපත් කරනු ලැබූ කරුණු වාර්තාව පදනම් කරගෙන ජර්මනිය, කැනඩාව මොන්ටෙනිග්‍රෝ, මලාවි, මැසිඩොනියාව සහ එක්සත් රාජ්‍යය ඇතුළු කේන්ද්‍රීය කණ්ඩායම් විසින් ශ්‍රී ලංකාවේ සංහිඳියාව වගවීම සහ මානව හිමිකම් ප්‍රවර්ධනය යන තේමාව යටතේ යෝජනාවක් ඉදිරිපත් කරන ලදී. එම යෝජනාව ඉදිරිපත් කළ අවස්ථාවේ දී චීනය ඒ පිළිබඳව ජන්දයක් පවත්වන ලෙසට ඉල්ලීමක් කරන ලදී.

මේ අවස්ථාව ලංකාව 2014 පසු නිර්හීතව ජන්දයකට මුහුණ දුන් පළමු අවස්ථාවයි. ඉන් පෙර ඇමරිකා එක්සත් ජනපදය මැදිහත් වීමෙන් 2012 ,2013, 2014 මාර්තු කවුන්සිලය පැවැත්වූ අවස්ථාවේදී ජන්දය පැවැත්විණි. එහිදී ලංකාවට පක්ෂව ජන්ද 12ක් හිමි විය. 2015 එවකට පැවැති රජය විසින් මානව හිමිකම් කොමිසමට ඇමරිකා එක්සත් ජනපදය විසින් ඉදිරිපත් කරනු ලැබූ යෝජනාවට ලංකාව විසින් සම අනුග්‍රාහකත්වයක් දක්වනු ලැබිණි. ඒ අනුව සම අනුග්‍රාහකත්වය 30/1 යෝජනා යටතේ විය. ඉන්පසු 2017 2018 සහ 2019 වසරවලදී 34/1 සහ 40/1 යෝජනා ඉදිරිපත් කිරීමේදී එම රජය නිහඬ වී සිටි බවක් පෙනිණි.

මෙවර පැවැති ජිනීවා 46වැනි සමුළුවේදී ප්‍රධාන වශයෙන් ‘ශ්‍රී ලංකාවේ සංහිඳියාව‘ වගවීම හා මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම’ පිළිබඳ 2019 මාර්තු 40/1 දරන යෝජනාවලියට පසුගිය රජය දැක්වූ සම අනුග්‍රහාකත්වයෙන් ශ්‍රී ලංකා රජය ඉවත් විය, එය මේ රටේ ජනතාව විසින් නව රජය පිළිබඳව වඩා ඇගැයීමට ලක් කළ කරුණකි.

මෙහිදී ලංකාවට පක්ෂව මානව හිමිකම් උල්ලංඝනය නොවුණ බව සඳහන් කරමින් චීනය, රුසියාව, බංගලාදේශය, පකිස්ථානය, රුසියාව කියුබාව බොලිවියාව, පිලිපීනය, සෝමාලියාව, උස්බකිස්තානය, වෙනිසියුලාව ඇතුළු රටවල් ජන්දය ප්‍රකාශ කරනු ලැබිණි. මෙහි ඇති විශේෂත්වය නම් ඉතිහාසයේ වසර හාරසිය පනහක් පමණ අප යටත් කර ගනිමින් සිටි රටවල් කිසිවක් අපිට පක්ෂව ජන්දය නොදීමයි. ඊට අමතරව මේ කවුසිලයේ හතළිස් හත් දෙනෙක් සිටින අතර එහි එකොළොස් දෙනෙකුගෙන් ශ්‍රී ලංකාවට පක්ෂව ජන්දය ලැබුණි. ඊට අමතරව රටවල් දාහතරක් ජන්දය දීමෙන් වැළකී සිටියහ. ඉන්දියාව, ජපානය, ඔස්ට්‍රේලියාව, සුඩානය, ලිබියාව, නේපාලය ඇතුළත් තවත් රටවල් ජන්දය දීමෙන් වැළකී සිටින ලදී.

අසූවිවළක් බව පවසමින් 2018 මානව හිමිකම් කවුසිලයෙන් ඉවත් වූ ඇමරිකාව වර්තමාන ඇමරිකානු ජනාධිපති බලයට පත්වීමෙන් අනතුරුව මානව හිමිකම් කවුසිලයට නැවතත් මැදිහත් වන බව ප්‍රකාශ කර තිබිණි. මේ සිදුවීම් පිටුපස ප්‍රධාන හස්තය ඇමරිකාවයි. එහිදි ඇමරිකාව සමඟ ඉන්දියාව, ඔස්ට්‍රේලියාව, ජපානය සහ ඇමරිකාව යන රටවල් QUAD යන සංවිධානය සාමාජිකයෝ වෙති. ඔවුන් චීනයේ සේද මාවතට එරෙහිව සිටියදීත් ඉන්දියාව, ජපානය, ඔස්ට්‍රේලියාව, අමරිකාව ඒ පිළිබඳ වඩා සැලකිලිමත් නොවී ජන්දය නොදී සිටි බව පෙණිනි.

> **මෙය ලංකාවේ පරාජයක් ලෙස නොව තවත් සන්ධිස්ථානයක් ලෙස ගෙන එය ජයග්‍රහණය කිරීමට උත්සාහ කළ යුතුයි**

මෙහිදි සඳහන් කළ යුතුවන්නේ අසල්වැසි රට වන ඉන්දියාව පිළිබඳ මෙරට බොහෝ දෙනෙක් විශ්වාස කරනු ලැබුයේ මෙරටට විරුද්ධ ව ජන්දය ප්‍රකාශ කරයිද යන මතයයි. කොටි ව්‍යාපාරය ශක්තිමත් කරනු ලබන්නේ ඉන්දියාව බවත් බහුතරයකගේ අදහස වීමට එයට හේතුවයි. කෙසේ වෙතත් කොටි සංවිධානය විසින්ම ඉන්දියාවේ රජිව් ගාන්ධි මහතාව ඝාතනය කරනු ලැබිණි. ලංකාවේ දෙමළ ඩයස්පෝරාව තමිල්නාඩු දේශපාලඥයන් සියලු දෙනාගේම අපේක්ෂාව වූයේ ඉන්දියාවේ ජන්දය මෙරටට විරුද්ධව ලැබීමයි.

කෙසේ වුවත් ඉන්දියානු ප්‍රතිපත්තිය මේ කවුසිලයට සහභාගි වූ නියෝජිතවරයා සඳහන් කරන ලද අතර; එහිදි ඔවුන් සඳහන් කරන ලද්දේ ලංකාවේ මානව හිමිකම් ප්‍රතිපත්තිය කරුණු දෙකක් යටතේ හැඩ ගැසී ඇති බවයි.

ඒ ආකාරයට ලංකාවේ මානව අයිතිවාසිකම් පිළිබඳව ඔවුන්ගේ ප්‍රතිපත්තිය ශ්‍රී ලංකාවේ දෙමළ ජාතිකයන්ගේ සමානතාව, යුක්තිය, අභිමානය හා සාමය වෙනුවෙන් පෙනී සිටීම සහ දෙවැනි කරුණ ලෙස දක්වන්නේ ලංකාවේ එක්සත් භාවය, ස්ථාවරභාවය, භෞමික අඛණ්ඩතාව සහතික වීම වේ. මෙය ඊළාම්වාදීන්ට ඇත්ත වශයෙන්ම දරුණු පහරකි. දෙමළ ජනතාවගේ සමානතාව, යුක්තිය, ගෞරවය වෙනුවෙන් පෙනී සිටින අතර; ලංකාවේ ස්ථාවරත්වය එක්සත්භාවය භෞමික, අඛණ්ඩතාවය සහතික කිරීමද ඔවුන්ගේ ස්ථාවරයයි.

මේහිදී රටවල් 22ක් ජන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදී. මෙහි විශේෂත්වය නම් කිසිදු යුරෝපා රටක් අපිට විරුද්ධව ජන්දය නොදුන්සේම අපිට පක්ෂව ජන්දය දෙන්නේ එකම ආසියාතික රටක් වන දකුණු කොරියාව ජන්දය ලබා දෙයි. බංගලාදේශය වැනි රටවල් අපිට පක්ෂපාතිව ජන්දය දෙන ලදී. ඉන්දියාව, නේපාලය වැනි රටවල් ජන්දය දීමෙන් වැළකී සිටින ලදී. පිලිපීනයට ඇමරිකාවට යම් බලපෑමක් කළ හැකි රටකි. නමුත් පිලිපීනය මේ අවස්ථාවේදි ජන්දය දුන් බව පෙනෙයි. ආජන්ටිනාව ජන්දය ප්‍රකාශ කරන ලදි. සමස්තයක් ලෙස මේ තත්ත්වය යුරෝපිය රටවල එකතුවක් ලෙස සඳහන් කළ හැකියි.

ඒ කෙසේ වෙතත් මෙහිදී යම් සාධනීය ලක්ෂණ ඇති බව අපිට දක්නට ලැබෙන බව ඇතැමුන්ගේ අදහසයි. විශේෂයෙන් ලංකාවේ ජනාධිපතිවරයා හා අගමැතිවරයා ස්වාධීනව, නිර්භීතව කටයුතු කිරීම සම්බන්ධයෙන් මේ අවස්ථාවේ ස්තුතිවන්ත විය යුතුයි; එය අගය කළ යුතුයි. 2015 දි අපි මෙහිදී සම්පූර්ණ යටත් වීමකට භාජනය වීමක් දක්නට ලැබිණි. ඒ වගේම 2017 සහ 2019 දක්වා ඒ එසේ ම ඒ ආකාරයෙන්ම විය. මේ අවස්ථාවේදි එසේ නොවිණි. වත්මන් ජනාධිපතිවරයාගේ නායකත්වයෙන් භෞමික අඛණ්ඩතාව ස්වාධිපත්‍ය මෙන්ම මේ රටේ ආරක්ෂක සේවාවන් වල නියුතු සියලු නිලධාරීන්, හමුදාහටයන් වෙනුවෙන් පෙනී සිටි බවක් දක්නට ලැබිණි.

මේ මානව හිමිකම් මුවාවෙන් දේශපාලන අරමුණු මත යෝජනා ඉදිරිපත් කිරීමේ හැකියාවක් නැත. එම නිසා ඊළාම්වාදීන්වත් සතුටු වීමට හැකියාවක් නැත. මෙතැනදී දැනට සිදුවී ඇති කරණ නම් එම යෝජනාව සම්මත වීමයි. අපට බහුතරයක් නැති වීම සත්‍යයකි. ඔවුන්ගේ පැත්තෙන්ද ඔවුන්ගේ පසුබැසීමක් වෙයි. නමුත් කුඩා රටක් වශයෙන් අපිට චීනයේ, රුසියාවේ සහයෝගය ලැබුණි. ඒ නිසා අපිට සැබෑ මිතුරන් කවුද දුරස්ථව හෝ අපේ මිතුරන් කවුද යන කරුණ තේරුම් ගත හැකිය. මේ අනුව සිදුවන එක කාර්යයක් වෙයි. යුද අපරාධ පිළිබඳ සාක්ෂි සහතික කිරීමට දත්ත ගබඩාවක් පිහිටුවීමට මානව අයිතිවාසිකම් ලේකම්වරියගේ කාර්යාලයක් පිහිටුවීමට හැකියාවක් ලැබීම මෙහිදී සිදුවිය. ඒ සම්බන්ධයෙන් පැහැදිලි කරනු ලබනුයේ OHCHR යනුවෙනි.

ඔවුන්ට ලංකාවට පැමිණ ඒ කාර්යාලයක් පිහිටුවා යාහැකිය. මෙහිදී සඳහන් කළයුතු වන්නේ මේ කරුණ මතුවන්නේ LTTE ත්‍රස්තවාදී යුද අපරාධ සොයා බැලීමටය. නමුත් ඒ සම්බන්ධයෙන් සොයාබැලීමක් නොවිණි. එම ප්‍රදේශවල සිටිනු ලැබුයේ උතුරින් අතුරුදහන් වූවන්ට වඩා සරණාගතයන්ය. එතැන ඇති ගැටලුව ඔවුන් එම සරණාගතයන් නිතාමතාම ඇති කළාද යන්නයි.

ඇතැම් එල්ටිටිඊ හිතවාදීන් විසින්ම මේ වනවිටත් ඩයස්පෝරාව ලංකාව තුළත් ගෙන යනු ලබයි. ඒපමණක් නොව ආණ්ඩුවලට සෑහෙන බලපෑමක් ඇති කරනු ලබයි. විදෙස් රටවල සිටින එල්. ටී. ටී. ඊ ඩයස් පෝරාව මෙහෙයවන්නන්ට විශාල වත්කම් වෙයි. ඒ රටවල මැතිවරණ ව්‍යාපාර වලට දායක වෙයි. කෙසේවුවත් මානව හිමිකම් උල්ලංඝනය වීම සම්බන්ධයෙන් විමර්ශන වාර්තාවක් මානව හිමිකම් සමුළුවට ඉදිරිපත් කළ යුතුයි. එහිදී 47 , 48 සහ 49 යන සමුළුවලට ඉදිරිපත් කළ යුතුයි.



මේවන විටත් සිවිල් ජනතාව එල්ටීටීඊ ය විසින් පැහැර ගැනීම් සහ අතුරු දහන්වීම් පිළිබඳව යම් කිසි උද්ඝෝෂණයක් පවතී. එම පළාතේ ජනතාවගේ හඬක් මේ වනවිට නැඟෙයි. ඇතමුන්ට අමතකවුවද එල්ටීටීඊය විසින් එවකට දුවිඩ සිවිල් ජනතාව පලිහක් ලෙස එල්ටීටීඊය පාවිච්චි කරනු ලැබුණි. වැඩියෙන්ම ඔවුන් දුවිඩ දේශපාලඥයන් මරා දැමිණි. ඒ අනුව ඊළමට විරුද්ධව හඬනැඟූ අය මරා දැමිණි. නිලම් තිරුවෙල්වම් සහ ලක්ෂ්මන් කදිරගාමර් වැනි උගත්හු මරා දැමිණි.

කොටි සංවිධානය ආරම්භ වූ දින සිට එනම් 1975 වැනි කාලයේ දොරයප්පා නගරාධිපති මරා දැමීමෙන් ආරම්භ කළ මරා දැමීම් දිගටම සිදුවිය. එහෙත් ඔවුන්ගේ ව්‍යාපාරය 2009 අවසන් වුයේද නැත. තවදුරටත් ඒ සංවිධානයේ කටයුතු සිදු වෙයි. ඒ අයගේ දේශපාලන ඉලක්ක ලබා ගැනීමට ඔවුන් උත්සාහ කරනු ලබයි.

> **අපිට සැබෑ මිතුරන් කවුද දුරස්ථව හෝ අපේ මිතුරන් කවුද යන කරුණ මෙහිදී තේරුම් ගත හැකියි**

අපිට අලුත් අත්දැකීමක් සහ අලුත් අභියෝගයක් වුවද මානව හිමිකම් අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමේ චෝදනාව මෙරටට පමණක් එල්ල වූවක් නොවෙයි.

ඇත්ත වශයෙන්ම මෙතැනදී මේ රටේ රජය සහ මහජනතාවගේ සාතිශය බහුතරයගේ සහය රජයට හිමිවිය. විපක්ෂයේ දේශපාලන පක්ෂයක වචනයකින් හෝ සහයක් දුන්නේ නැත. රජය නියමාකාරයෙන් ප්‍රචාරක කටයුතු නොකෙළේ යැයි ඇතැමුන්ගේ අදහසයි. එසේ නොවන්නන්ට පක්ෂව තව ජන්දයන් ගතහැකි බව ඒ අයගේ අදහසයි. මානව හිමිකම් කවුන්සිලය යනු වඩා හොඳින් ඒ අයගේ බලය තහවුරු කරගැනීමට උත්සාහ කරන ස්ථානයකි. කෙසේ වෙතත් චීනයට ආර්ථික බලයක් තිබුණද දේශපාලනික වශයෙන් බලය පවත්වාගෙන යන්නේ නැත. ශතවර්ෂ ගණනාවක් සිට බටහිර රටවලට දේශපාලනයක බලයේ අවශ්‍යතාවය පවතී. ඒ හෙයින් ඔවුන්ට අවනත නොවීම හේතු කොටගෙන මේ කාරණාව අපිට මතු වී ඇති බව ඉතා පැහැදිලිය. අන්තර්ජාතික ක්ෂේත්‍රයේ අපේ හිතවතුන් අපි හඳුනා ගැනීමට මෙය හොඳ අවස්ථාවකි.

නැවත මෙවැනි තත්ත්වයන් ඇති නොවීමට කටයුතු කිරීම අපගේ වගකීමකි. අපේ රටේ දේශප්‍රේමීන් මෙන්ම විදේශ ප්‍රේමීන්ද වෙයි.

මෙහිදී ආර්ථික සමබාධක පැනවේ යැයි ඇතැම්හු විශ්වාස කරති. ඒ සඳහා අවකාශයක් මානව හිමිකම් කවුන්සියලයට නැත. අපි ඉතා සුබවාදිව මුහුණ දිය යුතුයි. මෙය ලංකාවේ පරාජයක් ලෙස නොව මෙය සටනේ තවත් සන්ධිස්ථානයක් ලෙස ගෙන එය ජයග්‍රහණය කිරීමට උත්සහා කළ යුතුයි. එය ජයග්‍රහණය කිරීමට එකාමෙන්ම එකට සිට ගනිමින් කටයුතු කළ යුතුයි.

කෑගල්ල හෙට්ටිමුල්ල බණ්ඩාරනායක මහා විදුහල

දරුවාගේ පාසලේ සංවර්ධනය වෙනුවෙන් ජීවිතයෙන් වන්දි ගෙවූ පියෙක්

අනතුර සිදුවූ ස්ථානය මෙහි දැක්වේ

කෑගල්ල පාසලක සිදුවූ බේදවාචකය

පාසලේ නඩත්තුවට සංවර්ධන මුදල් දෙමවුපියන් ලබා දී තිබියදීත් මෙසේ ශ්‍රමයද ලබාගැනීම සාධාරණද?

● **ඔස්වල්ඩ් ගොඩකුඹුර,**
රඹුක්කන විශේෂ

මාපියන්ට තම දරුවන් පාසලකට ඇතුළත් කිරීමද සටනකි. එහෙත් සටන එතැනින් නිමා නොවේ. දරුවා පාසලට ඇතුළත් කළ දිනයේ සිටම තවත් අභියෝග රැසකි. පාසලේ දෙමාපිය රැස්වීම්, ශ්‍රමදාන, උත්සව, මුදල් එකතු කිරීම් නිමාවක් නැත. දරුවා පන්තියෙන් පන්තිය ඉහළට යන විට ගුරුවරුන්ට තෑගිබෝග ලබාදීමටද අවශ්‍යය. මේ එකකට හෝ සහභාගි නොවුණේ නම් බොහෝවිට දරුවාට සිදුවන්නේ අමිහිරි අත්දැකීම්වලට මුහුණදීමටය.

දරුවන් වෙනුවෙන් වන මෙම තරගයේදී විවිධ පරිත්‍යාග සිදුකිරීමට දෙමාපියන්ට සිදු වේ. එවැන්නක් නිසා ඇතිවූ ශෝචනීය බේදවාචකයක් පසුගිය ඉරිදා කෑගල්ල හෙට්ටිමුල්ල ප්‍රදේශයෙන් වාර්තා විය. ඒ තම දරුවාගේ පාසල වෙනුවෙන් පියකුට ජීවිතයෙන් වන්දි ගෙවීමට සිදුවීමකි.

කෑගල්ල හෙට්ටිමුල්ල බණ්ඩාරනායක මහා විද්‍යාලයේ තෙමහල් ගොඩනැගිල්ලේ වීදුරු බිඳී තිබූ ජනේලයක් අලුත්වැඩියා කිරීමට සහය වීමට ගිය තිදරු පියෙක් අඩි විස්සක් පමණ ඉහළ සිට බිමට ඇද වැටීමෙන් මරණයට පත් විය. මෙසේ අවාසනාවන්ත ලෙස මරණයට පත්වූයේ හෙට්ටිමුල්ල තලගල පදිංචි නිශාන් භාග්‍ය ජනිත් වල්දෙනිය නමැති හතළිස් අට හැවිරිදි අයෙකි.

මියගිය අයගේ බිරිය වන ටී. ධම්මිකා ගීතානි ප්‍රියදර්ශනී වීරසිංහ පවසන්නේ මෙබන්දකි.

''අපි විවාහ වෙලා අවුරුදු විසිතුනක්. අපිට දරුවෝ තුන්දෙනෙක් සිටිනවා. ලොකු දුව පියුමි කල්‍යානි විශ්වවිද්‍යාල ශිෂ්‍යාවක්. දෙවැනි පුතා මහිත් ධනුවර කෑගලු විද්‍යාලයේ 12 වාණිජ අංශයේ ඉගෙන ගන්නවා. බාල දුව තෙවුමී නෙසන්යා හෙට්ටිමුල්ල බණ්ඩාරනායක විද්‍යාලයේ හය අරලිය පන්තියේ. මගේ මහත්තයා කොළඹ නැව් සංස්ථාවේ සේවය කළේ. එයා දිනපතාම ගෙදර ඉඳලා වැඩට ගියා. ඉරිදාට නිවාඩු නිසා ගෙදර ඉන්නවා.

නිශාන් භාග්‍ය සිය පවුලේ අය සමඟින්

මම ගලගෙදර පෞද්ගලික ආයතනයක ගබඩාවක සේවය කරනවා.ගිය ඉරිදා එයා තෙවුමී දුවගේ පාසලේ පිරිසිදු කිරීම් වැඩවලට උදවුවට ගියා. එයා මාව බයිසිකලයෙන් කෑගල්ලට ගෙනැවිත් ඇරලලා තමයි ඉස්කෝලෙට ගියේ. මහත්තයා ජනේල් ගලවමින් සිටි අයට උදවු කරන්න පන්ති කාමරයේ ඉඳලා ජනේලයෙන් බහින කොට බිමට වැටුණු බව කියනවා. මෙයාට මේවගේ වැඩ කරලා හුරු නැහැ. මේ වගේ දේවල්වලට පුහුණුවක් තියෙන අය යෙදවූවා නම් මගේ මහත්තයාට මෙහෙම දෙයක් වෙන්නේ නැහැ. තවත් තාත්තා කෙනෙක්ට මේවගේ දේවල් නොවෙන්න පාසල් පද්ධතිය තුළ වැඩ පිළිවෙළක් සකස් කරන්න කියලයි අපි ඉල්ලන්නේ.

මට දැන් රැකියාවත් අතහරින්න සිදුවෙනවා දරුවන් වෙනුවෙන්. රැකියාවට යන එන එක ගැටලුවක්. මගේ අම්මාත් සමඟ මහත්තයයි දරුවනුයි අපි මේ ගෙදර හිටියේ. මහත්තයාගේ තාත්තාත් එක්තැන්වෙලා ඇඳේ. මහත්තයා තමයි තාත්තාගේ හැම දෙයක්මත් කළේ. මාව පාසලේ අනධ්‍යයන කාර්ය මණ්ඩලයට සම්බන්ධ කරගන්න උත්සාහ කරන්නම් කියලා දුවගේ පාසලෙන් කිව්වා. මගේ මහත්තයා වෙනුවෙන් එහෙම අවස්ථාවක් ලබාදෙනවා නම් මට දරුවන් සමඟ වැඩි කාලයක් ගතකරන්න පුළුවන්.''

කෑගල්ල, දෙබත්ගම, උඩවත්ත පදිංචි එම්. පී. කපිල කුමාර වඩු කාර්මිකයෙකි. ඔහුගේ දරුවකුද මේ පාසලේ ඉගෙනුම ලබයි. පාසලේ තෙමහල් ගොඩනැගිල්ලේ වීදුරු බිඳුණු ජනේල් අලුත්වැඩියාවට ඔහු තවත් අයෙක් සමඟ සූදානම් වූවේ පාසලෙන් කරන ලද දැනුම්දීමකට අනුව එහි පැමිණීමෙනි. නිශාන් භාග්‍ය බිම ඇදවැටී ඇත්තේ ඔහුට උදවු කිරීමට යාමේදී බව කපිල කුමාර කියයි.

''මගේ පුතා මේ පාසලේ හය අරලිය පන්තියේ ඉගෙන ගන්නවා. පුතාගේ පන්තිභාර ටීචර් 21 වැනිදා පන්තිය සුද්ධ කරන්න තාත්තලා කීපදෙනකුට එන්න කියලා තිබුණා. මමත් උදේ අටට විතර ගියා. පන්තිභාර ටීචර් කිව්වා හය අරලිය පන්තිය තියෙන්නේ තුන්වෙනි තට්ටුවේ. ඒකේ ජනෙල්වල වීදුරු කැඩිලා පියන් ගලවන්න කියලා. මම පන්ති කාමරයේ ජනේලයකින් කොන්ක්‍රීට් තට්ටුවට පැනලා ජනෙල් පියනේ ඇණ ගලවන්න උත්සාහ කරමින් සිටියා.

එතකොට මේ තාත්තා පන්ති කාමරයට ඇවිත් මගෙන් ඇහුවා ඔයා ඔතනට ආවේ කෙහොමද කියලා. අර ජනේලයෙන් පැනලා තමයි ආවේ

මියගිය නිශාන් භාග්‍ය ජනිත් වල්දෙනිය

විදුහල්පති ජී.ආර්.චූටි මහත්තයා සහ වඩු කාර්මික කපිල කුමාර

ගෙන්වා ගන්නවා. අපේ පාසලට ක්‍රීඩා පිටියක් නැහැ. දරුවන් සෙල්ලම් කරන විට බෝල වැදිලා වීදුරු බිඳුණු ජනේල කීපයක් තිබුණා.වඩු කාර්මික දෙමාපියන් දෙදෙනෙක් එදා ගෙන්වා ගත්තේ ඒ ජනේල අලුත්වැඩියා කරගැනීමටයි. එක වඩු කාර්මික තාත්තා කෙනෙක් ආයුධයක් ගෙන එන්න නගරයට ගිය අතරේ අනෙක් වඩු කාර්මික තාත්තා ජනෙල් පියන් ගලවමින් ඉඳලා තියෙනවා. ඒ අතර තමයි මේ තාත්තා එයාට උදවු කරන්න කියලා ජනේලයෙන් එළියට යනවිට බිමට වැටිලා තියෙන්නේ.

එයාට අනෙක් තාත්තලා එක්ක වැට අලුත්වැඩියා කරන වැඩේට උදවු වෙන්න කිව්වාම දරුවා පන්තියකින් ගන්න දහය හමාරට විතර ආපසු යන්න ඕනෑ කියලා තමයි ජනෙල් හදන අයට උදවුවට එයාගේම කැමැත්තෙන් ගිහින් තියෙන්නේ.

මේ පාසල ආරම්භ කර තිබෙන්නේ 1860 අවුරුද්දේ. හයේ පන්තියේ සිට උසස් පෙළ දක්වා පන්ති පැවැත්වෙනවා. පාසල් ඉඩම අක්කර හතර හමාරක්.එම ඉඩම පුරා විසිරුණු ගොඩනැගිලි පනස් දෙකක් තිබෙනවා. මේ අවුරුද්දේ හයේ පන්තියට දරුවන් තුන්සිය හතරක් ඇතුළත් වුණා. පාසලේ දරුවන් දෙදහස් අටසියයක් පමණ ඉගෙන ගන්නවා. පාසල් සංවර්ධන සමිතිය මඟින් අනුමත රුපියල් එක්දහස් නවසියයක් පමණක් පාසලට දරුවන් එන එක පවුලකින් අය කරනවා. බොහෝ පවුල් අඩු ආදායම්ලාභී පවුල් නිසා අපි ඒකටත් බලපෑම් කරන්නේ නැහැ. රජයේ ආධාර ලෙස විශාල ගොඩනැගිලි ලැබුණත් පිළිසකර වැඩවලට ප්‍රතිපාදන ලැබෙන්නේ නැහැ. කවර ආණ්ඩුවකටවත් අවුරුදු පතා මේ පාසල් සියල්ලටම ප්‍රතිසංස්කරණයට මුදල් දෙන්න බැහැ.''

ජනීවා බැටළු හම ගැලවීම

"අපේ රටේ අභ්‍යන්තරයට පිටරටවලට ඇඟිලි ගහන්න දෙන්න බැහැ. ඒක නිසා ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය තානාපති ඩේවිඩ් ග්ලැස්ටන් නැවත එංගලන්තයට පිටත්කර යැවිය යුතුයි." යනුවෙන් ප්‍රකාශ කළේ රණසිංහ ප්‍රේමදාස හිටපු ජනාධිපතිවරයාය. 1989 වර්ෂයේ දී පැවති පාර්ලිමේන්තු මහ මැතිවරණයේ දී ඇතිවූ සිද්ධියක් මුල් කරගෙන එවකට ශ්‍රී ලංකාවේ සිටි බ්‍රිතාන්‍ය තානාපති ඩේවිඩ් ග්ලැස්ටන් යළි බ්‍රිතාන්‍යයට යැවීමට ක්‍රියා කළේ එවකට ජනාධිපතිව සිටි රණසිංහ ප්‍රේමදාසය. එම මැතිවරණයේ දී දික්වැල්ල ප්‍රදේශයේ ඡන්ද මධ්‍යස්ථානයකට ගිය බ්‍රිතාන්‍ය තානාපති ඩේවිඩ් ග්ලැස්ටන් මැතිවරණය පැවැත්වීම සම්බන්ධයෙන් යම් ප්‍රකාශයක් කර තිබුණි.

එදා රණසිංහ ප්‍රේමදාස මෙහෙම ප්‍රකාශ කළාට මෙදා හිටපු ජනාධිපති රණසිංහ ප්‍රේමදාසගේ පුත් වර්තමාන විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස ප්‍රකාශ කරන්නේ කුමක් ද?

"අපි ආණ්ඩුවට විරුද්ධව පිටරටවලට ගිහිල්ලා කේලම් කියන්නේ නැහැ. නමුත් මෙවර ජිනීවා මානව හිමිකම් සමුළුවේ දී ශ්‍රී ලංකාවට එරෙහිව යෝජනාව ජයග්‍රහණය කිරීම ගැන අපි කනගාටු වෙනවා. මේ යෝජනාව පරාජයට පත්වුණේ වර්තමාන ආණ්ඩුවේ දුර්වල විදේශ ප්‍රතිපත්තිය නිසයි." යනුවෙන් සජිත් ප්‍රේමදාස ප්‍රකාශ කළේ පසුගිය 25 වැනි දා පාර්ලිමේන්තුවේදීය.

46 වැනි ස්විස්ටර්ලන්තයේ ජිනීවා නුවර දී පැවති ජගත් මානව හිමිකම් සමුළුවේ දී ශ්‍රී ලංකාවට එරෙහිව ඉදිරිපත් කෙරුණු යෝජනාව සජිත් ප්‍රේමදාස විපක්ෂ නායක ඇතුළු මුළු විපක්ෂයට ම විහිළුවක් බවට පත් වී තිබේ.

"අපි පිටරටට ගිහිල්ලා කේලම් කියන්නේ නැහැ" යනුවෙන් සජිත් ප්‍රකාශ කළේ ඇයි?

බළලා මල්ලෙන් එළියට පනින්නේ සජිත්ගේ මේ කතාවත් එක්කය.

එක්සත් ජාතික පක්ෂය, සමගි ජන බලවේගය යන දේශපාලන පක්ෂ දෙකේ ම චින්තනය එකය.

තමන් පැරණි එක්සත් ජාතික පක්ෂයෙන් ඉවත් වී සිටින බව පෙන්වීමට සමගි ජන බලවේගය සෑහෙන උත්සාහයක් ගත්ත ද එලක් නැත. අලුත් බෝතලයේ ඇත්තේ පරණ වයින්මය.

එක්සත් ජාතික පක්ෂයේ නායක රනිල් මෙන් නොව තමන් නව ලිබරල් ආර්ථිකය ප්‍රතික්ෂේප කරන බවක් පෙන්වීමට සජිත් ප්‍රේමදාස විපක්ෂ නායකවරයා උත්සාහ ගනී.

සජිත් එහෙම උත්සාහ ගන්නේ ආචාර්ය හර්ෂ ද සිල්වා සහ ඉරාන් වික්‍රමරත්න දෙපස තබාගෙනය.

හර්ෂ සහ ඉරාන් යනු නව ලිබරල් ආර්ථිකයේ කප්පිත්තන් බව අමුතුවෙන් කිවයුතු නොවේ. ජිනීවාවල දී ශ්‍රී ලංකාවට එරෙහිව ඉදිරිපත් කෙරුණු යෝජනාව ගැන කිඹුල් කඳුළු හෙළා අමුතු දේශප්‍රේමයක් පෙන්වීමට සජිත් ඇතුළු සමගි ජන බලවේගය උත්සාහ දරයි. ශ්‍රී ලංකාවට එරෙහිව ඡන්ද විමසීම සඳහා ජිනීවා මානව හිමිකම් සමුළුවට එල්ල වුණු යෝජනාවේ වාර්තාවට පිටු 17 1/2 කි. මින් පිටු 15 1/2 ක්ම වෙන්කර තිබෙන්නේ ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයාගේ පාලන කාලය පිළිබඳවයි.

මෙම පිටු 15 1/2 තිබෙන අසත්‍ය චෝදනා සහ පසුගිය දිනවල රනිල්ලා, සජිත්ලා, අනුර කුමාරලා, සුමන්තිරන්ලා, විග්නේෂ්වරන්ලා, සම්බන්ධන්ලා, හකීම්ලා, රිෂාඩ්ලා මාධ්‍ය හමු පවත්වමින්, මාධ්‍ය නිවේදන සිදු කරමින් සිදුකරන ලද අසත්‍ය චෝදනා බව ඉතා පහසුවෙන් තේරුම් ගත හැකිය.

ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා බලයට පත්වූ දින සිට මේ දක්වා ගත වී ඇත්තේ වසරකුත් මාස 04 ක පමණ කාලයක් පමණි.

මෙම කාලයෙන් වසරකට ආසන්න කාලයක් කොවිඩ් - 19 හෙවත් කොරෝනා වසංගතය සමඟ පොරබැදීමට සිදුවිය.

ලෝකයේ දරුණුතම වසංගතයකට මුහුණ දෙමින් රට මේ ආකාරයට හෝ කළමනාකරණය කිරීම ගැන විපක්ෂය වචනයකුදු කතා කරන්නේ නැත. ඔවුන්ට අවශ්‍ය වී තිබෙන්නේ ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය නැති බව ජාත්‍යන්තරයට ගතු කීමටය.

ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිධුරයට පත්වීමෙන් පසුව මේ රටට අහිමි වී තිබෙන ප්‍රජාතන්ත්‍රවාදය කුමක්ද?

සජිත් ප්‍රේමදාස හා ලක්ෂ්මන් කිරිඇල්ල පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කළේ මාධ්‍ය නිදහසට බාධා එල්ල වී ඇති බවයි.

සමාජ මාධ්‍ය ජාලයේ විපක්ෂයේ කණ්ඩායම් සහ විපක්ෂයට ඉතා ඉහළ සහයෝගයක් ලබාදෙන මාධ්‍ය ජාලයක් දිගින් දිගට ම ආණ්ඩුවට ප්‍රහාර එල්ල කරයි. පැපොල් ගසක් කැපුව ද ඔවුන් එය නිර්මාණශීලීව බැරකරන්නේ ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයාගේ ආණ්ඩුව කැලෑ කපනවා බව ප්‍රකාශ කිරීමටය.

මෙරට ස්විස්ටර්ලන්ත තානාපති කාර්යාලයේ සේවිකාවගේ නාට්‍ය ජවනිකාවෙන් එම පැහැර ගැනීමේ සිද්ධිය බොරුවක් බව පැහැදිලි විය. ස්විස් තානාපති කාර්යාලයේ නාටකයේ අංක 02 පසුගිය දා රඟ දැක්වූයේ සමගි ජන බලවේගයේ ප්‍රබලයන් දෙදෙනකු වන දොස්තර රාජිත සේනාරත්න සහ ඔහුගේ පුත් චතුර සේනාරත්නයි.

මාධ්‍යවේදියකු පැහැරගැනීමට ලක්වූවා සේ රඟ දක්වමින් එහි වරද ආණ්ඩුව පිට පැටවීමට උත්සාහ කළ සිද්ධිය සම්බන්ධයෙන් රාජිතගෙන් සහ චතුරගෙන් රහස් පොලිසිය ප්‍රශ්න කරමින් සිටී.

සාමාන්‍යයෙන් ජිනීවා මානව හිමිකම් සැසිවාරය සමීප වන විට මේ ආකාරයේ නාට්‍ය ජවනිකා රඟ දැක්වීම සාමාන්‍ය සිද්ධියක් බවට පත්ව තිබේ. මෙම සිදුවීම්වලට අදාළ තොරතුරු ජිනීවා වෙත ගෙනයාමට පිරිසක් කල්තියා සූදානමින් සිටිය ද වෙබ් මාධ්‍යවේදියාගේ පැහැර ගැනීමේ සිදුවීම බොරුවක් බව හෙළිවීම නිසා ජිනීවාවලට ගෙන යාමේ උත්සාහය ව්‍යාර්ථ විය.

කිඹුල් නාටකයේ අංක 02 වෙබ් මාධ්‍යවේදියාගේ අතුරුදන්වීමේ නාටකය ගැන සමාජය මීට වඩා දැනුම්වත් විය යුතුයි.

මෙවැනි අසත්‍ය ප්‍රචාර දිගින් දිගට ම සිදුකරගෙන යනවා නම් ආණ්ඩුව නීතිමය ක්‍රියාමාර්ගවලට යා යුතුයි. එසේ නොවුණොත් මෙම අසත්‍ය චෝදනා වුව ද ඒවා ආණ්ඩුවේ ගිණුමට බැර කිරීමට විපක්ෂයේ පිරිස් කටයුතු කරනවා ඇත.

කැළෑ හෙළි පෙහෙළිකරන බව ප්‍රකාශ කරමින් විපක්ෂය තවත් චෝදනාවක් එල්ල කරන අතර එම චෝදනාව ද මානව හිමිකම් වාර්තාවේ සඳහන්වේ.

රාජ්‍ය ආයතනවල ඉහළ තනතුරුවලට ආරක්ෂක අංශ ප්‍රධානීන් පත් කිරීමෙන් එම ආයතනවල ද ප්‍රජාතන්ත්‍රවාදය නැති වන බවට ද විපක්ෂය චෝදනා නගයි.

මෙම චෝදනාවම ජිනීවා මානව හිමිකම් කවුන්සිලය ශ්‍රී ලංකාවට එරෙහිව එල්ල කළ යෝජනාවේ සඳහන් වේ.

මෙම චෝදනා එකම තැනකින් එන බව කීමට තවත් සාක්ෂි වුවමනා නැත.

එම්.ඒ. සුමන්තිරන් දෙමළ ජාතික සන්ධාන මන්ත්‍රීවරයා ද සිදුකරන්නේ මෙම චෝදනාවමයි. ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයාගේ කාලයේ සිදු වුණා යැයි කියන ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියා කුමක් ද?

ඒ සාක්ෂි සහිතව ප්‍රායෝගිකව ඔප්පු කිරීමට හැකි ද? ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයාගේ මේ දක්වා පාලන සමය තුළ වැඩිම අවධානයක් යොමුවූයේ කොරෝනා පාලනය කිරීම, සෞඛ්‍ය උපදෙස් හා නිරෝධායන ක්‍රියාවලියත්, ජන ජීවිතය නඟා සිටුවීම, ආදායම් අහිමි වූ ජනතාවට ආදායම් ලබාදීම, ගම සමඟ පිළිසඳර මඟින් ගම්වල ජනතාවගේ ගැටලු විසඳීම ඇතුළු කරුණු ගණනාවක් කෙරෙහිය. ජාතික ආරක්ෂාව යළි තහවුරු කිරීමට ගත් ක්‍රියාමාර්ග ද අමතක කළ නොහැක. මෙතැනදී සිදු වී තිබෙන මානව හිමිකම් කඩවීම කුමක් ද? කියා එක්සත් ජාතික පක්ෂය, සමගි ජන බලවේගය, ජාතික ජන බලවේගය ප්‍රමුඛ ජනතා විමුක්ති පෙරමුණ කරුණු ඉදිරිපත් කළ යුතුයි.

එසේ කරුණු ඉදිරිපත් නොකර සිදුකරන්නේ මඩ අවලාද නැගීම පමණි. ඒ සඳහා මුදල් දී ලබාගත් ෆේස්බුක් කල්ලි සිටිති.

මෙම ෆේස්බුක් කල්ලිවලට මුදල් පොම්පකරන්නේ ඇතැම් බටහිර රටවලිනි, ඇතැම් තානාපති කාර්යාල හරහා ද මුදල් පොම්ප බවට තොරතුරු වාර්තා වේ.

කොටි නිතවාදී දෙමළ ඩයස්පෝරාව ද මුදල් යහමින් වියදම් කරයි. ඇතැම් රාජ්‍ය නොවන සංවිධාන ද ඒ පිටුපස සිටී. ඔවුන්ට අවශ්‍ය කුමන හෝ ආකාරයකින් ආණ්ඩුවට එරෙහිව කුමන හෝ දෙයක් ප්‍රචාරය කිරීමට ය.

පැපොල් ගසක් කැපුව ද එය ෆේස්බුක් හරහා "ආණ්ඩුව ගස් කපනවා" යනුවෙන් ප්‍රකාශ කරන්නේ එම නිසාය.

ඒ තරමටම වර්තමාන විපක්ෂය දේශපාලනමය වශයෙන් බංකොලොත් වී සිටින්නේ ඔවුන්ට යන එන මං නැති වී තිබෙන නිසාය.

ශ්‍රී ලංකාවට එරෙහිව ජිනීවා මානව හිමිකම් කොමිසමට ඉදිරිපත් කරන වාර්තාවෙන් තවත් අසත්‍ය චෝදනාවක් මෙරටට එල්ල කරයි. ඒ රට මිලිටරිකරණය වී ඇති බවට එල්ල වන චෝදනාවයි.

ඇතැම් රාජ්‍ය ආයතන ප්‍රධානීන් ලෙස යුධ හමුදාවේ කීර්තිමත් නිලධාරීන් හෝ විශ්‍රාම ගිය නිලධාරීන් පත් කිරීම වරදක් වන්නේ කෙසේ ද? ඔවුන් මෙම චෝදනාව එල්ල කරනු ලබන්නේ ශ්‍රී ලංකාවට පමණයි.

ආරක්ෂක අංශ රට තුළ සුවිශේෂී කාර්යභාරයක් සිදු කරද්දී ඔවුන්ට එරෙහිව මෙසේ චෝදනා එල්ල කරනු ලබන්නේ කාගේ වුවමනාවට දැයි සිතා ගැනීමට අපහසු නොවනු ඇත. කොරෝනා ව්‍යවසනය හමුවේ ලෝකයේ ම නිරෝධායනයෙන් ඉහළ ම ස්ථානයක් හිමිකර ගත්තේ රටවල් 3 ක් පමණි. ඒ ශ්‍රී ලංකාව, ඊශ්‍රායලය සහ වියට්නාමයයි. නිරෝධායන ක්‍රියාවලිය ශ්‍රී ලංකාව ඉතා හොඳින් සිදු කරගෙන යන බවත් ඒ සඳහා මෙරට ආරක්ෂක අංශ සුවිශේෂී කාර්යභාර්යයක් සිදු කරන බවත් එක්සත් ජාතීන්ගේ සංවිධානය ද ප්‍රකාශ කළේ ය.

නිරෝධායන සහ සමාජ සුබ සාධන ක්‍රියාවලියේ දී ශ්‍රී ලංකාවේ ආරක්ෂක ලෝකයෙන් ම දෙවන ස්ථානය හිමිකරගත් බව ද එක්සත් ජාතීන්ගේ සංවිධානය ප්‍රසිද්ධියේ කියා සිටියේ ය.

එවැනි සහතිකයක් ලබා දීමෙන් අනතුරුවත් වර්තමාන ආණ්ඩුව යටතේ මෙරට මානව හිමිකම් උල්ලංඝණය වන බවට එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයට යෝජනා ඉදිරිපත් වෙන්නේ කෙසේ ද?

ඒ සඳහා ගතු කේලම් කියන්නේ මෙරට වර්තමාන විපක්ෂයයි.

නොයෙක් අවලාද, මඩ ප්‍රචාර ගෙනයමින් මෙම විපක්ෂය සිදුකරගෙන යනු ලබන මෙම ප්‍රචාර මේ වන විට මේ රටේ පොදු මහජනතාව වෙනදාටත් වඩා හොඳට අවබෝධ කරගෙන ඇත.

බ්‍රිතාන්‍ය සාම මන්ත්‍රී මණ්ඩලය නියෝජනය කරන නේස් බී ස්වාමිවරයාට ශ්‍රී ලංකාව ගැන තිබෙන කැක්කුම වර්තමාන විපක්ෂයට නොතිබීම ඉතාම කනගාටුදායකය. ඒ ගැන නේස් බී ස්වාමිවරයා සිය මවිතය ද පළ කරයි. "ශ්‍රී ලංකාව ලස්සන රටක්. ඒ රටේ ලස්සන නාස්තිකරලා රට වැනසුවේ කොටි නායක ප්‍රභාකරන්." නේස් බී ස්වාමිවරයාගේ මෙම කතාව රනිල්ගේ, සජිත්ගේ, අනුර කුමාරගේ, සුමන්තිරන්ගේ, මනෝ ගනේෂන්ගේ මුවින් පිටවෙන්නේ නැත.

ඔවුන්ගේ කටවල්වලින් ප්‍රකාශ වෙන්නේ ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිධුරයට පත්වීමෙන් අනතුරුව මේ රටේ මානව හිමිකම් උල්ලංඝනය වී ඇති බවයි.

ගෝඨාභය රාජපක්ෂ මේ රටේ සිදුකර තිබෙන මානව හිමිකම් කඩ කිරීම් මොනවා ද? කියා විපක්ෂයට නිශ්චිතවම ප්‍රකාශ කළ නොහැකිය. ඔවුන් සිදු කරන්නේ මඩ ප්‍රහාර එල්ල කිරීම පමණි.

පසුගිය වසරක කාලය තුළ සජිත් ප්‍රේමදාස, අනුර කුමාර දිසානායක, ආර්. සම්බන්ධන්, එම්.ඒ. සුමන්තිරන්, මනෝ ගනේෂන් ඇතුළු විපක්ෂයේ ජනතා නියෝජිතයන් පාර්ලිමේන්තුවේ දී සිදු කළ විවිධ ප්‍රකාශවල පිටපත් සම්බන්ධ කරගෙන ජිනීවාවලදී ශ්‍රී ලංකාවට එරෙහි යෝජනා සකස් වී තිබේ.

එකසත් ජාතීන්ගේ සංවිධානයේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් මිෂෙල් බැචලේ මූලින් ම ශ්‍රී ලංකාවට එරෙහිව ඉදිරිපත් කරන ලද යෝජනාවේත්, පසුගිය 22 වැනි දා ජිනීවා මානව හිමිකම් සමුළුවේ ඡන්ද විමසීමට ලක් කරන ලද ශ්‍රී ලංකාවට එරෙහි යෝජනාවට ද ඇතුළත් කර තිබෙන කරුණු සහ මෙරට විපක්ෂයේ ප්‍රවෘත්ති නිවේදන අතර කිසිදු වෙනසක් නොමැත.

මෙරට ඇතැම් රාජ්‍ය ආයතනවල ප්‍රධානීන් ලෙස විශ්‍රාමික හමුදා නිලධාරීන් පත් කිරීම, පළාත් සභා ඡන්දය පැවැත්වීම යන කරුණු සම්බන්ධයෙන් මෙම වාර්තාවට ඇතුළත් කොට තිබෙන යෝජනා සම්බන්ධයෙන් මෙම ගැළපීම් වඩාත් හොඳින් තහවුරු වෙයි.

විශ්‍රාමික හමුදා නිලධාරීන් ඇතැම් රාජ්‍ය ආයතනවලට යොදා ගැනීම සම්බන්ධයෙන් විපක්ෂය සිටින්නේ හරිම කනගාටුවෙනි.

ඊට හේතුව එම විශ්‍රාමික හමුදා නිලධාරීන් නිවැරදිව කටයුතු කිරීම නිසා එම ආයතන නිවැරදි මාවතකට රැගෙන යනවාට විපක්ෂය අකමැතිය. විශ්‍රාමික හමුදා නිලධාරීන් ඇතැම් රාජ්‍ය ආයතනවල ප්‍රධාන තනතුරුවලට පත්කිරීමට එරෙහිව පාර්ලිමේන්තුවේ විවිධ ප්‍රකාශ නිකුත් කරමින් මාධ්‍ය නිවේදන දිගට හරහට නිකුත් කරන ලද්දේ වත්මන් විපක්ෂයයි. පළාත් සභා ඡන්දය පැවැත්වීම සම්බන්ධයෙන් ද පාර්ලිමේන්තුව තුළ විවිධ ප්‍රකාශ නිකුත් කරමින් මාධ්‍ය හමු පවත්වමින් ආණ්ඩුවට චෝදනා කළේ ද වත්මන් විපක්ෂයයි.

පළාත් සභා ඡන්දය පැවැත්වීම කල්දැමීමට හේතු වී තිබෙන්නේ පසුගිය යහපාලන ආණ්ඩුව කාලේ දී පළාත් සභා පනතට ඉදිරිපත් කරන ලද සංශෝධනයයි.

එම සංශෝධනය හේතුවෙන් පළාත් සභා ඡන්දය පැවැත්වීම අතරමඟ නතර වී ඇත. එදා යහපාලන ආණ්ඩුව කාලෙදී පාර්ලිමේන්තු වෙලාව පැය 2 ක් 3 ක් දීර්ඝ කරගනිමින් ඇතැම් මන්ත්‍රීවරුන්ගේ සහාය විවිධ වරප්‍රසාද දී ලබාගෙන පාර්ලිමේන්තුවේ 3/2 ක් ලබාගෙන පළාත් සභා පනත සංශෝධනය කළේය.

නමුත් දැන් එය පවතින්නේ අතරමඟ තත්වයකය. පළාත් සභා ඡන්දය පැවැත්විය යුත්තේ නව මැතිවරණ ක්‍රමයකට ද? පැරණි ක්‍රමයකට ද? කියා තවම නිශ්චිත වශයෙන් ප්‍රකාශ කළ නොහැක.

එවැනි තත්වයක් ඇතිකළේ පසුගිය යහපාලන ආණ්ඩුව විසිනි. එම නිසා පළාත් සභා මැතිවරණය පැවැත්වීම ගැටලුවක් වී ඇති අතර එම ගැටලුව විසඳා ගැනීම සඳහා පාර්ලිමේන්තුවේ 3/2 ක බලයක් අත්‍යවශ්‍ය වී ඇත. ඉදිරි පළාත් සභා මැතිවරණය නව ක්‍රමයකට පැවැත්වුවත් පැරණි ක්‍රමයට පැවැත්වුවත් පාර්ලිමේන්තුවේ 3/2 ක බහුතරයකගෙන් යෝජනා සම්මතයක් කරගත යුතුව ඇත.

එවැනි තත්වයක් ඇති කිරීමට මූල් වූ යහපාලන ආණ්ඩුවේ නියෝජිතයන් විපක්ෂයට ගොස් අද වර්තමාන ආණ්ඩුවෙන් පළාත් සභා ඡන්දය පවත්වන්නේ කවද්ද? කියා ප්‍රශ්න කරයි. එම ප්‍රශ්න කිරීමට අද ජිනීවා මානව හිමිකම් සමුළු වාර්තාවෙන් ද ප්‍රශ්න කිරීම හරිම අපූරුවට ගැළපේ.

ශ්‍රී ලංකාවට එරෙහිව කටයුතු කරන රටවල්, දෙමළ ඩයස්පෝරාව ඇතැම් භයිඅ කල්ලි ක්‍රියාකරන ආකාරය සහ මෙරට විපක්ෂය කෙතරම් අවබෝධයකින් මෙම කටයුත්ත සිදුකරනවා ද යන්න හොඳින්ම පැහැදිලි වනු ඇත.

මෙසේ රට එක් පැත්තකින් පවා දෙන ගමන් සජිත් ප්‍රේමදාස විපක්ෂ නායක අනෙක් පැත්තෙන් කියා සිටින්නේ ශ්‍රී ලංකාවට අත පෙවීමට විදේශ රටවල්වලට ඉඩ ලබා නොදෙන බවයි.

වර්තමාන යුද හමුදාපති ලුතිනල් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වාට ඇමෙරිකාවට යෑමට ඉඩ ලබාදෙන ලෙස තමා ඉල්ලා සිටින බව සජිත් ප්‍රේමදාස පාර්ලිමේන්තුවේ දී ප්‍රකාශ කරයි.

නමුත් ජිනීවා මානව හිමිකම් කොමිසම් වාර්තාවෙන් අපේ රණවිරුවන්ට, විශ්‍රාම ගිය රණවිරුවන්ට එල්ල කරන චෝදනා ගැන සජිත් වචනයකුදු කතා නොකරයි.

එම සිද්ධීන්වලදී සජිත් සිටින්නේ බිරි අලින්ට වීණා වයනවා වැනි තත්ත්වයකය.

පසුගිය 24 වැනි දා පාර්ලිමේන්තුවේ සභානායක, විදේශ කටයුතු අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන විසින් සජිත් ප්‍රේමදාස විපක්ෂ නායකවරයාගෙන් ප්‍රශ්නයක් විමසන ලදී.

"විපක්ෂ නායකතුමා ඔබතුමා ඉන්නේ මොන පැත්තේ ද? ශ්‍රී ලංකාව පැත්තේ ද, ඊට එරෙහි පැත්තේ ද යනුවෙන් දිනේෂ් ගුණවර්ධන විමසන්නේය.

ඊට කිසිදු පිළිතුරක් නොදුන් සජිත් දිගට ම කතාව කරගෙන ගියේය.

තමා පෙනී ඉන්නේ ශ්‍රී ලංකාව වෙනුවෙන් බව සජිත්, කිරිඇල්ල ඇතුළු සමගි ජන බලවේගයේ කිසිවෙකු ප්‍රකාශ කළේ නැත.

ඊට හේතුව ඔවුන්ට එසේ කීමට නොහැකිවීමට හේතු ගණනාවක් ම තිබීමයි.

එසේ ප්‍රකාශ කළහොත් සමගි ජන බලවේගය සමඟ සිටින සමහරෙක් ඔවුන්ගෙන් ඇත්වනු ඇත. දෙමළ ඩයස්පෝරාව ඇතැම් NGO සංවිධාන ඇතැම් බෞද්ධ මිවාදී බලවේග දැනට සමගි ජන බලවේගය සමඟ කටයුතු කරන බව නොරහසකි. ජිනීවාවල ශ්‍රී ලංකාවට එරෙහිව එල්ලවන චෝදනා සහ විපක්ෂයේ මාධ්‍ය නිවේදන එකම පැනකින්, එකම අතකින් ලිවීම නිසා සමගි ජන බලවේගය ඇතුළු විපක්ෂය සිටින්නේ කුමන පැත්තේ ද කියා දැනගැනීම එතරම් අපහසු නොවනු ඇත.

"පසුගිය යහපාලන ආණ්ඩුව කාලයේ දී නම් ජිනීවා මානව හිමිකම් සමුළුවේදී මෙසේ ශ්‍රී ලංකාව පරාජය වන්නේ නැහැ." යනුවෙන් පාර්ලිමේන්තුවේ දී පැවසුවේ විපක්ෂයේ ප්‍රධාන සංවිධායක, ලක්ෂ්මන් කිරිඇල්ලය.

පසුගිය යහපාලන ආණ්ඩුව කාලයේ දී ජිනීවා මානව හිමිකම් කවුන්සිලයේ හැසිරීම කෙබඳුදැයි කියා අමුතුවෙන් කිව යුතු නැත.

රට උපරිම ආකාරයෙන් පාවා දුන්නා නම් ජිනීවා මානව හිමිකම් සමුළුවේ දී කිසිඳු ගැටලුවක් ඇතිවන්න් නැත.

යහපාලන ආණ්ඩුවේ විදේශ කටයුතු අමාත්‍ය, මංගල සමරවීර 30/1 යෝජනාව සඳහා ඇමරිකාව සමඟ සම අනුග්‍රාහකත්වය ලබා දෙමින් යෝජනාව ඉදිරිපත් කළේ ශ්‍රී ලංකාවට එරෙහිවයි.

ශ්‍රී ලංකාවට එරෙහිව ශ්‍රී ලංකාව විසින් ම යෝජනාවක් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් සමුළුවට ඉදිරිපත් වන විට ඉන් කෙතරම් ජොලියක් කොටි ඩයස්පෝරාවට ඇතිවන්නට ඇද්ද?

2002 - 2004 වසර කාලවල සටන් විරාම ගිවිසුම ක්‍රියාත්මක වෙද්දී හමුදා කඳවුරු ඉදිරිපිටට පැමිණෙන කොටි සාමාජිකයන් නිදහසේ මුත්‍රා කරන්නේ හමුදාවට කොලොප්පන් ද කරමිනි.

එවැනි තත්ත්වයක් යළි උදා කළේ පසුගිය යහපාලන ආණ්ඩුව ජිනීවාවලදී රට පාවා දුන් නිසාය. එහෙම කළා නම් කිසිම ගැටලුවක් ශ්‍රී ලංකාවට ඇතිවන්නේ නැත. රට ඒ ආකාරයෙන් පාවා දී ජිනීවා මානව හිමිකම් කවුන්සිලයේ සභතික ලබාගෙන තියෙන ප්‍රතිඵලය කුමක් ද?

වර්තමාන ආණ්ඩුව ප්‍රකාශ කරන්නේ ඒ ආකාරයෙන් රට පාවා නොදෙන බවයි.

රටවල් 22 ක් ශ්‍රී ලංකාවට එරෙහි යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරද්දී රටවල් 11 ක් එම යෝජනාවට විරුද්ධ වී තිබේ.

රටවල් 14 ක් ඡන්දය දීමෙන් වැළකී සිට ඇත. ඡන්දය දීමෙන් වැළකී සිටි සෑම රටක ම නියෝජිතයන් ප්‍රකාශ කළේ ශ්‍රී ලංකාවට එරෙහි මෙම යෝජනාව ඔවුන් පිළිනොගන්නා බවයි. මෙය ඉතාම වැදගත් වේ.

එවිට බහුතරයක් වන රටවල් 25 ක්ම සිටින්නේ මෙම යෝජනා පිළිනොගන්නා තත්වයකය. මෙම කාරණයට සජිත් ප්‍රේමදාස විහිළු සපයමින් ප්‍රකාශ කරනු ලබන්නේ ඒ ආකාරයට ගණන් බැලුවොත් තමා මේ රටේ ජනාධිපතිවරයා බවයි.

මේ ආකාරයෙන් විහිළු සපයන විපක්ෂ නායකවරයෙක් සිටීම මේ රටේ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයට කෙතරම් හිතකර වන්නේ ද? කියා සිතා බැලිය යුතුය.

ජිනීවාවලින් මෙසේ කාලකණ්ණි සතුටක් ලැබුවාට රටට ගැටලුවක් නොවේ. තමන්ගේ අභිමානය රැකගෙන රට ඉදිරියට යන ගමන් ජාත්‍යන්තරයේ විශ්වාසය සහ සහාය ලබා ගැනීමට වර්තමාන ආණ්ඩුව තීරණය කර ඇත.

නමුත් විපක්ෂයට අවශ්‍ය වී ඇත්තේ ජිනීවා මානව හිමිකම් සමුළුවේ දී ශ්‍රී ලංකාවට එරෙහිව යෝජනාවත් ඉදිරිපත් වී ඇති නිසා ඉදිරියේ දී රටට විවිධ ප්‍රශ්නවලට මුහුණ දීමට සිදුවෙනැයි කියමින් ජනතාව මානසිකත්වයෙන් වැටීටවීමටය.

ජිනීවා මානව හිමිකම් සමුළුවට ඉදිරිපත් වූ වාර්තාවෙන් ශ්‍රී ලංකාවට සම්බාධක පැනවීම වැනි ක්‍රියා කිසිඳු ආකාරයකින් සිදුකළ නොහැකිය.

මෙම මානව හිමිකම් කවුන්සිලය මඟින් ශ්‍රී ලංකාවට එරෙහිව සිදුකරන ක්‍රියා නීති විරෝධී බවත් එය එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය උල්ලංඝණය කර ඇති බවත් ආණ්ඩුව විසින් පෙන්වා දෙන ලදී.

එම නිසා ජිනීවා මානව හිමිකම් කවුන්සිලයෙන් ලබන කාලකණ්ණි සතුට තාවකාලික වන්නේ මේ වන විට වෘක වෙස්ගත් ජිනීවා මානව හිමිකම් කොමිසමේ බැටළු හම ගැලවෙමින් තිබෙන නිසාය.

දේවාහිට නොපොහුණ දොම්පේ මීතිරිගල ඝේද හොවිපළේ හොවියන්ගේ අදෝනාව

සේදවත්ත හොවිපොළේ යටිරෝපණයක් ලෙස කළ මඤ්ඤොක්කා සහ අන්නාසි වගාව

සේදවත්ත හොවිපොළේ අගතියට පත් හොවින් පිරිසක්

සේදවත්තේ මාර යුද්දේ

සංචාරක අමාත්‍ය ප්‍රසන්න රණතුංග

ගම්පහ දිසා අඩවි නිලධාරිනි දේවානි ජයතිලක

ගොවි එකමුතුවේ ප්‍රධානි කේ.ගිල්බට් වර්ණසිරි

● රසික කොටුදුරගේ

ලංකාවේ නොවිසඳුණු නඩු පැවරීම්වලින් 75%-80% පමණ ඇත්තේ ඉඩම් නඩුය. එනිසා පරම්පරා ගණනාවක් තිස්සේ පිළිතුරු නොමැතිව ඇදී යන මෙම ගැටලු පිළිබඳව සංවේදී වූ ජනාධිපතිවරයා ඒ පිළිබඳව සොයාබලා ඊට කඩිනමින් විසඳුම් ලබාදෙන ලෙස අදාළ බලධාරීන්ට උපදෙස් දෙනු ලැබීය.

ඒ අනුව පසුගිය 20 වැනිදා සංචාරක අමාත්‍ය ප්‍රසන්න රණතුංග සහ ඉඩම් අමාත්‍ය එස්.එම් චන්ද්‍රසේන යන අයගේ ප්‍රධානත්වයෙන් දොම්පේ මීතිරිගල හෙක්ටයාර් 38ක් වූ සේද හොවිපළ යටතේ පැවති ඉඩම් එහි අවුරුදු 30-40ක පමණ කාලයක සිට පදිංචි වී වගා කටයුතු සිදු කරන හොවියන්ට ලබාදීමට අවශ්‍ය කටයුතු සුදානම් කෙරිණ. එම අවස්ථාවේ දී ගම්පහ දිසා අඩවි නිලධාරිනී දේවානි ජයතිලක ඊට විරෝධය පළ කරමින් අදහස් දැක්වීමත් සමඟ නැවතත් එය නොවිසඳුණු ගැටලුවක් බවට පත් විය.

එහිදී අදහස් දක්වමින් ගම්පහ දිසා අඩවි නිලධාරිනිය “කමිටු දෙකකින් තීරණය කරලා තියෙනවා රක්ෂිතයෙන් කොටසක් නිදහස් කරන්න කියලා. මේක 1885 මැයි 22 ගැසට් පත්‍රයකින් රක්ෂිතයක් බවට පත් කරපු ලංකාවේ පළමු රක්ෂිතය. මේක කැලණි ගඟේ අවසාන ජල පෝෂක ප්‍රදේශය. මීතිරිගල ඔයේ ජල පෝෂක ප්‍රදේශය. මීතිරිගල ඔය කියන්නේ අතිශය සංවේදී ප්‍රදේශයක්. පිරිසිදුම ජලය තියෙන ප්‍රදේශයක්. ගම්පහ තියෙන එකම ස්වාභාවික කැළේ. රක්ෂිතයක නීතියක් තියෙනවා අනවසර පදිංචියක් තියෙනවානම් ඉවත් කරන්න ඕන. හැමෝම මේකට කියන්නේ සේද හොවිපළ කියලා. ඒක වැරදියි. සේද හොවිපළ තියෙන්නේ රක්ෂිතයේ කොටසක. මේ රජය අපකීර්තියට පත් වෙන්නේ මේ වගේ වැරදි තීරණ නිසයි. නිලධාරීන්ගේ වැරදි තීරණ නිසයි දේශපාලනඥයන් අපහසුතාවට පත්වෙන්නේ” යැයි ප්‍රකාශ කළාය.

එම අවස්ථාවේදී සංචාරක අමාත්‍ය ප්‍රසන්න රණතුංග “නිලධාරීන් තමයි අණ පනත් හදන්නෙත් ඒ පණත් සංශෝධනය කරන්නෙත්. නිලධාරීන්ම හදලා නිලධාරීන් ඒවායේ හිර වුණාම ඒකේ වැරැද්ද පටවන්නේ දේශපාලනඥයන්ට. දේශපාලනඥයෝ අවුරුදු පහෙන් පහට යනවා. හැබැයි නිලධාරීන් ටයි පටි මාරු කරගෙන ඉන්නවා. ඒ නිසා නිලධාරීන් මේ ප්‍රශ්නය අපිට විසඳලා දෙන්න. ගොඩක් දුරට නිලධාරීන් කරන වැරදි හින්දා තමයි මේ රට; මේ තත්ත්වයට පත්වෙලා තියෙන්නේ. අපි නෙමෙයිනේ මේවාට නිපුණතාවය තියෙන අය. ඔබතුමියලා තීන්දු කරලා; කරන්න ඕන දේ අපිට කියන්න. ගම්පහ වනගහණය වැඩි කරනවාට මම 1500%කින් එකඟයි. හැබැයි ඒකට ක්‍රමවත් වැඩපිළිවෙළක් තියෙන්නේ ඕන. ගම්පහ වන වගාවන් සිදු විය යුතු ප්‍රදේශ ඔබතුමිය හඳුනාගෙන තියෙනවාදැයි” ප්‍රශ්න කළේය.

ඊට පිළිතුරු දෙමින් ගම්පහ දිසා අඩවි නිලධාරිනිය කියා සිටියේ තමන් ඒ පිළිබඳව කටයුතු කරමින් සිටින බවය.

1815 වනතෙක් වසර දහස් ගණනක් තිස්සේ ශ්‍රී ලාංකිකයන් ඉඩම් භුක්ති විඳ පරිහරණය කළ ද එම ඉඩම්වල අයිතිය, රජු සතුව පැවති බැවින් වැසියන්ට එහි අයිතියක් නොවීය. 1815 දී ශ්‍රී ලංකාව මුළුමනින්ම බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයට යටත් වීමත් සමඟ එතෙක් පැවති රාජාණ්ඩු ක්‍රමය අහෝසි වී ඉඩම්වල අයිතිය බ්‍රිතාන්‍යයන් සතු විය. බ්‍රිතාන්‍යයන් විසින් 1840 අංක 12 දරණ අනවසර ඉඩම් ආඥා පනත (No. 12 of 1840 The Prevent Encroachments upon Crown Lands) ප්‍රකාශයට පත් කළේ ඉන් අනතුරුවය. එම ආඥා පනතෙහි "කිසියම් පුද්ගලයෙකුට තමන් සතු ඉඩම තමාට අයත් බව සනාථ කිරීමට නොහැකි වන්නේ නම්, එම ඉඩම රාජසන්තක වන බව" සඳහන් විය. මෙමගින් ශ්‍රී ලාංකිකයන් පාරම්පරිකව භුක්ති විඳීම හා වගාව සැලකිල්ලට නොගන්නා ලදී. ඉන් බ්‍රිතාන්‍යයන් අදහස් කළේ අයිතිය සනාථ කිරීම සඳහා ඔප්පු, නිරප්පු, සන්නස් වැනි ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතු බවයි. මේ තත්ත්වය යටතේ 1840 අනවසර ඉඩම් ආඥා පනත නිසා අක්කර දහස් ගණනක් ශ්‍රී ලාංකිකයන්ට අහිමි විය. මෙය ශ්‍රී ලාංකිකයන්ගේ දැඩි විරෝධයට හා කණස්සල්ලට හේතු වූ අතර, 1818 දී උඩරට මහ කැරැල්ල ඇති වීමට බලපෑ ප්‍රධාන හේතු අතර මෙයද එක් හේතුවක් විය. පසුව මෙම ගැටලුව විසඳීම සඳහා රජයේ ඉඩම් මොනවාද?, පුද්ගලික ඉඩම් මොනවා ද? යන්න තීන්දු කිරීමේ ක්‍රියාවලියක් ආරම්භ කිරීමට බ්‍රිතාන්‍යයන්ට සිදු විය. එම ක්‍රියාවලිය ආරම්භ වූයේ 1897 අංක 1 දරන මුඩු බිම් ආඥා පනත මගිනි. (No of 1897 An Ordinance relating to Claims to Forest, Chena Waste and Uncoupled Lands)

ඒ අනුව 1903 වසරේ දී ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව ආරම්භ කළේය. යටත් විජිත පාලකයන් විසින් දිවයිනේ උඩරට වනාන්තර ප්‍රදේශ වතුවගාවට යොමුකර, පහතරට හොවිබිම් ප්‍රදේශවලට බලපාන පරිදි 1840 අංක 12 දරණ රජයේ ඉඩම් ආඥා පනත (අනවසර අල්ලා ගැනීම්) පනවා ක්‍රියාත්මක කරන ලදී. එම පනත මගින් අයිතිය ඔප්පු කළ නොහැකිව තිබූ සියලුම ඉඩම් රජය සතු බවට පූර්ව නිගමනයකට එළඹ තිබුණි. 1897 අංක 1 දරන මුඩු බිම් ආඥා පනත පනවා එමගින් වගා නොකරන ලද සියලුම ඉඩම් රාජ්‍ය සන්තක කෙරිණි. මෙම පනත් ක්‍රියාත්මක කිරීම දිසාපතිවරුන් විසින් ඉටු කරන ලද අතර 1903 දී චෙනම දෙපාර්තමේන්තුවක් වශයෙන් ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව ආරම්භ කරන ලදී.

කලක් යන විට ඉඩම් ගැටලු විසඳීමට ඉහත මෙම පනත ප්‍රමාණවත් නො වූ බැවින්, 1931 අංක 20 දරන ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනත පනවා ක්‍රියාත්මක කරන ලදී. ප්‍රථම වරට රජයේ පනතක් මගින් පුද්ගලයන්ට ඉඩම් හිමිකම ලබාදීම ආරම්භ වන්නේ මෙකී ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනත මගිනි.

මෙරට හඳවත බඳු මධ්‍යම කඳුකර වනාන්තර මුළුමනින්ම වතුවගාවට හරවා මෙරට ජනයා වගාකළ ඉඩම් වනාන්තර ඉඩම් බවට ගැසට් කළෝ බ්‍රිතාන්‍යයෝ ය. මෙහිදී දේවානි ජයතිලක රඟදක්වන්නේ යටත්විජිත ඒ ජන්ත වරයකුගේ භූමිකාවටත් එහා ගිය භූමිකාවක්ද යන්න ප්‍රශ්නයක් මතු වේ. ඇය රාජ්‍ය නිලධාරිනියක ලෙස වගකීම් සහගතව කටයුතු කිරීම අප අගේ කළ යුතු සේම ඊට සහය පළ කළ යුතුවෙමු. එසේ වුවත් ඇතැම් මානුෂික කාරණා සම්බන්ධයෙන් ඇය සංවේදී නොවීම පිළිබඳව ද ගැටලුවකි. මේ ගැටලුව නිසා අගතියට පත් හොවි එකමුතුවේ ප්‍රධානියා ලෙස කටයුතු කරන 68 වියැති කේ. ගිල්බට් වර්ණසිරි කියා සිටියේ “අපි මේ කලටුවාවට අයිති ඉඩම්වල පදිංචිවෙලා දැන් අවුරුදු 40ට වැඩියි. ඊටත් ඉස්සරින් මේක මහා රුස්ස කැළේ. මේක විතරක් නෙමෙයි දැන් ලංකාවේ බොහෝ නාගරික ප්‍රදේශවෙලා තියෙන ප්‍රදේශ බොහොමයක් ඒ කාලේ කැලෑ ප්‍රදේශ. මේ කැලෑවේ තිබුණු මහා රුස්ස කපල අහක්වෙලා රජයෙන් මේවයේ ඇල්බීසියා හිටවලා තිබුණා. ඒත් ඒ වගාව සාර්ථක වුණේ නැහැ. පස්සේ 1963දි විතර මේ ඉඩම්වල පදිංචි අයටම මේවා වගා කරන්න කිව්වා. ඊට පස්සේ 1971දි විතර මේ කලටුවා කියන බිම් කොටසේ තිබුණ අක්කර එකසිය අනුභයෙන් අක්කර සීයක් කච්චේරි ක්‍රමයට මිනිස්සුන්ට පවරලා දුන්නා. පස්සේ 1972 වගා සංග්‍රමය කාලේ උප දිසාපති විමල් අමරසේකර මේක සමූහ හොවිපළක් බවට පත් කළා. ඒ අනුව පැසන් පෘට්, මල් බෙරි, මඤ්ඤොක්කා, අල බතල,කෙසෙල්,අන්නාසි වැනි බෝග වගේම සත්ත්ව හොවිපළක් පවා මේ තුළ පවත්වාගෙන ගියා. 1977 මැතිවරණයෙන් පස්සේ ජයග්‍රහණය කළ එ.ජා.ප පක්ෂයට හිතවත් පුද්ගලයන් සියගණනක් බස්වලින් ඇවිත් මේ හොවිපළ කොල්ල කාලා විනාශ කළා. බෝග,සත්තු විතරක් නෙමෙයි අපි ඇඳන් හිටපු ඇඳුම්පවා ඒ අය ගලවගෙන ගියා. ඊට පස්සේ 1978 දී දිසාපතිවරයා හා දොම්පේ මන්ත්‍රී වුණු සරත්චන්ද්‍ර රාජකරුණා දෙන්නා එකතුවෙලා පට හා ආශ්‍රිත නිෂ්පාදන සංවර්ධන අධිකාරිය යටතට මේ ඉඩම් හොවින් එක්කම පැවරුවා. 1978 අධිකාරිය මල්බෙරි වගාව ප්‍රචලිත කළා. පල්ලකැලේ ප්‍රධාන මධ්‍යස්ථානයෙන් ඒ සඳහා අවශ්‍ය පට පණු බිත්තර ගෙනත් දුන්නා. කඩුවෙල තිබුණු වීවින් එකට තමයි අපි ඒ කෝෂ ලබාදුන්නේ. ඒක බොහෝම සාර්ථකව කරගෙන යද්දි අධිකාරිය කඩා වැටුණා. 1989 දි එවක වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා වූ ගාමිණි දිසානායක අධිකාරිය පාඩු ලබන බව පවසමින් කැබිනට් සංදේශයක් මගින් වසා දැම්මා. ඊටපස්සේ එහි සේවය කළ අයට වන්දි ලබාදීමට හැකියාවක් අධිකාරියට තිබුණෙ නැති නිසා අක්කරය එක දෙක තුන ඒ අය වගා කළ විදියටම ඉඩම් කොමසාරිස්වරයා දැනුවත් කර පවරා දුන්නා. අධිකාරියේ සුපවයිසර් කෙනෙක් විදියට සේවය කළ මටත් ඉන් අක්කර තුනකුත් පර්චස් දහයක් හිමි වුණා. අධිකාරිය මඟින් ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය ලබාගත්තට පස්සේ අපටත් නීත්‍යානුකූල ඔප්පු ලබාදෙන බව පැවසුවා. ඒත් ඒකාරණය ඉෂ්ට වුණේ නැහැ. එහෙම වුණා නම් අද අපට මෙහෙම ප්‍රශ්නයක් ඇති වෙන්නේ නැහැ.

පසස්සේ මේ ඉඩම්වල රබර් වගා කරන්න කියලා අධිකාරියට අපට පැවරුවා. ඒ අනුව අපි මේ ඉඩම්වල රබර් වවන්න පටන් ගත්තා. මේ දක්වා අපි අවුරුදු 25ක් රබර් වගාව කරගෙන ආවා. අවුරුදු 25කින් පස්සේ ඒ පැරණි රබර් ගස් ඉවත් කරලා නැවත රෝපණය ආරම්භ කළා. ඒවා වැඩෙනකම් යටිරෝපණයක් ලෙස අන්නාසි වවනවා. ඊට අමතරව මඤ්ඤොක්කා වගා කරනවා. ඒ අතර තුර තමයි මේ ප්‍රශ්නය මතු වුණේ. දැන් අඩවි නිලධාරිතුමිය මේ ඉඩම්වලින් අපිව ඉවත් කරන්න නඩුවක් දාල තියෙන නිසා අපට කිසිවක් කරකියාගන්න විදියක් නැහැ. අපි කබලෙන් ලිපට වැටිලයි ඉන්නේ. අපි කරපු වන විනාශයක් නැහැ.”

ගම්පහ දිසා අඩවි නිලධාරිනි දේවානි ජයතිලක මේ ඉඩම්වල පදිංචිකරුවන් සඳහා කිසිදු නීත්‍යානුකූල අවසරයක් නොමැති බව පවසන්නේ ඉහත තතු යටතේය. කැලණි ගඟේ අවසාන ජල පෝෂක ප්‍රදේශය ලෙස මීතිරිගල ඔයේ ජල පෝෂක ප්‍රදේශය හඳුන්වාදෙන ඇය එය හොවියන් විසින් විනාශ කර ඇත්තේ කෙසේද යන්න පැහැදිලි නොකරති. එහි යන්නෙකුට එවැන්නක හෝඩුවාවක් හෝ දිස් නොවීම ද විමතියට කරුණකි.

(ඡායාරූප සමන්ත වීරසිරි)

පත්‍රය බාරේ පළවන දැන්වීම් සඳහා එවන පිළිතුරු සාමාන්‍ය තැපෑලෙන් එවිය යුතුයි

ලියාපදිංචි තැපෑලෙන් එවන ලියුම් බාරගනු නොලැබේ

ධර්ම ශක්ති සමාජ සේවා පදනම සංවිධානය කළ ගෞරව නාම සම්මාන උළෙලේදී සමාජ සේවක තනිප්පුලිගේ චන්දන සුදත් ප්‍රනාන්දු විශේෂ ගෞරව නාමයකින් පිදුම් ලැබූ අතර ඒ මහතා විසින් සමාජ උන්නතිය උදෙසා සිදුකරනු ලද ආගමික හා සමාජ සේවාවන් සලකා, "මානව හිතවාදී සමාජසේවා විභූෂණ කීර්ති ශ්‍රී දේශමාන්‍ය ලංකාපුත්‍ර" යන ගෞරව නාමය බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේදී සම්මාන උළෙලේදී ලබා ගත් අවස්ථාව.

හැම ගමකම පාරවල් හදන්න රුපියල් කෝටි 2804 ක්

● නිහාල් පී. අබේසිංහ

ගම සමඟ පිළිසඳර වැඩ සමඟ යළි ගමට වැඩසටහන යටතේ මාර්ග සංවර්ධනය සඳහා සෑම ග්‍රාම නිලධාරී කොට්ඨාසයකටම රුපියල් ලක්ෂ 20 බැගින් රුපියල් කෝටි 2804.4ක් ලබාදීමට කටයුතු යොදා ඇති බව ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍ය නිමල් ලාන්සා සිළුමිණට පැවසීය.

ආර්ථික පුනර්ජනනීය හා දරිද්‍රතාවය පිටුදැකීම සඳහා වන ජනාධිපති විශේෂ කාර්ය සාධක බළකා ප්‍රධානී බැසිල් රාජපක්ෂගේ උපදෙස් පරිදි හා මහාමාර්ග අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතාගේ මඟ පෙන්වීම යටතේ මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා තිබේ.

මෙම වැඩසටහන යටතේ ග්‍රාම නිලධාරී කොට්ඨාස 14,022ක් සඳහා රුපියල් ලක්ෂ 20 බැගින් ලබාදීමට කටයුතු යොදා තිබේ. ඒ අනුව ජනතා ඉල්ලීම් මත හඳුනාගනු ලබන කිලෝ මීටර් 1 අඩු මාර්ගයක් හෝ දෙකක් අප්‍රේල් මස අවසන් වීමට පෙර සෑම ග්‍රාම සේවා වසමකම ක්‍රියාත්මක කිරීමට උපදෙස් ලබාදී තිබේ. ඒ අනුව අදාළ මාර්ගය ඉන්ටර්ලොක් කිරීම හෝ පෙර නිමැවුම් කොන්ක්‍රීට් යටතේ මාර්ගයේ ඉදිකිරීම් සිදුකරනු ලැබේ.

ශ්‍රී ලංකා මැජික් කවයේ 99 වන වාර්ෂික සභා සම්මේලනයේ නිලවරණය පසුගියදා පැවැත්වූ අතර එහි නව නිලධාරී මණ්ඩලය සේයාරුවකට මෙසේ පෙනී සිටියේය. නව නිලධාරී මණ්ඩලයේ උපදේශකයින් : සභාපති ලුතිනන් කර්නල් (විශ්‍රාමික) රොනල්ඩ් ද අල්විස්, ෂෙල්ටන් ජයසේකර සහ දෙව්සිරි ප්‍රනාන්දු පත් වූ අතර සෙසු මණ්ඩලයේ පිරිසක් මෙසේය. සභාපති : රොහාන් ජයසේකර, උප සභාපතිවරු : එච්.ඩී.එන්. ගුණසේකර, සුමිත්ත කුරුප්පු, සම්බුද්ධික රත්නායක,සුමංගල සිල්වා සහ නිරෝෂන් ජයසේකර ලේකම් : ප්‍රේමලාල් ප්‍රනාන්දු සහකාර ලේකම් : සම්බුද්ධික රත්නායක, භාණ්ඩාගාරික: රෝහිත් ජේ. සිල්වා සහකාර භාණ්ඩාගාරික: බෝවල්ගහ වික්‍රමසේකර කමිටු සභිකවරුන් : දිමිත්‍රි ප්‍රනාන්දු, දිනේෂ් තංගවේල්, විභාන් පෙරේරා, අසංක පතිරණ යන මහත්වරුන්.

‘නිවන වඩන වනගත අරණ’ අද එළි දකී

“අජරාමර ලෝකය”, “අබුද්ධස්ස කාලයේ බුදු සසුන”, “විදු ඇස් පාදන බුදු රැස්” සහ “බුද්ධෝත්පාද ලෝකය” කෘති රචනා කළ මාධ්‍යවේදී ශාස්ත්‍රපති චාමික මුණසිංහයන්ගේ නවතම ගවේෂණාත්මක ග්‍රන්ථය “නිවන වඩන - වනගත අරණ” නමින් 28 ඉරිදා (මැදින් පුන් පොහෝදා) උදෑසන 10.00 ට ඓතිහාසික කලවාන පාරේ පූජා ලෙන ආරණ්‍ය සේනාසනයේ දී එළි දැක්වේ.

කොළඹ 10, මරදාන පාරේ, අංක 791 හි (තක්සේරු දෙපාර්තමේන්තුව ඉදිරිපිට) පිහිටි “සාහිත පොත් පියසෙහි” නවතම ප්‍රකාශනයක් වන මෙය “කෙලෙස් තවන නූතන යෝගියෝ” පොත් පෙළෙහි පළමුවැන්නයි. “සබ්බාසව සූත්‍රයේ එන ප්‍රතිපදා හත”, “භාවනාවට පෙර දුරැලිය යුතු ආශ්‍රව හෙවත් කෙලෙස්”, “භාවනාවෙන් දකින සිත කය සහ භවය” යනාදී මාතෘකා යටතේ කතුවරයා වනගත ආරණ්‍ය ජීවිතයේ දී ලද ප්‍රයෝගික භාවනා අත්දැකීම් මෙහි සරලව රසවත්ව ඉදිරිපත් කර තිබේ. සිංහරාජ අඩවියෙහි හුදකලා වන අරණක වැඩවෙසෙන පරිණත භාවනායෝගී තෙරණුවෙකු විසින් ආධුනික භාවනායෝගියෙකු වෙත ලබා දෙන ලද “නිවන් මගෙහි පළමු පියවර” හෙවත් “භාවනා පූර්ව කමටහන්” කතන්දරයක් පරිදි පෙළ ගස්වා ඇත.

ග්‍රැෆික් ඩිසයින් සම්මන්ත්‍රණයක්

නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය යටතේ පැවැත්වෙන ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය මඟින් ග්‍රැෆික් ඩිසයින් තාක්ෂණය සහ මල්ටිමීඩියා පිළිබඳ නොමිලේ සම්මන්ත්‍රණයක් මාර්තු 30 වන අඟහරුවාදා පෙ.ව. 8.30 සිට සවස 1.30 දක්වා ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ දී පැවැත්වේ.

ග්‍රැෆික් ඩිසයින් තාක්ෂණය පිළිබඳ සාකච්ඡාවේදී ග්‍රැෆික් ඩිසයින් මෘදුකාංග භාවිතයෙන් එදිනෙදා සරල නිර්මාණ කරගන්නා අයුරු පහදා දෙන අතර මෙම තාක්ෂණය හදාරන්නට අදහස් කරන පුද්ගලයන්ට මෙන්ම එම ක්ෂේත්‍රයේ රැකියාවල නියුතු වීමට අදහස් කරන පුද්ගලයන්ට ද සාර්ථක මූලාරම්භයක් සහ දැනුමක් ලබාදේ. මල්ටිමීඩියා තාක්ෂණය පිළිබඳ සාකච්ඡාවේදී වෙබ් අඩවි නිර්මාණය ත්‍රිමාණ සජීවීකරණය සහ වීඩියෝ සංස්කරණය පිළිබඳ දැනුම ලබාදේ.

මෙම වැඩමුළුව පාසැල් හැරගිය සිසුන්ට මෙන්ම අනෙකුත් වෘත්තිකයන්ට ද ආධාරයෙන් සරල නිර්මාණ කරගන්නා අයුරු පහදා දේ.

ඉඩ කඩ සීමාසහිත නිසා 011 2686162 හෝ 011 2679791 යන දුරකථන අමතා කථා කිරීමෙන් ආසනයක් වෙන්කරවා ගත හැක. රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව නො.118 දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත කොළඹ 8 යන ලිපිනයට පැමිණීමෙන් ද ඔබට මෙම සම්මන්ත්‍රණයට සහභාගි විය හැක.



ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ පාර්ලිමේන්තු මන්ත්‍රී මහාචාර්ය චරිත හේරත්

1. ජනමාධ්‍ය කියන්නේ ලෝකයේ ඉතිහාසය පුරාවටම බලපෑම සහගත මැදිහත්වීමේ ආකෘතියක්. අපි එයට සිවුවන ආණ්ඩුව කියලා කියනවා. ජනතාව එසේ නැත්තම් මිනිසා කියලා කියන්නෙත් හිතන පතන කතා කරන සහ අදහස් හුවමාරු කරන සත්වයෙක් නිසා, ඒ හුවමාරු කරන අදහස් එකිනෙකා අතර පවතින්නේ, එහෙමත් නැත්තම් ගලා යන්නේ ජන මාධ්‍ය තුලයි.
ඒ නිසා පුවත්පත්, ගුවන් විදුලිය , රූපවාහිනිය එහෙම නැත්නම් ඒ සියල්ලටම වඩා අලුත් ඩිජිටල් අවකාශය ඔස්සේ හෝ මතු කරන අදහස් ගලා යනවා, ඒ නිසා ජනමාධ්‍ය කියන්නේ මිනිස් සමාජය බහා තබා තියෙන, එහෙම නැත්තම් මිනිසා ජීවත්වන වටපිටාව තුළ විසිරිච්ච අදහස් පද්ධතියක්, කැටිකරගත් අවකාශයක්.

2. ලංකාවේ මාධ්‍ය නිදහස කියන්නේ එක දවසක වැඩක් නෙවෙයි, මේක අපේ රට බ්‍රිතාන්‍යයන්ගෙන් නිදහස් වූ දා ඉඳලම තිබුණා . ඒ අනුව මේ රටේ මාධ්‍යට විශාල ඉඩක් තියනවා. රාජ්‍යයය පෞද්ගලික යන දෙඅංශයම ජනමාධ්‍ය ක්ෂේත්‍රය ඉතාම සක්‍රීය විදිහට දායක වෙනවා, සමහර රටවල් තියෙනවා රජයේ ජනමාධ්‍ය නැහැ. පෞද්ගලික අංශයේ විතරයි තියෙන්නේ. ලංකාවේ මේ දෙඅංශයම තියෙනවා. ආසියාවේ බොහෝ රටවල්වල මේ අංශ දෙකම තියෙනවා. එතකොට මේ අංශ දෙක ලංකාව ඇතුළේ විශාල නිදහසක් භුක්ති විඳිනවා . ලංකාවේ ජනමාධ්‍ය ඇතුළේ කතා කරන්න බැරි මාතෘකාවක් නැහැ. හැබැයි මෙතන ප්‍රශ්නයක් තියෙනවා. ඒ කියන්නේ ජනමාධ්‍ය අවකාශය නියාමනය වීමයි, ඒ කියන්නේ ආචාර ධර්ම පද්ධතියක් ඇතුළේ වැඩ කිරීමයි.
නියාමනය, ආචාර ධර්ම පද්ධතිය සහ මාධ්‍යවේදීන්ට තියෙන පුහුණුව යන කාරණා තුනම ඉතාම වැදගත්. නමුත් ලංකාව ඇතුළේ මේ සංකල්ප තුනේ ගැටුම්කාරිත්වයන් තියෙනවා.

3. මෙහි පැති දෙකක් තියෙනවා, එකක් තමයි මාධ්‍ය නියාමනය කිරීම. ඒක රජයකට අයත් දෙයක්. මාධ්‍ය නියාමනය එක පැත්තකින් සිදු වෙනවා, ඒ වගේම මාධ්‍යයටත් පුළුවන් ස්වයං නියාමනයක් හදාගන්න. ඒ නිසා මාධ්‍ය නියාමනය කියන කාරණය රජයෙන් වගේ ම අදාළ මාධ්‍ය ආයතනයෙනුත් සිදු කරනවා. හැබැයි මාධ්‍ය ආචාර ධර්ම කියන දේ රජයෙන් ලබාදිය යුතු නැහැ. මාධ්‍ය පුහුණුව කියන දේ පුද්ගල බද්ධ දෙයක්. ඒක වෙන වෙනම පුද්ගලයන් විසින් සිදු කළ යුතු දේවල් ඒ නිසා මාධ්‍ය නියාමනය, මාධ්‍ය ආචාර ධර්ම, පුහුණුව කියන කරුණු තුනම මාධ්‍යයට තිබිය යුතුයි. එක පැත්තකින් රාජ්‍යයටත් මැදිහත් වෙන්න පුළුවන් තව පැත්තකින් පෞද්ගලික අංශය විසිනුත් සිදු කළ යුතුයි.

4. කැළැල කියන කාරණය, ඒ ඒ දෘෂ්ටි කෝණයන්ට අනුව සිදු වන දෙයක්. ජනතා විමුක්ති පෙරමුණ වේවා කිසියම් රජයක් වේවා, ඒ ඒ කාලවල විපක්ෂයේ සමහර දේශපාලන කණ්ඩායම් සහ එල්ටීටීඊ සන්නද්ධ ව්‍යාපාරය පවා ජන මාධ්‍යයට විවිධ බලපෑම් එක් එක් කාලවලදී සිදු කළා.
ඒක නිසා ඒ බලපෑම්වලින් සමාජය ගලවන්න සිද්ධවෙන්නේ විශාල මහන්සියකින්. ඉතින් 83 ඉඳලා 2009 වෙනකම් උතුරේ වෙච්ච තත්ත්වයත්, ඒ වගේම 71 දී සහ 89 දී දකුණෙ වෙච්ච තත්ත්වයත් මේ රටට විශාල බලපෑමක් සිදු කළා. ඒ බලපෑම් දෙකට අමතරව ඒ ඒ රජයන් අතරත් විවිධ බලපෑම් සිදුවෙලා තියෙනවා.

5. ඒ කරුණේ පැති දෙකක් තියෙනවා, එකක් මාධ්‍ය නිදහස කියන එක හැමකෙනාටම හිමිවිය යුතු දෙයක්. ඒක රජයේත් පෞද්ගලික අංශයේත් දෙකේදීම. ඒ වගේම, පෞද්ගලික අංශය ගත්තොත් එහි මාධ්‍ය ආයතන හිමිකරුවන් කියන අයගේ පෞද්ගලික අභිලාෂයට වඩා සමාජ අභිලාෂයන් තෝරාගැනීම තමයි වෙන්නේ, මෙතනදි ඇත්තටම සමාජ අභිලාෂයන් රාශියක් තියෙනවා. කාඩ් කුට්ටම් වගේ, කොයි කොළේද ඉස්සරහට දාන්නද කියන එක තීරණය කරන්නේ කවුද කියන එකයි ඔය ඔබ අහන ප්‍රශ්නේ, ඒක තීරණය කරන්න රජයේ නම් එහි ප්‍රධානියෙක් ද, පෞද්ගලික අංශයක නම් ඒකෙ ඉන්න ප්‍රධානියා ද කියලා, ඕක ඉතින් ඇත්තටම පිළිතුරක් හරියටම නැති නමුත් වැදගත් ප්‍රශ්නයක්, ඒ කියන්නේ සමාජ අභිලාෂ, එහෙමත් නැත්නම් සමාජ ප්‍රශ්න ගණනාවක් තියෙනවා. මේ තියෙන අභිලාෂ සහ ප්‍රශ්න තුළින් කිනම් දේද ඉදිරියට ගන්නේ කිනම් දේද යටට යන්නේ කියන එක තීරණය කරන්නා කවුද කියන එක තමා ඔබ අහන්නේ, හැබැයි ඒ ප්‍රශ්නයට පිළිතුර මේකයි කියලා හරියටම කියන්න බැහැ. එක එක තලයන් තුළ සමහර කාලයක ඒකෙ ක්‍රියාත්මක වෙන්නේ සමාජයේම පිළිගත් ආකෘතීන් ඇතුළේ, සමහර කාල වල එහෙම වෙන්නේ නැහැ, සමහර කාලවල ඒක වෙන්නේ එක එක පුද්ගල බද්ධ සාධක මත, ඒ නිසා මේ දෙකම තියෙනවා.

මාධ්‍ය නිදහස, මාධ්‍යවේදියා සහ වාර්තාකරණය ගැන සිළුමිණෙන් ප්‍රශ්න පහක්

1. ඔබ මාධ්‍ය නිදහස විග්‍රහ කරන්නේ කෙසේද?
2. අපේ රටේ විපක්ෂය සහ ජනතාව තෘප්තිමත් වන අන්දමේ මාධ්‍ය නිදහසක් ලැබී තිබේද? නොඑසේ නම් එයට හේතුව කුමක්ද ?
3. මාධ්‍ය නිදහස රජය විසින් ලබා දිය යුතුද ? එසේ නැතිනම් මාධ්‍ය විසින් ලබා ගත යුතුද?
4. ජ.වි.පෙ සහ විවිධ රජයන් විසින් පසුගිය කාලයේ සිදු කළා යැයි කියන ක්‍රියා නිසා මාධ්‍යයට වූ කැළල මකා දැමීමට හැකිද, නොහැකි නම් එයට බලපාන හේතු කවරේද.?
5. මාධ්‍ය නිදහස මාධ්‍ය ආයතන හිමිකරුවන්ගේ නිදහසට පමණක් සීමා විය යුතුද? ඒ අයගේ මතවාද පිළි නොගන්නා මාධ්‍යවේදීන්ට එම ආයතන තුළ සිදුවන්නේ කුමක්ද?

මත ගැටෙන තැන

● සුභද්‍රා දේශප්‍රිය

ජන මාධ්‍යය යනු රටක සිවු වැනි ආණ්ඩුව යනුවෙන් සැලකේ. එහෙත් මාධ්‍ය නිදහස යනු මාධ්‍ය හිමිකරුවන්ට අවශ්‍ය නිදහස නොවේ. මාධ්‍ය ආචාර ධර්ම පද්ධතියක් වෙයි. එය සුරැකීම මාධ්‍යකරුවන්ගේ යුතුකමයි. මාධ්‍යවේදියාගේ නිදහසට මැදිහත් නොවීමෙන් වඩා සත්‍යවාදී තොරතුරු ජනතාවට රැගෙන යෑමට පාවිච්චි කිරීම මාධ්‍යවේදීන්ගේ වගකීමයි. මෙරට පසුගාමී මාධ්‍යකරණය යළිත් සිහිපත් කරවන සිදුවීම් කිහිපයක් සමඟ මාධ්‍ය නිදහස පිළිබඳ කතා බහ නැවත කරලියට පැමිණෙන්නට විය. ලෝක දේශපාලනයේ කේන්ද්‍රය ජනමාධ්‍ය බවට පත්වී තිබේ. මාධ්‍ය නිදහස යනු සීමා මායිම් නැති නිදහසක් නොවේ.

ජනතාවට සත්‍ය තොරතුරු රැගෙන යාමේ අතර මැදියා මාධ්‍යකරුවාය. පක්ෂග්‍රාහී වෙමින් කටයුතු කිරීම මාධ්‍යකරුවන්ගේ කාර්යභාරය නොවිය යුතුය. සිය මාධ්‍ය අයිතිවාසිකම් රැකගෙන කටයුතු කිරීමට මාධ්‍යයට හැකිනම් එය වඩා ප්‍රගතිශීලි වනු ඇත. මාධ්‍යකරුවා වඩාත් සත්‍යවාදී මිනිසකු යැයි ජනතාව තුළ යම් මතයක් ගොඩ නැඟී ඇති නිසාම දේශපාලඥයන්ට පාලකයන්ගේ කතාවලට වඩා මාධ්‍ය පිළිබඳ යම් විශ්වාසයක් ජනතාව තුළ වෙයි. අපක්ෂපාතිව හා සමබරව වාර්තා කිරීම මාධ්‍යයේ වගකීමකි. විවිධ න්‍යායපත්‍ර හමුවේ ඇතැම් මාධ්‍යකරුවන් කටයුතු කරනු ලබයි. සිව්වැනි ආණ්ඩුව වන මාධ්‍ය විසින් ජනතා අභිවෘද්ධිය වෙනුවෙන් ප්‍රජාතන්ත්‍රික ලක්ෂණ රැක ගනිමින් සිය කාර්යය ඉටු කළ යුතු බව අවිවාදිතය.

මධ්‍යස්ථව, සබුද්ධිකව පාලකයන්ට සහ ජනතාවට සැබෑ දිශානතිය පෙන්වන්නෙකු ලෙස මාධ්‍යවේදියා නිසි තැන සිට ගනිමින් කටයුතු කළ යුතුය. මාධ්‍යයේ වඩා වැදගත් කාර්ය භාරය එයයි.

ජනතා විමුක්ති පෙරමුණේ පාර්ලිමේන්තු මන්ත්‍රී විජිත හේරත්

1. ජනතාවට සත්‍ය දැනගැනීමේ අයිතියක් තියනවා. ඒ අයිතිය නිසි ලෙසින් සාක්ෂාත් විය යුතුයි. ඒ වගේම තොරතුරු සන්නිවේදනය කිරීමේ නිදහස ලබාදිය යුතුයි. සාවද්‍ය විග්‍රහවලින් වැළකිය යුතුයි. වැරදි විග්‍රහයන් යම් මාධ්‍යවලින් සන්නිවේදනය වීම වරදක්. සත්‍ය තොරතුරු නිවැරදිව දැනගැනීම මාධ්‍ය නිදහසේ මූලික අංගයක්.

2. හැමදාම මාධ්‍ය පාලනය කරන්නේ මාධ්‍ය හොබවන්නේ පවතින ආණ්ඩුවයි. මාධ්‍යවලට බලපත්‍ර දෙන්නේ පවතින ආණ්ඩු විසින්. මාධ්‍යවලට විදුලි සංදේශ නියාමන කොමිසම බලය ලබා දෙනවා. එයත් රජයට අයත් ආයතනයක්. මුද්‍රිත මාධ්‍ය ප්‍රාග්ධනය හසුරුවන්නේ පවතින ආණ්ඩුවල බලඅධිකාරිත්වයට යටත්වයි. හැමදාම වගේ කවර ආණ්ඩුවක් බලයේ සිටියත් ඒ ආණ්ඩුවේ බලඅධිකාරියට යටත් වෙලයි මාධ්‍ය පවතින්නේ. මේ රටේ සැබෑ මාධ්‍ය නිදහසක් ක්‍රියාත්මක වෙන්නේ නැහැ.

3. තොරතුරු ලබා ගැනීමේ අයිතිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ජනතාවගේ මූලික අයිතිවාසිකමක්. ඒ අයිතිය රජය අනිවාර්යෙන්ම ලබා දිය යුතුයි. ජනතාවට නිවැරැදි තොරතුරු ලබාදීමට නිදහස් මාධ්‍ය පැවැත්මක් තහවුරු කළ යුතුයි. මාධ්‍ය නිදහස කියන්නේ මාධ්‍ය මැදිහත් වෙලා ගත යුතු දෙයක් නොවෙයි. ජනතාව වෙනුවෙන් ජනතාව වෙත ලබා දිය යුතු දෙයක්.

4. හැමදාම රජයන් තමන්ගේ පැවැත්ම උදෙසා මාධ්‍ය පාවිච්චි කරනවා. බලය පවත්වාගන්න මාධ්‍ය බෙදා ගන්නවා ඒ නිසා මාධ්‍ය නිදහස පිළිබඳව කතිකාවක් ඇතිවිය යුතුයි. ජනතා විමුක්ති පෙරමුණ 2001 දී ස්වාධීන කොමිෂන් සභා හඳුන්වා දෙන්න හැදුවා. ස්වාධීන කොමිෂන් සභාවක් සම්මත කරන්න කියලා අපි යෝජනා කළා. එය අපි කළේ ආණ්ඩු මාධ්‍ය පාලනය කරන නිසා. අදටත් ස්වාධීන මාධ්‍ය කොමිසමක අවශ්‍යතාව තදින් දැනෙනවා. මාධ්‍ය ආයතන මාධ්‍යවේදීන් වෙත විවිධ කාලවලදී විවිධ මර්දනයන් ක්‍රියාත්මක කළා, මාධ්‍යවේදීන් සෘජුවම ශාරීරිකව මානසිකව කායිකව මර්දනයන් වෙනවා, එය එදා සිට අද දක්වා තවමත් සිදු වෙනවා, එයට එරෙහිව ජනතාවගේ පැත්තෙන් සටන් කරලා අද තියන ප්‍රමාණයට හෝ මාධ්‍ය නිදහස ලබාගෙන තියෙන්නේ. නමුත් එය ප්‍රමාණවත් නැහැ. තව බොහෝ ලබා ගත යුතු දේවල් තියනවා. මාධ්‍ය නිදහස කියන්නේ ප්‍රජාතන්ත්‍රවාදය සමඟ ගැටගැසුණු දෙයක්.

5. මාධ්‍යවේදීන් හා මාධ්‍ය හසුරුවන්නන්ගේ ප්‍රාග්ධනය විසින් ස්වාධීන මාධ්‍යවේදීන්ට තමන්ගේ කටයුතු හෑද සාක්ෂියට අනුව කරන්න බැරිවෙලා තියනවා. තමන් නියෝජනය කරන ආයතනයට බලඅධිකාරියට යටත් වියයුතු තත්ත්වයක් තියනවා, එය ශෝචනීය තත්ත්වයක්. කොන්ද කෙළින් තියාගෙන ඉන්න වරදාන වරප්‍රසාදවලට යටවෙන්නේ නැති මාධ්‍යවේදීන් යම් පමණක් මේ හැසිරවීමේ වරදට එරෙහිව කටයුතු කිරීමට උත්සාහ කළත් බහුතරයක් මාධ්‍යකරුවන්ට එසේ කළ නොහැකි වෙලා තියනවා .

සමගි ජන බලවේග පාර්ලිමේන්තු මන්ත්‍රී ඉමිතියාස් බාකිර් මාකර්

1. මාධ්‍ය නිදහස ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක මූලික අංගයක්. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක මූලික මිනිස් අයිතිවාසිකමක් මෙන්ම පැවැත්මත් සමඟ බැඳී පවතින්නක්. විශේෂයෙන් නිවැරදි තොරතුරු ජනතාවට ලැබෙන්නේ නැතිනම් මිනිසුන් වැරදි තීන්දු ගන්න පුළුවන්. මාධ්‍ය නිවැරදි තොරතුරු ජනතාවට ලබාදීමෙන් ප්‍රජාතන්ත්‍රවාදී පැවැත්ම ආරක්ෂා වෙනවා. එකම කාසියක දෙපැත්ත වගේ තමයි ප්‍රජාතන්ත්‍රවාදය සහ මාධ්‍ය නිදහස. මාධ්‍ය නිවැරදිව හැසිරවීමට අදීනව කටයුතු කිරීමට මාධ්‍යවේදීන්ටත් යුතුකමක් තියෙනවා.

2 මමත් විපක්ෂ පක්ෂයේ ඉන්නේ ඒ වගේම මමත් ජනතාවගෙන් එක් අයෙක්. මම නම් තෘප්තිමත් වෙන්නේ නැහැ මාධ්‍ය නිදහස පිළිබඳව. නිදහස් මාධ්‍ය භාවිතයක් තියනවා කියලා ජනතාවගෙන් කෙනෙක් මෙන්ම විපක්ෂයේ කෙනෙක් කියලත් මම තෘප්තිමත් වෙන්නේ නැහැ. මාධ්‍ය ගතහොත් පුද්ගල හිමිකාරිත්වය සහ රජයේ හිමිකාරිත්වය මතයි සියලු දේවල් රඳා පවතින්නේ. ආණ්ඩුව හිමිකාරිත්වය කිව්වට දේශපාලන පක්ෂයක හිමිකාරිත්වය විදිහටයි අපි මෙය දකින්නේ. නිදහසක් බලාපොරොත්තු වෙන්න පුළුවන් තැනක මාධ්‍ය තියනවාද. මේ වනවිට මාධ්‍ය හිමිකාරිත්වය වාණිජ අරමුණ දිනා ගැනීම උදෙසා දේශපාලනික අරමුණුවලටත් යොමුවෙලා තියෙනවා. පක්ෂග්‍රාහි අරමුණුවලට යන මාධ්‍ය නිසා මිනිසුන්ට නිවැරදි තොරතුරු ගලානොයන අවධානමක් අපි දකිමින් තියනවා . මේ වනවිට ආණ්ඩුවට විශාල මාධ්‍ය බලයක් නිර්මාණය වෙලා තියනවා.

3 රජයක් විසින් ලබාදෙන දෙයක් නොවෙයි. ප්‍රජාතන්ත්‍රික සමාජයක මූලික අයිතියක්. මාධ්‍යයට නිදහසත් සමඟ වගකීමකුත් තියනවා. නිවැරදි තොරතුරු ලබාදීමට ස්වයං ශික්ෂණයක් තිබිය යුතුයි . ජනමාධ්‍යවල වගකීම පිළිබඳව අපි සැලකිලිමත් විය යුතු වන්නේ ප්‍රජාවත් සමඟ බැඳිලා තියන නිසා. මාධ්‍යයේ නියැළිලා ඉන්න අයට ඉතා වැදගත් ස්වයං ශික්ෂණයක් තිබිය යුතුයි. ජනතාවත් සමඟයි ඒ වගකීම බැඳිලා තියෙන්නේ. එය ලොකු අභියෝගයක්.

4 ජනතා විමුක්ති පෙරමුණ බිත්තියට හේත්තු කරන්නට මෙවැනි ප්‍රශ්න ගොඩනැගීමේ අපෙක්ෂාවයි. අඩු පාඩු කම් ජනතා විමුක්ති පෙරමුණේ එක් යුගයක තිබුණා විය හැකියි. ඒ අය අද වනවිට ප්‍රජාතන්ත්‍රවාදී රාමුවක් තුළ හැසිරෙන්නට උත්සාහ කරනවා. අතීතයේ කැළැල් පෙන්වලා ලේබල් ඇලවීමක් නොවෙයි කළ යුතු වන්නේ. ඒ අය මතු කරන ප්‍රශ්නවලට රජයක් ලෙස පිළිතුරු දිමයි වැදගත් වෙන්නේ. ඉතිහාසය ජනතාව දන්නවා. තමන්ගේ වැරදි වහගන්න අනෙක් පාර්ශ්ව පලිහක් කරගැනීම නොවෙයි වැදගත් වෙන්නේ. අනෙක් අයට මඩගහන්න ගිහින් ආණ්ඩුව විසින් මාධ්‍යයට කරන හානිය වහගන්න බැහැ. නිදහස් මාධ්‍ය කලාව කොටුකරන්නේ සීමා කරන්නේ නැතුව වැඩ කරන්න කියල අපි රජයෙන් ඉල්ලන්නේ.

5 ආණ්ඩුව විසින් මෑතක සිට ඍජු නොවන තර්ජනයක් මාධ්‍යයට එල්ල කරනවා. මාධ්‍ය ආයතනවල අයිතිකරුවන්ගේ නිදහස නොව මාධ්‍ය නිදහසයි තිබිය යුතු වන්නේ. ලෝකයේ දියුණු රටවල මාධ්‍ය ස්වාධීනයි. නමුත් අද අපේ මාධ්‍යකරුවන්ට වෙනත් අයගේ න්‍යාය පත්‍රවලටත් වැඩකරන්න වෙලා. අද මාධ්‍යකරුවන් බය කරන්න හදනවා. කාටද මේ තර්ජන ආණ්ඩුව එල්ල කරන්නේ. එය අසාධාරණයි. මේ පවතින ක්‍රමවේදය ප්‍රතික්ෂේප කළ මාධ්‍යවේදීන්ට මේ රටේ ඉන්න පුළුවන් වුණාද? මාධ්‍ය ආයතන හිමිකරුවන්ගේ නිදහසක් ගැන කතා කරලා එය සමාජගත කරන්න අලුතින් උත්සාහයක් කරනවා. කළ යුතු වන්නේ මාධ්‍ය නිදහස ලබා දීමයි. ප්‍රජාතන්ත්‍රවාදය තුළ තිබිය යුතු මූලික අයිතියක් මාධ්‍ය නිදහස. දේශපාලකයන්ට ජනතාවට මාධ්‍යවේදීන්ට මේ මාධ්‍ය නිදහස පිළිබඳව නිවැරැදි තොරතුරු පිළිබඳව වගකීමක් තියනවා. එවිට ප්‍රජාතන්ත්‍රවාදය අනතුරට යනවා. අධිපතිවාදය හිස ඔසවනවා. අද ඒ අභියෝගයටයි අප මුහුණ දී තියෙන්නේ.

මහරගම පිළිකා රෝහලේ 'නයිටිංගෙල්ලා'ට වූ හිංසනය

● අමිල මලවිසූරිය

මහරගම අපේක්ෂා රෝහල මෙරට පිළිකා රෝගීන් වෙනුවෙන්ම ප්‍රතිකාර කරන එකම රෝහලයි. පිළිකාවෙන් පීඩා විඳින කුඩා දරුවාගේ සිට වැඩිහිටියා දක්වා සුවහසක් රෝගීන් වෙනුවෙන් එහි වෛද්‍යවරු, හෙද හෙදියන් ඇතුළු සියලු කාර්ය මණ්ඩලය ඉටු කරන්නෙ අනූපමේය සේවාවකි.

පිළිකාවෙන් පීඩා විඳින රෝගීන් වෙනුවෙන් විසිහතර පැයේම කැප වෙමින් විශේෂයෙන්ම අධික ලෙස ශරීරයට අහිතකර විකිරණශීලි රසායනික කිරණ මුදාහරින උපකරණ සහ ඖෂධ සමඟ කටයුතු කරන එහි කාර්ය මණ්ඩලයට බොහෝ දෙනා හිස නමා ආචාර කරති.

එවැනි අපමණ කැපකිරීම් කරන කාර්ය මණ්ඩලයක් සිටින මහරගම, අපේක්ෂා රෝහලෙන් පසුගියදා වාර්තා වූයේ වෙනස්ම කතාන්දරයකි. ඒ, අපේක්ෂා රෝහලෙහි හෙදියන් දෙදෙනකු පැයක පමණ කාලයක් එහි ගැබ්ගෙල පිළිකා රෝගීන්ට ප්‍රතිකාර කරන විකිරණශීලි කාමරයක් තුළ සිරවී සිටි බවයි. එවැනි විකිරණශීලි කාමරයක් තුළ එතරම් කාල පරාසයක් සිරකර සිටීම ශරීරයට ඉතාම අහිතකර තත්ත්වයක් බවත් විශේෂයෙන්ම පිළිකා අවදානම, ජාන විකෘති වීම් හෝ වෙනත් භයානක රෝගී තත්ත්වයන් පවා ඇතිවිය හැකි බව මහරගම රෝහලේ බොහෝ හෙද හෙදියන්ගේ මතයයි. එසේම එවැනි විකිරණශීලි කාමරයක් තුළ වැඩි වේලාවක් රැඳී සිටිමෙන් ඇතිවන රෝගී තත්ත්වයන් කෙටි කාලයකදී මෙන්ම ඇතැම් විටෙකදී වසර දෙක තුනකදී පමණක් නොව දිගු කලක් ඉක්ම ගොස් පෙන්නුම් කරන රෝගී තත්ත්වයන්ද විය හැකි බව ඒ පිළිබඳ විශේෂඥයන්ගේද අදහසයි.

කෙසේ හෝ පසුගිය 17 වැනිදා සවස පැයක පමණ කාලයක් එනම් සවස තුනේ සිට හතර දක්වා වැනි කාල පරාසයක් එම හෙදියන් දෙදෙනා එහි සිරවී සිටි බවට මහරගම පොලිසියටද පැමිණිල්ලක් කර තිබිණි. මහරගම, කටුවාවල පටුමඟෙහි පදිංචි තරුණ හෙදියක් විසින් එම පැමිණිල්ල ඉදිරිපත් කර තිබිණි.

අධික විසෙන් යුත් කාමරයේ පැයක කාලයක් හෙදියන් දෙදෙනෙක් සිරකර තබලා

එම පැමිණිල්ලෙහි සඳහන් වී තිබුණේ පැමිණිල්ල සිදුකරන තමා සමඟ රත්නපුර පාර, ඌරපොළ, ඉංගිරිය ලිපිනයේ පදිංචි තවත් සහෝදර හෙදියක් මාර්තු 17 වැනිදා සවස තුනට පමණ විකිරණශීලි කාමරයේ රැඳෙමින් රෝගීන්ට පසුදාට අවැසි ප්‍රතිකාර සූදානම් කරමින් රාජකාරියෙහි නිරතව සිටි බවයි. එම අවස්ථාවේ දර්ශන සහ මධුක නමැති විකිරණ ප්‍රතිකාර ශිල්පීන් දෙදෙනා විසින් විකිරණ කාමරයේ දොර වසා අගුළු දමා විදුලියද විසන්ධිකොට එම ශිල්පීන් දෙදෙනා වෙනත් රාජකාරියක් සඳහා ගොස් ඇති බවයි.

කිසිවක් කරකියාගත නොහැකිව ඝන අන්ධකාරයේ එම කාමරයේ රැඳී සිටි හෙදියන් දෙදෙනාගේ ජංගම දුරකථනද ක්‍රියා විරහිත විණි. ඒ, එම කාමරයේ දොරගුළු වසා දමා තිබූ හෙයින් පිටත සමඟ කිසිම සබඳතාවක් නොවූ නිසාවෙන් දුරකථනවලට 'සිග්නල්' පහසුකම් නොමැති හෙයිනි.

පැයක පමණ කාලයක් ඒ තුළ සිරවී දොරගුළු විවර කරගැනීමට නොහැකිව බය බිරාන්තව අසරණව සිටි එම හෙදියන්ගේ 'වාසනාවට' වෙනත් හෙද නිලධාරිනියක් කිසියම් කාර්යකට එම කාමරය අසලට පැමිණ තිබුණාය. ඒ මොහොතේ කාමරයේ සිරවී සිටි දෙදෙනා උදවු ඉල්ලා කෑකෝ ගැසීම ඇසීමෙන් එලෙස පැමිණි හෙද නිලධාරිනිය විසින් ක්ෂණිකව දොරගුළු විවෘත කිරීම නිසාවෙන් පිටතට පැමිණි බව පොලිසියට කළ පැමිණිල්ලේ සඳහන්කර තිබුණාය.

මහරගම පොලිසියට ලැබුණු එම පැමිණිල්ල පිළිබඳව මහරගම පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක එච්. එච්. ජනකාන්තගේ උපදෙස් මත විවිධ පැමිණිලි අංශයේ නිලධාරිහු විමර්ශනයක් ආරම්භ කළහ. පොලිසිය සිදුකළ විමර්ශනයෙන් අනතුරුව පසුගිය 21 වැනිදා රාත්‍රියේ එලෙස හෙදියන් දෙදෙනෙකු ශරීරයට අහිතකර අධික විසකින් යුත් විකිරණශීලී කාමරයක් තුළ පැයක පමණ කාලයක් අයුතු ලෙස සිරකර තැබීමේ චෝදනාවේ සැකකරුවන් දෙදෙනා අත්අඩංගුවට ගැනිණි. ඒ, ඊට ප්‍රධාන සැකකරුවා වූ රත්මලාන, ශ්‍රී ධර්මාරාම පාරේ පදිංචි කන්දගේ

මහරගම දන්ත රෝහලේ වෛද්‍යවරියක්ද හෙදියකට පහරදී කන පළලා

මධුක සඳරුවන් පෙරේරා නමැත්තා සහ ඊට අනුබල දීමේ චෝදනාව මත නුගේගොඩ, පාගොඩ පාර ලිපිනයේ වෙසෙන සේනානායක මුදියන්සේලාගේ කරුණා සාගර දර්ශන බණ්ඩා නමැත්තා පොලිස් අත්අඩංගුවට පත්විණි.

පොලිස් අත්අඩංගුවට පත් දෙදෙනා මහරගම පොලිස් නිලධාරින්ට කියා තිබුණේ විහිළුවකට එවැනි දෙයක් කළ බවයි. එහෙත් එය ජීවිතයත් මරණයත් අතර කළ අමනෝඥ විහිළුවක් ලෙස මහරගම අපේක්ෂා රෝහලේ කාර්ය මණ්ඩලයේ අදහසය. විශේෂයෙන්ම එම කාමරය තුළ යම් පුද්ගලයකු වැඩි වේලාවක් රැඳී සිටීම කෙතරම් අවදානම්ද යන්න එම විකිරණ ශිල්පීන් දෙදෙනාද හොඳාකාරවම දැන නොසිටියා විය නොහැකිය.

පොලිස් අත්අඩංගුවට පත් දෙදෙනා කුමක් කීවද ශරීරයට අධික විස සහිත ද්‍රව්‍ය තැන්පත් කාමරයක් තුළ අයුතු ආකාරයෙන් එලෙස හෙද නිලධාරිනියන් දෙපළක් සිරකර තැබීමේ චෝදනාව මත එම සැකකරුවන් දෙපළ මාර්තු 22 වැනිදා නුගේගොඩ, ගංගොඩවිල මහේස්ත්‍රාත් අධිකරණයේ මහේ-

චෝදනාවට ලක්වූ එම විකිරණ ශිල්පීන් දෙදෙනා හට එක් අයකුට රුපියල් ලක්ෂ දෙකක් බැගින් වූ ශරීර ඇප දෙකක් මත මුදා හැරුණේ නැවත මෙවන් සිදුවීම් නොවීමට වගබලා ගන්නා ලෙසට දැඩි සේ අවවාද කිරීමෙන් පසුවයි.

එලෙස මුදා හැරියද ලබන ජුනි මස 2 වැනිදා නැවතත් නුගේගොඩ, ගංගොඩවිල මහේස්ත්‍රාත් අධිකරණයේ දෙදෙනාටම පෙනී සිටින නියෝග කළ මහේස්ත්‍රාත්වරයා තවදුරටත් මේ පිළිබඳව වැඩිදුර විමර්ශනය කරන ලෙසට මහරගම පොලිසියටද නියම කෙරිණි.

කෙසේ හෝ මෙකී සිදුවීම එතරම් 'ගණන්' නොගෙන සිටීමට මහරගම, අපේක්ෂා රෝහලේ පරිපාලනයද පියවරගෙන තිබුණේ එම චෝදනාවට ලක්වූ විකිරණ ශිල්පීන් දෙදෙනාට එරෙහිව කිසිදු විනය පියවරක් හෝ නොගනිමිනි. අපද මේ පිළිබඳව රෝහල් අධ්‍යක්ෂවරයාගෙන්ද විමසීමක් කළත් එහි අධ්‍යක්ෂවරයා එය එතරම් තැකීමක් නොකොට නිහඬ වූයේ දුරකථනයද විසන්ධි කරමිනි. එසේම මෙකී අමනෝඥ සිදුවීමට කිසියම් ආකාරයක එම අකරතැබ්බයට සැල විණි.

හෙදියන් දෙපළක විශේෂයෙන් ශරීරයට අධික විසෙන් යුත් උපකරණ සහිත කාමරයක සිරකර තැබීම එක්තරා ආකාරයකින් බරපතළ ගණයේ කාන්තා හිංසනයක් ලෙසද සැලැකේ. එම හෙදි-

අත්අඩංගුවට ගත් විකිරණ ශිල්පීන් දෙදෙනාට අධිකරණයෙන් ඇප

යන් දෙපළගේ ජීවිතවලට මෙකී සිදුවීම හරහා යම් අවදානමක් ඇතිවුවහොත් ඊට වගකිවයුත්තන් දෙන පිළිතුර කුමක් ද? එම නිසා මෙවැනි අවදානම් ස්ථානවල රාජකාරි කරන සේවකයන් පිළිබඳව මීට වඩා නිසි බලධාරින් මෙන්ම පරිපාලකයන්ගේ වගකිවයුතු අවධානය යොමුවිය යුතුමය. එසේ නොමැති වුවහොත් ඉදිරියේදී මෙවැනි විහිළු තුළින් නිරපරාදේ වන්දි ගෙවන්නෙ මිනිස් ජීවිතයි.

මේ අතර ගෙවී ගිය සතියේ තවත් හෙදියක පිළිබඳවම මහරගමින්ම නොඇසිය යුතු අවාසනාවන්ත සිදුවීමක් වාර්තා විණි. ඒ මහරගම දන්ත රෝහලේ වෛද්‍යවරියක විසින් එම රෝහලේම සේවය කරන හෙදියකගේ කනට පහර දීමේ සිදුවීමකි. එම පහර දීමෙන් තුවාල ලත් හෙද නිලධාරිනිය කොළඹ ජාතික රෝහලේ 73 වාට්ටුටද ඇතුළත්කර තිබුණේ එම පහර දීමෙන් වූ රෝගී තත්ත්වයට ප්‍රතිකාර ලබා ගැනීම වෙනුවෙනි.

සෞඛ්‍ය අධ්‍යාපන ප්‍රවර්ධන හෙද නිලධාරිනියක වන ඇයට පහර දීම මෙන්ම මහරගම අපේක්ෂා රෝහලේ හෙදියන් දෙපළට සිදුවූ අකරතැබ්බය ඇතුළු පසුගිය කාලයේ හෙද සේවාවේ නියැළි සිටින්නන්ට වන තාඩන පීඩන පිළිබඳව රාජ්‍ය සේවා එක්සත් හෙද සංගමයේ සභාපති මුරුත්තෙට්ටුවේ ආනන්ද හිමියන්ගෙන් විමසීමක් කළහ.

"ඔය පහර දීමේ සිදුවීමට එරෙහිව අපි එම රෝහල ඉදිරිපිටම පසුගියදා කක්ම විරෝධතාවක් දැක්වූවා. ම හෙද හෙදියන් කරන්නෙ ාර්යභාරයක්. විශේෂයෙන්ම ත් කැපවීම මොනතරම්ද... ඇතැම් අවස්ථාවල හෙද හෙදියන් දිවා රෑ නොමැතිව රාජකාරියට කැපවෙලා ඉන්නෙ. මෑත කාලයේ සිට රෝහල් කීපයකම එවැනි හෙද හෙදියන් රැසකටම හරිම අප්‍රසන්න සිදුවීම්වලට මුහුණ දීමට සිදු වුණා. අපි මේ පිළිබඳව සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ බලධාරින් දැනුවත් කළා. ඒත් ඒ කිසිම නිලධාරියෙක්ගෙන් සාර්ථක ප්‍රතිචාරයක් ලැබෙන්නෙ නැහැ. අපිට මේ නිලධාරින්ගෙන් හෙදියන්ගේ ගැහැටවලට පිළිතුරු ගන්න වෙලා තියෙන්නෙ තර්ජනය කරලා. මං මේ පිළිබඳව ලිඛිතවම ඇමැතිතුමියව දැනුම්වත් කළා. ඉතින් මේ පිළිබඳව ඉදිරියේදී සාර්ථක පිළිතුරු නොලැබුණොත් දීප ව්‍යාප්ත විරෝධතාවක් ක්‍රියාත්මක කරනවා."

පාරිභෝගික ඔබේ පහසුවට ලංකා විදුලිබල මණ්ඩලයෙන්
Online සේවා රැසක්...

නව විදුලි සබඳතා ලබාගැනීමට අන්තර්ජාලය ඔස්සේ ඉල්ලුම් කරන්න

බිඳවැටුම් පිළිබඳ අන්තර්ජාලය ඔස්සේ අප වෙත දැනුම් දෙන්න

සැපයුම අත්හිටුවීම් අන්තර්ජාලය ඔස්සේ කල්තියා දැනගන්න

අන්තර්ජාලය ඔස්සේ විදුලි බිල ගෙවන්න

පිවිසෙන්න www.ceb.lk

CEBCare Web Portal එක ඔස්සේ පාරිභෝගික ඔබට මාර්ගගත සේවා රැසක්...
ඔබත් CEBCare හි ලියාපදිංචි වී මෙම පහසුකම් අදම අත්විඳින්න...

ලංකා විදුලිබල මණ්ඩලය
இலங்கை மின்சார சபை
CEYLON ELECTRICITY BOARD

විදුලි බලයෙන් සසිරිමත් දිවියක්...

ඔලිඳ දේශයේ පනස් වසරක මිත්‍රත්වය තවදුරටත් තහවුරු කළ වගයි

අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂයන්, බංග්ලාදේශ අගමැතිනී ශෙයික් හසීනා විසින් මහත් හරසරින් පිළිගත් අයුරු (වමේ) සහ දෙරටේ අගමැතිවරුන් ද්විපාර්ශ්වික සාකච්ඡා පැවැත්වූ අයුරු (දකුණේ)

● ටිරෝනි වෑවලගේ

අසල්වැසියන් සමඟ සමගිය, සාමූහිකත්වය සහ සහෝදරත්වය යනු නිවෙසකට, ගමකට පමණක් නොව රටකටද පොදු කරුණකි. අසල්වැසියන්ගේ සහයෝගීත්වය නොමැතිව පවුලකට පමණක් නොව රටකටද අපහසු කරුණකි. බංග්ලාදේශය යනු අපේ අසල්වැසියාය. ශ්‍රී ලංකාව සහ බංග්ලාදේශය අතර ඇත්තේ බංග්ලාදේශය තරම්ම ඉපැරණි මිතුදමකි. බංග්ලාදේශය බිහිවී තවමත් වැඩි ඈතක් නොමැති අතර එදා සිට අද දක්වා බංග්ලාදේශය යනු ශ්‍රී ලංකාවට නිරතුරු සහාය දක්වන ශ්‍රී ලංකාව සතු ඉතා හොඳ මිතුරෙකි.

බංග්ලාදේශයට නිදහස ලැබීමේ ස්වර්ණ ජයන්තිය වෙනුවෙන් ශ්‍රී ලංකාවේ අග්‍රාමාත්‍යවරයාට ආරාධනා ලැබෙන්නේද, එතුමා එම ආරාධනාවට අනුව තවමත් සාමාන්‍ය වී නොමැති කොවිඩ් වාතාවරණය හමුවේ වුවද බංග්ලාදේශයේ සංචාරයට එක් වන්නේද එකී නොබිඳුණු මිතුදම හේතුවෙනි.

බංග්ලාදේශය අතීතයේ ඉන්දියාවේම කොටසකි. එය වෙනම රටක් බවට පත් වන්නේ 1971 වසරේ මාර්තු 26වැනිදාය. එයට පෙර 1947දී බංග්ලාදේශ භූමිය ඉන්දියාවෙන් වෙන් කරන්නේ නැගෙනහිර පකිස්තානය වශයෙනි.

ඉන්දියාවට නිදහස ලබා දුන් බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් නොවනතින ලේ ගංගාවක් නිර්මාණය කරන්නේ ඉන්දියාව දෙකඩ කරමින් පකිස්තානය බිහි කරමිනි. අධිරාජ්‍යවාදීන් බිහිකළ පකිස්තානය අමුතුම රටක් විය. එය කොටස් දෙකකින් සමන්විත වූ අතර එම කොටස් දෙක පිහිටා තිබුණේ එකිනෙකට ප්‍රතිවිරුද්ධව කිලෝමීටර් ගණනාවක් දුරකිනි. එය නැගෙනහිර පකිස්තානය සහ බටහිර පකිස්තානය නම් විය.

මේ කොටස් දෙකකින් යුක්ත වූ පකිස්තානය පාලනය කිරීම එකල බටහිර පකිස්තානයේ සිට පකිස්තානය පාලනය කළ පාලකයන්ට ඉතා අසීරු විය.

එකල අද මෙන් දියුණු තාක්ෂණය නොපැවති අතර බටහිර පකිස්තානයේ සිට ගන්නා තීන්දු තීරණය නැගෙනහිර පකිස්තානයට දැනුම් දීමටද සැලකිය යුතු වේලාවක් ගත විය.

බටහිර පකිස්තානයේ ජනතාවට වඩා නැගෙනහිර පකිස්තානයේ ජනතාව භාෂාව, සංස්කෘතිය යනාදී විවිධ අංශයන්ගෙන් වෙනස්කම් සහිත වූ අතර ඒ වෙනස්කම් සමබර කර ගනිමින් පාලනයක් ගෙන යෑමට භූමියේ වූ දුරස්ත බව විශාල බාධාවක් විය.

ඒ අනුව නැගෙනහිර පකිස්තානය ස්වාධීන රාජ්‍යයක් බවට පත්වීමේ මූලික අවශ්‍යතාව පෙන්නුම් කරන්නට වූයේ එහි ආරම්භක අවධියේ සිටම බව පැවසිය හැකිය.

නොබෝ කලකින්ම නැගෙනහිර පකිස්තානය වෙනම ස්වධීන රාජ්‍යයක් ලෙස වෙන්විය යුතු බව ප්‍රකාශ කරන්නට වූ අතර එහි අවසානය සටහන් වන්නෙ 1971 වසරේදීය.

එහෙත් එම ස්වාධීනත්වය සටහන් වීමට පෙර බටහිර සහ නැගෙනහිර පකිස්තානය අතර රුධිර ගංගා ගලා ගිය අතර වාර්තා වන්නේ එම නිදහස් සටනේදී මිනිසුන් මිලියනයක් පමණ මිය ගිය බවය. කෙසේ වුවද නැගෙනහිර පකිස්තානයට නිදහස දීමට පකිස්තාන බලධාරීන්ට සිදුවන අතර ඒ සමඟින් බංග්ලාදේශය බිහිවන්නේය.

මේ බංග්ලාදේශ භූමිය බෙංගාල බොක්ක ආශ්‍රිත මුහුදු සීමාවෙන් අවසන් වන අතර රටේ සෙසු ප්‍රදේශ වටා පැතිර තිබෙන්නේ ඉන්දියාවට අයත් භූමියයි.

එය එසේ වුවද නිදහස ලැබූ තැන් සිට බංග්ලාදේශය අත් කරගෙන ඇති ප්‍රගතිය ඉතා විශාලය. කලින් කලට තට්ටුමාරු දේශපාලනය රටේ බලයට තරග වැදුනද, නිරන්තරයෙන් ඇතිවන සුළි කුණාටු හේතුවෙන් ගංගා සහ බ්‍රහ්මපුත්‍ර නම් වන අති විශාල ගංගාවන් පිටාර ගැලීමෙන් අති විශාල ජීවිත සහ දේපළ හානි සිදුවුවද බංග්ලාදේශය දිනෙන් දිනම පා නගමින් සිටින්නේ දියුණුව වෙතය.

> *නිදහස ලැබූ තැන් සිට බංග්ලාදේශය අත් කරගෙන ඇති ප්‍රගතිය ඉතා විශාලය. කලින් කලට තට්ටුමාරු දේශපාලනය රටේ බලයට තරග වැදුණද, නිරන්තරයෙන් ඇතිවන සුළි කුණාටු හේතුවෙන් ගංගා සහ බ්‍රහ්මපුත්‍ර නම් වන අති විශාල ගංගාවන් පිටාර ගැලීමෙන් අති විශාල ජීවිත සහ දේපළ හානි සිදුවුවද බංග්ලාදේශය දිනෙන් දිනම පා නගමින් සිටින්නේ දියුණුව වෙතය.*

එහිදී බංග්ලාදේශය නිරතුරුව අසල්වාසීන් සමඟ හිතවත්ව කටයුතු කළ අතර විශේෂයෙන් ශ්‍රී ලංකාව එරට ඉතාම හොඳ මිතුරකු විය.

මෙවර නිදහස දිනා ගැනීමේ පනස්වන සංවත්සරය සඳහා ශ්‍රී ලංකාවේ අගමැති මහින්ද රාජපක්ෂ මහතා ආරාධනා ලබන්නේ ද එකී මිත්‍රත්වය හේතුවෙන්මය.

එමෙන්ම මේ අවස්ථාවට සමගාමීව බංග්ලාදේශය විසින් එරට ජාතියේ පියා ලෙස විරුදාවලි ලබා සිටින බංගබන්දු ෂෙයික් මුජිබර් රහ්මාන් මැතිතුමාගේ ජන්ම ශත සංවත්සරය සැමරීමද සිදු කළ අතර මේ සැමරුම් දෙකම එක්වර යෙදීමෙන් සහ ඒ සඳහා ශ්‍රී ලංකා අග්‍රාමාත්‍යවරයාට ආරාධනා කිරීමෙන් ඔවුන් මේ අවස්ථාවට ලබා දුන් වැදගත්කමක්, ඒ සඳහා ආරාධනා කිරීමෙන් ශ්‍රී ලංකාවට ලබා දුන් වටිනාකමත් වටහා ගත හැකිය. එමෙන්ම 2020 අගෝස්තු මස මහින්ද රාජපක්ෂ මහතා ශ්‍රී ලංකාවේ අග්‍රාමාත්‍ය ධූරයට පත්වූ පසු නිරත වූ ප්‍රථම විදේශ සංචාරයද මෙය වන බැවින් එම සංචාරයට ශ්‍රී ලංකාවෙන් ලැබුණු වැදගත්මක කෙතරම්ද යන්න වටහාගත හැකිය.

බංග්ලාදේශයට සැපත් ශ්‍රී ලංකා අග්‍රාමාත්‍යවරයා මහත් හරසරින් පිළිගනු ලැබූ අතර පසුගිය 19වැනිදා ඩකා හි ජාතික පෙළපාළි පිටියේදී පැවති විශේෂ වැඩසටහනේදී 'විශේෂ ආරාධිතයා' ලෙස මහින්ද රාජපක්ෂ මහතාව එරට අගමැතිනිය ශෙයික් හසීනා විසින් නිවේදනය කර පිළිගනු ලැබූ අතර එහිදී ශ්‍රී ලංකා අග්‍රාමාත්‍යවරයා විසින් විශේෂ දේශනයක්ද සිදු කරනු ලැබීය.

එම දේශනය සඳහා ශ්‍රී ලංකා අග්‍රාමාත්‍යවරයා පදනම් කර ගනු ලැබ තිබුණේ බංග්ලාදේශයේ නිර්මාතෘ ශෙයික් මුජිබර් රහ්මාන්ගෙ දූරදර්ශී දේශපාලන වැඩපිළිවෙළයි.

එම සාර්ගර්භ දේශනය අවසානයේ බංග්ලාදේශ අගමැතිනිය ශ්‍රී ලංකා අග්‍රාමාත්‍යවරයාට විශේෂ ස්තුතියක් පුදකර සිටියේ මෙවැනි වසංගතය තත්ත්වයක් තුළ වුවද තම රටට පැමිණීමට කාරුණික වීම සම්බන්ධයෙනි.

පසුව දෙරටේ අගමැතිවරුන් දෙදෙනා අතර ද්විපාර්ශ්වික සාකච්ඡා ආරම්භ වූ අතර, එහිදී තුස්තවාදය හා ප්‍රචණ්ඩ අන්තවාදය හේතුවෙන් බහුවාදී සමාජවලට පැනනගින තර්ජන හඳුනාගෙන දෙරටේ පමණක් නොව කලාපයේම එවැනි තර්ජන පිටුදැකීමට සහයෝගය දීම කෙරෙහි දෙරටේ අග්‍රාමාත්‍යවරුන්ගේ අවධානය යොමු විය.

මේ සංකීර්ණ පොදු අභියෝගයන්ට මුහුණ දීම පිණිස ද්විපාර්ශ්වික සහයෝගීතාවට පහසුකම් සැලසීම සඳහා ඒකාබද්ධ ආයතනික යාන්ත්‍රණයක් සැකසීමට කටයුතු කිරීමටද ඔවුහු එකඟ වූහ.

මීට අමතරව ද්වී පාර්ශ්වික ගිවිසුම් හයකටද අත්සන් තැබීම සිදුවිය.

තරුණ සංවර්ධනය ශක්තිමත් කිරීම සඳහා වන අවබෝධතා ගිවිසුම, ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති කවුන්සිලය සහ බංග්ලාදේශ කෘෂිකාර්මික පර්යේෂණ සභාව අතර අවබෝධතා ගිවිසුම, දෙරට අතර ව්‍යක්තීය අධ්‍යාපනය පිළිබඳ අවබෝධතා ගිවිසුම, බංග්ලාදේශ හෙදියන් ශ්‍රී ලංකාවේදී පුහුණු කිරීම පිළිබඳ අවබෝධතා ගිවිසුම, ලක්ෂ්මන් කදිරගාමර් ජාත්‍යන්තර සහයෝගීතා සහ උපායමාර්ගික අධ්‍යයන ආයතනය සහ බංග්ලාදේශ ජාත්‍යන්තර සහ උපායමාර්ගික අධ්‍යයන ආයතනය අතර සහයෝගීතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම සහ 2021 – 2025 දක්වා දෙරට අතර සංස්කෘතික නුවමාරු පිළිබඳ අවබෝධතා ගිවිසුම එම ගිවිසුම් වේ.

මීට අමතරව කලාපයේ සංචාරක කටයුතු ප්‍රවර්ධනයට කටයුතු කිරීමේ හැකියාව පිළිබඳ අවධානය යොමු වූ අතර, වෙරළබඩ සංචාරක නෞකා පිළිබඳ අවබෝධතා ගිවිසුමක් ඇති කර ගැනීම සම්බන්ධවද අවධානය යොමු විය.

තිරසාර සංවර්ධනය පිළිබඳ 2030 න්‍යාය පත්‍රය ඵලදායී ලෙස සාක්ෂාත් කර ගැනීම සඳහා කටයුතු කිරීම සම්බන්ධයෙන්ද දෙරටේම එකඟතාව හිමි විය. එමෙන්ම දෙරටේ නායකයින්ගේ වඩා වැඩි අවධානය සමෘද්ධිමත්, සාමකාමී, ස්ථාවර දකුණු ආසියානු කලාපයක් බිහි කිරීම සම්බන්ධව වන යෝජනා කෙරෙහි යොමු විය.

ශ්‍රී ලංකාව සහ බංග්ලාදේශය අතර රාජ්‍යතාන්ත්‍රික සබඳතා පිහිටුවීම පිළිබඳ පනස් වැනි සංවත්සරය ලබන වසරට යෙදී ඇති බැවින් ඒ අදාළ සැමරුම් සිදුකිරීම කෙරෙහිද දෙරටේම අවධානය යොමු වී ඇති බවද ප්‍රකාශ විය.

ජිනීවා යෝජනා සම්මත කර ගනිද්දී ආසියාව-අප්‍රිකාව අප සමඟ



● ටිරෝනි වෑවලගේ

ජිනීවා මානව හිමිකම් කවුන්සිලය පසුගියදා ශ්‍රී ලංකාව සම්බන්ධව තවත් යෝජනාවක් සම්මත කර ගත්තේය. එය යෝජනාවක් ලෙස මානව හිමිකම් කවුන්සිලයට ඉදිරිපත් කරනු ලැබුවේ බ්‍රිතාන්‍ය ප්‍රමුඛ රටවල් කණ්ඩායමක් විසිනි. එලෙස ඉදිරිපත් කෙරුණු යෝජනා සම්බන්ධව ශ්‍රී ලංකා රජය තම එකඟතාව පළ නොකළ බැවින් ඒ යෝජනා සම්බන්ධව ඡන්ද විමසීමක් කිරීමටද සිදුවිය. පසුගියදා සිදුවූ එම ඡන්ද විමසීමෙන් යෝජනා සම්බන්ධව එකඟතාව පළ කරමින් වැඩි ඡන්ද ප්‍රමාණයක් හිමිවූ අතර තවත් රටවල් කිහිපයක් ශ්‍රී ලංකාවට පක්ෂවද ඡන්දය භාවිත කළහ. තවත් රටවල් ඡන්දය භාවිත කිරීමෙන් වැළකී සිටියහ.

ජිනීවාහි එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව හිමිකම් කවුන්සිලය සමන්විත වන්නේ රටවල් 47කිනි. එම සාමාජිකයන් 47 අප්‍රිකානු රටවල් 13කින්ද, ආසියා පැසිෆික් රටවල් 13කින්ද, නැගෙනහිර යුරෝපා රටවල් 6කින්ද, ලතින් ඇමරිකානු සහ කැරිබියන් රටවල් 8කින්ද, බටහිර යුරෝපා සහ තවත් රටවල් 7කින්ද සමන්විත වේ. මේ එහි ව්‍යුහයයි. මේ රටවල නිත්‍ය සාමාජිකයන් මෙන්ම වරින්වර නුවමාරුවන නියෝජනයන්ද වේ. කෙසේ වුවද ශ්‍රී ලංකාවද අතීතයේ සිටම එහි සාමාජිකත්වය උසුලයි. ලෝකයේ රටවල සිදුවන මානව හිමිකම් කඩ කිරීම් සම්බන්ධව සොයා බලා ඒ පිළිබඳ සාධාරණයත්වය ඉෂ්ට කිරීමට කටයුතු කිරීම මානව හිමිකම් කවුන්සිලයේ ප්‍රධාන කාර්යභාරය වේ. එහෙත් එසේ වූ පමණින් මානව හිමිකම් කවුන්සිලය සර්ව සාධාරණ විනිශ්චය ආසනයක් ලෙසින්ද හඳුනාගත හැකිද යන ප්‍රශ්නයට ඉතිහාසය පුරා ශ්‍රී ලංකාව මුහුණ දී තිබේ.

එහි ක්‍රියාකාරීත්වය බටහිර රටවලට වාසිදායක අන්දමින් ක්‍රියාත්මක වන අන්දම ලෝකය අත්දුටුවේ වරක් දෙවරක් නොවේය. ඇතැම්විට රුසියාවේ සහ චීනයේ නිෂේධ බලය නොවන්නට බොහෝ අන්තනෝමතික තීරණ මේ මානව හිමිකම් කවුන්සිලය වෙතින් එළිදකින්නට ඉඩ තිබිණි.

මෙවර ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ඉදිරිපත් වූ යෝජනා මාලාවේ එක් ප්‍රධාන යෝජනාවක් වූයේ උතුරේ ඉඩම් හමුදාව විසින් බලහත්කාරයෙන් අත්පත් කර ගැනීමය. ඒ සම්බන්ධ චෝදනා එල්ල කිරීමේදී අප රටේ උතුරුකරයේ ජනතා නියෝජිතයන් රැසකගේ සහයෝගයද හිමිවන අන්දම දැක ගත හැකි විය.

මේ යෝජනා ඉදිරිපත් කිරීමේදී සහය දැක්වූ බ්‍රිතාන්‍ය ඒ සඳහා විශේෂ අන්තර්ජාල සමුළු වාරයක් පසුගිය මාර්තු 20වැනිදා පැවැත්වීය. එම සමුළු වාරය ඇමතීමට ශ්‍රී ලංකාවේ උතුරුකරයේ ජනතා නියෝජිතයන් කිහිප දෙනෙක්ම දායක වූ අතර ප්‍රධාන දේශනය පවත්වන ලද්දේ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ හිටපු මහ කොමසාරිස් නවනීදන් පිල්ලේ මහත්මියයි. ඒ සඳහා තවත් ජනප්‍රිය චරිතයක් වූ හිටපු බ්‍රිතාන්‍ය අගමැති ටෝනි බ්ලෙයාර්ගේ බිරිය වන චෙරී බ්ලෙයාර්ද එක් වූවාය. චෙරී බ්ලෙයාර් මේ වන විට අන්තර්ජාතික මානව හිමිකම් නීතිඥවරියක් ලෙස කටයුතු කරන්නීය. ටෝනි බ්ලෙයාර් බ්‍රිතාන්‍ය අගමැති ලෙස කටයුතු කරන අවධියේ ජෝර්ජ් බුෂ් සමඟ එක්ව හමුදා මෙහෙයවා ඉරාකය බිමට සමතලා කර දැමූ අන්දමත් ඒ හේතුවෙන් ඉරාක වැසියන්ගේ මානව හිමිකම් කඩවූ අන්දමත් චෙරී බ්ලෙයාර්ට අමතක වී ඇති අන්දම පුදුම සහගතය. බොහෝවිට මේ සියල්ලේ ඉලක්කය බ්‍රිතාන්‍යයේ පදිංචි දෙමළ ජනතාවගේ ඡන්ද විය හැකිය. කෙසේ වුවද අවසානයේ ඡන්ද විමසීම නිමා වූයේ ශ්‍රී ලංකාව සම්බන්ධ යෝජනාවට වැඩි ඡන්ද ලැබීමත් සමඟිනි. එහිදී ආර්ජන්ටිනාව, ආර්මේනියාව, ඔස්ට්‍රියාව,බහමාස්, බ්‍රසීලය, බල්ගේරියාව, චෙක් ජනරජය, ඩෙන්මාර්කය, ෆීජී, ප්‍රංශය, ජර්මනිය, ඉතාලිය, මලාවි, මාෂල් දූපත්, මෙක්සිකෝව, පෝලන්තය, දකුණු කොරියාව, යුක්‍රේනය, උරුගුවේ ඇතුළු රටවල් 22ක් යෝජනාවට පක්ෂව ඡන්දය ලබා දුන්හ. ශ්‍රී ලංකාවට පක්ෂව එනම් යෝජනාවට විරුද්ධව ඡන්දය ලබා දුන් රටවල් 11අතර රුසියාව, චීනය සහ පකිස්තානය මෙන්ම බංග්ලාදේශය, බොලිවියාව, කියුබාව, එරිත්‍රියාව, පිලිපීනය, සෝමාලියාව, උස්බෙකිස්තානය සහ වෙනිසියුලාවද විය.

වමේ සිට, විදේශ ඇමති දිනේෂ් ගුණවර්ධන සහ මානව හිමිකම් කොමසාරිස්වරිය මිෂෙල් බැෂලේ

මේ රටවල් කණ්ඩායම් දෙක දෙස බැලූ විට අන්තර්ජාතික දේශපාලනය දන්නා අයට පැහැදිලිවම පෙනී යන්නේ මේ ඇත්තේ ලෝකයේ ප්‍රධාන බල කඳවුරු දෙකේ නියෝජනයක් බවයි. දක්ෂිණාංශික බල කඳවුර ශ්‍රී ලංකාවට විරුද්ධ යෝජනා සම්මතයට එක්වන අතර ශ්‍රී ලංකාව ආරක්ෂා කිරීමට එක්ව සිටින්නේ වාමාංශික බල කඳවුර ලෙස හඳුනාගත හැකිය. වර්තමානය වන විට වාමාංශික සහ දක්ෂිණාංශික සීමා මායිම් එහා මෙහා වී පැවතියද තවමත් මේ කඳවුරේ රටවල් දක්ෂිණාංශයට දණ නැමීම ප්‍රතික්ෂේප කරන රටවල් ලෙස හඳුනා ගත හැකිය.

සැබවින්ම ශ්‍රී ලංකාව මානව හිමිකම් කවුන්සිලයේදී තර්ක කර සිටියේ තමන්ට එල්ල වී ඇති චෝදනා සාධාරණ නොවන බවයි. එහිදී මේ යෝජනා සම්මතවීම වැළැක්වීමට මෙන්ම යෝජනා සංශෝධනය කිරීමටද විදේශ අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතා ඇතළු පිරිස ගත් උත්සාහයන් අගය කළ යුතුය. කෙසේ වුවද මේ යෝජනා සම්මත වුවද විදේශ අමාත්‍යවරයා පෙන්වා දෙන්නේ මේ යෝජනා සම්බන්ධව ඡන්දය ලබා දීම ප්‍රතික්ෂේප කළ රටවල් සංඛ්‍යාවට අනුව සැබවින්ම යෝජනාවලට එකඟතාව නොදැක්වූ රටවල් සංඛ්‍යාවෙන් වැඩි බවයි.

මේ යෝජනාවලට තම මතය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටි සිටි රටවල් සංඛ්‍යාව 14කි. එම රටවල් අතර බර්කිනා ෆාසෝ, කැමරූන්, ගැබොන්, ඉන්දියාව, ඉන්දුනීසියාව, ජපානය, ලිබියාව, නැමීබියාව, නේපාලය, සෙනගාල්, සූඩාන් සහ ටොගෝ යන රටවල් විය. මේ රටවල් දෙස බැලූ විට පෙනී යන විශේෂ කරුණක් වේ. එනම් මේ රටවල් ආසියා මහාද්වීපයට සහ අප්‍රිකා මහාද්වීපයට අයත් බවයි.

ආසියාව මෙන්ම අප්‍රිකාවද යුරෝපය ඇතුළු ධනවත් රටවල කුඩම්මාගේ සැලකිලිවලට නිබඳව මුහුණ දෙන රටවල් සහිත කලාපයන් දෙකකි. මේ රටවල ජනතාවට අධික පොලී සහිත ණය හෝ කොන්දේසි මිස මේ නිති දමන ධනවත් රටවලින් ලැබුණු මානුෂීය ආධාර කිසිවක් නැත. යටත්විජිතකරණය යටතේ ඔය රටවල් සියල්ලම ධනවත් වූයේද ආසියාව සහ අප්‍රිකාව සූරාගෙන කෑමෙනි. අදටත් ඔවුන් වක්‍රාකාරව සිදුකරමින් සිටින්නේද එයමය. එබැවින් ආසියාවේ මෙන්ම අප්‍රිකාවේ රටවල් මෙවැනි මත විමසුමකදී නිශ්ක්‍රිය වීම පුදුමයට කරුණක් නොවේය. එහෙත් අප උනන්දු විය යුතු වන්නේ මේ රටවල් අපේ පාර්ශ්වයට දිනා ගැනීම කෙරෙහිය. කෙසේ වුවද ඔවුන් අපට විරුද්ධ නොවීමම සතුටට කරුණකි. දකුණු ආසියා කලාපය සැලකුව විට පකිස්ථානය සහ බංග්ලාදේශය අපට පක්ෂ වන විට ඉන්දියාව සහ නේපාලය නිශ්ක්‍රිය වන්නේය. එය සතුටට කරුණකි.

එහෙත් ඉන්දියාව කෙසේ වෙතත් නේපාලය හෝ අපගේ පාර්ශ්වයට දිනා ගැනීමට කටයුතු කළ හැකි නම් එය ජයග්‍රහණයක් වන්නේය. අප්‍රිකා මහාද්වීපය සමඟ ශ්‍රී ලංකාව වඩාත් සුහද සබඳතා පවත්වා ගත යුතු වන්නේය.

ශ්‍රී ලංකාව අනාදිමත් කාලයක සිය විදේශ ප්‍රතිපත්තිය ලෙස ඉතා විධිමත් නොබැඳි පිළිවෙතක ගමන් ගන්නේය. එය මුළු ලෝකයටම එක සමාන වඩා ස්ථාවර පිළිවෙතක් බව අවස්ථා ගණනාවකදී ඔප්පු කර ඇත්තේය. අනාගත ලෝකයේ ගාමක බලවේගය වනු ඇත්තේ ආසියාව වුවද යුරෝපයේ මෙන්ම ඇමරිකා කලාපයේද ශ්‍රී ලංකාව හොඳ හිත පැතිරවිය යුතු වන්නේ නොබැඳි පිළිවෙත දිගින් දිගටම ක්‍රියාත්මක කරමිනි. කැත්තට පොල්ල සංකල්පය ජාත්‍යන්තර සබඳතාවලදී කිසිසේත් සාධනීය වන්නේ නැත.

අනික් අතට රටක ස්වාධිපත්‍යයට ඇඟිලි ගැසීම්වලින් වැළකීමට ලෝකයේ බලවත් යැයි සැලකෙන රටවල් කටයුතු කළ යුතුය. රටක් තම අභ්‍යන්තර ගැටලුවලින් මිදෙන්නේ නම් එහි වාසිය එම රටේ ජනතාවටමය. රුසියාව සහ චීනය යන අනාදිමත් කාලයක සිට අප සමඟ සිටින මිතුරන් මේ අත්දැකීම්වලට අප්‍රමාණව මුහුණ දුන් රටවල්ය. එහෙත් ඔවුන් මේ අභියෝග හමුවේ නොසැලී සිටින්නේ තම මිතුරන්වද ආරක්ෂා කර ගනිමිනි. කියුබාවද කිසිදා ශ්‍රී ලංකාවට එරෙහිව කටයුතු නොකරන, අප මෙන්ම බටහිර ධනවතුන්ගේ අතපෙවීම්වලට විරුද්ධ මතකය පවතින රටකි. කියුබාව මෙහිදී අපට ලබා දුන් සහයද ඉතා අගය කළ යුතුය. අප මෙවැනි අවස්ථාවනට සාර්ථකව මුහුණ දෙන්නේ කෙසේද යන්න එම රටවල අත්දැකීම් ඔස්සේ සලකා බැලිය යුතුය. එමෙන්ම රටේ ස්වෛරීභාවයට හානි කරන ඕනෑම අවස්ථාවකදී ශක්තිමත්ව එයට විරුද්ධ විය යුතුය.

විදේශ අමාත්‍යාංශය මෙහිලා සිදු කරන කාර්ය භාරය අති විශාලය. එහෙත් එය තවදුරටත් සාධනීය විය යුතුය. මිතුරන් වර්ධනය කර ගැනීම පහසු නැත. එහෙත් සතුරන් ඇති කර ගැනීම පහසුය. මිතුරන් ඇති කර ගැනීම යනු කියන පදයට නැටීමද නොවන බව සිහියේ තබා ගත යුතුය. අද ලෝකයේ රටවල ආනගතය තීරණය වන්නේ රට අභ්‍යන්තරයේ නොවේය. එය තීරණය වන්නේ රටින් බාහිරව සිදුවන බලවතුන්ගේ ක්‍රියාකාරකම් සහ තීන්දු තීරණ හමුවේය. එවැනි අවස්ථාවක අපට අනන්‍ය වැඩපිළිවෙළක පැවතීම ඉතා දුෂ්කරය. එහෙත් දුෂ්කරය යනුවෙන් අදහස් වන්නේ ජයග්‍රහණය කිරීමට නොහැකි බව නොවේය.

මේ සම්මත කර ගත් යෝජනා හමුවේ ඉදිරියේදී ශ්‍රී ලංකාව මත අන්තර්ජාතික බලපෑම් වැඩි වීමට ඇතැම් විට ඉඩකඩ පවතින්නේය. එවැනි අවස්ථාවලදී ඉතා සුක්ෂ්මව කටයුතු කිරීමට අපේ රටේ බලධාරීන් දැනුම්වත් විය යුතුමය. එසේ නොකළහොත් ශ්‍රී ලංකාව අන්තර්ජාතික කෙළිබිමක් බවට පත්වනු ඇති අතර එහි අවාසියද අපේම දූ පුතුන්ට අත්විඳීමට සිදුවනු ඇත.

වැලිකඩ වටරවුමේදී දිවි අහිමි වූ උප පොලිස් පරීක්ෂකවරයා

රංජිත් ප්‍රියංකර උප පොලිස් පරීක්ෂකවරයාගේ දේහය අසල හඬා වැටෙන බිරිය මානෙල් ඉන්ද්‍රාණි සහ දියණිය පී.ආර්.දේශාණි ඇතුළු ඥාති හිත මිත්‍රාදීන්

උප පොලිස් පරීක්ෂකවරයා පොලිස් ආචාර මැද අවසන් ගමන් ගිය අයුරු

● අක්මීමන විශේෂ, **සුනිල් ගමගේ**

උප පොලිස් පරීක්ෂක රංජිත් ප්‍රියංකර හා ලොරි රථයේ සහායකවරයකුට මරු කැඳවමින් පසුගිය 23 දින උදැසන රාජගිරියේදී සිදු වූ අනතුර බොහෝදෙනකුගේ නෙතට කඳුළක් නැංවීමට සමත් විය. සිය රාජකාරියේ යෙදෙමින් වාහනයක් පරීක්ෂා කරමින් සිටියදී බත්තරමුල්ල දෙසින් අධික වේගයෙන් පැමිණි වෑන්රථයක් මොවුන් දෙදෙනා යටකරගෙන ගියහ. එහි දී බරපතළ තුවාල ලැබූ රංජිත් ප්‍රියංකර උප පොලිස් පරීක්ෂකවරයාගේ මෘත දේහය රඳවා ඇති ඔහුගේ නිවෙසට අප ගියේ වැඩිවිස්තර සොයා ගනු වස්ය.

වැලිකඩ ආයුර්වේද වටරවුම ආසන්නයේ දි රථවාහන රාජකාරියේ යෙදී සිටියදී අධික වේගයෙන් පැමිණි වෑන් රථයක් යටකරගෙන යෑමෙන් මෙම උප පොලිස් පරීක්ෂකවරයා හා තවත් අයකු මිය ගියේය. කොළඹ ජාතික රෝහලේ දී කළ හදිසි මරණ පරීක්ෂණයේ දී පරීක්ෂකවරයාගේ වාර්තාව අනුව අනතුරට පත් රංජිත් ප්‍රියංකරගේ එක් පාදයක් ස්ථාන තුනකින් කැඩී ගොස් ඇති බවත්, පපු ප්‍රදේශයෙන් ඉරණම් ඇට 4ට වැඩි ප්‍රමාණයක් බිඳී ගොස් ඇති බවත්, හිසෙහි පිටුපසින් මොලය ප්‍රදේශයට බරපතළ ලෙස තුවාල සිදුවී ඇති බවත් සඳහන් වී ඇත.

මෙම අනතුරෙන් මියගිය උප පොලිස් පරීක්ෂකවරයා අක්මීමන බඳුන්ගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. නැගණිය අප සමඟ මෙසේද කීවාය.

‘අයියාට මෙහෙම දෙයක් වේවි කියලා අපි සිහිනෙකින්වත් සිතුවේ නැහැ. පොලිස් කොස්තාපල්වරයකු ලෙස තමයි මුලින්ම පොලිසියට බැඳුණේ. අයියා පොලිස් සේවයට එක්වෙලා වසර 30කටත් වැඩියි. ඔහු කොළඹ, වවුනියාව, ත්‍රිකුණාමලය යන ප්‍රදේශවල පිහිටි පොලිස් ස්ථාන රැසක රාජකාරි කළා. ‘

උපපොලිස් පරීක්ෂකවරයාගේ හදිසි වියෝවය දරාගත නොහැකිව බිරිඳ හා එකම දියණිය දැඩි කම්පනයට පත්ව සිටිති. මියගිය උප පොලිස් පරීක්ෂකවරයාගේ දේහය පසුගිය (23)දා රාත්‍රි නිවසට රැගෙන විත් තිබුණි. තම සැමියාගේ හදිසි වියෝවය දරාගත නොහැකිව බිරිඳ වන අතුලහේවගේ මානෙල් ඉන්ද්‍රාණි හැඬූකඳුළින් යුතුව මෙසේ කීවාය.

‘අනේ මගේ මහත්තයාට මොකද වුණේ. ඇය එසේ කියමින් හඬා වැළපෙන්නීය. නිවසේ සාලයේ තැන්පත්කොට ඇති සිය සැමියාගේ මෘත දේහය දෙස බලාගෙන වැලපින්නියක් ලෙස හඬා වැලපෙන්නීය.

උප පොලිස් පරීක්ෂකවරයාගේ එකම දියණියට ද තම පියාගේ වියේවය දරාගත නොහැකිය.

...මියගිය උප පොලිස් පරීක්ෂකවරයාගේ එකම දියණිය වන පි.ආර්.දේශාණි සිය පියාගේ වියෝව ගැන මෙසේ පැවසීය.

සිද්ධිය වූ දිනයේ මමත් අම්මත් ගොදර නිදියගෙන හිටියෙ. උදේ 5ට පමණ හදිසි අනතුරු ඇංශයෙන් දුරකතන ඇමතුමක් ආවා; ඉක්මනට අම්මත් එක්ක රෝහලට එන්න කියලා. අපි දුරකතන ඇමතුම ආ විගසම රෝහලට ගියා. එතනදි අපිට කිව්ව තාත්ත රාජකාරියේ යෙදී සිටින විට රිය අනතුරක් සිදුවෙලා කියල. අපි පස්සෙ දැනගත්ත රිය අනතුරින් තාත්ත මියගොස් ඇති බව. අනේ මගේ තාත්තා, රාත්‍රී රාජකාරියට ගියේ මාව උදේට කැම්පස් එක්ක යන්න එනව කියලා‘

“දුව කැම්පස් එක්ක යන්න එනවා කියූ සැමියා ගෙදර ආවේ පෙට්ටියෙන්..”

බිරිය මානෙල් හැඬූ කඳුළෙන් කියයි...

රංජිත් ප්‍රියංකර දක්ෂ පොලිස් නිළධාරියෙකි. තමාට පවරන ඕනෑම රාජකාරියක් අකුරටම ඉටු කිරීමට උපරිම ලෙස උනන්දු වන නිසාම ඉහළ නිළධාරීන්ගේ පැසසුමට ලක්වී ඇති නිලධාරියෙකි.

උසස් පොලිස් නිලධාරීන් පැවසූ ආකාරයට රංජිත් ප්‍රියංකර කිසිවකුගෙත් සිත් නොරිදවා රාජකාරිය ඉටු කරන්නට උත්සාහ ගත් අයෙක්. ඔහු රාජකාරියත් හරියටම කරපු අයෙක්. ඒ වගේම කාගෙවත් හිත් නොරිදෙන ආකාරයෙන් කටයුතු කරන්නත් උත්සාහ ගත් අයෙක්. ඒ හින්දම ඔහුට ප්‍රශංසා පිරිනැමීම් 160ක් ඉක්මවා ඇති බවත් පොලිස්පති තුමාගේ එක් ප්‍රශංසා පිරිනැමීමක් සිදුව ඇති බවත් එම පොලිස් නිලධාරීන්ගෙන් ප්‍රකාශ විය. එමෙන්ම උසස් නිලයන්ගේ මෙන්ම පහත් නිළධාරීන්ගේ ද සිත් දිනාගෙන කටයුතු කරන්නට සමත් වූ රංජිත් ප්‍රියංකර උප පොලිස් පරීක්ෂකවරයා කෙරෙහි හැම කෙනෙක්ගෙන්ම ලෙන්ගතු සෙනෙහසක් හිමි වූ බවද ඔහු සමඟ සේවයේ යෙදී සිටින නිළධාරීන්ගෙන් අසන්නට ලැබුණු කරුණකි.

ඒ නිසාම සිද්ධිය වූ මොහොතේ පටන් ඔහුත් සමඟ රාජකාරි කළ සෑම තරාතිරකම නිලධාරීන් ඔහුගේ වියෝවින් කම්පාවට පත් වී ඔහු වෙනුවෙන් කළ හැකි සියල්ලම ඉටු කරන්නට උත්සාහ ගත් ආකාරය දකින්නට ලැබිණි.

මෘත දේහය නිවසේ තැන්පත් කළ අවස්ථාවේ සිට අවසන් කටයුතු කරන තෙක් නිවසේ සිටුවූ සියලුම දේ එම නිළදාරීන්ගෙන් ඉටුවීම ප්‍රශංසනීය වේ. උප පොලිස් පරීක්ෂකවරයාට කරන ගෞරවයක් වශයෙන් ඔවුන් තමන්ට හැකි ආකාරයෙන් කටයුතු කරමින් මියගිය රංජිත් ප්‍රියංකරට එසේ කෘතගුණ සැලකිය.

උප පොලිස් පරීක්ෂකවරයාගේ අවසන් කටයුතු පසුගිය 25 දින පූර්ණ පොලිස් ගෞරව මැද පවුලේ සුසාන භූමියේ දී සිදුකෙරිණි.

ඡායාරූප-ජයලාල් ජයවර්ධන - ගාල්ල

මොබිටෙල් (පුද්ගලික) සමාගම
ව්‍යාපෘති යෝජනාවක් සඳහා අයැදුම්පත් (RFP) කැඳවීම

පහත සඳහන් අවශ්‍යතාවයන් සඳහා මොබිටෙල් පුද්ගලික සමාගමට තාක්ෂණික සහ වාණිජ යෝජනා කැඳවනු ලැබේ.

- RFP No.: MOB/MKT/28/03/21-005
  මොබිටෙල් පුද්ගලික සමාගම සඳහා රියදුරු සේවා ලබාගැනීම 2021/2023

- RFP No.: MOB/ADM/28/03/21-004
  මොබිටෙල් පුද්ගලික සමාගම සඳහා පවිත්‍රතා සේවා ලබාගැනීම 2021/2023

2021 මාර්තු මස 28 වන දින සිට 2021 අප්‍රේල් මස 19 වැනිදා දක්වා RFP අයැදුම්පත් www.mobitel.lk/RFP වෙබ් අඩවිය වෙත පිවිස ඩවුන්ලෝඩ් කරගැනීමට හැකියාව තිබේ.

අදාළ ලියකියවිලි සමඟින් නිසි පරිදි සම්පූර්ණ කොට අත්සන් තබන ලද ලියාපදිංචි වීමේ අයැදුම්පත (මුද්‍රා තබන ලද තාක්ෂණික සහ වාණිජ යෝජනා අයැදුම්පත් වෙන වෙනම ලියුම් කවරවල බහා) අවසාන දිනට සහ වේලාවට පෙර ප්‍රසම්පාදන අංශය වෙත ගෙනැවිත් භාරදෙන්න. දිනය පසුවී භාරදෙනු ලබන සියලුම අයැදුම්පත් සහ අදාළ ලියකියවිලි අසම්පූර්ණ වීම, ලංසු ඇපකරය, NDA සහ අනෙකුත් විස්තර සහිත අසම්පූර්ණ අයැදුම්පත් නිෂ්ප්‍රභ කිරීමේ අයිතිය මොබිටෙල් සතු වේ.

RFP සඳහා සහභාගි වීමට බලාපොරොත්තු වන මොබිටෙල් හි ලියාපදිංචි වී නොමැති සැපයුම්කරුවන් ඉහත සඳහන් අවසාන දිනයට ප්‍රථමයෙන් මොබිටෙල් හි ලියාපදිංචි විය යුතුයි. මොබිටෙල් විකුණුම්කරුවන් හට ලියාපදිංචි පත්‍රිකාව www.mobitel.lk/SupplierRegistrationForm මඟින් ඩවුන්ලෝඩ් කරගත හැක.

කළමනාකරු - ප්‍රසම්පාදන
ප්‍රසම්පාදන අංශය
මොබිටෙල් (පුද්) සමාගම
109, ගාලු පාර, කොළඹ 3.

SLTMOBITEL
එකම එක සබැඳියාව

තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය
ජාතික තරුණ සේවා සභාව

ක්‍රීඩා සංචිත හා ක්‍රීඩා පුහුණු කඳවුරු සඳහා පුහුණු උපදේශකයින් බඳවා ගැනීම

පූර්ණකාලීන / කෙටිකාලීන / අර්ධකාලීන [සතිඅන්ත]

1) මලල ක්‍රීඩා පුහුණුකරු

2) ක්‍රීඩා කණ්ඩායම් පුහුණුකරු
(වොලිබෝල්/බීච් වොලිබෝල්/නෙට්බෝල්/බාස්කට් බෝල්/බැඩ්මින්ටන්/ක්‍රිකට්/පාපන්දු/කාන්තා පාපන්දු/කබඩ්ඩි/එල්ලෙ/කැරම්/චෙස්/කඹ ඇදීම)

3) පුහුණු සංචිත පුහුණුකරු
(දුනු විදීම/ඉලක්කයට වෙඩි තැබීම/පිහිනුම්/මිශ්‍ර සටන් කලාව/කරාතේ/වූෂු/ටයිකොන්ඩෝ/ජූඩෝ/ජිම්නාස්ටික්/යෝග/කායවර්ධන)

ඉහත තරග සඳහා ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා ජාතික මට්ටම්වලදී පුහුණු කිරීමට කැමති උපදේශකවරුන්ට අයදුම් කල හැක

www.nyscsports.com

තෙජාර ජයසිංහ
සභාපති/අධ්‍යක්ෂ ජනරාල්
ජාතික තරුණ සේවා සභාව
මහරගම

වෙබ් අඩවියේ උපදේශකවරුන් බඳවා ගැනීමේ අයදුම්පත්‍රය මගින් **2021 මාර්තු මස 31 වන දිනට පෙර** අයදුම් කරන්න.

බස් අනතුරින් දෙමවුපියන් මියගිය දරු තිදෙනාට රැකවරණයක්

බස් රථ අනතුරින් මියගිය දරුවන්ගේ පියා සහ මව

දෙමවුපියන් අහිමි වූ දරු තිදෙනා

විශේෂඥ වෛද්‍ය පාලිත රාජපක්ෂ සහ බිරිය තරංගා සඳමාලි වික්‍රමරත්න සිය දරුවා සමඟ

බස් අනතුරින් මියගිය අන්තෝනි සාමි සහ මැඩෝනා දෙමවුපියන්ගේ රැකවරණය අහිමිවූ දරු තිදෙනා බාරගෙන හදාවඩා ගැනීමට අම්පාර සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක කාර්යාලයේ වසංගත රෝග විශේෂඥ වෛද්‍ය පාලිත රාජපක්ෂ සහ ගුරුවරියක් වන ඔහුගේ බිරිය තරංගා සඳමාලි ඉදිරිපත්ව සිටී. ඔවුනටද වසර 3 හමාරක පුතණුවකු සිටී

බස් රථ අනතුරින් මියගිය අසංක, ජෙතුම් බේබි, කාවින්ද්‍රා සහ සඳමාලි (වමේ සිටය)



අනතුරින් මිය ගිය ඩිනල්, යෝගදාස්, සුබ්‍රමනියම් සහ මුරලිදරන් (වමේ සිටය)



අනතුරින් මිය ගිය නාගරත්නම්, අන්තෝනි සාමි සහ මැඩෝනා, ෆාතිමා සහ ජයසීලන් (වමේ සිටය)

පස්සර බස් අනතුරේ කඳුළු කතාව

මියගිය සංඛ්‍යාව 14 යි : තුවාලකරුවන් 31යි

● **ප්‍රසන්න පත්මසිරි**
ඌව පළාත් සමූහ

ලුණුගල සිංහල, දමිළ, මුස්ලිම්, කිතුනු යන හැමකාගේම නෙතට කඳුළක් එක්කළ දිනයක් වූයේ පසුගිය විසි වැනිදාය. එදා නිවාඩු දිනයක් වුවත් දහසකුත් එකක් බලාපොරොත්තු පොදි බැඳගෙන වෙනදා මෙන්ම තමන්ගේ අධ්‍යාපනික කටයුතු ඇතුළු ජීවනෝපායන් සොයා බසයක නැඟ ගිය ඇතමුන්ට මරණය හිමි වෙද්දී තවත් අය සදාකාලික ආබාධිතයන් වූයේ ප්‍රදේශයටම කඳුළක් එක් කරමින්ය.

වෙනදා මෙන්ම එදා උදේත් 6.30ට ලුණුගලින් කොළඹ බලා ගමන් ගිය පෞද්ගලික මඟී බස් රථයක ගමනාන්තය විනාඩි හතළිස් පහකින් නිමා වූයේ අඩි 250ක ප්‍රපාතයක පෙරළීමෙනි.

අනතුරින් බසයේ ගමන්ගත් 14 දෙනෙකුට ජීවිත අහිමි වෙද්දී ඔවුන්ගේ දරු පවුල් වල සියලු දෙනාටත් ජීවිතයේ සියලු බලාපොරොත්තු අහිමි විය. තවත් හය හත් දෙනකු අද වන විටත් ජීවිතයත් මරණයත් අතර සටනකය. සදාකාලික ආබාධිත වූවෝද විශාල පිරිසකි.

ලුණුගලින් සෑම දිනකම උදේ 6.30ට කොළඹ බලා ගමන් ආරම්භ කරන පෞද්ගලික බසය 20 දිනයේදීත් එම වෙලාවටම ගමන් ආරම් කළත් පස්සර නගරය ආසන්න වෙද්දී මඟීන් 50කට අධික පිරිසකගෙන් බසය පිරී තිබිණ.

රියදුරාගේ අධික වේගය හා නොසැලකිල්ල නිසාත් පාර මැද

කාවින්ද්‍යා තත්සරණී (21).ලුණුගල උඩපංගුවේ පදිංචි අන්තෝනි සාමි නෝවා(32) හා බෙනට් මැඩෝනා (31) , ලුණුගල පදිංචි පෙරුමාල් මුරලිදරන් (46),හා පොන්නම්බලම් අගලන් (40) ,යපම්මේ පදිංචි ටී.එම් අශෝක පත්ම කුමාර (35) ,වෙල්ලවෙළ පදිංචි ආදම් ජේතුම් බේබි (86) සහ ආදම් සායිබු පාතිමා උම්මා (47), දේසිබොක්ක පදිංචි වෙල්ලයන් සුබ්‍රමනියම් (73),මීදුම් පිටියේ පදිංචි පාකියනාදන් යෝගදාස් (48),රාමන් නාගරත්නම්(68),සුබ්‍රමනියම්

වී සිටිති. වෙල්ලවෙළ එකම පවුලේ හත් දෙනකු බසයේ නැගී හාලිඇල බලා යද්දී සිදු වූ අනතුරින් මවක හා දියණියක මිය ගියාය. ඔවුන් දෙදෙනා ආදම් ජේතුම් බේබි සහ ආදම් සායිබු පාතිමා උම්මාය. පාතිමාගේ දරුවන් දෙදෙනකුද මේ වන විටත් බරපතළ තුවාල ලබා බදුල්ල රෝහලේ ප්‍රතිකාර ගනිමින් සිටී.

පොන්නම්බලම් අගලන් සහ ටී.එම් අශෝක පත්ම කුමාර යන අයගේ දරුවන්ට කිසිදු පිහිටක් නැති තරමටම

ඔතාගෙන ගොඩට ගෙනාවා. ටික මෙහොතක් යද්දී අපේ අසල්වැසියන් ගෙවල් වල තිබූ හැම රෙදි කැල්ලක්ම ගෙනත් රෝගීන් ඔතා ගොඩට ගත්තා. සමහරු ඇඳිවත පවා ගලවා රොගීන්ට ඇන්දුවා. පැය භාගයක් යද්දී දහස් ගණනක් අපේ ගමේ මිනිස්සු මෙතනට එක් වුණා. සියලුම දෙනා එකම දම්වැලක් ලෙස අත් අල්ලාගනිමින් රොගීන් පැය ගාණක් තිස්සේ ගොඩට ගෙනාවා. බසයේ සිරවී සිටි තුවාලකරුවන් වගේම මිය ගිය අයත් ගොඩට ගෙනාවා.

පසුව පොලිසියත් ඇවිත් ගම්වාසීන්ට සහය දුන්නා' සිද්ධිය සියැසින් දුටු මාර්ගයේ සිටි තුවාන්සා මේ ඛේදවාචකය ගැන පැවසුවේ මෙවැන්නකි. 'මම උදේ පාරේ වැඩ කරන්න ආවා. වැඩට ලෑස්ති වෙද්දී බසය වේගයෙන් එනවා දැක්කා. මම හිටියේ ගල ළඟ කඩය අසල. වේගයෙන් ආපු බසයට තුන්දෙනෙක් නඟින්න අත දැම්මා. ඒත් නතර කළේ නෑ; අධික වේගයෙන්ම ඉදිරියට

● කුඩු පට්ටම් වුණු බස් එක ගල් දෙකක් මැද්දේ හිර වුණා

රාජන්ද්‍රන් (55),මුත්තයියා මුරුගේස් (71) යන අය අනතුරින් මිය ගියාය. මගේ දුව කාවින්ද්‍යා තත්සරණී අනතුරින් මිය ගියා. දුවගේ අම්මා වසර දහයකට කලින් මිය ගියා එදා ඉඳලා දුවයි මමයි හිටියේ මගේ හැමදෙයක්ම බැලුවේ දුව මට කන්න බොන්න විතරක් නොවෙයි ඇඳුම් පවා සෝදලා දුන්නේ දුව මම දැන් ජීවත් වෙලා වැඩක් නෑ. බදුල්ලේ තිබෙන ඩිප්ලෝමා පන්තියට යන්න බස් එක හෝන් කරද්දී ගේට්ටුව ඇරගන්න බැරි වුණා. දුව වැටෙකින් පැනලයි බසයට ගොඩ වුණේ ඒ ගමන ආය නොයෙන ගමනක් කියලා මම දැනගෙන හිටියේ නැතැයි රත්නසිරිගේ මුවින් පිටවිය. දියණියගේ වියෝවෙන් සදාතනිකව අසරණ වූ රත්නසිරි මළ මිනිය අසල බිම දිගා වෙමින් රැයක් ගත කළේ කාගේත් දෙනෙතට කඳුළක් එක් කරමිනි. ලුණුගල උඩපංගුව ගමේ කුලී නිවසක පදිංචිව සිටි අන්තෝනි සාමි නෝවා හා බෙනට් මැඩෝනා

අසරණය. ආර්. එම් හංසිකා සඳමාලිත් අනාගතයේ දහසකුත් බලාපොරොත්තු තබා ඩිප්ලෝමා පාඨමාලාවට යද්දි අනතුරට ගොදුරු විය. වෙනදා මෙන්ම වේගයෙන් ආපු බසය මගේ වෙළඳසැල ඉදිරියේදි ලොරියකට වෙට්ටුවක් දාද්දී එකපාරටම ප්‍රපාතයට පෙරළුණා. මම දුවගෙන ගියා. බසය පේන්නවත් නෑ. ප්‍රපාතය දිගටම මිනිස්සු වැටිලා හිටියා. එතනට දෙතුන්දෙනෙක් ආවා. අපි පහළට බැහල එක එක්කෙනා ගොඩට ගෙනාවා යැයි අනතුර සියසින් දැක පළමුවෙන්ම රෝගීන් ගොඩට ගත් මොහොමට් ජෙම්සික් රාසික් පැවසුවේය. ඔහු අනතුර ගැන මෙසේද කීය.

'පෙරළුණ බසයෙන් විසිවුණ අය කැළයේ තැන් තැන්වල වැටී හිටියා. ඇතමුන් මිය ගිහින්; තවත් අය පණ අදිනවා. ප්‍රපාතයේ තිබෙන බසයෙන් මහා විලාප හඬ ආවා. මගේ සහයට තවත් දෙතුන් දෙනෙක් එකතු වුණා. නිවසේ තිබුණ ඇඳ ඇතිරිලි, පොරොනා සහ අතට හසුවන රෙදි කැබලි ගෙනත් මඟීන් එවායෙහි

තුවාල ලැබූවන් බේරාගත් පිරිස අතර ඉෂාක් සාරංග, මොහොමඩ් රිෂාඩ්, රත්නසිරි සහ මොහොමඩ් ජෙම්සික් වමේ සිට

● ප්‍රපාතයට වැටුණු බසයේ මළ සිරුරු සිසීකඩ විසිවෙයි

තිබූ ගලක් ගැන අවධානය නොකළ නිසාත් ඉදිරියෙන් පැමිණි ලොරි රථ රියදුරෙකු නිසාත් මේ අවාසනාවන්ත අනතුර සිදු වන්නට ඇති බව කවුරුත් කියති. අනතුරින් ලුණුගල හා යපම්ම ප්‍රදේශයේ පදිංචි ආර්. එම් හංසිකා සඳමාලි (25)සහ එම්.ඒ

යුවළ තම කුඩා දරුවන් තිදෙනා මව ළඟ තබා බදුල්ල බලා ගියේ ප්‍රතිකාර ගැනීමටය ධාවනය වෙමින් තිබූ බසයට ත්‍රිවිලරයකින් ගොස් ගොඩවී ගිය ගමනක ප්‍රතිඵලය වූයේ දරුවන් තිදෙනෙකුට පියකු හා මවක අහිමි වීමකි. දරුවන් තිදෙනා සදාකාලිකව අසරණ

● උස් මිටිකම් නොතකා ප්‍රදේශයේ ජනයා තුවාලකරුවන් ගෙන යාමට කළේ පුදුම කැපකිරීමක්

ආවා. ඉදිරියෙන් ට්‍රිපර් රථයක් ආවා; වේගය අඩු නොකරම ගිය බසය පාරෙන් ඉවතට පැන පෙරළුණා. අපි හයියෙන් කෑ ගැහුවා. ටික වේලාවකින් වටේ හිටපු මිනිස්සු දුවගෙන ආවා. ඒ අය ප්‍රපාතයට බැස්සා; ටික වේලාවක් යද්දී පොලිසිය සහ විශාල පිරිසක් ආවා. ඒ අය පහළට ගිහින් රෝගීන් ගොඩට ගෙනාවා' යැයි පැවසීය. ලුණු-

රෝහලට රැගෙන එන තුවාලකරුවන් බදුල්ල මහ රෝහලට ගෙන යාමට ගිලන් රථවලට පැටවූහ.

එම අවස්ථාවේදී බදුල්ල මහ රෝහලේ පැවත් "ඕ" නෙගටිවු වර්ගයේ ලේ අවශ්‍ය බව මාධ්‍ය මගින් ප්‍රචාරය වීමත් සමඟ ඒ අසා සිටි දහස් ගණනක් මිනිස්සු රෝහලට ලේ දන් දීමට පැමිණියහ. පස්සර දිසා රෝහ-

● බස්එක එක පාරටම පා වුණා

ගල පදිංචි ඉශාක් සාරංග මෙකී ඛේදවාචකයට සජීවීව මුහුණ දුන්නෙකි. ඔහු එකී සිද්ධිය ගැන සිය මතකය අවදි කළේ මෙලෙසිනි. මම ලුණුගලින් බසයට ගොඩ වුණා. වේගයෙන් යද්දී තමයි පෙරළුණේ. පෙරළුණු බසය කරණම් ගසමින් තමයි ප්‍රපාතයට වැටුණේ. බසය පෙරළෙද්දීත් කිහිප දෙනෙකු එළියට විසි වෙනවා දැක්කා. විශාල ශබ්දයක් සමඟ ගල් රැණක වැදිලා බසය නැවතුනා. මමත් එතනදි එළියට විසි වුණා. මට වැඩිය තුවාල නැති වුණාට ඇතිවුණ බිය නිසාම ටික

ලට ඇතුළත් කළ රෝගීන් අතරින් 13 දෙනකු මියගොස් සිටියහ. ඒ අතර සිටි රෝගීන් 31 දෙනෙකු බදුල්ල මහ රෝහල වෙත මාරුකර යවන අතරතුර එක් පුද්ගලයෙකු මිය ගොස් තිබේ. බරපතළ තුවාල ලැබූ පස් දෙනෙකු සහ තුවාල ලැබූ 25 දෙනෙකු නේවාසිකව ප්‍රතිකාර ගනිමින් සිටිති. ඒ අතර දරුවන් පස්දෙනෙකු, කාන්තාවන් 13 දෙනෙකු සහ පිරිමි පුද්ගලයන් හත්දෙනෙකුද බසයේ රියදුරාද වේ. අදටත් බදුල්ල මහ රෝහලේ විසි දෙනෙකු පමණ ප්‍රතිකාර ගනිමින් සිටිති.

● ගල වැටුණු තැනින් බසය වේගය අඩු නොකර ටිපරයට ඉස්සර කරන්න ගියා

වේලාවක් එතන හිටියා. වැඩි පිරිසක් බසයේ සුන් බුන් වලට යටවෙලයි හිටියේ. ටික වේලාවකින් මම අමාරුවෙන් ගස් අල්ලමින් පාරට යද්දි ළඟ පාත මිනිස්සු ඇවිත් අපිව රෝහලට ගෙන ගියා.

මම මැරෙන්නේ නැතුව බේරුණා; මොනවා වුණා ද කියලා මට හිතාගන්න බෑ. පැය තුනක පමණ කාලයක් තිස්සේ බසයේ සිරවී සිටි තුවාලකරුවන් ගොඩට ගැනීමට නොහැකි වූ නිසා බූම් යන්ත්‍රයක් ගෙනවිත් බසය පැත්තකට පෙරළා ඒ තුළත් සිරවී සිටි අයව ගොඩට ගැනිණ.mපසුව පොලිස් නිලධාරීන් හා යුද හමුදා නිලධාරීන්ද පැමිණ සහය දැක්වීය. රෝගීන් ගොඩට ගන්නා අතරතුර ඉහළ කඳු

පස්සර දිසා රෝහලේ තැන්පත් කළ මිය ගිය අයගේ පී.සී.ආර් පරීක්ෂණ ලබා ගැනීමෙන් පසු පශ්චාත් මරණ පරීක්ෂණ කටයුතු සඳහා සිරුරු සියල්ලම බදුල්ල මහ රෝහලේ අධිකරණ වෛද්‍යවරයා වෙත එදිනම සවස යොමු කරන ලදී.

මිය ගිය අය පිළිබඳව සිදු කළ පී.සී. ආර් පරීක්ෂණ වලින් කොරෝනා රෝගය වැළඳී නොමැති බව තහවුරු වීමත් සමඟ බදුල්ල වැඩ බලන මහේස්ත්‍රාත් සුජීවන ද සිල්වා මහ රෝහලේ මෘත ශරීරාගාරයට පැමිණ මහේස්ත්‍රාත් පරීක්ෂණය සිදුකර පශ්චාත් මරණ පරීක්ෂණ කටයුතු සඳහා අධිකරණ වෛද්‍යවරයාට යොමු කළේය.

● අනතුර ගැන ඇසූ වෛද්‍යවරුන් ඇතුළු රෝහල් කාර්ය මණ්ඩලය නිදිවර්ජිතව වෙහෙසෙයි

ප්‍රදේශයේ සිට පෙරළී ආ විශාල ගලකට යටවී රෝගීන් ගොඩට ගැනීමට සහය වූ පුද්ගලයකු තුවාල ලබා රෝහල් ගත කළේය. අනතුරින් තුවාල ලැබූ රෝගීන් පස්සර දිසා රෝහලට ගෙන එන අවස්ථාවේදී ප්‍රදේශවාසීන් දහස් ගණනක් රෝහලට පැමිණීමත් සමඟ රෝහල් භූමිය එකම හිස් ගොඩක් බවට පත්විය. එය පාලනය කිරීමට පොලිස් නිලධාරීන් එක්විය. බදුල්ල මහ රෝහලේ වෛද්‍යවරුන්, හෙදියන් ඇතුළු නිලධාරීන් පස්සර

පශ්චාත් මරණ පරීක්ෂණය බදුල්ල මහ රෝහලේ විශේෂඥ අධිකරණ වෛද්‍ය රුචිර නදීර විසින් පවත්වා රිය අනතුරක් හේතුවෙන් ශරීරයේ බහුවිධ තුවාල සිදුවීමෙන් සිදු මරණ බවට තීන්දු කළේය. පසුදින අලුයම් කාලය වෙද්දී මිය ගිය අයගේ මෘත දේහ නිවෙස් වලටද ගෙනවිත් තිබිණ. එදිනත් පසු දිනත් අනතුරින් මිය ගිය අයගේ අවසන් කටයුතු ලුණුගල පොදු සුසාන භූමි කිහිපයකදි සිදුවිය.

අනතුරට හේතු වූ ට්‍රිපර් රථය පැදවූ රියදුරා වන බදුල්ල හිඳගොඩ පදිංචි දිසානායකලාගේ චන්ද්‍රකුමාර් නැමැත්තා අනතුරෙන් පසු සැඟව සිටියදී පස්සර පොලිසිය මගින් අත්අඩංගුවට ගෙන බදුල්ල අධිකරණයේදි මහේස්ත්‍රාත් හමුවට ඉදිරිපත් කිරීමෙන් පසු රක්ෂිත බන්ධනාගාර ගත කෙරිණ. ,බදුල්ල මහරෝහලේ නේවාසිකව ප්‍රතිකාර ගනිමින් සිටි අනතුරට පත්වූ බසයේ රියදුරා හමුවට ගිය මහේස්ත්‍රාත් සුජීවන ද සිල්වා මහතා තුවාලකරු , පරීක්ෂා කිරීමේදි දකුණට සහ වම් හක්කට තුවාල සිදුව ඇති බව තහවුරු කරගැනීමෙන් පසු රක්ෂිත බන්ධනාගාර ගත කිරීමට නියෝග කර බන්ධනාගාර නිලධාරීන් යටතට පත් කළේය.

ඌව පළාත් වැඩ බලන ජ්‍යේෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රොහාන් සිල්වා,බදුල්ල නියෝජ්‍ය පොලිස්පති ජී.කේ.ජේ අපොන්සු, බදුල්ල ජ්‍යේෂ්ඨ පොලිස් අධිකාරී වසන්ත කන්දේවත්ත,පස්සර පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක පාලිත සෙනවිරත්නගේ උපදෙස් මත පරීක්ෂණ කටයුතු සිදුවිය.

සිළුමිණ

වෂී 2021ක් වූ මාර්තු මස 28 වැනිදා ඉරිදා

හරංග

91 සපුරන
'සිළුමිණ' ගමන් මඟ
පිටු 19-22

බක්මස ලග්න පලාපල
පිටුව 23

17
ධම්මික පැණියට මොකද වුණේ
පිටුව 24

මැදින් පුන් පොහෝදා
කුරුගලට එන්න

කඳු මුදුනේ ස්ථාපිත බුදු පිළිමයක්

කුරගල පුදබිමේ ඉහළට ගඩොල් ගෙන යාමට ගිහි පැවිදි පිරිස් ශ්‍රමදාන පැවැත්වූ ආකාරය

● තාරක වික්‍රමසේකර

ශ්‍රී ලාංකේය උරුමය විදහා පානා අතීත පුරා විදුබිම් වනසා ලන්නට අන්තවාදීන් කටයුතු කරන්නේ මීට දශක කිහිපයක සිටය. බළන්ගොඩට නුදුරු කූරගල පුරාවිදු බිමට අත්වූයේද ඒ ඉරණමයි.

ඒ අනුව අන්තවාදීන්ගේ ග්‍රහණයෙන් කූරගල පුරාවිදු බිම මුදා ගෙන එය සමස්ත සිංහල, දෙමළ, මුස්ලිම් ඇතුළු සියලු ලාංකිකයන්ගේම උරුමය බවට කූරගල පත් කිරීමට නෙල්ලිගල නායක හාමුදුරුවන් හෙවත් චතුරකුඹුරේ ධම්මරතන හිමියෝ කටයුතු කරමින් සිටිති.

ඒ අනුව 'යළි පිබිදෙන කූරගල' නමින් කූරගල පුරාවිදු බිමේ පුරා විද්‍යා භූමීන්ට කිසිදු හානියක් නොවන සේ සංවර්ධන කටයුතු ආරම්භ කිරීමට කටයුතු කළ බව නෙල්ලිගල හාමුදුරුවෝ පවසති.

කූරගල පර්වත මුඳුනේ තිබුණු ඉපැරණි දාගැබ මේ වනවිටත් අන්තවාදීන් විසින් වනසා දමා ඇති අතර පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින්, වනසා දමන ලද ස්තූප කොටස් එකතු කර දර්ශන අඩ චෛත්‍යයක් පුරාවිද්‍යා ලක්ෂණ මත පර්වත මස්තකයේ ඉදි කර ඇත. එම නිසා ඒ ආසන්නයේ පුරා විද්‍යා භූමිය ආරක්ෂා වන ලෙසින් අඩි 100ක් උස මහ සෑයක් 'අස දිසි ශාක්‍ය සුගත මහා සෑය' නමින් ඉදි කිරීමට අවශ්‍ය කටයුතු යෙදූ බව නෙල්ලිගල හාමුදුරුවෝ පවසති.

එම චෛත්‍යයේ මංගල ශිලා ප්‍රතිෂ්ඨාපනය හෙවත් චෛත්‍යය රාජයාණන් වහන්සේට මුල්ගල් තැබීම මේ මස 28 වැනිදාට යෙදෙන මැදින් පුර පසොළොස්වක පුන් පොහෝ දින පස්වරු 4.00ට සිදු කෙරේ. මේ සඳහා මුද්‍රිත මාධ්‍ය අනුග්‍රහය ලේක්හවුස් ආයතනයෙනි.

එමෙන්ම එදින උදෑසන දහසකට අධික උපාසක උපාසිකාවන් පිරිසක් සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේදයන්ට අනුව සීල සමාදානයට සහභාගි වන බවද නෙල්ලිගල හාමුදුරුවෝ පවසති. එම උපාසක උපාසිකාවන්ට සීල සමාදානයට අවශ්‍ය ආවරණ ඉඟකඩ කිසිවක් කූරගල නොමැත. එහෙත් පෙර රජ දවස සිහි ගන්වමින් ගස් ගල් යට සීල සමාදානය පැවැත්වීමට කටයුතු කෙරෙනු ඇත.

උපාසක උපාසිකාවන් වෙනුවෙන් ආවරණ සහිත භූමියක් ඉදි කිරීමටද සැලසුම් කර ඇති බවද උන්වහන්සේ පවසති. එමෙන්ම සහභාගි වන සියලු උපාසක උපාසිකාවන්ට එදින අවශ්‍ය දානමාන සියල්ල සැපයීමට කටයුතු යොදා ඇතැයිද උන්වහන්සේ පවසති. එදින රාත්‍රී 7.00 සිට රාත්‍රී 9.00 දක්වා බළන්ගොඩ රාධ හිමියන්ගේ විශේෂ ධර්ම දේශනයක්ද පැවැත්වේ. සිල් සමාදන්වන උපාසක උපාසිකාවන් දහස් ගණනක් එම ධර්ම දේශනයටද සහභාගි වන බව මේ වන විටත් දැනුම් දී ඇති බව උන්වහන්සේ පවසති. අවශ්‍ය තරම් භූමිය ඇති හෙයින් සෞඛ්‍යාරක්ෂිතව කටයුතු කිරීම අපහසු නොවන බවද උන්වහන්සේ අපට පැවසූහ.

28 වැනිදා කූරගල සිදු කෙරෙන මේ මහා පින්කමේ මුද්‍රිත මාධ්‍ය දායකත්වය දරනු ලබන්නේ සිළුමිණ, බුදුසරණ, දිනමිණ ඇතුළු පුවත්පත් මුල් කරගත් ලේක්හවුස් ආයතනය විසිනි. ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ කර්තෘවරු 28 වැනිදා පැවැත්වෙන උත්සවයට පැමිණෙති. ඒ දායකත්වය සිදු කෙරෙන්නේ ජාතික උරුමයක් රැක ගැනීම වෙනුවෙනි. නෙල්ලිගල හාමුදුරුවන් පවසන්නේ කූරගල ඉතිහාසය මානව සංහතියේ අවුරුදු 8,000ත් 16,000ත් අතර කාලයක් දක්වා දිව යන්නක් බවයි.

වර්තමානයේ කූරගල, බුදුගල, ගල්ටැම්යාය නමින් හඳුන්වන ප්‍රදේශ සියල්ලම පුරාණයේ එකම ආරණ්‍ය සේනාසන සංස්ථාවකට අයත්ව තිබුණු බව දැනගන්නට ඇත.

කූරගල උරුමය රැක ගන්නට ආ නෙල්ලිගල හාමුදුරුවෝ මෙසේ හඬ අවදි කරති.

''මේ දාගැබ නිර්මාණය කිරීමේදී ඇති වන සියලු බාධාවන් මැඬ පවත්වාගෙන මම කටයුතු කරනවා. නෙල්ලිගල ජාත්‍යන්තර මධ්‍යස්ථානය හදද්දී සහරාන් හෂීම් අවස්ථා 3කදී පැමිණ මට තර්ජනය කළා. ඒත් මම සැලුණේ නැහැ. ඒ සියල්ල ආශිර්වාදයක් කර ගත්තා.



ඉදිකිරීම් ආරම්භයට දුෂ්කර මාවතේ කූරගල තරණය කරන නෙල්ලිගල හාමුදුරුවෝ

කූරගල අද මේ තත්ත්වයට පත්වීමට වගකිව යුතු වන්නේ වසර 100කට විතර කලින් දිවි ගෙවපු අපේ ගිහි පැවිදි මුතුන් මිත්තන්. ඒ ගිහි පැවිදි අය නිසි ලෙසින් කූරගල ඉදිරි පරපුරට රැක නොදීම නිසා අද අප අසරණ වෙලා තියෙනවා. අපි මේ වගකීම නිසි පරිදි නොකළොත් ඉදිරි පරපුරත් අපිට අනිවාර්යෙන්ම ඒ වගකීම පැහැර හැර ඇරි බවට දෝෂාරෝපණය කරාවි.

කූරගල ගැන විවිධ මාධ්‍යවලින් හඬ නැගුවා. ඇත්තෙන්ම ඒ හඬ නිසා තමයි කූරගල රැකගත යුතුයි යන්න අවදි වුණේ. එම නිසා හඬ නගපු සියලුම මාධ්‍යවලටත් සමාජ මාධ්‍ය වල පවා ඒ වෙනුවෙන් සටහනක් පවා තැබූ අයටත් මේ අවස්ථාවේදී ස්තුතිය පළ කර යුතු වෙනවා.

කෙසේ නමුත් මේ ස්ථානයේ ඇති අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම ගැන පමණයි අපි කතා කෙළේ. කිසිදු අයුරකින් විනාශ කර ඇති දාගැබ හෝ යළි ඉදිකිරීම ගැන අප කතා කෙළේ නැහැ.

එම නිසයි යළිත් එම දාගැබ ප්‍රති නිර්මාණය කිරීමේ වගකීම මම බාරගත්තේ. ඒ වෙනුවෙන් මෙම ස්ථානයේ රැඳී සිටිය යුතු බව මම තරයේ විශ්වාස කරනවා.

මම ඉපදුණේ අධ්‍යාපනය ලැබුවේ වගේම විහාරස්ථානය ලෙසින් මහනුවරයි සිටියේ. මේ පළමු වරටයි එයින් පිටත ස්ථානයක සිට කටයුතු කරන්නේ.

මේ ස්ථානය අස්ගිරි විහාර පාර්ශ්වයට අයත් පුරාවිද්‍යා භූමියක්. එහි වර්තමාන හිමිකාරීත්වය පවතින්නේ දෙල්තොට ධම්මජෝති හිමියන්ටයි එමෙන්ම ආදි කර්තෘ ධුරය දරන වටදූර ඥානිස්සර හිමියන්ද මේ කටයුතු සඳහා මට ආශිර්වාද කරමින් ශාසනික සම්ප්‍රදායට අනුව අත පැන් වත්කර මේ කාර්යය මට බාර කළා.

ඒ පසුගිය පෙබරවාරි 4 වැනිදා.

ඒ අනුව මම මාර්තු 2 වැනිදා මෙම ස්ථානයට වැඩම කළා. වාරියපොළ ශ්‍රී සුමංගල හිමියන් අතීත ලෙස හඬ අවදි කළ ඒ දිනය ලක්වාසී අප සැමට විශේෂිත දිනයක්.

කූරගල කඳු මුදුන කරා.....

මම මේ ස්ථානයට පැමිණෙන්නෙ නිසි සැලසුමක් ඇතිවයි. එහෙම නැතිව මේ කටයුතු කරන්න බැහැ.

එම නිසා කන්ටේනර් දෙකක් ගෙනවිත් මම මෙතනට ආවා. සියලු වැඩ කටයුතු කරන්නෙ සැතපෙන්නෙ පවා ඒ කන්ටේනර් තුළයි.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් ලබා දෙන උපදෙස් අනුව ඉදිරි කටයුතු සිදු කරනවා. පුරාවිද්‍යා රක්ෂිතයක් නිසා අපට අවශ්‍ය විදිහට මෙහි ඉඳිකිරීම් කරන්න බැහැ. ඒත් මේ භූමිය සක්‍රිය වුණොත් පමණයි මේ ස්ථානයේ දියුණුව පැවැත්ම රඳා පවතින්නේ. වන්දනාකරුවන් ඇවිත් මලක් පහනක් පූජා කරල, සිල් සමාදන් වෙලා, කප්රුක් පූජාවන් කරල භූමියේ සුවඳ දුම් විහිදෙන විටයි මෙහි අනාගතය රඳා පවතින්නෙ.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට වයස අවුරුදු 200ක් වත් නැහැ. නමුත් පුරාවිද්‍යා සාක්ෂි අනුවම මේ ස්ථානය අවුරුදු 2,200ක් පැරණියි. එහෙනම් ඉතිරි අවුරුදු 2000ම මේ භූමීන් රැක ගත්තේ භික්ෂූන් වහන්සේ. උන් වහන්සේ නැතිව මේ කටයුතු කරගෙන යන්න බැහැ.

එම නිසයි භික්ෂූන් වහන්සේ සක්‍රිය ලෙසින් මෙහි වැඩ වාසය කරමින් මේ ස්ථානයේ සක්‍රිය පුදබිමක් කළ යුතු වන්නේ. ඒ අනුව තමයි අඩි 100ක් උස චෛත්‍යයක් සැදීමට අප කටයුතු කරන්නේ. ඒ සඳහා අපට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලැබුණා. කාලාන්තරයක් සත්ව බිලි පූජා තැබූ මේ භූමිය ඉදිරියේදී සුවඳ දුමින් පිරී ඉතිරී යාවි. මෙහි ජීවිතය ඉල්ලා සතුන් හැඬුවා. ඒ වෙනුවට ජනතා ආශීර්වාද ගාථාවන් කියැවේවි. මෛත්‍රිය, කරුණාව පතුරුවන පුදබිමක් වේවි. අතීත රජ දවසින් පසුව පළමු වරටයි කූරගල වන්දනාවට පාත්‍ර වන්නේ.

නෙල්ලිගල ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානය දියුණු කරන්න අතහිත ලබා දුන් බෞද්ධයන් කූරගල දියුණුවට අතහිත දෙන බව මට හොඳටම විශ්වාසයි.

මේ 'අස දිසි ශාක්‍ය සුගත මහා සෑය' වෙනුවෙන් ලක්ෂ 400ක පමණ මුදලක් වැය වෙනවා. එහි වැඩි බරක් දරන්න මේ වන විටත් විෂ් පෞද්ගලික රෝහලේ අධිපති හෙළරුවන් පසන් කුමාර මහතාත් නිරංජලා සරෝජනී මහත්මියත් මුල්වෙලා කටයුතු කරනවා.

ඊට අමතරව මේ ස්ථානයේ ඉදි කිරීමට යෝජිත සංඝාවාසය වෙනුවෙන් දායකත්වය ලබා දෙන්න නාවල කුෂන් වර්ක්ස් අධිපති ආර්. ජී. ප්‍රේමරත්නත් නන්දනි පාදුක්ක හා ලහිරු එරන්ද ගමගේ ඉදිරිපත්ව තිබෙනවා. එමෙන්ම මෙම ස්ථානයේ සම්බුද්ධ ප්‍රතිමා ඇතුළු ආරාමයකට අවශ්‍ය බොහෝ දේ ඉදි කෙරෙනවා. ඒ සියල්ල වෙනුවෙන් ශ්‍රී ලාංකික බෞද්ධ අබෞද්ධ බොහෝ දෙනෙක් උපකාර කරන බව මට හොඳටම විශ්වාසයි.

රජ කාලයෙන් පසු කූරගල සිදු කරන මහා පින්කම් මාලාව

මේ පූජා භූමිය එක් පිරිසක් වෙනුවෙන් කරන වැඩක් නෙමෙයි රටේ සියලු ජනතාව වෙනුවෙන් ශ්‍රී ලාංකික උරුමය රැකදීමක් ඒ නිසා මාධ්‍යවේදීන්, දේශපාලඥයන්, රජයේ නිලධාරීන් ඇතුළු සියලු ලාංකිකයන්ට තමන්ට හැකි අයුරින් මේ සඳහා දායකත්වය ලබා දිය හැකියි. මාධ්‍යවේදීන්ට පෑන මෙහෙයවමින්, නිලධාරීන්ට නිසි තීරණ ගැනීමෙන්, ඇති හැකි අය පරිත්‍යාග කිරීමෙන්, පරිත්‍යාග කරන්න අපහසු අයට ශ්‍රම දායකත්වයෙන් වැනි ඕනෑම ආකාරයකට මේ සඳහා දායකත්වය ලබා දෙන්න පුළුවන්.''

නෙල්ලිගල හිමියන් දරන මේ වැයම සුළුවෙන් තැකිය හැක්කක් නොවේ. උන් වහන්සේ පවසන්නේ කිසිදු විටක ජනතා සුබසෙතට යොදවනු ලබන මුදල් මේ සඳහා ලබා ගැනීමට කටයුතු නොකරන බවයි. පාසල් අධ්‍යාපනයට හෝ අසරණ රෝගීන් වෙනුවෙන් සෞඛ්‍යට වැය කරන්නට ඇති මුදල් වැනි කිසිදු මුදලක් මේ සඳහා යොදා නොගන්නා බව උන් වහන්සේ පෙන්වා දෙති.

චෛත්‍යය ඉදිකිරීම සඳහා වන ශ්‍රම දායකත්වය ලබා දෙන්නට ශ්‍රී ලංකා යුද හමුදාව කටයුතු යොදා ඇත. යුද හමුදාපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මේ වන විටත් ඒ සඳහා අවශ්‍ය කටයුතු සලසා තිබේ. එමෙන්ම අනෙක් අවශ්‍යතා සඳහා සිවිල් ආරක්ෂක බළකාය යොදවීමටද පියවර ගැනෙනු ඇත. මේ වන විටත් කන්ද මුඳුනේ ඉදිකිරීම් වෙනුවෙන් අවශ්‍ය ගොඩනැගිලි ද්‍රව්‍ය ඉහළට ගෙන යාම පිණිස ස්වාමීන් වහන්සේ ඇතුළු බොහෝ ගිහි පිරිස් පැමිණ දායකත්වය දක්වති. මෙය තවත් එක් විහාරස්ථානයක් ඉදි කිරීමක් නොවන බවත් ලාංකීය උරුමයක් රැක දීමක් බව උන් වහන්සේ පෙන්වා දෙති.

කූරගල අසදිසි ශාක්‍ය සුගත මහා සෑය ලබන වසරේ පෙබරවාරි මස 4 වැනිදාට යෙදෙන නිදහස් දිනයේ විවෘත කිරීමට පවා දින යොදා ගෙන තිබේ. නෙල්ලිගල හාමුදුරුවන්ගේ නිසි සැලැස්ම එයින් මනාව පැහැදිලිය.

කූරගල පුදබිම සම්බන්ධයෙන් කළ හැකි උපකාර හෝ ශ්‍රම දායකත්වය ගැන යම් විමසීමක් අවශ්‍ය වන්නේ නම් දුරකතන අංක 0117373731 / 0117373730, හෝ 0761737373 (අමිල) මඟින් විමසීම් කළ හැකිය.

ඉදි කිරීම් සඳහා අවශ්‍ය ගල්, වැලි, සිමෙන්ති ඇතුළු ඕනෑම භාණ්ඩයක් ඒ සඳහා පරිත්‍යාග කළ හැකිය. එමෙන්ම මූල්‍ය ආධාර පවා ලබා දිය හැකිය. සියලු මූල්‍ය ආධාර කූරගල රජමහා විහාරය නමින් බළන්ගොඩ සම්පත් බැංකුවේ ඇති ගිණුම් අංක 009760006000 වෙත යොමු කළ හැකිය.

සේයාරූ - චේතක වික්‍රමාරච්චි

කූරගලට ඔබේ දායකත්වය ලබා දෙන්න

ආධාර
බළන්ගොඩ සම්පත් බැංකුවේ
කූරගල රජමහා විහාරය
ගිණුමට බැර කළ හැකිය
0097 6000 6000

ගල්වැලි සිමෙන්ති වැනි භාණ්ඩ ද්‍රව්‍ය
පරිත්‍යාග කළ හැකිය
ශ්‍රමදාන සඳහා සහභාගිවිය හැකිය.

සියලු විමසීම්
011 737 3731
011 737 3730
076 173 7373 (අමිල)

නෙල්ලිගල හාමුදුරුවන් වැඩ සිටින ස්ථානය

වාණිජ මණ්ඩලී

රුසියාවේ සුපිරි ධනවතකු වන අන්ද්‍රේ මෙල්නිචෙන්කෝ කොළඹ වරාය නගරයේ සංචාරයක

ලෝක මට්ටමේ ධනවත් ව්‍යාපාරිකයෙකු ලෙස සැලකෙන රුසියානු ජාතික අන්ද්‍රේ මෙල්නිචෙන්කෝ මහතා පසුගිය මාර්තු 17 දිනයේ කොළඹ වරාය නගරයේ සංචාරයක නිරත විය. ඔහු සමඟ ශ්‍රී ලාංකික සම්භවයක් සහිත බ්‍රිතන්‍ය දේශපාලනඥයෙකු සහ යුරෝපා සංගම් පාර්ලිමේන්තුවේ හිටපු මන්ත්‍රීවරයෙකු වූ නිරන්ජන් දේව ආදිත්‍ය ද එම අවස්ථාවට එක් විය.

ස්වෝත්සාහයෙන් දියුණු වූ ව්‍යාපාරිකයෙකු ලෙස සැලකෙන මෙල්නිචෙන්කෝ, ස්විට්සර්ලන්තය පදනම් කරගත් දැවැන්ත පොහොර සමාගමක් වන EuroChem සමූහ ව්‍යාපාරයේ සහ රුසියාව පදනම් කරගත් බලශක්ති සමාගමක් වන SUEK හි මහා පරිමාණ ආයෝජනයන් සිදුකර තිබේ. කොළඹ වරාය නගර ව්‍යාපෘතිය වෙත පැමිණි මෙල්නිචෙන්කෝ මහතා ඇතුළු පිරිස එම සමාගමේ සහකාර කළමනාකාර අධ්‍යක්ෂවරුන් වන YueYeqing සහ තුල්සි අලුවිහාරේ සහ අධ්‍යක්ෂ (විකුණුම් හා අලෙවි) යමුනා ජයරත්න විසින් සාදරයෙන් පිළිගන්නා ලදි.

කොළඹ වරාය නගර ව්‍යාපෘතිය, එහි වත්මන් ඉදිකිරීම් කටයුතු සහ අනාගත සංවර්ධන සැලසුම් ආදිය සම්බන්ධයෙන් මෙහිදී මෙල්නිචෙන්කෝ ඇතුළු පිරිසට කරුණු විස්තර කිරීමට එම ව්‍යාපෘතියේ විකුණුම් හා ආයෝජක සම්බන්ධතා පිළිබඳ මෙරට කළමනාකරු රධික ඇල්ලේපොළ කටයුතු කළේය.

ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පැහැදීමෙන් යුතුව අදහස් දැක්වූ මෙල්නිචෙන්කෝ මේ වනවිට ඉදිකරමින් පවතින වරාය නගරයේ ක්‍රමෝපායික සැලසුම්කරණය පිළිබඳව සිය ප්‍රසාදය පළකළේ ය. ආයෝජන මණ්ඩලයේ සභාපති සංජය මොහොට්ටාල, අධ්‍යක්ෂ ජෙනරාල් පසන් වනිගසේකර සහ ව්‍යාපාර ක්ෂේත්‍රයේ ප්‍රවීණයෙකු වන රාජන් බ්‍රිටෝද මෙම අවස්ථාවට එක්වූහ.

ZenBook Flip 13 (UX363) නවතම ලැප්ටොප් පරිගණකය හඳුන්වා දෙයි

ASUS ශ්‍රී ලංකා සමාගම සිය නවතම සුවිශේෂී හඳුන්වා දීම වන ZenBook Flip 13 (UX363) ශ්‍රී ලංකාවට හඳුන්වා දුන්නේය. Intel Evo Platform මඟින් ක්‍රියාත්මක වන මෙම ZenBook Flip 13 (UX363) සුවිශිෂ්ට portable අත්දැකීමක් ලබා දෙන අතර OLED touchscreen, 11th Generation Intel Core processors සහ Intel Iris Xe graphics මඟින් බලගන්වා ඇත.

ZenBook Flip 13 යනු HDMI සහ USB Type-A ports ද සහිත ලොව සිහින්ම ලැප් ටොප් පරිගණකයයි. එහි නවතම Thunderbolt 4 USB-C ports දෙකක්ද වේ. නව ප්‍රොසෙසර සහ ග්‍රැෆික්ස්, මෙන්ම 16 GB RAM එක හා 1 TB PCIe® 3.0 SSD මඟින් Silky-smooth ක්‍රියාකාරිත්වයක් සහතික කරනු ලබයි.

ZenBook Flip 13 හි ඇති WiFi 6, මඟින් අන්තර්ජාලයේ 4K UHD වීඩියෝ සහ දත්ත හුවමාරුව 2.4 Gbps දක්වා රැහැන් මඟින් සිදුකෙරෙන දත්ත හුවමාරු වේගයට වඩා වේගයෙන් ගමන් කරවීමට අවස්ථාව සලසා දී ඇත. රැහැන් රහිත සම්බන්ධතා වඩාත් උසස් අන්දමින් සිදු කිරීම සඳහා ASUS WiFi Stabilizer සහ ASUS WiFi SmartConnect මෙම ලැප් ටොප් පරිගණකයෙහි ඇතුළත් වන අතර ASUS WiFi Master Premium technology තාක්ෂණයෙන් වයිෆයි ක්‍රියාකාරිත්වය තව දුරටත් ප්‍රශස්ත කර ඇත. ඒ අනුව WiFi signal සහ දmobile hotspots සමඟ බාධාවකින් තොරව සම්බන්ධ වේ.

අවශ්‍ය ඕනෑම තැනකට පහසුවෙන් අතේ ගෙන යා හැකි වන පරිදි නිර්මාණය කර ඇති ZenBook Flip 13, 13.9 mm තරම් සිහින් වන අතර 1.3 kg තරම් සැහැල්ලු බවකින් යුතු බහුකාර්ය හැකියාවන්ගෙන් සමන්විතය. laptop, tablet, tent, stand, හෝ අවශ්‍ය ඕනෑම අකාරයකට භාවිත කළ හැකි වන පරිදි අංශක 360ක් කරකැවිය හැකි වන පරිදි නිර්මාණය කර තිබේ.

Covid 19 රෝගයෙන් ආරක්ෂා වීම සඳහා කැන්ගරු කැබ්ස් වෙතින් ආරක්ෂිත ක්‍රම රැසක්

වසර 33 ක කාලයක් පුරා ශ්‍රී ලාංකේය ජනතාවගේ විශ්වාසය ඉහළින්ම දිනූ මෙරට ප්‍රමුඛතම කැබ්රථ සේවා සැපයුම් සමාගම වන කැන්ගරු කැබ්ස් පෞද්ගලික සමාගම සිය පාරිභෝගික ජනතාවගේ සෞඛ්‍ය ආරක්ෂාව පිළිබඳ ඉහළම අවධානය යොමු කරමින් ශරීර උෂ්ණත්ව මාපකයක් සහ විෂබීජ නාශක දියර බෝතල් සිය සමාගමේ ලියාපදිංචි සෑම රියදුරු මහතෙකුටම ලබා දීමට කටයුතු කර තිබේ.

කොවිඩ් 19 රෝගයෙන් සිය පාරිභෝගික ජනතාව ආරක්ෂාකර ගැනීම උදෙසා මෙම පියවර ගෙන ඇත. කැන්ගරු කැබ්ස් රියදුරු මහත්වරු සෞඛ්‍ය උපදෙස් ඉතා ඉහළින්ම අනුගමනය කරන අතර සිය වටිනා පාරිභෝගිකයන්ගේ සෞඛ්‍ය ආරක්ෂාව පිළිබඳ නිරන්තරයෙන් ඉහළ අවධානයක් යොමු කරති. සෑම පාරිභෝගිකයෙකුගේම ශරීර උෂ්ණත්වය මැන බැලීමෙන් පසුව ඔවුන්ව රථයට නංවාගෙන ප්‍රවාහන අවශ්‍යතා ඉටුකර දීමටත්, සෑම ගමනාන්තයකටම පෙර රියදුරු මහතාගේ හා පාරිභෝගියන්ගේ දෑත් විෂබීජ නාශක දියර යොදා පිරිසුදු කර ගැනීමටත්, නිසි පරිදි මුහුණු ආවරණ පැළඳ සිටීමටත් කැන්ගරු කැබ්ස් රියදුරු මහත්වරුන් කටයුතු කරන අතර එමඟින් කැන්ගරු කැබ්ස් භාවිත කරන පාරිභෝගිකයන්ගේ සෞඛ්‍ය ආරක්ෂාව මනාව තහවුරු කරගනු ලැබේ.

දිවයිනේ අංක එකේ කැබ් රථ සේවයවන කැන්ගරු කැබ්ස් සමඟ එක් වී සෞඛ්‍ය ආරක්ෂාවට මුල් තැන දෙමින් සිය ප්‍රවාහන අවශ්‍යතා සපුරා ගැනීමට සියලු දෙනාටම ආරාධනා කරන බව කැන්ගරු කැබ්ස් කළමනාකාරිත්වය දන්වා සිටී.

AMW නවතම නියෝජිත ප්‍රදර්ශනාගාරය ගම්පහ Glitz Park හි විවෘතයි

AMW පුද්ගලික සමාගම (Associated Motor Ways Private Limited) ගම්පහ ප්‍රදේශයේ සිය නවතම ප්‍රදර්ශනාගාරය විවෘත කිරීමට පසුගියදා කටයුතු කළේ ය. Glitz Park පුද්. සමාගම සමඟ එක්වී, නුවර පාරේ මිරිස්වත්ත ප්‍රදේශයේ මෙම නව ප්‍රදර්ශනාගාරය විවෘත කර තිබේ. මේ ඔස්සේ දැන් ගම්පහ ප්‍රදේශයේ ජනතාවට AMW සමාගමේ සේවා වඩාත් පහසුවෙන් ලබාගත හැකි වනු ඇත.

නව ප්‍රදර්ශනාගාරය මඟින් ගම්පහ ජනතාවට සියලුම වර්ග හා මාදිලි වලට අයත් වාහන වඩාත් පහසුවෙන් හා විශ්වාසයෙන් යුතුව මිලදී ගැනීමට, විකිණීමට හා හුවමාරු කිරීමට අවස්ථාව සැලසේ. පාවිච්චි කළ වාහන සඳහා වසර 3 ක වගකීමක් හිමිවීම, වාහන සඳහා හොඳම මිලක් ලැබීම, පැය 24 ක් තුළ මුදල් ලබාගත හැකි වීම සහ පැය කිහිපයක් තුළ හුවමාරුව සිදුකළ හැකි වීම වැනි සුවිශේෂී ප්‍රතිලාභ රාශියක් මෙමඟින් පාරිභෝගිකයන් වෙත හිමි වනු ඇත.

AMW රථවාහන සඳහා අලෙවිය, සේවාවන් හා අමතර කොටස් සපයන 3S මධ්‍යස්ථානයක් (Sales, Services and Spares) ලෙස ක්‍රියාත්මක වන ගම්පහ නව ප්‍රදර්ශනාගාරය තුළදී අනෙකුත් සියලුම වර්ගවල වාහන විකිණීමට හා මිලදී ගැනීමටද අවස්ථාව සලසා දී තිබේ. Glitz Park සමාගම 2005 වසරේ සිටම AMW සමඟ අත්වැල් බැඳගෙන සිටින අතර, ගම්පහ දිස්ත්‍රික්කයේ විශාලතම නියෝජිත ආයතනය ලෙස සැලකේ. ගුණාත්මක සේවාව සම්බන්ධයෙන් වසර ගණනාවක් පුරා විහිදෙන කීර්තියක් එම සමාගම සතු ය. වාහන වලට සිදුවී ඇති හානි හඳුනාගත හැකි Touch Diagnostics වැනි දියුණු තාක්ෂණයන් මෙම නව මධ්‍යස්ථානය තුළ භාවිත වේ.

පැල්වත්ත කිරි සමාගම කාන්තාවන් සවිබල ගන්වයි

පැල්වත්ත කිරි සමාගම කාන්තා නායකත්වයෙන් යුතු පවුල් 100කට අධික සංඛ්‍යාවක් සහ 1200කට අධික කිරි කර්මාන්තයේ නියුතු කාන්තාවන් පිරිසක් සවිබල ගන්වමින් කාලෝචිත සමාජ ප්‍රයත්නයක් සඳහා කැපවී සිටී. ඒ අනුව පැල්වත්ත සමාගම විවිධත්වය පිළිගැනීම සහ සේවා ස්ථානයට ඇතුළත් කර ගැනීම පිළිබඳ සිය දැක්මට සමගාමීව ග්‍රාමීය ප්‍රදේශවල කාන්තාවන්ට සහාය වෙමින් වර්ල්ඩ් විෂන් ඉන්ටර්නැෂනල් සමඟ ව්‍යාපෘති කිහිපයක් ආරම්භ කර ඇත. ගොවිපළ කිරි එකතු කිරීම, ස්වයංක්‍රියකරණය, ඩිජිටල්කරණය සහ කෘෂි කර්මාන්ත ක්‍රියාකාරකම් පිළිබඳ පුහුණු සැසි මෙම ව්‍යාපෘතිවලට ඇතුළත් කොට ඇත.

පැල්වත්ත සමාගම විසින් වෙනස් කොට සැලකීම් නොකරන සේවායෝජක ප්‍රතිපත්තියක් අනුගමනය කරන අතර කාන්තාවන්ගේ අවශ්‍යතා සඳහා විශේෂ අවධානයක් යොමු කරයි. එමෙන්ම පුරුෂයන් හා ස්ත්‍රීන් සඳහා සමාන වැටුප් පිරිනැමීම හා නම්‍යශීලී වැඩ ලැයිස්තුවක් ද සමාගම ඉදිරිපත් කරයි. සමාගම විසින් පෝෂණය කරනු ලබන අධාරක කර්මාන්තවල වැඩෙන ශ්‍රම බළකාය තුළ කිරි සැපයුම්කරුවන්ට සහ කිරි ගොවීනට අනගි අවස්ථා හිමි කර දී ඇත.

DPMC WORKSHOP මාතර විවෘතයි

ඩේවිඩ් පීරිස් මෝටර් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්හි බස්නාහිර පළාතෙන් පිටත ස්ථාපිත කෙරුණු ප්‍රථම වාහන සේවා මධ්‍යස්ථානය ලෙස DPMC WORKSHOP – MATARA පසුගියදා විවෘත කෙරුණි.

මාතර නගරයට ආසන්නව ගාලුපාර, තල්අරඹ, කඹුරුගමුව යන ස්ථානයේ පිහිටා ඇති DPMC WORKSHOP – MATARA වෙතින් බජාජ් වාහන/ KTMමෝටර් සයිකල් නඩත්තු,සේවා සහ අලුත්වැඩියා ඇතුළු සියලුම වාහන සඳහා බොඩි වොෂ් සහ ඩීටේලින් සේවාද ලබාගත හැකිය.

ඩේවිඩ් පීරිස් මෝටර් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්හි සේවා මධ්‍යස්ථානයක් පිළියන්දළ මඩපාත මේ වන විටත් ක්‍රියාත්මක වේ.

මේ පිළිබඳ අදහස් දක්වමින් ඩේවිඩ් පීරිස් මෝටර් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්හි අංශ භාර කළමනාකරු (ක්ෂේත්‍ර සේවා) චන්න රණවක පැවසුවේ තම සමාගම සෑම විටම බජාජ් වාහනවලට අලෙවියෙන් පසු ඉහළ මට්ටමේ අලෙවියෙන් පසු සේවාවක් සහ තාක්ෂණික සහයෝගයක් ලබාදීමට ආයෝජනය කරන අතර දැනට පවතින ආනයන සීමා හේතුවෙන් තිබෙන වාහනය නිසි පරිදි සේවා සහ නඩත්තු කිර තබා ගැනීම වැදගත් කරුණක් වී ඇති බවයි.

උස්වත්ත කන්ෆෙක්ෂනරි වර්ක්ස් සමාගම අනුග්‍රහයෙනි
මොටාගෙදරගේ ගුරු ගෝල වෙනස - 79



දෙවු ප්‍රවීණ චිත්‍ර ශිල්පී මොටාගෙදර වනිගරත්න මෙහි වම් පසින් ඇති චිත්‍රය නිර්මාණය කළේ ය. ඉන්පසු එබඳුම චිත්‍රයක් නිර්මාණය කරන්නැයි සිය ගෝලයකුට උපදෙස් දුන්නේය. එහෙත් ගෝලයා නිර්මාණය කළ චිත්‍රය ගුරුවරයාගේ චිත්‍රය හා සමාන යැයි බැලූ බැල්මට පෙනුණ ද එහි වෙනස්කම් දහයක් ඇත. ඔබ කළ යුත්තේ එම වෙනස්කම් දහය මොනවාදැයි අංක මඟින් සලකුණු කිරීමයි. වෙනස්කම් සලකුණු කළ 'සිළුමිණ' පත්‍රයෙන් කපා ගත් ගෝලයාගේ චිත්‍ර සටහන තැපැල්පත්වල පමණක් අලවා උස්වත්ත ටිපිටිප් හෝ බිස්කට් ලාංජන 2 ක් සමඟ පහත දැක්වෙන ලිපිනයට යොමු කරන්න. එක් පුද්ගලයකුට චිත්‍ර සටහන් එකකට වැඩි ගණනක් එවිය හැකි අතර ඒවා මුල් පිටපත් පමණක් විය යුතු ය.

තැපැල්පත් 2021 අප්‍රේල් 20 වැනිදාට පෙර ගුරුගෝල වෙනස, සිළුමිණ, ලේක්හවුස්, කොළඹ 10 ලිපිනයට එවිය යුතු ය. ගුරු ගෝල වෙනස ජයග්‍රාහකයන්ට රුපියල් 2,500 බැගින් මුදල් ත්‍යාග 09 ක් පිරිනැමේ. ත්‍යාග පිරිනැමීම උස්වත්ත කන්ෆෙක්ෂනරි වර්ක්ස් සමාගමේ අනුග්‍රහයෙනි.

සම්බන්ධීකරණය - ගාමිණී රූපානන්ද (අනුරූ මාධ්‍ය සේවා)

රුපියල් විසිපන්දහසක තෑගි

පිළිතුරු එවීමේදී නම, නිවැරැදි ලිපිනය සහ දුරකතන අංකය සඳහන් කළ යුතුය.

සිළුමිණ Daintee X-TRA ප්‍රහේලිකා අංක 120 රුපියල් 50,000 ක තෑගි

1	2	3	4		■		6
7				■	8		
9		■	10	11			
	■	■	12				■
13	14				■	■	15
16		■		■	17	18	
	■	19		20			
21						■	

Daintee X-TRA ප්‍රහේලිකා අංක 120

නම: ....

ලිපිනය: ....

අත්සන: ....

සම්බන්ධීකරණය - ගාමිණී රූපානන්ද අනුරූ මාධ්‍ය සේවා

කොන්දේසි

(1) ප්‍රහේලිකාව සඳහා මසකට රුපියල් 50,000ක මුදලක් ජයග්‍රාහකයන් 10 දෙනකු අතර බෙදී යයි.

(2) පළමුවෙන්ම තෝරාගන්නා නිවැරැදි පිළිතුරු 10ට රුපියල් 5,000 බැගින් මුදල් තෑගි පිරිනැමේ.

(3) සිළුමිණ පුවත්පතේ පළවන ප්‍රහේලිකාව විසඳා කූපනය පුරවා ලියුම් කවරයක බහා, එහි වම්පස ඉහළ කෙළවරේ ප්‍රහේලිකා අංක 120 යනුවෙන් සඳහන් කර ඩේන්ටී මයිලේඩි ටොෆී දවටන 10ක් සමඟ සිළුමිණ ප්‍රහේලිකාව, ලේක්හවුස්, කොළඹ 10. යන ලිපිනයට 2021 අප්‍රේල් 20 දිනට පෙර එවිය යුතුය. නිවැරදි ලිපිනය, දුරකතන අංකය සහ ඊමේල් අංකයක් ඇත්නම් එයද ලියා එවන්න.

(4) ජයග්‍රාහකයන් තෝරා ගනු ලබන්නේ කුසපත් ඇදීමෙනි. ජයග්‍රාහකයන්ගේ ප්‍රතිඵල පුවත්පතේ පළ වී තෙමසක් ඇතුළත ත්‍යාග මුදල් පිරිනැමේ. ඔබේ ත්‍යාග මුදල නොලැබුණහොත් පමණක් සිළුමිණ කර්තෘ මණ්ඩලය අමතන්න. (දුරකතන අංකය 011-2429265)

(5) ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ සහ ඩේන්ටී ආයතනයේ, සේවකයන්ට හෝ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ට තරගය සඳහා ඉදිරිපත් විය නොහැකිය.

උපකාරක පද

1 කොවිඩ් මළසිරුරු භූමිදානයට තෝරා ගත් උතුරුදිග දූපත
5 කාව්‍ය
7 රට රටවල තතු සඳහන් සිතුවම/ චිත්‍රය
8 සත 6ක වටිනාකමින් යුත් කාසිය
9 කකුල
10 හංස පේළිය/ පන්තිය
12 ගුවන් හමුදා කඳවුරක් නිසා ප්‍රකට හම්බන්තොට දිසාවේ ගමෙකි
13 නයාගේ භෝගාවලිය
16 රාවණාගේ ප්‍රතිවාදියා
17 නිවෙස් හි ඇතුළු ගේ/ කුටි
19 ගනුදෙනුවක් වෙනුවෙන් මුලින් ගෙවන මුදල
21 ගෙඩි-වණ-දද සඳහා ගන්නා දුර්ලභ ඖෂධ ශාකයකි

පහළට..
1 බුදුරදුන් මංගල දම් දෙසුම පැවැත් වූ විහාරය
2 රාගය/ ඇල්ම
3 පසුව දීමට ඉල්ලා ගන්නා මුදල
4 මේ දැස කුමට ද, සංගීතා, වන බඹරා ආදි චිත්‍රපටවල අධ්‍යක්ෂ
5 අන්ධ ජනයාට මඟ කියන ලීය හෝ වැල හෝ
6 මල නැති / පිරිසුදු
8 කෝට්ටේ යුගයේ බිහි වූ මුල්ම සංදේශ කාව්‍යය
11 පිහිට
14 ගම්මානය
15 රුබෙයෝලා නමින් ද හැඳින්වෙන වෛරස් රෝගය
17 කාර්යාල කාර්ය සහායක යන්නෙහි කෙටි යෙදුම
18 මාරයා
19 පහත්/නීච/නරක යන අරුත් දේ
20 තිහ

සිළුමිණ 91 1930-2021 සපුරයි

නිදහස් සටනේ අදිසි හස්තය

සිළුමිණ පුවත්පත ශ්‍රී ලංකාවේ පත්තර මහගෙදර වූ ලේක්හවුස් ආයතනයට ආලෝකයක් එක් කළ විශිෂ්ට පුවත්පතකි. 'සිළුමිණ' ජාතික, ආගමික හා සංස්කෘතික පුනරුදයක් උදෙසා දායකත්වය දැක්වූ බව රහසක් නොවේ.

සිළුමිණ පුවත්පත උපත ලැබුවේ 1930 වර්ෂයේදීය. 19 වැනි ශතවර්ෂයට අයත් එම වකවානුවේදී ශ්‍රී ලංකාවේ නිදහස් සටන් ව්‍යාපාරය ජාතික හා ආගමික හැඩයක් ගනිමින් පැවතිණි. උගත් ස්වදේශික ලාංකිකයන් විසින් දේශීය වශයෙන් විවිධ සංවිධාන පිහිටුවා ගනිමින් අවි ආයුධවලින් තොර සංස්කෘතික යටත් විජිතවාදී අරගලයක් ආරම්භ කර තිබිණි. ලෝකය පුරා යටත් විජිතවාදයට එරෙහිව සංස්කෘතික අරගලයක් ක්‍රියාත්මක වූ වකවානුවක ශ්‍රී ලාංකේය නිදහස් ව්‍යාපාරය උදෙසා උගත් පිරිසක් සිය දායකත්වය දැක්වීම සුවිශේෂී කරුණකි.

එවැනි කාල වකවානුවක 1930 වර්ෂයේ මාර්තු 30 වැනි දින පෙරවරු 10.47 යෙදුණු සුබ මොහොතින් 'ජාතියට මැණිකක්' යන අරුතින් සිළුමිණ පුවත්පත සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම මගින් ආරම්භ කරන ලදී.

සිළුමිණ පුවත්පතේ ආරම්භක කර්තෘවරයා වූයේ පියසේන නිශ්ශංක මහතා ය. ඔහු ලේක්හවුස් ආයතනයේ සේවයට බැඳුණේ භාෂා පරිවර්තකයෙකු වශයෙනි. එතුමා රට, ජාතිය, ආගම පිළිබඳ උසස් හැඟීම් සහිත සමාජ පරිඥානය සහිත පුද්ගලයෙකු වූ හෙයින් 'සිළුමිණ' පුවත්පතේ සාමාජයීය හා ශාස්ත්‍රීය කාර්යභාරය උදෙසා ද ආරම්භක කර්තෘවරයාගේ පරිචය බලපෑ බව දැකගත හැකිය.

'සිළුමිණ' පුවත්පතේ මුල්කාලීන සංස්කාරකවරුන් එහි ගුණාත්මකභාවය සහ නව දැනුම උත්පාදනය මෙන් ම සමාජ ආකල්ප සකස් කිරීම කෙරෙහි යුහුසුළු වූ බව නොරහසකි. කාලීන වශයෙන් වැදගත් හා අත්‍යවශ්‍ය පුවත් සහ සාරගර්භ විශේෂාංග පළ කළ ආකාරය දැකගත හැකි ය. දෙස් විදෙස් තොරතුරු මෙන් ම නව දැනුම හා ලෝකය පිළිබඳ යාවත්කාලීන වන දැනුම් සම්භාරයක් 'සිළුමිණ' තුළින් සමාජගත විය. නිදහස් ව්‍යාපාරය සංස්කෘතික වශයෙන් ඇරඹුණු වකවානුවේ සිළුමිණ සිය ජාතික හා සංස්කෘතික කාර්යභාරය නොපිරිහෙළා ඉටු කළ බව පසක් වන්නේ සිළුමිණ අන්තර්ගතය හා පාඨක සමාජයට පිරිනැමූ දැනුම ගබඩාව නිසා ය. නොබෝ කලකින් 'සිළුමිණ සත දහයේ විශ්වවිද්‍යාලය' යන අත්වර්ථ නාමයෙන් හැඳින්විය. නිදහස් නිවහල් චින්තනය ලොව පුරා පැතිර යන සමයක 'සිළුමිණ' සිය වටිනා අන්තර්ගතයක් තුළින් එකී නිදහස හා අනන්‍යතාව මෙන් ම එහි වැදගත්කම පිළිබඳ සමාජ දෘෂ්ටිය පුළුල් කරනු ලැබිය.

මුල් කාලීන වශයෙන් 'සිළුමිණ' පුවත්පතෙහි දැකිය හැකි සුවිශේෂී ලක්ෂණයක් වශයෙන් විශිෂ්ට ගණයේ ලේඛකයන්, පර්යේෂකයන්, විද්වතුන් ලාංකේය පාඨක සමාජයේ දැනුම හා සමාජ අවබෝධය පුළුල් කිරීමට 'සිළුමිණ' පුවත්පතෙහි සිය ලිපි පළ කිරීම දැක්විය හැකි ය. රොබට් නොක්ස්ගේ අත්දැකීම් 'සිළුමිණ' පුවත්පතෙහි පළ විය. පසුව එද හෙළදිව වශයෙන් ග්‍රන්ථයක් ලෙස පළවූයේ ද එයමය. මේජර් තෝමස් ස්කිනර්ගේ අත්දැකීම්, වාරිමාර්ග ක්ෂේත්‍රයේ විශිෂ්ටයෙකු වූ ආර්.එල්. බ්‍රොහියර්ගේ ලිපි පෙළ, සෙනරත් පරණවිතානගේ සීගිරි කුරුටු ගී පිළිබඳ පර්යේෂණ ලිපි ආදී වටිනා ලිපි සිංහල භාෂාවෙන් පළ කිරීමට 'සිළුමිණ' කටයුතු කළේ ය.

මහත්මා ගාන්ධිතුමන්ගේ නිදහස් ව්‍යාපාරය පිළිබඳ උණුසුම් ලිපි මෙන් ම සුභාෂ් චන්ද්‍ර බෝස් වැනි නායකයින්ගේ විශිෂ්ට ලිපි 'සිළුමිණ' පුවත්පතේ පළ කිරීම තුළින් ලෝකයේ නිදහස පිළිබඳව ඇති ආකල්පය මෙන් ම සිය දේශීය අනන්‍යතාව ආරක්ෂා කරගැනීමේ වටිනාකම ලාංකේය ජනතාවට වටහා දෙන්නට සිළුමිණ මහත් පරිශ්‍රමයක් දැරූ බව පෙනේ.

ද්විභාෂික දැනුම ඇති විද්වතුන් සම්බන්ධ කරගැනීමෙන් සහ පාඨකයාගේ දැනුම අත්දැකීම් පුළුල් කිරීමට සිළුමිණ යත්න දරන ලදී.

සිළුමිණ පුවත්පතට ආහරණයක් වූ ටැබ්ලොයිඩ් ප්‍රමාණයේ ශාස්ත්‍රීය අතිරේකය එකල සමාජයේ නිදහස් චින්තනය හා වටිනාකම් පුළුල් කරන ලදී. ලංකාවේ නිර්මාණ සාහිත්‍යය පිළිබඳ අවධානය යොමු කිරීමේදී නිසඳස් කාව්‍ය පිළිබඳ කතිකාවක ගොඩනැගීමෙහිලා සිළුමිණ සිය දායකත්වය නොඅඩුව සපයනු ලැබිය. 1930 වැනි කාල වකවානුවකදී වෝල්ටර් ලිප්ටන් කවියාගේ කාව්‍ය නිර්මාණයක සිංහල අනුවාදය සිළුමිණ පුවත්පතෙහි පළ කර ඇත. නිසඳස් කාව්‍ය සම්ප්‍රදයේ ලාංකේය සලකුණ ලෙස හඳුන්වන පී. බී. සේනානායක 1946 දී සිය නිර්මාණ 'සිළුමිණ' පුවත්පතේ පළ කිරීමෙන් නව කාව්‍ය සම්ප්‍රදය අත්හදා බැලීම සිදුකර තිබේ. ඒ අනුව සාහිත්‍යයේ නව උන්නතිය සඳහා 'සිළුමිණ' හේතු වූ බව සඳහන් කළ හැකි ය.

2012 වර්ෂයේ දී සිළුමිණ පුවත්පතෙහි පළ වූ 'ලංකාවේ දැහැන්ගත සිත' යනුවෙන් පළ වූ ලිපියක සඳහන් කර ඇත්තේ සිළුමිණ සත දහයේ විශ්ව විද්‍යාලය යනුවෙන් හඳුන්වනු ලබන්නේ 40 දශකය තුළ මිනිසුන්ගේ උපභෝග පරිභෝග සඳහා ඇති කැමැත්තට වඩා දැනුම අත්දැකීම් පුළුල් කිරීමට ලබා දුන් සුවිශේෂී දායකත්වය නිසා වන බවයි. මෙකී පුළුල් ප්‍රවේශය හොඳින් අවබෝධ කරගත් මුල්කාලීන සංස්කාරකවරු ජාතික සාමාජයීය අවශ්‍යතාව හා වගකීම සිළුමිණ තුළින් ඉටු කිරීමට සමත් වූහ. සිළුමිණ ශාස්ත්‍රීය සංග්‍රහය තුළින් ලෝකයේ යාවත්කාලීන වන දැනුම නිරන්තරයෙන් සිය පාඨකයාට ලබාදෙනු ලැබිය. වර්තමානයේ මෙන් තාක්ෂණය එතරම් නොදියුණු අවධියක පවා සිළුමිණ සිය සාමාජීය වගකීම නොපිරිහෙළා ඉටු කළ බව පෙනේ.

'සිළුමිණ ප්‍රථම පුවත්පත අධ්‍යයනය කිරීමේදී පෙනී යන්නේ අධිරාජ්‍යවාදය හා නිදහස පිළිබඳව ජාත්‍යන්තර වශයෙන් පවතින තත්ත්වයන් ලාංකේය සමාජයට සමීප කිරීම උදෙසා 'සිළුමිණ' සුවිශේෂී කාර්යභාරයක් ඉටු කළ බවයි. එහි පළ වූ පුවත්වලින් පවා එය මනාව පිළිබිඹු වෙයි. දෙවන ලෝක යුද්ධ සමයේ ලෝක බලවතුන් හා බ්‍රිතාන්‍ය යටත්විජිතවාදය පිළිබඳ ජාත්‍යන්තර අත්දැකීම් සහ අධිරාජ්‍යවාදයට එරෙහි නව නිදහස පිළිබඳ සංකල්පයන් ආරම්භයේ සිටම අවධානයට බඳුන් කිරීමට 'සිළුමිණ' උත්සාහ දැරූ බව පෙනේ. සමාජීය දැනුම මෙන් ම භාෂා ශාස්ත්‍රීය දැනුමෙන් ද සිළුමිණ පොහොසත් විය. ජාත්‍යන්තර හා දේශීය වශයෙන් සවිඥානික, පාඨක පිරිසක් බිහි කිරීමෙහිලා නිදහස් චින්තනය ගරු කරන ජාතියක් බිහි කිරීමෙහිලා 'සිළුමිණ' සිය දායකත්වය ලබාදී ඇත. ස්වදේශිකවාදී චින්තනය පුළුල් කිරීම උදෙසා විශිෂ්ට ගණයේ විද්වතුන්ගේ ඇසුර සිළුමිණ නිතැතින් ම ලබාගත්තේ ය.

හෙළයේ මහා ගත්කරු මාර්ටින් වික්‍රමසිංහ, සෙනරත් පරණවිතාන, බඹරුන්දේ සිරි සීවලී හිමි, හික්කඩුවේ සුමංගල හිමි, යක්කඩුවේ ප්‍රඥාරාම හිමි, එෆ්.ආර්. සේනානායක, එදිරිවීර සරච්චන්ද්‍ර, ආනන්ද රාජකරුණා, ඩබ්.ඒ. සිල්වා, සාගර පලන්සූරිය වැනි හසළ දැනුමැති ලේඛකයන්, බුද්ධිමතුන් සහ යතිවරුන් සිළුමිණ වටා එක් රොක් වූ අයුරු දැකිය හැකි ය.

සිංහල භාෂාව උසස් ආකාරයෙන් භාවිත කිරීම සිළුමිණෙහි සුවිශේෂත්වයකි. පුවත්පත තුළ කාලීන ආකර්ෂණය පුවත්පත් බස් වහරක් යොදා ගැනීම මෙන් ම භාෂාව තුළින් සමාජ සාරධර්ම හා වටිනාකම් නිතැතින්ම ආරක්ෂා කරන ලදී. නිවහල් චින්තනය ගරු කරමින් පොදු ජනතාවගේ ආකල්ප සකස් කිරීමෙහිලා භාෂාව උසස් ලෙස සුරක්ෂිත කරන ලදී.

පියසේන නිශ්ශංකගෙන් පසු සිළුමිණ ප්‍රධාන කර්තෘ ධූරය පත් මාර්ටින් වික්‍රමසිංහ මෙකී සිළුමිණෙහි ශාස්ත්‍රීය හා සමාජීය උන්නතිය නව මානයකට රැගෙන ගිය ශ්‍රේෂ්ඨ කතුවරයෙකි. එකල සමාජයේ භාෂාව පිළිබඳ තිබූ කතිකාවකට මතා තෝතැන්නක් සැපයූ සිළුමිණ සංයමයෙන් යුතුව එකී මතවාද ඉදිරිපත් කරන ලදී.

1932 පෙබරවාරි 22 වැනි දින සිළුමිණ පුවත්පතේ කතු වැකිය වූයේ 'සිංහල භාෂාවේ ව්‍යවහාරයේ විෂමතා' යන්නයි. මේ අනුව භාෂාව සම්බන්ධයෙන් පුළුල් අවධානයක් ලබාදුන් අතර එහි ජීවගුණය ආරක්ෂා කිරීමටත්, නිවැරැදි භාෂා භාවිතයටත් සිළුමිණෙහි කැපවූ බව මතාව ප්‍රකට වේ.

පියසේන නිශ්ශංකයන් බාසුරු යන අත්වර්ථ නාමයෙන් හා මාර්ටින් වික්‍රමසිංහයන් මයුරපාද යන අත්වර්ථ නාමයෙන් පුවත්පතට ලිපි සැපයුවේ සිළුමිණ ලේඛකත්වයේ නිර්මාණශීලී ගුණය ආරක්ෂාකර ගැනීමට ය.

'සිළුමිණ' සත දහයේ විශ්වවිද්‍යාලය වශයෙන් නිදහස් රාජ්‍යයක තිබිය යුතු පාඨක සමාජය ගොඩනැගීමේ අරමුණින් මෙන් ම ජාතික, ආගමික වටිනාකම් ආරක්ෂා කිරීම උදෙසා බුද්ධිමය හා ශාස්ත්‍රීය අරගලයක් සිදු කළ නිහඬ සටන්කරුවෙකු ලෙස හැඳින්වීම අසාධාරණ නොවේ.

● මහාචාර්ය **රෝහණ ලක්ෂ්මන් පියදාස**



රත්මලානේ ධර්මාරාම හිමි

පියසේන නිශ්ශංක

මාර්ටින් වික්‍රමසිංහ

මීමන ප්‍රේමතිලක

සිළුමිණක් වන් සිළුමිණ

ඉරහඳ පවතිනාතාක් කල් රැකෙනා බවට පිළිගත් නැකතකින් බිහි වූ සිංහල පත්‍ර කලාවේ දැවැන්තයෙක් වන සිළුමිණ පුවත්පත 91 වැනි වසරට පා තබන්නේ මාර්තු 30 වැනිදාය. ශත දහයක මිලකින් ආරම්භ කොට සත දහයේ විශ්වවිද්‍යාලය නමින් බුහුමනට පාත්‍ර වෙමින් පාඨකයාගේ මන රංජනය කළ සිළුමිණ; අදත් ස්වකීය අනන්‍යතාව, අභිමානය රැක ගනිමින් ස්වාභිමානී ගමනක යෙදී සිටී. දශක නවයක මතක සටහන් සමඟින් සිළුමිණ ඇරඹි අභිමානවත් මඟ ගැන අප විවරණයක යෙදෙන්නේ වර්තමානයේ පෞඪත්වයට ඉතිහාසය දෙස් දෙන බැවි සිහිපත් කරමිනි.

සිළුමිණ ආරම්භ වන්නේ යටත් විජිත යුගයේදීය. මේ යුගයේ දේශීය චින්තනයකින් හෙබි සිංහල පුවත්පතක් ආරම්භ වීම වැදගත් සන්දිස්ථානයකි. 1930 මාර්තු මස 30 වැනිද සිළුමිණ පුවත්පත ආරම්භ වූ යුගය යටත්විජිත ශ්‍රී ලංකාවේ දේශපාලනික පරිවර්තනීය වෙනසක් ඇති වූ සමයෙකි. 1931 වන විට ශ්‍රී ලංකාවේ දේශපාලන ප්‍රවණතාව කුමක් විය යුතුද යන්න ගැන ඉංග්‍රීසි ආණ්ඩුව සලකා බලමින් සිටියේය. සිළුමිණ පත්‍රය බිහි වෙන්නේ ලංකාවේ සියලුදෙනා යටත් විජිතය ඇතුළත උපතින් සමානයන් බවට පත්කරන, අවුරුදු 21ට වැඩි සියලු ම පුරවැසියන්ට තමන්ගේ දේශපාලන නියෝජිතයා පත්කර ගැනීමට අවකාශ සලසා දෙන කාල වකවානුවක ය. ලංකාවට සර්වජන ඡන්ද බලය ලබා දීමට ක්‍රියා කළ කම්කරු පක්ෂ නායක ඒ. ඊ. ගුණසිංහ සහ ඔහුගේ ඉල්ලීම් ගැන ලේක්හවුසියේ සිළුමිණ කර්තෘවරයා විශේෂයෙන් අවධානය යොමු කර ඇති බැවි සිළුමිණ ඉතිහාසය පිරික්සීමේදී පෙනේ. සර්වජන ඡන්ද බලය ශ්‍රී ලංකාවට අවශ්‍ය බව පැහැදිලිව පිළිගත් ප්‍රතිපත්තියක් සිළුමිණට තිබුණි. මුල්කාලීන සිළුමිණ ජනප්‍රිය වීමටත් ඒ කාරණය ඉවහල් වූ බව ඉතිහාසඥයන්ගේ මතයයි. 1931 දී සර්වජන ඡන්ද බලය ලැබීමත් සමඟම ඇතිවුණු පරිවර්තනය මිනිසුන්ට ක්‍රම ක්‍රමයෙන් අවබෝධ කොට දුන්නේ ද සිළුමිණ පත්‍රය මඟිනි.

සිළුමිණ ප්‍රධාන කතු පදවියට මුලින්ම පත් වෙන්නේ ප්‍රකට ලේඛකයකු වන පියසේන නිශ්ශංක සූරීන් ය. භාෂා පරිවර්තකයකු ලෙසින් ලේක්හවුසියට බැඳුණු ඔහු තරම් මේ සඳහා සුදුස්සෙක් නැතැයි ලේක්හවුස් නිර්මාතෘ ඩී. ආර්. විජයවර්ධනයන් සිතීම සාක්ෂ්‍යයෙන්ම නිවැරදි තීරණයකි. පුවත්පත ඇරඹීමට නැකතක් සෙවීම ද එකල බාර වූයේ පියසේන නිශ්ශංකයන්ට ය. ඔහු බෙන්තර වළල්ලාවිට කෝරලයේ සංඝනායක හිමියන් ලවා අති ප්‍රබල නැකතක් සාදවා ගත්තේය. මේ නැකත පිළිබඳ උත්වහන්සේ ප්‍රසිද්ධියේ කළ ප්‍රකාශය එකල ජනප්‍රිය වූ බැවි ඉතිහාසයේ සඳහන් ය. ඒ ' මේ නැකතින් පටන් ගන්නා පුවත්පතක් ඉර හඳ පවතිනා තාක් කල් පවතිනවා' යනුවෙනි. පුවත්පතට 'සිළුමිණ' යන නාමය තබන ලද්දේ රත්මලානේ ධර්මාරාම හිමියන් විසිනි. මාර්ටින් වික්‍රමසිංහ වැනි වියතුන් හා එක්ව සිළුමිණ හැකි තරම් ඉහළ මට්ටමකට ගෙන ඒමට පියදස නිශ්ශංක සූරීන් බෙහෙවින් උත්සාහ ගත්හ.

පුවත්පත් කලාවේදියකු ලෙස හා ලේඛකයකු වශයෙන් මාර්ටින් වික්‍රමසිංහයන් නිසා සිළුමිණ කතු ධූරය බැබළුණු බැවි අවිවාදිතය. වික්‍රමසිංහයන් සිළුමිණ කතුධූරයට පත් වෙන්නේ 1934 බැවි සඳහන්ය. ඒ පියසේන නිශ්ශංකයන්ට දිනමිණ කතුධූරය බාර ගැනීමට සිදුවීම නිසාය. මාර්ටින් වික්‍රමසිංහයන් 'මයුරපාද' නම් අත්වර්ථ නාමයෙන් සිළුමිණ පුවත්පතට ලියන්නේ 1934 අගෝස්තු 5 වැනිදා සිට ය. එහි ශීර්ෂය වූයේ 'උත්සව සත්නිය හා සූදුව' යන්නයි. එතැන් සිට 1950 නොවැම්බර් 5 වැනි දින දක්වා මයුරපාද නමින් වික්‍රමසිංහයන් සිළුමිණට ලියන ලද ලිපි සංඛ්‍යාව 235කි. අවසන් ලිපියේ ශීර්ෂය වූයේ ' සිංහල නාටකය දියුණු කිරීම' යන්නයි. අභිමානවත් ලේඛන සම්ප්‍රදායක උරුමය සිළුමිණට හිමි වන්නේ එකී පාදම මත පිහිටා ය. ඒ අනුව විශ්වවිද්‍යාලයක් තරමට දැනුම සම්පාදනය කළ තෝතැන්නක් බවට සිළුමිණ පුවත්පත අනවතරයෙන් පත් විණි.

මෙකී සම්ප්‍රදයෙන් පොහොසත් වුණු සිළුමිණ 1934 දී තගෝර් තුමා ලංකාවට පැමිණීම ගැන සිය පාඨකයන් දැනුම්වත් කළ ආකාරය එහි ගමන්මග හා අරමුණු පිළිබඳ ගැඹුරු චිත්‍රයක් මවාපායි. ඔහුගේ කවි පරිවර්තනය කර පුවත්පතේ පළ කරමින්, චිත්‍ර පළ කරමින්, ඔහු පිළිබඳ විශිෂ්ට ලිපි පළ කරමින් ශාස්ත්‍රීය ප්‍රබෝධයක් ඇති කිරීමේ ලා මහඟු මෙහෙයක් සිළුමිණ ඉටු කළේය. දේශීය කලා ශිල්ප නඟා සිටුවීමට ප්‍රබල හේතුවක් බවට සිළුමිණ පත්වන්නේ එකී ආරම්භය සමඟ වීම ශක්තිමත් පාදමක් නිර්මාණය වීමේ ලා උපස්ථම්භක විය. මේ ලිපි හා තාගෝර් තුමාගේ පැමිණීම සාමාන්‍ය ජනතාව අතරට පවා රැගෙන යෑමට සිළුමිණ ක්‍රියා කළ ආකාරය ඇතුළත කියැවෙන ශාස්ත්‍රීය ප්‍රබෝධය එක භාෂික සිංහල පාඨකයන්ට පුවත්පත බෙහෙවින් සමීප වීමේ ලා හේතු කාරණා විය.

භාෂා ශාස්ත්‍ර විශාරදයන්, ඉතිහාසඥයන්, පුරා විද්‍යාඥයන් මෙන්ම විවිධ මාදිලියේ වියත් ලේඛකයන් ද සිළුමිණ පුවත්පතට ඉතා සාරගර්භ ලිපි සැපයීම ඉතා වැදගත් ය. ලංකාවේ සිය නාමය සටහන් කළ බොහෝ ලේඛකයන්, විද්වතුන් සිය මුල්ම පුවත්පත් ලිපිය ලියන්නේ සිළුමිණ වෙනුවෙනි. පැලෑනේ ශ්‍රී වජිරඥාන නාහිමි, කළුකොඳයාවේ ශ්‍රී පඤ්ඤාශේඛර නාහිමි, එඩ්මන් පීරිස් රදගුරුතුමන්, මහාචාර්ය ගුණපාල මලලසේකර, මහාචාර්ය සෙනරත් පරණවිතාන, මාර්ටින් වික්‍රමසිංහ වැනි වියතුන්ගේ එද සිළුමිණේ පළවූ ලිපි ලේඛන ඊට උදාහරණ වේ.

සිළුමිණ ඒක භාෂික පාඨකයන්ට විදුබිමකි. පුවත්පත බිහිවූ මුල් කාලයේම අයි.ඇම්.ආර්. ඊරියගොල්ලයන් ඉදිරිපත් කළ 'නොක්ස්ගේ ලංකා ඉතිහාසය' පරිවර්තන ලිපි පෙළ ගිනිය නොහැකි තරම් වැදගත් වන්නේ ඒවැනි පසුබිමකය. පසුව එය පොතක් ලෙස ඉමහත් ගෞරවයට පාත්‍ර විණි. මෙකල්හි මෙන් නොව එද තොරතුරු ලබාගැනීමට සිංහලෙන් පළවූ පොත්පත් ඉතා හිඟ විය. එබැවින් එංගලන්තයේ විකාශනය වූ ඉංග්‍රීසි ගුවන්විදුලි වැඩසටහන් හා එංගලන්තයේ පළවූ පොත්පත් විවිධ විද්වතුන් විසින් පරිවර්තනය කරන ලදුව සිළුමිණේ පළ විණි. ශාස්ත්‍රීය පිපාසයෙන් සිටි පිරිසට මෙය පැන් දෝතක් වූ අතරම, සිළුමිණ ඉටු කළ ශාස්ත්‍රීය මෙහෙය අද්විතීය වන්නේ ද එවන් වූ කරුණු හේතුවෙනි.

සිළුමිණ ඇරඹි ශාස්ත්‍රීය හා අනගිහවතීය ඓතිහාසික කාර්ය බාරය තවත් ඔපවත් කිරීමේ ලා බලපෑම් කළ කර්තෘවරු කිහිපදෙනෙක්ම වූහ. කාව්‍ය සම්ප්‍රදය හා කලාව කෙරෙහි වැඩි අවධානයක් යොමු වන්නේ 1961 සිට 65 දක්වා කතුකම් කළ මීමන ප්‍රේමතිලක සමයේය.

පියසේන නිශ්ශංකයන්ගේ පටන් මාර්ටින් වික්‍රමසිංහ, මීමන ප්‍රේමතිලක, ඩී.එෆ්. කාරියකරවන, කවුඩාතේ පියදස පෙරේරා, තිලකරත්න කුරුවිට බණ්ඩාර,කරුණාදස සූරියආරච්චි ආදී වශයෙන් කලින් කල පත්වූ බොහෝ කර්තෘවරු නිර්මාණ ක්ෂේත්‍රයට විශාල දායකත්වයක් සැපයූහ. මෙය ලෝක මට්ටමින් ගත් කල ද විශේෂ ප්‍රවණතාවකි. බොහෝ දෙනා අතර ඇති විශ්වාසයක් වන්නේ පුවත්පත් කලාව හා නිර්මාණ කලාව අතර පරස්පරයක් ඇති බවය. සිළුමිණ ඉතිහාසය ගෙන බැලූ කල මෙය සාවද්‍ය කරුණක් බව ඉහත කරුණු ඔස්සේ සනාථ වේ.

සිළුමිණ පොබ කළ කතුවරු බොහොමයකි. මේ අය අතරින් බොහොමයක් සාහිත්‍යධරයන් ය. ආරම්භක කර්තෘ පියසේන නිශ්ශංක 'බාසුරු' යන ආරූඪ නාමයෙන් ගැමි පරිසරය අළලා පුවත්පතට ලියූ ලිපි අදටත් අධ්‍යයන කටයුතු සඳහා යොදා ගැනේ. 'වදුල' වැනි එකල ජනප්‍රිය නවකතාවක් ඔහු අතින් ලියැවෙන්නේ මෙකී කාර්ය බහුලත්වය මැද ය. හෙළයේ මහා ගත්කරු ලෙස විරුදාවලී ලබන මාර්ටින් වික්‍රමසිංහයන් සිළුමිණ කතු පදවිය බැබළූ වූවෙකි. මෙතෙක් ආ ගමන් මඟ සිළුමිණ කතුධූරය හෙබවූවන් වන්නේ ශ්‍රී ලාල් හික්කඩුව ලියනගේ (1944-1953), ඩෙන්සිල් පීරිස් (1953-1961), මීමන ප්‍රේමතිලක (1961-1965), ඇස්. සුබසිංහ (1965), විමලසිරි පෙරේරා (1965-1969), ධර්මපාල වෙත්තසිංහ(1969-1980), එඩ්මන්ඩ් රණසිංහ (1980- 1981), ඩී. එෆ්. කාරියකරවන (1981-1982), වැ. බ. මෙත්තානන්ද (1982-1984), බන්දුල ශ්‍රී සරත්චන්ද්‍ර (1984-1985), ඩී. සී. කරුණාරත්න (1985-1989), කවුඩාතේ පියදස පෙරේරා (1989-1993), තිලකරත්න කුරුවිට බණ්ඩාර (1993-1994, 2002- 2004), නිමල් හොරණ (1994-1999), සුජීව දිසානායක (1999-2001), දෙල්තොට චන්ද්‍රපාල (2001-2002), වජිර පැල්පිට (2004-2005), කරුණාරත්න අමරතුංග (2005-2005), කරුණාදස සූරියආරච්චි (2005-2013), සුන්දර නිහතමානී ද මැල් (2014), ලක්ෂ්මන් පියසේන (2015-2018), චාමර ලක්ෂාන් කුමාර (2018), සුනිල් ජයසේකර (2018) චාමින්ද වාරියගොඩ (2019) ය. වත්මන් කර්තෘ ධර්මන් වික්‍රමරත්න සිළුමිණ කතු පදවියට පත්වන්නේ 2020 ජනවාරි සිටය.

සිළුමිණ කර්තෘ ධූරය හෙබවූවන් අතර එඩ්මන්ඩ් රණසිංහ, ඩී. සී. කරුණාරත්න, තිලකරත්න කුරුවිට-බණ්ඩාර, කරුණාරත්න අමරතුංග, සුන්දර නිහතමානී ද මැල්, සුනිල් ජයසේකර, ලක්ෂ්මන් පියසේන හා චාමින්ද වාරියගොඩ යන ජ්‍යෙෂ්ඨයෝ අදටත් මාධ්‍ය ක්ෂේත්‍රයේ රැඳී සිටිති.

අනූ එක් වසරක් යනු පුවත්පතකට පරිණතම අවදියකි. පාඨක සහෘදය ප්‍රජාව හා අර්ථ සම්පන්න සහසබඳතාවක් දශක නවයක් තිස්සේ අවිච්ඡින්නව පවත්වා ගෙන යෑම පහසු කරුණක් නොවේ. සිළුමිණට 91 සපිරෙද්දී මෙරට ට සර්ව ජන ඡන්ද බලයට ද වසර 90ක් සැපිරේ (1931-2021). සිළුමිණ හා ප්‍රජාතන්ත්‍රීය නැඹුරුව කියවා ගැන්මේ ලා එය ශක්තිමත් පදනමකි. 1930 මාර්තු 30 පළමු සිළුමිණ පුවත්පතේ එස්. මහින්ද හිමියන් ගේ පහත කවිපෙළ පළ වී තිබිණි. උත්වහන්සේගේ ඒ කවිය අප කියවා ගන්නේ පෙර නිදහස පිළිබඳ කරුණ පසුබිමේ තබා ය.

නිදහස හිමි වෙත්ටත් - ජාති ආලේ වැඩෙන්ටත්
නැණ එළිය ලබන්නටත් - වාසනාවන්ත වෙන්ටත්
රට සමය හදන්ටත් - වාද - බේ බුන් කරන්ටත්
සමගිය ලියලන්ටත් - ඒ මඟින් ලෝ වැඩෙන්ටත්
කැමති අය සිටින්නම් - සිංහලද්දීපයේ මේ
'සිළුමිණ' කියවන්වා - ආයුබෝවන්! කියන්වා!
මේ වග මෙලෙස දන්වන් - නේ කියන්නේ හිතන්නේ
සිළුමිණෙහි ඉතා ළාබාල - කවිකාරයා වේ!

● සුමුදු චතුරාණී ජයවර්ධන

සිළුමිණ 91 1930-2021 සපුරයි

වසර 91ක සිළුමිණ මුද්‍රණ ඉතිහාසය

පත්තර මහගෙදර සත දහය විශ්වවිද්‍යාලය යන විරුදාවලිය ලත් සිළුමිණ පුවත්පත මේ සතියේ මාර්තු 30 වැනිදා සිය 91 වැනි වසර සපුරයි. වසර 91ක් සිළුමිණ පුවත්පත ඔබ අතට ලැබුණේ මෙරට මුද්‍රිත සන්නිවේදනය යටතේ ආරම්භ කළ දැනටත් වැඩියෙන්ම ජනප්‍රියව පවතින ප්‍රථම සිංහල ඉරිදා පුවත්පත වශයෙන්ය.

සිළුමිණ පුවත්පත වසර 91ක් ඔබට ලබා දුන්නේ සුවිශේෂී මුද්‍රණ තාක්ෂණ ක්‍රම අනුවය. 1930 සිටම අද දක්වා විවිධ නව තාක්ෂණික සංවර්ධන ක්‍රියාදමයන්ට යොමු වෙමින් සිළුමිණ පුවත්පත විශිෂ්ට නිමාවකින් යුක්තව ඔබ අතට පත්කරන්නට හැකිවී ඇත්තේ මුද්‍රිත සන්නිවේදනය කෙරෙහි නව තාක්ෂණය හා නවීන පරිගණක පද්ධතිවල මෙහෙයවීම් මත බව පැවසීම අතිශයෝක්තියක් නොවේ.

මුළු ලොවම විශ්ව ගම්මානයක් වන වත්මන් සංකීර්ණ සමාජයේ ජීවත්වීම උදෙසා ඇඳුම් පැලඳුම් වැනි මූලික සාධක මෙන්ම එකිනෙකා අතර අදහස් හුවමාරු කර ගැනීම හෙවත් සන්නිවේදනය අද අත්‍යවශ්‍ය දෙයක් වී ඇත.

එක් පුද්ගලයකුගේ සිතේ හටගත්තා අදහසක් තවත් පුද්ගලයකුට හෙළි කිරීම සන්නිවේදනය ලෙස සරලව අර්ථ දක්වේ. සන්නිවේදනය වනාහී භාෂාව මාධ්‍ය කොටගත් නිරායාසයෙන්ම පරිණාමයට බඳුන් වන ක්‍රියාදමයකි. සන්නිවේදනය ශ්‍රව්‍ය, දෘෂ්‍ය හා මුද්‍රිත හෙවත් ලිඛිත ලෙස ප්‍රධාන කොටස් තුනකි. සෑම අවස්ථාවකදීම නිරන්තරයෙන්ම කියවා බැලීමටත් අවශ්‍ය නම් සිතේ ධාරණය වන තාක් කල් තැවත නිරීක්ෂණය කිරීමටත් හැකි බැවින් ඉහත කී සන්නිවේදන ක්‍රම තුනෙන් මුද්‍රිත සන්නිවේදයට ප්‍රමුඛ ස්ථානයක් හිමිවෙයි.

යමක් මුද්‍රණය කරනවා යනුවෙන් අදහස් කරන්නේ අවශ්‍ය වර්ණයකින් සුදුසු මතුපිටක තමාට අවශ්‍ය ඕනෑම පිත්තූරයක් අකුරක් හෝ මෝස්තරයක් ඒ ආකාරයෙන් ම ලබා ගැනීමයි. තවත් අයුරකින් කීවොත් මුද්‍රණය යනු මුල් ප්‍රතිබිම්බයක් එනම් අච්චුවක් නැවත නැවත අච්චු ගැසීමකි.

අප ලෝකයේ මුද්‍රිත සන්නිවේදනය ඇති වූයේ ලිඛිත සන්නිවේදනයේ ආභාසයෙන්ය. ඒ අනුව බොහෝ කලාවන්ට මෙන්ම ලේඛන කලාවන්ට ප්‍රබල අනුබලයක් වූයේ ආගමික කටයුතුවල බලපෑමයි. ඒ අනුව ශ්‍රී ලංකාවේ පුස්කොළවල බණ දහම් ත්‍රිපිටකය ලියා තබන ලද්දේත් භික්ෂූන් වහන්සේ විසිනි. මෙහිදී ලෝහ වර්ගයක් මඟින් සෑදූ අකුරු එකම තඹ තහඩුවක් මත සවිකර ඒ අකුරු මත තීන්ත තවරා අවශ්‍ය පිටපත් ගණන ලබා ගත හැකි බව පෙන්වා දුන්නේය. ඒ ආශ්‍රයෙන් ගුටෙන්බර්ග් 1450 හි ලොව ප්‍රථම මුද්‍රණ යන්ත්‍රය නිපදවා මහා විප්ලවයක් ඇති කළේය. 1455 දී ගුටෙන්බර්ග් පේළි 42කින් යුත් ලතින් බයිබලය මුද්‍රණය කළේය.

ඒ අනුව ජොහැන්නස් ගුටෙන්බර්ග් 1900 - 2000 ශතකයේ ලොව සුවිශේෂී හා වැදගත්ම පුද්ගලයා (Man Millenniyam) බවට පත්විය. ඊට පසුව ඉතාලියේ වැනීසියේ එල්ඩස් මනුතියෙස් නමැත්තා ඇලඩීන් නමින් මුද්‍රණාලයක් ආරම්භ කර ඇත. මේ සිද්ධාන්තය අනුව යමින් ලෝහයෙන් සෑදූ මුල්ම මුද්‍රණ යන්ත්‍රය නිපදවනු ලැබිය. ඒ සමඟම 1955දී ඉන්දියාවේත්, 1644දී චීනයේත්, 1739දී අමෙරිකාවේත්, ජර්මනියේත් නගරවල මුද්‍රණ යන්ත්‍ර හා මුද්‍රණ ආයතන විවෘත විය.

මෙකල ශ්‍රී ලංකාව පාලනය කළේ ලන්දේසිත්ය. ඔවුහු අපේ රටට මුද්‍රණ ශිල්පය ගෙන ඒමට කටයුතු කළහ. ශ්‍රී ලංකාවේ ප්‍රථම මුද්‍රණ ග්‍රන්ථය 1737 දී පළවිය. එය පළකළේ ලන්දේසීන්ගේ යුද්ධායුද ගබඩාවේ පිහිටුවන ලද මෙරට ප්‍රථම මුද්‍රණාලයේදීය. ක්‍රිස්තියානි යාඥා පොතක් වන මෙය සිංහලෙන් පළවිය. මෙහි සිංහල අකුරු සකස් කර ඇත්තේ ලන්දේසි වෙඩ් බේත් ගබඩාව බාරව සිටි ෂාඩ් බාස් නම් පුද්ගලයා විසිනි.

මේ අයුරින් ඊයම් වලින් සෑදූ අකුරු උපයෝගි කරගෙන අපේ මුද්‍රණ කර්මාන්තය ඒ අනුව අපේ රටේ දියුණු විය.

ඒ අනුව මෑතක් වනතුරු අපේ රටේ ජනප්‍රිය ලෙස පැවති උස්තල මුද්‍රණ ක්‍රමය හෙවත් ලෙටර් ප්‍රෙස් මුද්‍රණය ක්‍රමය ක්‍රියාවට නැංවිනි. 1930 සිට 1980 පමණ වන තෙක් සිළුමිණ පුවත්පත ද මුද්‍රණය කළේ ලෙටර් ප්‍රෙස් ක්‍රමයටය.

මුලදී ඊයම්වලින් සෑදූ එක් එක් අකුරු ඇමිණීමේ ක්‍රමය නිසා පුවත්පත් පිටු සකස් කිරීමට වැඩි වේලාවක් ගත විය. මේ අනුව 1882 දී පමණ ඉක්මනින් අකුරු ඇමිණීමේ ක්‍රමයක් පිළිබඳව සොයා බැලීමට ඇමෙරිකාවේ සිටි ඔට්මාර් වර්ගන්තැලර් නැමැති ජර්මන් ජාතික මුද්‍රණ ශිල්පියා කටයුතු කළේය. ඒ අනුව අකුරු පේළියක් සේ සකස් කර එය නොවැටෙන සේ ඊයම් වලින් සැකසූ එකම තීරුවක් ලෙස සකස් කළ හැකි බවයි.

1980 වකවානුවේ පවා ලේක්හවුස් ආයතනයේ ක්‍රියාත්මක 'ලයිනෝ ටයිප්' බිහිවූයේ ඉහත ක්‍රමයේ

මුද්‍රණ යන්ත්‍රයට මුද්‍රණ තහඩු සවිකරන ආකාරය.

අතීතයේ පිටුසැකසීම සිදුවූයේ මේ අයුරින් ඊයම් අකුරු උපයෝගී කරගෙනය.

මේවන විට පිටු සකස් කරන්නේ පරිගණකය ආශ්‍රයෙනි

නවීන පරිගණක මඟින් සිළුමිණ පුවත්පතේ පිටුසැකසීම

අපේ මුද්‍රිත සන්නිවේදනයේ ඉතිහාසය එතෙර මෙතෙර පුදුමයට පත්කරයි

අනුගමනය කර ඇත්තේ පත්ගිදෙන් තල්පතේ ලියා පුස්කොළ බවට ඒවා පත්කිරීමේ ක්‍රමයයි.

පසු කාලයේදී ලීවලින්, මැටිවලින් ගල්වලින් අකුරු සකස් කිරීම සිදුවිය. ඒ අනුව බුදු දහමේ වන ගාථා ලී කැටයම් ලෙස විවිධ තලවලට ගැනීමද සිදුවිය.

නමුත් මේ ක්‍රමයෙන් සකස් කළ දේවල් ඒ දේවල්වලට පමණක් සීමාවිය. යළි පිටපත් ගැනීම අපහසු විය. එසේම චීන අධිරාජ්‍යය පුරා පරිපාලන කටයුතු කිරීමට ලිපි ලේඛන වේගයෙන් සකස් කිරීමට අවශ්‍ය විය. ඒ අනුව ඔවුන්ට කඩදසි හා මුද්‍රිත ක්‍රමයක් අවශ්‍ය විය.

ඒ අනුව චීන ජාතික ත්සෙයිලුං නැමැත්තෙක් කඩදාසිවලට සමාන ද්‍රව්‍යයක් ක්‍රිස්තු වර්ෂ 105දී නිපදවා තිබේ. පසුව ක්‍රි.ව. 175දී ප්‍රංශ ජාතික නිකලස් ලුයි රොබර්ව් විසින් මුල්ම කඩදාසි නිපදවීමේ යන්ත්‍රය ද සම්පාදනය කර ඇත.

ආරම්භ සමයේ මුද්‍රණ ශිල්පය හඳුන්වන ලද්දේ සකල කලාවන්ගේ ආරක්ෂක කලාව (Art Presevative of All Arts) ලෙසිනි. සියලු කලාවන් ආශ්‍රිත කරුණු සම්භාරය මුද්‍රණ ශිල්පය මඟින් ප්‍රකාශ කළ හැකි නිසා මුද්‍රණ ශිල්පය පිළිබඳව එලෙස හඳුන්වා දී ඇත.

ජර්මන් ජාතිකයකු වූ ජොහැන්නස් ගුටෙන්බර්ග් විවිධ රටවල කෙරෙන අකුරු අමුණා කරන මුද්‍රණ කටයුතු පිළිබඳව අවධානය යොමු කර තිබේ. ඔහු කළ පර්යේෂණ අනුව ඔහු විසින් ඊයම් හා තඹ මිශ්‍රිත

ලෝකේම තවම පුවත්පත් මුද්‍රණය කරන්නේ අත්වැරදීමකින් බිහිවුණ 'ඔෆ්සෙට්' ක්‍රමයෙන්

මේ පුවත්පත් මුද්‍රණය කිරීම සඳහා මුලින්ම ඊයම් සහිත පිටුව ෆවුන්ඩරි තම් අංශය හරහා යා යුතුය. එවිට ඒ පිටුව තවත් යන්ත්‍ර ආධාරයෙන් අර්ධ ගෝලාකර ස්තරයක් ඇති ඊයම් තහඩුවක් බවට පත්වෙයි.

උස්තල නැත්තම් ලෙටර් ප්‍රෙස් ක්‍රමයට සැකසූ තහඩුවල මුද්‍රණය කළ යුතු කොටස් උඩට නෙරා ඇත. අකුරු ඇත්තේ නොපිටටය. ඉන්පසු තහඩුව අර්ධ ගෝලාකාර හැඩයක ආකාරයක කැරකෙන සිලින්ඩර්වලින් යුත් රොටරි යන්ත්‍රයට සවි කිරීම කරනු ලැබේ.

රොටරි යන්ත්‍රයේ කැරකෙන සිලින්ඩරය මත තිබෙන ඊයම් තහඩුව මෙහිදී යටින් ඇති තීන්ත හා ගැටේ. එවිට තහඩුවේ මතුපිටින් ඉහළට නෙරා ඇති මුද්‍රණය විය යුතු කොටසේ තීන්ත තැවරී එය සිලින්ඩර අතරින් දිවෙන දිග කොළයකට තද වේ. එවිට ඊයම් තහඩුවේ ඇති දේ කොළයට මුද්‍රණය වීම සිදුවේ.

උස්තල මුද්‍රණ ක්‍රමයේදී වර්ණ ඡායාරූප මුද්‍රණය අපහැදිලි විය. එමෙන්ම සමහර අවස්ථාවලදී පුංචි අකුරු බොඳවීමක් ද දක්නට ලැබේ. ඒ අඩුපාඩු සපුරා ගැනීම පිණිස නව ලිතෝ මුද්‍රණ ක්‍රමය 1802 දී පමණ සොයා ගෙන ඇත. එය සොයාගෙන ඇත්තේ ඇමරිකා එක්සත් ජනපදයේ නිව් ජර්සි ජනපදයේ සිටි අයිරාරුබල් නම් ගල් මුද්‍රණ ශිල්පියෙක්ට තම යන්ත්‍රයට කඩදසි දැමීමට අතපසුවීමකිනි. මේ මුද්‍රණ ක්‍රමය නවීකරණයවී බිහිවී තිබේ.

මේ මුද්‍රණ ක්‍රමය බොහෝ දෙනා හඳුන්වන්නේ ලිතෝ මුද්‍රණ ක්‍රමය හෙවත් සමතල මුද්‍රණ ක්‍රමය ලෙසය. තෙල් හා ජලය මිශ්‍ර නොවේ යන සිද්ධාන්තය මේ මුද්‍රණ ක්‍රමයට පදනම වී තිබේ. මෙය ලොව වැඩි දෙනා හඳුන්වන්නේ 'ඕෆ් සෙට්' යන නමිනි.

ලේක්හවුස් ආයතනය ඇතුළු මෙරට සියලු පුවත්පත් ආයතනවල අති නවීන සමතල මුද්‍රණ යන්ත්‍රවල පුවත්පත් මුද්‍රණය කරන්නේ 'අයිරා රුබල්' තැනූ සමතල මුද්‍රණ යන්ත්‍ර සිද්ධාන්තය පදනම් කරගෙනය.

මේ ක්‍රමයට පුවත්පත් පිටුවක් නිර්මාණය කරන්නේ ඊයම් මඟින් නොවේ. තනිකරම පරිගණක ගත නව තාක්ෂණික ක්‍රමයටය. ඒ අනුව ලේඛකයා ලියන ලිපි ඇත. අදාළ පිටුවට අදාළ ඡායාරූප ද ඉන්පසු නව මෘදුකාංගය යටතේ ඇති වෙනම පරිගණක ගොනු මඟින් හෝ අන්තර්ජාලය මඟින් ලබාගෙන අදාළ පිටුවට යොමු කරනු ලැබේ. ලේක්හවුස් ආයතනය දැන් පාවිච්චි කරන Lib 6 මෘදුකාංග පද්ධතිය ලේක්හවුස් ආයතනයේ කර්තෘ මණ්ඩල මාධ්‍යවේදීන්ට ඇති පරිගණක පද්ධතිය පිටු සැකසුම් අංශයේ පරිගණක පද්ධතියට පමණක් නොව දැන්වීම් අංශයේ පරිගණක පද්ධතියද එකට සම්බන්ධ වී තිබේ. ඒ අනුව අදාළ පුවත්පතේ ප්‍රධාන කර්තෘවරයාට මේ සියලු lib 6 පරිගණක මෘදුකාංගය යටතේ තම පුවත්පතේ සියලු කටයුතු කර්තෘවරයාගේ ප්‍රධාන පරිගණකය මඟින් නිරීක්ෂණය කළ හැකිය.

Lib 6 පරිගණක මෘදුකාංගය මඟින් සාදන සියලු පිටු ඉන්පසු නිෂ්පාදන අංශයේ නිෂ්පාදන කළමනාකරුගේ ප්‍රධාන පරිගණකයට යොමු කර ඔහුගේ අධීක්ෂණය හා පිරික්සීම් යටතේ කෙලින්ම මුද්‍රණ තහඩුවෙත යොමු කරනු ලැබේ. පරිගණකයෙන් කෙලින්ම මුද්‍රණ තහඩුවට යොමු කරන මේ නව තාක්ෂණය CTP ලෙස හඳුන්වනු ලැබේ.

මෙහිදී වර්ණ පිටු සඳහා මුද්‍රණ තහඩු 4ක්ද කළු සුදු පිටු සඳහා මුද්‍රණ තහඩු 1ක්ද නිපදවනු ලබන අතර ඒ ප්‍රමාණය පුවත්පතේ පිටු ගණන අනුව වෙනස්වේ. මේ ප්ලේට් රොටරි යන්ත්‍රයට සවිකර පුවත්පත් මුද්‍රණය කරනු ලැබේ.

සිළුමිණ පුවත්පත මුලින්ම උස්තල ක්‍රමයට මුද්‍රණය කර ඇත්තේ 'ගොස් සර්බර්ටයින්' මුද්‍රණ යන්ත්‍රයෙනි. ඉන්පසු 'හෝ කැබ්රි' මුද්‍රණ යන්ත්‍රයෙන් 1980 වනතෙක් සිළුමිණ මුද්‍රණය කර ඇත.

වසර 91ක් පැරණි සිළුමිණ පුවත්පත ලේක්හවුස් ආයතනයේදී මුලින්ම සමතල මුද්‍රණ ක්‍රමයෙන් මුද්‍රණය කර ඇත්තේ 'හැරිස්' රොටරි මුද්‍රණ යන්ත්‍රයෙන්ය. ඊට පසු 'ගොස් කොමියුනිටි' මුද්‍රණ යන්ත්‍රයෙන් සිළුමිණ මුද්‍රණයවී ඇත. ලේක්හවුස් ආයතනයට 2000 - 2010 දශකයේදී අලුතින් මුද්‍රණ යන්ත්‍ර කිහිපයක් ගෙන්වනු ලැබිය. ඒ අතරින් 'ගොස් අර්බන්ලයිනර්' මුද්‍රණ යන්ත්‍රය සුවිශේෂී එකකි. දැනටත් සිළුමිණ පුවත්පතේ බොහෝ

මැග්නම් මුද්‍රණ යන්ත්‍රය ඡායාරූප - කැළුම් ලියනගේ

වසර 25ක් තිස්සේ ලේක්හවුස් ආයතනයේ ක්‍රියාත්මක වන 'ගොස් අර්බන්ලයිනර්' මුද්‍රණ යන්ත්‍රය.

පරිගණක මඟින් විදයුත් යතුරු ලියනය කර අදාළ ගොනු අංක යොදු නවත් අලුත්ම මෘදුකාංග ඇති පරිගණක පද්ධතියකට යොමු කරනු ලැබේ.

ඕෆ්සෙට් මුද්‍රණ ක්‍රමයේ සුවිශේෂ ප්‍රයෝජනය වනුයේ වර්ණ ඡායාරූප පමණක් නොව රූ සටහන් චිත්‍ර හා වෙනත් වර්ණ ඡායාරූප හා උත්සව අවස්ථා පවා අලංකාරව මුල් නිර්මාණයට සියයට 96 - 98 පමණ සමානව මුද්‍රණය කරවා ගැනීමට අවස්ථාව ලැබේ. සමතල මුද්‍රණ ක්‍රමයේදී අකුරු ඇමිණීම සිදුකරන්නේ විදයුත් දර්ශක පරිගණකය (Vidio display terminal) මඟින්ය. ඊයම් බරු ප්‍රසාරණය කරමින් ලයිනෝ යන්ත්‍ර ක්‍රියා කරවන්නන් දුක් විඳි කාලය නව තාක්ෂණයේ බලපෑම හේතු කොටගෙන මෙසේ අවසන් වී තිබේ. දැන් ඔවුන්ට වායු සම්කරණය කළ කාමරක සිට මෙම පරිගණකය මඟින් අකුරු ඇමිණීම සිදු කළ හැකිය. යතුරු ලියනයට සමාන අකුරු මුහුණත් රාශියකින් හෙබි මෙම පරිගණක කට්ටලය රූපවාහිනියකට සමාන වූ වද්දන අකුරු දර්ශනය වන දර්ශකයකින්ද සමන්විත වේ.

පුවත්පතට අවශ්‍ය ලිපි ආදිය විදයුත් දර්ශක පරිගණක ක්‍රියාකරුට බාර දීමෙන් පසු ඒ සියල්ල පරිගණක යතුරු පුවරු මඟින් පරිගණකය තුළට ඇතුළු කරනු ලැබේ. අක්ෂර දෝෂ ඇතොත් මුද්‍රිත පිටපතක් ගෙන ඒවා නිවැරදි කරගත හැකිය.

මෙම VDT පරිගණකවල සුවිශේෂත්වයක් වනුයේ ඡේද වෙන් කිරීම, පද බෙදීම් ආදියද ඒවාට කළ හැකි වීමය. පිටුවට අදාළ උප කර්තෘ ටයිප් කිරීමට එවන සෑම ලිපියකටම ගොනු අංකයක් යොදන අතර ලිපිය විදයුත් යතුරු ලියනය කිරීමෙන් පසු තවත් මෘදුකාංගයක් සහිත (ලේක්හවුස්හි නම් lib 6) පරිගණක පද්ධතියකට යොමු කරනු ලැබේ. ඊට පසු යළිත් උපකර්තෘවරයා එම ලිපිය අදාළ පිටුවට යොමු කරනු

ලයිනෝ - මොනෝ සමඟින් ලඩ්ලෝ අකුරු ලෙටර්ප්‍රෙස් - ඕෆ්සෙට් - සුරකිමු සැම මිතුරු

නය දියුණු විය. එහි ප්‍රතිඵලයක් ලෙස ඒ අනුව එදා තල්පතේ ලියූ දේ අද නවීනතම පරිගණක වලින් සකස් කර ලොව පුරා ප්‍රචලිත කිරීමට අවස්ථාව ලැබී තිබේ.

සිළුමිණ පුවත්පත වසර 91ක් ඔබ අතට පත්වූයේ ද ඉහත සඳහන් කළ මුද්‍රණ කර්මාන්තයේ විවිධ පරිණාමයන්ට බඳුන් වෙමින්ය. ඒ අනුව 1930 පළවූ අපැහැදිලි ඡායාරූපවලින් යුක්ත හා බොඳවූ අකුරුවලින් යුත් සිළුමිණ පුවත්පත වෙනුවට දැන් ඔබ අතට නවීන තාක්ෂණය අනුව නිම කළ පැහැදිලි හා නව නිමාවකින් යුත් සිළුමිණ පුවත්පතක් ලබාදීමට හැකිවී ඇත්තේ ලේක්හවුස් ආයතනයේ මනා කළමනාකාරිත්වයේ හා ලේක්හවුස් ආයතනයේ සියලු සේවක සේවිකාවන්ගේ පූර්ණ සහයෝගය නිසා බව කිව යුතුමය.

● නිහාල් පී. අබේසිංහ

සිළුමිණ 91 1930-2021 සපුරයි

සඳහා තව මගක් පාදනු ලැබීමයි. අනෙක් අංශයෙන් බොහෝ ශාස්ත්‍රීය කරුණු පිළිබඳව පොදු පාඨකයාට වැටහීමක් ලැබෙන පරිදි සංවාද සාකච්ඡා සහ ශාස්ත්‍රීය විවාද පැවැත්වීමට හැකි වීමයි. ඒ නිසා ශ්‍රී ලංකාව තුළ විශිෂ්ට පුවත්පත් කලාවක් බිහි කිරීමේ මෙහෙවරට උරදුන් පුවත්පතක් ලෙස සිළුමිණ හැඳින්වීමට කැමැත්තෙමි.

වසර 91 ක කාල පරිච්ඡේදය තුළ සිළුමිණ පුවත්පත පළ කළ විශේෂාංග, ප්‍රවෘත්ති විමර්ශන, ශාස්ත්‍රීය ලිපි ආදිය වෙනස් මගක් ගනු ලැබිය.

ශ්‍රී ලංකාවේ නිදහස උදෙසා විවිධාකාරයේ ව්‍යාපාර ආරම්භ කිරීම, නිදහස ලබාගැනීම සහ සර්වජන, ජන්ද බලය තුළින් නිදහස් පාර්ලිමේන්තුවක් පත්කිරීම ආදී දේශපාලන වෙනස්කම් මෙන් ම, භාෂා සාහිත්‍යය සහ සංස්කෘතික වෙනස්කම්වලට මුහුණදුන් සිළුමිණ දීර්ඝ ඉතිහාසයක් ඇති පුවත්පතකි.

සිළුමිණ මාධ්‍ය කාර්යභාරය එදා සහ අද

ශ්‍රී ලංකාවේ නිදහස උදෙසා විවිධාකාරයේ ව්‍යාපාර ආරම්භ කිරීම, නිදහස ලබාගැනීම සහ සර්වජන, ජන්ද බලය තුළින් නිදහස් පාර්ලිමේන්තුවක් පත්කිරීම ආදී දේශපාලන වෙනස්කම් මෙන් ම, භාෂා සාහිත්‍යය සහ සංස්කෘතික වෙනස්කම් වලට මුහුණදුන් සිළුමිණ දීර්ඝ ඉතිහාසයක් ඇති පුවත්පතකි.

ශ්‍රී ලංකාවේ ප්‍රකාශයට පත් කෙරෙන සති අන්ත පුවත්පත් අතර අඛණ්ඩව මේ දක්වා වැඩිම කාලයක් පවත්වාගෙන ආ එකම පුවත්පත ලෙස 'සිළුමිණ' හැඳින්විය හැකි ය. තවත් සමහර සති අන්ත පුවත්පත් පැවතුණ ද ඒවා අඛණ්ඩව පවත්වාගෙන යාමට නොහැකි වූ නිසා සිළුමිණ තරමි ඉතිහාසයක් ඒවාට නොමැත. 91 වසරක් අඛණ්ඩව සති අන්ත පුවත්පතක් ලෙස පවත්වා ගැනීමට හැකිවීම ශ්‍රී ලංකාවේ පුවත්පත් ක්ෂේත්‍රයේ එෙතිහාසික සිදුවීමකි.

මෙම කාල පරිච්ඡේදය තුළ 'සිළුමිණ' පුවත්පත විසින් ඉටුකරන ලද මෙහෙවර ලෙස ශාස්ත්‍රීය ලෝකයේ සහ පුවත්පත් කලාවේ තව ප්‍රවණතාවක් ඇති කළ බව සඳහන් කළ හැකි ය. ඊට හේතුව සිළුමිණ පුවත්පත ශ්‍රී ලංකාවේ පුවත්පත් කලාවේ විකාශය

මේ සියල්ල පිළිබඳව මහජනතාව ප්‍රබුද්ධ අයුරින් දැනුවත් කිරීම සඳහා සෑම අවස්ථාවකදීම 'සිළුමිණ' පුවත්පත කටයුතු කළේ ය. උදාහරණයක් ලෙස සිංහල නාට්‍ය කලාවේ සිදුවූ පරිවර්තනයන්ට අදළව සිළුමිණ විසින් පළ කරන ලද ප්‍රවෘත්ති, විචාර සහ හැඳින්වීම්. එම නාට්‍ය රචකයන්ගේ නාට්‍ය අධ්‍යක්ෂවරුන්ගේ පැසසුමට ලක් විය. ප්‍රබුද්ධ ප්‍රේක්ෂක පිරිසක් බිහි කිරීමට හේතු විය. මෙම තත්ත්වය අධ්‍යාපන, සෞඛ්‍ය වැනි ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ද ක්‍රියාත්මක වූ බව මාගේ අදහසයි.

අන්තර්ජාලය, සමාජ මාධ්‍ය සහ නවීන තාක්ෂණය වර්තමානයේ මුද්‍රිත මාධ්‍ය කෙරෙහි විශාල බලපෑමක් ඇති කර තිබෙන බව පෙනේ. මෙය ශ්‍රී ලංකාව තුළ පමණක් නොව අනෙක් රටවල ද සිදුව ඇත. නව සහස්‍රයේදී ජනමාධ්‍ය කලාවේ සෑම ක්ෂේත්‍රයකටම මෙම බලපෑම එල්ල වී තිබේ. එසේ වුව ද සිතමාව වැනි මාධ්‍යයන් කෙරෙහි ඇති වූ බලපෑම හා සංසන්දනය කරන විට මුද්‍රිත මාධ්‍ය කෙරෙහි ඇති වූ බලපෑම එතරම් දරුණු නොවේ. එයට හේතුව මුද්‍රිත මාධ්‍යයේ පුවත්පත කිසිදු වෙනසක් නොකර ඒ ආකාරයෙන් ම නව තාක්ෂණය ඔස්සේ ද පාඨකයා වෙත ගෙන යාමට හැකිවීමයි. මුද්‍රිත මාධ්‍යයට තාක්ෂණික වෙනස්කම් සමඟ ගැළපීම් කිරීමට හැකි වුවත් ගැටලුව වන්නේ සමාජ මාධ්‍ය මඟින් ඒ කෙරෙහි ඇති කළ බලපෑමයි.

සමාජ මාධ්‍ය ප්‍රවෘත්ති ගෙන යෑම සම්බන්ධයෙන් ද යම් සිදුවීමක් විවිධ පැතිකඩ ඔස්සේ විග්‍රහ කිරීම සම්බන්ධයෙන් ද පාඨකයාට සජීවීව ඒවා සමඟ සම්බන්ධවීමට හැකියාව ලැබී තිබීමෙන් ද අනෙක් මාධ්‍යවලට සාපේක්ෂව ඉදිරියට ගමන් කර තිබේ. පුවත්පතක සාම්ප්‍රදායිකව පවතින විනය, වෘත්තීය වගකීම, නීතිමය බාධා ස්වයංවාරණය වැනි දේවලින් මිදී කටයුතු කිරීමට සමාජ මාධ්‍යයට ඉඩ ලැබී ඇත. එහි ප්‍රතිඵලය වන්නේ චිකිලීක්ස් වැනි ලොවට නව තොරතුරු හෙළි කළ සමාජ මාධ්‍යයන් බිහිවන අතරම විශ්වසනීයත්වයෙන් තොර ඕපාදූපවලට බර වූ අපහාස හා අපවාදවලට යොදු ගත හැකි මාධ්‍යයන් බවට පත්ව තිබීමයි. එබැවින් ශික්ෂණයක් විනයක් සහ තිරවදෘතාවක් සහිත ප්‍රවෘත්ති කලාවක් සමාජ මාධ්‍ය තුළින් බිහි වන තුරු සාම්ප්‍රදායික මාධ්‍ය කලාව අඛණ්ඩව පවතිනු ඇතැයි සිතිය හැකි ය.

මේ වනවිට ශ්‍රී ලංකාවේ සති අන්ත පුවත්පත් දැඩි අභියෝගයකට මුහුණ දී සිටියි. ඊට හේතුව දැඩි තරගකාරිත්වයක් ඇතිවී තිබීමත් ප්‍රේක්ෂකයාගේ සති අන්ත පුවත්පතක් පිළිබඳ බලාපොරොත්තු සහ අපේක්ෂාවන් වෙනස් වී තිබීමත් ය. පාඨකයාට පුවත්පත් කියවීම සඳහා ලැබෙන කාලය ක්‍රමයෙන් කෙටිවෙමින් පවතින අතර පුවත්පත් විසින් එම කෙටි කාලය තුළ පාඨකයාට ලබාදිය හැකි රසවින්දනය වඩාත් කෙටිමගකින් ලබාදිය හැකි ආකාරය පිළිබඳවද අවධානය යොමුකර තිබේ.

එබැවින් පෙර පැවැති ආකාරයට ශාස්ත්‍රීය ලිපි සහ ශාස්ත්‍රීය සංවාද ආදිය සඳහා වැඩි ඉඩක් වෙන්කිරීම තුළින් පාඨක ප්‍රසාදය දිනාගත හැකි යැයි අපේක්ෂා කළ නොහැකි ය. එනිසා ම බොහෝ පුවත්පත් සංවේදී හෝ කුතුහලය දනවන විශේෂාංග තුළින් තරගයට මුහුණදීමට ඉදිරිපත් වී සිටියි. මෙම තත්ත්වය වෙනස් කර පාඨකයා දැනුම්වත් කරමින් පාඨකයාට නිවැරැදි පුවත් ලබාදෙන අතරම ඔහුගේ දැනුම පුළුල් කෙරෙන ඉහළ රසවින්දනයක් ලබාදෙන ආකාරයේ මාධ්‍ය කලාවක් බිහි කරගැනීම අවශ්‍ය වේ.

● මහාචාර්ය **සුනන්ද මද්දුම බණ්ඩාර**

නිද්‍රාශීලී සමාජය අවදි කළ සිළුමිණ මතවාද - සංවාද

සිළුමිණ සම කර්තෘවරයෙක් වශයෙන් සිටි අභාවප්‍රාප්තවූ ආචාර්ය රංජිත් එල්. අබේවික්‍රමයන් අවසන්වරට සිළුමිණට ලියූ ලිපිය.

ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ ජන මනස සැනසූ, උත්ප්‍රේරණීය තලයකට ගෙන ගිය 'සිළුමිණ' පුවත්පත සමාජයේ මහත් පෙරැළියක් සිදු කළ මාධ්‍ය භූමිකාවකි.

1930 මාර්තු 30 වැනිද එළිදක්වූ සිළුමිණට වසර 91කි. පත්‍ර කලාවේ ප්‍රවිණත්වයට පිවිසි සිළුමිණ මඟින් ජන මනස - හදවත ප්‍රසාර්ථ තලයකට ගෙන ගිය මහා පුවත්පතකි.

එද කතුවැකි ලියූ මාර්ටින් වික්‍රමසිංහ, මිනිසා ගේ මනස අවදි කරන්නට මහත් උත්සාහයක් ගත් බව එම කතු වැකි පරිශීලනයෙන් ප්‍රකට වන්නේය.

සිළුමිණ 'ශාස්ත්‍රීය අතිරේකය' ජන හදවත - මනස අවදි කළ තෝතැන්නකි. සමාජයේ දුර්මතයට තුඩුදුන්, යම් යම් විෂය මඟින් මතවාද සංවාද ජනිත කිරීමෙන් නිදුශීලි සමාජය අවදි කරන්නට ප්‍රබල කඩඉමක් විය.

මතවාද නැත්තම් එම පුවත් පතෙත් පලක් නොමැත. යම් යම් ගැටලු නිරාකරණය කරන්නට ගිහි - පැවිදි උගතුන් එම මතවාදවලට සම්බන්ධ වීමෙන් ජන සමාජය අතිශය ප්‍රබෝධයට පත්විය. 'සම්මත සිංහල මතවාද' - 'පස් පැණි මතවාද සංවාද' - සිංහල හෝඩියේ අක්ෂර සංවාදය - පූර්විකාව - විමසුම් - විකල්ප අදහස් - ග්‍රැමෆෝන් හි මතවාද හේතුවන් සිළුමිණ පුවත්පත තවදුරටත් ඉහළට ගියේය.

සිළුමිණ 50 වැනි පත්‍රය

සිදතෙන් ඇ - ඈ ඉවත්වීම

'සිදතෙන් ඇ - ඇ ඉවත්වීම' පිළිබඳ ප්‍රබල මතවාදයකට යොමු විය. සිදත පදයට කළ වියරණ සංග්‍රහයක් මැයෙන් කොළඹ විශ්ව විද්‍යාලයේ සන්ධ්‍යා කහඳගමගේ පැවසුවාය. එයට සමගාමීව අඹුවන්ගල විදුහලේ පී.එම්.කේ. පතිරත්න පැවසුවේ ගුරුකුල මතවලට වහල් වීමෙන් සිදුවූවක් බවයි. පත් ඉරුවෙන් අක්ෂර මැකී ගිහින් යනුවෙන් රත්වල ඉන්ද්‍ර ජයරත්න පැවැසූ අතර පාලි - සකු බලපෑවාද? යනුවෙන් ත / ඤනිස්සර මහා විද්‍යාලයේ ශාස්ත්‍රවේදී එස්. ශ්‍රියා දයාරත්න පැවසුවාය. දිගු කාලයක් මේ මතවාදය සම්බන්ධයෙන් විමසුමට බඳුන්වී සමාජයේ පැවැති දුර්මත දුරලීමට ප්‍රබල තැන්තක් විය.

*සමනල සංවාදය

'සමනල සංවාදය තවත් ප්‍රබල කඩ ඉමකි. සමනොල සමනල වූයේ ස්වර පූර්ව රූපයෙනි' යනුවෙන් පැවැසුවේ 'සම සුලං සමනල විණි අදහසට එරෙහිවය.

නිසැඳැස් මතවාද සංවාදය ප්‍රබල තැන්තකට පිවිසියේ ය. 'නිසඳැස් ද විරිතෙන් පරිපූර්ණය' යන මැයෙන් කැටවල බුද්ධසිරි හිමියන් ලියුවේ වික්ටර් පී. ලියනගේට පිළිතුරු වශයෙනි. මේ සම්බන්ධයෙන් ද දිගුවට මත පළවිය.

සම්මත සිංහල මතවාද යටතේ රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති ලෙවන්ගම සරණංකර නාහිමියන් පැවැසුවේ වැඩි වැටුප් පතා කරන සටන් බසේ ප්‍රගතියට නැත්තෙ ඇයිද? යන්නයි.

සමූපකාරය - සමූපකාරය

ස (මූ) පකාරය - ස (මූ) ප

කාරය - ස(මූ)පාකාරය

ස(ම)පකාරය යන මැයෙන් ද සංවාදයකට පිවිසිණි.

'හඳුන්වා දෙන සම්මතය අතාර්තිකයි' යන මැයෙන් ද මතවාදයක් පැවැතිණි. තවද 'සැමියා බරුවා නම් අඹුව බිරිය නොවේද? යන මැයෙන් ද මතවාදයකි.

'සිද්ධාන්ත පැහැවීම අදීනත්වයට බාධාවක්' යන මැයෙන් සම්මත සිංහල මතවාද සංවාද යටතේ තවදුරටත් රැගෙන ගියේය.

'චක්‍රලේඛය අව්‍යක්තයි, වැරැදි වදන් සෙවීමට උත්සුකවීම පැසැසුමට ලක්වන්නක්, 'බිරිඳ යන්තෙහි බුහු බසත් 'නැත' ය න්නද මතභේදයට තුඩු දුන් තවත් මතයකි.

ස(බ)රගමුවද? ස(ප)රගමුවද? යන්න ගැනත්, අධ්‍යක්ෂ ද අධ්‍යක්ෂ (ක) යන්න පිළිබඳවද මතවාදයක් පැවැතුණි.

ස(මූ)පකාරය, ස(මූ)පකාරය යන්න දෙකම නිවැරැදියයි යන මතයක් ද විය. සකු උපසර්ග යොදු ගැනීමෙන් අදහස ලබාගන්න බැහැ යයිද උච්චාරණ පහසුවට භාවිතවූවක් යනුවෙන් ද මතයයි. තවදුරටත් ස(මූපකාරය ගීතයේ ඵලයක්ද යනුවෙන් තවත් මතයකි.

භාෂා සංගායනාවකට කාලය ඇවිත් යනුවෙන් ද මතවාදයකි.

අඹුව බිරිය නම් සැමියා බෙරියාය යනුවෙන් තවත් මතයකි.

සම්ප්‍රදායකට වැහැරීම ශිෂ්ටයන්ගේ ගතියයි යනුවෙන් තවත් සම්මත සිංහල මතයකි. භාෂාවේ විනය වියරණයයිද අර්ථාවබෝධයට න - ණ - ල - ළ භාවිතය අනුබලයක් යනුවෙන් ද තවත් මතවාදයකි.

*ඇ කාරයත් එක්වීම

භාෂාව සම්බන්ධයෙන් නිතරම මතවාදයට බඳුන්විය. එහි ඵලයක් වශයෙන් 'හෙළ බස ලැදි වියතුන් එක්වී සුදුස වැඩ පිළිවෙළක් යොදමු යන මැයෙන්ද, රීතියත් - රිද්මයත් වරද්දගනු එපා යනුවෙන් ද වැරැදි වදන් එක් රැස් කළොත් විහාල ග්‍රන්ථයක් ලිවිය හැකියයි ද මතයකි.

සිංහලයට 'ඇ' කාරයත් අවශ්‍ය නැතැයිද මතයකි. බස අසම්මත නම් සංවරයක් ඇතිවේද? යන්න තවත් මතවාදයකි. සම්මතය රැකිය යුතුද? නැද්ද? යන්න තවදුරටත් මතවාදයට බඳුන් විය.

'ඉංගිරිසි නීති - රීති දේවත්වයෙන් සැලකීම' යනු තවත් මතවාදයකි.

සම්මත සිංහලයත් ඕතෑ ද? එපාද? යනුවෙන් ශාස්ත්‍රපති පණ්ඩිත අරම ශ්‍රී ධම්මතිලක නාහිමියන්ගේ මතය බොහෝදුරට ගියේය.

පස් පැණි මතවාද සංවාදය බොහෝදුරට ගිය මතයකි. මෝරුවලට 'තක්‍ර' යනුවෙන් ගැමි වහරේ නිසි තැනක යෙදී නෑ යනු මතයකි. පස් පැණි දහම් ගැටයක්ද? යන්න තවත් මතයකි. පස් පැණිත් මෝරුත් අතර ඇති සම්බන්ධය කුමක්ද? යන්න තවත් මතයකි. තක වන්නාසේ ක්‍රියා පදයත්, පස් පැණි මෝරු හි වැටුණා සේ යන අර්ථයයි, තක - හුගක් යන අර්ථයයි, පාලියෙන් 'තත්ත' 'තත' වී ඇත.

පස් පැණි සංවාදය

පුස්කොළ පිටපත් කිරීමේදි අර්ථය විකෘති වෙලා 'තක' යනු තර්කය යන අරුතයි. පත්පැණිත් තකවත්නාසේ නිවැරදි යෙදුමයි. 'පස් පැණිත්' යනු භෝජන සංග්‍රහයත්,

'තක' යනු මෝරුයි: අරුත් කී සැටි වැරැදියි යනුවෙන් චන්ද්‍රජි ගුණතිලක අදහස් දක්වන අතර මහාචාර්ය බත්දුසේන ගුණසේකරගේ අදහස වන්නේ 'අපේ වියතුනට - උගතුනට 'තක' වදන හමු නොවීම පුදුමයක් යන්නයි, තවද මිහිරි තැවිල්ල පස් පැණි වූවාද? යන්න තවත් මතයකි. 'සිදත් සඟරාව' ගුරුකොට ගනිමු යයිද තවත් අදහසකි.

පස් පැණිද - පස් රසයද - පස් පණතද - පස් පැණිතද - පත් පැණිතද? යනුවෙන් තවදුරටත් මතය දිගට ඇදී ගියේ ය.

තක වතවා - තප්පවතවා දෙමළ බසේ බලපෑමක් ද යනුවෙන් සඳහන් කරන අතර පස් පැණිත්තක් තම්න්නාසේ යනුවෙන් ශුද්ධ කරගත යුතුයි යන්න තවත් මතයකි.

පස් පැණි තක (එ) වන්නාසේ: ගැටලුව විසඳුණේ ද යනුවෙන් මහාචාර්ය සුචරිත ගම්ලත් අසයි. පස් පැණිවලට උපමා කෙළේ පස් ප්‍රීතිය යනුවෙන් තවත් මතයකි. 'පස් පැණිත තවන්නාසේ' නිවැරැදි යෙදුම යනුවෙන් ද තවත් මතයකි.

සිළුමිණ ශාස්ත්‍රීය අතිරේකයේ පස් පැණි ගැටලුව ඉතා දුරදිග ගිය මතවාදයකි. චන්ද්‍රජි ගුණතිලක හිතුවක්කාර ලෙස හෙළ බස විහිළුවට ලක්කරන්න එපායයි විශ්වවිද්‍යාල මහාචාර්යවරුන්ට පවසන්නිය.

ගැමි වහර ගුරු වහර පස් පැණිද? පත් පැණිද? යනුවෙන් තවදුරටත් මතය ඉදිරියට යයි.

විවිධාර්ථවලින් මංමුළාවට යනුවෙන්ද, පස්පැණි තකටත් නාසේ යනුවෙන්ද, ප්‍රණීතයට හෙළ වදන 'පිණි' යයිද මතයකි.

ඇහැලේපොළ අදිකාරම් අස්සන අන්තිම කැමැති පත්‍රයට යන මැයෙන් තවත් මතවාදයකි.

ඇහැලේපොළ ගිවිසුම

ඇහැලේපොළ අදිකාරම් උඩරට ගිවිසුමට අස්සන්කර නෑ මතවාදයේ තවත් මතයකි.

ශ්‍රී රහල් මාහිමි වැඩ සිටියේ අම්බනද? නොටගමුවේද? යනුවෙන් පළවූ තවත් මතවාදයකි.

විෂ්ණු - උපුල්වත්

විෂ්ණු - උපුල්වත් දෙදෙනෙක් යනුවෙන් තවත් මතයකි.

ග්‍රැමොෆෝන් ගී මතවාද තවත් සංවාදයකි. මේ සංවාදයේදී මුල් රසය නොබිඳ ගායනා කළ හැකිද? යනුවෙන් පවසන අතර වෙනත් හඬකින් ඇසෙන විට නීරසයක් හා දුකක් දැනේ පවසන අතර ඉලෙක්ට්‍රෝනික සංගීතයෙන් සංකර කරන්න එපා යනුවෙන් තවදුරටත් විමර්ශනයකි. අලුතෙන් ගැයේ නම් අර්ථ රසයට කුමක්වේද යන්න තවත් අදහසකි.

සරල ගී කාරයන් විකෘති කළ විට ජාතියට ඉතිරිවන්නේ කුමක්ද? නාද මාලාවට හානි නොකර ගයන්න හැකි නම් වරදක් නෑ, පැරැණි ගී අලුතෙන් ගැයීම රැකීමේ මඟක් නොවේ යන්න තවත් මතයක්ය.

තවදුරටත් ඉදිරියට යන ග්‍රැමෆෝන් ගී මතවාදය 'නවක හඬින් කැසට් ගත කිරීමට වාණිජත්වයට නව පණක් දීමක්. රසඥතාව දනවමින් ගයන ගී ඇහැසීම ජාතික මෙහෙවරක්, සංරක්ෂණය කිරීමේ අග්‍රඵලයක්, පැරැණි ගී නොනසා රැක ගැනීම යුතුකමක්, පැරැණි දේ පැරැණි ලෙසම පැවැතිය යුතුද? මුල් නිර්මාණවලට කිසිදු හානියක් නෑ. අපේ පැරැණි ගීත කෙළෙසන්න එපා.

තවදුරටත් ඉදිරියට යන ග්‍රැමෆෝන් ගී මතවාද 'අර්ථය - තාලය නොනසා පැරැණි ගී ගැයීම වරදක් නෑ?' උනිමු වෙණ සදනියි නොදන්නෙමු ගායනා කරනියි, පැරැණි ගායක - ගායිකාවන්ට කරන මදි පුංචිකමක්.

නාග රාගය

නාග - නග - නක රාගයද? රාජ නාමයන්ද යන මැයෙන් අරම ශ්‍රී ධම්මතිලක නාහිමියන් විසින් මතවාදයකට මං පිවිසන ලදි.

කව්සිඑණ කතුවරයා ගැනද මතවාදයක් පැවැතිණි.

සිළුමිණ ශාස්ත්‍රීය අතිරේකය මඟින් මතවාද සංවාද තවදුරටත් ඉදිරියට ගෙනයන ලදි. 'සිංහල නව කතාවේ සමාජ විඥානය' ආශ්‍රයෙන් තොම්සන් ඒ. වැන්දබෝනා ගෙනා එම අදහස දුරදිග ගිහින් සමාජය පුරා මහත් ආන්දෝලනයක් ඇති කරන්නකි.

සියපත ආශ්‍රයෙන් සමාජයට අදළ කරුණු ආශ්‍රයෙන් අදහස්, ආකල්ප, සංකල්ප ගොන්නක් පහළවිය.

සාහිත්‍ය විචාර සංවාද ආශ්‍රයෙන් තර්කය විචාරයට ඇඳ ගැනීම නිර්මාණකරණයට හානි නැද්ද? යනුවෙන් විමර්ශනයට ලක්විය.

සිළුමිණ සාහිත්‍යය විෂය සම්බන්ධයෙන් පුළුල් ක්ෂේත්‍රයන් විහිදවන ලදි. සමාජයේ විවිධ පැතිකඩ දෙස පුළුල් වූ විඥානයකින් යුතුව ඒ කාර්යභාරය ඉටුකිරීමට සිළුමිණ දැවැන්ත මෙහෙවරක් සිදුකොට ඇත.

තුලනාත්මක විචාරය

තුලනාත්මක විචාරයන් ඔප් නැංවීමට ද මහත් පරිශ්‍රමයක් දරා ඇත. තුලනාත්මක විචාරයක් නැත්තනම් සම්භාව්‍ය ගණයට ගැනෙන නිර්මාණ බිහිනොවන්නේමැයි. මේ සම්බන්ධයෙන් විශ්ව විද්‍යාල පද්ධතියේ මහාචාර්යවරු ඒකාබද්ධ වී විචාර මාර්ගයකට (තුලනාත්මක) මංපෙන් විවර කළහ.

මතවාද සම්බන්ධයෙන් කිසිදු පුවත් පතක සිදු නොවූ මෙහෙවරක් සිළුමිණෙන් ප්‍රකට විය. ඒ හේතුව නිසාම සහෘදයන් සිළුමිණෙන් මතුවන මතවාදය කුමක්ද යන්න තොඉවසිල්ලෙන් බලා සිටියහ.

මිනිසාගේ හා රටේ උත්තතිය උදෙසා පුළුල්වූ ක්‍රියා පද්ධතියකට වසර 90ක් පුරා අඛණ්ඩව මෙහෙවරක් කරන ලදි. තම තමන්ගේ අදීන අදහස් පද්ධතියකට මං පෙන් විවර කළ සිළුමිණ දිගු කාල පරාසයකදී රටේ උත්තතිය උදෙසා සුවිශාල මෙහෙවරක් කළ මාධ්‍ය ඒකකයි.

බර්ලින් දහම් පවුර

මහාචාර්ය ජයදේව තිලකසිරි 'අන්තර්ඥානය අවදි කළ බර්ලින් දහම් පවුර මඟින් සහෘද මනස උත්තලයකට ගෙනයන්නට අතිශයින්ම බලපෑවේය.

සාහිත්‍ය විචාරය අවරට ගිය සමයක මහාචාර්ය කුලතිලක කුමාරසිංහ සාහිත්‍ය විචාරය උදෙසා නිශ්චිත විධි ක්‍රමයක් අවශ්‍යද? යන මැයෙන් හෙළිකළ ආකල්ප ආශ්‍රයෙන් විචාරකයන් හා නිර්මාණකරුවන් අතර මත භේද රාශියක් මතුවිය.

'නවකතාවේ තව මං හෙළිකළ දුයිෂේන්' සම්බන්ධයෙන් සිරිපාල තිලකසේන හෙළිකළ ආකල්ප - සංකල්ප ආශ්‍රයෙන් සිංහල නවකතාව නව මඟකට ප්‍රවේශවන්නට අතිශය අනුබලයක් විය.

මනමේ මතවාද

මතමේ මතවාද සංවාද යටතේ 'පුරුෂෝත්තම වාදයකට කැරැලි ගැසූ බවත් නාට්‍යයෙන් නිරූපිතවේද? යන මැයෙන් සංවාදයක් දිගු කාල පරාසයකට සම්බන්ධ විය. සහෘදයන් මතමේ නාට්‍යයට දක්වූයේ අසීමිත ආදරයකි. ළෙන්ගතුකමකි. ඒ නිසාම මෙබඳු මතවාද සිළුමිණ ආශ්‍රයෙන් ප්‍රකටවීම අනුව නාට්‍ය ක්ෂේත්‍රයට නව පණක් දෙන ලදි.

සිරිමත් සිරිතක සිරිය සිරිමාවෝ බණ්ඩාරනායක සම්බන්ධයෙන් මලල්ගොඩ බන්දුතිලක හෙළිකළ අදහස් බොහෝදෙනාගේ මතස අවදි කරන්නට සමත්විය. සිරිමාවෝ බණ්ඩාරනායක චරිතයේ අන්තර්ගත සිරිත් - විරිත් සමුදයක් මේ කෘතියෙන් අනාවරණය විය.

'ඛසට විනකරන නූතන වියරණ ඇදුරෝ' යටතේ අනඳපිය කුඩාතිහ හෙළිකළ අදහස් ආශ්‍රයෙන් භාෂාව සම්බන්ධයෙන් මතුවූ ගැටලු රාශියක් නිරාකරණය කරන්නට බලපෑවේය. භාෂාවට සම්මතයක් මිසක් සම්ප්‍රදායක් තිබිය නොහැකිය. ගුරුකුල මඟින් බසට විවිධ සම්ප්‍රදායයන් ගෙන ඒමෙන් භාෂාව හදරණ අය අතිශය දුෂ්කරතාවට පත්වූහ. මෙබඳු මතවාද ආශ්‍රයෙන් සමාජය නිවැරැදි ගමන් මඟකට යොමු කරන්නට සමත් විය.

මහාචාර්ය ඒ. බී. පී. කලන්සූරිය හෙළි කළ ආකල්ප ශාස්ත්‍රීය අතිරේකය තවදුරටත් ඉදිරියට ගෙන ගියේය. මහාචාර්ය කේ. එන්. ජයතිලක හා බුදුසමයානුගත දර්ශනික විග්‍රහය ආශ්‍රයෙන් සමාජය නව මඟකට යොමු කරන්නට ප්‍රබල කේන්ද්‍රීය තැන්තක් විය.

වාග් විද්‍යාව

'වාග් විද්‍යුව මානව චර්යාවේ අංගයක්ද? යන මැයෙන් දිමුතු ලක්මිණි කුමාරගම හෙළිකළ ආකල්ප වාග් විද්‍යුව සම්බන්ධයෙන් උගත හැකි දේ රැසකි. මෙබඳු මං පෙන් විවර කරන්නට සිළුමිණ ශාස්ත්‍රීය අතිරේකය ගෙතහැර පෑ මෙහෙවර අති විශිෂ්ටය.

පරණවිතාන නොකියවූ සීගිරි ගී

පරණවිතාන නොකියවූ සීගිරි කුරුටු ගී බෙනිල් ප්‍රියංක එම්මානුවෙල් හෙළිකළ නව මං පෙත ආශ්‍රයෙන් බොහෝ දෙනාගේ හදවත් තව තවත් රමණීයත්වයට යොමුවන්නට ප්‍රබල කඩඉමක් විය.

මේ නව සංකල්ප - ආකල්ප ආශ්‍රයෙන් සිළුමිණ පුවත් පත හෙළිකළ මතවාද හේතුවෙන් සමාජය නව මඟකට පිවිසුණි. නිදුශීලි සමාජය අවදි කරන්නට මේ විශේෂාංග ගෙතගිය මහඟු මෙහෙවර අදත් පාඨකයන් සමඟය. එය කාලත්‍රයකට බලපාන දර්ශනික භූමිකාවකි.

● ආචාර්ය **රංජිත් ඇල්. අබේවික්‍රම**

බුදු දහමේ ප්‍රවර්ධනයට සිළුමිණ දුන් අත හිත

සිළුමිණ 91 1930-2021 සපුරයි

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ශ්‍රී කල්‍යාණී සාමග්‍රී ධර්ම මහා සංඝ සභාවේ අනුනායක හා ප්‍රධාන ලේඛකාධිකාරී

මහාචාර්ය අග්ගමහා පණ්ඩිත

කොටපිටියේ රාහුල නා හිමි

ශ්‍රී ලාංකීය ජනමාධ්‍ය කලාවේ නව පිටුවක් පෙරළා ආගමික ශාස්ත්‍රීය ලිපිවලින් සාරගර්භ පුවත්පතක් ලෙස ජනතාව අතර පැමිණියේ සිළුමිණ පුවත්පතයි. 1930 වසරේ මාර්තු මස 30 වැනිදා ඉරිදා ආරම්භ කළ මේ පුවත්පත එදා මෙදා තුර දශක නමයක කාලය තුළ මෙරට ආගමික ශාස්ත්‍රීය සමාජ වශයෙන් කළ සේවාව සුළු පටු නොවේ. සිංහල බෞද්ධයා ලංකා ලෝකය වැනි පුවත්පත් කලින් කලට බිහිවුණද ස්ථිර පදනමක් මත ජනතාවගේ ආදරය හා ගෞරවය දිනාගෙන ආගම දමහට ලැදි පුවත්පතක් ලෙස සිළුමිණට දශක නමයක කාලයක් එන්නට හැකි වූයේ පුවත්පතේ සාරගර්භ ලිපි මෙන්ම එම ලිපි හැම විටම ජනතාවට ජීවන මාර්ගයක් ලෙසින් සපයා දුන් නිසාය.

ආරම්භක සිළුමිණ පුවත්පතේ සිරස්තලය පවා පළ වූයේ බෞද්ධ රටවල් දෙකක් අතර යුද්ධයක් යන සිරස්තලයෙන් වන අතර එයින් කියවුණේ බෞද්ධයන් වශයෙන් එක්ව සමගියෙන් කටයුතු කළ යුතු බවකි. එද ආරම්භ වුණු මේ ආගමික පුනරුදය පුවත්පතේ අද දක්වාම පවත්වා ගැනීම මාධ්‍ය කලාවේ ලෙහෙසියෙන් කළ හැක්කක් නොවේ.

ලේක්හවුස් ආයතනයේ ආරම්භක සතිපතා පුවත්පත ලෙසින් එළිය දුටු සිළුමිණ පුවත්පතට නම තැබීමට කටයුතු කළ ධම්මාරාම හිමියන් ද බෞද්ධ දර්ශනය අනුව එම නම් තැබීම සිදු කර තිබේ. 'චූඩා මාණික්‍යය' යන අර්ථයෙන් එය යුක්තය. චෛත්‍යයක චූඩා මාණික්‍යයෙන් නිවන පසක් කරන අතර එම බෞද්ධාගමේ මාර්ගයේම ගමන් කරමින් සිළුමිණ පාඨකයාට උපරිම වශයෙන් ධර්ම මාර්ගය ලබා දෙන ලදී.

ආරම්භක යුගයේ සිට දශක මීට දශක කිහිපයක් යනතුරුම සිළුමිණේ ප්‍රධාන ලිපි සම්පාදකයන් වූයේද භික්ෂූන් වහන්සේය. ඒ අතර ලබුගම ලංකානන්ද මහ නාහිමියෝ ලිපි පෙළක් පළ කළහ. එමෙන්ම අකුරැටියේ අමරවංශ හිමියෝද ලිපි පෙළක් පුවත්පතේ පළ කළහ. එසේම කෝදගොඩ ඥානාලෝක නා හිමියන්ගේ මෙන්ම රද්දලේ පඤ්ඤාලෝක නා හිමියන්ගේද ලිපි රැසක් සිළුමිණ පුවත්පතේ පළවීමෙන් බෞද්ධ පුනරුදයක් ඇති කරන්නට සමත් විය.

එසේම බලන්ගොඩ ආනන්ද මෛත්‍රී මහ නාහිමියන්ගේද ලිපි රැසක්ම සිළුමිණ පුවත්පතේ පළ වූ අතර එම ලිපි කොටස් වශයෙන් පවා එකතු කර සාරගර්භ ලිපි සංග්‍රහයක් ලෙසින් තබා ගන්නට පවා ඇතැමෙක් කටයුතු කළහ.

එම නා හිමිවරුන්ගේ සාරගර්භ ලිපි අනුව යමින් සෙසු ලේඛකයෝද ගුණාත්මක බවින් මෙන්ම ආගමට දහමට අනුව ලිපි සම්පාදනය කිරීම නිසා පංචශීල ප්‍රතිපදව අනුගමනය කරනු ලබන ජනතාවක් උදෙසා ලිපි සම්පාදනය කළහ. විද්‍යාව, පරිසරය, කෘෂිකර්මය මේ ඕනෑම ක්ෂේත්‍රයක ලිපි වේවා ඒ සියල්ල දහමට අනුගතව සම්පාදනය වුණු පුවත්පතක් ලෙස සිළුමිණ පුවත්පත හඳුන්වා දිය හැකිය.

ශත දහයේ විශ්වවිද්‍යාලය පමණක් නොව බුදු දහමේ උත්තතියට දායකත්වයක් ලබා දුන් දහම් හඬක් ලෙස සිළුමිණ හඳුන්වා දිය හැක්කේ එහෙයිනි.

එසේම ආරම්භයේ සිටම ගුණාත්මක බවින් මෙන්ම පිළිවෙළකට පුවත්පත සම්පාදනය කළ බවද මෙහිදී පැවසිය යුතුය. පුවත්පතේ කිසිදු විටක අන්තවාදී අදහස් හෝ ආගමික අන්තවාදී අදහස් හෝ පළ කෙළේ නැත. එමෙන්ම බුදු දහමට පටහැනි කිසිදු කරුණක් මුල් කරගෙන කටයුතු කෙළේද නැත.

විශේෂයෙන්ම එකල ලිපි සම්පාදනය කළ ලේඛකයන්ගේ අදහස් අනුව පුවත්පත එලෙසින් සාර ධර්ම සංග්‍රහයක් ලෙසින් පවත්වා ගන්නට හැකියාව තිබුණු බව පැහැදිලිය.

ආගම් විරෝධී හෝ ජාති විරෝධී හෝ කරුණු ඉස්මතු කරන්නක කිසිදු විටක පුවත්පත කටයුතු කෙළේ නැත. හැමවිටම වගකීමක් ඇති පුවත්පතක් ලෙසින් කටයුතු කරන ලදී.

එසේම ජාතික පුවත්පතක ප්‍රථමයෙන් බෞද්ධ පිටුවක් ආරම්භ කරමින් බුදු දහමට වෙනමම විශේෂත්වයක් ලබා දුන්නේද සිළුමිණ පුවත්පත මහිනි. ඊට අමතරව බෞද්ධ අතිරේක ප්‍රථමයෙන් නිකුත් කිරීම ආරම්භ කිරීමට සිළුමිණ පුවත්පතෙන් ඇරැඹීමෙන්ම පුවත්පත බුදු දහමේ උත්තතියට ලබා දුන් සේවාව පැහැදිලිය.

ඇසළ පෙරහර, නවම් පෙරහර, කැලණි පෙරහර, අනුරාධපුර අලුත් සහල් මංගල්‍යය වැනි විශේෂිත ආගමික කටයුතු උදෙසා මෙන්ම ඉන්දියාවෙන් සර්වඥ ධාතු මෙරට වන්දනාව පිණිස ගෙන්වන ලද අවස්ථාවලදී පවා එවැනි විශේෂ අතිරේක පළ කිරීමෙන් බුදු දහමට පුවත්පත ලබා දුන් අනුග්‍රහය අතිමහත්ය.

අද මෙන් පහසුවෙන් කිසිදු තොරතුරක් සොයා ගැනීම අතීතයේ කළ නොහැකි වූ අතර එවැනි කාල වකවානුවකදී පොහොය දින විස්තර මෙන්ම සිද්ධස්ථාන විස්තර පළ කරමින් එවකට සිළුමිණ සිදු කෙළේ අනුපමේය මෙහෙයකි.

එසේම පුන් පොහෝ දිනවල දැන්වීම් පළ කිරීමේදී පවා විශේෂ සැලකිල්ලක් දක්වන ලද අතර පොහෝ දිනට නොගැලපෙන කිසිදු දැන්වීමක් පවා පළ නොකරන ලදී.

එසේම මෙරට ජ්‍යෙෂ්ඨ ස්වාමීන් වහන්සේ නමක් අපවත් වුණු අවස්ථාවකදී හෝ ගුණ සැමරුමකදී සෑම විටම පෙරමුණ ගත් පුවත්පතක් ලෙසද සිළුමිණ හැඳින්විය හැකිය.

ස්වාමීන් වහන්සේ නමක් සිටින පුවතක් හෝ විශේෂාංගයක් පළ කිරීමේදී එය අනිවාර්යෙන්ම පිටුවේ ඉහළින් පළ කිරීමේ සම්ප්‍රදායය අනිවාර්යෙන්ම අනුගමනය කළ පුවත්පතක් ලෙසද සිළුමිණ හඳුන්වා දිය හැකි අතර එය සිළුමිණ පුවත්පතේ අද දක්වාම රැකගෙන එන සම්ප්‍රදායකි. සෑම විටම පංචශීල ප්‍රතිපදව රැකෙන අයුරින් ලිපි පළ කිරීම සිළුමිණ පුවත්පතේ සම්ප්‍රදය වූ අතර භාෂාව හැසිරවීමේදී එය උසස් සාහිත්‍ය රසය රැකෙන පරිදි මෙන්ම බෞද්ධාගමික සම්ප්‍රදායයන් රැකෙන ලෙසින් හැසිරවීමද අගය කළ යුතුමය.

අතීතයේ සිට විහාරස්ථානයක පුවත්පතක් ගත්තා නම් ඒ සිළුමිණ පුවත්පතය. සිරස්තල යෙදීමේදී පවා බුදු දහමට අනුගත වන ලෙසින් සිරස්තල යෙදීමද සිළුමිණ සිදු කළ තවත් මෙහෙයක් ලෙසින් පෙන්වා දිය හැකිය.

අවශ්‍ය අවස්ථාවලදී බුදු දහම රැකගත යුතු බවට දැක්වෙන ප්‍රධාන සිරස්තල යෙදීමටද සිළුමිණ කටයුතු කරන ලදී. 1965 වසරේ ජනවාරි සහ මාර්තු මාසයේ සිළුමිණ පුවත්පත් දෙකක ප්‍රධාන සිරස්තල ලෙස දැක්වුණේ ' මේ මැතිවරණෙදි බෞද්ධයන් වංදය දිය යුතු හැටි' යන්න හා 'ත්‍රිවිධ රත්නයට ඔබේ ඡන්දය පූජා කරන්න' යනුවෙන් සිරස්තල යොද තිබුණි. මැතිවරණයක් අභියස සිරස්තල වුවද දේශපාලන මතය කුමක් වුවත් බුදු දහම රැක ගැනීමට අතිවාර්යය බව සිළුමිණ මහින් පසක් කර තිබේ.

සිරස්තල පමණක් නොව කතුවැකි මහින් පවා අනාවරණය කෙළේ ජනතාව සෑම විටම කටයුතු කළ යුත්තේ දහමට එකඟ වන ලෙසින් බවයි.

1931 වසරේ පුවත්පත් කතුවැකියක ශ්‍රී ලාංකිකයාගේ හැසිරෙන ආකාරය දක්වා එයින් ඔහු වෙනස් විය යුතු බව දක්වා තිබුණේ මෙසේය.

' ඉන්දියාවෙන් එංගලන්තයට යන තරුණයා උගතකු වී එම රටට පැමිණ රට ජාතිය ආගම වෙනුවෙන් දිවි පුදයි. නමුත් ලාංකිකයා තම නම, ජාතිය, හැර අන් සියල්ලෙන්ම ඉංග්‍රීසිකාරයකු වී සිය රටට පෙරලා අවුත් නිලතල දරන්නේය. ඔහුට සිංහල ජාතිය සම්බන්ධ වූ සියල්ල පමණක් නොව සමහර විට මාතෘ පිතෘන් පවා පිළිකුල් වේ. ප්‍රසිද්ධ සභාවකදී යුරෝපාකාරයකුට මෙන් භාෂා පරිවර්තකයෙකුත් අවශ්‍ය වන්නේ ය. සිය නිවසේදී පවා ඔහු සිය බසින් කතා කරතොත් ඒ මෙහෙකරුවන් සමඟ පමණකි. මේ ගතිගුණ එංගලන්තයට යන තරුණයන් පමණක් නොව මෙරට ඉංග්‍රීසි විද්‍යාලවල ඉගැනීම ලබන තරුණයන් අතරද බොහෝ සෙයින් දක්නට ලැබෙත්. ...සමහර මවුපියෝ දරුවන් සිංහල සිරිත්විරිත්වලට පයින් ගසා ඉංග්‍රීසි සිරිත්ම අනුගමනය කරනු දැක්ම අගයක් නම්බුවක් හැටියට සලකත්. '

ආගමට දහමට අනුව ශ්‍රී ලාංකිකයන් කටයුතු කළ යුතු අන්දම පුවත්පත්වලින් මෙසේ පළ කෙළේ වරක් දෙවරක් නොවේ. අප පෙර සඳහන් කළ පරිදි මෙරට පුවත්පත් ආරම්භක වකවානුවේදී විශේෂයෙන්ම 1930 වකවානුවේ ඇතැම් පුවත්පත් ආගමික වශයෙන්ස බෙදී ආත්මාර්ථකාමී අයුරින් කටයුතු කළ බව ආචාර්ය ධනපාල බාලගේ විසින් රචනා කළ සිංහල පුවත්පත් හා ශ්‍රී ලාංකිකයන්ගේ සමාජ දේශපාලන චින්තනය කෘතියෙන් දක්වා ඇත්තේ 'බොහෝ පුවත්පත් ආගමික වශයෙන්ද බෙදී ආත්මාර්ථකාමී අයුරින් ක්‍රියා කළ බවයි. '.....වැනි පුවත්පත් සිංහල බෞද්ධයින්ට එරෙහිව විවිධ ව්‍යාපාර ගෙන ගොස් ඇත. අන්‍යාගමිකයන්ගේ ක්‍රියා නිශ්ඵල ක්‍රියා හැටියට පෙන්වමින් , ඒ ඒ ආගම් තුළ පවතින නිකායන් අතරද ආගම් සම්බන්ධ කොට ගත් කණ්ඩායම් අතරද පමණක් නොව ජාතීන් අතරද අසමගිය ඇති කරනු පිණිස ක්‍රියා කිරීම ඊට නිදසුනකි. ආගම්වලට ආවේණික සාම්ප්‍රදයික සිරිත් විරිත් හා පූජා විධීන් හෙළා දැකීම ..... සිරිතක් විය.'

එහෙත් සිළුමිණ පුවත්පත ඒ කිසිදු ලෙසකින් ආගම් පිළිබඳ අන්තවාදී අදහස් හෝ අනෙක් ආගම් හෙළා දැක්වීමක් සිදු කර නොමැති නිසා පුවත්පතේ සමබරතාවය මෙන්ම ගුණාත්මකභාවයද රැක ගන්නට සමත්ව ඇත. වසර 91ක දීර්ඝ කාලයක් නොපිරිහුණු ජාතික පුවත්පතක් ලෙසින් පවත්වා ගෙන යාමට සිළුමිණට හැකිව ඇත්තේ සිළුමිණේ පවතින ආගමික සහජීවනය හා ගුණාත්මක හා සාරධර්ම අගයන ප්‍රතිපත්තිය නිසාය.

● සාකච්ඡා කළේ - **තාරක වික්‍රමසේකර**

සිළුමිණ නව මගක ප්‍රවේශය

හිරු මෝදු වෙමින් පැවැතිණි. මම හාත්පස සිසාරා බැලුවෙමි. කාර්යාලයේ බිත්තියේ එල්ලා ඇති රූප රාමු රැසකි. ඒ පියසේන නිශ්ශංක සහ මාර්ටින් වික්‍රමසිංහයන් ඇතුළු සිළුමිණ කතුවරුන් විසි දෙදෙනාය.

හාත්පස සිසාරා ජනේලයෙන් පිටතටද දැස් යොමු කළෙමි. ඇහැළ ගස් කහ මලෙන් පැහැබරය. ලයිට් කණුවක උඩ සිටි පැස්තුඩුවෙකු බේරෙ වැව දෙසට ඉගිළී ගියේය. රිගල් සිනමාහලෙන් දිවා කාලයේ 'කොළඹ' චිත්‍රපටිය නැරඹූ පිරිස් පිටතට එමින් සිටියහ.

මම අතීතය ආවර්ජනය කළෙමි. ලේක්හවුසියට ප්‍රථම වරට පා තැබුවේ 1976 සැප්තැම්බර් මසය. ඒ කොළඹ ආනන්දයේ සත්වන ශ්‍රේණියේ ඉගෙනුම ලබමින් සිටියදීය. සමස්ත ලංකා රචනා තරඟයකින් ලත් ජයග්‍රහණය වාර්තා කිරීමට දිනමිණට අවැසි විය. කතාව ලීවේ දිනමිණේ තිලකරත්න කුරුවිට බණ්ඩාරය. මේසයක් උඩ ඉන්දවා ඡායාරූපයක් ගත්තේ රෝලන්ඩ් පෙරේරාය.

ඉන් වසර 44කට පසු 2020 ජනවාරි මස සිළුමිණ කතුකම ම වෙත පැවැරිණි. දිවයින පුවත්පතේ කර්තෘ මාණ්ඩලිකයකු ලෙස 1984 ජනවාරි 15 ද සේවයට බැඳුණු මා වෘත්තීය පුවත්පත් කලාවේදියකු ලෙස මේ ගත කරන්නේ 37 වන වසරය. මාධ්‍ය ජීවිතයක ගලා බැස්ම දියඇල්ලකට සමානය. එය මිවදයක් සේ ඉමිහිරි නැත; කොහොඹ දලු සේ තිත්තද නැත. ගලා බසින්නෙ සැඩවය; වරෙක නිහඬය; තවත් වරෙක ප්‍රචණ්ඩය; එහෙත් රිද්මානුකූලය.

අද 2021 මාර්තු 26 සිකුරාදා දහවල්ය. වම්පස කවුළුවෙන් දැස් යොමු කළෙමි. සිළුමිණ කර්තෘ මණ්ඩලයම මිමැසි පොදියක් මෙනි. ලහි ලහියේ වැඩය. සිළුමිණ පුවත්පතේ සතියේ කටයුතු නිමා වන්නේ සිකුරාදාය. ඉරිදා පුවත්පතක සිකුරාදාවක් යනු මහ සිකුරාදාවකි. ඒ සඳහා දායක වන අය බොහෝය. කර්තෘ මණ්ඩලය පමණක් නොව ප්‍රාදේශීය මාධ්‍යවේදියෝ ද බාහිර ලේඛකයෝද පරිගණක අකුරු සංයෝජක සහ පිටු සැකැසුම් ශිල්පීන්ද දැන්වීම්, මුද්‍රණ සහ බෙදහැරීම් ඇතුළු ප්‍රවාහන අංශයද ඊට එක් වෙති.

කර්තෘ මණ්ඩලය පමණක් නොව ප්‍රාදේශීය මාධ්‍යවේදියෝ ද බාහිර ලේඛකයෝද පරිගණක අකුරු සංයෝජක සහ පිටු සැකැසුම් ශිල්පීන්ද දැන්වීම්, මුද්‍රණ සහ බෙදහැරීම් ඇතුළු ප්‍රවාහන අංශයද ඊට එක් වෙති. අවසානයේ අලෙවි නියෝජිතයෝ අතින් එය පාඨක ඔබ අතට පත්වෙති. අවසානයේ සිළුමිණ මේ සියල්ලන්ගේම සංකලනයකි.

අවසානයේ අලෙවි නියෝජිතයෝ අතින් එය පාඨක ඔබ අතට පත්වෙති. සිළුමිණ මේ සියල්ලන්ගේම සංකලනයකි. පොහොර පසක පැළයක් සිටුවූ විට වැඩෙන දේ වූකලී පොහොර පසෙහි වාතයෙහි, හිරු කිරණෙහි තෙතමනයේත් සංකලනයකි. එය සිළුමිණටද පොදුය.

වර්තමානයේ නිකුත් වන ප්‍රමුඛ සිංහල ඉරිදා පුවත්පත් ගණන 10 කි. සංවේදී හෝ කුතුහලය දනවන විශේෂාංග තුළින් ඔවුහු අඩුවැඩි වශයෙන් තරඟයට මුහුණ දී සිටිති. සිළුමිණ පාඨකයා දැනුවත් කරමින් නිවැරැදි පුවත් ලබාදෙන අතර ඔවුනගේ දැනුම පුළුල් කරන ඉහළ රස චිත්දනයක් ලබා දෙන ආකාරයේ මාධ්‍ය කලාවක් වෙනුවෙන් කටයුතු කරයි. මෙහිදී පියවර දස දහසක් පෙරට යන්නට කතුවරයා වශයෙන් මට සහාය දෙන පිරිස් බොහෝය. ලේක්හවුස් සභාපති ප්‍රමුඛ අධ්‍යක්ෂ මණ්ඩලයද සිළුමිණට ලබා දී ඇති නිදහස පැසසුම් කටයුතුය.

වත්මන් සිළුමිණ කර්තෘ මණ්ඩලය

සිළුමිණ කර්තෘ මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ සම කර්තෘ නිහාල් අබේසිංහ, ප්‍රවෘත්ති කර්තෘ තාරක වික්‍රමසේකර, විශේෂාංග කර්තෘ සුමුදු වතුරාණී ජයවර්ධන, නියෝජ්‍ය විශේෂාංග කර්තෘ ඉනෝකා සමරවික්‍රම, පිටු සැකැසුම් නිර්මාණ සංස්කාරක මහේෂ විදනපතිරණ ද, නියෝජ්‍ය ප්‍රවෘත්ති කර්තෘ සුභාෂිණී ජයරත්න, විද්‍ය සහ තාක්ෂණික අංශ ප්‍රධානී විරෝනි වැවලගේ, ව්‍යාපාරික කර්තෘ ඉනෝකා පෙරේරා, නියෝජ්‍ය ව්‍යාපාරික කර්තෘ චන්දිමා එදිරිමාන්න, සුහද්‍ර, දේශප්‍රිය, නිශානි බන්නැහැක, හර්ෂ ගුණවර්ධන, අමිල මලවිසූරිය, හර්ෂා සුගතදස, රසික කොටුදුරගේ, සුරේකා ඉලංගකෝන්, ටෙක්ලා පද්මිණී කාරියවසම්, ඇතුළු කර්තෘ මාණ්ඩලිකයන් ද සිළුමිණට සවියකි; දිරියකි.

සිළුමිණේ රසඳුන බර කරට ගෙන සිටින ටානියා මෝසස් ද ක්‍රීඩා අතිරේකයේ වගකීම් උසුලාගත් කසුන් ඉරුගල් බණ්ඩාර ඇතුළු එම අතිරේකයන්හි සෙසු සගයන්ද සිළුමිණට සම්පතකි.

පරිගණක අංශයේ එච්. ඒ. සමරවංශ සහ දිනුක්ෂි පෙරේරාද සෝදුපත් අංශයේ වසන්ත කුමාරද පිටු සැකැසුම් අංශයේ ප්‍රියන්ත ජයලත්, ප්‍රියන්ත බිබිලදෙනිය සහ තිලිණ පතිරණගේ සිළුමිණ හැඩවැඩ කරන්නට උර දෙන්නෝය. රෝහණ රත්නවීර, කේ. ඩී. විජයසිරි සහ එම්. රාජේන්ද්‍රන්ගෙන් සිළුමිණට ලැබෙන සහාය අගනේය.

පාඨකයන්ගේ අදහස් සහ යෝජනා පමණක් නොව විවේචන ද අප දිරිගන්වනසුලුය. දැන් උදව් ඇත්තේ අලුත් උදැසනකි. ඒ සඳහා පියවර දසදහසක් පෙරට යන්නට සිළුමිණ පාඨක ඔබ අප කෙරෙහි තබන විශ්වාසය අපට ශක්තියකි. ඒ දිරිය මත නොයෙක් නව මංපෙත් හෙට දිනයේදී නව තවත් එළිපෙහෙළි වනු ඇත.

ධර්මන් වික්‍රමරත්න
කර්තෘ- සිළුමිණ

අපල සපල

දිවයින

වෂී 2021ක් වූ මාර්තු මස 28 වැනිදා ඉරිදා

දිවයින සුබ මුහුර්ත

28 ඉරිදා උදේ 07.11 සිට 07.17 දක්වා, 29 සඳුදා උදේ 10.14 සිට 10.45 දක්වා, 30 අඟහරුවාදා උදේ 09.24 සිට උදේ 09.44 දක්වා, 31 බදාදා උදේ 08.42 සිට 08.57 දක්වා, 01 බ්‍රහස්පතින්දා උදේ 08.47 සිට උදේ 08.14 දක්වා, 02 සිකුරාදා උදේ 07.11 සිට 07.21 දක්වා, 03 සෙනසුරාදා උදේ 06.12 සිට 06.42 දක්වා

දිනය	රාහු කාලය
මාර්තු 28 ඉරිදා	- සවස 04.48 - 06.20 - අලුයම 04.40 - 06.08
මාර්තු 29 සඳුදා	- උදේ 07.40 - 09.31 - රාත්‍රි 07.48 - 09.17
මාර්තු 30 අඟහරුවාදා	- සවස 03.17 - 04.48 - අලුයම 03.11 - 04.35
මාර්තු 31 බදාදා	- දහවල් 12.14 - 01.45 - රාත්‍රි 12.14 - 01.42
අප්‍රේල් 01 බ්‍රහස්පතින්දා	- දහවල් 01.45 - 03.16 - අලුයම 01.41 - 03.10
අප්‍රේල් 02 සිකුරාදා	- උදේ 10.41 - 12.13 - රාත්‍රි 10.45 - 12.13
අප්‍රේල් 03 සෙනසුරාදා	- උදේ 09.09 - 10.40 - රාත්‍රි 09.15 - 10.44

ප්‍රබල බුධ මාරුවක්



2021 අප්‍රේල් මස ලග්න පලාපල

බක්මහ ඔබට කොහොමද

මීන, මකර, වෘෂභ, සිංහ ලග්න වලට මංගල යෝග

වෘෂභ - මිථුන - කටක - සිංහ - කන්‍යා - වෘශ්චික - ධනු මකර - කුම්භ - මීන ලග්න හිමියන්ට ධනයෝග සමඟ සුබ පල

මේෂ - තුලා ලග්න හිමියන්ට මධ්‍ය පල

මිථුන, කටක, සිංහ, කන්‍යා, තුලා, වෘශ්චික ලග්න වලට රැකියා ලාභ හා උසස්වීම්

● ප්‍රවීණ ජ්‍යෝතිෂවේදී අජිත් ධර්මසිරි

විශ්ව ග්‍රහ තාරකා මණ්ඩලය විටෙක සුබවාදිවද තවත් විටෙක අසුබවාදිවද හැසිරීම් රටා මතු කරයි. පසුගිය වකවානුව අප අත්විඳි අත්දැකීම් අනුව මරු කතරට දිය සිසිලක් සේ සිතට සතුට දනවනසුලුය. මෙතෙක් පවතින ගුරු නීචය ජුනි මාසය තෙක් පවතින නමුදු අප්‍රේල් මාසය තුළ අපට වැදගත් ග්‍රහමාරු කීපයක් සිදුවෙයි. ඒ අනුව රවි මේෂ රාශියේ උච්චවීම අප්‍රේල් 14 දා උදේ 02.23 ට සිදුවෙයි. බුධ නීචයෙන් මිදී මේෂ රාශියට ඒම අප්‍රේල් 16 දා 2.58 ට සිදුවෙයි.

ඒ අතර සිකුරු මේෂ රාශියට පැමිණීම අප්‍රේල් 10 දා උදේ 6.20 ට සිදුවෙයි. මසක් ඇතුළත සිදුවන මෙම ග්‍රහ මාරු හා නීචයෙන් මිදීම අපට ඉතා සුබවාදී තත්ත්වයකි. මෙතෙක් පැවතෙමින් තිබෙන වසංගත රෝග අවම වීම - මිනිසුන් මිනිසුන් අතර සිදුවන කලහකාරී බව අවසන්වීම - හදිසි අනතුරු රිය අනතුරු හා කෙනකු කෙනෙකු නුරුස්නා ලෙස එදිරිවාදිකම් අවසන්ව යහපත් කාල පරිච්ඡේදයකට කටයුතු උදාවීම මේ අතර වෙයි. මෙහිදී රවි - සිකුරු මේෂ රාශියට මෙන්ම බුධ කුම්භ රාශියට ඒම වඩාත් වැදගත් වෙයි. ඒ ලංකා කේන්ද්‍රයේ බුධ බලවත් වෙමින් ලග්න ගතවන නිසාය.

එවිට රටේ වගකිව යුත්තන්ට නිදහසේ රට කරවීමට හැකිවන අතර එදිරිවාදිකම්, කකුලෙන් ඇදීම්, බාධා කිරීම් අවම වනු ඇත. ඒ හැරෙන්නට අස්ථීර ලෙස හැසුරුණු බොහෝ දෙනෙකු තම වැරදි මාර්ගය වටහාගෙන නිවැරදි මාර්ගයකට ප්‍රවිෂ්ට වනවා ඇත. එලෙසම අප රටට පිටරටවලින් මතුවී තිබෙන චෝදනා තර්ජන ගර්ජන ඉවත්ව පැහැදිලි සතුටුදායක වාතාවරණයක් මතු කෙරෙනවා ඇත. ඒ සඳහා බුද්ධිමතුන්ගේ මනස ඒ වෙනුවෙන් යොමු වෙයි. කාගේත් එකමුතුකම එකට අත්වැල් බැඳ ගැනීම පක්ෂ පාට බේද නොතකා සිදුවන බව කිව යුතුය. බුධ අධ්‍යාපනයට තුඩුදෙන මුල්වන ඥානකාරක ග්‍රහයා ලෙසින් නොමඟ ගිය කොටස් යළි සුමගට ගැනීමට සමත් වීම කාගේත් අභිවෘද්ධිය සඳහා වෙයි. බුධ කාව්‍ය ශාස්ත්‍රයට, වික්‍රමාන්විත දේට, කැටයම් හා ශාස්ත්‍රීය කටයුත්තට පොත්පත් ඇතුළු ශාස්ත්‍රීය දේට ප්‍රමුඛවන ග්‍රහයාය. ඒ නිසා බුධ නීච භාවයෙන් මිදී 16 වැනි දින මේෂ රාශියට පැමිණීම ඒ ඒ අංශවලට තිබූ දැඩි බාධා ඉවත්ව යහපත අභිවෘද්ධිය උදාවීමකි.

රටේ සංවර්ධනය ශීඝ්‍ර ලෙස ඉදිරියට යාම අධ්‍යාපන මට්ටමෙන් නව ක්‍රියාමාර්ග අනුව පාසල් අධ්‍යාපන කටයුතු නිසි පරිදි පවත්වාගෙන යාම නියමිත වේලාවට විභාගාදි කටයුතු නිසි පරිදි පවත්වා ගෙන යාමට ඒ තුළින් හැකි වෙයි.

මේෂ
වියදම් තත්ත්වය ඉහළ යයි

මේෂ ලග්නයට අනුව ඔබට රැකියා ගැටලු මතු කරමින් සතිය ආරම්භය කණස්සල්ල මතු කෙරේ. එහෙත් පිටරටක සිට පැමිණි අයකු නිසා ගැටලු අවම කෙරේ. වියදම් තත්ත්වය ඉහළ යයි. තම සුබ විහරණය සඳහා තමා විසින් ගන්නා වැරදි තීන්දු තීරණ තම අවාසියට හේතු වෙයි. උගුරේ අසාත්මිකතා තුනටියේ ආපදා පෙන්වනු ඇත. මවු පාර්ශ්වයේ කෙනකු තම අපහසුතා මඟහරවා දීමට උනන්දු වනු ඇත.

වෘෂභ
යහපත් ව්‍යාපාරයකට මඟ

වෘෂභ ලග්නයට අනුව ඔබට සිතේ තදබල ආත්ම ශක්තියක් මතුවීම තුළ ඉදිරියට යාමේ උනන්දුව ඇති කෙරේ. තමාට දරුවකු නිසා ඉතා සුබවාදි බවක් මතු කෙරේ. වාසස්ථානයෙන් පිට ගමන් බිමන් නිසා කාර්ය බහුල වන නමුත් ඒ තුළින් ආදායම් තත්ත්වය උසස් කර ගැනීමට හැකි වෙයි. බුධ හා සිකුරුගේ බලපෑම මත යහපත් ව්‍යාපාරයකට මග පෑදේ.

මිථුන
අන් අයගේ ප්‍රසාදය

මිථුන ලග්නයට අනුව ඔබට ඉදිරි කාලය රැකියා අභිවෘද්ධිය උදා වේ. රැකියා ස්ථානගත කාර්ය බහුලතා දක්නට ලැබුණද සිතේ සතුටින් කටයුතු කිරීමට හැකිවේ. තම අදහස් උදහස් අනුව අනුන්ගේ ප්‍රසාදය අත්කර ගැනීමට සමත්වේ. දිනපතා ඔබ කරගෙන ආ ආදායම් මාර්ගයක් ශක්තිමත් පසුබිමකින් පවත්වාගෙන යාමට හැකිවේ. තුනටියේ ආපදා මතු විය හැකි නිසා බර ඉසිලීම් වැනි වෙහෙසකාරී වැඩ පිළිබඳ සැලකිලිමත් වන්න.

කටක
පිය පාර්ශ්වයෙන් ලැබීම්

කටක ලග්නයට අනුව ඉදිරි කාලය ඔබට සුබයි. හදිසි ධන ලාභ මෙන්ම උරුමයන් පිළිබඳ බලාපොරොත්තු තබා ගතහැකි වනු ඇත. තම පිය පාර්ශ්වයෙන් ලැබීම් ඇතිවේ. ජලයෙන් හා මහපොළොවෙන් ලැබෙන ආදායම් මතු කෙරේ. තමාට තිබූ නීති ගැටලුවක් සමතයකට පත්වේ. ඉගෙන ගන්නා වයසේ නම් අධ්‍යාපන ජයග්‍රහණ ද රැකියා කරන තත්ත්වයේ නම් රැකියා උසස්වීම් ද මතු කෙරේ.

සිංහ
උසස් සමාජශීලී බවක්

සිංහ ලග්නයට අනුව ඔබගේ ඉදිරි කාලය තම ආත්ම අභිමානය ඉහළ යන කාලයකි. බොහෝවිට සමාජශීලී බව නිසාම ජයග්‍රහණ හිමිවේ. තම ආදායම් උසස් වන අතර වියදම ද කිසියම් මට්ටමකින් ඉහළ යනු ඇත. එහෙත් උසස් තලයට යනවා මිස බිඳ වැටීම් නැත. ගෘහ ජීවිතය සතුටුදායකවේ. ශරීර සෞඛ්‍ය පිළිබඳව ද සතුටු විය හැකි වේ.

කන්‍යා
බලාපොරොත්තු සඵල වේ

කන්‍යා ලග්නයට අනුව ඔබට ඉතා සුබ සතියක ආරම්භයක් වෙයි. චන්ද්‍රයා ලග්න ගත වීමෙන් ආරම්භ වන මෙය තම බලාපොරොත්තු බොහොමයක් සඵල කරවා ගත හැකිවේ. අවිවාහක අයට මංගල යෝග තරුණ තරුණියන් අතර ආදර සබඳතා මතු කෙරෙන වකවානුවකි. එසේම ව්‍යාපාරික අතින් ද වෘත්තිමය වශයෙන් ද ආර්ථික තත්ත්වය උසස්වේ. තමා කාලයක් තිස්සේ ක්‍රියාවට නැංවීමට සිටි ව්‍යාපාරයක් සඵල කරවා ගැනීමට හැකිවේ.

තුලා
සම්පතමයන් වෙතින් ගැටලු

තුලා ලග්නයට අනුව ඔබට ඔබගේ ඉදිරි කාලය සුබ අසුබ දෙක සමසේ භුක්ති විඳීමට සිදුවේ. ආදායමේ තරමට වියදම ද සතුටේ තරමට අසතුටද ඇති කෙරේ.

තමාගේ සම්පතමයින් වෙතින් තමාට සිත් කළකිරෙන සිදුවීම් ඇතිවේ. සිතේ කෝපය පාලනය කර ගත යුතු කාලයකි. පිටරටකට යාමට බලාපොරොත්තුවෙන් සිටින අයට අදහස් සඵලවේ. එහෙත් ගමන පිළිබඳ සුදුසු නිරවුල් නීතිමය රාමුවක් තුළ මිස නොසැලකිලිමත් ලෙස කටයුතු නොකරන්න.

වෘශ්චික
කාර්ය බහුල කාලයක්

වෘශ්චික ලග්නයට අනුව ඔබගේ ආදායම් මට්ටම ඉහළ යයි. තම ව්‍යාපාරික කටයුත්තට අලුත් අලුත්දේ එකතු කර ගැනීමෙන් එය උසස් මට්ටමට ගෙන ඒමට සමත්වෙයි. පහසුකම් අතින් ඔබට සුබවාදි වෙයි.

සිතේ පවතින අදහස් උදහස් කාර්ය බහුලකම නිසාම ව්‍යාකුල තත්ත්වයට පත්විය හැක. ආගමික අංශයට වැඩි නැඹුරුවක් දැක්වීමෙන් සිතේ සතුට සංයමය වඩවා ගැනීමට ඔබට හැකිවෙයි.

ධනු
සාර්ථක සැලසුමක් වගකිවයුත්තන් අතට

ධනු ලග්නයට අනුව ඉදිරි කාලය රැකියාවේ උසස්වීම් හා ආදායම් ඉහළයාම් පෙන්වයි. කාලයක් තිස්සේ සැලසුම් කළ වෘත්තිමය සැලසුමක් වගකිවයුත්තන් අතට පත් කිරීමෙන් එය බොහෝ දෙනාගේ සැලකිල්ලට යොමුවේ. එය ඉදිරියේදී සාර්ථක ලෙස ක්‍රියාවට නැංවීමට කටයුතු කෙරේ.

ඒ නිසාම ඔබ රැකියා ස්ථානයේ කැපී පෙනෙන චරිතයක් බවට පත්වේ.

මකර
දුරබැහැර කටයුත්තකට යාමක්

මකර ලග්නයට අනුව ඉදිරි කාලය ඔබට පුණ්‍යවන්ත ලෙස කල්ගෙවීමට හැකිවේ. සැලසුම් සාර්ථකවේ. යුග දිවියේ සතුට ගෘහ ජීවිතයේ අභිවෘද්ධිය උදාවේ. අනාගත ආයෝජන කටයුත්තකට දුර බැහැරකට යාමට සිදුවේ. ඒ ගමන් වලදී ආර්ථික මෙන්ම ශාරීරික අපහසුතා දැනුනද කරගෙන යාමට අදහස් කරන වැඩපිළිවෙළ සාර්ථක වීමෙන් සියලු කම්කටොලු දුරුව යනවා ඇත. හිසේ කැක්කුම් වේදනා නිසා කටයුතු වලට බාධා වීමට පුළුවන.

කුම්භ
අධිෂ්ඨානය ඉහළ යන කාලයක්

කුම්භ ලග්නයට අනුව මෙම කාල වකවානුව ඔබගේ සිතේ යම් කණස්සලු බාවයක් පැවතුණ ද තමාට එන සමාජ ගැටලු හමුවේ අධිෂ්ඨානය ඉහළ යන වකවානුවකි. උත්සාහයෙන් ජයග්‍රහණ හිමිකර ගනී. පාසල් යන දරුවන්ට අධ්‍යාපනය සඳහා දැනුම ලබාදීමට කැපවන කාලයකි. ඒ අනුව ඔබට වැඩිහිටි ප්‍රශංසා - ආර්ථික වාසි හා ධන පරිත්‍යාග හිමි වේ. ස්වර්ණාභරණ හා අලංකාරය සඳහා ඇඳුම් හා විසිතුරු දේ මිලට ගන්නා වකවානුවකි.

මීන
ලොතරැයි ජය

මීන ලග්නයට අනුව ඔබට ඉදිරි කාලය ඉතා සතුටුදායක වෙයි. සිතේ සතුටින් කාලය ගත කිරීමට හැකිවේ. ආර්ථික ලැබීම් හා තම ගෘහ ජීවිතයේ සතුට දැනෙන කාලයකි.

දේපළ හිමිකම්, ලොතරැයි ජයග්‍රහණ මෙන්ම මහපොළොවෙන් ලැබෙන උරුමකම් හිමිය. ජලාශ්‍රිත කටයුතු කෙරෙන් දුරස් වන්න. ඒ හා සම්බන්ධ ස්ථානවලදී අනතුරු ඇතිවිය හැකිය. තම සහකරුවා හෝ සහකාරිය වෙත කිසිමදාකටත් වඩා තමාගේ කටයුතු කෙරේ සහයෝගය ලබාදෙන වකවානුවකි.

බිලිඳු නමට අකුරු

● සමන්ති අනුබුදු

28 ඉරිදා

මාර්තු 28 ඉරිදා 17.35 තෙක් උත්‍රපල් නැකැත උදාව පවතී. ඒ කාලය තුළ උපදින බිලිඳුන්ගේ නමට "ටෙ, ටො, ප, පි" අකුරු සුදුසු වේ. ඉන්පසු මාර්තු 29 සඳුදා 15.01 තෙක් හත නැකැත උදාව පවතී. ඒ කාලය තුළ උපදින බිලිඳුන්ගේ නමට "පු" අකුර සුදුසු වේ.

29 සඳුදා

මාර්තු 29 සඳුදා 15.01 සිට මාර්තු 30 අඟහරුවාදා 12.21 තෙක් සිත නැකැත උදාව පවතී. ඒ කාලය තුළ උපදින බිලිඳුන්ගේ නමට "පෙ, පො, ර, රි" අකුරු සුදුසු වේ.

30 අඟහරුවාදා

මාර්තු 30 අඟහරුවාදා 12.21 සිට මාර්තු 31 බදාදා 09.44 තෙක් සා නැකැත උදාව පවතී. ඒ කාලය තුළ උපදින බිලිඳුන්ගේ නමට "රු, රෙ, රො, ත" අකුරු සුදුසු වේ.

31 බදාදා

මාර්තු 31 බදාදා 09.44 සිට අප්‍රේල් 01 බ්‍රහස්පතින්දා 07.21 තෙක් විසා නැකැත උදාව පවතී. ඒ කාලය තුළ උපදින බිලිඳුන්ගේ නමට "ති, තු, තෙ, තො" අකුරු සුදුසු වේ.

01 බ්‍රහස්පතින්දා

අප්‍රේල් 01 බ්‍රහස්පතින්දා 07.21 සිට අප්‍රේල් 02 සිකුරාදා 05.19 තෙක් අනුර නැකැත උදාව පවතී. ඒ කාලය තුළ උපදින බිලිඳුන්ගේ නමට "න, නි, නු, නෙ" අකුරු සුදුසු වේ.

02 සිකුරාදා

අප්‍රේල් 02 සිකුරාදා 05.19 සිට අප්‍රේල් 03 සෙනසුරාදා 03.43 තෙක් දෙට නැකැත උදාව පවතී. ඒ කාලය තුළ උපදින බිලිඳුන්ගේ නමට "නො, ය, යි, යු" අකුරු සුදුසු වේ.

03 සෙනසුරාදා

අප්‍රේල් 03 සෙනසුරාදා 03.43 සිට අප්‍රේල් 04 ඉරිදා 02.38 තෙක් මුල නැකැත උදාව පවතී. ඒ කාලය තුළ උපදින බිලිඳුන්ගේ නමට "යෙ, යො, බ, බි" අකුරු සුදුසු වේ.

මෙහි වේලාව දක්වා ඇත්තේ පැය 24 ඔරලෝසුව අනුවයි.

දෙවියෝ ද කැමැති මටයි!

ඒ බමුණු කුමරු බ්‍රහ්මාලිය. කොසොල් රට ධනවත් පවුලක උපන් ඔහුට වේදය පිළිබඳ ඉහළ දැනුමක් තිබිණ. නගරයේ වියත් පඬිවරුන්ගේ පැසසුමට ඔහු ලක්වූයේ ඒ දැනුම නිසාය.

බ්‍රහ්මාලි වේද දැනුම තුළ සිරවී නොසිටියේ බ්‍රහ්මගේ මැවිල්ල ගැන ප්‍රශ්න කෙළේය. සමාජය කුල හතරකට බෙදීමට මුල් වූ බ්‍රහ්ම අසාධාරණයේ උල්පත සේ දුටුවේය.

"ඔහු මැවූයේ දුකෙන් පිරි ලොවක් ඒ ගැටලුවලට වේදයේ විසඳුම් නැහැ."

බ්‍රහ්මාලි සිතුවේය.

එක් රජ කුමරකු පැවිදිව ගොඩ නැගූ සසුනෙහි චණ්ඩාල කුල උපන් සුනීතට, සෝපාකට ඉඩ ලැබුණු හැටි, ඒ දෙදෙනා බමුණු කුලයෙන් ආ සැරියුත්, මුගලන් හිමිවරුන්ට සමාන වී ඇති සැටි, රජකුලයෙන් ආ රාහුල, ආනන්ද හිමිවරුන්ට සමාන වී ඇති සැටි, බ්‍රහ්මගේ කුල නියමයට රජ කුලයෙන් ආ ශාස්තෲවරයා අභියෝගයක් වී ඇති සැටි, බ්‍රහ්මාලිට අසන්නට ලැබිණ.

ඒ ශාස්තෲවරයා බුදුරජාණන් වහන්සේ ය.

"බුදුන් අපේ සතුරෙකි. බ්‍රහ්ම මැවූ මේ සමාජය උඩු යටිකුරු කිරීමට ඔහු වෙහෙසෙනවා. අපේ කොසොල් රජතුමා පසුගියදා මහ සෙනගක් බලා සිටියදී චණ්ඩාල කුලයේ සුනීතට වැන්දා. සුනීත කසළ ශෝධකයෙක්. දැන් බුදුන්ගේ ශ්‍රාවකයෙක්. බුදුන්ගේ කහ සිවුර පෙරෙව්වා පමණයි, ඔහුගේ චණ්ඩාල ලකුණ මැකී ගියා. මේක අපට තර්ජනයක්. පුරෝහිත බමුණා කොසොල් රජුට මේ ගැන කීවා. රජු සිනාසුණා. රජුට දැන් බුදුන්ට වඩා ලොකු කෙනෙක් නැහැ. අපි සංවිධානය වෙලා බුදු සසුන විනාශ කළ යුතුයි. නැත්නම් අඩු කුලේ පවුකාරයන් රජකමටත් ඒවි...



බ්‍රහ්මාලිට මහලු බමුණෝ කීහ.

බ්‍රහ්මාලි මිතුරකු හමු විය. බුදුරජාණන් වහන්සේ මේ සමාජය විප්ලවීය වෙනසකට හසු කරන

ආකාරය ඔහු මිතුරාට කීය. මිතුරා ඔහුට පිළිතුරු දුන්නේය.

"මේ වෙනස සමාජයේ යහපතක් ඇති කරනවා. බ්‍රහ්මයාගේ මුවින් අප ඉපදුණාය කියන ඉගැන්වීමට ඔබ එකඟද? අප ඉපදුණේ ස්ත්‍රී යෝනියකින්. මගේ බාල මල්ලි ඉපදුණු දවස මට මතකයි. අම්මා වැදුම් ගෙයි හිටියා. මල්ලි අම්මාගේ යෝනියෙන් පිටතට ආවා. ඉතින් බ්‍රහ්මයාගේ කට තිබෙන්නේ අම්මාගේ ශරීරයේ පහත බඩට පහළින් ද?"

බ්‍රහ්මාලි හඬ නගා සිනාසුණේය.

"ඔබ බුදුන් අනුව යන්නෙක් වගෙයි."

"තාම නැහැ. එහෙත් මා ඒ ගැන සොයනවා. සොයාගත් තරමින් මට වැටහෙනවා. ලෝකය, ජීවිතය මැනවින් වටහාගත්, ප්‍රඥාවෙන් කරුණාවෙන් පිරුණු උත්තම ශාස්තෲවරයා උන්වහන්සේයි. බ්‍රහ්ම, වේදය පිළිබඳව මගේ විශ්වාසය බිඳ වැටිලා."

බ්‍රහ්මාලි තවත් මිතුරන් කිප දෙනකු හමුවූයේය. ඔවුහු ඔහුට බුදුරජාණන් වහන්සේ දේශනා කරන ධර්මය සැකෙවින් දැක්වූහ.

"මුළු ලොවම දුකෙන් පිරී ඇත. දුකට හේතුව තණ්හාවයි. අවිද්‍යාවයි. එය දුරු කිරීමෙන් දුකෙන් මිදීම හෙවත් නිර්වාණය උදාවේ. ඒ සඳහා ගමන් කළ යුතු මාර්ගයක් ඇත. එය ආර්ය අෂ්ටාංගික මාර්ගය නම් වේ. අප දුකෙන් මුදා ගැනීමට දෙවියකුට, බ්‍රහ්මයකුට නොහැකි ය. එය කළ යුත්තේ අපමය. බුදුරජාණන් වහන්සේ මනුෂ්‍යයා, දෙවියකුට, බ්‍රහ්මයකුට යටත් නොකරයි. තමාගේ විමුක්තිය ලබාගත යුත්තේ තමා විසින්ම ය. ඒ මඟ පෙන්වීම උන්වහන්සේගේ දහමෙන් සිදුවෙයි.

බ්‍රහ්මාලි ඒ මිතුරන්ගේ අත්වලින් අල්ලා ගත්හ.

"ඔබ මගේ සැබෑ මිත්‍රයෝ... මා හිතනවා මට සුදුසුම ශාස්තෲවරයා ඔබ නිසා හමුවේය කියා."

"දැන් උන්වහන්සේ ජේතවනාරාමයේ වැඩ වෙසෙනවා"

"අර සුදත්ත සිටුවරයා තැනවූ ආරාමයද"

"ඔව්, දැන් සුදත්ත සිටුවරයා හඳුන්වන්නේ අනේපිඬු සිටුවරයා නමින්"

"මා අද ම මේ දැන් ම ජේතවනාරාමයට යනවා."

බ්‍රහ්මාලි බුදු රදුන් හමුවුණේ ය. උන්වහන්සේ ගේ දෙසුමකට සවන් දුන්නේය. සවන් සමග හිත ද දුන්නේය. යළි නිවස ගැන නොසිතූ ඔහු එදා ම බුදුරදුන්ගේ සව්වෙක් වූයේ ය. ඔහුට භාවනාව සඳහා උපදෙස් ලැබිණ.

වනාන්තරයට වැඩම කළ බ්‍රහ්මාලි හිමියෝ විදසුන් වැඩුයේ මඳ කලෙකින් රහත් බවට පත්වූහ.

දිනක් උන්වහන්සේ භික්ෂූන් වහන්සේ නමක ඇසූ ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් මෙසේ වදාළහ.

කෙලෙසුන්ගෙන් මිදුණු නිවී සැනසුණු සිතින් ගලා ගිය බ්‍රහ්මාලි හිමියන්ගේ උදානය ද එය ම විය.

"රියැදුරු අසුන් දමනය කරන මෙන් සොඳින්
දමනය කරන ලද සය ඉඳුරන් මැනවින්
මානය සමග ආසව නැසූ තාදි ගුණ
සපිරුණු දෙවියනට රිසි අය මෙහි වෙත්ද?
රියැදුරු අසුන් දමනය කරනු මෙන් සොඳින්
දමනය කෙළෙමි මම සය ඉඳුරන් මැනවින්
මානය සමග ආසව නැසුවෙමි තාදි
ගුණයෙන් පිරුණු මට දෙවියෝ කැමැති වෙති.

භාවිතයට ගත් ගෑස් සිලින්ඩර

පැණිය ඇසුරුම් කිරීමට ගෙනා බෝතල් ගොඩගසා ඇති අයුරු

ධම්මික පැණිය සොයා කෑගල්ලට ගිය ගමන

● ඔස්වල්ඩ් ගොඩකුඹුර

කොරෝනා වසංගතය මුළු ලෝකයම වෙළා ගෙන අවසන්ය. රෝගය පැතිරයාමත් සමඟ මුළු ලෝකයම බියට පත්වූයේ ඒ සඳහා නිසි බෙහෙතක් නොතිබූ බැවිනි. කෑගල්ලේ වෙදමහතකුගේ පැණියකින් කොරෝනා සුව වන බව සැලවීමත් සමඟින් බොහෝ දෙනකුගේ අවධානය එදෙසට යොමු විය.මෙම වෙදමහතාගේ නම ධම්මික බණ්ඩාර යැයි පැවසූ බැවින් එම බෙහෙතද "ධම්මික පැණිය" නමින් හැඳින්විණි.

කාලි මැණියන් සිහිනෙන් පැවසූ වට්ටෝරුවකට අනුව මේ ඖෂධය නිපදවන බවද තැන තැන පැවසිණි. මේ පැණිය සොයා වෙදමහතාගේ කෑගල්ල ඔත්නාපිටියේ පිහිටි නිවසටත්, උඩුමාගම දේවාලයටත් වැල නොකැඩී සෙනඟ පැමිණිහ.ධම්මික පැණිය නොමිලයේ බෙදා දෙන දන්සැල් ද පැවැත්විණි.

මේ අතර මෙම ඖෂධය පිළිබඳ විවිධ පිරිස් නොයෙක් මත පළ කළහ. තවත් පිරිසක් වෙදමහතාගේ සුදුසුකම් පිළිබඳ ප්‍රශ්න මතු කළහ. කොරෝනා එන්නත මෙරටට ගෙන ඒමත් සමග ජනතාව පැණියෙන් ඈත්වන්නට පටන් ගත්තේය. ධම්මික වෙදමහතා කොරෝනා එන්නත ලබාගත් බවට සමාජ මාධ්‍යවල ඡායාරූපද පළ විය. ඔහු පවසන්නේ එය තමන්ට මඩ ගැසීම සඳහා යොදා ගන්නක් ලද බවය.

කාලයක් එකදිගට පුවත් මැවූ ධම්මික වෙදමහතා මේ වනවිට නිහඬව ඇත. ධම්මික පැණියද ජනතාවගේ මතකයෙන් ගිලිහී යමින් තිබේ .මේ වෙදමහතාගේ වත්මන් තොරතුරු සොයා යාමට ''සිළුමිණ'' අදහස් කළේ එබැවිනි.

අප ධම්මික වෙද මහතා හමුවූයේ ඔහු පදිංචිව සිටින ඔත්නාපිටිය නිවසේදීය. පසුගිය දිනවල කොරෝනා පැණිය නිෂ්පාදනය කළේද එහිදීය. අද වන විට ඒ සඳහා යොදාගත් භාජන හා උපකරණද පැත්තක අසුරා ඇත. කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශයෙන් ලබාදුන්නා යැයි කියන කැබැලි කරන යන්ත්‍රයද පසෙකට දමා ඇත. නිවෙසේ එක් පසෙක හිස් කාලේ වීදුරු බෝතල් දහස් ගණනකි. තවත් පසෙක හිස් ගෑස් සිලින්ඩර තොගයකි. මෙහි රැඳී සිටියා යැයි කියන වෙද මහතාගේ ආරක්ෂකයන් හෝ සේවකයන්ද එහි නැත.

ජනමාධ්‍යවල උණුසුම් පුවත් මැවූ මෙම වෙද මහතා අප හා කතාබහට එක්වූවේ ජනමාධ්‍ය තමන් නොමරා මැරූ බව ද පවසමිනි.

"දැන් මම බෙහෙත් හදන්නේ නැහැ. බෙහෙත් හදන එක නතර වුණේ මී පැණි නැති නිසා. චීනයෙන් මී පැණි ටිකක් ගෙන්වා ගත්තා. දැන් මී පැණි ආවත් බෙහෙත් හදන්නේ නැහැ කියලා තීරණයක් ගත්තා. මම සිතුවේ ලංකාවේ කොවිඩ් නැති කරන්නයි, ලංකාවට විදේශ විනිමය අරගෙන දෙන්නයි. ඒත් මේ රටේ වැඩි පිරිසක් බෙහෙතට කෙනෙහිලිකම් කරා. ගිය අවුරුද්දේ මුල බෙහෙත හැදුවා. නොවැම්බර් මාසයේ වතුපිටිවල රෝහලේ සායනික පරීක්ෂා සිදුකරලයි බෙහෙත එළි දැක්වූවේ. කොවිඩ් හැදුණු අයට දවස් තුනෙන් සනීප වුණා. ලෙඩ්ඩු බලාගත් අයට මේ බෙහෙත නිසා කොවිඩ් වැලඳුණේ නැහැ.

ලංකාවේ නාවික හමුදාවේ මුල් වටයේ කොවිඩ් තුරන් කළේ මමයි. බය නැතිව මට එහෙම කියන්න පුළුවන් ඡායාරූප සමඟ මගේ ළඟ සාක්ෂි තිබෙන නිසයි. වරායට, ගුවන් තොටුපළ අරින කොට ඔය එන්නත තිබුණේ නැහැ. ඒ අයට බෙහෙත් දුන්නෙත් මමයි. මේ බෙහෙත ධම්මික පැණිය වුණෙත් මාධ්‍ය තුළින්මයි. මේ බෙහෙත බීපු කාටවත් මම උපදෙස් දුන් විදියට මස් මාළු නොකා මත්පැන්, දුම්නොබී සිටියා නම් කොවිඩ් හැදුණේ නැහැ. මම හදපු බෙහෙත ලක්ෂ විසිපහකට අධික පිරිසක් බිව්වා. ඒ අයගෙන් වැඩි දෙනෙක් කොරෝනා පොකුරු ඇතුළේ සිටි අය. ඒ අයට කොවිඩ් වැලඳුණේ නැහැ.

සමහර වෛද්‍යවරු මේ බෙහෙතට බොහෝ නින්දා කළා. කෑගල්ලෙන් ධම්මික පොකුරක් හැදෙයි කීවා. ඔත්නාපිටියේ බෙහෙත් හදන තැන පැණි පොකුරක් හැදෙයි කීවා. එක දවසට දස දහසක් විතර සෙනඟ පොදි ගැසෙමින් බෙහෙත් ගන්න ආවත් ඒ කාටවත් කොරෝනා පොකුරක් වුණේ නැහැ."

ධම්මික බණ්ඩාර යනු පාරම්පරික හෝ ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරයෙක් නොවීය. එවැන්නකු ලෝකයම වෙළාගත් රෝගයකට බෙහෙත් කරන්නේ කෙසේද යන්න බොහෝ දෙනෙකුට පැනයක් විය. ධම්මික බණ්ඩාර යන නම ඔහුගේ සැබෑ නම නොවන බවටද සමහරු ප්‍රකාශ කර තිබිණි. අප ඒ පිළිබඳවද ඔහුගෙන් විමසුවෙමු.

''ඒක ඇත්ත, මගේ නම ධනපාල. මම ඒ වෙනුවට ධම්මික බණ්ඩාර ලෙස නම වෙනස් කළේ මීට අවුරුදු අටකට නවයකට විතර කලින්. ඒක කළේ හාමුදුරුවන්ගේ ඉල්ලීමකට. උන්වහන්සේලාට දෙණියාය ගැටබරු දේවාලයේ බස්නායක නිලමේ හැටියට මාව පත්කර ගන්න මගේ නම ප්‍රශ්නයක් වුණා. මගේ උපන් වේලාවට අනුව නැකැත් බලලා තමයි උන්වහන්සේලා මේ නම තිබ්බේ.

එහෙම නැතිව කොවිඩ් බෙහෙත නිසා නොවෙයි. නායක හාමුදුරුවන්ට ඕනෑ වුණා මාව ඉදිරියට ගෙනියන්න. මගේ තාත්තා මාතර,අම්මා තමයි කෑගල්ලේ.

මේක දෙවියන්ගේ ඖෂධයක්. මගේ අතින්ම තමයි මම මේක දෙන්නේ. මට වෙද මහත්තයා කීවේ මාධ්‍ය තුළින්. කාලි මැණියන් මගේ ඇඟට ආවේශ වෙලා තියෙන නිසා මට කියන්නේ ''මැණියෝ'' කියලයි. තුම්මෝදර භද්‍රකාලි දේවාලයේ මැණියෝ කීවාම ඕනෑම කෙනෙක් දන්නවා. මගේ දේවාලයෙන් අවුරුදු ගණනක් විවිධ ලෙඩ රෝගවලට ප්‍රතිකාර කරනවා. බටහිර වෛද්‍යවරුන් සුවකරන්න බැහැ කියූ රෝගීන් කාලි අම්මාගේ ආශිර්වාදයෙන් මම සුව කරලා තියෙනවා. ඒ වුණත් මම වෙදමහත්තයෙක් නොවෙයි.

ආයුර්වේදය කියන්නේ මේ රටට ඉන්දියාවෙන් ආව එකක්. ඉන්දියාවට ආවේ සෘෂිවරුන්ගෙන්.මේ ගැන හරි ගවේෂණයක් කළොත් ඒක තේරුම් ගන්න පුළුවන්.ආයුර්වේද වේවා සිංහල හරි බටහිර හරි වේවා කොවිඩ්වලට බෙහෙතක් නැතිව මරබියෙන් පෙලෙන වෙලාවකයි මම මේ බෙහෙත හදලා දුන්නේ.මගේ ජන්මය හොයන්නේ නැතිව මේ බෙහෙත ගැන හෙව්වානම් හරි.ඊයේ පෙරේදා පස්සර ලොකු රිය අනතුරක් සිදු වුණා.එතැන තුවාල වූ අයගේ ලේ යනකොට රෙදි පටිය ගැටගැසූ කෙනා වෛද්‍යවරයෙක් නෙවෙයි.හැබැයි තුවාල වු කෙනාගේ ජීවිතය බේරාගන්න ඒක වැදගත් වුණා. මගේ බෙහෙතට ආයුර්වේද වෛද්‍යවරු කෙනෙහිලිකම් කළා.මගෙන් බෙහෙත් වට්ටෝරුව ඉල්ලුවා. මම වට්ටෝරුව දුන්නාම බෙහෙත හැදුවත් වැඩක්වුණේ නැහැ. අපි මේක හැදුවේ මැණියන්ගේ අතින්. මැණියන්ගේ ආශිර්වාදයෙන්.''

ධම්මික පැණිය පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ලබාදීමටද ධම්මික මහතාට හැකි විය.එහෙත් පැණිය පානය කළ සෞඛ්‍ය ඇමැතිවරියට කොවිඩ් වැලදීමත් සමග ජනතාව අතර යළි ඒ ගැන විවිධ මත පැතිරුණි. ඒ සම්බන්ධයෙන් ඔහු පවසන්නේ මෙබන්දකි.

''මම හදපු බෙහෙත ලක්ෂ විසිපහකට අධික පිරිසක් බිව්වා. ඒ අයගෙන් වැඩි දෙනෙක් කොරෝනා පොකුරු ඇතුළේ සිටි අය. ඒ අයට කොවිඩ් වැළඳුණේ නැහැ කියලා මම කලිනුත් කීවා. පාර්ලිමේන්තුවේදී මම කථානායකතුමාට මේ බෙහෙත දුන්නා. සෞඛ්‍ය ඇමැතිතුමියත් මේ බෙහෙත බීවා. ඒත් එතුමියට කොවිඩ් හැදුණා. එතුමිය මගේ උපදෙස් පරිදි දින තුනක් බෙහෙත ලබාගත්තා නම් එතුමියට කොවිඩ් හැදෙන්නේ නැහැ. එතුමියගේ පවුලේ අයත් ඒ ගැන කියලා තිබුණා. පියල් නිශාන්ත ඇමැතිතුමාත් බෙහෙත බිව්වේ නැහැ කියලා කියා තිබුණා.

ඒ වගේම විමල් වීරවංශ ඇමැතිතුමා මේ බෙහෙත හරියට බිව් නිසා කොවිඩ් වැළඳුණේ නැහැ කියලා රූපවාහිනී වැඩසටහනකදී කීවා. මාධ්‍ය එකක් දෙකක් හැර බොහොමයක් මේ තත්වය විකෘති කරලායි වාර්තා කළේ. කොරෝනා නිවාරණ ප්‍රතිශක්තිකරණ ජීව ශක්ති පානය ලෙස මම හදපු බෙහෙත ධම්මික පැණිය බවට පත්කළේ ජනමාධ්‍යයි. මම ආයුර්වේද සභාවෙන් දුන් සහතිකයත් ප්‍රතික්ෂේප කළේ කොරෝනා නිවාරණ කියලා සහතිකයේ නොතිබූ නිසයි. "

ධම්මික බණ්ඩාර වෙදමහත්තයා

මේ බෙහෙත් දන්සැල් දෙනවා වගේම අලෙවි කළ බවටත් තොරතුරු වාර්තා වුණා. කොවිඩ්වලට බෙහෙතක් නොමැතිව තිබියදී මේ බෙහෙත ඔබට අලෙවි කරගැනීමට ලැබීමෙන් ලොකු වාසියක් අත්වූවාද? අපි ඔහුගෙන් විමසුවෙමු.

මම ලංකාවේ උසම සමාධි බුදු පිළිමය හදන්න සැලසුම් කරලා තිබුණේ. ඒ සඳහා මා ළඟ තිබූ මුදල් මේ බෙහෙත හදන්න මම වියදම් කළා.මගේ ළඟ තිබුණු වාහන හයක් විකිණුවා.බැතිමතුන් දුන් මුදල්, මගෙත් එක්ක වැඩ කරන අයගේ රත්තරන් බඩු පවා උකස් කරලා සොයාගත් මුදල්වලින් තමයි අපි මේ බෙහෙත හැදුවේ. කාගෙන්වත් සල්ලි ලැබුණේ නැහැ.ඒත් මේ බෙහෙතට අගෞරව කළා මිස කවුරුවත් උදවු කළේ නැහැ.

බෙහෙත් හදන්න අවශ්‍ය දේ ගන්න මගේ සියලු දේවල් ඉවර කරලා මේගේ විකුණන්න තීරණය කළා. ඒක අර කෙනෙක් කියලා තිබුණා වගේ මගේ උන්මන්තකකම වෙන්න ඇති. මම සිතුවේ මේ රට වෙනුවෙන්.භද්‍රකාලි මැණියන් මට සියලු සැප සම්පත් දීලා තිබෙනවා. බෙහෙත්වලට, විදුලියට, ගෑස්වලට, ශ්‍රමයට යනාදී වශයෙන් බලලයි බෙහෙත් බෝතලයක් රුපියල් දස දහසකටත්,බෝතල් කාලක් රුපියල් දෙදහස් පන්සියයකටත් මිල නියම කළේ. ලැබුණු මුදල් චීනයෙන් මී පැණි ගෙන්වා ගන්න යෙදවූවා. බෙහෙත් බෙදාදෙන විට විවිධ ප්‍රශ්නවලට මුහුණ දෙන්නත් සිදු වුණා.මෙතැනදී කාලේ බෝතල් හත් දහසකට වඩා බෙදා දුන්නා. උඩුමාගම දේවාලය ළඟදී 7662ක් බෙදා දුන්නා.පූර්ණ සෞඛ්‍ය ප්‍රතිපත්ති හා නීතිරීතිවලට පටහැනිවයි බෙහෙත් බෙදාදුන්නේ.හැබැයි ඒ කාටවත් කොවිඩ් හැදුණේ නැහැ.''

ධම්මික වෙදමහතා මේ බෙහෙත ගැන කෙතරම් විශ්වාසයෙන් ප්‍රකාශ කළත් ඔහු කොවිඩ් එන්නත ලබාගත් බවට සමාජ මාධ්‍ය ජාලාවල ඡායාරූපයක් සංසරණය වෙමින් තිබේ.අප ඒ ගැන විමසූවිට ඔහු ඊට මෙලෙස පිළිතුරු දුන්නේය.

"මම නම් ඒක දැක්කේ නැහැ.හෙදියක් මට මේ එන්නත ලබාදෙන ඡායාරූපයක් සමාජ මාධ්‍යවල තිබෙනවා කියලා මටත් දැනගන්න ලැබුණා.ඒ දේශපාලනඥයකුට එන්නත දෙන පින්තූරයකට මගේ ඔළුව බද්ධ කරලා නිර්මාණය කළ ඡායාරූපයක්. මට අවශ්‍ය නම් ඒකට විරුද්ධව නීති මඟින් කටයුතු කරන්නත් පුළුවන්. ඒත් මම දකින එකම දේ මම තව කෙනෙකුට වෛර කරන්නේ නැහැ. සමහර මාධ්‍යවලින් මට මඩවලින්, අගුවිවලින් ප්‍රහාර එල්ල කළත් මම වෛරයෙන් කිසිවක් ප්‍රකාශ කළේ නැහැ.

මම කැමැති නැහැ දේශපාලනඥයන්ට. මටත් දේශපාලනයට ආරාධනා තිබෙනවා. නමුත් මම කැමැති නැහැ. හැබැයි මම දේශපාලනඥයන්ට බොහෝ උදවු කළ කෙනෙක්. මම මැතිවරණවලදී ඡන්දය පාවිච්චි කරන්නේ නැහැ. ස්වාධීනව කටයුතු කරනවා. දේවාලයට ආශිර්වාද ගන්න පැමිණෙන බොහෝ දේශපාලනඥයන්ට මම උදවු කළා. සමහර දේශපාලනඥයෝ මගේ බෙහෙත වදකහ සුදිය වගේ කීවා. තව සමහරු එන්ජින් ඔයිල් කීවා. හැබැයි ඒ කියපු අයත් බෙහෙත බිව්වා. ඉහළම අය ඉල්ලන වෙලාවට බෙහෙත දෙන්න බැරි වුණාම දොස් කීවා මිස උදවු කළේ නැහැ.

දේශපාලනඥයන් ඔහුට උදවු නොකළ බව කීවත් මේ රටේ ඉහළම දේශපාලනඥයෙකුගේ නියෝගයකින් ඔහුට රජයේ අනුග්‍රහයෙන් මී පැණි තොග පිටින් ලැබුණු බව සමහරු ප්‍රකාශ කරති. ඒ අතරම එක්තරා අමාත්‍යාංශයකින් රුපියල් ලක්ෂ විසිපහක් වටිනා යන්ත්‍රයක්ද ලබාදී ඇති බව පැවසෙයි. අප ඒ පිළිබඳවද ධම්මික බණ්ඩාර වෙදමහතාගෙන් විමසූවෙමු.

"ජනාධිපතිතුමා වනජීවී දෙපාර්තමේන්තුව හරහා මට මී පැණි නොමිලේ ලබාදුන්නා කියලා කතාවක් ප්‍රචාරය වී තිබෙනවා. ජනාධිපතිතුමා මට මී පැණි ලබාදුන්නේ නැහැ.එතුමා මේ බෙහෙත පිළිගත්තෙත් නැහැ. වනජීවී එකෙන් කිසිවක් ලැබුණෙත් නැහැ. සමහර හාමුදුරුවරු මට මී පැණි හා සාදික්කා සොයා දුන්නා. මුලදී රුපියල් හත්සිය පනහට ගත්ත මී පැණි බෝතලය රුපියල් හත්දහස් පන්සියයටත් ගන්න සිදු වුණා. සත පනහට රුපියලට ගත්ත සාදික්කා ගෙඩිය රුපියල් දහයට දොළහට ගියා.

භාවිතයට නොගෙන අතහැර දමා ඇති උපකරණ

කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශයෙන් සාදික්කා කැලි කපන යන්ත්‍රයක් ලැබුණා. ලක්ෂ විසි පහක යන්ත්‍ර නම් ලැබුණේ නැහැ. මේ කැලි කපන මැෂිම ලක්ෂ හතර හමාරයි. සාදික්කා ප්‍රවාහනයට ශීතකරණ පහසුකම් තිබෙන කුඩා ලොරියක් ගත්තා.ඒක ගත්තේ පුතාගේ නමින් ලක්ෂ විසි පහක් ණය අරගෙන. ඒ ණය දැන් ටික ටික ගෙවාගෙන යනවා. මැණියන්ගේ බලයෙන් මගෙන් ප්‍රතිකාර ගත්ත විදේශ රටක ජීවත්වන විශේෂඥ වෛද්‍යවරයෙක් මට ලබාදුන් ජීප් රථය තමයි මම දැන් පාවිච්චි කරන්නේ. සුව කළ නොහැකි බව කියන පිළිකා, ඒඩ්ස් වැනි රෝගවලටත් මගෙන් ප්‍රතිකාර ලබාගෙන සුව වූ අය සිටිනවා.

මගේ ළඟ ළමයි අට දෙනෙක් විතර උදවුවට හිටියා. මගේ ළඟ පෞද්ගලික ආරක්ෂාවට කිසිවෙක් හිටියේ නැහැ. මගේ අම්මා මගේ ආරක්ෂාවට සිටිනවා. මගේ ළඟ සිටින ළමයි මම බලා ගන්නවා. අවුරුද්දක කාලයක් බෙහෙත නොමිලේ දුන්නා. එන්නත් එනවත් එක්කම මී පැණි නැතිව බෙහෙත හදන එක නතර වුණා. මට කිසිම දෙයක් නැතිවුණා. ළඟ හිටපු අය නැති වුණා. ඒකෙන් කම්පා වෙලා මම හදිසියේම අසනීප වුණා.

මේ ඖෂධය විදේශීය රටවල් හතරක පහක පරීක්ෂණ තත්ත්වයේ තිබෙනවා. ඖෂධය ඒ රටවලට යවන්න නම් නියෝජිතයෙක් අවශ්‍ය බව කියනවා. මේ ඖෂධය දේශීය ආයතනවලිනුත් ඉල්ලුවා. ඒ අය බෙදා හරින්නම් කියලා. මේක දෙවියන්ගේ ඖෂධයක්. එහෙම ජාවාරම් කරන්න දෙන්න බැහැ. මතු බුදුවන භද්‍රකාලි මැණියන්ටපින්පිණිස මම පුළුවන් තරම් කාලයක් දේවාලයේදී බෙහෙත් කරනවා. ඉල්ලන කෙනෙක්ට දෙන්න දැනටත් මගේ ළඟ කොවිඩ්වලට හදපු බෙහෙත තිබෙනවා. පද්මාසනය සමග අඩි එකසිය පනස් හයක් විතර උස ලංකාවේ උසම සමාධි පිළිම වහන්සේ ඉදිකිරීමත් මගේ සිහිනයක්.

කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශයෙන් ලබාදුන් යන්ත්‍රය භාවිතයට නොගෙන මුල්ලකට දමා තිබූ අයුරු

වියපත් නොවන යොවුන් ලේඛිකාව

අනුල ද සිල්වා

පිටුව 31

රාජ්‍ය සාහිත්‍ය සම්මාන උළෙලට

බාලගිරි දෝෂයද

පිටුව 32

ප්‍රදේශයේ පරිසර නියෝජිතයන් ඉඩම පරීක්ෂා කරන මොහොත

සිංහරාජය ගැන භාග්‍යා කියන කතා ඇත්තද?

● තුෂාර හෙට්ටිආරච්චි

ගෙවිහිය දින කීපය තිස්සේ මෙරට පුරා කවුරුත් වැඩි අවධානයක් යොමු කළේ සිංහරාජ වනාන්තරය විනාශ කරන බවට පැතිර කතාවටයි. සැබවින් ම එවැන්නක් සිදු වන්නේ නම් එය බලවත් අපරාධයකි. සියලු සත්වයන්ගේ ජීවන පැවැත්ම උදෙසාත් පරිසරයේ සුන්දරත්වය සඳහාත් වනාන්තරයකින් සිදුවන්නේ සුවිශාල දායකත්වයකි. සිංහරාජය යනු ලෝක උරුම වනාන්තරයකි. එහි සුන්දරත්වය දැකීමට දෙස් විදෙස් ජනයා මහත් ප්‍රියතාවක් දක්වයි. ජෛව විවිධත්වයෙන් පිරුණු, ශ්‍රී ලංකාවට ආවේණික ශාඛ හා ඖෂධ වර්ග මෙන්ම සතා සිව්පාවුන් පවා ගහණ ප්‍රදේශයක් ලෙස සිංහරාජය සලකයි. ඒ විතරක් නොව අනුබුදු මිහිදු මාහිමියන් ද පරිසරය සුරැකීමේ වැදගත්කම පෙන්වා දුණි.

අපේ රටේ පරිසර සුන්දරත්වය වනසාලමින් වනාන්තර එළි කරමින් සංවර්ධනයේ මිරිඟුවක් පසුපස දුවන බවට විවිධ පරිසර සංවිධාන චෝදනා නඟයි. මෙවැනි වටපිටාවක් පසුගිය කාලය පුරාවට එවැනි මාතෘකා රැසක් කරලියට පැමිණියේය. එවන් ජනප්‍රිය කතාවකට මැතක දීම මාවත විවර වන්නේ රක්වාන කප්‍රුගස්වත්ත පදිංචි තරුණියක් වන භාග්‍යා අබේරත්න රූපවාහිනී වැඩ සටහනක් අතරතුර සිදු කළ ප්‍රකාශයත් සමගිනි. සිංහරාජ වනාන්තර මායිමේ අලිමංකඩ අවහිර වන පරිදි පරිසර පද්ධතියට හානි කරමින් හෝටලයක් ඉදි කරනවා යැයි ඇය මෙහිදී ප්‍රකාශ කරයි. ගස්වැල් කපා දමමින් දිය පහර අවහිර කරමින් සිංහරාජ මායිම සාහසික ලෙස වනසන අයුරක් ඉන් ගම්‍ය විය. අප ද එයින් මහත් කම්පනයට පත් වූයේ පරිසරය ආරක්ෂා කිරීම ජාතික වගකීමක් වන හෙයිනි. මේ ප්‍රකාශය ඔස්සේ සමාජ මාධ්‍ය මගින් විවිධ පුද්ගලයන් ඉලක්ක කර වාග් ප්‍රහාර එල්ලකර ගැනුනි.

එය සංවේදී ප්‍රකාශයක් ද විය. ඇගේ ඇස්වල පිරුණු කඳුළු සංවේදී හදවත් වැලඳ ගත්තේය. අනුකම්පා කළේය; ආදරය කළේය. මේ නිසා ම ඇත්ත දැන හෝ නොදැන ඇයව සුරැකීමේ මුවාවෙන් පෙනී සිටි සමාජ මාධ්‍ය වීරයන් රැසකගේද රැඟුම් දැක ගත හැකි විය. කොළඹ කේන්ද්‍රීය ජනප්‍රිය විරෝධතා සංස්කෘතියට පණ ලැබීද ගමේ උදවිය මේ ගැන වචනයක්වත් කීවේ නැත. ඒ ඔවුන් මෙහි යථා තත්ත්වය හොඳින් දන්නා හෙයිනි.

සිංහරාජය දැක නැති රත්නපුරයට පය ගසා නැති සමහරුන් අතරමං විය. මන්ද සිංහරාජ මායිම් හරි හැටි නොදන්නාකම විය යුතුය. මුවින් ගිලිහෙන සෑම වචනයකටම යම් අර්ථවත් බවක් පවතී. එහෙත් භාග්‍යා කළ ප්‍රකාශය එතරම් ම ගැඹුරින් ඇයට නොදැනෙන්නට ඇත. අප තව දුරටත් බෝටියතැන්න කතාවේ ඇත්ත නැත්ත සොයා යන්නට අදහස් කළෙමු. භාග්‍යා අබේරත්න පෙන්වා දෙන මේ ඉඩම පිහිටියේ රක්වාන පොතුපිටිය මාර්ගයේ රක්වාන දෙසින් පොතුපිටිය ට කිලෝමීටර් පහක් පමණ ගිය තැනයි.

" මෙය පුද්ගලික ඉඩමකි- අනවසරයෙන් ඇතුල්වීම තහනම් " යනුවෙන් සඳහන් දැන්වීමක් ඉඩමට ඇතුළු වන ස්ථානයේ සවිකර ඇත. එහි වූ ගේට්ටුව අසලට පැමිණි මා ඉඩම හිමිකරු සිටීදැයි ඇසුවේ ගේට්ටුව අසල සිටි ආරක්ෂකයාගෙනි. ඔහු ඉඩම මධ්‍යයේ ඇවිදිමින් සිටි තරුණයකු පෙන්වා මේ ඉන්නේ ඔහු යැයි පෙන්වීය.

" මේ ඉඩමේ අයිතිකරු ඔබද".. ඔව් මහත්තයා. එන්න ඇතුළට. ඒ අවසරයෙන්ම මා හට ඉඩමට ඇතුළු වීමට හැකි විය. මගේ ඊළඟ අභිප්‍රාය වූයේ මේ ඉඩමේ හිමිකාරත්වයේ නිරවද්‍යතාව පසක් කර ගැනීමයි.

ඒ අනුව ඉඩම හිමි ගයාන් ගුරුගේ සමඟ කෙළින්ම කතා බහට යෙමුවිය. ගයාන් කියන්නේ මෙම ඉඩම ඔහු මිලදී ගත්තේ 2020 ජූනි මාසයේ බවත් ඒ වන විට මෙහි මානම් සහ ඉළුක් වැනි තණකොළ වැවී තිබූ බවයි.

ඇයි මෙහෙම තැනක ඉඩමක් මිලදී ගන්න හිතුවෙ." පසුගිය වසරේ කොරෝනා වසංගතය හේතුවෙන් අපි ගෙදරටම කොටුවුණා. යන්න එන්න ජීවිතය විඳින්න තැනක් තිබුණෙ නෑ. ඒ නිසා අපි කල්පනා කළා මේ වගේ නිස්කලංක පරිසරයක විවේකීව ඉන්න තැනක් හදාගන්න. ඒ අනුව මගේ පවුලේ අක්කලා දෙන්නත් එක්ක පැරණි තේ වගාව සහිත මේ ඉඩම ගත්තා. ඊට පස්සේ අපි නියමිත අවසර ලබාගෙන කුඩා නිවාස තුනක් ඉදිකිරීම ආරම්භ කළා. අපි මේ ඉඩමේ එකම ගසක්වත් කැපුවෙ නෑ. අපි පරිසරය ට ආදරෙයි. ගස් නැති නිසා පැළ විශාල ප්‍රමාණයක් රජයේ පැළ තවාන් වලින් ගෙනැවිත් රෝපණය කළා. ඒ නිසා අපි ඉඩම හදන ගමන් ම ලස්සන ට ගස් වැල් වවලා මේ ඉඩම ගස්වලින් ම වහනවා. තව මාස කීපයකින් ආවොත් ඔබලාට බලාගන්න පුළුවන් වෙයි මෙහි සැබෑ තත්ත්වය. අපිට පුද්ගලිකව දොස් කිව්වාට අපි කලබල වුණේ නෑ. සත්‍යය ජයගනියි.

එහෙත් ඉඩමේ අයිතිය සම්බන්ධයෙන් සමාජයේ පළ වූ අදහස් අනුව එහි ඇත්ත නැත්ත සොයා බැලීම සඳහා අප මුණගැහුණේ දොලේකන්ද වසමේ ග්‍රාම නිලධාරී අමිත ධර්මසිරියි.

මොකක් ද මේ ප්‍රශ්නගත ඉඩම..?

මේක කලවාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දොලේකන්ද වසමේ පිහිටි බෝටියාතැන්න වත්ත කියන්නෙ මේකට. මේ ඉඩම 1961. මැයි මස 19 දින නිකුත් කර ඇති අංක 933 අවසන් ගම් සිතියමට අනුව අංක 84 බෝටියතැන්න මූකලාන බෙරගල කන්දෙපැනැල්ල මූකලාන බෝටියතැන්න එස්ටේට ගෝල්ඩන් ග්‍රෝ බෙරගල මූකලාන වශයෙන් මෙම ඉඩම හඳුන්වා තිබෙනවා. මීට අයත් භූමිය අක්කර 501 රූඩ් 1පර්චස් 17 ක් විශාලත්වයෙන් යුක්තයි. දැනට මේ කතා කරන කොටස හරියටම අක්කර හතයි රූඩ් තුනයි පර්චස් විසි විසිතුනයි දශම තුනයි දෙකක් විශාලය. මෙම ඉඩමට අයත් ප්‍රමාණය කොටස් කරුවන් තිදෙනකු ට අයිතියි.

මේ ඉඩම් කොටස සම්බන්ධයෙන් ඔබ දන්නා කරුණු ? මේක පැහැදිලිවම පුද්ගලික ඉඩමක්. ඒ ගැන තර්කයක් නෑ. මේ ඉඩමේ මායිමටත් එහායින් තවත් පුද්ගලික ඉඩම් කීපයක් ම පිහිටා තිබෙනවා. දැනට අවුරුදු තුනකට ඉස්සෙල්ලා එදා මේ ඉඩමේ හිමිකරු භුගත ජලය උඩට ගෙන ජලය බෝතල් කිරීමේ ව්‍යාපෘතියක් සඳහා අවසර ඉල්ලා තිබුණා. මෙහි තිබූ ගස් කපා දමා තියෙන්නෙ ඒ අවස්ථාවෙ. මෙයට විරුද්ධව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහ ගමේ උදවිය ගෙන ගිය සටන නිසා ඔහු ඉඩමත් විකුණලා යන්න ගියා. ඔවුන්ගෙන් වර්තමාන හිමිකරුවන් ඉඩම ලබා ගෙන තිබෙන්නෙ 2020 ජූනි මාසයේ. ඒ වන විට ඉඩමේ තිබුණේ විනාශ වී ගිය තේ සහ ඉළුක් සහිත කුඩා කැලෑවක්. එහි වටිනා ගස් කිසිවක් තිබුණේ නැහැ. එදා ඉඳලා ම ඉඩම සංවර්ධන කටයුතු කෙරෙනවා. පැළ වර්ග සිටුවා තිබෙනවා. තේ නැවත වගාව ආරම්භ කරලා. නමුත් එදා වතුර බෝතල් කර්මාන්තය පටන් ගත්තා නම් අද විශාල ජල ප්‍රශ්නයක්. එය නතර කර ගැනීමට ගමේම ජනතාව එකට එකතු වුණා. මේ ඉඩම සංවර්ධනය කරනවාට කවුරුත් විරුද්ධව ආවේ නෑ.

අප ඊළඟට ගියේ කලවාන ප්‍රාදේශීය ලේකම් සංජීවනී කන්ඩම්බි මුණ ගැසීමටයි. මොකක් ද මේ සිංහරාජ වනාන්තරය අයිනේ හෝටල් තුනක් හදන කතාව..?

ඔබ අහන්නෙ බෝටියතැන්න ඉඩම ගැනද..? ඔව්.

මෙම ස්ථානය මම පරීක්ෂා කළා. මෙහි ගස් කැපීමක් සිදුව ඇත්තේ මීට වසර කීපයකට පෙර ඉඩමේ හිමිකරුවන් අතින් බවයි තොරතුරු තිබෙන්නෙ. මෙහි කුඩා දිය පහරක් අවහිර කොට අක්කර කාලක විතර කුඩා පොකුණක් සාදා තිබුණා. මම උපදෙස් දුන්නා; එය ඉවත් කරන ලෙස. මේ වන විට එය සිදුවී තිබෙනවා. මෙකී දිය පාර මීට අවුරුදු දහයකට පෙර වෙනත් පැත්තකින් ගලා ගෙන ගිහින් තිබෙන්නෙ. වර්තමාන හිමිකරුවන් ඉඩම මිලදී ගනිද්දී දියපහර මෙම ඉඩම හරහා ගලා යාමට සලස්වා තිබෙනවා. නමුත් මේ ඉඩම මේ වන විට පැරණි තේ වගාව විනාශ වූ කොටස් නැවත වගා කටයුතු ආරම්භ කර තිබෙනවා.

පරිසර සංවේදී කලාප වල පිහිටි ඉඩම් සංවර්ධනය කිරීමේ දී නිශ්චිත ක්‍රමවේදයක් අනුගමනය කළ යුතුව තිබෙනවා නේද ?

ඔව්. නමුත් මෙම ඉඩම විනාශ වී ගිය පැරණි තේ වගාවක්. පාරිසරික වාර්තාවක අවශ්‍යතාව මතු වන්නේ අලුතෙන් ම කැලය කපා ඉවත් කරන අවස්ථාවකදි. පස ආරක්ෂා කිරීමට ගල්වැටි යොදමින් තිබෙනවා. මතුපිටින් පෙනෙන මට්ටමේ හානිදායක තත්ත්වයක් දැනට නැහැ. මේ පිළිබඳව අපි අවධානයෙන් සිටින අතර පරිසරය ට අහිතකර යමක් වේ නම් අවශ්‍ය නීතිමය පියවර ගැනීමට අපි පසුබට වෙන්නෙ නැහැ. භාග්‍යා අබේරත්න වැනි දරුවන් පරිසරය ගැන අවදියෙන් සිටීම හුගක් වැදගත්. මේ නිසා අලුත් පරිසර ආරක්ෂණ සංස්කෘතියක් රටේ බිහිවේවි. ඉතිරිව ඇති රජයට අයත් ඉඩම් හා වටිනා පරිසරය ආරක්ෂා කර ගැනීමට මේ අවස්ථාව ප්‍රයෝජනයට ගැනීම සුදුසුයි.

වනාන්තරයකට වග කියන රාජ්‍ය ආයතන කිහිපය අතරින් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව ප්‍රධාන තැනක් උසුලනු ලබයි. රත්නපුර අතිරේක අඩවි වන නිලධාරී සම්පත් වනිගසේකර පවසන්නේ භාග්‍යා දියණිය ඉදිරිපත් කළ ඉඩම බෝටියතැන්න නැමති ඉඩම නම් එය වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව ට අයත් ඉඩමක් නොවන බවයි. බොහෝ දෙනෙක් කතා කරනවා හෙක්ටයාර එකකට වඩා විශාල ඉඩමක් එළ පෙහෙළි කරනවා නම් ඊට වලංගු පාරිසරික බලපත්‍රයක් ලබා ගත යුතු බවට. නමුත් ගැටලුව වෙන්නෙ මෙම ඉඩම විනාශ වී ගිය පැරණි තේ වගා ඉඩමක් නිසා එවැනි අවශ්‍යතාවක් මතු වෙන්නේ නැහැ. මේ වන විට අයිතිකරුවන් තුන්දෙනෙක් විසින් නිවාස තුනක් ඉදිකරනවා. හුඟ දෙනෙක් මෙය සිංහරාජ වනාන්තරය යැයි කියා කරන අර්ථකථනය සාවද්‍යයි. නමුත් අපි සිංහරාජ පරිවාර වනාන්තර ආරක්ෂා කළ යුතුයි. දැනට පවතින අණපනත් සමඟ මෙසේ තර්ජනයකට ලක්ව ඇති ඉඩම් හඳුනා ගැනීමට අවශ්‍ය පියවර ගෙන තිබෙනවා.

රටේ මෙච්චර සංවාදයට ලක්වූ බෝටියතැන්න ඇත්තටම ගමේ මිනිස්සුන්ට ප්‍රශ්නයක් නැද්ද..?

අප විමසුවේ ගම්වැසියකු වන රඹුක කෝපිකැල්ල රක්වාන පදිංචි එස්.කරුණාදාස (60) ගෙනි.

කලවාන ප්‍රාදේශීය සභාවේ උඩපත්තුව දොලේකන්ද වසම බෝටියතැන්න ඉඩම අක්කර තිස්හයක්. මෙහි තේ වගා කර තිබුණේ වසර තිහකටත් පෙර. අපේ ආතලා මුත්තලා තමයි ඒව කරල තියෙන්නෙ. අක්කර හතහමාරක් පුද්ගලයන් තිදෙනෙකු විසින් අරගෙන තිබෙන බවයි ආරංචිය. මෙහි නිවාස තුනක් ඉදි වෙමින් පවතිනවා. නමුත් ඔවුන් පරිසරය ට හානියක් නොවන ලෙස අදාළ ඉඩම් සංවර්ධනය කිරීම සතුටට කරුණක්. කුකුල් කෝරලය සහ අටකලන්කෝරලය වෙන් වෙන්නෙත් මෙම ප්‍රදේශයෙන්.

සිංහරාජ වනාන්තරය ආශ්‍රිතව සැරිසරන අලියකු මේ ප්‍රදේශයේ ආසන්නයේ රැඳී සිටින්නෙ නැහැ. ප්‍රධාන මාර්ගයේ ගොස් ටික දුරකින් නැවත වනයට යනවා. මම ගමේ කෙනෙක් හැටියට මේ ඉඩම තුළ පරිසරය ට හානියක් වෙනව නම් ඒකට එකෙන්ම අකමැතියි. නමුත් දැනට මෙම ඉඩම් වල අයිතිකරුවන්ට මෙම ඉඩම ලැබීමත් පරිසරයට වෙච්චි ආශීර්වාදයක්.

මෙම ඉඩමටත් එහා කැලය පැත්තට වෙන්න තවත් පුද්ගලයන් සතු පුද්ගලික ඉඩම් තියෙනවා. ඒවත් සංවර්ධනය වෙනවා. නමුත් කිසිවකු ඒ ගැන කතා කරන්නෙ නෑ.අපේ රටටම වෙලා තියෙන දේ මේ කාරණයෙන්වෙලා තියෙන එක පැහැදිලියි.කොතනකින් හරිඅනුල ගත්ත සටන් පාඨයක් එක්ක රට ගිනි තියන එක එදත් වුණා .අදත් අපූරුවට ඒක සිදු වෙනවා.නමුත් පරිසරය ට හානියක් වෙනවනම් ඉස්සෙල්ලා ම පාරට බහින්නෙ මම.මොකද මීට පෙර අයිතිකරුවන් කරන්න ගිය අපරාධය වැළැක්වීම ට අපි දිවිහිමියෙන් කැපවුණා. හමුදාවෙ කර්නල් කෙනෙක් ඇවිත් මේ ඉඩමේ තිබුණු කුඩා ගස්ටික ඔක්කොම කැපුවා. ජල බෝතල් කිරීමේ ව්‍යාපෘතියක් කරන්න. ගම්මුන් ඒකට විරුද්ධව කටයුතු කළා. රාජ්‍ය ආයතනවල නිලධාරීන්ටත් විරුද්ධව අපි කතා කළා. නමුත් දැන් කරන්නෙ ඉඩම සංවර්ධනය කිරීමක්.

වන විනාශය පිළිබඳව දියණියක් ලෙස භාග්‍යා නැගූ හඬ නිසා රට අවදි විය. මේ දියණිය බිහිකළේ රත්නපුර ගොඩකවෙල රාහුල ජාතික පාසලයි. පාසලේ විදුහල්පති ඉන්ද්‍රාණි විජේලතා මේ ප්‍රශ්නය ගැන මෙසේ පැවසීය.

"භාග්‍යා අබේරත්න දියණිය 2020 වසරේ අපොස උසස්පෙළ විභාගයට ගණිත අංශයෙන් පෙනී සිටියා. ඇය අපේ පාසලට පැමිණෙන්නේ පහ වසර ශිෂ්‍යත්ව විභාගය සමත් වීමෙන්. පාසලේ හොඳින් කැපී පෙනෙන දරුවෙක්. අනාගතයේ මෙවැනි දරුවන් රටට අවශ්‍ය වෙයි.ඒ වගේ ම ඇය හරිම සංවේදී දරුවෙක්. එදා ඒ දරුවා රූපවාහිනී වැඩ සටහනේ දී කළ ප්‍රකාශයේ දිග පළල හෝ බරපතළකම සම්බන්ධයෙන් මම අදහස් කතා කරන්නෙ නැහැ. අපි මුවින් පිට කරන සෑම වචනයක් ම වගකීමෙන් කියන්න පුරුදු වෙන්නත් ඕන.

එහෙත් දැන් භාග්‍යා අබේරත්න දියණිය පවසන්නේ මෙවැනි කතාවකි.

" එදා ගමේ තමන් සමඟ කතා කළ පිරිස අද ගොඩක් ඈත් වී ඇති බව ඇය කියයි. බලනකොට මේ කැලෑ විනාශය පිළිබඳ ප්‍රශ්නය තිබිල තියෙන්නෙ මට විතරයි, මගේ පැත්තට ගමේ කවුරුත් කතා කරන්නෙ නෑ. මට දැන් නම් බාහිර ආයතන වල නිලධාරීන් ගෙන් කිසිම බලපෑමක් එන්නෙ නෑ. පොලිසියේ මහත්වරු ඇවිත් තර්ජනය කළා කියලා ප්‍රචාරය වුණා. රක්වාන පොලීසියේ මහත්වරු දෙදෙනෙක් ඇවිත් විස්තර ඇහුවා. මට කිසි තර්ජනයක් කළේ නෑ. කළු වඳුරා අපේ වත්තට කෑම කන්න එනවා. කළු කොටියා ඉන්නවා කියලා ගමේ අය කියනවා. මම නම් දැකලා නෑ. ඒත් ගෝනුන්, මුවන්, ඕළුවා, ඉත්තෑවා වගේ සත්තු ගොඩක් ඉන්නවා. ඒක දේශික සත්වයන් වන හඳපාන්ඇල්ල මැඩියා සහ අංකටුස්සා මේ කැලේ ඉන්නෙ. ඉඩම කාගෙද කියලා මම දන්නෙ නෑ. අදාළ බලධාරීන් ඒවා බලා ගනියි'

දැන් තත්ත්වය මෙසේ වන අතර භාග්‍යා ගේ වචන කිහිපයට රටේ මහා කලබැගෑනියක් ඇති වී හමාරය. කවුරුන් කෙසේ කීවත් අසන්නා සිහිබුද්ධියෙන් ඇසිය යුතු බව පමණක් අපි අවධාරණය කරමු.

'රක්වාන පොලිසියේ මහත්වරුන් හෝ රජයේ කිසිම නිලධාරියෙක් මට තර්ජනය කළේ නෑ.. කළු කොටියා නම් මම කවදාවත් දැකලා නැහැ...'
- 19 හැවිරිදි භාග්‍යා සිය නිවසේදී සිළුමිණට කියයි

'භාග්‍යා සිටි රූපවාහිනී වැඩසටහනේ දිග පළල හෝ බරපතළකම මම කතා කරන්නේ නැහැ. ඒත් අපි මුවින් පිටකරන සෑම වචනයක්ම වගකීමෙන් කියන්න පුරුදු වෙන්න ඕන...'
- භාග්‍යා අධ්‍යාපනය ලබන ගොඩකවෙල ජාතික පාසලේ විදුහල්පතිනිය පවසයි

ඉඩම් හිමියා සිය ඉඩමේ ගස් වහා කර තිබුණේ මෙසේය

වමේ සිට - ඉඩම හිමි ගයාන් ගරුගේ, කලවාන ප්‍රාදේශීය ලේකම් සංජීවනී කන්ඩම්බි, දොලේකන්ද ග්‍රාම නිලධාරී අමිත ධර්මසිරි, අතිරේක දිස්ත්‍රික් අඩවි වන නිලධාරී සම්පත් වනිගසේකර සහ රත්නපුර ගොඩකවෙල රාහුල ජාතික පාසලේ විදුහල්පතිනි ඉන්ද්‍රාණි විජේලතා

● නිශානී හේරත් බන්නැහැක

මුහුදේ ගිලෙන ජීවිත 173 ක් සිය දෑතින් බේරූ චන්ද්‍රපාල

කින්රෝස් ක්ලබ් එකේ මේ සේවාව නිසා මුහුදේ ගිලිණු ජීවිත බේරුණු වාර අනන්තයි.

රදිය වළල්ලට මැදිවූ මුතු ඇටය වන ශ්‍රී ලංකාවේ පිහිනීමට හැකියාව ඇත්තේ අතළොස්සකට වුවත්, ලෝකයේ අනිකුත් රටවල් හා සසඳන විට ඒ සුළුතරය පිහිනීමට සැබෑ හපන්නුය. ලෝකයේ බොහෝ රටවල් සමඟ තරග වදිමින් ඔලිම්පික් රන් පදක්කම් පවා දිනා ගැනීමට ශ්‍රී ලාංකික පිහිනුම් ක්‍රීඩක ක්‍රීඩිකාවන් සමත්වී ඇත. පානදුරේ එස්.එම්. චන්ද්‍රපාල (66) මුහුදේ පිහිනීමේ සැබෑ දක්ෂයෙක් වන අතර ඔහු විසින් එදා මෙදාතුර බේරාගෙන ඇති ජීවිත ගණන 173 පමණ වේ. චන්ද්‍රපාල සේවය කරන්නේ වැල්ලවත්ත දුම්රියපළ සීමාවේ මුහුදු පැත්තට වන්නට ඉදිකර ඇති කින්රෝස් ස්විමින් ඇන්ඩ් ලයිෆ් සේවින් ක්ලබ්' ආයතනයේ ය.

මේ ආයතනයේ ඉතිහාසය මින් දශක අටකටත් එහා ගිය එකකි. වැල්ලවත්ත පාලමට එහා බිංතඹුරු හා කඳුරු ගස් ගොන්නකි. මුහුදට සමීපව එම තුරු සෙවණේ ඉදිකළ පොල්ඇතු පැල බීච් වාඩිය නම් වේ. බීච් වාඩියේ හිමිකරු වූයේ මයික් සිරිමාන්නය. ඔහු ගුවන් හමුදාවේ විශ්‍රාමික නිලධාරියෙකි. මුහුදේ පිහිනීමට දක්ෂයෙක් වන මයික් එය විනෝදාංශයක් කරගත් අයෙකි. බීච් වාඩිය සමීපයේ මුහුදේ ගිලෙන අයගේ ජීවිත බේරා ගැනීම ඔහුගේ පුරුද්දක් විය. මුහුදේ පිහිනීමට හා පිහිනීමට ගොස් අනතුරට පත්වන අයගේ ජීවිත බේරාගැනීමට, තවත් කිහිප දෙනෙක් ඔහු හා එක්වූහ. මෙහි කථානායක චන්ද්‍රපාල මීට සම්බන්ධ වූයේ 1978 වසරේදී ය. ඒ බීච් වාඩියට නොව ඒ වෙනුවට 1977 වැල්ලවත්ත දුම්රියපළ සමීපයේ පිහිටවූ මේ කින්රෝස් ක්ලබ් එකට ය. හැට හය හැවිරිදි චන්ද්‍රපාලගේ ගම පානදුරේ ය. අධ්‍යාපනය ලැබුවේ පානදුරේ ශාන්ත අන්තෝනි කතෝලික පාසලෙනි. පාසල අහවර වී නිවසට පැමිණ පානදුරේ ගඟේ නෑම, ඔහුගේ සතුටයි. පාසලේ නිවාසාන්තර තරගවලින් හා යෞවන සමාජ වොලිබෝල්, පාපන්දු තරගවලින් ඔහු ජය පිට ජය ලැබීය. අ.පො.ස.සා.පෙළ දක්වා ඉගෙන ගත් ඔහු පාසල් ගමනට ආයුබෝවන් කීවද පිහිනුම් හා ජීවිතාරක්ෂක සේවය හා හාපුරා කියා ඇරඹීය. ඒ පානදුරේ සිලනියම් ක්ලබ් එකෙනි. ක්ලබ් අතර, තරගවලට හා ග්‍රාම සේවක මට්ටමේ තරගවලින් ජය ලැබීමට ද දක්ෂයෙක් විය. ඔවුන්ට පිහිනුම් පුරුදු කිරීමට කොළඹ ශ්‍රී ලංකා ජීවිතාරක්ෂක සංගමයේ සාමාජික පොලිස් සැරයන් පියදාස සිල්වා සැදී පැහැදී සිටියේය. චන්ද්‍රපාලගේ දක්ෂතාවන් නෙත ගැටුණු පියදාස සිල්වා ඔහුව 'කින්රෝස් ස්විමින් ඇන්ඩ් ලයිෆ් සේවින්' ආයතනයට හඳුන්වා දුණි. ඒ 1970 දශකයේ අවසාන භාගයයි.

වැල්ලවත්ත මුහුදු සීමාවේ සැතපුමක් වපසරිය ඔවුන්ගේ රාජධානියක් විය. මුහුදුදේ රළු පරළු බව, මට සිලුටු බව, රැලි ඇදෙන ස්වභාවය, ජලයේ පැහැය දිගු කාලයක් නිරීක්ෂණය කිරීමෙන් දැන් ඔවුහු මුහුද ගැන හොඳින්ම හඳුනති. කින්රෝස් නිර්මාතෘ මයික් සිරිමාන්නයන් අවුරුදු 75 ක් ම මුහුදේ පිහිනීමෙන් ප්‍රීති විය. අවසාන භාගයේ ඔහු කින්රෝස් ක්ලබ් එකේ පොල් රුප්පාව අසල පුටුවක වාඩි වී තමන්ගේ පසු පරම්පරා කීපයකට පසු උපන් කොලු ගැටවු මුදේ නාන හා පීනන අයුරු බලා හිටියේ සැනසුම් සුසුම් හෙළමිනි.

මයික් සිරිමාන්නයන්ගේ පිහිනුම් හා ජීවිතාරක්ෂක සේවා සංගමයට එක්වූ චන්ද්‍රපාලට මුල් ම රුකියාව ලැබුණේ කොළඹ මධ්‍යම තැපැල් නුවමාරුවේය.

ලියුම් තේරීමට ගිය චන්ද්‍රපාල පසුව තැපැල්කරුවූ අතර කොළඹ 12 ප්‍රදේශයේ ලියුම් බෙදුවේ ය. රැකියාව අහවර වූ පසු ඔහුගේ නිවහන වූයේ කින්රෝස් ක්ලබ් එකයි. මෙයින් ගෙවීමක් නොලැබුණ ද ආහාර පාන, විටමින්, පලතුරු, පෝෂ්‍යදායී ආහාර මෙන් ම ගමන් ගාස්තුවක් ද ලැබුණි. මේ හැමදේටමත් වඩා පිහිනුම් හා ජීවිතාරක්ෂක පුහුණුව ගැන ලැබුවේ මහත් අත්දැකීම් සමූහයකි.

ඒ 1982 සන්ධ්‍යා වරුවකි. අතොරක් නොමැති ඇත දියඹ දෙස චන්ද්‍රපාල බලා සිටියේ මුහුදු ළඟ වැල්ලේ ඉදිකළ කොට බිත්තියකට බරවී ගෙන ය. ඔහු ඇඳ සිටියේ කොට කලිසමකි. කොහොමත් ඔවුන් අඳින්නේ කොට කලිසමක් හා ටීෂර්ටයකි. එක්වරම මුහුදේ පීනමින් සිටි තරුණයෙක් දැක් ඔසවන අයුරු හා මූදේ ගිලෙන බව නිරීක්ෂණය කළ චන්ද්‍රපාල අසුරු සැණින් මුහුදට පැන ක්ෂණයකින් ඔහු වෙත ළඟා වී දැත්වලින් ගොඩට ඇදගෙන ආවේය. තරුණයා කටින් වතුර දමයි. මූලික ප්‍රථමාධාර ලබාදී ගිලන් රථයක් ගෙන්වාගෙන හනිකට තරුණයා රෝහල් ගත කළ නිසා ඔහුට ජීවත්වීමට වාසනාව ලැබුණි. ඒ ඔහු විසින් ජීවිතය බේරාගත් පළමු වැන්නා ය. එම තරුණයාගේ වයස අවුරුදු 29 කි.

ජීවිතයක් බේරා ගැනීමෙන් ඔහුට ඇතිවූයේ නිම් හිම් නැති සතුටකි. ඒ සතුට මිල කළ නොහැකි ය. දිනක් කඩපළේ කෙනෙක් daily news පත්තරේ කියවමින් සිටියේය. අන්තිම පිටුවේ තිබූ Life Guard vacancy ඔහුගේ නෙත ගැටුණේ අහම්බෙනි. සාරතී එන්ටප්‍රයිසස් වෙතින් 'ඩුබායිවල ජේබල් අලි' තරු පහේ හෝටලයේ හිමිකරුගේ දියණියගේ ජීවිතය බේරා ගැනීමේ දුර්ලභ අවස්ථාව චන්ද්‍රපාලට ලැබුණි. ඒ නිසා ම එහි වසර 17 සේවය කිරීමට ද අවස්ථාව උදා විය. මුහුදේ ගිලුණු තවත් පිරිමියෙක් හා කාන්තාවක් ද බේරා ගැනීමට එහිදී ඔහු සමත් විය. හම්බ කළ සල්ලිවලින් ඔහු ගේ දොර හදාගත්තේ ය. ඔහු ගියේ මුලින් ම රු. 12000 වැටුපට ය. නැවත එන වකවානුව වනවිට ඔහුගේ මාසික වැටුප රු. 80000 විය.

ඔහු ඩුබායිවලටත් පිහිනීමේ හා ජීවිත රැක ගැනීමේ කලාව කියා දුන්නේ ය. ජීවිත බේරා ගැනීමට එහි තිබුණේ රිටි පමණි. ටෝපිඩෝ ඇතුළු ජීවිතාරක්ෂක උපකරණ ඕස්ට්‍රේලියාවෙන් ගෙන්නා ගැනීමට හෝටලය තීරණය කළේ ඔහුගේ ඉල්ලීමටය.

චන්ද්‍රපාල නැවත ලංකාවට පැමිණියේ 2008 දී ය. නුගේගොඩ සංගීත පිහිනුම් තටාකයේ හා ඩී.එස්. සේනානායක විද්‍යාලයේ දරුවන්ට පිහිනුම් පුරුදු කළේය.

ඒ මොන දේ කළත් වැල්ලවත්ත කින්රෝස් ආයතනයට පැමිණීම ඔහුගේ දෛනික ජීවිතයෙන් කොටසක් විය. වසර ගණනාවක් තුළ ජීවිතයේ විවිධ වයස් බාණ්ඩයන් තුළ ඔහු ජීවිත 175 පමණ බේරා ඇත. ඒ අතරින් ළමයි 70 කි. ඉතිරි අය පිරිමින් ය. කාන්තාවන් නැති තරම් ය. චන්ද්‍රපාල බේරාගත් වයස වැඩිම පිරිමියා අවු. 45 වන අතර කුඩාම ළමයාට අවුරුදු 14 කි. එහෙත් පිහිනුම් කරුවන් රැසක් සමඟ වැල්ලවත්ත මුහුදේ පීනමින් සිටි අවු. 15 පමණ පිරිමි දරුවකුගේ ජීවිතය අවාසනාවන්ත ලෙස නිමා වූ කථා පුවත චන්ද්‍රපාලයන් මෙසේ මතකයට නැඟීය.

"එදා අන්න අතන අපි සේරම කට්ටිය මුහුදේ පීනමින් හිටියේ එක පාරටම ලොකු රැල්ලක් ආවා. මේ දරුවා අතුරුදහන් වුණා. එදා මූදේ වතුරත් බොර පාටයි. පතුල පැහැදිලිව පේන්නේ නෑ. අපි සේරම මූද පීරමින් ළමයා හෙව්වා. එක්කෙනෙකුගේ කකුලට ළමයව පැගිලා ගොඩට ගේනකොටත් නැතිවෙලා. ඒ වගේම කෙනෙක්ව ගිලෙන්න යනවා නම් ඔහුගේ ඉරියව්වලින් අපි තේරුම් ගන්නවා. මූදේ සද්දෙට කෑ ගැහුවත් ඇහෙන්නෙ නෑ. ඒත් අත් දෙකට ගසනවා. සමහරු එක අතක් ඔසවනවා. යට යනවා ආයේ උඩ එනවා. තුන් පාරක් උඩ ඇවිත් යට ගියොත් ආයෙත් උඩ එන්න අමාරුයි. සමහරු ඒ සීමාවෙම ගිලෙනවා. සමහරු රැල්ලත් එක්ක යටින් දියඹට ඇදිලා යනවා. සමහරුන්ට නිවැරැදිව පීනන්න හැකි වුණත් සමහරුන්ට බැහැ. එහෙම අය මූදේ අඩිය ගහලා හිටගන්න බලනවා. මූද ගැඹුරු නම් හිටගන්න බෑනේ. ගිලෙන කෙනෙකුගේ අන්තිමට දකුණු අත පමණයි උඩට එන්නේ. ගල්කිස්ස මුහුදේ රැල්ල වැඩි නිසා ඉක්මනට ගහගෙන යනවා. වැල්ලවත්තේ රැල්ල ඒ තරම් සැර නෑ. හැබැයි ගැඹුර වැඩියි."

දවසක් අර මූදට ගෙනත් දාලා තියන දිරන නැව් ඇන්ජිම ළඟ කෙනෙක් පීනන කොට ගිලෙනවා දැකලා අපි ගැඹුරින් පීනලා ගිහින් බේර ගත්තා. ඔහු මීමැස්මෝර රෝගියෙක්. සමහර අයව කණ්ඩායමක් ලෙසත් තවත් අයව තනිවම ගිහිල්ලත් බේර ගන්නවා. ගිලෙන්න යන කෙනෙක් බේරගන්න ගිහාම අතින් ඇදගෙන එනවාට වඩා මේ උපකරණය පැලඳගෙන ගිහින් බේර ගැනීම තමයි හොඳම ක්‍රමය. "

එදා මෙදා තුර ජීවිත බේරාගත් අයගෙන් තුටු පඬුරු පාත්කුඩම් ලැබුණේ නැද්දැයි මා ඇසුවෙමි.

"ජීවිතයක් බේරලා අපි සල්ලි බලාපොරොත්තු වෙන්නෙ නම් නෑ. ආත්ම තෘප්තිය, පින වටිනවා. එහෙම කවුරුත් සල්ලි දීලා නෑ. පින් දෙනවා. වඳිනවා. දවසක් මෙහෙට ආපු මුස්ලිම් කෙනෙක්ගේ රු. 80,000 ජංගම දුරකථනයක් වැටිලා තිබිලා අහුලලා දුන්නා. මට කේක් එකක් ගෙනත් දුන්නා. පිහිනුම් හා ලයිෆ් සේවින් ඉගෙන ගන්න මෙහෙට එන ළමයින්ගෙන් නම් අය කිරීමක් කරනවා. ඒත් නැති බැරි අයට නොමිලයේ උගන්වනවා. නුගාක් පාසල්වල ළමයි පිහිනුම් පුරුදු වුණාට තරගවලට යවන්නේ සීමිත ගණනක් නිසා මෙහෙ පුරුදු වෙලා ක්ලබ් එකට සෙල්ලම් කරනවා. ක්ලබ් එකේ සාමාජික වුණාම ඉගෙන ගන්නයි ක්‍රීඩා තරග කරන්නයි දෙකම පුළුවන්. මේ ක්ලබ් එකෙන් ලොකු සේවයක් කරනවා. පොලිස් ජීවිතාරක්ෂක අංශයේ D.I.G චූලසිරි මැදිහත්වී පොලිසියේ අයට පිහිනුම්, කිමිඳුම්, ජීවිතාරක්ෂක සේවා පුහුණු කරනවා. අපි උදේ 8 සිට සවස 6.00 තුරු නාන අය ගැන විමසිල්ලෙන් ඉන්නේ. මූද සැර නම් රතු කොඩිය දානවා. ඒත් ඒවා නොතකා ගිහින් සමහරු ජීවිත නැති කරගන්නවා. මෙහි කළමනාකරු ශිවන්ත ක්ලබ් එක ගැන තොරතුරු අප හා බෙදා ගත්තේ ය.

චන්ද්‍රපාලට ලැබුණු සහතික සම්මාන, කුසලාන, පදක්කම් මහා ගොඩක් මේසයක් මත විය. ඒ අතර ඩුබායිවලදී ස්නුකර් හා බිලියඩ් තරගවලින් ලැබුණු කුසලාන 22 කි. කොතරම් කුසලාන සහතික ලැබුණ ද කිසිදු මුදල් ත්‍යාගයක් මේ වනතෙක් ඔහුට ලැබී නැත. සමහර කුසලාන ද ප්‍රදානය, කිරීමෙන් මාස කීපයකට පසු ඊළඟ වසරේ දිනන අයට දෙන්න ඉල්ලා ගන්නේ ඒ ඒ ක්‍රීඩා සමාජ හා ක්ලබ් වලිනි. දිවයින පුරා තියන ක්ලබ්වල විවෘත තරගවලට ඉදිරිපත් වීමේදී අනිත් තරගකරුවන්ගෙන් ඇහෙන්නේ හින්ටි පහරවල්ය. "ආ... අදත් ආවද? තවත් පීනනවද? ඔයා ඉන්නකම් අපිට චාන්ස් එකක් නෑ" යනුවෙනි.

නේපාලය, ඉන්දියාව, පිලිපීනය වැනි රටවල් සමඟ සසඳන විට ලංකාවේ පිහිනුම් හා ජීවිතාරක්ෂක කලාව ඇත්තේ ඉදිරියෙනි. නිදහස් ආර, ළය ආර, සමනල ආර හා පසුපස ආර නමින් පිහිනුම් ක්‍රම සතරකි. එක් එක් අයගේ හැකියාවන් ඇත්තේ වෙනස් අංශවලටය.

චන්ද්‍රපාලගේ බිරිය සිරියලතා මල්වානගෙන් ඔහුට ලැබෙන්නේ නොමද සහායකි. ඔහුට කසුන් ජලංජ හා දිල්හාරා ජීවනී නම් තරුණ දරුවෝ වෙති.

ඔහුගේ ජීවිතය බැඳී ඇත්තේ ලයිෆ් සේවින් සමඟය. දවසක් මූදේ ටියුබ් මත නාමින් සිටි දෙදෙනෙක් අනතුරට පත්වන විට දෙදෙනාම එකවර රැගෙන ඒමේදී චන්ද්‍රපාලගේ කකුල ගල් පරයක වැදී තුවාල විය. ඔහුට මුහුදේ සැතපුම් 2 - 6 අතර ප්‍රමාණයක පිහිනිය හැකි ය.

ඔහුගේ ලිපිනය
10/19, ඉඹුල්හිය.
ශාන්ති මාවත, අළුබෝමුල්ල, පානදුර.
දූ.ඇ. - 0774675656

සේයාරූ - විමල් කරුණාතිලක

● නුවර එළිය
ඩබ්ලිව්. එස්. හෙට්ටිආරච්චි

මුනිසිරිපා වන්දනාවේ අපේ උරුමය කියැවෙන අඹගමුව සෙල්ලිපිය

අවුරුදු දහස් ගණනාවක් හය මාසයකට ආසන්න කාලයක් ලක්ෂ ගණනාවක පුද පූජාවට ලක්වූ සිරිපාද පුදබිම 2019-2020 වන්දනා සමය කොරෝනා වයිරසය නිසා අතරමගදී නතර කර දමන්නට සිදු විණි. එහෙත් ශ්‍රී ලංකාවාසී බෞද්ධ හා අනෙකුත් ආගමිකයන්ටත් අද සමනොළ පුදබිම වන්දනා කරගැනුමට අවකාශය ලැබී ඇත. එය අප කවුරුත් ලැබූ වාසනාවකි. මේ මුනිසිරිපා වැඳ ගන්නට යන කාලයයි. සිංහල දමිළ අලුත් අවුරුද්දට පෙර සිරිපා වැඳ ආශිර්වාදය ලබා ගැනීම අපේ ගැමියන්ගේ මතක නුරු පුරුද්දකි. 2021 මාර්තු 28 මැදින් පොහොය ශ්‍රී පාද වන්දනා සමයේ සුවිශේෂ දිනය වේ. කොරෝනා වයිරසය හමුවේ ඇති සෞඛ්‍ය නිතිරීති අනුව මෙවර මේ උදාර වන්දනා ගමන සංවිධානය කර ඇත.

මේ සිරිපා වන්දනා ගමන ගැන පොලොන්නරු රාජ්‍ය සමයේ පළමුවන විජයබාහු රාජ රාජ්‍ය අනුග්‍රහය ලබාදෙමින් සටහන් කළ අඹගමුව සෙල්ලිපිය දැන හඳුනාගතහොත් එය සිරිපා වන්දනා ගමන තවත් අර්ථවත් වනු ඇතැයි සිතේ.

මුහුදු මට්ටමින් අඩි 7360 ක් උසින් යුතු සිරිපා පුදබිම ශ්‍රී ලාංකික බොදුනුවන්ට පමණක් නොව ලෝක වාසී බොදුනුවන්ගේ මහත් වූ ගරු බුහුමන් ලබන ආගමික ස්ථානයකි. අප දන්න තරමින් පුණ්‍ය භූමියක් කේන්ද්‍ර කරන්ගෙන වාර්ෂිකව සය මසක් සිදු කෙරෙන වන්දනා ගමන නම් සිරිපා වන්දනා ගමන විය හැකිය.

සමන්ත කූඨ පර්වතය මුඳුනේ වූ මුනි සිරිපා පාද පත්මය මත නළල තබා වන්දනා කිරීමට යෑම අති දුෂ්කර ගමනකි. ඒ නිසාම මේ උතුම් වන්දනා ගමන රාත්‍රී කාලයේ සිදු කිරීමට අපේ පැරැන්නන් කටයුතු කර ඇත. ඒ අනුව අද දක්වාම රාත්‍රී කාලයේ මේ වන්දනා ගමනට බැතිමත්නු එකතු වෙති. අද දවසේ සිරිපා -වන්දනා ගමනට විවිධ වූ පහසුකම් එකතු වී ඇත. එහෙත් එදවස මේ වන්දනා ගමන අති දුෂ්කර කටයුත්තකි. අපේ පැරැන්නන් මේ උතුම් වන්දනා ගමනට යටගියාවේ එකතු වී ඇත්තේ ගේ දොර හරකාබාන ආදී තමන් සතු සියලු වස්තූන් තම දූ දරුවන්ට පවරා දීමෙන් පසුවය. සිරිපා වන්දනා ගමන කොතෙක් දුෂ්කර එකක්ද යන්න එයින් තේරුම් ගත හැකිය. ඒ පිළිබඳව මනාව කියන සටහනකි නුවරඑළිය අඹගමුව සෙල්ලිපිය.

නුවරඑළිය, අඹගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගිනිගත්හේන නගරයේ සිට නාවලපිටිය මාර්ගයේ නය වන සැතපුම් කණුව අසලින් වම් පසට හැරී උඩබුලත් ගම තුළ යාර 400 ක් පමණ දුර ගිය තැනදී මහ කළු ගල් තලා කීපයක් අපට දිස් වේ. මෙම ගල්තලා අතර ගල් කුලුනු දෙකක මනාව ලියැවුණු සටනක් අපට දැකගත හැකිය.

අඟල් 4 ක් පමණ දුරින් ඉරි ගසා ලියූ සටහන් පළමු ගල තුළ පේළි 33 ක්ද දෙවන ගල මතුපිට අක්ෂර පේළි 25 ක්ද දැකගත හැකි අතර ඉතා කතාව පෙන්නුම් කරන අර එහි දැක්වේ.

ශ්‍රී පාද වන්දනා ගමනට අදාළ බොහෝ කරුණු මෙම අඹගමුව සෙල්ලිපිය තුළ අඩංගු වී ඇත.

එදවස මේ උතුම් පුදබිම වන්දනා කිරීමට මේ පුංචි ශ්‍රී ලංකාවේ සතර දිගින් බැතිමතුන් පාගමනින් පැමිණ ඇත්තේ අති දුෂ්කර ලෙස මාස ගණන් ගත කිරීමෙන් පසුවය. ඇතැම් විට එය එදා වට වන්දනාවටද ඇතුළත් වන්නට ඇති බව සිතිය හැකිය.

අවුරුදු දහස් ගණනකට පෙර පළමු විජයබාහු රජ දවස 1055-1110 අතර කාලයේදී ඇති වූ ආගමික ප්‍රබෝධය හේතුකොටගෙන පළමු විජයබාහු රජතුමා විසින් මෙම සෙල්ලිපිය පිහිටුවා සිරිපා වන්දනා ගමනට පූර්ණ රාජ්‍ය අනුග්‍රහය ලබාදුන් බව මෙම අඹගමුව සෙල්ලිපිය කරුණු කියයි. සිරිපා පුණ්‍ය භූමිය වන්දනා මාන කරන පිළිවෙත් හා ඒ වෙනුවෙන් පැවරූ නිත්දගම් පිළිබඳව මේ සෙල්ලිපිය සාක්ෂි දරයි.

සිරිපාදය

ඇත දුර බැහැර සිට සිරිපා වන්දනාවට පැමිණෙන වන්දනාකරුවන්ට ගමනේ දුෂ්කරතාව මත ගිමන් හැර මනා සෞඛ්‍ය තත්ත්වයකින් සිරිපා කරුණා කිරීමට අවැසි කායික ශක්තිය ලබාදීම අරමුණු කරන්ගෙන පළමු විජයබාහු රජු සිරිපා පුදබිමේ සිට ගව් පහක් දුරට ගව්වෙන් ගවට ගිමන්හල් ඉදිකොට බෙහෙත් හල් සකසා දින ගණනාවක් වන්දනා කරන්නන්ට විවේක ගන්නට අවකාශ සලසා ඇත. ඒ සමගම ඔවුන්ට බත බුලතින් සංග්‍රහ කළ යුතු බවත් ඔවුන්ට ආවතේව කළ යුතු බවත් එම හැම කටයුත්තක්ම තමා වෙනුවෙන් ඉටුකළ යුතු බවට රජු විසින් නියෝගයක් ලෙස මෙම සෙල්ලිපියේ කරුණු දක්වා ඇතැයි පැවසේ.

සෙල්ලිපියේ ඇති මධ්‍ය කාලීන සිංහල අක්ෂර

පළමු විජයබාහු රජු තම අවුරුදු 55 ක රාජ්‍ය කාලය තුළදී රටට එල්ල වී තිබුණු සොළීගේ තර්ජනයෙන් මුදවාගෙන යහ පාලනයකට නතු කර ඇත. ඒ යටතේ රට තුළ වූ වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කරමින් ආගමික ප්‍රබෝධයට පියවර ගත්තේය. ඒ පිළිබඳව මහා වංශයේ ද්විතීය භාගයේ 60 වෙනි පරිච්ඡේදයේ මෙසේ සඳහන් කර ඇත.

"සමන් කූඨ පව්වෙහි පිහිටි මු රජතුගේ පා සටහන වඳනා පිණිස දුක සේ යායුතු මග යන්නා වූ මනුෂ්‍යයෝ සියල්ලෝම නොපෙළෙන්ව යි දන් වැටුප් පිණිස හැල්කෙත් ආදියෙන් සමෘධ වූ ගිලීමලය නම් ගම දෙව්. කෙසෙල්ගම් මගද එසේම ඌවරට මගද වෙන් වශයෙන් ගම් දී සලාද කරව්. රජතෙමේ අනාගත කාලයෙහි රජදරුවෝ ඒ ගම් නොගණන් වයි අකුරු කොටවා ගල්ටැම් පිහිටවීය. ඒ රජතෙමේ ලාභස්ථානවාසී වූ සමණන්ට අතුරුවිට නම් ගමද එසේම සගුළු ගමද සිරිමිඩගල් ගමන්ද දුන්නේය"

සිරිපා වන්දනා කරන මහා සංඝයා වහල්ලාට වන්දනාකරුවන්ට ආහාර පාන බෙහෙත් හේත් දීම හා සියලු රැකවරණය දීමට එකතු වන රාජකාරි කරන අයට වැටුප් ගෙවීම සඳහා භව බෝගවලින් යුතු ගම්මානද සිරිපාද පුදබිමට පවරා තිබුණු බව මහාවංශයේ තවදුරටත් සඳහන්ව ඇත.

එපමණක් නොව ශ්‍රී පාද පත්මය වන්දනා කිරීමේ ක්‍රමවේදයක්ද පුද පූජා පැවැත්වීම සුදුසු අය උඩමළුවට ඇතුළු විය යුතු බවත් අනෙක් අවශේෂ කොටස් පහත මළුවේ සිට සිරිපා පත්මය වන්දනා කළ යුතු බව මෙම අඹගමුවේ සෙල්ලිපියේ සටහන්ව ඇති බව පැවසේ.

මහාවංශය අනුව ක්‍රි.ව. 1187 දී නිශ්ශංකමල්ල රජු සිවු රඟ සේනාං සමඟ සමන්ත කූඨ පර්වතයට ගොස් සිරිපා වැඳ පුදා ගත් බවට තොරතුරු අනාවරණය කරයි.

අවුරුදු දහස් ගණනාවක් අප හෙළ රාජාවලියේ මහ රජවරු මේ පුණ්‍ය භූමියට මහත් බැතියෙන් තම ගෞරවය පුද කරමින් අද දවසේ අප වෙත උරුම කර ඇත. උඳුවප් පොහොය දින සිට වෙසක් පුන් පොහොය දින දක්වා දින 147ක් අප ශ්‍රී ලාංකික බෞද්ධ ජනතාව මේ සිරිපා වන්දනාවට එක්වෙති. ශ්‍රී ලංකාවේ දකුණු කොනේ සිටත් උතුරු මැද ඌව වෙල්ලස්ස දිගාමඩුල්ල ඇත දුර බැහැර සිට එක් අරමුණක් තුළ වන්දනා නඩ සිරිපා කරුණා කිරීමට ආව ගියේ මහත් වූ බැතිබරවය.

මේ සිරිපා වන්දනාව උප සංස්කෘතියක් තුළ ක්‍රියාත්මක වූ කාර්යයකි. ඉතා දුර බැහැර සිට යෙදෙන අති දුෂ්කර වන්දනා ගමනක් බැවින් ඒ සඳහාම භාවිත කිරීමට වෙන් වූ වචන මාලාවක් සිරිපා වන්දනාවට එකතු විය. ලොකු කුඩා කවුරු වුවද පළමු වතාවට සිරිපා වන්දනාවට යෙදෙන්නේ නම් ඔවුන් හඳුන්වනු ලබන්නේ කිරිකෝඩු මහ කෝඩු වශයෙනි, තම උරහිසෙහි රැඳුණු ගමන් මලට සැහැල්ලුද නගින බඹින වචන වෙනුවට 'කරුණා කරන්න' ඉතා ළබැඳි ආමන්ත්‍රණයකි. මෙවැනි දේ අද සිරිපා කරුණා කරන අය අතර ඇත්නම් ඒ කෙනෙක් දෙදෙනකු අතර විය හැකිය.

අද සිරිපා වන්දනා ගමන වන්දනා ගමනක්ද විනෝද ගමනක්ද යන්න පවා තේරුම් කරගත නොහැකි තැනකට පත්ව ඇත. අප දැන හෝ නොදැන මේ උදාර වන්දනා ගමන වාණිජ කරණයට ලක්ව ඇත. සිරිපා කරුණා කරන බැතිමතුන් අති බහුතරයක් ගමන් ගන්නා වූ නල්ලතන්නියේ සිට උඩමළුව දක්වාම සිත සනසන දේට වඩා සිත පාරන දේ නෙත ගැටීම අරුමයක් නොවේ. එදා සිරිපා වනපෙතෙහි කාගේත් සිත සැනසූ තුන්සරණයේ කවියක් අද ඇසේ නම් ඒ කලාතුරකිනි. ඒ වෙනුවට ඇසෙන්නේ උසුළු විසුළු පමණකි. සිරිපා වන්දනාව සම්බන්ධ උප සංස්කෘතියක් පිළිබඳ වෙනම සාකච්ඡා කළ යුතු තැනකට පත්ව ඇත.

කෙසේ වුවත් මේ සිරිපා වන්දනා සමය නිසා එදා පුරාණයේදී පළමු විජයබාහු රජු අඹගමු සෙල්ලිපියේ අකුරු කර අපට කියාදුන් පාඩම එක වරක් නොව දහස් වරක් කියවිය යුතු පාඩමකි. ඒ අපේ ප්‍රෞඩ අතීතයට ගෞරවය පුද කිරීමය.

කතරගම මැණික් ගඟ

මහවැලි ගඟේ සුන්දරත්වය

ජල දූෂණය වළකන 'සුරකිමු ගංගා'

පාර්ලිමේන්තුව අසල අපි වැවූ වනඵයන දැන් සිංහරාජය වගේ - ජනපති

ගංගා 103ක් අපවිත්‍ර කරන ස්ථාන 10,410ක් ගැන හෙළිවෙයි

● නිහාල් පී. අබේසිංහ

'කැලණි ගඟේ කුණු යනවා බලා වරෙන්' මේ මා මීට වසර 10කට පමණ පෙර සිළුමිණ පුවත්පතට ලියූ ලිපියක ශීර්ෂ පාඨයකි. ඒ අනුව කැලණි ගඟත් අපේ රටේ ඇති ගංගා 103ක් පමණ පසුගිය වකවානුවේ බරපතළ ජල දූෂණයකට ලක්වී තිබිණි. ඒ පිළිබඳව මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රාදේශීය කාර්යාල මඟින් පරිගණක යෙදවුමක් භාවිත කරමින් ගවේෂණයක් සිදු කළේ විශේෂඥයන්ගේ ද සහාය ඇතිවය. මේ පිළිබඳව කරුණු දක්වන පරිසර ඇමැති මහින්ද අමරවීර මහතා පවසන්නේ මේ ගවේෂණය මඟින් අපේ ගංගා 103 හි ජලය අපිරිසිදු කිරීමට බලපාන මූලාශ්‍ර සහිත ස්ථාන 10401ක් පමණ පවතින බව අනාවරණය වූ බවයි.

එසේම කැලණි ගඟ අපේ රටේ දූෂිතම ගඟ බවත් කැලණි ගඟ ප්‍රමුඛ මේ සියලු ගංගා පවිත්‍ර කිරීමට හා ඉදිරියට අපවිත්‍ර කිරීම වැළැක්වීමට අද කටයුතු කිරීම කාලීන අවශ්‍යතාවක් වී ඇති බවත් ඇමැතිවරයාගේ අදහස වී තිබේ.

මේ ගැටලුවට පිළියමක් ලෙස මෙරට ගංගා සියල්ලම පවිත්‍ර කිරීමත්, ඉදිරියට එහි ජල දූෂණය වැළැක්වීමත් ප්‍රධාන අරමුණු කරගෙන මෙරට ප්‍රථම වරට ක්‍රියාත්මක වන ජලයට සම්බන්ධ සියලු අමාත්‍යාංශ ඒකාබද්ධ වූ සුවිශේෂ වැඩසටහන ලෙස 'සුරකිමු ගංගා' වැඩසටහන දැන් රජය ආරම්භ කර ඇත.

මේ යටතේ අපේ රටේ සෑම ගඟකම සියලු ගංඉවුරු හා ජලය සංරක්ෂණය ඒ ප්‍රදේශයට සුවිශේෂී විශේෂඥ හා බලධාරී නිලධාරී පිරිසකට බාර දෙනු ලැබේ. ඒ අනුව එම ගංගා පවිත්‍රව තබා ගැනීම ඔවුන් සතු වගකීමයි.

පරිසර ඇමැති මහින්ද අමරවීරයන් පවසන පරිදි මෙහි ප්‍රධාන අරමුණ ගංගා සංරක්ෂණය මඟින් ජනතාවට පිරිසුදු පානීය ජලය ලබාදීම, පරිසර හා ජෛව සම්පත් සුරැකීම හා සංචාරක කටයුතු ප්‍රවර්ධනයයි.

ශ්‍රී ලංකාවේ පිහිටි ගංගා ද්‍රෝණි 103 පුනරුත්ථානය කර සුරකිම මඟින් වත්මන් හා අනාගත පරපුරට සුපිරිසුදු ජලය ලබාදීමට මෙය ක්‍රියාවට නංවයි.

දිය දෝතක් බීමට හැකි අයුරින් අපේ සියලු ගංගා සුපිරිසුදු කරමින් මෙරට ගංගා හා ඒ ආශ්‍රිත ජලධාර ප්‍රදේශ සංරක්ෂණය කිරීම මෙහි තවත් අරමුණක් වන බවද ඇමැතිවරයා පවසයි.

"සුරකිමු ගංගා" වැඩසටහනෙහි ප්‍රධාන සමාරම්භක උත්සවය කතරගම මැණික් ගඟ අසල ඓතිහාසික රුහුණු කතරගම පූජා භූමි පරිශ්‍රයේ දී මාර්තු මස 22 වැනි දින ජනාධිපති ගෝඨාභය රාජපක්ෂයන්ගේ ප්‍රධානත්වයෙන් ආරම්භ කෙරිණි.

මීට සමගාමීව එදිනම ආණ්ඩුකාරවරුන්ගේ ප්‍රධානත්වයෙන් අනෙක් පළාත් අට නියෝජනය කරමින් "සුරකිමු ගංගා" වැඩසටහනෙහි පළාත් සමාරම්භක උත්සව පැවැත්වීම ද සිදුවිය. ඒ අනුව බස්නාහිර පළාත කැලණි ගඟ පහළ හංවැල්ල ස්ථානයේදී ද සබරගමුව පළාත කළු ගඟ රත්නපුර සමන් දේවාලය ආශ්‍රිතව ද නැගෙනහිර පළාත අම්පාර ගල්ඔය ආශ්‍රිතව ද මධ්‍යම පළාත මහනුවර ගන්නෝරුව මහවැලි ගඟ ආශ්‍රිතව ද වයඹ පළාත බිංගිරිය දැදුරු ඔය ආශ්‍රිතව ද උතුරු පළාත කිලිනොච්චිය කනගරායන් ආරු ආශ්‍රිතව ද දකුණු පළාත වළවේ ගඟ අම්බලන්තොට පාලම ආශ්‍රිතව ද උතුරුමැද පළාත අනුරාධපුර මල්වතු ඔය බන්ධනාගාර පරිශ්‍රය ආශ්‍රිතව ද සමාරම්භක උලෙළ සංවිධාන කර තිබිණි.

වත්මන් ආණ්ඩුවේ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ දස වැදෑරුම් සංකල්පයෙහි අන්තර්ගත සංකල්පයක් වන "තිරසර පරිසර කළමනාකරණය" සඳහා ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් අතරින් ප්‍රධාන වැඩසටහනක් ලෙස "සුරකිමු ගංගා"

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂයන් විසින් 'සුරකිමු ගංගා' සමාරම්භක සමරු ඵලකය නිරාවරණය කළ අවස්ථාව. මෙම අවස්ථාවට පරිසර අමාත්‍ය මහින්ද අමරවීර, කෘෂිකර්ම රාජ්‍ය ඇමැති ශෂීන්ද්‍ර රාජපක්ෂ, පරිසර අමාත්‍යාංශයේ ලේකම් විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ, මධ්‍යම පරිසර අධිකාරියේ සභාපති සිරි අමරසිංහ, ඌව පළාත් ආණ්ඩුකාර රාජා කොල්ලූරේ යන අය ද එක්වූහ.

'සුරකිමු ගංගා' භූගෝලීය තොරතුරු තාක්ෂණික වෙබ් අඩවිය ජනාධිපති ගෝඨාභය රාජපක්ෂයන් විසින් කතරගමදී ආරම්භ කළ අවස්ථාව. මෙම වෙබ් අඩවිය මඟින් 'සුරකිමු ගංගා' වැඩසටහනේ සියලු තොරතුරු හා කමිටු සාමාජිකයන් ගැන තොරතුරු ඕනෑම අයකුට ලබාගත හැකිය.

වැඩසටහන හඳුන්වාදිය හැකිය. මෙහිදී පරිසරයේ ප්‍රධාන අංගයක් වන ජලයේ ගුණාත්මක බව සුරැකීම මඟින් ජල සම්පත සුරැකීම සඳහා කටයුතු කරයි.

ජනාධිපතිතුමා සහ අගමැතිතුමා පරිසරය සුරැකීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන වැඩපිළිවෙළ ශක්තිමත් කිරීම සඳහා ආර්ථික පුනර්ජීවන හා දරිද්‍රතාව තුරන් කිරීම සඳහා වූ ජනාධිපති කාර්ය සාධන බළකායේ ප්‍රධානී බැසිල් රාජපක්ෂයන්ගේ ද සංකල්පයක් මත "සුරකිමු ගංගා" වැඩසටහන ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය මූලික කටයුතු 2020 වර්ෂයේදී ආරම්භ කෙරිණි. පරිසර අමාත්‍යවරයා ලෙස මහින්ද අමරවීර අමාත්‍යතුමන් විසින් කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව වැඩසටහන සඳහා කැබිනට් අනුමැතිය හිමිවූ බව පරිසර අමාත්‍යාංශයේ ලේකම් විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ මහතා පවසයි.

පරිසර අමාත්‍යාංශය සහ මධ්‍යම පරිසර අධිකාරිය ඒකාබද්ධව "සුරකිමු ගංගා" වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි. මෙම වැඩසටහන ප්‍රධාන වශයෙන් කමිටු තුනක් මඟින් ක්‍රියාත්මක වේ. මාස දෙකකට වරක් රැස්වීමට නියමිත "සුරකිමු ගංගා" අන්තර් අමාත්‍යාංශ ජාතික මෙහෙයුම් කමිටුව මෙහි ප්‍රධාන කමිටුවයි. සෑම මසකට වරක්ම රැස්වීමට නියමිත "සුරකිමු ගංගා" දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව සහ සෑම දෙසතියකට වරක්ම රැස්වීමට නියමිත "සුරකිමු ගංගා" ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව අනෙක් කමිටු දෙවිත්වයයි.

වැඩසටහන ප්‍රධාන වශයෙන් "සුරකිමු ගංගා" අන්තර් අමාත්‍යාංශ ජාතික මෙහෙයුම් කමිටුවෙහි අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන අතර ඒ සඳහා අමාත්‍යාංශ ලෙස පරිසර අමාත්‍යාංශය, නාගරික සංවර්ධන අමාත්‍යාංශය, රාජ්‍ය සේවා පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය, වනජීවී හා වනසංරක්ෂණ අමාත්‍යාංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය, වාරිමාර්ග අමාත්‍යාංශය, ඉඩම් අමාත්‍යාංශය ඇතුළු අමාත්‍යාංශ 14ක් එක්වෙයි. පරිසර අමාත්‍යාංශයේ ලේකම්වරයා අන්තර් අමාත්‍යාංශ ජාතික මෙහෙයුම් කමිටුවේ සභාපතිත්වය දරන අතර ලේකම් ලෙස කටයුතු කරන්නේ මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයාය. මධ්‍යම පරිසර අධිකාරියේ සභාපතිවරයා අදාළ කමිටුවේ නියෝජිතයකු වේ.

මෙයට අමතරව සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන පරිදි "සුරකිමු ගංගා" දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව ක්‍රියාත්මක වේ. දිස්ත්‍රික් ලේකම් / දිසාපති ගේ සභාපතිත්වයෙන් ක්‍රියාත්මක මෙම කමිටුවල ලේකම් ලෙස මධ්‍යම පරිසර අධිකාරියේ දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂවරයා ක්‍රියාකරයි.

"සුරකිමු ගංගා" වැඩසටහන යටතේ ශ්‍රී ලංකාවේ සෑම ගං ඉවුරකටම එක් එක් ප්‍රදේශයට අදාළව ප්‍රාදේශීය කමිටු සමිපව වගකියනු ලබන අතර මෙම වැඩසටහනේ ප්‍රධාන ක්‍රියාකාරකම් වන ගංගා ජලය පිරිසිදු කිරීම සහ ඉවුරු ශක්තිමත් කිරීම සඳහා කළ යුතු ක්‍රියාකාරකම් හඳුනාගැනීම ප්‍රාදේශීය කමිටු මඟින් සිදුකරනු ලබයි. මෙම හඳුනා ගැනීම සඳහා "සුරකිමු ගංගා" අන්තර් අමාත්‍යාංශ ජාතික මෙහෙයුම් කමිටුව මඟින් මාර්ගෝපදේශ සපයනු ලැබේ. එලෙසම වැඩසටහන සම්බන්ධයෙන් ජාතික මට්ටමෙන් මාර්ගෝපදේශ ලබාදීමට විශේෂඥ කණ්ඩායමක සහය ලබා ගනී. ජලය ආශ්‍රිතව කටයුතු කරනු ලබන සියලුම රාජ්‍ය ආයතන ඒකාබද්ධ කරමින් මුළු දිවයිනම ආවරණය වන පරිදි ක්‍රියාත්මක වන "සුරකිමු ගංගා" වැඩසටහන සඳහා 2001 අයවැය මඟින් රුපියල් මිලියන 200ක මුදලක් වෙන්කර ඇති බව පරිසර අධිකාරියේ සභාපති සිරි අමරසිංහ මහතා පවසයි.

'සුරකිමු ගංගා' සමාරම්භක උලෙළ මාර්තු 22 වැනිදා පැවැත්වූයේ ජනපති ගෝඨාභය රාජපක්ෂයන්ගේ ප්‍රධානත්වයෙන් කතරගම මැණික් නදිය අසලදීය. මෙම උත්සවයට ප්‍රධාන ආරාධිතයා ලෙස එක්වූ ජනාධිපතිතුමා පැවසුවේ ලෝකයේ සියලුම රටවල් ලෝක ජල දිනය සමරන මොහොතේ "සුරකිමු ගංගා' ජාතික පාරිසරික වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ ඉතාමත් වැදගත් අවස්ථාවක් බවයි.

"රට හඳුන "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අඩංගු දස වැදෑරුම් ප්‍රතිපත්තිය තුළ එක් වැදගත් අංගයක් වන්නේ තිරසර පරිසර කළමනාකරණය බවද එහිදී ජනපති පැවසීය.

ජනාධිපතිවරයා එහිදී මෙසේ ද පැවසීය. රජ කාලයේ සිට අපේ වියළි කලාපය පුරා ක්‍රියාත්මක වන එල්ලංගා පද්ධතිය අද වාරි ඉංජිනේරුවන් පවා පුදුම කරවන්නක්. පරම්පරාවෙන් පරම්පරාවට පෝෂණය වූ ගංගා 103කින් සමන්විත ගංගා ද්‍රෝණි පද්ධතිය අප ලද වටිනාම දායාදයක්.

ජලය මානව යහපැවැත්මට මෙන්ම කෘෂි, ධීවර, සංචාරක කර්මාන්තවල වගේම අනෙකුත් කාර්මික අවශ්‍යතාවයන් ඉටුකර ගැනීමේදී ප්‍රධාන සාධකයක්. එමෙන්ම මිනිසාගේ පමණක් නොව අනෙක් සතුන්ගේ පැවැත්ම

කැලණි ගඟේ ජල දූෂණය පිළිබඳ විද්‍යාත්මක පරීක්ෂණ

කළු ගඟේ අනවසර වැලි ගොඩදැමීම

සෑම ගංගා ඉවුරක්ම හා ගංගාවක්ම ආරක්ෂා කිරීමට කණ්ඩායම්

අමාත්‍යාංශ 14ක් එක්වී ගංගා සුරකින්න ජාතික මෙහෙයුම් කමිටුවක්

උදෙසා ද ජලය ඉතා වැදගත් වෙනවා.

අතීතයේ අපේ කොළඹ හා තදාසන්න නගරවල තිබූ අපිරිසුදු, පරිසර දූෂණ තත්ත්වයත් අද තිබෙන තත්ත්වයත් පිළිබඳව ජනාධිපතිතුමා එහිදී පහදා දුන්නේය.

විශේෂයෙන්ම කොළඹ ජීවත්වෙන ජනතාවට මතක ඇති එදා මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා රට භාරගන්න වෙලාවේ කොහොමද කොළඹ කුණු කඳු ගොඩගැහිලා තිබුණේ කියලා. ඒවා ඉවත් කරන්න බැහැ කියලා සමහර අය කිව්වා. නමුත් එතුමාගේ පාලන කාලයේදී අපි මුළු කොළඹම තිබෙන කුණු ප්‍රශ්නයට විසඳුමක් දීලා කොළඹ අවට නගරය පරිසර හිතකාමී, ජනහිතකාමී, පිරිසිදු වාතය සහිත ජීවත්වීමට ඉතා සුදුසු පරිසරයක් ලෙස ගොඩනැඟුවා. ඒ යුද්ධයෙන් පසු අවුරුදු 04 ක් වැනි කෙටි කාලය තුළ. ඒවා අදත් ඒ ලෙසම පවතින්නේ තිරසාරව ඒ දේවල් කළ නිසා.

එම වැඩපිළිවෙළ නිසා කොළඹ නගරය ආසියාවේ තිබෙන ප්‍රධාන නගර අතුරින් සුන්දර ඒ වගේම පිරිසිදු නගරයක් බවට විවිධ රටවල පවා පුවත්පත්වල සඳහන් වුණා. එම හරිත නගරය අප නිර්මාණය කළේ ගස් සිටුවීමෙන් පමණක් නොවෙයි. ඇත්ත වශයෙන්ම අපි කොළඹ නගරය, කෝට්ටේ නගරය, නුගේගොඩ මේ නගරවල ගස් විශාල ප්‍රමාණයක් පැළ කළා. කුඹුක්, මී ආදී අද ඔය විශාල වෙලා තිබෙන ගස් සියල්ලම පැළ කළේ ඒ කාලයේදී. ඇත්තටම පැළ හොයාගත්තෙත් බොහොම අමාරුවෙන්. අපි එදා මේ කුඩා නගරවල අලංකාර උද්‍යාන සකස් කළා. විහාරමහාදේවී උද්‍යානය පවා නොයෙක් ඉදිකිරීම් නිසා අපිළිවෙළටයි තිබුණේ.

පරිසර සංවර්ධනය කියන්නේ පරිසරය ජනතාවට ජීවත් වීමට සුදුසු ස්ථානයක් බවට පත්කිරීම. තමුන්නාන්සේලාට මතක ඇති පැරණි තුරඟ තරග පිටිය හා නිදහස් චතුරස්‍රය අවට කොහොමද තිබුණේ කියලා. ගොඩනැඟිලි දිරාපත් වෙලා, කඩා වැටිලා අශෝභනයි. නමුත් අපි ඒ පැරණි ගෘහ නිර්මාණ ශිල්පයට හානියක් නොවන ආකාරයට ඒවා නැවත නිර්මාණය කරලා ඒ අවට ගස් ඉන්දලා පරිසරය ලස්සන කළා. 2009 ඒ ත්‍රස්තවාදී උවදුර අවසන් කිරීමෙන් පසු අපි කොළඹ නගරය විශාල උද්‍යාන නගරයක් ලෙස නිර්මාණය කළා.

එපමණක් නෙවෙයි අපේ පරිසරය ඉතාමත්ම වැදගත් තෙත්බිම්වලින් යුක්ත වෙනවා. කොළඹ සහ තදාසන්න ප්‍රදේශවල තෙත්බිම් විශාල වශයෙන් අපි කුඩා කාලයේදී තිබුණා. ඒවා පසුකාලයේදී ගොඩකලා. සමහර අවස්ථාවලදී මම මේ ගොඩකරපු ස්ථාන හාරලා නැවත ඒ තෙත්බිම් ආරක්ෂා කරන්න අපි කටයුතු කළා. දියත උයන ප්‍රදේශය විශාල වශයෙන් ගොඩකරලා තිබුණේ. එදා වැලිපාර්ක් ලෙස හඳුන්වපු ස්ථානය තෙත් බිම් උද්‍යානයක් බවට පත්කරළා තෙත්බිම් ආරක්ෂා ව න ආකාරයෙන් පරිසර හිතකාමී ලෙස නිර්මාණය කරන්න අපට පුළුවන් වුණා. නුගේගොඩ, පිළියන්දල, බෙල්ලන්විල මේ හැම පළාතකම ඒ ප්‍රදේශ සංවර්ධනය කළා. මේවට අද ගිහිල්ලා බැලුවොත් සාමාන්‍යයෙන් දකින්නේ නැති කුරුල්ලෝ පවා ඉන්නවා යැයි ජනාධිපතිතුමා පැවසීය.

එදා පොඩි වැස්සකට පවා එම ප්‍රදේශවලට ගංවතුර ගැලුවා. කොළඹත් යටවුණා. ඒ ඔය පහත්බිම් ගොඩ කිරීම නිසා. අපි ඒ වෙනුවට පොඩි වැව් රැසක් නිර්මාණය කළා. ඒ සියල්ලක්ම පරිසරය හා සම්බන්ධයි. පරිසරය ආරක්ෂා කරනවා කියන්නේ තිරසර පරිසර සංවර්ධනයක්.

ජනගහනය වැඩි වීමත් සමඟ තෙත් බිම් හා පහත් බිම් තමයි ගොඩකරන්නේ. නමුත් මේවායේ තමයි ජෛව විවිධත්වය තියෙන්නේ. පාර්ලිමේන්තුව පිටිපස්සේ මම සකස් කළ ස්ථානයට ගියාම සිංහරාජය වගේ. විශ්වාස කරන්නේ නෑ එවැනි ප්‍රදේශයක් කොළඹ තිබෙනවා කියලා.

"සුරකිමු ගංගා" වැඩසටහන දියත් කිරීමෙන් මධ්‍යම පරිසර අධිකාරිය කරන්නේ ඉතාමත් වැදගත් ජාතික මෙහෙවරක්. සියලුම පාර්ශ්වකරුවන් රාජ්‍ය හා රාජ්‍ය නොවන අංශයන්ගේ පූර්ණ සහයෝගය මේ සඳහා ලබා දෙන්න ඕන. අදින් ඇරඹෙන "සුරකිමු ගංගා" ජාතික පාරිසරික වැඩසටහන අනාගත පරපුර වෙත අපි සියලු දෙනා විසින් දෙනු ලබන මහඟු දායාදයක් බව විශ්වාස කරන බවද ජනාධිපති ගෝඨාභය රාජපක්ෂයන් එහිදී පැවසුවේ අනාගත අපේක්ෂාවන් පෙරටු කරගෙනය.

මධ්‍යම පරිසර අධිකාරියේ සභාපති සිරි අමරසිංහ මහතා විශේෂයෙන් අවධාරණය කරන්නේ මෙම 'සුරකිමු ගංගා' දීප ව්‍යාප්ත වැඩපිළිවෙළ ආර්ථික පුනර්ජීවනය පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බළකායේ ප්‍රධානී බැසිල් රාජපක්ෂයන් තමාට ලබාදුන් උපදෙස් අනුව ක්‍රියාත්මක කළ බවයි.

මේ අනුව මෙම වැඩසටහන සාර්ථක වුවහොත් මා වසර 10 කට පෙර ලියූ ඉහත දැක්වූ කැලණි ගඟ පිළිබඳ ලිපියේ ශීර්ෂ පාඨය 'කැලණි ගඟේ කුණු නැති බව බලා වරෙන්' යනුවෙන් වෙනස් කිරීමට අපට හැකිවනු ඇතැයි මගේ විශ්වාසයයි.

ඉකුත් දශක පහක් ඇතුළත කැරලි දෙකකට ජවිපෙ නායකත්වය දුන්නේය. ප්‍රථම කැරැල්ල 1971 අප්‍රේල් ක්‍රියාත්මක වූ අතර එහිදී ඝාතනයට ලක් වූ සංඛ්‍යාව 5,000කට ආසන්නය. ජවිපෙ 2වැනි කැරැල්ල 1986න් ඇරඹී 1990 න් අවසන් වූ අතර එහිදී 60,000කට අධික පිරිසක් ඝාතනයට ලක් වූහ. සිළුමිණෙහි පළවන මෙම ලිපි මාලාව එම කැරලි දෙක ඇතුළත ජවිපෙ නායකත්වයේ දෘෂ්ටිමය මඟ පෙන්වීමකට යටත්ව, එහි ප්‍රායෝගිකත්වය ක්‍රියාවට නැඟූ කැරලි නායකයන්ගේ සත්‍ය කතාවයි.

24 කොටස

වෘත්තීය සමිති ක්ෂේත්‍රයේ ජවිපෙ භූමිකාව-2

සමස්ත ලංකා සංස්ථා සේවක සංගමයේ වාර්ෂික සභාව සහ නිලවරණය 1985 ජනවාරි 31 කොම්පඤ්ඤවීදිය ගුරු මැදුරේ පැවති අතර එයට ශාඛා මට්ටමේ නියෝජිතයන් 107ක් පැමිණ සිටියහ. මෙහිදී ජවිපෙ නායකයන් ගේ උපදෙස් අනුව ක්‍රියාකාරිකයන් විසින් සභාපති ලෙස දෙහිඕවිට පදිංචි නීතිඥ සමන් වික්‍රමබන්දු ද, ලේකම් ලෙස ජයන්ත විජේසිංහ ද පත්කර ගන්නා ලදී. ජ්‍යෙෂ්ඨ උප සභාපති ලෙස ඩී. ආර්. ලියනාරච්චිද, අනුශාසක ලෙස නීතිඥ එම්. බී රත්නායකද නම් කෙරිණි.

තුල්හිරිය කම්හලේ වෘත්තීය සමිති ආරම්භ කිරීමේ පුරෝගාමියා වූ ලංකා වෙළෙඳ සේවා සංගමයේ තුල්හිරිය ශාඛාවේ ප්‍රථම ලේකම්වරයා සහ ජවිපෙ ක්‍රියාකාරිකයකු වන පුත්තලමේ උපන් එදිරිසිංහ ආරච්චිගේ චන්ද්‍රසිරි එහි වෘත්තීය සමිති රැස්වීමක් අමතමින්.

> පක්ෂ තහනම මධ්‍යයේ වූවද ජවිපෙ වෘත්තීය සමිති මඟින් 1985 සහ 1986 මැයි දින රැලිද, කොළඹ නව නගර ශාලාවේදී පවත්වන ලදී, 1986 වසර මැයි දින රැලියේදී ජවිපෙ දෙවන පෙළ නායකයකුව සිටි නීතිඥ විජේදාස ලියනාරච්චි විසින් රෝහණ විජේවීර විසින් ජාතික ගැටලුව සම්බන්ධයෙන් පක්ෂයේ ස්ථාවරය ප්‍රකාශිත 'දෙමළ ඊළාම් අරගලයට විසඳුම කුමක්ද?' මැයින් රහසිගතව මුද්‍රණයකර තිබූ කෘතිය මුල්වරට එළිදැක්විණි.

ජවිපෙ ජාතික කම්කරු සටන් මධ්‍යස්ථානයට අනුබද්ධ නාමික සංවිධානයක් වූ දුම්රිය සටන් පෙරමුණ මඟින් 1988 සැප්තැම්බර් මස රටපුරා දුම්රිය ස්ථානවල අලවා තිබූ පොස්ටරයක්.

ජවිපෙට යෝධ සවියක් වූ තුල්හිරිය පෙහෙකම්හළේ විවිධ වෘත්තීය සමිති නායකයන් සහ ක්‍රියාකාරිකයන් කිහිපදෙනෙක්. මොවුහු ජවිපෙ සමාජවාදී කම්කරු සංගමයේ තුල්හිරිය කමිටුවේ මුල් පෙළේ සාමාජිකයින්ය. වමේ සිට සමස්ත ලංකා පේෂකර්ම කම්කරු සමිතියේ ලේකම් වූ මතුගම උපන් දොන් රූපවංශ ලියනාරච්චි, කොමියුනිස්ට් පක්ෂයට සම්බන්ධ රාජ්‍ය සංස්ථා සේවක සමිතියේ ප්‍රධාන ලේකම් බද්දේගම උපන් තෙල්මුර විදානගේ උදේනි සමන් කුමාර, ලංකා වෙළෙඳ සේවක සංගමයේ තුල්හිරිය ශාඛා ලේකම් කරන්දෙණියේ ඉලන්දාරි දේවගේ හේමපාල, ජනවේගය සමිතියේ ලේකම් ඇල්පිටියේ උපන් පිටුවල කංකානම්ගේ දයාසේන සහ වෙළෙඳ සේවක සංගමයේ ක්‍රියාකාරී වැලිගම උපන් ගිගනගේ චන්ද්‍රසිරි හෙවත් සමන්ත වේ.

ජවිපෙ තහනම ඉවත් කරන මෙන් ආණ්ඩුවට බලකරමින් 1983 සැප්තැම්බර් ලංකා වෙළෙඳ සේවා සංගමයේ මෙහෙයවීමෙන් කොල්ලුපිටිය සී. එම්. යූ ශාලාවේදී රැස්වීමක්ද පවත්වන ලදී. ඒ රැස්වීම අමතා බාලා තම්පෝ, මහාචාර්ය කාලෝ ෆොන්සේකා, ගුණසේන මහානාම සහ ජවිපෙ වෘත්තීය සමිතිය වෙනුවෙන් ඩී. ආර්. ලියනාරච්චි ද කතා කළහ. රැස්වීමට ජවිපෙ නියෝජිතයන්ට සහභාගී වීමට උපතිස්ස ගමනායක ගේ අවසරය ලැබිණි.

එම සාකච්ඡාවේදී ගත් තීරණයක් වූයේ 1984 මැයි 1 ලෝක කම්කරු දිනය ජවිපෙ වෘත්තීය සමිති මඟින් කොළඹ නව නගර ශාලාවේ මැයි 1 සැමරිය යුතු බවය. ඒ අනුව මැයි දිනය සමස්ත ලංකා වෘත්තීය සමිති සම්මේලනය, සමස්ත ලංකා සංස්ථා සේවක සංගමය, සමස්ත ලංකා වතු සේවක සංගමය සහ සමස්ත ලංකා ප්‍රවාහන සේවක සංගමය මෙහෙයවීමෙන් 1984 මැයි 1 විශාල පිරිසක ගේ සහභාගීත්වයෙන් කොළඹ නව නගර ශාලාවේ පැවැත්විණි. එහිදී රැස්ව සිටි පිරිස අමතා සමස්ත ලංකා වෘත්තීය සමිති සම්මේලනයේ වැඩ බලන ලේකම් ගාමිණී ගුණසේකර, එහි වැඩබලන සභාපති ඩබ්ලිව්. වයි. ද සිල්වා, සමස්ත ලංකා සංස්ථා සේවක සංගමයේ ප්‍රධාන ලේකම් ඩී. ආර්. ලියනාරච්චි. එහි සංවිධායක ලේකම් පී. කේ දයාසේන, සමස්ත ලංකා ප්‍රවාහන සේවක සංගමයේ ලේකම් නාරච්චි, දයාසේන සහ අයුබ් ඇතුළු කිහිපදෙනෙක්ම විය. ඉවත් වූ එම කණ්ඩායමේ මතය වූයේ යටිබිම්ගත දේශපාලනය කිරීමේ අවසානය මහා බෙදවාචකයකින් අවසන් විය හැකි බවය.

එම වසරේම අප්‍රේල් වනවිට වෘත්තීය සමිති සහ ජවිපෙ අතර මතභේදයක් ඇතිවූ අතර සමස්ත ලංකා සංස්ථා සේවක සංගමය ජවිපෙන් ඉවත්වීම සඳහා වෘත්තීය සමිති රෙජිස්ට්‍රාර්වරයා ගේ අනුමැතිය පැතීය.

මෙසේ ඉවත්වීමට හේතුව ජවිපෙ කෙරෙහි සංගමයේ ප්‍රධාන පෙළේ නිලධාරීන් දක්වන විශ්වාසය බිඳීයෑම බව එහි සංවිධායක ලේකම් පී. කේ. දයාසේන 1985 අප්‍රේල් නිවේදනයක් නිකුත් කරමින් සඳහන් කළේය. ඒ වනවිට ද එහි ප්‍රධාන ලේකම් ඩී. ආර්. ලියනාරච්චි, භාණ්ඩාගාරික සෝමරත්න රණසිංහ ඇතුළු කිහිපදෙනෙක් සංගමයෙන් ඉවත්ව තිබිණි. ගමනායක ගේ මැදිහත්වීම මත එම ප්‍රශ්නය නිරාකරණය වූ අතර සංගමයේ කටයුතු තීරණය කිරීමේ අයිතිය ඒ අනුව ජවිපෙට හිමි විය.

> ජවිපෙ තහනමට ලක්වී මාස 17ක් ගතවන විට නීති විරෝධී තත්ත්වයක් යටතේ පක්ෂ වෘත්තීය සමිති කටයුතු තවදුරටත් කළ නොහැකි බවට මතය පිළිගත් පිරිසක් 1985 ජනවාරි 31න් පසු ඉන් ඉවත් විය. ඉවත් වූ එම කණ්ඩායමේ මතය වූයේ යටිබිම්ගත දේශපාලනය කිරීමේ අවසානය මහා බෙදවාචකයකින් අවසන් විය හැකි බවය.

පක්ෂ තහනම මධ්‍යයේ වූවද ජවිපෙ වෘත්තීය සමිති මඟින් 1985 සහ 1986 මැයි දින රැලිද කොළඹ නව නගර ශාලාවේදී පවත්වන ලදී. වසර 1986 මැයි දින රැලියේදී ජවිපෙ දෙවන පෙළ නායකයකුව සිටි නීතිඥ විජේදාස ලියනාරච්චි විසින් රෝහණ විජේවීර විසින් ජාතික ගැටලුව සම්බන්ධයෙන් පක්ෂයේ ස්ථාවරය ප්‍රකාශිත 'දෙමළ ඊළාම් අරගලයට විසඳුම කුමක්ද?' මැයින් රහසිගතව මුද්‍රණයකර තිබූ කෘතිය මුල්වරට එළිදැක්විණි. විජේවීර ගේ එම කෘතිය තුළින් අධිරාජ්‍යවාදී උපාය අරමුණ මෙන්ම කලාපය තුළ ඉන්දීය උපක්‍රමික අරමුණුද ඒ තුළ ලංකාවේ ජාතික ගැටලුව ස්ථාන ගතකොට ඇති අයුරුද එකී අර්බුදයට වමේ විසඳුමත් එක්කරමින් සම්පාදනය කර තිබිණි.

වසර 1986 වන විට සමස්ත ලංකා වෘත්තීය සමිති සම්මේලනයේ ප්‍රධාන ලේකම් තනතුරට ගාමිණී ගුණසේකර පත්වූ අතර සමස්ත ලංකා සංස්ථා සේවක සංගමයේ ප්‍රධාන ලේකම් තනතුරට ජී. ඩබ්ලිව් ගාමිණී ජයලත් පත්ව තිබිණි. කැලණි සරසවියේ උපාධිධාරියකු වූ ගාමිණී ගුණසේකර දැඩි කැපවීමකින් වෘත්තීය සමිතිය ගොඩනැගූ අතර කලක් කුඩා කර්මාන්ත, පොල් වගා කිරීමේ මණ්ඩලය සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ සේවය කළ ඔහු අසූව ජූලි වර්ජනයෙන් රැකියාව අහිමි වූවකි. සම්මේලනය මඟින් මාලිමා නමින් වූ පුවත්පතක්ද ප්‍රකාශයට පත්කරන ලදී. පසුව ගාමිණී ගුණසේකර ජවිපෙ 2වැනි කැරැල්ලේ නායකයෙකුව සිටියදී 1990 ජනවාරි 1 හබරාදූවේදී අත්අඩංගුවට ගෙන 1990 මැයි මස ඝාතනයට ලක්විය.

සමස්ත ලංකා සංස්ථා සේවක සංගමයේ ලේකම් වූ ගාමිණී ජයලත් කොළඹ සංවර්ධන සභාවේ මන්ත්‍රීවරයකු වශයෙන් කලක් කටයුතු කළ අතර පසුව දෙවැනි කැරැල්ලේ නායකයකු වශයෙන් කටයුතු කිරීමේදී 1989 අවසාන භාගයේ අත්අඩංගුවට පත්ව පසුව ඝාතනයට ලක්විය. ඔහු කලක් රත්නපුර දිසා ලේකම් වශයෙන්ද කටයුතු කළ අතර දක්ෂ සංවිධායකයෙකි.

වාමාංශික පක්ෂ මඟින් මෙහෙයවූ වෘත්තීය සමිති එක්සත් ක්‍රියාකාරී කමිටුවේ වෘත්තීය සංගම් 22ක ජාතික සමුළුව කොළඹ සුගතදාස ක්‍රීඩාංගණයේදී 1986 මාර්තු 25 පැවති අතර එයට සහභාගි වූ පිරිසක් විසින් එහි කැඳවුම්කරු ලෙස කටයුතු කළ කොමියුනිස්ට් පක්ෂයට සම්බන්ධ ලංකා වෘත්තීය සමිති සම්මේලනයේ ප්‍රධාන ලේකම් එල්. ඩබ්ලිව්. පණ්ඩිතට ශාරීරික ප්‍රහාරයක් එල්ලකර රැස්වීම කඩාකප්පල් කරන ලදී. එයට ජවිපෙ වෘත්තීය සමිති ක්‍රියාකාරිකයින් ලෙසින් සහභාගි වී ප්‍රහාර එල්ලකරන ලද්දේ කැලණි සරසවියේ සමාජවාදී ශිෂ්‍ය සංගමයේ සිසුන් කණ්ඩායමක් විසිනි.

සාම්ප්‍රදායික වාමාංශික පක්ෂ සහ වෘත්තීය සමිතිවලට විකල්පයක් වශයෙන් ජවිපෙ වෘත්තීය සමිති විසින් ජනතා සටන් පෙරමුණ නමින් ඒකාබද්ධ සම්මේලනයක්ද 1986 අගෝස්තු මස 8 නාරාහේන්පිට අභයාරාමයේදී ස්ථාපිත කරන ලදී. එහි ප්‍රධාන වෘත්තීය සමිති සාමාජික සංවිධාන වූයේ රාජ්‍ය සේවා එක්සත් හෙදි සංගමය, සමස්ත ලංකා වෘත්තීය සමිති සම්මේලනය සහ සමස්ථ ලංකා සංස්ථා සේවක සංගමයයි. කැඳවුම්කරු වූයේ මුරුත්තෙට්ටුවේ ආනන්ද හිමිය. පළාත් සභා යෝජනා පැරදවීමට කම්කරු පන්තිය ගොනු කිරීම එහි අරමුණ විය.

ජනතා සටන් පෙරමුණේ මංගල රැලිය 1986 ඔක්තෝබර් 10 දෙමටගොඩ වෙළෙඳපොළ සංකීර්ණය ඉදිරිපිට පැවැත්විණි. මුරුත්තෙට්ටුවේ ආනන්ද හිමි, පෙරියසාමි තංගරාජා, ගාමිණී ජයලත්, ගාමිණී ගුණසේකර, ඇතුළු කිහිපදෙනෙක් රැස්වීම ඇමතිය. මව්බිම සුරකීමේ ව්‍යාපාරය ආරම්භයත් සමඟ ජනතා සටන් පෙරමුණ ක්ෂයවී ගියේය.

ජවිපෙ වෘත්තීය සමිති විසින් 1987 මැයි 1 පවත්වන මැයි රැලිය සඳහා කොළඹ නව නගර ශාලාව වෙන්කර ගෙන තිබුණි.

එහෙත් 1987 අප්‍රේල් 21 දෙමළ බෙදුම්වාදීන් විසින් කොටුව බස් නැවතුම්පොළේ කාර් බෝම්බයක් පුපුරුවා හැරීමෙන් පුරවැසියන් 122ක් ඝාතනයට ලක්වූ අතර වීදිබට දහස් සංඛ්‍යාතික පිරිස් ඊට පසුදින ආරක්ෂාව ඉල්ලමින් මව්බිම සුරැකීමේ ව්‍යාපාරයේ නායකත්වයෙන් ඇඳිරි නීතියද නොතකා පෙළපාලි ගිය බැවින් රජය මඟින් මැයි දින පෙළපාලි සහ රැස්වීම් තහනම් කරන ලදී. එවිට ජවිපෙ විසින් සිදුකළේ මව්බිම සුරැකීමේ ව්‍යාපාරයේ මැයි දින රැස්වීමක් 1987 මැයි 1 නාරහේන්පිට අභයාරාමයේදී පැවැත්වීමට එහි නායකයින් එකඟකර ගැනීමය.

ඒ අනුව 1987 මැයි 1 නාරාහේන්පිට අභයාරාමයේ පැවති රැස්වීම 2,000කට ආසන්න පිරිසකගේ සහභාගිත්වයෙන් මැයි දින තහනම නොතකා පැවැත්විණි. රැස්වීම අවසානයේදී පිරිස සහ පොලිස් භටයන් අතර ඇතිවූ ගැටුමේදී පොලිසිය විසින් වෙඩි තැබීමෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සේවය කළ ලෙස්ලි ආනන්දලාල් කිරිබත්ගොඩ සහ ජයවර්ධනපුර සරසවියේ සිසු කිත්සිරි මෙවන් රණවක මරුමුවට පත්විය.

මෙහිදී රට පුරාම උද්ඝෝෂණ පැවති අතර උද්ගත වූ තත්ත්වයත් සමඟ රජය විසින් 1987 මැයි 18 ජවිපෙට සම්බන්ධ වෘත්තීය සමිති 18ක් තහනම් සංවිධාන බවට ගැසට් කරන ලදී.

ජාතික ආරක්ෂාව සහ මහජන සාමය පවත්වා ගැනීම සඳහා 1987 අංක 05 දරණ හදිසි අවස්ථා නියෝග යටතේ මෙම තහනම පැනවූ බව රජය නිවේදනය කළේය.

තහනම් වූ එම සංවිධාන අතර සමස්ත ලංකා වෘත්තීය සමිති සම්මේලනය, සමස්ත ලංකා සංස්ථා සේවක සංගමය, සමස්ත ලංකා ප්‍රගති සේවක සංගමය, සමස්ත ලංකා සුව සේවක සංගමය, සමස්ත ලංකා කාර්මික නිලධාරීන්ගේ සංගමය, ලංකා තැපැල් සේවක සංගමය, සමස්ත ලංකා සමූපකාර සහ වෙළෙඳ ආයතන සේවක සංගමය, සිසිල්බීම පොදු සේවක සංගමය, සමස්ත ලංකා වතු සේවක සංගමය, රාජ්‍ය සේවා ඒකාබද්ධ ලිපිකරු සේවා සංගමය, සමස්ත ලංකා ධීවර කාර්මිකයින්ගේ සංගමය, සමස්ත ලංකා විදුලි සේවකයන්ගේ සංගමය, ලංකා පළාත් පාලන සේවක සංගමය, සමස්ත ලංකා උසස් අධ්‍යාපන සේවක සංගමය, ලංකා දුම්රිය ප්‍රවාහන සේවක සංගමය, සමස්ත ලංකා වරාය සේවක සංගමය සහ ජනතා වතු නිලධාරි සංගමය විය.

ජවිපෙ සාමාජිකයකු බවට හඳුන්වා දුන් කේ. සී. සේනානායක සහ ජාතික ආරක්ෂක ඇමති ලලිත් ඇතුලත්මුදලි අතර ජවිපෙ සහ රජය සමඟ 1988 මැයි 09 අත්සන් කළ මතභේදාත්මක ගිවිසුමෙන් පසු එහි කොන්දේසියක් අනුව ඉහත වෘත්තීය සමිති 18 තහනමද වසරකට පසු එනම් 1988 මැයි 19 ගැසට් මඟින් ඉවත් කරන ලදී. ඒ සමඟම 1983 ජූලි සිට ජවිපෙට පනවා තිබූ තහනමද රජය මඟින් ඉවත් කළේය.

ඒ වන විටත් ජවිපෙට සෘජු සහ වක්‍ර සම්බන්ධව සිටි වෘත්තීය සමිතිවලට අයත් නායකයන් සහ ක්‍රියාකාරින් රැසක් 2වන කැරැල්ලට ක්‍රියාකාරිව එක්වී සිටි අතර එය එක පෙරමුණක් වශයෙන් ජාතික කම්කරු සටන් මධ්‍යස්ථානය වශයෙන් දිස්ත්‍රික්ක 19ක ක්‍රියාත්මක විය.

එහි න්‍යෂ්ටිය වූයේත් එය ක්‍රියාත්මක කළේත් අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලය නියෝජනය කළ ජවිපෙ පූර්ණකාලීන සරසවි ශිෂ්‍ය ක්‍රියාකාරීන් විසිනි. ජාතික කම්කරු සටන් මධ්‍යස්ථානය මුල සිටම ක්‍රියාත්මක වූයේ 2වැනි කැරැල්ලේ සන්නද්ධ අංශය වූ දේශප්‍රේමී ජනතා ව්‍යාපාරය යටතේය.



අසූව ජූලි වර්ජනයෙන් පසු ජවිපෙ ප්‍රධාන සටන් පාඨය පෙරට ගෙනයන සරසවි සේවකයන් පිරිසක් 1982 මැයි පෙළපාළියේදී.

ජවිපෙ පක්ෂ තහනමට පෙර 1983 මැයි දින පෙළපාළියේදී බැංකු සේවක පෙරමුණ බැනරය යටතේ පිරිසක් ගමන් කරන අයුරු.

ඓතිහාසික ගන්නෝරු සටනට වසර 383යි

● එස්.ජී.විජේරත්න - කටුගස්තොට සමූහ

කන්ද උඩරට ආක්‍රමණය කිරීමට පැමිණි පෘතුගීසි සේනාව පලවා හැරීම පිණිස අපගේ විරෝධාර සෙන්පතියන් දියත්කළ ඓතිහාසික ගන්නෝරු සටන සිදුකර 2021 මාර්තු 28 වැනි දිනට වසර 383 ක් සපිරේ. එදා 1938 වසරේ පෘතුගීසි හමුදාවේ කපිතාන් ජෙනරාල් දියෝගු ද මේලෝ දහසක පමණ පෘතුගීසි භටපිරිසක් සහ තවත් දහස් ගණනක කුලී හේවායන් ද පිරිවරාගෙන කන්ද උඩරටට පැමිණ මහනුවර ඇතුළු අවට ගම්මාන ගිනි තබා විනාශ කරමින් දේපොළ කොල්ලකා නැවැතත් කොළඹ බලා යමින් සිටියදී එම වසරේ මාර්තු මාසේ 28 වැනිදා නවාතැන්ගෙන ඇත්තේ ඓතිහාසික ගන්නෝරුව රණබිම ප්‍රදේශයේය. මොවුන් මෙම ස්ථානයට පැමිණෙමින් සිටියදී මහවැලි ගඟ පිටාර ගැලීම නිසා ඔවුන් සතුව තිබුණු වෙඩිබෙහෙත් වැනි පුපුරණ ද්‍රව්‍ය දැ වතුරට හසුවී තෙත බරිත වී ඇති අතර ඒවාද නවාතැන්ගෙන සිටි ස්ථානයේ වියළමින් සිට ඇත.

ගෙන සිටින බව දැනගත් අපගේ විරෝධාර රණවිරුවෝ ඔවුන්ගේ කඳවුර හතර වටින් කොටුකර ඔවුනට පහර දීමට පටන් ගත්හ. දෙපිරිස අතර සටන ඇවිළෙමින් තිබුණු අවස්ථාවේ ගන්නෝරුව කන්ද මුඳුනේ පිහිටි දිවිදොස්ගලට නැගගත් ගන්නෝරුවට යාබදව පිහිටි යටිහලගල ගමේ සිටි සෙන්පතියකු වූ රාජකරුණා වෙල්ලි බ්‍රාහ්මණ විදානේතුමා ඇතුළු රණවිරුවන් පිරිස එතැන සිට දුනු හී මානා පෘතුගීසි හමුදාවට පහර දීම ආරම්භ කර තිබේ. මේ අවස්ථාවේ ක්‍රියාත්මක වූ වෙල්ලි බ්‍රාහ්මණ ගැටපේලි නම් විරෝදාර සෙන්පතියා විසින් ඊ පහරක් විද පෘතුගීසි හමුදාවට නායකත්ව දුන් දියාගෝ ද මේලෝ මරා දමනු ලැබීය. එම සටන පැවැති අවස්ථාවේ මෙම විරෝධාර සෙන්පතියාද සතුරු හමුදාවේ ප්‍රහාරයකට ලක්ව අසාධ්‍ය තත්ත්වයට පත්වූ බවද පසුව ඔහු මියයන තුරුම දිවිදොස්ගල මස්ථකයේ රතු පැහැති කොඩියක් ළෙල දුන් බව සේමපාල උඩගම විසින් රචිත 'බෝධිවංශ ජනකතා 'කෘතියෙහි සඳහන්ව තිබේ.

පෘතුගීසි හමුදාව විසින් රණබිම ප්‍රදේශයේ වියළමින් සිටි පුපුරණ ද්‍රව්‍යය සියල්ලද අප සෙන්පතියන් විසින් කරුංකා පුවක් ගෙඩි වලට ගින්දර අවුළුවා ඒවා හී තුඩෙහි අමුණා එල්ල කළ පහරින් ගිනිබත්ව ගිය බවද ඉතිහාසයේ සඳහන්ව තිබේ.

සෙනරත් රජුගෙන් පසු කන්ද උඩරට පාලනය භාරගත් දෙවෙනි රාජසිංහ රජතුමා හැත්තෑදහසක සේනාවක් සංවිධානය කර ඉන් තිස් දහසක් පමණ භට පිරිසක් උඩරටට ඇතුළු වන මුර කපොලු වල රඳවා තිබේ. ඉතිරි තිස්දහසක පමණ භට පිරිස ගන්නෝරුව කන්ද ආශ්‍රිතව රඳවා පෘතුගිසින් පහර දීමට සලස්වා ඇත.පෘතුගිසින්ගේ යුද බලය හමුවේ උපක්‍රමශීලිව කන්ද උඩරටින් පිටව ගොස් කොත්මලේ ප්‍රදේශයේ සැඟවී සිටි දෙවැනි රාජසිංහ රජතුමා ගන්නෝරු සටනින් පසු නැවැතත් කන්ද උඩරට මහනුවර රජවාසල වෙත පැමිණ තිබේ.

ගන්නොරු සටනේදී පෘතුගීසි හමුදාවේ විශාල පිරිසක් මරා දමා ඔවුනට උන්හිටි තැන් අහිමි කළ රාජකරුණා වෙල්ලි බ්‍රාහ්මණ විදානේ සෙන්පතියා ඇතුළු පිරිස ජයගෝෂා නගමින් දිවිදොස්ගලින් බැස යටිහලගල පිහිටි ස්වකීය මැදුරට පැමිණි විගස දෙවෙනි රාජසිංහ රජු විසින් පණිවුඩකරුවකු එවා රජවාසල වෙත කැඳවා ඔහුට සත්කට්ටුවක් ප්‍රදානය කළ බව ද ඉතිහාසයෙ සඳහන්ව ඇත. පසුව රජතුමා විසින් දක්ෂ කාර්යශූර හමුදාපතීන් තේරීමේදි රාජකරුණා විදානේ ප්‍රදානියා සේ තෝරගෙන ඇත.

වල්ගොවිවාගොඩ අමරවංශ හිමි

ප්‍ර.සබා මන්ත්‍රී නදුන්ගේ

යුඩිපී සමරතුංග

එදා පරංගින්ට විරුද්ධව ගන්නෝරු සටන දියත් කළ වෙල්ලි බ්‍රාහ්මණ ගැටපේලි පරපුර පිළිබඳව තොරතුරු ඇතුළත් කර විජිත වෙල්ලි රාජාවලිය නමැති ග්‍රන්ථය සකස් කර තිබේ. පසුව එම ග්‍රන්ථය 1818 කැරැල්ල සමයේ අස්ථාන ගතව තිබුණු බව පැවැසුණද, එය දැනට බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ සුරක්ෂිතව තිබෙන බව හලාවත රාජගුරු මැදුරේ අධිපති දේවධර්මාචාර්ය ගරු එඩ්මන්ඩ් පීරිස් බිෂොප්තුමා පවසා ඇත.

එදා පරංගින්ට විරුද්ධව ගන්නෝරු සටන දියත් කළ වෙල්ලි බ්‍රාහ්මණ ගැටපේලි පරපුර පිළිබඳව තොරතුරු ඇතුළත් කර විජිත වෙල්ලි රාජාවලිය නමැති ග්‍රන්ථය සකස් කර තිබේ. මේ අවස්ථාවේ ක්‍රියාත්මක වූ වෙල්ලි බ්‍රාහ්මණ ගැටපේලි නම් විරෝදාර සෙන්පතියා විසින් ඊ පහරක් විද පෘතුගීසි හමුදාවට නායකත්ව දුන් දියාගෝ ද මේලෝ මරා දමනු ලැබීය. එම සටන පැවැති අවස්ථාවේ මෙම විරෝධාර සෙන්පතියාද සතුරු හමුදාවේ ප්‍රහාරයකට ලක්ව අසාධ්‍ය තත්ත්වයට පත්වූ බවද පසුව ඔහු මියයන තුරුම දිවිදොස්ගල මස්ථකයේ රතු පැහැති කොඩියක් ළෙල දුන් බව සේමපාල උඩගම විසින් රචිත 'බෝධිවංශ ජනකතා 'කෘතියෙහි සඳහන්ව තිබේ.

පෘතුගීසි හමුදාව විසින් රණබිම ප්‍රදේශයේ වියළමින් සිටි පුපුරණ ද්‍රව්‍යය සියල්ලද අප සෙන්පතියන් විසින් කරුංකා පුවක් ගෙඩි වලට ගින්දර අවුළුවා ඒවා හී තුඩෙහි අමුණා එල්ල කළ පහරින් ගිනිබත්ව ගිය බවද ඉතිහාසයේ සඳහන්ව තිබේ.

සෙනරත් රජුගෙන් පසු කන්ද උඩරට පාලනය භාරගත් දෙවෙනි රාජසිංහ රජතුමා හැත්තෑදහසක සේනාවක් සංවිධානය කර ඉන් තිස් දහසක් පමණ භට පිරිසක් උඩරටට ඇතුළු වන මුර කපොලු වල රඳවා තිබේ. ඉතිරි තිස්දහසක පමණ භට පිරිස ගන්නෝරුව කන්ද ආශ්‍රිතව රඳවා පෘතුගිසින් පහර දීමට සලස්වා ඇත.පෘතුගිසින්ගේ යුද බලය හමුවේ උපක්‍රමශීලිව කන්ද උඩරටින් පිටව ගොස් කොත්මලේ ප්‍රදේශයේ සැඟවී සිටි දෙවැනි රාජසිංහ රජතුමා ගන්නෝරු සටනින් පසු නැවැතත් කන්ද උඩරට මහනුවර රජවාසල වෙත පැමිණ තිබේ.

ගන්නොරු සටනේදී පෘතුගීසි හමුදාවේ විශාල පිරිසක් මරා දමා ඔවුනට උන්හිටි තැන් අහිමි කළ රාජකරුණා වෙල්ලි බ්‍රාහ්මණ විදානේ සෙන්පතියා ඇතුළු පිරිස ජයගෝෂා නගමින් දිවිදොස්ගලින් බැස යටිහලගල පිහිටි ස්වකීය මැදුරට පැමිණි විගස දෙවෙනි රාජසිංහ රජු විසින් පණිවුඩකරුවකු එවා රජවාසල වෙත කැඳවා ඔහුට සත්කට්ටුවක් ප්‍රදානය කළ බව ද ඉතිහාසයෙ සඳහන්ව ඇත. පසුව රජතුමා විසින් දක්ෂ කාර්යශූර හමුදාපතීන් තේරීමේදි රාජකරුණා විදානේ ප්‍රදානියා සේ තෝරගෙන ඇත.

එදා පරංගින්ට විරුද්ධව ගන්නෝරු සටන දියත් කළ වෙල්ලි බ්‍රාහ්මණ ගැටපේලි පරපුර පිළිබඳව තොරතුරු ඇතුළත් කර විජිත වෙල්ලි රාජාවලිය නමැති ග්‍රන්ථය සකස් කර තිබේ. පසුව එම ග්‍රන්ථය 1818 කැරැල්ල සමයේ අස්ථාන ගතව තිබුණු බව පැවැසුණද, එය දැනට බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ සුරක්ෂිතව තිබෙන බව හලාවත රාජගුරු මැදුරේ අධිපති දේවධර්මාචාර්ය ගරු එඩ්මන්ඩ් පීරිස් බිෂොප්තුමා පවසා ඇත.

ලට පහළින් කඳවුරු බැඳගෙන ඉදල තියෙනවා. යටිහලගල පොල්වත්තේ ගෙදර විදානේට මේක ආරංචි වෙලා තියෙනවා. පස්සේ මේ අය දිවිදොස්ගලට නැගල බැලුවාම දැකල තියෙනවා බණ්ඩර තැන්නේ කඳවුරු බැඳගෙන ඉන්නවා. පස්සේ ඒ අය දුනුහී මානලා උන් විනාශ කරල තියෙනවා. පස්සේ රජතුමාට මේක ආරංචි වෙලා රජවාසලට කැදවලා තෑගි හෝග දීල තියෙනවා. ලිදේගෙදර කෙනෙක් මේ සටනට දායකත්වය ලබා දීල තිබෙනවා. එයාට ජයසිංහයා කියල නම දැම්මලු. පස්සේ ඒ පරම්පරාව ලිදේ ගෙදර ජයසිංහලා වුණාලු. ඒ වගේම රජ්ජුරුවෝ යටිහලගල ගම ගම්වරයක් ලෙස නම්කරලත් තියෙනවා. කෝට්ටල මේ ගමේදි රාජ භාණ්ඩාගාරයට අයබදු එකතු කරලත් තියෙනවා.

පරංගින්ට පස්සේ උඩරටට ආපු සුද්දෝ මේ ගමේ තේ වගාව කරල තියෙනවා. අපිත් තේ වැව්වා. අද තේ වතු මුඩුබිම් බවට පත්වෙලා. ගම්මිරිස් වගාව තිබුණා. ඒවත් නැතිවෙලා. නොයක් මිශ්‍ර බෝග වගා කිරීම නිසා එක දෙයකින් වත් ප්‍රයෝජනවත් දෙයක් වෙලා නැහැ. අල බතල වර්ග රාශියක් වගා කරල තිබුණා. ඒවා කාලා අපේ

පරංගි කඳවුර තිබුණ රණබිමට ගන්නෝරු කන්ද පෙනෙන අයුරු

අය හොඳ ශක්ති සම්පන්න අය වුණා. මගේ පියාණන්ද වයස අනු ගණනක් ජීවත් වුණා '

හාරිස්පත්තුව ප්‍රාදේශීය සභා මන්ත්‍රී විජිතකුමාර නදුන්ගේ මේ පිළිබඳව මෙසේ පැවසීය.

'2021 මාර්තු 28 වැනි දිනට ගන්නෝරු සටනට වසර 383 ක් වෙනවා. ඒ සටනට අපේ මුතුන් මිත්තෝ තමයි නායකත්වය දීල තියෙන්නේ. ගන්නෝරු කන්දේ දිවිදොස්ගල මත ඉඳල තමයි දියාගෝ ද මේලෝ නමැති පරංගි යුද සෙනවියා මරා දැම්මේ. එදා විසි හත්දහසක පමණ පරංගි සේනාව විනාශ කරල දැම්මා. සටනට නායකත්වය දුන් රාජකරුණා වේල්ලි මුදලි සෙන්පතියා යටිහල ගමේ සිට ඇවිත් තියෙන්නේ දිවිදොස්ගල මුඳුනට. එදා ඒ අනීත සෙන්පතියන් ආපු අශ්ව කරත්ත පාර තවමත් දකින්ට ලැබෙනවා. එදා මහනුවර අතහැර කොත්මලේට දෙවැනි රාජසිංහ රජු ගොස් සිටියදී රාජ නියෝගයකින්ද තොරව තමන් මවුබිම වෙනුවෙන් ස්වකීය යුතුකම ඉටුකරල අදට වසර තුන්සිය අසුතුනක් වෙනවා. නමුත් එවැනි සෙන්පතියන් බිහිකළ යටිහලගල ගමට වර්තමානයේ තියෙන්නේ කුඩම්මගේ සැලකිලි. අදටත් ගන්නෝරු සටනක් තිබුණා කියල සාකච්ඡා කළාට ඒකට නායකත්වය දුන්, සටනේදි දිවි පුදපු ඒ වීරෝදාර රණවිරුවන් ගැන පොතපතක වත් සඳහන් වෙන්නේ නැහැ. ඒක ඇත්තටම කනගාටුවට කරුණක්. ඒ විරෝදාර රණවිරුවන් බිහිකළ ගමේ මන්ත්‍රීවරයා හැටියට මට කටයුතු කරන්න ලැබීම සතුටට කරුණක්. මට වුවමනා වෙලා තියෙන්නේ මේ ඓතිහාසික යටිහලගල ගමට වෙච්ච වැරැද්ද නිවැරදි කර ගැනීම. සමහර රාජද්‍රෝහී ක්‍රියාවන්ට පෙලඹුණු අයගේ තොරතුරු අධ්‍යාපන පෙළ පොත්වල පවා ඇතුළත් වෙලා තියෙනවා. නමුත් රාජ නියෝගයක්වත් නොමැතිව තම රට රැක ගැනීම දිවි පුදකළ යටිහල පදිංචිව සිටි ඒ රණවිරුවන් ගැන කිසිවෙක් සඳහන් කරන්නේ නෑ. එමනිසා අද වගේ දවසක සිදුවුණු ඒ යුද ජයග්‍රහණය මෙනෙහි කරල වර්තමාන රජයවත් මේ යටිහලගල ගමට ඒ ඉතිහාසයට වටිනාකමක් දෙනවා නම් හොඳයි කියන එක තමයි මගේ අදහස. අනුරාධපුර යුගයේ සිටම රටේ ආරක්ෂාවට තැනින් තැන සේනාව යොදවලා තිබුණා.එසේ තිබුණු තැනක් තමයි මේ හාරිස්පත්තුව යටිහලගල කියන ගම.ඒකත් අපි අමතක කරන්න හොඳ නැහැ'

ඓතිහාසික ගන්නෝරු සටන පිළිබඳව මහත් අභිමානයෙන් කතා කළ යටිහලගල ශ්‍රී සුමානාරාම පුරාණ විහාරයේ විහාරාධිකාරී දෙනුවර ප්‍රධාන අධිකරණ සංඝනායක පූජ්‍ය වල්ගොව්වාගොඩ අමරවංශ හිමි මෙසේ පැවසූහ.

'ඇත්තටම අද වැනි දිනයක තමයි කන්ද උඩරට වෙහෙර විහාර විනාශ කරලා අහිංසක ජනතාව මරාදැමූ පරංගි හමුදාවට අපේ මුතුන් මිත්තෝ අමතක නොවන පාඩමක් ඉගැන්නුවේ. අද රක්ෂිත කැලයක් බවට පත්කර තියෙන හෙක්ටයාර් 63.787 කින් සමන්විත ගන්නෝරු කැලයේ සිට තමයි අපේ විරෝදාර හමුදාව පරංගින්ට එරෙහිව සටන සංවිධානය කරල තියෙන්නේ. ඒ වනාන්තරය පාමුල තමයි යටිහලගල ගම තියෙන්නේ. ඉතින් අදින් වසර 383 කට පෙර එදා ගන්නෝරු සටනට එක්ව රටදැය වෙනුවෙන් දිවිපිදු රණවිරුවන් සිහිකර අපේ විහාරස්ථාන පරිශ්‍රයේ ස්මාරකයක් හා කෞතුකාගාරයක් හදන්න කියල මම වගකිවයුතු අයගෙන් ඉල්ලා සිටිනවා'

ඉනෝකා සමරවික්‍රමට සාහිත්‍ය සුරී සම්මානයක්

සංකලන සඳැස් කාව්‍ය සංසදය(සසකස) කාව්‍යාභිමානී 2020 සම්මාන උලෙළ ලෝක කවි දිනය යෙදුණු මාර්තු 21 දා කඩවත ඉන්ද්‍රා හෝටලයේදී පැවැත්විණි. එහිදී සිළුමිණ පුවත්පතේ "කවි සිළුමිණ" කාව්‍ය පිටුවෙන් ප්‍රවීණ සහ ආධුනික කවි කිවිඳියන්ට කරන මෙහෙය අගයමින් එහි සංස්කාරිකා සිළුමිණ නියෝජ්‍ය විශේෂාංග කර්තෘ ඉනෝකා සමරවික්‍රම සාහිත්‍ය සුරී සම්මානයෙන් පිදුම් ලැබීය. සංකලන කවි සංසදයේ විධායක රංජිත් මල්ලුවාවඩු කවියා විසින් සම්මානය සහ සහතික පත්‍රය ප්‍රධානය කළ අයුරුයි මේ . සංකලන සඳැස් කාව්‍ය සංසදය විසින් දිවයින පුරා පාසල් දරු දැරියන් අතර පවත්වන ලද කාව්‍ය රචනා හා පද්‍ය ගායනා තරග වලින්ජයගත් ජයග්‍රාහකයන්ට සම්මාන සහතිකපත් පිරිනැමීම මෙන්ම සංගමයේ කවි කිවිඳියන් ඇගයීමද මෙහිදී සිදුකරන ලදී.

ජායාරූප _ තිසරණ පෙරේරා

වියතුනුත් වරදවන ල ළ යෙදුම්

● ශ්‍රීනාත් ගණේවත්ත

ගිය වර 'හරි වහරින්' අපි 'ල' යෙදිය යුතු තැන වරදවා 'ළ' යෙදෙන වදන් කිහිපයක් විමසා බැලුවමු. අද ද එසේ (දන්තජ) 'ල' වෙනුවට වරදවා (මූර්ධජ) 'ළ' යෙදෙන වදන් කිහිපයක් විමැසිල්ලට ලක් කරමු. මෙ ද වහරෙහි බොහෝ පැතිරී ගිය වදන් වෙයි. එ හෙයින් බොහෝ දෙනකු - බොහෝ වියතුන් පවා සිතන්නේ වැරැදි වහර හරි බව යි, හරි වහර (දන්තජ 'ල' යෙදීම, වැරැදි බව යි. පද නිෂ්පත්තිය (වදන් නිපැදී ඇති සැටිත්) සැලැකිල්ලට ගනිමින් මේ විමැසීම කැරෙන්නේ සැකයෙකින් තොර ව ම හරි වහර පෙන්වා දිය යුතු හෙයිනි.

මුලින් ම 'වැලැපෙනවා' යන ක්‍රියානාමය ගනිමු. මෙය බොහෝ දෙනකු ලියන්නේ 'වැළැපෙනවා' යනුවෙන් (මූර්ධජ) 'ළ' සහිත ව ම ය. (දන්තජ) 'ල' යොදා එය ලියූ සිසුවකු ගේ එ යෙදුම වැරැදි බව පවසා (මූර්ධජ) 'ළ' යොදා එක් ගුරුවරියක එය 'නිවැරැදි' කළ බව වරක් අසන්නට ලැබිණ. එ සේ ඇතැමුන් (මූර්ධජ) 'ළ' යොදනුයේ 'වැළැකෙනවා' යන වදන හා නොනිසි ලෙස සමාන කිරීමෙන් යැයි ද සිතිය හැකි වේ.

'වැලැපෙනවා' යනු නිපැදෙන්නේ 'වලප්/ වලප' යන ධාතුවෙනි. (ක්‍රියා මූලයෙනි) ඒ හා අනුරූප වැ සංස්කෘතියෙහි ද පාලියෙහි ද 'විලාප' යනු යෙදේ. එහි යෙදෙන්නේ (දන්තජ) 'ල' විනා (මූර්ධජ) 'ළ' නොවෙයි. සිංහලයෙහි ද (දන්තජ) 'ල' යෙදෙන බව එයින් ස්ථිර වේ. සිංහලයෙහි තද්භව වචනවල ණ - න - ළ - ල යෙදුම බොහෝ තන්හි පාලියට අනුරූප වෙයි. මෙහි සංස්කෘත පාලි දෙකෙහි ම (දන්තජ) 'ල' යෙදෙන නියා සිංහලයෙහි ද එය ම යෙදෙන බව නිසැක ය.

වලප්/ වලප ධාතුව 'වලපී - වලපිති - වැලැපි' යනුවෙන් පරස්මෛ පදයෙහි ද 'වැලැපේ - වැලැපෙති - වැලැපිණි - වැලැපුණු' යනුවෙන් ආත්මනේ පදයෙහි ද වර නැගේ. මෙහි නාමය 'වලප' යනු යි. වත්මන් වහරෙහි එ තරම් නොයෙදුණ ද පැරැණි වහරෙහි ඒ යෙදිණි. "වන සොවුනෙන් යහන් පත් නිරතුරු ඉති වලප ගත්" යන කවි සිළුමිණි යෙදුමෙහි ඒ මැනැවින් යෙදේ.

මෙ ලෙස වරදවා යොදන තවත් වදන නම් පුලුස්සනවා' යනු යි. බොහෝ විට, බොහෝ දෙනකු යොදන්නේ 'පුළුස්සනවා' යන (මූර්ධජ) 'ළ' සහිත රූපය යි. ඒ ඉඳුරා ම වැරැදි වේ. (දන්තජ) 'ල' සහිත රූපය ම නිවැරැදි වේ.

'පුලුස්සනවා' යන ක්‍රියා නාමය නිපැදෙනුයේ 'පුලුස්' යන ධාතුවෙනි. ඒ හා අනුරූප වැ සංස්කෘත භාෂාවෙහි 'ප්ලෝෂ' යනු යෙදේ. එහි (දන්තජ) 'ල' යෙදෙන අයුරු පැහැදිලි ය.

'පුලුස්' ධාතුව 'පුලුස්සා - පුලුස්සති - පිලිස්සී - පිලිස්සූ' යනුවෙන් වර නැගේ. ඉංගිරිසියෙහි 'ෆ්යුජ්' (fuse) යන වදන සඳහා සිංහලයෙන් 'පුලුසු' යන සිප්යුරු (පාරිභාෂික වදන තනා ඇත්තේ ද 'පුලුස්' ධාතුව ඇසුරිනිත.

පිලිස්සුණු, දැවුණු යන අරුත දීම පිණිස සංස්කෘතයෙහි 'ප්ලුෂ්ට' යන්න යෙදේ. ඒ හා අනුරූපව සිංහලයෙහි 'පුලුටු' යනු යෙදේ. වත්මන් වහරෙහි 'පුලුටු' යන්නෙන් පුලුස්සන ලද දේ (ඇතැම් විට) තෙලින් බදින ලද දේ අදහස් කෙරේ.

සිංහල කට වහරෙහි එන 'පුච්චනවා' 'පුස්සනවා' යන වදන් ද තැනී ඇත්තේ 'පුලුස්සනවා' යන්න ම අව්‍යක්ත ලෙස උච්චාරණය කිරීමේ ඵල වශයෙනි. එහිදී 'ල' ලොප් වී ඇති සැටි දැකිය හැකි ය. ඒ, දැත (ඉක්මන්) උච්චාරණය නිසා වූ විකෘතියෙනි.

මේ පිලිස්සීම, දැවීම යන අරුත ම දීම පිණිස 'පලහ' යි ධාතුවක් ද යෙදේ. එය 'පල හා - පලහති - පැලැහී - පැලැහූ' යි වර නැගේ. මෙහි දු යෙදෙනුයේ (දන්තජ) 'ල' ම ය. අද වහරෙහි එ තරම් නෙයෙදුණෙ ද පැරැණි වහරෙහි යෙදුණු බවට 'පැසි හිඟුරු අම මෙන් - ඇදැ පලහා කටැ මියුරු' යන කවි සිළුමිණි පැදිය ආදිය මනා නිදසුන් වේ.

(දන්තජ) 'ල' වෙනුවට (මූර්ධජ) 'ළ' යොදා නිතර වරදවන තවත් වදන් පෙළක් ලෙස සිත්කළු, දැකුම්කළු, කන්කළු ආදිය දැක්විය හැකි ය. මේ සියලු තන්හි දන්තජ 'ල' (සිත්කලු, දැකුම්කලු, කන්කලු ආදි වශයෙන්) යෙදිය යුතු ය. කළු - කලු යනු අරුත් දෙකක් දෙන වදන් වේ. කළු යනු සංස්කෘතයෙහි කාල, පාලියෙහි කාළ යනු හා අනුරූප ව යෙදේ. එහි අරුත කළු පැහැය නොහොත් 'මරණය' යනු යි. ඒ අනුව දැකුම්කළු යනු කළු පැහැය නොහොත් මරණය දැක්ම ද සිත්කළු යනු කළු සිත නොහොත් මරණ චින්තය ද කන්කළු යනු කළු පැහැති කන් නොහොත් කනෙහි මරණය ද හඟවයි. කළුකන් ඇති බව (තාල කර්ණ භාවය) යනු අවාසනාවන්ත බව යි.

කලු යනු සංස්කෘතයෙහි 'කල්‍ය' යන්න හා අනුරූප ව යෙදේ. ඇදගන්නා, ආකර්ෂණීය යනු එහි අරුතයි. එ අනුව සිත්කලු යනු සිත් ඇදගත්ත ද, දැකුම්කලු යනු දර්ශනය ඇදගන්නා හෙවත් අලංකාර ද කන්කලු යනු කන් ඇදගන්නා හෙවත් මධුර ද යන අරුත් ඇත්තේ ය.

කියනු මැන දෙවිඳුනේ

මිනිස දහම් දෙදරා
ජාති භේද මතු වී...
කෙළෙස් දම් බිඳී
බලයේ සුක්කානම් පතා...

ජාතියක සෙනෙහස පලුදු කොට
අගාධයකට වැටී
පරලොවදි අපි
මොනවා පතාදෝ...

කියනු මැන
දෙවිඳුනේ
ජීවය මැවූ...

● **නාමෙල් වීරමුනි**

හැර නොයන පෙම

කිසි දිනක නොලද උණුහුම
ආදරණීයයි නුඹ මට
උණුහුමක සුවඳ දෙන..
බොහෝ දෙන කරන බස්
රිදවමින් මා
මට උරුම නැති
උණුහුම...

හිඳින විට මා තනිකමක
කඳු පාමුල ඇල අද්දර
මා සොයනා නුඹ ඇවිදින්
ළෙන්ගතුකම පැවේ
මට සමීපව
මට වටින නුඹ...

හිමිදිරිය දහවල
ගොම්මන නැගෙන තැන
මා සෙවූ අය
හීටරේ උණුහුම ලබනවා දැන්
ඒ පැමිණි අය...

උණුහුමක් නැති නුඹ
සීතලය ඒ අයට
නාව ද යළිඳු ඒ අය
සීතලේ මගෙ තනියට
නුඹ මා ළඟය තවම...
වුව ද නුඹ සීතලේ
කිසි දිනක නුඹ
මා හැර නොයන වග
මට දැනෙයි
ආඩම්බර හාදුවක
උණුහුමක සුවඳ දෙන...

● **කීර්ති කපුවත්ත**

ජීවිතය

උදැසන පිබිදී
සවසට පරවෙන මලකි
නැත,
එය
සුළං කපොල්ලක
අතු අග සුපිපුණ
දුහුළු මලකි...

● **එච්.එම්.ආර්. ශාන්ත කුමාර**

ලස්සන ලොවක්

වෛරය ක්‍රෝධය අත් හරිමු
හිනැහි හිනැහි කල් ගෙවමු
විනෝදයෙන් ජීවිත ගෙවමු
ලස්සන ලොවකට පිය නගමු

● **නදීකා ඇහැලියගොඩ**

විදෙස් කවිය

අම්මා වෙතටයි

අද ඔබේ උපන් දිනේ බව මසිත මට කියයි
මගෙ සිත මට ඔබ ගැන කියන විට
එය කවදත් මට මහත් සේ විශ්වසනීයයි
අම්මෙ ඉතින් මට කියන්න
ඔබ වෙනුවෙන්
මම කුමක් නම් පැතුව යුතුවා වෙම් ද ?
මහ ධන නිධාන ?
ගරු නම්බුනාම ?
රාජකීය රන් කිරීට ?
අහෝ අම්මේ
එහෙව් දේ නොවෙයි
ඔබ දකින විට මසිත පහළවෙන
සතුට බඳු සතුටක් මම ඔබ වෙනුවෙන් පතමි

විකටෝර් හියුගෝ (Victor Hugo)

Victor Hugo (1802-1885) යනු කීර්තිධර ප්‍රංශ ලේඛකයෙක් ව නොදන්නෙක් නැත.
ඔහු ලියා පළකළ ඓතිහාසික නවකතාවක් වූ නෝත්‍රදාමයේ කුදා (Notre-Dame de Paris, 1831) නිසා අදත් ඔහු නොපිරිහුණු කීර්තියකින් යුතුව සිටින්නෙහි ය. හේමන්තයේ තුරුපත් (Les Feuilles d'automne, 1831), අවරට යන ඉරක ගී (Les chats de crépuscule, 1835) , ඇතුළාන්තයක හඬවල් (Les voix intérieurs, 1837) හා ආලෝකධාරා හා සෙවණැලි (Les rayons et les ombres, 1840) ආදී ඔහුගේ කවි පොත් සමස්ත ප්‍රංශ කාව්‍ය ඉතිහාය සලකුණු කිරීමට සමත්ව තිබේ. 1816 වැනි වසරේ සැප්තැම්බර 26 වැනිදා සිය
මව අමතා 'අම්මා වෙතටයි' (A Mamañ) යන මැයින් ඔහු මේ කවිය ලියුවේ ය. මේ ඒ ප්‍රකට කවියේ සම්පූර්ණ සිංහල අනුවාදයයි.

අනුවාදය : උදයංග අමරසේකර

සිතුවමක් වූ මතකය

විදුලි පහන් ආලෝකයෙන්
වර්ණවත් වූ මන්දිරයේ
පියගැට පෙළ බසින ඔහුට
වර්ණවත් සාදයෙහි
වර්ණවත් කතාබහ
වර්ණවත් ඇඳුම් ආයිත්තම්
මේ සියල්ලෙන් වැසුණු
ජීවිතේ යථාර්ථය
මායා තිමිර පටලයක්
වුණි දැස තුළ
කිසිදා බලන්නට
නොහැකි විය සත්‍ය
ඇගේ සරාගී දැස් හමුවේ
අමතක විය ඔහුට
ඔහු වටා ගෙතුණු ජීවිතය
පොහොසත් දනන් හමුවේ
සුරාවට රාගයට
උගසට තැබුවේය ජීවිතය
යළිඳු යනු නොහැකි
තමා ආ මාවත තුළ
තනිව බලා සිටිනා යුවතිය
සිතුවමක් විය මනසට

● **ඉරේෂා දුලාංජලී කල්දේරා**

ළඳුනි

නුඹට මතකද එදා
පිදු සෙනේ දයාවෙන්
ළංවෙලා මුළු හදින්
ලොවම අමතක කරන්...
ඇයි ගියේ වෙන හදට

කඳුළු දී මගෙ නෙතට
නතුවෙන්න ඔහු පෙමට
අඩුවුණේ කිම නුඹට...
තටු සිඳුණු කිරිල්ලක

වෙළා නුඹ හඬනවද
බඹර තුඩ විස බවම
පසක් වෙනවාද අද...

● **ශ්‍රීමතී කුමාරි ජයකොඩි**

මුහුණු පොතේ කවියක්

අනියත දහම

සොඳුරු වූ යැයි දකින අවසන
ආස වූ යැයි නැවතුමක් ළඟ
දුකම එහි මැයි පෙනී නොපෙනිම
ඇලි ඇලී තව විඳින දුක මය...

සොඳුරු කිසි තැන නිවෙන්නට මඟ
ආස හැම තැන නිවෙන්නට මඟ
නොවන වග මුණිඳුන් වදාහල
එයයි තිර එක අනියතක දම..

● **දේවී ජයවර්ධන**

නරියා, මිදි වැල සහ අපි

නරියෙක් යන විටදී දවසක් බඩගින්නේ
තිබුණා මිදි වැලක් ගෙදරක පිළිකන්නේ
දැක එහි තිබුණ මිදි ගෙඩි කොහොමද කන්නේ
ටික ටික ළං වුණා ක්‍රමයක් හිතමින්නේ

බැලුවා අවට නැත කිසිවෙකු පෙනෙන්නට
කෙක්කක් වත් නැතේ අහලක දකින්නට
මොනවද ඉතින් ඇත්තේ දැන් කරන්නට
උඩ පැන බලන්නම් මිදි ගෙඩි කඩන්නට

උඩ පැන බැලුවා මිදි තව උඩ ඇත්තේ
ආයෙත් පනියි දහිරිය අරගෙන චිත්තේ
නැවතත් පනින්නයි නරියට හිත ඇත්තේ
උඩ පැන බලයි එවරත් කිසි පල නැත්තේ

සමහර විටදි උත්සාහ කෙරුවත් පල නැත්තයි
ආයෙත් උත්සාහ කළත් ප්‍රතිඵල නම් තිත්තයි
අපටත් එහෙම දේ වෙන බව නම් ඇත්තයි
බැරි වුණ විටදි බැණ බැණ යන බව සත්තයි

● **නන්දිසේන මුහන්දිරම්ගේ**

යකඩ ඇණය ලීයට කියූ කවිය

පහර දෙද්දි වේගයෙන්
යන්න සිදුවිය මට
උඹ පසාරු කරගෙන
ඇසි ඇසී උඹෙ මර විලාසය

මගේ කෑමොර හඬ අසන්නට
තරම් සිහි කල්පනාවක් නැති
උඹේ රුහිරෙන් නෑවි නෑවී
උන්ගෙ ඕනෑ එපාකම්
ඉටු කරන්නට ....

ඉඩ දුනිමි යකඩෙට
මගේ සිරුරෙන් ගලන
මලකඩවලින් නැහැවී
කළු ගැහී උඹ
මාත්තෙක්ක ම හඬා වැලපෙන
ලොවම හරි තද කළුයි සුමිත්‍රා

● **කේ.පී.ඩබ්ලිව්. ප්‍රියන්ත ජයලත්**

එක මලක්....

එක එක මල් ගොමුවෙ එක එක මලේයා
දෙක දෙක මල් මොටද එක මල අගේයා
වනන්තරේ නිරන්තරේ පරසතු මල් පිපේයා
නුඹ එක මලකි මටනම් නුඹ අගේයා.

● **විශ්ව ජයම්පති බණ්ඩාර.**

මිනිසුනේ

අඳුනන නාඳුන මනුසත් හදකට
දෙන්නේ නම් ඔබෙ සිනාව මදකට
යන්නේ නැ ඔබෙ ධනයෙන් අඩු කොට
මැණිකකි සිනාව මිනිසුනි අපහට

● **චමෝද්‍යා කාවින්දි**

අනිත්‍යය

හිරු කිරණ සිපගෙන
විකසිතව අරවින්ද...
බුදු සමිඳු පාමුල දී
පුද ලබන
අපූරුව...

අනියතේ සොබාවය
නිරන්තර පසක් කර
පරවෙලා ගියා වෙද...
සොඳුරු සියපත

● **බුද්ධිකා සංජීවනී**

ඈ...

මැරුණු තරුවක් ලෙද
දුබල කය වාරු කරගෙන
අහසට නැඟ බලමි
ඔබ එදා වෙන්ව ගිය
ඒ අඳුරු මාවත...!

මහදුගේ යට
ඔබ නිදන සොහොන් ගැඹ
තවමත් සිහිල රඳවන
ඔබ නික්ම ගිය සොවින්
මහනුගෙත් හඬනවා තව...

මහනුගේ වෙත පැමිණි සඳ
මගේ නෙත් මත
ඔබ දිලිසී මොහොතක්
ඔබ දියව ගිය සැටි පුදුම..

● **නිහාල් ගුණවර්ධන**

ඇත් අම්මාගේ පැතුම

හුළං කෝඩය දුවන් ඇවිදින්
අහස පුරහම සුදු වලාවන්
මේඝ ගර්ජන විදුලි වැල් මැද
මෙලොව දිනූ පුත වාසනාවන්
උපන් දා සිට වනේ දලුකොළ
තොලේ රන්දා දුන් සිනාවන්
සී කරන් පුත සැනසියන් අද
නුඹේ පිං කඳ වාසනාවන්...

ගම් දනව්වල රුදුරු මිනිසුන්
ඇවිත් වනසති අපේ උරුමය
මොනරු මිටි කොට වනස් පතියන්
මොරටු ඉගිලෙන අයුරු කදිමය
යදම් මරුවැල් තිබේ හැම තැන
සොඳුරු වන ගබ නැසෙන කරුමය
නුඹේ පරපුර උදාරයි අද
එයයි ඇති නිය දමේ අරුමය...

කුංචනාදය පුතුනි නුඹගේ
වනය දෙදරුම් කවයි මිහිපිට
යෝධ සවිබල දුන්න කඩොලැත්
නුඹේ සීයා කෙනෙකි රජ රට
පනා මුරේදිත් ජීවිතේ දුන්නේ
අපේ වරිගය නගා ගන්නට
එදා හිටියෙත් නුඹේ සීයයි
දන්ත දා හිමි වඩම්මන්නට...

එපා කිව් දේ නො අසාම නුඹ
ගොසින් යදමක හිර වුණා
ඉන් මිදෙන්නට බැරිව ගත්තු වීරිය
මගේ හද කිරි ගැහුණා
වනෙන් පිටමං වුණ දිනේ සිට පුතේ
නෑ සනුහරෙම තැවුණා
සීවරං දෙවි ඔබට බාරයි
ම'පුතු රැක ගනු මැනවි යෙහෙනා

● **රත්නා කහඳගමගේ**

ගඟ ඉවුරු සහ මුහුද

සීත කඳු ලඳ
ළැමෙන් ගිලිවුණ
ක්ෂීර බිඳුවක්
ගිලී යන්නට නොදී පොළොවෙහි
සිනිඳු දෝතක් තබා දැලින්
කුඩා දියවැල සදා දුන්නේ
ඉවුරු නොම වෙද?...
රුදුරු ගල් පර අනෙක බාධකවලින් බේරා
ඇළක් කොට එය
ගඟක් කොට යළි
පෙරට ගෙන ගියෙ
ඉවුරු නොම වෙද..
පළල් කර කර ගැඹුරු කර කර
ගඟක් ලෙස එය පෙරට ගෙන ගියෙ
ඉවුරු නොම වෙද?....
ඈත සිට ගඟ
මඟ ගෙවා ගෙන
ගලා එනු දැක
වන වනා අත් නොඉවසිල්ලෙන්
බලා සිටිනා මහා සයුරට
තුරුල් වන විට
රුදුරු බාධකවලින් බේරා
පළල් කර කර ගැඹුරු කර කර
ගඟ සුරැකි අර ඉවුරු දෙක ගැන
ගඟට මතක ද?...

● **සිරිනිමල් ලක්දුසිංහ**

වළං මැණ්ඩිය

මහ බැද්දේ පතොක් යායෙ නුඹස් බැඳිලා සරුවට
ගඳපානා ගස් ගොන්නේ එරමිණි වැල් වකාරයට
ගම් තුලාන යට කරගෙන දිය අගලක් බැස පහළට
වළං ගොඩැල්ලේ හිරු රැස්, සඟවන්නේ ගස් කදිමට

කටු මැටිටෙන් හැඩ ගේ දොර, ළං කරගෙන එක පොකුරට
ඉලුක් වහල් හිල් කරනව අව්රැස් ඊතල විලසට
පුංචි පුංචි කඳු විලසින් මැටි ගොඩවල් පිළිකන්නට
පේවිලා දින එනතෙක් බලා හිඳියි උජාරුවට

වැහි කාලෙට මැටි වළවල් සැරසීලා ගෙඹි මඟුලට
තාල අල්ලමින් පද්දයි ගෙඹි පැංචියො හනි හනිකට
අඟුවෙ පිලේ හටටි ගොඩක පහන් කරන අප්පොච්චිට
තිස්සෙ නැහුන මුළු ඇඟපත නිවා ගන්න නැත රැයකට

සියොළඟ මතුවන ඩා බිඳු, කඳුළු, සුසුම් කැටි වළඳට
හැකි වේවිද? පෝරණුවෙන් බැසගන්නට තැබූ විලසට
බිඳුණු වළං ගොඩක සැඟව කැකුළු හීන වළපල්ලට
යන දිනයට මාරු කාසි ඇති වේවිද පණ රැකුමට

බුලත් කහට පිරි දෙතොලෙන් හිනා කිණිති ගෙන එළියට
ගොමස්කඩව ගිය රෙදි පිළි දවටා ගෙන හරි කදිමට
කත් ලීයේ බරට නැමී ගාට ගාට තුන් කුදයට
මඩ පල්වුණු ගේ මිදුලෙන්, වහන් වෙන්න නම් කෙදිනට

● **කපිල බස්නායක**

සතියේ කවිපොත

කෘතිය- **LOCKDOWN** නොකළ සිතුවිලි
කර්තෘ - වෛද්‍ය මනෝරි ගමගේ
අමිල - රුපියල් 250 පිටු 52
විමසීම් -071 8312898
ගොඩගේ ප්‍රකාශනයකි

රට වසා දැමුවත් , රැකියාවලට යෑම තාවකාලිකව නතර වුවත් කොවිඩ් 19 මිනිසුන්ගේ සිතුවිලි සිරකර දමන්නට බැරි විය. ඇතැමුන් කැත්ත උදැල්ල අතට ගත්තේ දවස නිකම්ම ගෙවා දමනවාට වඩා වත්ත කොටා කෙසෙල් පඳුරක්, බතල වැලක්, වම්බටු පැළයක් සිටුවීම පලක් ඇති දෙයක් යැයි සිතූ නිසාය. තවකෙක් අත්කම් නිර්මාණ කරන්නට විය. නිවෙසට වී රැඳුන කාලයේ කවුරු කවුරුත් මොන මොනවා හෝ කරන්නට විය.

ළමාරෝග විශේෂඥ වෛද්‍ය මනෝරි ගමගේ ගේ **"LOCKDOWN** නොකළ සිතුවිලි" කාව්‍ය සංග්‍රහය ද එවැනි සුබවාදී දැක්මකි. පාසල් කාලයේ සිට කවියට පෙම්බැඳි ඇය තුළින් කවිය ඇත් වන්නේ වැඩිදුර අධ්‍යාපනය සඳහා යොමු වීමත් සමඟය. විශ්වවිද්‍යාල ආචාර්යවරියක, වෛද්‍යවරියක ලෙස කටයුතු කිරීමට යොමු වීමත් සමඟ ගිලිහි ගිය කවි පිළිබඳ යළිත් මතුවන්නේ කොරෝනා වෛරසය රට ආක්‍රමණය කිරීමත් සමඟය. මේ ඈ සිතට ආ සිතුවිලිය. ඇය බොහෝම නිදහසේ තමන්ට දැනෙන දේ ලියන්නට සමත් වී ඇත.

විටෙක කොරෝනා යනු වෙස්වළාගෙන පැමිණි ආශිර්වාදයක් බඳුය. බොහෝ මිනිසුන්ට අපේකම මතක් වුයේ ද ස්වාභාවදහම ගැන මතක් වුයේද ඒ කාලයේය. බෙහෙත් පෙත්තකින් කැස්ස හෙම්බිරිස්සාවට සුවය සෙවූ බොහෝ දෙනා කොරෝනාවෙන් බේරීමට අපේ රටේ හෙළ වෙදකම පමණක් නොව නොයෙක් දේශීය ආහාර රටාවන්ට මුල්තැන දෙන්නට විය. රට වසා තැබූ කාලය් මිනිසුන් වෙනස් වුයේ ඔවුන්ට ද නොදැනෙන ලෙසය. මේ සියල්ල පිටුපස ඇත්තේ මරණයට ඇති බිය බව කිවිඳිය අවධාරණය කරන්නීය. මාතෘකාව මතක් වූ අපේකම.

හට්ටියේ දුම උඩට ඇදඟ ඇද
කොත්තමල්ලි දිවා රෑ බොන
පෙරුම්කායම් අත පයේ බැඳ
වෙලා "ගොඩයන් ", "පොඞ් " සිතූ හැම
වස විසක් නැති බෙහෙත් නොගසන
ගම් දොරේ වැව් අහර සොයමින
පිළි මළකුණු කිසිත් නොබුදින
"ගුණවතුන්" ඇත විසිර දස අත
පෙන්නලා බොරු මුහුණු ලෝකෙට
ගරහලා පෙර අපේ සිරිතට
ගලවලා හැව මරණ භයටම
අදහලා ඇත අද අපේකම

කොරෝනා වයිරසය නිසා චීනයේ ඉතාලියේ ඇමෙරිකාවේ දස දහස්ගණනින් මිනිසුන් මිය යන විට පැය ගණනක් ඉකුත්ව යන්නට පෙර ඒ සියලු සිරුරු දවා අළු කර දමන විට අප කම්පාවෙන් එදෙස බලා සිටියෙමු. දැන් අපේ රටේ ඇත්තේ අවමංගල්‍ය උත්සවය. අතේ මිටේ සල්ලි නැති කෙනෙක් මිය ගිය විටද කෙසේ හෝ ඒ ඒ කටයුතු කරන්නේ ණයක් වීය. නමුත් කොරෝනා වයිරසය ඉගැන්වූ පාඩම මේ සියල්ල යටකර දැම්මේය. පළමු කොරෝනා මරණය අපේ රටට අලුත්ම අත්දැකිමක් විය. කිවිඳිය එය කියන්නට උත්සාහ දරන්නේ මෙසේය. මාතෘකාව කොරෝනා සහ මරණය.

මිනිය තනි වී බිය වෙතැයි
රකියි තව තනි නොතනියක්



මනෝරි ගමගේ

අහල පහලට වගේ හැමට ම
නොම දෙමින් ඉස්පාසුවක්
මරණ ගෙදරක් අපේ ගම රට
වෙනම ලියැවෙන කතාවක්...
කොරෝනා ඔබ ඇවිත් ඊයේ
කළා නොව මහ පෙරළියක්
එදා වගෙමයි නැසුණු කුණු කය
ඒත් හැමදේ හරි වෙනස්..
නිදි මැරිලි නෑ- තනි රැකිලි නෑ
නෙස්කැෆේ නෑ- මත් වතුර නෑ
එක්ව තැන තැන
දොඩන අය නෑ..
ගෙවී යනු මත්තෙන් දිනක්
දැවී අළු කරදා දෙනෙත්
දිවිය අනියත බව පසක්
කරන්නට නුඹ වුණි සමත්....

කිවිඳිය ගේ සෑම කවියකටම පාදක වී ඇත්තේ කොරෝනා සමයේ අත් විඳි දැය. දුටු දේය. ප්‍රවෘත්ති වලින් ඇසු දුටු දේය. අතේ මුදල් නිබුණ ද ඇතැම් විට බඩුවක් මුට්ටුවක් ගන්නට කඩයක් අහල පහල නොතිබිණි . ඇතැම් වට එළවළු මාළු හාල් තුන පහ ලොරි ගමට පැමිණිය ද ඒවා මිලට ගන්නට අතේ සල්ලි නැති ඇත්තෝ ද වුහ. බොහෝ අවහිර බාධක මැද්දේ දිවි ගෙවූ ඇතැම් පවුල් වල කෑවේ එක් වේලක් පමණි. ඇතැම් පවුල්වලට ඒ වේලත් නැත. කොහොම වුණත් පාසල් දින නියමයක් නැතිව වැසී ගිය විට දරුවන්ට පාඩම් උගන්වනු ලැබුවේ ඔන් ලයින් හරහාය. ඒ පහසුකමත් නැති දරුවෙකු කෙසේ නම් ඉගෙන ගන්න ද . දුප්පත්කම, අස්සේ කොරෝනා ද පැමිණ ඒ මදිවාට ඔන්ලයින් ඉගැන්වීම ක්‍රමය නිසා අපහසුවට පත්වූ දරුවෙකුගේ දුක්බර කතාවකි මේ. මාතෘකාව **Online Teaching.** ලොක්ඩවුන් නොකළ සිතුවිලි අතර තිබී හමු වූ මේ කවිය හද කම්පාකරවන සුලුය. එය වඩවඩාත් දනවන්නේ අවසන් කවි පේළියෙනි.

watsapp මෙන්ම **viber** ද නැත මෙමට හිමි
දුරකථනයක් ඇති කිසිවෙක් ගෙදර නැති
ටීචර් එවන වැඩ කිසිවක් නොදන්නෙමි
තනියෙන් මම පොත් පෙරලා බලන්නෙමි...
පැහැදිලි නොමැති තැන් තිබුණත් මගේ හිතේ
අහගනු කෝම අම්මට බෑ අකුරු පොතේ
හීනෙන් ඇවිත් අහගන්න ද හිමින් සැරේ
ඒකත් බෑනේ කුසගිනි නිදි නොදෙයි රෑයේ...

කොරෝනා නිසා අත්විඳින්නට වූ දුක්බර සිද්ධි පමණක් නොවේ රටේ දේශපානය , ආර්ථිකය මේ සමාජය ගැන ද ඇය "**LOCKDOWN** නොකළ සිතුවිලි" හරහා හරි අපූරුවට කතාකරන්නීය.

ඔබේ කවි නිර්මාණ පහත ලිපිනයට එවන්න
කවි සිළුමිණ, ලේක්හවුස්, කොළඹ 10.
විද්‍යුත් තැපෑල - *edmediaunit@gmail.com*

නිමැවුමක පෙරනිමිති

• සුමුදු ඔතරාණි

සියුම් දෑ අතර ඉසියුම් දෑ සොයන අනුල ද සිල්වා

අපි සුන්දරත්වයට හැඩයක් පාටක් නිර්මාණය කර ඇත්තෙමු. ඒවා සම්මත කෝඩු ය. ඒ මිම්මෙන් පිට ඇති සියලු දේ අසුන්දර යැයි අපි කියමු. එහෙත් සැබෑ සුන්දරත්වය ඒ මිම්මෙන් පිට තිබුණහොත්... අප සුන්දරත්වය මනින්නේ පෙර අප මනස හුරු පුරුදු කළ හැඩතල ඔස්සේ නොවේද? ඒ හැඩතල වලින් ඔබ්බට යන්නට අපට හැකි නම්...

ඔබ යම් යම් දෑ හඳුනාගන්නේ ඒවා ගැන ඔබේ මනසට බාහිර සාධක වලින් මැවූ දේ ඔස්සේ නො වේද? සාමාන්‍ය මිනිසුන් වන අප බොහෝවිට රාමුගත මනස් ඇති අය නිසා ව්‍යාකූල මනෝභාවවලින් පෙළෙන්නෙමු. ඔබට, මට නිදහසේ මිනිසුන් ඇසුරු කිරීමට නොහැකි වී ඇත්තේ එබැවිනි. මනස නිදහස් නොවන බැවින් විවිධ මනෝභාවවල ජීවත්වන අප එකිනෙකා දෙස බලන්නේ සැක සංකා සහිත ව ය. එනිසා ම ඔබට මා දෙසවත්, මට ඔබ දෙසවත් විවෘත මනසකින් බැලීමට නොහැකි වී ඇත්තේ ය. නිර්මාණකරුවා එසේ නැත. ඔහුගේ මනස විවෘත ය; නිරීක්ෂණ ගුණයෙන් යුතු ය; එනිසාම අපිට නොපෙනෙන දේ නිර්මාණකරුවාට පෙනෙන්නේ ය.

නිර්මාණයක පෙරනිමිති සොයා යන ගමනේ අද අපට හමුවන ලේඛිකාව අනුල ද සිල්වා ය. ඇය ජ්‍යෙෂ්ඨ පුවත්පත් කලාවේදිනියකි; පරිවර්තිකාවකි; ස්වතන්ත්‍ර නවකතා, යොවුන් කතා නිර්මාණවේදිනියකි.

ඇය සිය නිර්මාණ අතර 'මංජේශ්වරී' තම සිත වඩාත් සසල කළ බැව් පවසා සිටියේ මෙපරිද්දෙනි.

"මංජේශ්වරී කතාවේ එන්නේ ශ්‍රී ලංකාවේ නාවික හමුදාවේ තරුණයකු පිළිබඳවයි. ඔහුගේ ඉන්දියානු පෙම්වතිය හා තිබුණ බැඳීම, ඇය විවාහ කර ගැනීම දක්වා වූ කතාවයි. අද ඔවුන් වාසය කරන්නේ ඉන්දියාවේ. ලංකාවේ පළමු වතාවට හා අවසාන වතාවට තමයි හමුදාවේ සේවය කරන තරුණයකුට විදේශීය තරුණියක අවාහ විවාහ කර ගැනීමට අවස්ථාව සැලසෙන්නේ. ඒ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග ජනපතිනියගේ ධූර කාලයේ එතුමියගේ විශේෂිත අවසරය පිට. නීතිමය වශයෙන් විතරක් නොවෙයි මේ වගේ බැඳීම්වලට ප්‍රශ්න එන්නේ. ගෙවල් දොරවල්වලින්, අවට පරිසරයෙන් හැම දෙයින්ම. හැබැයි මේ සියල්ල ජයගන්නත් සැබෑ ආදරයට පුළුවන්. මෙන්න මේ කතාව ඇහුවම මගේ සිත සසල වුණා. එයයි මා 'මංජේශ්වරී' නවකතාවට පාදක කරගත්තේ.

> නිර්මාණයක ජීව ගුණය රඳා පවතින්නේ භාෂාව මත ය. ලේඛකයා හෝ නිර්මාණකරුවා භාෂාව ගැන දරන අදහස සහ භාෂාව භාවිතයේ වන නෛපුණ්‍ය බව ඊට එක්කරන ආලෝකයේ ප්‍රභාව සුළුපටු නොවේ. කෙතරම් හොඳ වස්තු බීජයක් වුව ද; කෙතරම් අපූරු පරිකල්පනයක් වුව ද; කෙතරම් අර්ථපූර්ණ රූප රචනයක් වුව ද භාෂාව නමැති දවටනයේ සුමිහිරි ව දවටා නැත්නම් ඒ නිර්මාණය ප්‍රතික්ෂේප වන්නේ ය.





නිර්මාණයක ජීව ගුණය රඳා පවතින්නේ භාෂාව මත ය. ලේඛකයා හෝ නිර්මාණකරුවා භාෂාව ගැන දරන අදහස සහ භාෂාව භාවිතයේ වන නෛපුණ්‍ය බව ඊට එක්කරන ආලෝකයේ ප්‍රභාව සුළුපටු නොවේ. කෙතරම් හොඳ වස්තු බීජයක් වුව ද; කෙතරම් අපූරු පරිකල්පනයක් වුව ද; කෙතරම් අර්ථපූර්ණ රූප රචනයක් වුව ද භාෂාව නමැති දවටනයේ සුමිහිරි ව දවටා නැත්නම් ඒ නිර්මාණය ප්‍රතික්ෂේප වන්නේ ය. ඕනෑ ම නිර්මාණයක සුන්දරත්වය, ප්‍රබලත්වය, හැඟීම් දනවන සුළු බව වැනි බොහෝ කාරණා සඳහා ඍජු ව ම බලපෑම් කරන්නේ භාෂාව ය. අපගේ වාක්කෝෂය පුළුල් වන්නේ කියැවීමෙනි; බැලීමෙනි; ඇසුරු කිරීමෙනි. අප වඩ-වඩාත් කියවන්නේ නම් අපට භාෂාවේ වන නව දැනුම්, නව වදන් එකතු වේ. අනුල ද සිල්වා අප ජ්‍යෙෂ්ඨ ලේඛිකාවගේ බස මුවහත් ය; සුගම ය; රිද්මයානුකූල ය. මේ සියල්ල එක්තැන් වූ කල ඇගේ අත්දැකීමට පරිකල්පනය ද මුසුවී අපූරු කතාවක් ගොඩනැගෙන්නේ ය.

'මායා බන්ධන පොත කියෙව්වහම, මෙය මිථ්‍යාවක් ද කියලා කෙනකුට හිතෙන්න පුළුවන් . ඒත්, මට මේ කතාව කිව්වේ මගේ පාඨකයෙක්. එය ඔහුගේ පවුලේ කතාව. මට ඒ කතාව ලිවීමට සිත් වූයේ එවැනි අත්දැකීම් කිහිපයක් මටත් තිබෙන නිසයි.

ඒ වගේම තවත් අත්දැකීමක් පාදක වුණු කොටස් තුනකින් යුත් නවකතාවක මුල් පොත තමයි 'මල්මද බිසෝලා'.

මේ කතාවේ මුල් කොටසේ එන්නේ ගමේ සාමාන්‍ය පවුලක තරුණයෙක්. ඔහු චිත්‍ර ශිල්පියෙක්. ඔහු තමන්ගේ නිවෙසේ සිටි මෙහෙකාර තරුණිය ගේ චිත්‍රයක් අඳිනවා. එයට විදෙස් සම්මාන ලැබෙනවා. ඔහු පසුකාලීනව ශ්‍රී ලංකාවට එනවා. මෙහි දෙවැනි කොටස වන 'වංගගිරි අසපුව' පොතේ එන්නේ විදේශයක සිට පැමිණෙන තරුණයා, තම පැලැන්තියට ගැළපෙන තරුණියක හා විවාහ වීමයි. ඒත්, අර මෙහෙකාර තරුණියගේ චිත්‍රයත් සමග ඔවුන් අතර ගැටුම් ඇති වෙලා,ඔවුන්ගේ යුග ජීවිතේ ප්‍රශ්න ඇතිවෙනවා. අවසානයේ චිත්‍ර ශිල්පියා පැවිදි වෙනවා. මේ කතාවේ අවසානය තමයි කඳුළ සහ සිනහව. එහිදී භික්ෂූන් වහන්සේට තම ගිහි ජීවිතයේ බිරිය සමග ප්‍රශ්න ඇති වෙනවා. අවසානයේ භික්ෂූන් වහන්සේ ගිහි කල බිරියට ජීවිතයේ අනිත්‍ය දුක පිළිබඳ චිත්‍රයක් ඇඳලා දෙනවා. ඇය එයින් ජීවිතය අවබෝධ කරගන්නවා. ඒ චිත්‍රය තමයි පොතේ පිටකවරේ තියෙන්නේ. මට අවශ්‍ය වුණේ, බොහෝම සුළු සිද්ධි නිසා මිනිස්සු ජීවිතේ පටලවා ගන්න හැටි, අවුල් කරගන්න හැටි කියන්නයි. මේ පොත් තුන ම එකට නොබැලුවත්, පොත් තුන වෙන් වෙන් වශයෙන් පාඨකයාට කියවා රසවිඳින්න පුළුවන්.





අවසානයේ මේ සියල්ල බුදු දහම නිසා නිරවුල් වෙනවා. මිනිසුන් ජීවිත පටලවා ගන්නේ දුර දිග නොබැලීම, ඉවසිල්ලක් නැතිකම නිසයි. මට පාඨකයන්ට කියන්න ඕන වුණේ ඒ දේ. හැම කතාවකම ගැහැනිය ප්‍රමුඛ වුණාට, මගේ මේ පොත් තුනේ කතා නායකයා පිරිමියෙක්. ඒත්, ඒවගේ ගැහැනු චරිත බොහොමයක් තිබෙනවා'

නිර්මාණකරුවා ජීවිතය දෙස බලන්නේ බොහෝ දයාවෙනි. ඒ දයාව විසින් සමස්ත පාඨක සහෘදය ප්‍රජාව ම ඥානනය කරවනු ලබයි. අප ආනන්දය කියන්නේ එයට ය. එකී ආනන්දය ගොඩනොනැගෙන තැන පාඨක සිත් නවතින්නේ නැත.

ලේඛකයන්, නිර්මාණකරුවන් සිය අත්දැකීම් නිසි පරිදි නිසි තැනට යෙදිය යුතු ම ය. නැත්නම් ඒ අත්දැකීම් පොදු අත්දැකීම් බවට පත්වී පොදු පාඨකයාට සෙවණ සලසා දෙන්නේ නැත. අනුල ද සිල්වා අප ජ්‍යෙෂ්ඨ ලේඛිකාව සිය කෘති ඔස්සේ ඒ පොදු සෙවණ අපට සාදා දෙයි.

'පාරාවළල්ල' නවකතාව ලියද්දිත් මට අමතක නොවෙන අත්දැකීමක් ලැබුණා. දශක තුනක යුද්ධය අවසන් වී වැඩි දිනක් ගත වීමට මත්තෙන් අපි කිහිප දෙනෙක් යාපනයේ සංචාරයකට ගියා. යුද උණුසුම ඒ වනවිටත් යම් මට්ටමකට යාපනය සලිත කර තිබුණා. පාර පුරා වාහන, කැඩුණු බිඳුණු ගොඩනැගිලි අතර අපට කෑමට යමක් සොයා ගැනීමටවත් තැනක් තිබුණේ නෑ. අප දන්නා හඳුනන අපේ ප්‍රාදේශීය මාධ්‍යවේදයකු වන මංගලනාත් මේ වෙලාවෙ මට පිහිට වුණා. ඔහු අපට ඉන්න තැනක් හොයල දීලා කෑම සපයා ගන්න පුළුවන් ගැහැනු කෙනෙක් එක්කාගෙන ආවා. ඒ කාන්තාව තමන්ගේ ඉඩම් සොයා ගෙන ආව කෙනෙක්. යුද්ධයෙන් ඇගේ ඥාති හිතෛෂීන් බොහොමයක් දෙනා මිය ගිහින්. ඇගේ කඳුළු කතාවයි මම පාරාවළල්ල ලෙස ලියූයේ. දැන් ඇය විදේශගත වෙලා ඉන්නේ'

පාඨක හෝ රසික මනසෙහි සදාකාලිකව රැඳී සිටින චරිත නිර්මාණය කරන කෙටිකතාකරුවෝ හා නවකතාකරුවෝ එකී චරිතවල අත්දැකීම පොදු පාඨක අත්දැකීමට සමාන කරති.

යුද්ධය අපි කවුරුත් අඩුවැඩි වශයෙන් සසල කළ දෙයකි. ඒ පොදු දැනීම නිර්මාණකරුවා විසින් පාඨක මනසේ කැලඹිල්ලක් ඇති කරයි. නිර්මාණකරුවාගේ විශේෂත්වය එයයි.

අනුල ද සිල්වා ලේඛිකාව පුවත්පත් කලාවේ ආභාසය නිසාදෝ අත්දැකීම් නිරීක්ෂණය කරමින් ඒ පිටුපස හඹා යන්නට, සියුම් දෑ අතර ඉසියුම් දෑ ග්‍රහණයට මනාසේ සමත් ය.

නිර්මාණයක ජීව ගුණය රඳා පවතින්නේ භාෂාව මත ය. ලේඛකයා හෝ නිර්මාණකරුවා භාෂාව ගැන දරන අදහස සහ භාෂාව භාවිතයේ වන නෛපුණ්‍ය බව ඊට එක්කරන ආලෝකයේ ප්‍රභාව සුළුපටු නොවේ. කෙතරම් හොඳ වස්තු බීජයක් වුව ද; කෙතරම් අපූරු පරිකල්පනයක් වුව ද; කෙතරම් අර්ථපූර්ණ රූප රචනයක් වුව ද භාෂාව නමැති දවටනයේ සුමිහිරි ව දවටා නැත්නම් ඒ නිර්මාණය ප්‍රතික්ෂේප වන්නේ ය.

සැමරුම් කිත් රැස

මහාචාර්ය **ජයන්ත අමරසිංහ**

දම්රම් නාහිමි ගුණ මනරම් රත්මලානේ ශ්‍රී ධර්මාරාම යතීන්ද්‍රයෝ

රත්මලානේ ශ්‍රී ධර්මාරාම නාහිමියන්ගෙන් ඉටු වූ ශාස්ත්‍රීය සේවය පිළිබඳ සඳහන් කරන සියලු දෙනා පොදුවේ එකඟ වන කරුණක් වන්නේ උන්වහන්සේ වෙතින් තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් කෙරෙහි පැවති පාණ්ඩිත්‍යය මූර්තිමත් වූ බවයි. ඒ අභීෂ්ටාර්ථ සාධනයෙහි ලා අප්‍රතිහත ධෛර්යය සහ කැපවීම මෙන්ම ශ්‍රෙෂ්ඨ ගුරුවරයකු වූ රත්මලානේ ධර්මාලෝක නාහිමියන්ගේ මඟ පෙන්වීම ඉඳුරාම ප්‍රතිෂ්ඨා විය. ධර්මාරාම හිමියෝ මෑත භාගයේ ලංකාවේ විසූ ශ්‍රෙෂ්ඨ පඬිවරුන් වන ඩබ්ලිව්. ඇෆ්. ගුණවර්ධන, කුමාරතුංග මුනිදාස, මාර්ටින් වික්‍රමසිංහ ආදීන්ගේ මෙන්ම තවත් බොහෝ දෙස් විදෙස් උගතුන්ගේද නොමඳ සම්භාවනාවට පාත්‍ර වූහ. ධර්මාරාම හිමියන් වෙතින් ප්‍රතීයමාන වූ ධර්ම ශාස්ත්‍ර ඥානය උන්වහන්සේගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරපුර වෙතින් ගලා විත් වර්තමානය වන විට සිඳී යමින් පවතින බැවින් මෙය එබඳු උතුමකු පිළිබඳ ආවර්ජනයට යෝග්‍යතම අවස්ථාවකැයි සිතමි.

ධර්මාරාම හිමියන්ගේ උපත සිදු වූයේ 1853 වර්ෂයේ සැප්තැම්බර් මස 23 වෙනි බදාදා කලපළුවාවේදීය. පියා ඇලෙක්සැන්ඩර් වීරසිංහ අප්පුහාමි නම් විය. මව දෝන ඉසබෙලා ද අල්විස් සිරිවර්ධන නම් වූවාය. බටුවන්තුඩාවේ පඬිතුමාගේ ඉල්ලීම පරිදි ළදරුවාගේ ජන්ම පත්‍රය සකස් කළ දොන් පිලිප් ද සිල්වා ඇපා අප්පුහාමි සහ අනාගතයේ මේ දරුවා ශ්‍රෙෂ්ඨ පැවිදි උතුමකු වන බවට අනාවැකි පළ කළ බව පැවසේ. දරුවා අකුරු කියවීමට සුදුසු වයසට පැමිණි පසු මුලින්ම කිත්සිරිමෙවන් කැලණි විහාරවාසී කොටගම ස්වාමීන්ද්‍රයන් වහන්සේ වෙත යොමු කෙරිණ. නිවසේ සිට දිනපතා සැහෙන තරම් දුරක් ගමන් කිරීමට සිදු වීම වෙහෙසකර ක්‍රියාවක් බව හැඟුණු බැවින් අලුත්කුරුවේ අස්ගිරි වල්පොළ විසූ සමීප ඥාතියකු වූ දොන් දිනෙස් අමරතුංග අප්පුහාමිගේ නිවසෙහි දරුවා නවත්වා ඒ නිවස ආසන්නයේ වස් වසා වැඩ සිටි කහතුඩුවේ චන්ද්‍රජෝති ස්ථවිරයන් වහන්සේ වෙත ශාස්ත්‍රෝද්ග්‍රහණය සඳහා යොමු කෙරිණ. චන්ද්‍රජෝති ස්ථවිරතුමා වීරසිංහ පවුලට ඥාති සම්බන්ධයක් බහුශ්‍රැත සිල්වත් හිමි නමකි. චන්ද්‍රජෝති ස්ථවිරයෝ දරුවාගේ පුණ්‍යමහිමය දැන මවු පියන්ට නොදන්වාම සත් හැවිරිදි වියේදී දරුවා සසුන්ගත කළහ. සසුන්ගතව කෙටි කලකින් සාමණේර හිමි නම චතුර ලෙස ධර්ම දේශනා පැවැත්වීමට තරම් සමත් වූ අතර දිනක් උන්වහන්සේගේ ධර්ම දේශනාවක් ශ්‍රවණය කළ නිකලස් ගුණතිලක සල්පිටි කෝරලයේ මුදලිතුමා සාමණේර හිමිනම උසස් අධ්‍යාපනයක් ලබා දීමට යෝග්‍ය ගුරුවරයකු වෙත යොමු කරන ලෙස කළ ඉල්ලීම ප්‍රකාරව 1864 වර්ෂයේදී රත්මලානේ ධර්මාලෝක මහ නාහිමියන් වෙත යොමු කෙරිණ. ධර්මාලෝක හිමියෝ නැවතත් සාමණේරයන් වහන්සේ පැවිදි කරවා, රත්මලානේ ධර්මාරාම" යයි නම් තැබූහ.

දස හැවිරිදි වියේදී ධර්මාලෝක හිමියන් වෙත පැවිදි වූ ධර්මාරාම සාමණේරයෝ සිංහල සහ පාලි භාෂා විෂයයෙහි මනා ප්‍රවීණත්වයක් ලදහ. ධර්මාරාම හිමියන් සංස්කෘත භාෂාව පිළිබඳ ප්‍රවීණත්වය ලැබ ගත්තේ කුමාරස්වාමි බ්‍රාහ්මණ පඬිතුමාගේ ආරාධනයෙන් 1869 වර්ෂයේ ඉන්දියාවේ තෙලිඟු ප්‍රදේශයෙන් මෙරටට පැමිණ සිටි මාතෘභූතේශ්වර ශර්මශාස්ත්‍රී පඬිවරයාගෙනි. ඊට අමතරව අන්නම් භට්ටියල නීලකණ්ඨ භට්ටිය සහ විශ්වනාථ කුමාරස්වාමි යන පඬිවරුන් වෙතින් නිරුක්ති ශාස්ත්‍රය සහ ව්‍යාකරණය හැදෑරීයග දීර්ඝ කාලයක් ශාස්ත්‍ර අධ්‍යයනයෙහි නිමග්න වූ ධර්මාරාම සාමණේරයෝ 1874 වර්ෂයේදී මල්වතු විහාරයේදී උපසම්පදාව ලැබූහ. උපසම්පදාව ලැබ මහ පෙරහැරකින් රත්මලානට වැඩමවූ ධර්මාරාම ස්ථවිරයන් වහන්සේට ධර්මාලෝක හිමියන් විසින් පුරාණ විහාර විද්‍යාස්ථානයේ ඉගැන්වීම් කටයුතු පැවරිණග වස් විසීම සඳහා ආරාධනා ලැබෙන විහාරස්ථානයකට වැඩම කිරීමේ චාරිත්‍ර ප්‍රකාරව සියනෑ කෝරලයේ දළුගමට ගුරු ශිෂ්‍ය දෙනම වැඩම කළ අවස්ථාවේ දොන් ඒබ්‍රහම් සමරතුංග රන්දුණු බස්නායක මුහන්දිරම් ප්‍රමුඛ දායක පිරිසකගේ මූලිකත්වයෙන් 1875 වර්ෂයේදී විද්‍යාලංකාර දායක සභාව ස්ථාපනය කෙරිණග දායක සභාවේ ඉල්ලීම පරිදි අභිනවයෙන් ඉදි කෙරුණු කුඩා පොල්අතු මඩුවක ගුරු ශිෂ්‍ය දෙනම විසින් ශාස්ත්‍ර ශාලාවක් ආරම්භ කරන ලදීග 1876 වර්ෂයේ පැලියගොඩ ප්‍රදේශයේ ඉඩමක ගොඩනැගිල්ලක් ඉදි කොට විද්‍යාලංකාර පිරිවෙන ආරම්භ කෙරුණු පසු ශිෂ්‍යයන්ගේ පරිශීලනය සඳහා යෝග්‍ය පාඨ්‍ය ග්‍රන්ථ සම්පාදනය කෙරෙහි අවධානය යොමු කළ හිමිවරු දෙනම ඒ සඳහා උත්සුක වූහ. එහි ප්‍රථම පියවර ලෙස සංස්කෘත ශබ්දමාලාව සම්පාදනය කෙරුණු අතර දෙවනුව ධර්මප්‍රදීපිකාව සංස්කරණය පළ කෙරිණ.

1887 වර්ෂයේ අගෝස්තු මස 17 වෙනි දින රත්මලානේ ශ්‍රී ධර්මාලෝක මහා ස්ථවිරයන් වහන්සේ අපවත් වීමෙන් හිස් වූ විද්‍යාලංකාර පරිවේණාධිපති ධූරයට විද්‍යාලංකාර දායක සභාව විසින් රත්මලානේ ශ්‍රී ධර්මාරාම ස්ථවිරයන් වහන්සේ පත්කර ගන්නා ලදහ. පුරාණ ග්‍රන්ථ සංස්කරණය සම්බන්ධයෙන් ගුරු හිමියන් වෙතින් ලද පරිචය තව දුරටත් වර්ධනය කර ගත් ධර්මාරාම හිමියෝ ඒ වන විට පෙළ නෂ්ටප්‍රායව පැවති ශ්‍රෙෂ්ඨ ලාංකික කවියකු වූ මහා කවි කුමාරදාසයන් විසින් රචිත ජානකීහරණය මහා කාව්‍යය එහි පුරාණ සිංහල සන්නය ආශ්‍රය කොට සකස් කෙරුණු ප්‍රතිසංස්කෘත පෙළක් 1890 වර්ෂයේදී පළ කළහ. ධර්මාරාම හිමියන්ගේ ජානකීහරණය සංස්කරණය පළ වන තෙක් ඒ කෘතියෙහි අංග සම්පූර්ණ සංස්කරණයක් නොවූ අතර පෙරදිග රටවල් කිහිපයකින් පසුව ලැබුණු පිටපත් ආශ්‍රයෙන් පූර්ණ සංස්කරණ පළ වූයේ කලකට පසුවය. ජානකීහරණ සංස්කරණ බැරෑරුම් කර්තව්‍යයෙහි ලා උන්වහන්සේට පිටු බල වූයේ භාරතීය පඬිවරුන් ඇසුරෙන් ලද කාව්‍ය ශාස්ත්‍ර හා සංස්කෘත භාෂා ඥානයයි.

ධර්මාරාම හිමියන්ගෙන් සිදු වූ ශාස්ත්‍රීය මෙහෙය සාකච්ඡා කිරීමට මෙවන් තීරුවක් නොව පිටු සිය ගණනක කෘතියක් සම්පාදනය කළ යුතු වේග එහෙත් සිංහල භාෂාව විෂයයෙහි ලා උන්වහන්සේගෙන් ඉටු වූ ඒක් සුවිශේෂ මෙහෙයක් වන සිංහලයෙහි යටපත්ව පැවති නල ණල ලල ළ සම්භාව්‍ය ව්‍යවහාරය නැවත පාදා මතුකොට දීම පිළිබඳ විශේෂයෙන් සඳහන් කළ යුතුයග 1892 දී ධර්මාරාම හිමියෝ සත්‍යසමුච්චය සඟරාව මඟින් නල ණල ලල ළ ව්‍යවහාරය පිළිබඳ ස්වකීය නිගමනය ඇතුළත් කොට අක්ෂර වින්‍යාසය පිළිබඳ නිවැරදි සම්භාව්‍ය පිළිවෙළ පැහැදිලි කළහ. සිංහල භාෂාව ව්‍යවහාර කරන පඬිවරුන් වැඩි දෙනකු ධර්මාරාම හිමියන් පාදා දුන් ක්‍රමය අනුගමනය කිරීමෙන් උන්වහන්සේගේ පරිශ්‍රමයෙහි වටිනාකම පැහැදිලි වෙයි.

සිදත් සඟරාවට ධර්මාරාම හිමියන් විසින් සම්පාදනය කරන ලද ව්‍යාඛ්‍යාවද උගතුන්ගේ සම්භාවනාවට පාත්‍ර වියග එතෙක් සිදත් සඟරාවේ වැරදි ලෙස අර්ථ දක්වා තිබුණු බොහෝ තැන් නිරාකූල කිරීමට ඒ පරිශ්‍රමය හේතු විය. ධර්මාරාම හිමියන්ගේ ශුද්ධියෙන් 1896 වර්ෂයේ පළ වූ මොග්ගල්ලාන පංචිකාප්‍රදීපය පැරණි ශාස්ත්‍රීය වාචනා මාර්ගයේ ජීවමාන විදහා දැක්වීමක් ලෙස පිළිගැනේ. හංස සන්දේශය, සැළලිහිණි සන්දේශය, කාව්‍යශේඛරය යන සම්භාව්‍ය සිංහල කාව්‍ය ග්‍රන්ථද ධර්මාරාම හිමියන්ගේ ව්‍යාඛ්‍යා හේතු කොට ගෙන දෝෂ විනිර්මුක්තව වර්තමාන පාඨක ලෝකයට පිවිසීම නිසා සාහිත්‍ය සම්ප්‍රදාය ජීවමාන කෙරිණි. සිතින් සිතා ගන්ටත් බැරි' තරමේ ධර්ම ශාස්ත්‍රීය මෙහෙයක් ඉටු කිරීමට කුඩා කාලයේ පටන් අප්‍රමාණ ලෙස වෙහෙසුණු ධර්මාරාම යතීන්ද්‍රයෝ සැටපස් වන වියේදී ආයු සංස්කාරය හළහ.

සන්නිවේදන සංවාද

● මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර

විරෝධය නොපාන්නේ ඇයි?

මහා බ්‍රිතාන්‍යයේ නාගරික නිවාසයක පහළ මහලේ කලක් කල්ගත කළ මහා දාර්ශනික බර්ට්‍රන්ට් සෙල් (Bertrand Rassell) මහතා බැහැදැකීමට පැමිණියේ තරුණයෙකි.

“ඔබතුමාට මගේ පැමිණීම බාධාවක් වුනාද දන්නේ නැහැ“ තරුණයා කීය.

“නැහැ මට කිසිම බාධාවක් වුනේ නැහැ“

“මම ඊශ්‍රායලේ ඉඳල ඇමරිකාවට ඇවිල්ල එහි ඉගෙනුම ලබාගෙන කාලයක් උගන්වල, එන්ගලන්තයට ඇවිල්ල අවුරුදු එකහමාරක් විතර වෙනවා. මට මේ රටවල් දෙකම දැන් හුගක් හුරුපුරුදුයි. ඒත් මට මේ රටවල් දෙකේම ප්‍රශ්න තියනවා“

“ප්‍රශ්න? ඒ කිව්වේ?“

“දේශපාලන ප්‍රශ්න, සමාජ ප්‍රශ්න, සංස්කෘතික ප්‍රශ්න, දාර්ශනික හා වෙනත් ප්‍රශ්න තිබෙනවා“

රසල්තුමා සියල්ලටම මැනැවින් කන්දී සිටියේය.

“ඉතින් මොකක්ද මේ මොහොතේ ඔබට තිබෙන ප්‍රශ්නය?“ අනතුරුව ඇසුවේය.

“ඒක පවසන්න තමයි, මම මේ වැයම් කරන්නේ“

තරුණයා ඊළඟට කී දේටත් රසල්තුමා මැනැවින් ඇහුම්කන් දුන්නේය.

“අපට සිද්ධවෙලා නැද්ද යමක් කමක් දන්න උදවිය වශයෙන් න්‍යෂ්ටික අවි නිපදවීම් (Nuclear weapons) වලට විරෝධය පාන්නට? අපට සිද්ධවෙලා නැද්ද යුද බිහිසුණු කමින් ලොව ගලවා ගන්නට? අපට සිද්ධවෙලා නැද්ද වහල්කමින් මිදෙන්නට? අපට සිද්ධවෙලා නැද්ද මත්ද්‍රව්‍ය උවදුරින් ලෝකය ගලවා ගැන්මට? අපට සිද්ධවෙලා නැද්ද වියට්නාමයේ අහිංසකයන් මරන්නට ඇමරිකන් සෙබළුන් යවන එකට විරුද්ධවීමට? ඇමරිකාව ඒ සඳහා එන්ගලන්ත සහාය ලබා ගැන්මට වැයම් කිරීමට අප විරුද්ධ විය යුතු නැද්ද?“

තරමක නිශ්ශබ්දතාවක් ඉන් අනතුරුව දෙදෙනා අතර හට ගැන්වන නිශ්ශබ්දතාව බිඳිමින් කතා කළේ රසල්තුමන්ය.

“කවුද කිව්වේ ඔය හැමදේමට ඔබ කියන විරුද්ධත්වය හෙවත් විරෝධය (Protests) පාන්නට එපාය කියල“

“ඇයි ඔය පත්තරවලින්, ගුවන් විදුලියෙන්, රූපවාහිනියෙන් කතාබහ කරන උදවිය මොනවද කියන්නේ? විරෝධය එපා කියල“

“හැම කෙනෙක්ම එහෙම කියන්නේ නැතේද?“

“මට ඇහුණු කියවන්නට ලැබුණු හැම තැනකින්ම කියැවෙන්නේ නිකම් මට නොතේරෙන, මට නොවැටහෙන බොරු සාමයක් (Peace) සන්සුන් බවක් අවශ්‍ය බවයි.“

යළිත් වතාවක් රසල්තුමා තරමක නිහඬතාවකින් පසුව කතා කරන්නට පටන් ගන්නා අයුරු තරුණයාට පෙණිනි.

“ඇයි මම පැවසූ දේවල් ඔබට ඇහිලා නැද්ද?

මම ඔය හැම කෙනෙකුටම පිළිතුරු දුන්නු බව මතක නැද්ද?

ඔය කියන හැම කෙනකුටම මගේ හඬ යටපත් කිරීමට වුවමනා බව ඔබට පෙනුණේ නැද්ද?“

“රසල් පඬිතුමනි, ඔබ විතරයි මට පෙනුණේ මා පවසන දේට එකඟත්වය දක්වන්නේ කියලයි මට හිතුනේ? එහි ප්‍රතිඵලයක් වශයෙන් තමයි, මට මෙහෙම ඔබතුමන් හමුවීමට අභිරුචියක් ඇතිවුණේ. ඒ නිසා කරුණාකර පවසන්න මට යළිත් අප ජනතාවට කුමක් කිව යුතුද?“

“ජනමතය (Pablic opinion) සැකසීමට ප්‍රධාන වන එකම වැකිය මම ඔබට පවසන්නම්“

“මම ලියා ගන්නම්“

“වැයම කෙතරම් නිසරු වුවත්, ඔබ හිතනවා නම් යමකට විරෝධය පෑ යුතුය කියා, එය වහා ඉටු කරන්න“ තරුණයා සටහන් කරගත්තේය.

"However butile the issue may be, if you feel like protesting, do so immediately, for it will lead to a good public opinion"

රාජ්‍ය සාහිත්‍ය උත්සවයට බාලගිරි දෝෂය ද?

සංස්කෘතික කටයුතු සම්බන්ධයෙන් වෙනම අමාත්‍යාංශයක් පිහිටුවීම සිදු වන්නේ 1956 දේශපාලන ජයග්‍රහණයෙන් පසුව ය. ඉන් අනතුරුව සංස්කෘතික කටයුතු සඳහා වෙන ම අමාත්‍යාංශයක් ප්‍රථම වරට පිහිටුවීම සිදු වන්නේ 1970 දී ය. ඒ සමගි පෙරමුණු රාජ්‍ය සමය යි. ඊට පෙර සංස්කෘතික කටයුතු යන විෂය පැවතුණේ වෙනත් විෂයයන් බාර අමාත්‍යවරු යටතේ ය. පසුව 1980. 04. 01 සිට එය යළිත් ස්ථාපනය වූ අතර 1994 දී සංස්කෘතික හා ආගමික කටයුතු යනුවෙන් නම් කරන්නට යෙදුණි.

මොහාන් ශ්‍රියන්ත ආරියවංශ
mohansriyantha@gmail.com

1948 ලංකාව නිදහස ලබන පසුබිමේ එහි දේශපාලන ක්‍රියාකාරකයන් වුණේ ජාතික වීරයන් ලෙසින් අප හඳුනා ගන්නා පාර්ශ්වය යි. නමුත් ඒත් සමඟම ජාතික සංස්කෘතික ප්‍රබෝධය ද එහි ප්‍රධාන බලවේගයක් බවට පත් වී තිබුණි. ඉන්දියාවේ මෙන් ම අපේ රටේ ද යටත්විජිතවාදී අධිරාජ්‍ය ග්‍රහණයෙන් නිදහස ලබා ගැනීමට ඉදිරිපත් වූ ඒ සමාජ දේශපාලන ව්‍යාපාරය හුදු දේශපාලන ක්‍රියාවලියක් පමණක් ම නොවූ බව ඉන් පැහැදිලි වේ. ඉහතදීත් කී අන්දමට ඊට සංස්කෘතික බලවේග වලින් ද ප්‍රබල සහායක් ලැබුණි.

ධර්මපාලතුමන්ගේ ජාති හිතෛෂී සංස්කෘතික ව්‍යාපාරය පසුබිමේ ජාතික වීරයන්ගේ දේශපාලනය, පියදාස සිරිසේන වැනි සාහිත්‍යධරයන්ගෙන් ජනතා සාහිත්‍ය ක්‍රියාකාරීත්වයේ දේශප්‍රේමී සහාය ලංකාවේ ජාතික නිදහස් සටන් ව්‍යාපාරයට ලබා ගැනීමට හැකි වන්නේ ඒ නිසා ය. ඒ නිසා ම නිදහසින් පසුව පිහිටුවා ගත් නිදහස් පාර්ලිමේන්තුව තුළ සර් ඩී. බී. ජයතිලක වැන්නවුන් ඒ සංස්කෘතික බලවේගය වෙනුවෙන් පෙනී සිටීම පැහැදිලිව ම දැකිය හැකි තත්ත්වයක් විය.

විශේෂයෙන් ම සිංහල භාෂා අධ්‍යයනය මුල් කොටගෙන ජයතිලකයන් අතින් වැඩි දියුණු වූ සම්භාව්‍ය සාහිත්‍ය ව්‍යාපාරයට අදාළ කටයුතු, ජර්මානු ජාතික ආර්ය භාෂා පිළිබඳව ප්‍රාමාණික දැනුමක් සහිත මහාචාර්ය විල්හෙල්ම් ගයිගර් වැන්නවුන්ගෙන් ඒ වෙනුවෙන් ලද සහාය මෙන් ම මෙරට ජාතික සංස්කෘතික කටයුතු ප්‍රවර්ධනය මුල් කොටගෙන 1952 වර්ෂයේ පාර්ලිමේන්තු පනතකින් ලංකා කලා මණ්ඩලය පිහිටුවන්නට කටයුතු කිරීම එහි ප්‍රතිඵල හැටියට පෙන්වා දිය හැකි ය.

කෙසේ වෙතත් සංස්කෘතික කටයුතු සම්බන්ධයෙන් වෙනම අමාත්‍යාංශයක් පිහිටුවීම සිදු වන්නේ 1956 දේශපාලන ජයග්‍රහණයෙන් පසුව ය.



උත්සවය සම්බන්ධයෙන් මගේ මතය වන්නේ සංස්කෘතික අධ්‍යක්ෂකගේ මතය යි.

පූජ්‍ය රඹුකන සිද්ධාර්ථ හිමි
සාහිත්‍ය අනු කමිටුවේ සභාපති

ඉනුත් සංස්කෘතික කටයුතු සඳහා වෙන ම අමාත්‍යාංශයක් ප්‍රථම වරට පිහිටුවීම සිදු වන්නේ 1970 දී ය. ඒ සමගි පෙරමුණු රාජ්‍ය සමය යි. ඊට පෙර සංස්කෘතික කටයුතු යන විෂය පැවතුණේ වෙනත් විෂයයන් බාර අමාත්‍යවරු යටතේ ය. පසුව 1980. 04. 01 සිට එය යළිත් ස්ථාපනය වූ අතර 1994 දී සංස්කෘතික හා ආගමික කටයුතු යනුවෙන් නම් කරන්නට යෙදුණි.

ඉහතදීත් සඳහන් වූ ආකාරයට සංස්කෘතික කටයුතු බාර අමාත්‍යාංශය මුලින් ම පිහිටුවන්නට යෙදුණේ එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායකයන්ගේ දේශපාලන ජයග්‍රහණයෙන් පසුව 1956. 04. 12 දින යි. එහි ලා ප්‍රධාන ම අරමුණ වශයෙන් දැක්වුණේ, රටට අවශ්‍ය ජාතික සංස්කෘතික ප්‍රතිපත්තියක් සකස් කොට ඉදිරිපත් කොට පවත්වාගෙන යෑම යි. එසේ පිහිටුවන්නට යෙදුණ අමාත්‍යාංශයේ සංස්කෘතික කටයුතු බාර පළමු අමාත්‍යවරයා වූයේ 1956. 04. 12 දින සිට 1959. 06. 08 දින තෙක් කටයුතු කළ ජයවීර කුරුප්පු ය.

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් ප්‍රථම රාජ්‍ය සාහිත්‍ය උත්සවය 1957 සැප්තැම්බර් මස 7 සහ 8 යන දෙදින ශ්‍රී ජයවර්ධන පුර කෝට්ටේ පැරකුම්බා පිරිවෙනේ සහ පැපිලියානේ සුනේත්‍රාදේවි පිරිවෙනේ දී අගමැති එස්. ඩබ්. ආර්. ඩී බණ්ඩාරනායකයන්ගේ සහභාගීත්වයෙන් පවත්වන්නට යෙදුණි. ප්‍රධාන දේශනය පැවැත්වූයේ මහාචාර්ය සෙනරත් පරණවිතානයන් ය.

එතැන් සිට අද දක්වා මෙම උත්සවය යම් යම් විවේචන මැද වුණත් අඛණ්ඩව පවත්වාගෙන ආවේ යැයි කීමට තිබූ අවස්ථාව ගැන නැවත සිතන්නට සිදුවී ඇත්තේ 2020 වසරේදි එය නොපැවැත් වූ නිසාය. ඒ අනුව 2019 වර්ෂයේ පළ වූ සාහිත්‍ය කෘති වෙනුවෙන් සම්මාන ප්‍රදානය කිරීමට නියමිත 2020 රාජ්‍ය සාහිත්‍ය උත්සවය පැවැත්වීම සිදු නොවිණි. මේ සම්බන්ධනේ උණුසුම් කතා බහක් ද රට තුළ ඇති විය.

රාජ්‍ය සාහිත්‍ය උපදේශක මණ්ඩලයේ සභාපතිවරයා ලෙස වසර 10 ක කාලයක් කටයුතු කළ මහාචාර්ය සමන්ත හේරත්ට අනුව පාස්කු ප්‍රහාරය වැනි අසීරු අවස්ථාවක දී වුණත් මෙම උත්සවය පැවැත්වීමට ඔවුන් කටයුතු කොට තිබේ.

ඇතැම් වසරවලදීත් ප්‍රමාද වී හෝ උත්සවය පවත්වන්නට කටයුතු කොට තිබේ. එසේ හෙයින් 2020 දීද ප්‍රමාද වී හෝ අදාළ උත්සවය පවත්වන්නට යෙදුණේ නම් මැනවයි යන අදහස ඔහුගෙන් ප්‍රකාශ වී තිබුණි. ඒ ගැන සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂවරිය වන තරණි අනෝජා ගමගේ ලබා දුන් ප්‍රකාශයට අනුව පසුගිය අතීත අත්දැකීම්වල දී මෙන් නොව මෙහි දී සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව මුහුණ පෑ බරපතළම ප්‍රශ්නය වූයේ සෞඛ්‍ය නීති අණ පනත් හමුවේ වෙනදා පරිදි ක්‍රියාකාරී වීමට නොහැකි වීමයි.

එපමණක් නොව ප්‍රදේශ ලොක් ඩවුන් කිරීම, ප්‍රදේශයකට දෙකකට පමණක් නොව එම ව්‍යසනය මුළු ලංකාවට ම එක සේ බලපෑම යන තත්ත්වයන්ට ද මුහුණ පාන්නට සිදු වී තිබිණි. නමුත් එවැනි දුෂ්කරතාවන් හමුවේ වුණත්, සෙසු සම්මාන ප්‍රදානෝත්සව වන ගොඩගේ සම්මාන උත්සවය, ස්වර්ණ පුස්තක සම්මාන උත්සවය, විදෙ‍්‍යාදය සම්මාන ප්‍රදානය වැනි උත්සව පැවැත්වුණේය යන්න රාජ්‍ය සාහිත්‍ය උත්සවය නොපැවැත්වීමට එරෙහි තදින් ම නැගුණ චෝදනාවක් වූයේ ය.

ඒ සම්බන්ධයෙන් අපේ ප්‍රශ්න කිරීමට සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂවරිය ලබා දුන් පිළිතුර මෙසේ ය.

"අනිත් සාහිත්‍ය සම්මාන උත්සව ගැන මම මෙහිදී කතා කරන්නේ නෑ. ඒත් පැහැදිලිවම කියන්න ඕනෙ කරුණු කිහිපයක් තිබෙනවා. අපි කෘතියකට විනිශ්චයක් ලබා දෙන්නේ වට 4ක සමීක්ෂණ කටයුතු අවසන් වූ පසුව යි. එක වටයකින් පමණක් කෘති තෝරලා සම්මාන ලබා දෙන්න අපි කටයුතු කරන්නේ නැහැ. ජාතික වගකීමක් ඒ සම්බන්ධයෙන් අපට තියෙනවා. මේක ලොකු කටයුත්තක්. සමහරු ප්‍රශ්න කරලා තිබුණා දියුණු තාක්ෂණයක් ඇති නිසා ඔන්ලයින් ක්‍රමයට හරි මේක පවත්වන්න තිබුණා නේද කියලා. නමුත් මම අර කිව්වා වගේ වට 4 කින් සමීක්ෂණ කටයුතු සිදු කෙරෙන පුළුල් කාර්යයක් එකවර එහෙම කිරීම අතිශයින් අපහසුයි. එවැනි පුළුල් මට්ටමකින් රාජ්‍ය සාහිත්‍ය සමීක්ෂණ කටයුතු සිදු කෙරෙන්නේ අදාළ කෘතිවලට උපරිම සාධාරණය කළ යුතු නිසයි. ඒ වගේම අනෙක් සම්මාන උලෙළවලට සාපේක්ෂව රාජ්‍ය සාහිත්‍ය සම්මාන ප්‍රධානයේදී වැඩි ඉසවු සංඛ්‍යාවක් ක්‍රියාත්මක වෙනවා.

ඒ ඒ කෘති වලට අදාළව අපේ මේ සමීක්ෂණ කටයුතු නගර කේන්ද්‍රීයවම ගොඩනැගෙන්නේ නෑ; ප්‍රාදේශීය මට්ටමින්ද සමීක්ෂකයන් ඊට සහභාගී වෙනවා. මහනුවර තමයි ඊට අදාළ වැඩිම ග්‍රන්ථ සමීක්ෂක පිරිසක් ඉන්නෙ. ඒ වන විට මහනුවර ලොක් ඩවුන් කරපු තත්ත්වයක් තිබුණා. මෙවැනි ප්‍රායෝගික ගැටලු රැසක් ඇති වී තිබුණා."

2020 වසර මේ වන විට ඉකුත් වී තිබේ. 2021 වසරේ ද තෙවැනි මාසයත් ගෙවී යමින් පවතී. ඒ අනුව ඉකුත් වසරේ පළ වූ කෘති වෙනුවෙන් සම්මාන ප්‍රදානය කෙරෙන 2021 රාජ්‍ය සාහිත්‍ය සම්මාන උත්සවය පැවැත්වෙයි ද? එයත් බාලගිරි දෝෂය හමුවේ තව තවත් කල් යයි ද? මේ ගැන සංස්කෘතික කටයුතු රාජ්‍ය ඇමති විදුර වික්‍රමනායකගෙන් විමසූ විට ඒ සම්බන්ධයෙන් ඔහු පැවසුවේ මෙවැන්නකි.

"ඔය ගැන අහන්න ඕනේ ඒ අදාළ රාජ්‍ය නිලධාරීන්ගෙන්. මොකද ඒ අය තමයි මේ හැම දෙයක් ම කර ගහලා අදින්නෙ.ඒ නිසා ඒ අයගෙන් අහන්න."

ඒ අනුව නැවතත් සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂිකා තරණි අනෝජා ගමගේ වෙත යොමු වීමට අපට සිදු විය. "අපි සියලු කටයුතු සූදානම් කරමිනුයි ඉන්නෙ. අදාළ සමීක්ෂණ කටයුතුත් අවසන් වෙමින් පවතිනවා. ඒ අනුව සිංහල ප්‍රකාශන 2162ක්, ඉංග්‍රීසි බසින් ලියැවුණු කෘති 176 ක් සහ දෙමළ බසින් ලියවුණ කෘති 298 ක සමීක්ෂණ කටයුතු අවසන් වෙමින් පවතිනවා. සිංහල කෘති විනිශ්චය වෙනුවෙන් 169 දෙනෙක් ද, දෙමළ කෘති වෙනුවෙන් 72 ක් ද, ඉංග්‍රීසි කෘති සඳහා 73 ක් වශයෙන් සහභාගිත්වයක් ඇතිව අදාළ සමීක්ෂණ කටයුතු සිදු කරන්නට කටයුතු කර තිබෙනවා. "රාජ්‍ය සාහිත්‍ය උත්සවය පැවැත්වෙන ස්ථානය ගැන ද මෙහි දී අපි ඇයගෙන් ඇසුවෙමු.

" අරලියගහ මන්දිරයේ දී හෝ රාජ්‍ය සාහිත්‍ය උත්සවය පවත්වන්න අපි කටයුතු කරමින් සිටිනවා." එහෙත් මින් පෙර එය පැවැත්වුණේ බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී නොවේදැයි අප ඇසූ විට ඇය පැවසුවේ පවත්නා සෞඛ්‍ය නීති රීති මත එවැනි විශාල සහභාගීත්වයකට යෑමට නොහැකි වුණොත්, ඊට විකල්ප ස්ථානයක් හැටියට අරලිය ගහ මන්දිරයේ රැස්වීම් ශාලාව ලබා ගැනීමට තමන් කටයුතු කරමින් සිටින බව යි. සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂවරිය තවදුරටත් පෙන්වා දුන් අන්දමට සාහිත්‍යකරුවකුට සිය ජීවිතයේ එක් වතාවක් පමණක් හිමිවන සාහිත්‍යරත්න සම්මානය ද සිංහල, දෙමළ, ඉංග්‍රීසි ලේඛකයන් තිදෙනකුට පිරිමන්නට ද කටයුතු කොට තිබේ.

අනිත් සියලු කටයුතු ද එලෙසින් ම පැවැත්වීමට සියලු කටයුතු සම්පාදනය කර තිබේ.

උත්සවයට පෙර පැවැත්වෙන සාහිත්‍ය දේශනය ද මහාචාර්ය අර්ජුන පරාක්‍රමයන් විසින් අප්‍රේල් මස 7 දින ශ්‍රී ලංකා පදනම් ආයතනයේ දී පවත්වන්නට සියලු කටයුතු සම්පාදනය කර තිබේ.

මිනිස්සු රට ගැන කතා කරනවා. ඒත් තමන්ගේ රට ගැන අභිමානයෙන් කතා කරනව ද? ඒ නිසා සාහිත්‍යයෙන් වගා කරන්න ඕන කරන ගුණධර්ම තියෙනවා. එක දවසකට උත්සවයක් පවත්වලා ඒ දේවල් කරන්න බැහැ. ඒ දේවල් අපේ ජීවිතත් එක්කම හැමදාම පවතින්න ඕනෙ. ඒ වෙනුවෙන් තමයි මේ හැම උත්සාහයක්ම අපි ගන්නේ.

විදුර වික්‍රමනායක
සංස්කෘතික කටයුතු රාජ්‍ය ඇමති

සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍ය විදුර වික්‍රමනායකව නැවතත් ඇමතූ අප මෙරට සාහිත්‍යයික හා සංස්කෘතික කටයුතු සම්බන්ධයෙන් ඔහුගේ අදහස විමසා සිටියේ ඒ සම්බන්ධයෙන් සිය අදහස පැවසීමට ඔහුට වගකීමක් ද ඇති බව පෙන්වා දෙමිනි.

"මම මෙතන දී පුද්ගලයකු විදිහටයි කතා කරන්නෙ. අපි දැන් කාලෙක ඉඳලා අපේකම ගැන කතා කරනවා. ඔබතුමන්ලාත් අනන්තවාරයක් ඔය ගැන ලියල ඇති. නමුත් අද මොකද වෙලා තියෙන්නෙ. රට ජාතියට ආදරය කිරීම ගැන කතා කරනවා. නමුත් ඇත්තටම මිනිස්සු රට ගැන හිතනව ද? මිනිස්සු රට ගැන කතා කරනවා. ඒත් තමන්ගේ රට ගැන අභිමානයෙන් කතා කරනව ද? ඒ නිසා සාහිත්‍යයෙන් වගා කරන්න ඕන කරන ගුණධර්ම තියෙනවා. එක දවසකට උත්සවයක් පවත්වලා ඒ දේවල් කරන්න බැහැ. ඒ දේවල් අපේ ජීවිතත් එක්කම හැමදාම පවතින්න ඕනෙ. ඒ වෙනුවෙන් තමයි මේ හැම උත්සාහයක්ම අපි ගන්නේ. අනිත් එක කොවිඩ් 19 කිය කියා හැමදාම මුලුගැන්විලා ඉන්නත් බැහැනෙ. එළියට බැහැලා වැඩ කරන්න සිද්ද වෙලා තියෙනවා. ඒ අනුව මෙවර සාහිත්‍ය උත්සවය අපි පවත්වනවා. ඒ ගැන කටයුතු කරගෙන යනවා."

මෙරට සංස්කෘතික කටයුතු ප්‍රවර්ධනය වෙනුවෙන් මුලින් ම ඇති කරන්නට යෙදුණේ ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ වත්මන් සභාපතිවරයා වන්නේ සම්මානිත මහාචාර්ය ජයසේන කෝට්ටේගොඩය.

මෙහි දී අපට ඇති වූ ප්‍රශ්නය වූයේ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයටත් පෙර පිහිටුවන්නට යෙදුණ කලා මණ්ඩලය රාජ්‍ය සාහිත්‍ය උත්සවය හා පොදුවේ ජාතික සංස්කෘතික කටයුතු වෙනුවෙන් දක්වන දායකත්වය කුමක් ද යන්න යි. ඒ සම්බන්ධයෙන් මහාචාර්ය කෝට්ටේගොඩ දැක්වූයේ මෙවැනි අදහසකි.

"මම මෙතනට පත් වෙලා තවම මාස හයකට වඩා නෑ. කොහොම නමුත් සංස්කෘතික කටයුතු සම්බන්ධයෙන් විශේෂයෙන් ම ජාතික සංස්කෘතික කටයුතු ප්‍රවර්ධනය වෙනුවෙන් ලොකු වගකීමක් පැවරිලා තියෙනවා මේ ආයතනයට. මෙහි දී මගේ අවධානයට යොමු වූ කාරණයක් තමයි අපේ රටේ තියෙනවනේ අස්පර්ශනීය සංස්කෘතික කලාව කියල දෙයක්. උදාහරණයක් හැටියට අපේ සොකරි, කෝලම් වැනි ජන රංග ගැන අපිට අවධානයක් තියෙන්න ඕනෙ. මේවා සංරක්ෂණයට අපි කටයුතු කරන්න ඕනෙ. ඒ අනුව මෙම කාල වකවානුවේ දී ම කෑගල්ල, දැදිගම, තුන්පොත ගමේ එළිමහන් භූමියක සාම්ප්‍රදායික සොකරි රංගය ඉදිරිපත් කරන්නට අපි කටයුතු කරගෙන යනවා. එහෙම වැඩ කටයුතු මේ ආයතනයෙන් සිද්ද වෙන්න ඕනෙ.

තවමත් මේ ආයතනයේ තියෙන්නේ 1952 දී පිහිටුවීමෙන් පසු ඇති කරපු නීති රීති ම තමයි. මගේ පුද්ගලික විශ්වාසය නම් ඒවායෙ වෙනසක් සිද්ධ වීම හොඳය කියන එක යි."

මෙහිදී ජාතික සාහිත්‍ය විනිශ්චය සම්බන්ධයෙන් ඔහුගේ මතය විමසූ විට ඔහු පැවසුවේ ඒ ගැන විවේචන මුලසිට ම පැවතුණු බව යි.

නමුත් මෙහිදී සිහි තබා ගත යුතු කාරණය වන්නේ විනිශ්චය කටයුතු සිදුවීම බාහිර විනිශ්චය කරුවන්ගෙන් සිදු කරන්නක් ය යන්න යි. සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ කාර්යභාරය වන්නේ ඒ වෙනුවෙන් පහසුකම් සැලසීම යි.

කලා මණ්ඩලය යටතේ පවතින සාහිත්‍ය අනු කමිටුවේ සභාපතිවරයා හැටියට කටයුතු කරන්නේ පූජ්‍ය රඹුකන සිද්ධාර්ථ හිමියන් ය.

පැවැත්වීමට නියමිත රාජ්‍ය සාහිත්‍ය උත්සවය සම්බන්ධයෙන් උන් වහන්සේගේ මතය විමසූ විට, සිද්ධාර්ථ හිමියන් පැවසුවේ ඒ සම්බන්ධයෙන් සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂවරියගේ මතය තමන් වහන්සේගේ ද මතය වශයෙන් සැලකීම සුදුසු බව යි.

කෙසේ හෝ වේවා මෙවර රාජ්‍ය සාහිත්‍ය සම්මාන උත්සවය පැවැත්වීමට නියමිත බවත්, පවත්නා සෞඛ්‍ය නීති රීතිවලට අනුකූලව එය සිදු වන බවත් සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂවරිය පැහැදිලවම කියා සිටියා ය.

කුමන බාධක ආවත් එය අභිමානවත් අයුරින් පවත්වන්නට සියලු කටයුතු සූදානම් කරමින් සිටින්නේ යැයි ද ඇය වැඩිදුරටත් පෙන්වා දුන්නා ය. රාජ්‍ය සාහිත්‍ය උත්සවය පැවැත්වෙන දිනය පිළිබඳව ද ස්ථිර වශයෙන් ම මෙම සතිය ඇතුළත දැනුම් දීමට හැකියාවක් ඇතැයි යනුවෙන් ද පැවසූ ඇය ඒ සම්බන්ධයෙන් හැකි ඉක්මනින් ප්‍රකාශයක් කරන්නේ යැයි ද පැවසුවා ය.

වෙනදා මෙන් බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී උත්සවය පැවැත්වීමට නොහැකි තත්ත්වයක් ඇති වුණහොත් විකල්පීය ස්ථානයක් හැටියට අරලියගහ මන්දිරය ඒ වෙනුවෙන් තෝරා ගැනීමට ඉඩ ඇත.

රාජ්‍ය සාහිත්‍ය සමීක්ෂණ කටයුතු සිදු කෙරෙන්නේ අදාළ කෘතිවලට උපරිම සාධාරණය ඉටු කරන ආකාරයටයි. ඒ වගේම අනෙක් සම්මාන උලෙළවලට සාපේක්ෂව රාජ්‍ය සාහිත්‍ය සම්මාන ප්‍රධානයේදී වැඩි ඉසවු සංඛ්‍යාවක් ක්‍රියාත්මක වෙනවා. ඒ වගේම ඒ ඒ කෘති වලට අදාළව අපේ මේ සමීක්ෂණ කටයුතු නගර කේන්ද්‍රීයවම ගොඩනැගෙන්නේ නෑ; ප්‍රාදේශීය මට්ටමින්ද සමීක්ෂකයන් ඊට සහභාගී වෙනවා.

තරණි අනෝජා ගමගේ
සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් ප්‍රථම රාජ්‍ය සාහිත්‍ය උත්සවය 1957 සැප්තැම්බර් මස 7 සහ 8 යන දෙදින ශ්‍රී ජයවර්ධන පුර කෝට්ටේ පැරකුම්බා පිරිවෙනේ සහ පැපිලියානේ සුනේත්‍රාදේවි පිරිවෙනේ දී අගමැති එස්. ඩබ්. ආර්. ඩී බණ්ඩාරනායකයන්ගේ සහභාගීත්වයෙන් පවත්වන්නට යෙදුණි. ප්‍රධාන දේශනය පැවැත්වූයේ මහාචාර්ය සෙනරත් පරණවිතානයන් ය. එතැන් සිට අද දක්වා මෙම උත්සවය යම් යම් විවේචන මැද වුණත් අඛණ්ඩව පවත්වාගෙන ආවේ යැයි කීමට තිබූ අවස්ථාව ගැන නැවත සිතන්නට සිදුවී ඇත්තේ 2020 වසරේදි එය නොපැවැත් වූ නිසාය.

සංස්කෘතික කටයුතු සම්බන්ධයෙන් විශේෂයෙන් ම ජාතික සංස්කෘතික කටයුතු ප්‍රවර්ධනය වෙනුවෙන් ලොකු වගකීමක් පැවරිලා තියෙනවා මේ ආයතනයට. තවමත් මේ ආයතනයේ තියෙන්නේ 1952 දී පිහිටුවීමෙන් පසු ඇති කරපු නීති රීති ම තමයි. මගේ පුද්ගලික විශ්වාසය නම් ඒවායෙ වෙනසක් සිද්ධ වීම හොඳය කියන එක යි."

මහාචාර්ය ජයසේන කෝට්ටේගොඩ
ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ සභාපති

වෘෂ 2021ක් වූ මාර්තු මස 28 වැනි ඉරිදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරන ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.

සිළුමිණ The Silumina

JOBS
රැකියා අතිරේකය

ආයතනයේ ඵලදායීතාව වැඩිකරගැනීමට අවශ්‍යද?
එසේ නම් මෙහෙම කරන්න...

ඔබත් යම් ව්‍යාපාරයක හිමිකරුවෙක්ද? එම ව්‍යාපාරය තවදුරටත් ශක්තිමත් කර ගැනීමට, ලාභය වැඩි කර ගැනීමට, සේවකයන්ගෙන් උපරිම සේවාවක් ලබා ගැනීමට ඔබට අවශ්‍යද? එසේ නම් ඔබ ප්‍රථමයෙන්ම අලුතෙන් සිතීමට පටන් ගත යුතුයි. ඔබේ ව්‍යාපාරය වැඩි දියුණු කර ගැනීම එතරම් අපහසු කටයුත්තක් නොවේ. එහෙත් ඒ සඳහා ප්‍රථමයෙන්ම ඔබගේ චින්තන පරාසය වෙනස් කර ගත යුතුයි.

ආයතනයක් දියුණුව කරා ගෙන යෑමේ ඵලදායීතාව වැඩි කර ගැනීමේ ප්‍රථම පියවර වන්නේ සේවකයන් දිරිමත් කිරීම සහ ඔවුන් තිවැරැදිව අරමුණ කරා ගෙන යෑමය.

එහිදී අංශ කිහිපයක් කෙරෙහි ආයතන ප්‍රධානියා ලෙස ඔබගේ අවධානය යොමු විය යුතුය. එහිදී ප්‍රථමයෙන්ම ඔබගේ ආයතනය භාවිත කරන යන්ත්‍රෝපකරණ කෙරෙහි ඔබගේ අවධානය යොමු කරන්න. සේවකයන් තවමත් භාවිත කරන්නේ ඉතා අබලන් යන්ත්‍ර නම්, ඒවා භාවිතයේදී ඔවුන්ගේ ජීවිතය පවා අනතුරේ හෙලන්නේ නම් ඔබට යන්ත්‍ර අලුත්වැඩියාවට හෝ නව යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීමට සිදුවනු ඇති.

ඉන්පසුව ඔබ අවධානය යොමු කළ යුතු වන්නේ ඔබේ ආයතනයේ භාවිත වන අමුද්‍රව්‍ය සම්බන්ධව. ඔබ නිෂ්පාදන කර්මාන්තයක නිරත අයෙක් නම් අදාළ අමුද්‍රව්‍ය කෙරෙහි ඔබ අවධානය යොමු කළ යුතුමයි. නිශ්චිත ප්‍රමිතියෙන් යුතු අමුද්‍රව්‍ය ඔබේ නිෂ්පාදනයේ ගුණාත්මක බව වැඩි කිරීමට ප්‍රබල හේතුවක් වනු ඇති. නිෂ්පාදනයේ ගුණාත්මක බව වැඩිවීම යනු අනික් අතින් ඵලදායීතාව වැඩි වීමට විශාල පිටිවහලක් ලබා දීමට සමත් හේතුවක්.

ඉහත කී කරුණු වගේම බලශක්තිය සහ මුදල් යන කරුණුත් ඔබගේ ආයතනයේ ඵලදායීතාව වැඩි කර දීමට දායකත්වය සලසනවා. විශාල බලපෑමක් කරනවා. ඒත් මේ සියල්ල සම්බන්ධව සමව අවධානය යොමු කරන අතර ඔබ ඔබේ ආයතනයේ ඵලදායීතාව වැඩි කර ගැනීමට තම වැඩිම අවධානය ලබා දිය යුතු වන්නේ ඔබේ සේවක පිරිස වෙතයි. ඔබේ ආයතනයේ ඵලදායීතාව වැඩි කර ගත හැකි වන්නේ සේවකයන් දිරිමත් කිරීමෙන් පමණි. සෙසු අංශ වර්ධනය කර ගැනීමෙන්, අඩුපාඩු සකසා ගැනීමෙන් කර ගත හැකි වන්නේ අමතර වාසියක් ලබා ගැනීම පමණි. ඔබගේ ශක්තිය සේවකයන් බව ඔබ කිසිසේත් අමතක කළ යුතු නැහැ. සේවකයන් තමයි ඔබගේ ව්‍යාපාරයේ දියුණුවත්, පරිහානියත් තීරණය කරන්නේ. ඉතින් ඔවුන් තිසි පරිදි සේවයේ යොදවමින් වැඩි ඵලදායීතාවක්, වැඩි ලාභයක් ලබා ගැනීමට ඔබ කටයුතු කළ යුතුයි. ඒ සඳහා ඔබට කළ හැකි කටයුතු කිහිපයක්ම තිබෙනවා.

එහිදී ප්‍රථමයෙන්ම ඔබ සේවකයන් වටහා ගත යුතුයි. සේවකයන් යනු ඔබ වැනිම මිනිසුන්. ඔබටත් ඔවුන්ටත් පොදු කරුණු තිබෙනවා.

මූලික අවශ්‍යතා, රැකියාවේ සුරක්ෂිත භාවය, සමාජ අනුගත වීම, සමාජයේ පිළිගත් ස්ථානයක් ලබා ගැනීම, ඉහළ සමාජයට පිවිසීමේ අවශ්‍යතාව යනාදී මේ කරුණු සෑම මිනිසකුටම පොදුයි.

විශේෂයෙන්ම ඔබගේ සේවකයන් සතුව මේ කරුණු අඩු වැඩි වශයෙන් පවතිනවා. ඔබ කළ යුතු වන්නේ මේ කරුණු ඔබගේ සේවකයන්ට අදාළව ක්‍රියාත්මක වන අන්දම වන අන්දම වටහා ගැනීමට කටයුතු කිරීමයි.

විශේෂයෙන්ම සේවකයන්ගේ මූලික අවශ්‍යතා සම්බන්ධව අවධානය යොමු කිරීම වැදගත්. එම මූලික අවශ්‍යතා සම්පූර්ණ කර ගත හැකි අන්දමේ වැටුපක්වත් ඔවුන්ට නොලැබෙන්නේ නම් ඔවුන්ගෙන් උපරිම සේවාවක් නොලැබීම පුදුමයක් නෙමෙයි. එසේත් නැතහොත් ඔවුන්ට පහසු ණය ක්‍රම සම්පාදනය කර දීමට ඔබට හැකියාවක් තිබෙනවා නම් එය බොහෝ වැදගත් වේවි. හැබැයි මේ ණය ලබා දීමෙන් සේවකයන් අනවශ්‍ය ණයකරුවන් බවට පත්ව තවත් ගැටලු ජාලයක නොපැටලෙන බවට වගබලා ගැනීමත් වැදගත්.

“විශේෂයෙන්ම සේවකයන්ගේ මූලික අවශ්‍යතා සම්බන්ධව අවධානය යොමු කිරීම වැදගත්. එම මූලික අවශ්‍යතා සම්පූර්ණ කර ගත හැකි අන්දමේ වැටුපක්වත් ඔවුන්ට නොලැබෙන්නේ නම් ඔවුන්ගෙන් උපරිම සේවාවක් නොලැබීම පුදුමයක් නෙමෙයි. එසේත් නැතහොත් ඔවුන්ට පහසු ණය ක්‍රම සම්පාදනය කර දීමට ඔබට හැකියාවක් තිබෙනවා නම් එය බොහෝ වැදගත් වේවි...”

හදිසි අවස්ථාවකදී සේවකයන්ට පහසුවෙන් ණය ලබා ගත හැකි වීම සහ ඒ සඳහා ආයතනයෙන් සහය හිමිවීම ආයතනය සම්බන්ධව සේවකයන්ගේ හැඟීම උසස් තැනකට ගෙන එන බව නොඅනුමානයි.

එමෙන්ම ඔබගේ සේවකයන්ගේ රැකියාවේ සුරක්ෂිත භාවය සම්බන්ධව උපරිමයෙන් කටයුතු කිරීමත් වැදගත්. ඔබගේ ආයතනය සේවකයන්ගෙන් සේවය ලබාගෙන ඔවුන් රොඩු මෙන් ඉවත දමනවා නම් ඔබටත් ඔවුන්ගේ උපරිම දායකත්වය නොලැබීමට බොහෝ ඉඩ තිබෙනවා. තමන් කොතරම් හොඳින් සේවය කළත් කිතම් අවස්ථාවක සේවය අහිමි වේද යන බිය පවතින සේවකයකු කල කිරීමට පත්වීම සාමාන්‍ය දෙයක්. එබැවින් ඔබ සේවකයන්ගේ රැකියාවේ සුරක්ෂිත බව තහවුරු කිරීමට උත්සාහ දැරීම වැදගත්. අවම වශයෙන් සේවකයන්ගේ සේවය පිළිබඳ ඇගැයීමක් යටතේ හෝ ඔවුන්ට සුරක්ෂිත බව ලබා දීම වැදගත්. එවැනි ඇගැයීමක් කිරීමෙන් සේවකයන් දිරිමත් විය හැකියි. උපරිම දායකත්වය දීමෙන් සේවය සුරක්ෂිත කර ගත හැකිය යන අදහස මත සේවකයන් වඩාත් දිරිමත් විය හැකියි.

මේ අන්දමට මූලික අවශ්‍යතා සම්පූර්ණ වීම සහ රැකියාවේ සුරක්ෂිතතාව හිමිවන විට නොඅනුමානවම එතන පවතින්නේ තෘප්තිමත් සේවකයෙක්. එම සේවකයා සමාජයේ කිසියම් ආරක්ෂිත ස්ථානයක් කරා ගම ජීවිතය ගෙන ඒමට කටයුතු කිරීමට තරම් බුද්ධිමත් අයෙක් නම් ඔබට එම සේවකයා මානව සම්පතක් ලෙස යොදා ගත හැකි අයකු වනවා.

ඇතැම් සේවකයන් කොතෙක් අවස්ථා ලබා දුන්නත් ඒවායින් ප්‍රයෝජනයක් නොගන්නා පුද්ගලයන් විය හැකියි. එහෙත් ඔබ ලබා දෙන අවස්ථා මත ජීවිතය හැඩගස්වා ගන්නා සේවකයන් සැබවින්ම ඔබගේ ආයතනයට අගනා බව කිව යුතුයි. මෙවැනි තෘප්තිමත් සේවකයන් හේතුවෙන් ඔබගෙ ආයතනයේ ඵලදායීතාව තිරායාසයෙන්ම ඉහළ යනු ඇති. එමෙන්ම මෙවැනි සේවකයන් වරින්වර ඇගයීමට ලක් කිරීමෙන් තවදුරටත් නිදාගිලී නොවන සේවක ප්‍රජාවන් පවත්වා ගැනීමටත් එමගින් ඔබගෙ ආයතනයේ ප්‍රගතිය සලසා ගැනීමටත් ඔබට හැකියාව ලැබෙනු ඇති. එමෙන්ම සේවකයන් තුළ යහපත් ආකල්ප ඇති කිරීමෙන්, ඔවුන් ආරක්ෂා වන්නේ ඔවුන් රැකියාව කරන ආයතනය ආරක්ෂා වීම තුළින් බව ඔවුන්ට වටහා දීමෙන් වඩාත් වැඩි කාර්යක්ෂම සේවයක් ලබා ගැනීමට ඔබට හැකියාව ලැබෙනු ඇති.

වැටුප් වර්ධක ලබා දීම, දිරි දීමනා ලබා දීම, ලාභාංශ බෙදා දීම, පුහුණුවීම් පාඨමාලා සඳහා සහභාගී කරවීම, යනාදිය මගින් ඔබට තෘප්තිමත් සේවකයන් පිරිසක් සමග ඔබගේ ඉදිරි ගමන සාක්ෂාත් කර ගැනීමට වඩා වැඩි අවස්ථා උදා කර ගත හැකි වන බව නිසැකයි.

ටිරෝනි වැවලගේ

දේශාභිමානී

ශ්‍රී ලංකා යුද්ධ හමුදා නිත්‍ය බලකායේ කෙඩෙට් නිලධාරියෙකු ලෙස බැඳීමට අවස්ථාවක් (උපාධි පාඨමාලාව සඳහා)

මූලික සුදුසුකම් :

- වයස : 2021 අප්‍රේල් මස 30 දිනට අවුරුදු 18 - 23 අතර
- උස සහ බර : අඩි 05 අඟල් 06ට (සෙන්ටිමීටර් 167.64) නොඅඩු හා බර කිලෝ ග්‍රෑම් 52 (රාත්තල් 118) ට නොඅඩු
- දෘෂ්ඨි තීක්ෂණතාව : උපැස් හා කාච රහිතව 6/6 විය යුතුය.
- විවාහක/අවිවාහක බව : අවිවාහක පුරුෂ විය යුතුය.
- අධ්‍යාපන සුදුසුකම් :

අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව හා ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයන් පහකට (05) සම්මාන සාමාර්ථ සමඟ විෂයන් අටක් (08) එකවර සමත්වීම.

සහ

අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් තෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් තුනක් (03) සමත්වීම සහ සාමාන්‍ය පොදු පරීක්ෂණය සඳහා 30% ක ප්‍රතිශතයක් සමඟ එකවර සමත්වීම.

හෝ

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව පිළිගනු ලබන අ.පො.ස (සා/පෙළ) සහ අ.පො.ස (උ/පෙළ) විභාගයන්ට සමගාමී පාත්‍යන්තර විභාගයකින් (Pearson/ Edexel, GCSE, GCE and Cambridge) ඒ හා සමාන සාමාර්ථ ලබා තිබිය යුතුය.

තෝරාගනු ලබන අයදුම්කරුවන් හට මූලික කෙඩෙට් නිලධාරී පාඨමාලාවට අමතරව කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය යටතේ උපාධි (Bsc) පාඨමාලාවක් හැදෑරීමට අවස්ථාව

ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යා පීඨය වෙතින් මූලික කෙඩෙට් නිලධාරී පාඨමාලාව සාර්ථකව අවසන් කරන සෑම කෙඩෙට් නිලධාරියෙකුම දෙවන ලුතිනන් නිලයෙන් අධිකාරියට පත්කරනු ලැබේ.

අයදුම්පත් හා තොරතුරු සඳහා https://www.army.lk/officers වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.

අයදුම්පත් භාරගන්නා අවසන් දිනය : 2021 මාර්තු මස 30 දින

විමසීම් : 0112 514 605

පිරිස් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර, කොළඹ

සිළුමිණ JOBS
සිළුමිණ The Silumina රැකියා අතිරේකය

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
ඉඩම් අමාත්‍යාංශය
සැලසුම් ශිල්පී තනතුර සඳහා ඇබෑර්තු

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ පුරප්පාඩුව පවතින සැලසුම් ශිල්පී තනතුරට බඳවා ගැනීම සඳහා සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. තනතුර :- සැලසුම් ශිල්පී

1.1 තනතුරු සංඛ්‍යාව :- 02

2. වැටුප් පරිමාණය :- 30,310/-300X10-350X7-495X4-660X20-50,940/-

2.1. මාසික මූලික වැටුප :- 30,310/-

3. වයස :- අවුරුදු 22 - 45 දක්වා

4. සුදුසුකම්

බාහිර අයදුම්කරුවන් :-

4.1 අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී සිංහල /දෙමළ, ඉංග්‍රීසි භාෂාව, ගණිතය ඇතුළුව විෂයන් හතරකට සම්මාන සහිතව එක් වරක දී විෂයයන් 06කින් සමත් වී තිබීම.

4.2 අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී සියලුම විෂයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තෘතීය අධ්‍යාපන පාඨමාලාවක් හැදෑරීම සඳහා අවශ්‍ය සාධන මට්ටම ලබා තිබීම.

4.3 **තාක්ෂණික නිපුණතා/ප්‍රවීණ**

එක් එක් තනතුරෙහි කාර්ය භාරයට අදාළව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නියම කර ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතා (N.V.Q) පහ (05) මට්ටමට අඩු නොවන්නා වූ තාක්ෂණික පාඨමාලාවක් සාර්ථකව හදාරා සහතික ලබා තිබීම.

5. ඉහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් තමන් විසින් සකස් කළ ජීව දත්ත තොරතුරු ඇතුළත් අයදුම්පත්‍රයක් අදාළ සහතිකවල පිටපත්ද සහිතව 2021.04.05 දිනට හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ලැබීමට සැලැස්විය යුතුය.

6. සියලුම අයදුම්කරුවන්ගේ විස්තර ලුහුඩු ලැයිස්තු ගතකර සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

7. රාජ්‍ය දෙපාර්තමේන්තු/ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල ආයතනවල සේවය කරන නිලධාරීන්ගේ අයදුම්පත්‍ර තම දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන්ගේ නිර්දේශය සහිතව තෝරා ගතහොත් නිදහස් කිරීමට හැකිද යන්න සඳහන් කර එවිය යුතුය.

8. අයදුම්පත් බහා එවනු ලබන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"සැලසුම් ශිල්පී තනතුර සඳහා අයදුම්පත්‍රය"** යනුවෙන් සඳහන් කර එවිය යුතුය.

සභාපති,
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව,
අංක 475, කඩුවෙල පාර, බත්තරමුල්ල.
2021.03.19

BE BETTER INFORMED!



News you can trust now free on your mobile phone.

Dinamina Daily News Thinakaran

VISIT apps.lakehouse.lk

DOWNLOAD TODAY!

AVAILABLE AT

LAKE HOUSE

සුදුසුකම්

බාහිර අයදුම්කරුවන් (පහත සඳහන් 1 හෝ 2)

(01) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලැබූ අලෙවිකරණය, ව්‍යාපාර කළමනාකරණය හෝ වාණිජ විෂය පිළිබඳ ප්‍රථම උපාධියක්.

සමග

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම් (මාස්ටර්) හෝ තනතුරට අදාළ ක්ෂේත්‍රයක පිළිගනු ලැබූ වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත (Associate) / පූර්ණ (Full) සාමාජිකත්වය

සහ

සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ ප්‍රසිද්ධ පුද්ගලික ආයතනයක සනාථ කළ සේවා වාර්තාවක් සමග කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර (15) පහළොවක පළපුරුද්ද සහ ඉන් වසර (05) පහක් ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටමේ විය යුතුය.

(02) තනතුරට අදාළ ක්ෂේත්‍රයක පිළිගනු ලැබූ වරලත් වෘත්තීය ආයතනයක පූර්ණ (Full) සාමාජිකත්වය

සමග

සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ ප්‍රසිද්ධ පුද්ගලික ආයතනයක සනාථ කළ සේවා වාර්තාවක් සමග කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර (15) පහළොවක පළපුරුද්ද සහ ඉන් වසර (05) පහක් ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටමේ විය යුතුය.

වයස : අවුරුදු 45 ට නොඅඩු සහ 60 ට නොවැඩි විය යුතුය.

වැටුප් හා අනෙකුත් දීමනා :

මූලික වැටුප : රු. 150,000/- (කාර්ය සාධන දීමනාව රු. 75,000/- + ප්‍රවාහන දීමනාව රු. 50,000 + රජයේ චක්‍රලේඛයන්ට අනුව තනතුරට අදාළ අනුමත ඉන්ධන දීමනාව + ජංගම දුරකථන ප්‍රතිපූර්ණ දීමනාව රු.9,000/- (මාසික) මෙම තනතුර සඳහා හිමිය)

සුදුසු අයදුම්කරු සතුව,

- විශිෂ්ට විශ්ලේෂණ, ගැටළු විසඳීමේ සහ සංවිධාන කිරීමේ හැකියාවන් සමග දක්ෂ ඇගයීමේ, සමාලෝචන කිරීමේ හා අර්ථ නිරූපනය කිරීමේ හැකියාවන් තිබිය යුතු අතර, ඉහළ ස්වයං අභිප්‍රේරිත පුද්ගලයෙකු විය යුතුය.
- ප්‍රබල නායකත්ව ගුණාංග සහ අන්තර් පුද්ගල සන්නිවේදන කුසලතා තිබිය යුතුය.
- තොරතුරු තාක්ෂණ කුසලතා ප්‍රදර්ශනය කිරීමේ මනා හැකියාව තිබිය යුතුය.
- විවිධ කණ්ඩායම් වලට නායකත්වය ලබාදීමේ සහ මෙහෙයවීමේ සනාථ කළ හැකියාව තිබිය යුතුය. මානව සහ අනෙකුත් සම්පත් නිසිලෙස යෙදවීමේ සහ සාර්ථකව කළමනාකරණය කිරීමේ පළපුරුද්ද තිබිය යුතුය.

සෑම අයදුම්කරුවෙකුම,

I. ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

II. තනතුරේ කාර්යභාරය හොඳින් ඉටුකිරීම සඳහා සහ ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය ශාරීරික හා මානසික යෝග්‍යතාවය තිබිය යුතුය.

III. විශිෂ්ට පෞරුෂයකින් හෙබි අයෙකු විය යුතුය.

ඔබට නියම සුදුසුකම් හා පළපුරුද්ද ඇතිනම්, ඔබගේ පිවිදත්ත ලේඛනය, සහතික වල ඡායා පිටපත්ද සමග මෙම දැන්වීම පළවී දින 10 ක් ඇතුළත ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට යොමු කරන්න. නැතිනම් vacancies@lanksathosa.org යන විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කරන්න (ඉල්ලුම් කරනු ලබන තනතුර ලිපි කවරයෙහි වම් පස ඉහළ කෙළවරෙහි / විද්‍යුත් තැපැල් පණිවුඩයෙහි "subject" තීරුවෙහි සඳහන් කළ යුතුය).

(කෙටි ලයිස්තුගත කළ අපේක්ෂකයන්ට පමණක් ආයතනය විසින් ප්‍රතිචාර දක්වනු ලැබේ.)

සභාපති,
ලංකා සතොස ලිමිටඩ්,
සතොස සහලේකම් ගොඩනැගිල්ල,
අංක 27, 05 වන මහළ, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02

වෙළඳ අමාත්‍යාංශය

ලංකා සතොස LANKA SATHOSA

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
තනතුරු පුරප්පාඩු (රාගම / කරාපිටිය)

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ රාගම හා කරාපිටියේ පිහිටා ඇති වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ ඒකකයන්හි පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්කරුවන් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබීම අවශ්‍ය වේ.

1. සාක්ෂි පටිගත කිරීමේ සහකාර MA 3 (තනතුරු 02)

සුදුසුකම්

බාහිර අයදුම්කරුවන්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන මනෝ විද්‍යාව/ සමාජ විද්‍යාව/ ජන සන්නිවේදනය පිළිබඳ ප්‍රථම උපාධියක් ලබා තිබීම.

2. උපදේශන සහකාර MA 03 (තනතුරු 02)

සුදුසුකම්

බාහිර අයදුම්කරුවන්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන මනෝ විද්‍යාව / සමාජ විද්‍යාව/ සෞඛ්‍ය ප්‍රවර්ධනය/ විශේෂ අවශ්‍යතා පිළිබඳ අධ්‍යාපනය/ කථන හා ශ්‍රවණ විද්‍යාව/ නාට්‍ය හා රංග කලාව පිළිබඳ ප්‍රථම උපාධියක් ලබා තිබීම.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා තිබීම අතිරේක සුදුසුකමක් ලෙස සැලකේ.

වෙනත්

ඉහත 1 හා 2 තනතුරු සඳහා පොදු කරුණු :

- **සේවා ගණය හා මාසික වැටුප් පරිමාණය** :
  ක.සේ.දෙ. චක්‍රලේඛ 2/2016 -MA 3 රු .[32,200-10 x 445-11 x 660-10 x 730-5 x 750 - 54,960.00]
  ක.සේ.දෙ. චක්‍රලේඛ 02/2016 උපලේඛන II අනුව 2020.01.01 වන දිනට ආරම්භක වැටුප් පියවර රු. 32,200.00
- **වයස** : අවුරුදු 23ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.
- **බඳවා ගැනීමේ ක්‍රමවේදය** : පත් කිරීමේ බලධාරියා විසින් පත්කරනු ලබන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ලිඛිත තරගකාරී විභාගයක සහ / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත තෝරා ගැනීම සිදු කෙරේ.

3. වීඩියෝ තාක්ෂණික සහකාර MA 2-1 (තනතුරු 02)

සුදුසුකම්

බාහිර අයදුම්කරුවන්

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තාක්ෂණික හෝ වෘත්තීය පුහුණු ආයතනයක් මගින් නිකුත් කරනු ලබන NVQ (ජාතික වෘත්තීමය සුදුසුකම්) 05 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම (වීඩියෝකරණය හා ඡායාරූපකරණය) සමග අදාළ ක්ෂේත්‍රයේ එක් වසරක පළපුරුද්ද ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන්

ඉහත බාහිර අයදුම්කරුවන් විසින් සපුරාලිය යුතු සුදුසුකම් ලබා තිබීම.

වෙනත්

- **සේවා ගණය හා මාසික වැටුප් පරිමාණය** :
  ක.සේ.දෙ. චක්‍රලේඛ 02/2016 - MA 2-1 රු. [30,310 -10x300 – 7x350 – 4x 495- 20x 660 -50,940]
  ක.සේ.දෙ. චක්‍රලේඛ 02/2016 උපලේඛන II අනුව 2020.01.01 වන දිනට ආරම්භක වැටුප් පියවර රු. 30,310.00
- **වයස** : අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.
- **බඳවා ගැනීමේ ක්‍රමවේදය** : පත් කිරීමේ බලධාරියා විසින් පත්කරනු ලබන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ලිඛිත තරගකාරී විභාගයක සහ / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත තෝරා ගැනීම සිදු කෙරේ.

4. කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන (යතුරු ලියන කටයුතු) සිංහල මාධ්‍ය MA 1-1 (තනතුරු 02)

බාහිර අයදුම්කරුවන්

අධ්‍යාපනික

1. a) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් එක්වරකදී පහත විෂයන් ඇතුළුව විෂයන් 04කට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් 06 ක් සමත්ව තිබීම.
   i. සිංහල
   ii. ඉංග්‍රීසි භාෂාව
   iii. ගණිතය

   b) අ.පො.ස.(උ/පෙළ) විභාගයෙන් විෂයන් තුනක් (03) (පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

   C) යතුරු ලියනය/ පරිගණක සාක්ෂරතාවය පිළිබඳ මාස හයක (06) සහතිකපත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන්

පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති ප්‍රාථමික සේවා ගණයේ ශිල්පීය, අර්ධ ශිල්පීය සහ ශිල්පීය නොවන නිලධාරීන් හට අයදුම් කළ හැක.

අධ්‍යාපනික

a) අ.පො.ස.(සා/පෙළ) විභාගයෙන් පහත විෂයන් ඇතුළුව විෂයන් 04කට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් 06 ක් සමත්ව තිබීම.
   i. සිංහල
   ii. ඉංග්‍රීසි භාෂාව
   iii. ගණිතය

b) යතුරු ලියනය/ පරිගණක සාක්ෂරතාවය පිළිබඳ මාස හයක (06) සහතිකපත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම.

වෙනත් : ඉහත සේවා ගණයේ ස්ථිර තනතුරක අවම වශයෙන් වසර 05ක සතුටුදයක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

5. කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන (යතුරුලියන කටයුතු) දෙමළ මාධ්‍ය MA 1-1 (තනතුරු 02)

බාහිර අයදුම්කරුවන්

අධ්‍යාපනික

1. a) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් එක්වරකදී පහත විෂයන් ඇතුළුව විෂයන් 04කට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් 06 ක් සමත්ව තිබීම.
   i. දෙමළ
   ii. ඉංග්‍රීසි භාෂාව
   iii. ගණිතය

   b) අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් විෂයන් තුනක් (03) (පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

   C) යතුරු ලියනය/ පරිගණක සාක්ෂරතාවය පිළිබඳ මාස හයක (06) සහතිකපත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන්

පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති ප්‍රාථමික සේවා ගණයේ ශිල්පීය, අර්ධ ශිල්පීය සහ ශිල්පීය නොවන නිලධාරීන් හට අයදුම් කළ හැක.

අධ්‍යාපනික

a) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් පහත විෂයන් ඇතුළුව විෂයන් 04කට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් 06 ක් සමත්ව තිබීම.
   i. දෙමළ
   ii. ඉංග්‍රීසි භාෂාව
   iii. ගණිතය

b) යතුරු ලියනය/ පරිගණක සාක්ෂරතාවය පිළිබඳ මාස හයක (06) සහතිකපත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම.

වෙනත් : ඉහත සේවා ගණයේ ස්ථිර තනතුරක අවම වශයෙන් වසර 05ක සතුටුදයී සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

6. කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන (සෝදුපත් බැලීමේ කටයුතු) සිංහල මාධ්‍ය MA 1-1 (තනතුරු 02)

බාහිර අයදුම්කරුවන්

අධ්‍යාපනික

1. a) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් එක්වරකදී පහත විෂයන් ඇතුළුව විෂයන් 04කට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් 06 ක් සමත්ව තිබීම.
   i. සිංහල
   ii. ඉංග්‍රීසි භාෂාව
   iii. ගණිතය

   b) අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් විෂයන් තුනක් (03) (පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන්

පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති ප්‍රාථමික සේවා ගණයේ ශිල්පීය, අර්ධ ශිල්පීය සහ ශිල්පීය නොවන නිලධාරීන් හට අයදුම් කළ හැක.

අධ්‍යාපනික

a) අ.පො.ස.(සා/පෙළ) විභාගයෙන් පහත විෂයන් ඇතුළුව විෂයන් 04කට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් 06 ක් සමත්ව තිබීම.
   i. සිංහල
   ii. ඉංග්‍රීසි භාෂාව
   iii. ගණිතය

වෙනත් : ඉහත සේවා ගණයේ ස්ථිර තනතුරක අවම වශයෙන් වසර 05ක සතුටුදයී සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

7. කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන (සෝදුපත් බැලීමේ කටයුතු) දෙමළ මාධ්‍ය MA 1-1 (තනතුරු 02)

බාහිර අයදුම්කරුවන්

අධ්‍යාපනික

1. a) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් එක්වරකදී පහත විෂයන් ඇතුළුව විෂයන් 04කට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් 06 ක් සමත්ව තිබීම.
   i. දෙමළ
   ii. ඉංග්‍රීසි භාෂාව
   iii. ගණිතය

   b) අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් විෂයන් තුනක් (03) (පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන්

පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති ප්‍රාථමික සේවා ගණයේ ශිල්පීය, අර්ධ ශිල්පීය සහ ශිල්පීය නොවන නිලධාරීන් හට අයදුම් කළ හැක.

අධ්‍යාපනික

a) අ.පො.ස.(සා/පෙළ) විභාගයෙන් පහත විෂයන් ඇතුළුව විෂයන් 04 කට සාම්මාන සාමාර්ථ සහිතව විෂයන් 06 ක් සමත්ව තිබීම.
   i. දෙමළ
   ii. ඉංග්‍රීසි භාෂාව
   iii. ගණිතය

වෙනත් : ඉහත සේවා ගණයේ ස්ථිර තනතුරක අවම වශයෙන් වසර 05ක සතුටුදයක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

වෙනත්

(ඉහත 4, 5, 6, හා 7 තනතුරු සඳහා පොදු කරුණු)

- සේවා ගණය හා මාසික වැටුප් පරිමාණය :
  ක.සේ.දෙ. චක්‍රලේඛ 02/2016 - MA 1-1 රු. [27,910 -10x300 –7x350 – 4x 495- 20x 660 – 48,540]
  ක.සේ.දෙ. චක්‍රලේඛ 02 /2016 උපලේඛන II අනුව 2020.01.01 දිනට ආරම්භක වැටුප් පියවර රු. 27,910.00
- වයස : අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.
- **බඳවා ගැනීමේ ක්‍රමවේදය** : පත් කිරීමේ බලධාරියා විසින් පත්කරනු ලබන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ලිඛිත තරගකාරී විභාගයක සහ / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත තෝරා ගැනීම සිදු කෙරේ.

ප්‍රතිලාභ

ඉහත සඳහන් සියලු තනතුරු සඳහා මූලික වැටුපට අමතරව රජයේ අනුමත ජීවන වියදම් දීමනාව හිමිවේ. එමෙන්ම සේවක අර්ථසාධක අරමුදල සඳහා 12% ක දායකත්වයක් හා සේවක භාරකාර අරමුදල සඳහා 3%ක දායකත්වයක් ද අධිකාරිය විසින් දරනු ලැබේ.

පොදු කරුණු

සෑම අයදුම්කරුවකුම ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු අතර, විශිෂ්ට චරිතයකින් යුක්ත වීම හා තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

ඉහත තනතුරු සඳහා අයදුම් කිරීමට සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිල වෙබ් අඩවියේ (**www.childprotection.gov.lk**) පළ කොට ඇති ආදර්ශ අයදුම්පත නිසි පරිදි සම්පූර්ණ කර 2021 අප්‍රේල් මස 12 වන දිනට හෝ ඊට පෙර ලැබෙන ලෙස ලියාපදිංචි තැපෑලෙන් පමණක් පහත ලිපිනය වෙත යොමු කළ යුතුය.

සෑම අයදුම්කරුවකුම තම අයදුම්පත්‍රය සමග උප්පැන්න සහතිකයේ සහතික කළ පිටපතක්, ජාතික හැඳුනුම්පතේ/ විදේශ ගමන් බලපත්‍රයේ සහතික කළ පිටපතක් හා අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද සනාථ කළ හැකි සහතිකපත් වල සහතික කළ පිටපත්ද යොමු කළ යුතුය. යම් අයදුම්කරුවෙකු එක් තනතුරකට වඩා අයදුම් කරන්නේ නම් එම එක් එක් තනතුර සඳහා වෙන් වෙන් වශයෙන් අයදුම්පත් වෙනම ලිපිකවරවල බහා යොමු කළ යුතුය.

අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ තමා අයදුම්කරන තනතුර සඳහන් කර එවිය යුතු අතර, රජයේ දෙපාර්තමේන්තු / රාජ්‍ය සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත් ආයතන ප්‍රධානියා මඟින් යොමුකළ යුතුය.

ඉහත උපදෙස් අනුව ඉදිරිපත් කොට නොමැති, අසම්පූර්ණ හා අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පසු ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර, මෙම තනතුර ලබා ගැනීම සඳහා කවර ආකාරයකින් හෝ බලපෑම් කිරීම නුසුදුසුකමක් වනු ඇත. කෙටි ලැයිස්තුගත කිරීමෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සහ /හෝ ලිඛිත පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර, මෙම පත්වීම් සම්බන්ධව ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

සභාපති, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය,
නො. 330, තලවතුගොඩ පාර,
මාදිවෙල, ශ්‍රී ජයවර්ධනපුර.

දුරකථන අංකය - 0112778911-14
වෙබ් අඩවිය - www.childprotection.gov.lk

සිළුමිණ JOBS
සිලුமினா The Silumina
රැකියා අතිරේකය

ප්‍රධාන පාලිකා

කොළඹට නුදුරු බාලිකා ළමා සංවර්ධන මධ්‍යස්ථානයකට ළමා පාලනය පිළිබඳව පළපුරුදු උගත් කාන්තාවක් අවශ්‍යයි.

වයස අවු. 45 සිට 55 දක්වා විශේෂයි. සහාය පාලිකාවක් සඳහාද ඇබෑර්තුවක් ඇත.

ඔබ පිළිබඳව සියලු තොරතුරු සහිතව පහත ලිපිනයට තැපැල් කරන්න.

N. පීරිස්,
54/5, දෙහිවල පාර, පැපිලියාන, බොරලැස්ගමුව.

අධ්‍යාපන ප්‍රකාශන ආයතනයකට පරිගණක ටයිප් සෙටින් වරියන් (Computer Type Setting)

අවශ්‍ය වී ඇත.

- වයස අවු : 30ට අඩු (කොළඹ, ගම්පහ අවට්න්)
- සිංහල, ඉංග්‍රීසි Type Setting කිරීමේ හැකියාව.
- අවුරුද්දකට නොඅඩු සේවා පළපුරුද්ද.
- Photoshop, Coreldraw, Illustrator, Indesign, Word භාවිත කිරීමේ හැකියාව අමතර සුදුසුකමක් සේ සැලකේ.

ඔබගේ අයදුම්පත්......
masterg@sltnet.lk වෙත යොමු කරන්න.
විමසීම් : 070-313 3002 / 070-313 3005

තේ වතු යායක් සඳහා ක්ෂේත්‍ර නිලධාරී ඇබෑර්තු

මහනුවර ප්‍රදේශයේ තේවතු යායක් සඳහා අවු. 30-50 අතර අවුරුදු 5 ට වැඩි පළපුරුද්දක් ඇති සහකාර ක්ෂේත්‍ර නිලධාරී ඇබෑර්තු

විමසීම් : 077-8304310
fieldofficer88@gmail.com

වසර 05ක් පළපුරුදු බරවාහන රියදුරු බලපත්‍රය සහිත අයවළුන් වහාම අවශ්‍යයයි

බැකෝ ලෝඩර්/ JCB ඔපරේටර්වරු සහ ඉදිකිරීම් යන්ත්‍ර ක්‍රියාකරුවන්

අවශ්‍යයි

වී.වී.කරුණාරත්න සහ සමාගම
579, මුල්ගහ හන්දිය, නුවර පාර, කැළණිය.
දු.අ.: 077-3358100 / 071-1712016 / 071-1700005
(කාර්යාල වේලාව තුළදී අමතන්න)

ආපනශාලා ඇබෑර්තු

ජාත්‍යන්තර හවුල් ව්‍යාපාරයකට අයත් ප්‍රධාන පෙළේ ආපනශාලාවක පහත සඳහන් ඇබෑර්තු ඇත.

- ❖ අරක්කැමියන්
- ❖ මුළුතැන්ගෙයි සහයකවරුන් - ගැහැනු / පිරිමි
- ❖ වේටර්වරුන්

සම්මුඛ පරීක්ෂණ 2021 මාර්තු මස 29 සහ 30 දිනවල

පෙරවරු 10.00 සිට පස්වරු 13.00 දක්වා පහත ලිපිනයේදී

Han Gook Gwan Restaurant
අංක 25, හැව්ලොක් පාර, කොළඹ 05.

සතර පෝදා එළිදකින සදහම් ප්‍රදීපය
බුදුසරණ

ගෘහ සේවිකාවක් අවශ්‍යයි
නිවසක වැඩ කිරීමට විශ්වාසවන්ත ගෘහ සේවිකාවක් සොයමින් සිටිති. සිංගප්පූරුව වගේ රටවල් වල පළපුරුදු ඇත්නම් වාසියි
අමතන්න 0777 420 311

අනාගත සිහින සැබෑකර ගැනීමේ එකම මග
මංගල යෝජනා තීරයයි
සිළුමිණ

---

www.adz.lk
it's what you want

තාක්ෂණික හා දැවමය යන්ත්‍ර ක්‍රියාකරු
Technical & Wooden Machine Operator

සුදුසුකම් :

- ➢ වයස අවුරුදු 50 ට නොඅඩු විය යුතුය.
- ➢ අවම වශයෙන් වසර 5 ක අත්දැකීම් සහිත පළපුරුද්ද
- ➢ යන්ත්‍රෝපකරණ හා උපකරණවල අමතර උපාංග හඳුනාගැනීම සහ අවශ්‍යතාව මත උපාංග ඇණවුමට ඇති මනා දැනුම.
- ➢ වැඩබිමේදී උපකරණ නඩත්තු කිරීමේ හැකියාව.
- ➢ නඩත්තු සැලසුම් ක්‍රියාත්මක කිරීම සහ ඒවායේ ප්‍රගතිය ඇගයීමට හැකිවීම.
- ➢ ශාරීරිකව යෝග්‍යය විය යුතුවේ.
- ➢ තාක්ෂණික දෝෂ හඳුනාගෙන නිරාකරණය කිරීමට හැකිවිය යුතුය.
- ➢ සියලුම යන්ත්‍ර හා උපකරණ ආරක්ෂිතව හා නිවැරදිව පාරිභෝගිකයන්ට පුහුණු කිරීමේ හැකියාව තිබිය යුතුය.
- ➢ රට පුරා විවිධ ස්ථානවලට ගමන් කිරීමට හැකියාව තිබීම අමතර සුදුසුකමකි.

මොරටුව හා පිළියන්දල අවට්න් විශේෂයි

විමසීම් : 0777127057 / 0112656560/61
විද්‍යුත් තැපෑල : hr@puwakarambaent.com

පුවක්අරඹ එන්ටප්‍රයිසස් (පුද්.) සමාගම

Aitken Spence

මිල කාලීනව මුද්‍රණ ක්ෂේත්‍රයේ ස්ථාවරව රැඳී සිටිමින් විශ්වාසනීය නාමයක් දිනා ඇති, සුවිට පත්ව පාලනයකින් යුතු උසස් සේවයක් සෑම විටම සිය පාරිභෝගිකයන්ට ලබා දෙන එයිට්කින් ස්පෙන්ස් ප්‍රින්ටින් ඇන්ඩ් පැකේජින් (පෞද්ගලික) සමාගම මුද්‍රණ ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා බවට පත්ව ඇත. එම පහත දැක්වෙන ඇබෑර්තු සඳහා කාර්යක්ෂම සහ උද්යෝගිමත් පුද්ගලයින්ට අයදුම් කළ හැක.

ඕෆ්සෙට්, ඩයිකට්න් සහ ග්ලූයින් මැෂින් ක්‍රියාකරුවන් (පුහුණු)

අ.පො.ස (සා.පෙළ) සමත්, ඕෆ්සෙට් (වර්ණ 5 සහ 6), ඩයිකට්න් සහ ග්ලූයින් මැෂින් සඳහා මුද්‍රණ ක්ෂේත්‍රයේ අවම වශයෙන් අවුරුදු 2ක සේවා පළපුරුද්දක් ඇති වැඩමුර ක්‍රමයට සේවය කළ හැකි මැෂින් ක්‍රියාකරුවන් සඳහා ඇබෑර්තු ඇත.

ඕෆ්සෙට්, ඩයිකට්න් සහ ග්ලූයින් මැෂින් ක්‍රියාකරුවන් (නුපුහුණු)

අ.පො.ස (සා.පෙළ) සමත්, ඕෆ්සෙට් (වර්ණ 5 සහ 6), ඩයිකට්න් සහ ග්ලූයින් මැෂින් සඳහා වැඩමුර ක්‍රමයට සේවය කළ හැකි නුපුහුණු මැෂින් ක්‍රියාකරුවන් සඳහා ඇබෑර්තු ඇත.

ශ්‍රී ලංකා මුද්‍රණ හෝ ඉංග්‍රීසි ආයතනයේ පාඨමාලා සහතිකපත් ලාභීන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ.

Aitken Spence Printing

අයදුම්කරුවන්ගේ පළපුරුද්ද හා සුදුසුකම් අනුව ඉහත සඳහන් තනතුරු සඳහා ආකර්ෂණීය වැටුප් හා අනෙකුත් වරප්‍රසාද ලබා ගත හැක.

ඔබගේ අයදුම්පත careers@aitkenspence.lk යන විද්‍යුත් ලිපිනයට හෝ කළමනාකාර අධ්‍යක්ෂක, එයිට්කින් ස්පෙන්ස් ප්‍රින්ටින් ඇන්ඩ් පැකේජින් (පුද්.) සමාගම, නො.90, සංගීත විදා වත්ත, මිවරමණ්ඩිය, සියඹලාපේ. යන ලිපිනයට මෙම දැන්වීම පළවී දින 10ක් ඇතුළත ආපසු නොවන, තොරතුරු සහතික කළ හැකි පුද්ගලයන් දෙදෙනෙකුගේ නම් ඇතුළත්ව අප වෙත ලැබීමට සලස්වන්න. තෝරාගත් අයදුම්කරුවන්ට පමණක් දැනුම් දීම සිදු කරනු ලැබේ.

දැන්වීම් කාර්යාල
ඔබගේ දැන්වීම් පළකරවා ගන්න පිවිසෙන්න

නුගේගොඩ
සවිසිරි වෙළඳ සංකීර්ණය
4 වන මහල, හයිලෙවල් පාර,
011 282 8114
සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම
ඩී ආර් විජේවර්ධන මාවත, කොළඹ 10
1949

පී.එස්.එම්.බී.ටෙක්නිකල් සර්විසස් (පුද්) සමාගම

පුරප්පාඩු

පී.එස්.එම්.බී.ටෙක්නිකල් සර්විසස් (පුද්) සමාගම භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයට අනුබද්ධිත පරිසර අමාත්‍යාංශය යටතේ පවත්නා ආයතනයකි.

අප සමාගමේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

(01) නීති නිළධාරී

අවශ්‍ය සුදුසුකම් හා පලපුරුද්ද:- (පහත 1 හා 2 හා 3)

(1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නීතිවේදි උපාධිය සමත්වී තිබීම

(2) ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු සහ ලියාපදිංචි සමාගම් ලේකම්වරයෙකු/වරියක වීම

(3) අධිකරණ කටයුතු/ක්‍රියාකාරී වෘත්තිය පරිචය පිළිබඳ සුදුසුකම ලබා ගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක සේවා පළපුරුද්දක් ලබා තිබීම

- අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයෙකු/වරියක ලෙස ලබා ඇති පලපුරුද්ද අතිරේක සුදුසුකමක් වනු ඇත.

(02) මානව සම්පත් කළමනාකරු

අවශ්‍ය සුදුසුකම් හා පලපුරුද්ද:- (පහත 1 හෝ 2 හෝ 3)

(4) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම සහ උපාධිය ලබාගැනීමෙන් පසුව තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක සේවා පළපුරුද්දක් ලබා තිබීම

(5) තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ පිළිගත් වරලත් වෘත්තිය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත්වී තිබීම සහ සුදුසුකම ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක සේවා පළපුරුද්දක් ලබා තිබීම

(6) තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද වෘත්තිය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද ජාතික වෘත්තිය කුසලතා (NVQ) 07 මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සහ සුදුසුකම ලබා ගැනීමෙන් පසු රජයේ රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අදාල ක්ෂේත්‍රයේ වසරක සේවා පළපුරුද්දක් ලබා තිබීම

වැටුප් පරිමාණය හා කාණ්ඩය MM1-1 (රු.53,175-1375×10-1910×15-රු.95,575.00)
සහ ආයතනය ලබාදෙන අනෙකුත් දීමනා

සියළුම අයදුම් කරුවන්

- අභ්‍යන්තර හා බාහිර අයදුම්කරුවන් ඉහත සඳහන් සියළුම සුදුසුකම් සපුරා තිබිය යුතුය
- වයස් සීමාව - වයස අවු. 22 ට නොඅඩු විය යුතු අතර අවු. 45 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවයේ හෝ අර්ධ රාජ්‍ය ආයතනයක /සංවිධානයක සේවයේ නියුතු නිලධාරීන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ)
- අධ්‍යාපන සුදුසුකම්, පලපුරුද්ද සහ අදාළ අනෙකුත් සියළුම සහතික පත්‍ර වල ජායා පිටපත් අයදුම්පතට ඇමිණිය යුතුය
- කොන්ත්‍රාත් පදනම යටතේ වසරක කාලයක් සඳහා පත්වීම ලබා දෙන අතර කාර්යය සාධනය පදනම් කරගෙන කොන්ත්‍රාත් කාල සීමාව දීර්ඝ කරනු ලැබේ.

සටහන

- සේවකයාගේ වැටුපෙන් 8% සේවක අර්ථසාධක අරමුදල සඳහා අයකරන අතර ආයතනය විසින් සේවක අර්ථසාධක අරමුදල සඳහා 12% සහ සේවක භාරකාර අරමුදල සඳහා 3% බැර කරනු ලැබේ.

ඔබගේ ජීවදත්ත ඇතුළත් අයදුම්පත් ඥාතීන් නොවන දෙදෙනකුගේ විස්තර සහිතව **2021/04/12 වන දිනට හෝ ඊට පෙර** පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියුම් කවරයේ වම් පස ඉහළ කෙලවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කල යුතුය.

ප්‍රධාන විධායක නිළධාරී
පී.එස්.එම්.බී.ටෙක්නිකල් සර්විසස් (පුද්) සමාගම,
අංක 190/ඒ,රත්නවීර ගොඩනැඟිල්ල,
ස්ටැන්ලි තිලකරත්න මාවත,
නුගේගොඩ

ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව (NRCSL)

නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය

පුරප්පාඩු

ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව (NRCLS) යනු දිවයිනේ රාජ්‍ය අංශයේ විද්‍යාඥයින් හට, මූල්‍ය සහාය සපයන, රජයේ අරමුදල් සම්පාදනයෙහි නියැලි නියෝජිතායතනයකි.

ජාතික පර්යේෂණ සභාවෙහි (NRC) හි, පවතින පහත සඳහන් තනතුරු පුරප්පාඩුව සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකීය පුරවැසියන් වෙතින් අයදුම්පත් දැන් කැඳවනු ලැබේ.

ප්‍රධාන විධායක නිලධාරී : HM 2-1 තනතුර

රැකියා විස්තරය : ජාතික පර්යේෂණ සභාවේ සියලුම ක්‍රියාකාරකම් සහ පරිපාලන සහ මූල්‍ය කටයුතු පිළිබඳ ගිණුම් හා වගකීම් භාරය දැරිය යුතුය. සභාවේ පොදු විධානය මග පෙන්වීම සහ පාලනය යටතේ සභාවේ කාර්ය කර්තව්‍යයන් සහ රාජකාරී ඉටුකිරීම බලාත්මක කිරීම සහ බලතල ක්‍රියාවේ යෙදවීම සහ ඒවා සභාව විසින් බලය පවරන ලද පරිදි සිදුකිරීම, ජාතික පර්යේෂණ සභාවේ කාර්ය මණ්ඩලයට නායකත්වය සැපයීම හා දිරිමත් කිරීම, තිලයේ විශිෂ්ටත්වයේ අත්කරගත්තා ජයග්‍රහනයන් හා සාක්ෂාත් කර ගැනීම සඳහා ක්‍රියාකිරීම සහ සභාවේ අරමුණු හා ක්‍රියාත්විතයන් හඹායාම ධුරයේ වගකීම් භාරයන්ට අන්තර්ගතය.

සුදුසුකම් :

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගන්නා වූ විද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධියක් සහ විද්‍යාව/ කෘෂිකර්ම විද්‍යාව/ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි සුදුසුකම් හෝ කළමනාකරණය පිළිබඳ පිළිගත් වෘත්තීයවේදී ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ ආයතනික සාමාජිකත්වය.

   සහ

   කළමනාකරණ මට්ටමේ අඩුම තරමින් වසර 20 ක පළපුරුද්ද ඉන් වසර 05ක් (පහක්) ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය. තවද ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු රාජ්‍ය සංස්ථාවක මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක සනාථ කළ පෙර සේවා වාර්තාවක්ද සහිත විය යුතුය.

   හෝ

2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගනු ලබන විද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධියක් සහ විද්‍යාව/ කෘෂිකර්මය/ ව්‍යාපාර පරිපාලනය හෝ වෙනත් අදළ ක්ෂේත්‍රයක දර්ශනශූරි / ආචාර්ය (PhD) උපාධියක්.

   සහ

   සනාථ කළ සේවා වාර්තාවක් සහිතව ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ අඩුම තරමින් වසර පහක (05) ක පළපුරුද්ද සහ රාජ්‍ය සංස්ථාවක මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසු ලත්, කළමනාකරණ පළපුරුද්ද.

වයස : අවුරුදු 35 ට නොඅඩු සහ අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය : HM 2-1 [රුපියල් 91,645-2, 700X12-124,045]

තනතුරට අදාළ වෙනත් කොන්දේසි

1. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.
2. අයදුම්කරුවන් දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීමට හා තනතුරට පැවරෙන සියලු රාජකාරී මැනවින් ඉටුකිරීමට හැකි වන සේ කායිකව හා මානසිකව යෝග්‍යතාවයෙන් හා ශක්තිමත් සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුය.
3. අයදුම්කරුවන් අනර්ඝ හා විශිෂ්ට චරිත ස්වභායෙන් යුක්ත විය යුතුය.
4. බඳවා ගැනීම්, පත්වීම් බලාධිකාරිය විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සිදුකරනු ලැබේ.
5. මෙම පත්වීම ස්ථිර පදනම මත වන අතර, සේවක අර්ථසාධක අරමුදලට (EPF) සහ සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලට (ETF) හිමිකාරිත්වය ලබනු ඇත. 2016 අංක 11 දරන ජාතික පර්යේෂණ සභා පනතේ විධිවිධාන පරිදි මෙම පත්වීම පත්වීම්ලාභියාගේ පත්වීම ලද දිනයේ සිට ගණනය කෙරෙන වසර පහක (05) කාල සීමාවක් සඳහා වනු ඇත. ප්‍රධාන විධායක නිලධාරියා නැවතත් පත්කරනු ලබන්නේ නම් හැර ප්‍රධාන විධායක නිලධාරියා වශයෙන් ඔහු/ ඇය පත්වීම් ලද දිනයට පෙරාතුව, එකී පනත මගින් පාලන වන ආයතනයක, කාර්ය මණ්ඩල සාමාජිකයෙකු/ සාමාජිකාවක ඔහු/ ඇය වූවේ වී නම් ඔහු/ ඇය හැටවන වසර සම්පූර්ණ කර නොමැති විටදී ආයතනයේ සිය නිත්‍ය පදවියට නැවත පත් කරනු ලබනු ඇත.
6. ජාතික පර්යේෂණ සභාවේ නියමිත තනතුරට අදළ වෙනත් ආත්තික/ අමතර පහසුකම් / ප්‍රතිලාභ (රථ වාහනයක් හෝ වාහන දීමනාව, ඉන්ධන දීමනාව සහ දුරකථන පහසුකම් දීමනාව)
7. අයදුම්කරුවන් විසින් සිය අත්සන් යෙදූ අයදුම්පත් සිය උප්පැන්න සහතිකය සහ වෙනත් අදළ සහතිකවල පිටපත්ද ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනද සහිතව අයදුම් කරනු ලබන තනතුර ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව සටහන්කර **2021 අප්‍රේල් මස 20 වන දිනට හෝ ඊට පෙර** ලැබෙන සේ ලේඛනගත තැපෑලෙන් කුරියර් දූත සේවය මගින් කොළඹ 07, විද්‍යා මාවතේ, අංක 120/7 හි ජාතික පර්යේෂණ සභාවේ සභාපති වෙත, යොමු කිරීම කළ යුතු වන්නේය.
8. අයදුම්කරුගේ ජීවදත්ත තොරතුරු ප්‍රකාශිත පරිලෝකනගත කළ පිටපතක් (Scan Copy) විද්‍යුත් තැපෑලෙන් (Email) මගින් admin@nrc.gov.lk වෙත Covid අදළ තැපැල් / කුරියර් ප්‍රමාදයන් වලකා ගැනීම සඳහා කලට වේලාවට ඉදිරිපත් කිරීම තහවුරු කිරීම අරභයා එවිය යුතුය. CV හි සියලු පිටුවල අපේක්ෂකයා විසින් සිය අත්සන යොද තිබිය යුතුය.
9. රජයේ දෙපාර්තමේන්තුවල/ සංස්ථාවල / ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනටමත් සේවයේ නියුතු නිලධාරීන්ගේ අයදුම්පත් ස්වකීය අදළ ආයතනවල ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.
10. ඉහත සඳහන් අවශ්‍යතාවලට අනුකූල නොවන සියලුම අයදුම්පත් භාරගැනීම ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මෙම දැන්වීම ජාතික පර්යේෂණ සභාවේ (NRC) හි වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කර ඇත. www.nrc.gov.lk

සභාපති, ජාතික පර්යේෂණ සභාව,
අංක 120/7, විද්‍යා මාවත, කොළඹ 07.
දුරකථන : 011-2675176
ෆැක්ස් : 011-2675136
ඊමේල් : admin@nrc.gov.lk

වැවිලි අමාත්‍යාංශය

ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය

තේ පර්යේෂණ මණ්ඩලය

ඇබෑර්තු

තලවාකැලේ පිහිටි ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ පවත්නා පහත සඳහන් ඇබෑර්තු පිරවීම සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී

(වල් පැළෑටි විද්‍යාව, ආහාර විද්‍යාව, පාංශු ක්ෂුද්‍ර ජෛවවේදය විශ්ලේෂණ රසායන විද්‍යාව, ජෛවමිතිය / සංඛ්‍යාතය, කීට විද්‍යාව හා පිරිසැකසුම් තාක්ෂණය ක්ෂේත්‍රවල විශේෂඥතාවයන් සතු අයහට ප්‍රමුඛතාව හිමිවේ)

රැකියා විස්තරය

පර්යේෂණ ව්‍යාපෘති සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම, දත්ත විශ්ලේෂණය හා අංශ ප්‍රධානී (HOD), ප්‍රධාන පර්යේෂණ නිලධාරී (PRO) යන අයගේ අවම මාර්ගෝපදේශකත්වය යටතේ විශේෂඥතා විෂයයන් සම්බන්ධව දත්ත ඉදිරිපත් කිරීම සහ දත්ත එක්රැස් කිරීම හා වාර්තාගත කිරීම සඳහා තාක්ෂණ හා පරීක්ෂණ නිලධාරීන් හට මාර්ගෝපදේශ සැපයීම සම්බන්ධයෙන් වගකීම දරයි. එසේම, ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරීවරයා, HOD හා PRO නිලධාරීන්ගේ මාර්ගෝපදේශ යටතේ අංශයේ තාක්ෂණ සම්ප්‍රේෂණ වැඩසටහන් සැලසුම් කිරීමේ වගකීමද දරයි.

බාහිර

අ) යෝග්‍ය විෂය සංයුක්තභාවයකින් යුතුව, පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් වසර හතරක (04) පළමු පංතිය හෝ දෙවන පංතිය ඉහළ පෙළ විද්‍ය/ කෘෂිකර්ම හෝ ඉංජිනේරු විශේෂ උපාධියක්

හෝ

ආ) යෝග්‍ය විෂය සංයුක්තභාවයකින් යුතුව, පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් වසර හතරක (04) දෙවන පංතිය පහළ පෙළ විද්‍ය/ කෘෂිකර්ම හෝ ඉංජිනේරු විශේෂ උපාධියක් සමග අවම වසර එකක (01) අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක්,

හෝ

ඇ) යෝග්‍ය විෂය සංයුක්තභාවයකින් යුතුව, විද්‍ය/ කෘෂිකර්ම හෝ ඉංජිනේරු උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයේ වසර දෙකක (02) පශ්චාත් උපාධි පර්යේෂණ උපාධියක්,

සහ

ඈ) අදාළ ක්ෂේත්‍රයේ දර්ශන විශාරද (Ph.D) උපාධියක් සහ වසර අටක (08) පර්යේෂණ පළපුරුද්ද ඉන් වසර දෙකක් (02) ඉහත උපාධිය ලබාගැනීමෙන් පසුව විය යුතුය.

සටහන : එක් එක් විෂය ක්ෂේත්‍රයන්හි පර්යේෂණ ප්‍රකාශනයන් සිදු කොට තිබීම අමතර සුදුසුකම් වේ.

අභ්‍යන්තර :

අ) දර්ශන විශාරද උපාධියක් සමග AR1 පර්යේෂණ නිලධාරියෙකු ලෙස අවම වසර හයක (06) සතුටුදායක සේවා කාලයක්.

හෝ

වසර දෙකක (02) දර්ශනපති / විද්‍යාපති (Mphil/Msc) පර්යේෂණ උපාධියක් සමග AR1 වර්ගීකරණයේ පර්යේෂණ නිලධාරියකු ලෙස වසර අටක (08) සතුටුදායක සේවා කාලයක්.

[(සැ. යු.): ඉහත 'ආ' හෝ 'ඇ' යටතේ සුදුසුකම් ලබන අයදුම්කරුවන් SRO තනතුර සඳහා සුදුසුකම් ලැබීමට අමතර පර්යේෂණ උපාධියක් ලබා සිටිය යුතුය.]

සටහන : එක් එක් විෂයයන් සම්බන්ධව ප්‍රකාශනයන් සිදුකොට තිබීම අමතර සුදුසුකමක් වේ.

වැටුප් පරිමාණය: AR2 (2016) (I) රුපියල් 76,200-10X2,000-රුපියල් 96,200/= (මසකට)

වයස : අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. ඉහත වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන් හට අදාළ නොවේ.

තෝරා ගැනීමේ ක්‍රමවේදය : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

02. ජ්‍යෙෂ්ඨ උපදේශක නිලධාරී

රැකියා විස්තරය :

උපදේශක හා ව්‍යාප්ති ව්‍යාපෘති සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම, ප්‍රතිඵල විශ්ලේෂණය හා අංශ ප්‍රධානී (HOD) හා ප්‍රධාන උපදේශක නිලධාරී (PAO) යන අයගේ අවම මාර්ගෝපදේශකත්වය යටතේ විශේෂිත ක්ෂේත්‍ර විෂයයන් සම්බන්ධව දත්ත ඉදිරිපත් කිරීම සහ දත්ත එක්රැස් කිරීම හා වාර්තාකරණය සඳහා තාක්ෂණ හා ව්‍යාප්ති නිලධාරීන්හට මාර්ගෝපදේශ සැපයීම සඳහා වගකීම දරයි. එසේම, ජ්‍යෙෂ්ඨ උපදේශක නිලධාරීවරයා, HOD හා PAO නිලධාරීන්ගේ මාර්ගෝපදේශ යටතේ, අංශයේ තාක්ෂණ සම්ප්‍රේෂණ වැඩසටහන් සැලසුම් කිරීමේ වගකීමද දරයි.

බාහිර :

අ) යෝගය විෂය සංයුක්ත භාවයකින් යුතුව, පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් වසර හතරක (04) පළමු පංතිය හෝ දෙවන පංතිය ඉහළ පෙළ විද්‍ය/ කෘෂිකර්ම හෝ ඉංජිනේරු විශේෂ උපාධියක්.

හෝ

ආ) යෝගය විෂය සංයුක්තභාවයකින් යුතුව, පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් වසර හතරක (04) දෙවන පංතියේ පහළ පෙළ විද්‍ය/ කෘෂිකර්ම හෝ ඉංජිනේරු විශේෂ උපාධියක් සමග අවම වසර එකක (01) අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක්,

හෝ

ඇ) යෝගය විෂය සංයුක්තභාවයකින් යුතුව, විද්‍ය/ කෘෂිකර්ම හෝ ඉංජිනේරු උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයේ වසර දෙකක (02) පශ්චාත් උපාධි පර්යේෂණ උපාධියක්.

සහ

ඈ) අදාළ ක්ෂේත්‍රයේ දර්ශන විශාරද (Ph.D) උපාධියක් සහ වසර අටක (8) පර්යේෂණ පළපුරුද්ද ඉන් වසර දෙකක් (02) ඉහත උපාධිය ලබාගැනීමෙන් පසුව විය යුතුය.

සටහන : එක් එක් විෂය ක්ෂේත්‍රයන්හි පර්යේෂණ ප්‍රකාශනයක් සිදුකොට තිබීම අමතර සුදුසුකමක් වේ.

අභ්‍යන්තර

අ) දර්ශන විශාරද උපාධියක් සමග AR1 උපදේශක නිලධාරියකු ලෙස වසර හයක (06) සතුටුදායක සේවා කාලයක්

හෝ

ආ) මාස 18 ක දර්ශනපති/ විද්‍යාපති (Mphil.MSc) උපාධියක් සමග AR1 වර්ගීකරණයේ උපදේශක නිලධාරියකු ලෙස වසර අටක (08) සතුටුදායක සේවා කාලයක් (සැ. යු. ඉහත (ආ) හෝ (ඇ) යටතේ සුදුසුකම් ලබන අයදුම්කරුවකු SAO තනතුර සඳහා සුදුසුකම් ලැබීම සඳහා පර්යේෂණ තුළින් අමතර පශ්චාත් උපාධියක් ලබා තිබිය යුතුය.)

සටහන : එක් එක් විෂය ක්ෂේත්‍රයන්හි පර්යේෂණ ප්‍රකාශනයන් සිදුකොට තිබීම අමතර සුදුසුකමක් වේ.

වැටුප් පරිමාණය : AR2(2016) (I) රුපියල් 76,200-10X2,000-රුපියල් 96,200/= (මසකට)

වයස : අවුරුදු 30 ට අඩු නොවිය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. මෙම අදාළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්හට අදාළ නොවේ.

තෝරාගැනීමේ ක්‍රමවේදය : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

03. පර්යේෂණ නිලධාරී :

(ආහාර විද්‍යාව, රසායන විද්‍යාව/ ජෛව රසායන විද්‍යාව, ජෛවමිතියක් සංඛ්‍යානය, සත්ත්ව විද්‍යාව හා රසායන ඉංජිනේරු විද්‍යාව යන විෂයයන්ගෙන් විශේෂඥතාව සහිත අයහට ප්‍රමුඛතාව)

රැකියා විස්තරය

පර්යේෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ප්‍රතිඵල විශ්ලේෂණය හා ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී (SRO), ප්‍රධාන පර්යේෂණ නිලධාරී (PRO) හෝ අංශ ප්‍රධානී යන නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ විශේෂිත විෂයයන්ගෙන් දත්ත ඉදිරිපත් කිරීම සහ දත්ත එක්රැස් කිරීම හා වාර්තාගත කිරීම සඳහා තාක්ෂණ පරීක්ෂණ හා ව්‍යාප්ති නිලධාරීන්හට මාර්ගෝපදේශ සැපයීම සහ පර්යේෂණ ව්‍යාපෘති හඳුනා ගැනීම හා සැලසුම් කිරීම සඳහා SRO හා PRO නිලධාරීන්ට සහය වීම.

බාහිර : යෝග්‍ය විෂය සංයුක්ත භාවයකින් යුතුව, පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් වසර හතරක (04) පළමුවන පංතියේ හෝ දෙවන පංතියේ ඉහළ පෙළ විද්‍ය/ කෘෂි කාර්මික හෝ ඉංජිනේරු විශේෂ උපාධියක්

හෝ

යෝග්‍ය විෂය සංයුක්තභාවයකින් යුතුව, පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් වසර හතරක (04) දෙවන පංතියේ පහළ පෙළ විද්‍ය/ කෘෂිකර්ම හෝ ඉංජිනේරු විශේෂ උපාධියක් සහ අදාළ ක්ෂේත්‍රයේ අවම වසර එකක (01) පශ්චාත් උපාධියක්.

හෝ

යෝග්‍ය විෂය සංයුක්ත භාවයකින් යුතු විද්‍ය/ කෘෂිකර්ම හෝ ඉංජිනේරු උපාධියක් සහ අදාළ විෂය ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි පර්යේෂණ උපාධියක්

අභ්‍යන්තර : පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් විද්‍ය/ කෘෂිකර්ම හෝ ඉංජිනේරු උපාධියක් සමග පරීක්ෂණ නිලධාරී/ ව්‍යාප්ති නිලධාරී වශයෙන් වසර හයක (06) සතුටුදායක සේවා කාලයක්.

වැටුප් පරිමාණය :

AR1 (2016) (I) රුපියල් 53,150-10X1,375-15X1,910- රුපියල් 95,550/= (මසකට)

වයස : අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් හට මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

තෝරා ගැනීමේ ක්‍රමවේදය :

ලිඛිත තරග විභාගයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

04. පරීක්ෂණ නිලධාරී

රැකියා විස්තරය :

පර්යේෂණ නිලධාරී / ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී / ප්‍රධාන පර්යේෂණ නිලධාරී යන නිලධාරීන් යටතේ විශේෂිත වූ විෂය ක්ෂේත්‍රයන්හි සැලසුම් කිරීම හා පර්යේෂණ ක්‍රියාත්මක කිරීම හා දත්ත ඉදිරිපත් කිරීමට සහාය විය යුතුය.

බාහිර :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍ය/ කෘෂිකර්ම/ තේ තාක්ෂණය හා අගය එකතු කිරීම/ වතු කළමනාකරණය ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක්.

අභ්‍යන්තර : (පහත 1 හෝ 2)

1. ඉහත බාහිර අයදුම්කරුවන් වෙතින් අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.
2. තාක්ෂණ නිලධාරියකු ලෙස (පර්යේෂණ හා සංවර්ධන) කළමනාකරණ සහකාර තාක්ෂණවේද වර්ගීකරණයේ (MA 2-2) අවම වසර අටක (08) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබීම.

වැටුප් පරිමාණය :

MA4 (2016) රුපියල් 37,970-10X755-15X930-5X1,135-65,145/ (මසකට)

වයස : අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. මෙම ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන් හට අදාළ නොවේ.

තෝරාගැනීමේ ක්‍රමවේදය :

ලිඛිත තරග විභාගයක් මගින් සහ/ හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

05. ව්‍යාප්ති නිලධාරී

රැකියා විස්තරය : උපදේශක නිලධාරී / ජ්‍යෙෂ්ඨ උපදේශක නිලධාරී/ ප්‍රධාන උපදේශක නිලධාරී යන නිලධාරීන් යටතේ තේ හා සම්බන්ධ ව්‍යාප්ති/ උපදේශක කාර්යයන්ට අදාළ කටයුතු කිරීම හා අදාළ කෘෂිකර්මික හා කෘෂිකාර්මික නොවන සේවා සම්බන්ධීකරණය කිරීම.

බාහිර :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍ය/ කෘෂිකර්ම/ තේ තාක්ෂණ හා අගය එකතු කිරීම / වතු කළමනාකරණය යන විෂය ක්ෂේත්‍රයන්ගෙන් ප්‍රථම උපාධියක්.

අභ්‍යන්තර (පහළ 1 හෝ 2)

1) ඉහත බාහිර අයදුම්කරුවන් වෙතින් අවශ්‍ය කරන සුදුසුකම් ලබාතිබීම.

2) තාක්ෂණ නිලධාරියකු (පර්යේෂණ හා සංවර්ධන) ලෙස, කළමනාකරණ සහකාර තාක්ෂණවේද වර්ගීකරණයේ (MA2-2) අවම වසර අටක (08) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබීම.

වැටුප් පරිමාණය :

MA4(2016) රුපියල් 37,970-10X755-15X930-5X1,135-65,145/= (මසකට)

වයස :

අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්හට මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

තෝරා ගැනීමේ ක්‍රමවේදය:

ලිඛිත තරග විභාගයකින් සහ / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

i) නවාතැන් පහසුකම් (පූර්ණ ගෘහ භාණ්ඩ සහිත නිල නිවාස/ නේවාසිකාගාර කාමර) පවතී නම් ලබාදෙනු ඇති අතර, නැතහොත් ඒ වෙනුවෙන් දීමනාවක් ගෙවනු ලැබේ.

ii) ආයතනයේ වෛද්‍ය යෝජනා ක්‍රමයෙහි පවත්නා නියමයන් ප්‍රකාරව වෛද්‍ය ප්‍රතිලාභ හිමිය.

iii) ආයතනයේ මාර්ගෝපදේශ ප්‍රකාරව හදිසි වෛද්‍ය ප්‍රතිකාර සඳහා නොමිලයේ ප්‍රවාහන පහසුකම් ලබාදේ.

iv) සෑම සති අන්තයකම තලවාකැලේ ශාන්ත කුම්බිස් සිට කොළඹට හා මහනුවරට ප්‍රවාහන පහසුකම් සැපයේ.

v) අර්ථසාධක අරමුදල : තෝරාගත් අයදුම්කරු විසින්, තම වැටුපෙන් 10% ප්‍රමාණයකින් කාර්ය මණ්ඩල අර්ථසාධක අරමුදලට දායක විය යුතු අතර, ආයතනය විසින්, 15% ප්‍රමාණයකින් ඒ සඳහා දායකත්වයක් දරනු ලබයි. තවද, ආයතනය විසින්, සේවක භාර අරමුදලටද 3% ප්‍රමාණයකින් දායකත්වයක් දරනු ලබයි.

vi) තේ පර්යේෂණ ආයතනයේ සේවකයන්හට හිමි අනෙකුත් ආන්තික ප්‍රතිලාභද ගෙවනු ලැබේ.

මෙම තනතුරු ස්ථිරය. සම්පූර්ණ ජීවදත්ත සහිත අයදුම්පත් උප්පැන්න සහතිකයේ පිටපතක්, අදාළ අධ්‍යාපනික හා අනෙකුත් වෘත්තිය සුදුසුකම්වල සහතික හා සේවා සහතිකවල පිටපත් සහ අයදුම්කරුගේ නිපුණතා හා අදාළ ක්ෂේත්‍රයේ දැනුම තක්සේරු කොට බැලීම සඳහා ඥාති නොවන තිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සමග ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් අය වෙත 2021 අප්‍රේල් 12 දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය.

රාජ්‍ය සේවයේ / සංස්ථාවල/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල නිලධාරීන් තමන්ගේ අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් යොමු කළ යුතුවේ. මෙම අවශ්‍යතාවයට අනුකූල නොවන අයුරින් එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප වීමට අවකාශ ඇත. එසේම අදාළ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම්කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

තොරතුරු සඳහා, කරුණාකර, තේ පර්යේෂණ ආයතනයේ වෙබ් අඩවිය වන www.tri.lk වෙත යොමු වන්න.

අධ්‍යක්ෂ,

ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය,

ශාන්ත කුම්බිස්, තලවාකැලේ.

බත්තරමුල්ල කොස්වත්තේ පිහිටි ආයතනයක් සඳහා

- කාර්යාලීය වැඩ සඳහා ගැ
- ගබඩා පාලන අවු. 35 - 45 ගැ
- රියදුරු බරවාහන
- අ. මැෂින් ඔපරේටර් ගැ/පි
- අත් උදව්කරුවන් ගැ/පි

0777365134 / 0115678794

වාත්තිය තාක්ෂණ විශ්වවිද්‍යාලය

අයදුම්පත් කැඳවීම

යාපනය විශ්වවිද්‍යාල විද්‍යායතනයේ අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිළධාරී

තනතුර සඳහා අයදුම්පත් කැඳවා ඇති අතර අදාළ පුවත්පත් දැන්වීම **2021 මාර්තු මස 28 වන දින** Sunday Observer පුවත්පතේ පළ කර ඇත.

වැඩිදුර තොරතුරු සඳහා විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියට පිවිසෙන්න.

www.univotec.ac.lk

උපකුලපති
වාත්තිය තාක්ෂණ විශ්වවිද්‍යාලය
නො.100, කඳවල
රත්මලාන.

දුරකතන : 011-2630706
2021 මාර්තු 28

1950 සිට දිනපතා සහ සතිපතා පත්‍රවල පළවූ හා පළනොවූ ඡායාරූපවල දළ සේයාපට පුස්තකාලයේ තැන්පත් කර ඇත. ඔබටත් ඡායාරූප ලබාගැනීමට අවශ්‍ය නම් පුවත්පතේ නම, දිනය සහ ඡායාරූපයේ විස්තර සඳහන් කොට ලියා හෝ පැමිණ විමසන්න.

පුස්තකාලයාධිපති
දුරකථන
(011) 2 242 9491

LAKE HOUSE

ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනය
තේ පර්යේෂණ මණ්ඩලය
වැවිලි අමාත්‍යාංශය

වතු වෛද්‍ය වෘත්තික තනතුර
ශා. කුම්බිස් වත්ත, තලවාකැලේ.

ඉහත සඳහන් තනතුර සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

රැකියා විස්තරය :

වතු අධිකාරිවරයාගේ මග පෙන්වීම යටතේ, එදිනෙදා සේවක වෛද්‍ය අවශ්‍යතාවන්හි නිරත වෙමින් සෞඛ්‍ය සම්පන්න ශ්‍රම බලකායක් පවත්වාගෙන යාම,

එසේම, අදාළ සියලු ලිපිලේඛන පවත්වාගෙන යමින්, සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සමග සෞඛ්‍යසේවා සඳහා සම්බන්ධීකරණය කිරීමට හැකිවිය යුතුය.

සේවා සම්බන්ධීකරණය කිරීම.

අධ්‍යාපන සුදුසුකම් :

අ.පොස. (ස/පෙළ) විභාගය ඉංග්‍රීසි සහ ගණිතය අංක ගණිතය සහිතව සමත්ව සිටීම (වෘත්තියේ පළපුරුද්ද සහිත අයට මෙය අදාළ නොවේ.)

සහ

ලංකා වෛද්‍ය විද්‍යාල සභාවේ ලියාපදිංචි සාමාජිකත්වය,

පළපුරුද්ද:

කනිෂ්ඨ වතු වෛද්‍ය සහකාරවරයකු (JEMA) ලෙස වසර 4 ක පළපුරුද්ද.

වැටුප් පරිමාණය

රු. 32,320/- 1,350X40-රු. 86,320/-

වාර්ෂික වැටුප් වර්ධකය - රු. 1,350/-

වයස් සීමාව :

අවුරුදු 22 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 45 ට වැඩි නොවිය යුතුය.

මෙම තනතුර ස්ථිරය, තෝරාගනු ලබන අයදුම්කරු සේවා අවශ්‍යතාව මත තලවාකැලේ ශාන්ත කුම්බිස් වත්තේ හෝ ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනය මගින් කළමණාකරනය කරනු ලබන වෙනත් වත්තක සේවය කළ යුතුවේ.

සම්පූර්ණ ජීව දත්ත ඇතුලත් අයදුම්පත් උප්පැන්න සහතිකයේ පිටපතක්, අදාළ අධ්‍යාපනික හා වෙනත් වෘත්තිය සුදුසුකම්, සේවා සහතිකවල පිටපත් සහ අයදුම්කරුගේ නිපුණතා හා අදාළ ක්ෂේත්‍රයේ දැනුම තීර්දේශකයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන්ද සමග **2021 අප්‍රේල් 12 දින හෝ ඊට පෙර** ලැබෙන සේ පහත අත්සන් කරන අය වෙත ලියාපදිංචි තැපෑලෙන් ලැබෙන්නට සැලැස්විය යුතුය.

රාජ්‍ය සේවා/ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. මෙම අවශ්‍යතාවය හා අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතුවේ. අයදුම්පත් බහාලන කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුවේ.

තොරතුරු සඳහා අපගේ වෙබ් අඩවිය වන www.tri.lk වෙත යොමුවන්න

අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනය,
ශාන්ත කුම්බිස්, තලවාකැලේ.

කැලණිය විශ්වවිද්‍යාලය- ශ්‍රී ලංකාව

පුරප්පාඩු

පහත සඳහන් තනතුරු සඳහා අයදුම්පත් 2021.04.20 වෙනි දින දක්වා මා විසින් භාරගනු ලැබේ

වෛද්‍ය පීඨය

1. **ශල්‍ය වෛද්‍ය අධ්‍යයන අංශය**
   කථිකාචාර්ය (ආධුනික) / කථිකාචාර්ය (සේවය නහවුරු නොකල)/ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II/I
2. **පවුල් වෛද්‍ය අධ්‍යයන අංශය**
   කථිකාචාර්ය (ආධුනික) / කථිකාචාර්ය (සේවය නහවුරු නොකල)/ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II/I

අයදුම්කරන පිළිවෙළ

මෙම තනතුරු සඳහා අදාළ අයදුම්පත් හා විස්තර කාර්යාල වේලාවන් තුළදී නියෝජ්‍ය ලේඛකාධිකාරී / ආයතන අධ්‍යයන වෙතින් ලබාගත හැක. එසේම අන්තර්ජාලයේ **www.kln.ac.lk** විශ්වවිද්‍යාල වෙබ් අඩවියට පිවිස අදාළ අයදුම්පත සහ තොරතුරු ලබාගත හැකිය. අයදුම්පත් හා විස්තර තැපෑලෙන් ලබාගැනීමට අවශ්‍ය නම් ඒ සඳහා ඉල්ලීමක් සහිතව ලිපිනය ලියූ මුද්දර සහිත සෙ. මී. 23X10 ප්‍රමාණයේ කවරයක් එවිය යුතුය.

අයදුම්කරුවන් විසින් එක් එක් තනතුරු සඳහා වෙන වෙනම අයදුම්පත් යොමුකළ යුතු අතර, අයදුම්පත් අදාළ සහතික පිටපත් සමග 2021.04.20 දින හෝ ඊට ප්‍රථම **නියෝජ්‍ය ලේඛකාධිකාරී / ආයතන අධ්‍යයන, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම්පස උඩ කෙළවරෙහි ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. අසම්පූර්ණ, අපැහැදිලි හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනවල අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුවේ. අවශ්‍ය නම් යෝග්‍යතාවයට අනුව තෝරාගත් අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට විශ්වවිද්‍යාලයට කටයුතු කළ හැකිය.

ලේඛකාධිකාරී,
කැලණිය විශ්වවිද්‍යාලය,
කැලණිය.

2021.03.25

සිළුමිණ JOBS
රැකියා අතිරේකය

ඇබෑර්තු

ගම්පහ ප්‍රදේශයේ පිහිටි ප්‍රධාන පෙළේ කම්බි නිෂ්පාදන සමාගමක පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ලත් පුද්ගලයින් දැන් බඳවාගැනේ.

PVC කොටින් (කම්බි) යන්ත්‍ර ක්‍රියාකරුවන්

PVC කොටින් (කම්බි) කිරීමේ යන්ත්‍ර පිළිබඳ දැනුම ඇති හා අවම අවුරුදු 3ක පළපුරුද්ද ඇති අය ඉහත තනතුර සඳහා ඉල්ලුම්කර හැක.

කම්කරුවන්

වයස අවුරුදු 20 - 40ත් අතර අයදුම්කරුවන්

වැටුප් හා අනෙකුත් දීමනා සාකච්ඡා කර ගත හැක, නවාතැන් හා ආහාර පාන සපයනු ලැබේ.

ඉහත සඳහන් කර ඇති සුදුසුකම් සහිත පුද්ගලයින් පහත ලබා දී ඇති ජංගම දුරකතනයට ඇමතුමක් ලබා දී ඔබගේ විස්තර ලබා දෙන්න.

ජංගම - 077-0406761

තාක්ෂණික හා දැවමය යන්ත්‍ර ක්‍රියාකරු
Technical & Wooden Machine Operator

සුදුසුකම්

- ❒ වයස අවුරුදු 50 ට නොඅඩු විය යුතුය.
- ❒ අවම වශයෙන් වසර 5 ක අත්දැකීම් සහිත පළපුරුද්ද
- ❒ යන්ත්‍රෝපකරණ හා උපකරණවල අමතර උපාංග හඳුනා ගැනීම සහ අවශ්‍යතාව මත උපාංග ඇණවුමට ඇති මනා දැනුම.
- ❒ වැඩ බිමේදී උපකරණ නඩත්තු කිරීමේ හැකියාව.
- ❒ නඩත්තු සැලසුම් ක්‍රියාත්මක කිරීම සහ ඒවායේ ප්‍රගතිය ඇගයීමට හැකිවීම.
- ❒ ශාරීරික යෝග්‍ය විය යුතු වේ.
- ❒ තාක්ෂණික දෝෂ හඳුනාගෙන නිරාකරණය කිරීමට හැකි විය යුතුය.
- ❒ සියලුම යන්ත්‍ර හා උපකරණ ආරක්ෂිතව හා නිවැරදි පාරිභෝගිකයන්ට පුහුණු කිරීමේ හැකියාව තිබිය යුතුය.
- ❒ රට පුරා විවිධ ස්ථානවලට ගමන් කිරීමට හැකියාව තිබීම අමතර සුදුසුකමකි.

මොරටුව හා පිළියන්දල අවටින් විශේෂයි

විමසීම් : 0777127057 / 0112656560/ 61

විද්‍යුත් තැපෑල : hr@puwakarambaent.com

පුවක්අරඹ එන්ටර්ප්‍රයිසස් (පුද්) සමාගම

කොළඹ ඉදිකිරීම් වැඩබිම් පුරප්පාඩු
කාර්මික නිලධාරී

NDT (සිවිල්) සමග ගොඩනැගිලි පිළිබඳ
වසර 7 ක පළපුරුද්ද හෝ සමාන සුදුසුකම්
සම්මුඛ පරීක්ෂණ

0779157444/ 0770418987

VACANCY

We are looking for energetic, self-motivated individuals to fill the below vacancies immediately. Our office is located in Rajagiriya.

SALES REPRESENTATIVES

(Colombo, Gampaha, Kadawatha, Ampara, Batticaloa, Jaffna)

- Experience in field sales of motor spares, hardware & electrical items will be an advantage.
- Must have own motor bike.

Monthly income **Rs. 55,000/- to 65,000/-**

070-6523416 / 070-6988871

Please apply within 07 days

E-mail: careers @somapalaco.com

පත්‍රය බාරේ පළවන දැන්වීම් සඳහා එවන පිළිතුරු සාමාන්‍ය තැපෑලෙන් එවිය යුතුයි

ලියාපදිංචි තැපෑලෙන් එවන ලියුම් බාරගනු නොලැබේ

සත වෙත සිරිසෙත සලසන සතිපත

දෝ සතර
වෙද සතර
දත් නොදත්
කාටත්
මහඟු මිණකි

සුබසෙත
සත වෙත සිරිසෙත සලසන සතිපත



21 වැනි
සියවසට
එළඹෙන
යෞවනයට
නිරවුල් ගමන් මග

බුදුසරණ

1950 සිට දිනපතා සහ සතිපතා පත්‍රවල පළවූ හා පළනොවූ ඡායාරූපවල දළ සේයාපට පුස්තකාලයේ තැන්පත් කර ඇත. ඔබටත් ඡායාරූප ලබාගැනීමට අවශ්‍ය නම් පුවත්පතේ නම, දිනය සහ ඡායාරූපයේ විස්තර සඳහන් කොට ලියා හෝ පැමිණ විමසන්න.

පුස්තකාලයාධිපති
දුරකථන
(011) 2 242 9491

LAKE HOUSE

දැන්වීමයි!

රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ

ප්‍රමාණ සමීක්ෂක III ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම

1.0 රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ප්‍රමාණ සමීක්ෂක III ශ්‍රේණියේ තනතුරුවල පවතින පුරප්පාඩු 01 ක් සඳහා නිලධරයන් බඳවා ගැනීමට රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ප්‍රකාරව අයදුම්පත් කැඳවනු ලැබේ.

2.0 යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන් පවතින පුරප්පාඩු සඳහා පත් කරනු ඇත.

3.0. මෙම පත්වීම ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය, තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට නිලධාරීන් යටත් විය යුතු වේ.

4.0 අවශ්‍ය සුදුසුකම්

(අ) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුයි.

(ආ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතුයි.

(රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන අය සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ)

(ඇ) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(ඈ) සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් මනා කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(ඉ) අධ්‍යාපන සුදුසුකම්:

(i) සිංහල / දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරකදී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම හෝ ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) තුන (03) මට්ටමේ කුසලතාවයක් ලබා තිබීම

හා

(ii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී විද්‍යා/ ගණිත විෂය ධාරාවෙන් සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තෘතීයික අධ්‍යාපන පාඨමාලාවක් හැදෑරීම සඳහා අවශ්‍ය සාධන මට්ටමට ලබා තිබීම. (පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් 03 කින් එකවර සමත්ව තිබීම ප්‍රමාණවත් වේ) හෝ ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) හතර (04) මට්ටමේ කුසලතාවයක් ලබා තිබීම.

(ඊ) වෘත්තීය සුදුසුකම්

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක තාක්ෂණ ක්ෂේත්‍රයේ (ප්‍රමාණ සමීක්ෂක) ජාතික වෘත්තීය කුසලතා (NVQ) හය (06) මට්ටමේ කුසලතාවයක් ලබා තිබීම.

(උ) වෘත්තීය සුදුසුකම් :

ප්‍රමාණ සමීක්ෂක ක්ෂේත්‍රයේ වසරක පළපුරුද්ද

(ඌ) සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවන දිනයේ හෝ ඊට පෙර

හෝ

සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

5.0 වැටුප් පරිමාණය : රු. 30,140-10X350-11X370-10X560-10X660-49,910/= (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව MT2-2016 වැටුප් කේතය අදළ වේ)

6.0 මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

2021 මාර්තු මස .... දින

....
(දෙපාර්තමේන්තු ප්‍රධානී)

ඒ සඳහා වන අයදුම්පත හා අදළ කොන්දේසි රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ www.pubad.gov.lk වෙබ් අඩවියේ පළ කරනු ලබන අතර, එය සම්පූර්ණ කර 2021.04.10 දින හෝ ඊට පෙර රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය, නිදහස් චතුරශ්‍රය, කොළඹ 07 යන ලිපිනය වෙත යොමු කළ යුතුය.

දැන්වීමයි !

රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ

තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී / සැලසුම් ශිල්පී III ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම

1.0 රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ පුරප්පාඩුව පවතින කාර්මික නිලධාරී තනතුරු 03 ක් සහ සැලසුම් ශිල්පී තනතුරු 01 ක් සඳහා නිලධරයන් බඳවා ගැනීමට රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ප්‍රකාරව අයදුම්පත් කැඳවනු ලැබේ.

2.0 ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙතින් පවත්වනු ලබන ලිඛිත තරග විභාගයක හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන් පවතින පුරප්පාඩු සඳහා පත් කරනු ඇත.

3.0 මෙම පත්වීම ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය, තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට නිලධාරීන් යටත් විය යුතු වේ.

4.0 **අවශ්‍ය සුදුසුකම්**

(අ) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුයි.

(ආ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතුයි.

(ඇ) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(ඈ) සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් මනා කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(ඊ) **අධ්‍යාපන සුදුසුකම් :**

(I) විද්‍යා / ගණිත / තාක්ෂණවේදය විෂය ධාරාවට අයත් භෞතික විද්‍යාව, සංයුක්ත ගණිතය, රසායන විද්‍යාව, තාක්ෂණවේදය සඳහා විද්‍යාව, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය හා ඉංජිනේරු තාක්ෂණවේදය යන විෂයයන් අතරින් විෂයයන් දෙකක් සහිතව විෂයයන් තුනකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ.පෙළ) විභාගය එකවර සමත්වීම හෝ ක්ෂේත්‍රයට අදළව ජාතික වෘත්තීය සුදුසුකම් 4 (NVQ 4) සම්පූර්ණ කර තිබීම

හා

(II) සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගය සමත්වීම හෝ ක්ෂේත්‍රයට අදළව ජාතික වෘත්තීය සුදුසුකම් 3 (NVQ 3) සම්පූර්ණ කර තිබීම.

(ඊ) **වෘත්තීය සුදුසුකම් :**

(I) මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (සිවිල්) හෝ

(II) ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව (සිවිල්) හෝ

(III) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව (සිවිල්) හෝ

(IV) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව (සිවිල්) හෝ

(V) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ I වන කොටස සාර්ථක ලෙස සම්පූර්ණ කිරීම හෝ

(VI) රැකියා ක්ෂේත්‍රයට අදළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම

හෝ

(VII) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණික සහතික නිකුත් කරන ආයතන වලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම් වලට සියලු අතින් සමානයැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

(උ) යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

(ඌ) සෑම අයදුම්කරුවකුම තනතුරට අදළ සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවන දිනයේ හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

5.0 **වැටුප් පරිමාණය :** රු. **31,040/- 10 x 445 - 11 x 660 - 10 x 730 - 10 x 750 - 57,550/-**
(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව MN 3 - 2016 වැටුප් කේතය අදළ වේ)

6.0 **විභාග පරිපාටිය**

මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පැවැත්වේ. අයදුම්කරුවකු තමාට අදළ එක් මාධ්‍යයක් තෝරාගත යුතු අතර, විභාගයට නියමිත සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා එම මාධ්‍යයෙන්ම පිළිතුරු සැපයිය යුතුය. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්ත වේ.

ප්‍රශ්න පත්‍රය / විෂය ක්ෂේත්‍රය	කාලය	මුළු ලකුණු	සමත් ලකුණු
බුද්ධි පරීක්ෂණය	පැය 01	100	40%
විෂයානුබද්ධ තාක්ෂණ ප්‍රශ්න පත්‍රය	පැය 03	100	40%

ප්‍රශ්න පත්‍රයේ නම	විෂය නිර්දේශය
බුද්ධි පරීක්ෂණය	අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත්, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්වයත් තීරණය කිරීමේ ශක්තියත්, විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්න වලින් යුක්තය.
විෂයානුබද්ධ තාක්ෂණ ප්‍රශ්න පත්‍රය	ගොඩනැගිලි ඉදිකිරීමේ මූලධර්ම, ඉදිකිරීම් කාර්යය සඳහා පිඹුරුපත් සකස් කිරීම හා කියවා වටහා ගැනීමේ හැකියාව, ඇස්තමේන්තු පිළියෙල කිරීමේ හැකියාව, ජල සැපයීම, ජල ප්‍රවාහන ක්‍රියාමාර්ග හා අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රියා පිළිවෙල පිළිබඳව අපේක්ෂකයා සතු අත්පත් කර ගත යුතු හැකියාවන් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්න වලින් යුක්ත වේ.

7.0 මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

....
(දෙපාර්තමේන්තු ප්‍රධානී)

2021 මාර්තු මස .... දින

ඒ සඳහා වන අයදුම්පත හා අදළ කොන්දේසි රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ www.pubad.gov.lk වෙබ් අඩවියේ පළ කරනු ලබන අතර එය සම්පූර්ණ කර 2021.04.10 දින හෝ ඊට පෙර රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය, නිදහස් චතුරස්‍රය, කොළඹ 07 යන ලිපිනය වෙත යොමු කළ යුතුය.

කිතුල් දැවයෙන් කළ නිර්මාණ

කිතුලේ වරුණා

'කිතුල් ගසෙන් ලබා ගන්නා 'තෙලිජ්ජ' වලින් හකුරු-පැණිත්, කිතුල් පිටි, අයිස් ක්‍රීම්, සීනි, සිරප් සහ කිතුල් දැව භාණ්ඩත් දැනට නිපදවනවා. මෙහි ඇති ඖෂධීය ගුණ අතර දියවැඩියාව පාලනය සහ පිටුදැකීම, අධික රුධිර පීඩනය, කොලස්ට්‍රෝල් පාලනය කිරීම සහ සීනි වෙනුවට ආදේශ කිරීම ප්‍රධානයි

● **නිමල් විජයතුංග,** ඇහැලියගොඩ විශේෂ.

සිරිලක 'කප්රුක' ලෙස සැලකෙනුයේ පොල් ගසය. ඒ එසේ නම් අපේ දෙවැනි කප්රුක ලෙස කිතුල් ගස හැඳින්වීම හැම අතින් ම යුක්ති යුක්ත ය. එයට හේතු ලෙස සඳහන් කළ යුතුව ඇත්තේ කිතුල් මලෙන් පැණිත්, කිතුල් කඳෙන් පිටිත් ලබා ගන්නා අතර යකඩ වලට නොදෙවෙනි කිතුල් ලීයෙන් විවිධාකාර සවිමත්-ස්වයං දිළිසීමක් ඇති ගෘහ භාණ්ඩ රැසක් ද, ජල පිහිලි, මෝල් ගස් , ජනෙල් ග්‍රිල් පොලු ඇතුළු යකඩ මෙන් කල් පවතින භාණ්ඩ රැසක් ද නිපදවිය හැකි නිසා මේ ගස එක්තරා විදියක කප්රුකක්ම බවය.

තාල වර්ගයට අයත් ගසක් වන කිතුල් ඉතා හොඳින් වැවෙනුයේ තෙත් කලාපයේ සහ අර්ධ තෙත් කලාපයේ ය. මුහුදු මට්ටමේ සිට අඩි 1000 සිට 6000 දක්වා උස් බිම්වල වැවෙන මෙම අගනා වෘක්ෂය ආශ්‍රිත විවිධ කර්මාන්ත මෙරටෙහි ක්‍රියාත්මක වනුයේ ඉතා ඈත අතීතයේ සිට ය. වර්තමානයේදී තාක්ෂණික දියුණුවත් සමඟ විවිධ යන්ත්‍ර සූත්‍ර භාවිතයෙන් වඩ වඩාත් කලාත්මක කිතුල් දැව නිර්මාණ බිහිවන වාතාවරණයක් මේ වනවිට නිර්මාණයවී ඇති සෙයකි.

කිතුල් ගස ආශ්‍රිත කර්මාන්තවල නියැළී සිටින ආයතන අතර ජාතික මට්ටමේ පවා සම්මාන සහතික ලබා ඇති- කිතුලෙන් ගතහැකි උපරිම ප්‍රයෝජනය ඉතා ක්‍රමවත් ලෙය උකහා ගනිමින් වෙසෙසින්ම ගම්බද පළාත්වල විශාල පිරිසකට රැකියා අවස්ථා උදාකැරදී ඇති- තව දුරටත් මේ ක්ෂේත්‍රයට පිවිසෙන්නට තරුණ තරුණියනට අත හිත දෙන- සබරගමු පළාතේ පිහිටි කිතුල් නිෂ්පාදන ප්‍රවර්ධන ආයතනයක් ලෙස ඇහැලියගොඩ බදුවත්තේ 'අරලිය උයනෙහි' දී 2001 වසරෙහිදී ආරම්භ කර මේ වනවිට විශාල ප්‍රදේශයක් ආවරණය කැර ඇති "ලංකා ඊකෝ ප්‍රොඩක්ට්ස් " ආයතනය හඳුන්වා දිය හැකිය.

වස විස නැති "මිහිරස" පාරිසරික නිෂ්පාදන යන නමින් වෙළඳ පොළට එන කිතුල් පැණි, කිතුල් හකුරු, කිතුල් පිටි මෙන්ම කිතුල් දැව ආශ්‍රිතව නිර්මාණය කැරෙන ගෘහ භාණ්ඩ විශාල සංඛ්‍යාවක් මෙම ආයතනයේ අධීක්ෂණය මත නිපදවනු ලැබේ.

මෝල්ගස්, දොරපොලු, ටීපෝ, ස්ටූල්, පිඟන්, කෝප්ප, හැඳි, විවිධ බඳුන්, බිත්ති සැරසිලි, කිටැග් වැනි දෑ මෙසේ නිපදවනු ලබන භාණ්ඩ අතර වෙයි. මෙම වෙළෙඳ ජාලයේ නිර්මාතෘ මෙන්ම කළමනාකාර අධ්‍යක්ෂවරයා ද වන ප්‍රියන්ත කුමාර මේ සඳහා පෙලඹී ඇත්තේ මනා අධ්‍යයනයකින් පසුව බැව් අප කළ විමසුමකදී සඳහන් කළේය. " කිතුල් ගසේ අගය වඩාත් වැඩි දියුණු කිරීම, ඒ ආශ්‍රිත නිෂ්පාදන ක්‍රියාවලිය යාවත්කාලීන කර අඩු ආදායම් ලාභී පවුල්වල කාන්තා සහ තරුණ කොටස් වල ජීවනෝපාය නගා සිටුවීම අපේ මූලික අභිප්‍රායයි" හෙතෙම සඳහන් කළේය.

එල්. කේ . ප්‍රියන්ත කුමාර

අපි කිතුල් මදින්නන් කණ්ඩායම් වශයෙන් වරින් වර ආයතනයට කැඳවා උපදෙස් - පුහුණුවීම් ලබා දී කිතුල් පැළ සහ වටිනා ආරක්ෂක උපකරණ කට්ටලය බැගින් පරිත්‍යාග කරනවා. ඒ ඒ පළාත්වල කිතුල් මදින්නන්ගේ සමිති වලට රිළවුන්ගෙන් කිතුල් මල් ආරක්ෂා කර ගැනීම සඳහා රුපියල් 25.000 ක් පමණ වටිනා 'එයාර් රයිපලය' බැගින් නොමිලයේ ලබා දීමේ වැඩසටහනක් ද අරඹා තිබෙනවා යැයි ද, ඉදිරි අනාගතයේදී කිතුල් පැළ ලක්ෂයක් සිටුවීමටත්, පුහුණු සහ නිෂ්පාදන මධ්‍යස්ථානයක් පිහිටුවීමටත් සැලසුම් කැර ඇතැයි ද ඔහු කීය.

'කිතුල් ගසෙන් ලබා ගැණෙන 'තෙලිජ්ජ' වලින් හකුරු-පැණිත්, කිතුල් පිටි, අයිස් ක්‍රීම්, සීනි, සිරප් සහ කිතුල් දැව භාණ්ඩත් දැනට නිපදවනවා. මෙහි ඇති ඖෂධීය ගුණ අතර දියවැඩියාව පාලනය සහ පිටුදැකීම, අධික රුධිර පීඩනය, කොලස්ට්‍රෝල් පාලනය කිරීම සහ සීනි වෙනුවට ආදේශ කිරීම ප්‍රධානයි.

'මේ මඟින් පාරිසරික සමතුලිතතාව රැක ගැනීම , ජල උල්පත් ආරක්ෂා කිරීම මෙන්ම පස සේදී යාම ද අවම කළ හැකිය.'ලංකා ඊකෝ ප්‍රොඩක්ට්ස්' ආයතනය මඟින් මේ වනවිට දිස්ත්‍රික්ක අටක කිතුල් නිෂ්පාදන ක්‍රියාවලිය ආවරණය කෙරේ.

සමස්ත දිවයිනේ සිදු කරන ලද සමීක්ෂණ වලට අනුව කිතුල් ගස් ලක්ෂ 30 ක් පමණ ඇති අතර එයින් මැදීම සිදු කැරෙනුයේ ගස් ලක්ෂ 5 ක පමණි. මුළු දිවයිනේම කිතුල් මදින්නන් 25.000ක් පමණ සිටින අතර මෙම ආයතනයට නිෂ්පාදන සපයන සංඛ්‍යාව 5.000 කි. දළ වශයෙන් එක් මදින්නෙකුගේ මාසික ආදායම රුපියල් 40.000 ක් පමණ වෙයි. පැණි බෝතලයක් නිපදවීම සඳහා 'තෙලිජ්ජ' බෝතල් 5 ක් ද, හකුරු කිලෝවක් නිපදවීමට 'තෙලිජ්ජ' බෝතල් 9 ක් පමණද ඇවැසි වෙයි.

ඉතා මෑතකදී 'මිහිරස' නිෂ්පාදන අලෙවි කිරීම සඳහා " කිතුල" යන නමින් ගැම්රස හලක් ඇහැලියගොඩ නගරයේදී විවෘත කැර ඇත. තම ආයතනය මඟින් කිතුල් නිෂ්පාදන 'මිහිරස ඊකෝ ප්‍රොඩක්ට්ස්' යන නමින් දේශීය වෙළඳ පොළට ද, 'ලංකා පියෝ කිතුල්' යන නමින් එතෙර වෙළඳ පොළට ද යවන බව කුමාර පවසයි. දැනට කිතුල් නිෂ්පාදන අපනයනය කෙරෙනුයේ ජපානය ඇතුළු රටවල් පහකට පමණක් වන නමුදු තවත් රටවල් වලට තම නිෂ්පාදන අලෙවි කර වැඩි වැඩියෙන් ශ්‍රී ලංකාවට විදේශ විනිමය උපයා දීමට ඉදිරියේදී පියවර ගනු ලබන බව ද ඔහු පැවසීය.

ඉතා මෑතකදී නිදහසේ කිතුලක් මැද ගැනීමට රජයෙන් සලසා ඇති සහනය කුමාර බෙහෙවින් ම අගය කළේය.

මෙම කිතුල් කර්මාන්තය නගා සිටුවීමෙහිලා ආයතන කිහිපයක අනුග්‍රහය ලැබෙන බවත්, මහවැලි හා කුඩා කර්මාන්ත අමාත්‍යාංශයේ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩ සටහන, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ කෘෂිකර්ම අගයදාන නවීකරණ ව්‍යාපෘතිය, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහනේ ජගත් පරිසර පහසුකම් වැඩ සටහන හා IOCN ආයතනයද ඒ අතර ප්‍රධාන වේ.

දේශීය බීජ ප්‍රවර්ධනයට විධිමත් නව දැක්මක්

● **ලලිත් චාමින්ද** - ගාල්ල

එළවළු බීජ පැළ වෙන්නේ නැහැ, මිල අහස උසට නැගලා, අස්වැන්න මදි, රෝග හා පළිබෝධ වලට ඔරොත්තු දෙන්නේ නැහැ, කලට වේලාවට එළවළු බීජ ලැබෙන්නේ නැහැ'

එළවළු බීජ සම්බන්ධයෙන් මේ ගොවින්ගෙන් එල්ල වන චෝදනාය. ඒ විතරක් නොව ඇතැම් එළවළු බීජවල ගුණාත්මකභාවය හා මිල පිළිබඳවද ගැටලු මතුවී තිබේ. විවිධ මිල ගණන් යටතේ එළවළු බීජ අලෙවි කරති. ඇතැම් එළවළු බීජ සඳහා වැයවන වියදම ගොවීන්ට දරාගැනීමට නොහැකිය. මෙවැනි අවස්ථාවලදී ගොවීන් දැඩි අසරණ තත්ත්වයට පත්වෙති.

ඒ කොයිහැටි වුවද රජය වාර්ෂිකව විශාල මුදලක් දේශීය බීජ කර්මාන්තයේ ප්‍රවර්ධනය වෙනුවෙන් ලබා දෙති. එහෙත් අපේ රටේ දේශීය එළවළු ගොවීන්ගෙන් 70% පමණ ආනයනික දෙමුහුන් එළවළු බීජ පිළිබඳ විශ්වාසය තබා කටයුතු කරති. මේ බව සඳහන් වන්නේ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ ආයතනය මගින් 2018 වර්ෂයේ දී පළ කරනු ලැබූ පර්යේෂණ වාර්තාවකය. අපේ රටේ ගොවීන් බහුතරයක් ආනයනික දෙමුහුන් බීජ පිළිබඳ විශ්වාසය තැබුව ද ඇතැම් ආනයනික බීජ වල ගුණාත්මක භාවය පිළිබඳ ගැටලු පවතී.

ඉල්ලුමට සරිලන ලෙස ගොවීන් වෙත බීජ සැපයීමට අවශ්‍යතාව නිසා 1984 වර්ෂයේ දී රජය මගින් බීජ නිෂ්පාදනයට හා ආනයනයට පෞද්ගලික අංශය දායක කරගනු ලැබීය. මේ සමඟ දේශීය බීජ නිෂ්පාදනය හා ආනයනය ශීඝ්‍ර ලෙස ඉහළ ගියේය. බීජ නිෂ්පාදනයේ දී හා ආනයනයේ දී විවිධ ගැටලු මතු විය. එම ගැටලු අවම කිරීමේ අරමුණින් 2003 අංක 22 දරණ බීජ පනත සම්මත කරනු ලැබීය. ඒ අනුව ලංකාවේ බීජ සම්බන්ධව ක්‍රියාත්මක වන ප්‍රධාන බාරකාරයා වන්නේ බීජ හා රෝපණ ද්‍රව්‍ය මධ්‍යස්ථානයයි. මෙය කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ ස්ථාපිත කොට ඇත්තේය. එය පිහිටුවීමේ අරමුණ වූයේ ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය කලට වේලාවට පහසු ස්ථානවලදී සාධාරණ මිල ගණන් යටතේ ගොවීන් වෙත ලබාදීමටය. එමෙන්ම උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය මගින් දේශීය වගාව සඳහා අවශ්‍ය අභිජනන බීජ නිෂ්පාදනය කිරීම හා නව එළවළු ප්‍රභේද හඳුන්වා දීම සඳහා පර්යේෂණ සිදුකරයි.

මෙවැනි තත්ත්වයක් තුළ එළවළු බීජ දේශීය වශයෙන් නිෂ්පාදනය කිරීමේ ක්‍රියාවලියේ කාර්යසාධනය පිළිබඳ ජාතික විගණන කාර්යාලය මගින් ඇගයීමක් සිදුකරනු ලැබීය. බීජ පනතේ දක්වා ඇති කාර්යයන් ඉටුකිරීමෙහිලා ජාතික බීජ සභාව ස්ථාපිත කරනු ලැබීය. ඒ කොයිහැටිවුවද ජාතික බීජ සභාව පළමුවට රැස්වී ඇත්තේ බීජ පනත සම්මත කිරීමෙන් වසර 14කට පමණ පසුවය. එනම් 2017 නොවැම්බර් මස 29 වැනිදින පළමුවරට බීජ සභාව රැස්වී ඇත. ඉන්පසු 2019 වර්ෂයේ දෙසැම්බර් 31 වැනිදින දක්වා කාලසීමාව තුළ රැස්ව තිබුණේ අවස්ථා තුනකදි පමණි. මෙම තත්ත්වය තුළ දේශීය බීජ නිෂ්පාදනයේ ප්‍රගතිය ඇගයීම ඇතුළු අදාළ අනිකුත් ප්‍රතිපත්ති සැකසීම හා අවශ්‍ය තීරණ ගැනීමේ ක්‍රියාවලිය ක්‍රියාකාරිව සිදුවී නොතිබූ බව ද විගණනය මගින් අනාවරණය කොට ඇත.

කෙසේවුවද 2015 වර්ෂයට සාපේක්ෂව 2019 වර්ෂයේ දී ආනයනය කළ බීජ කිලෝග්‍රෑම් ප්‍රමාණය සියයට 13කින් අඩුවී තිබුණි. සැබවින්ම එය හොඳ ප්‍රවණතාවකි. එහෙත් බීජ ආනයන වියදම සියයට 55කින් වැඩි වී තිබේ. බීජ හා රෝපණ ද්‍රව්‍ය මධ්‍යස්ථානයේ එළවළු බීජ නිෂ්පාදනය හා මිලදි ගැනීම 2019 වර්ෂයේ කිලෝග්‍රෑම් 37042කි. එම වර්ෂයේ ආනයනය කරනු ලැබූ බීජ ප්‍රමාණය කිලෝග්‍රෑම් 1.98.595කි. 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා දේශීය එළවළු බීජ දේශීයව නිෂ්පාදනය කිරීම සියයට 05ක් 16ක් අතර පරාසයක පවතී. එහෙත් ගොවීන්ගෙන් සියයට 84ක් 95ක් තවමත් ආනයනික බීජ මත යැපෙති. දේශීය එළවළු බීජ වලට වඩා ආනයනික එළවළු බීජ වැඩි බව නිරීක්ෂණය වී ඇත. මේ සඳහා ගොවීන් ආනයනික බීජ සඳහා යොමුවී ඇත්තේ පාරිභෝගික අවශ්‍යතාව සැපයීමට තරම් දේශීය වශයෙන් එළවළු බීජ නිෂ්පාදනය නොවීමයි.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දත්තවලට අනුව වර්ග 11කට අයත් එළවළු බීජ ආනයනය කිරීම සඳහා බලපත්‍ර නිකුත්කොට තිබුණි. එළවළු බීජ ආනයනය කිරීම සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ දී බෝංචි සඳහා පමණක් උපරිම ආනයන සීමා පැනවීමට කටයුතු කරනු ලැබීය. 2017 වර්ෂයේ දී බෝංචි බීජ මෙට්‍රික්ටොන් 187.1ක් 2018 වර්ෂයේ දී මෙට්‍රික්ටොන් 108.6ක්, 2019 වර්ෂයේ දී මෙට්‍රික්ටොන් 163ක් ආනයනය කිරීම සඳහා අවසර ලබා දී තිබුණි. පතෝල, වට්ටක්කා, බෝංචි, පිපිඤ්ඤා, කරවිල, තක්කාලි, මාළු මිරිස්, දඹල, මෑ, බණ්ඩක්කා, මිරිස් යන එළවළු බීජ 2017,2018 හා 2019 යන වර්ෂවලදී පිළිවෙළින් මෙට්‍රික්ටොන් 464,359,459ක් වශයෙන් ආනයනය කොට තිබුණි. එමෙන්ම මෙකී වර්ෂවල එක් එක් එළවළු වර්ගයෙන් ආනයනය කළ එළවළු බීජ ප්‍රමාණය පිළිබඳ දත්ත ශ්‍රී ලංකා රේගුව හා කෘෂිකර්ම දේපාර්තමේන්තුව සතු නොවිය. මේ හේතුවෙන් බීජ නියාමන කාර්ය සතුටුදායක අන්දමින් සිදුකිරීමට බාධාවක්ව පැවතුණු බවද විගණන වාර්තාවේ සඳහන් වේ. 2019 වර්ෂයේ දී ආනයනික බීජ ප්‍රමාණය 1,193,807කි. ආනයනික වියදම රුපියල් මිලියන 6,568කි. එම වර්ෂයේ බීජ කිලෝග්‍රෑමයක සාමාන්‍ය ආනයන වියදම රුපියල් 7,507කි.

2017 හා 2018 වර්ෂවල දී වෙළඳපොළෙන් මිලදී ගත් බීජ සම්බන්ධයෙන් ගොවීන් කිහිප දෙනකු විසින් පාරිභෝගික අධිකාරියට පැමිණිලි කොට තිබුණි. එම අධිකාරිය විසින් බීජ පනතේ 14 :02* වගන්තිය අනුව බීජ සම්බන්ධ වාර්තාවක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ සහතික කිරීමේ පරීක්ෂණාගාරයකින් ලබාගනු ලැබීය. අලාභය ලෙස අක්කරයකට රුපියල් 140,792 මුදලක් තක්සේරු කොට ගොවීන්ට අදාළ මුදල ගෙවන ලෙස වගඋත්තරකාර ආයතනයට දන්වා තිබුණි. එහෙත් 2020 ජූනි මස 25 වැනිදින වනවිට වසර 02කට වඩා වැඩිකාලයක් ගතවී තිබුණද එම අලාභය අයකර දීමට පාරිභෝගික අධිකාරියට නොහැකි විය.

වෙළඳපොළ තුළ අලෙවිය සඳහා ඇති එළවළු බීජවල ගුණාත්මකභාවය සම්බන්ධයෙන් ගැටලු පවතින බව පර්යේෂණවලදි අනාවරණය වී තිබේ. බීජ සහතික කිරීමේ සේවය මගින් 2018, 2019 වර්ෂවල පිළිවෙළින් පුද්ගලික අංශයේ බීජ අලෙවි සැල් 260ක් හා 220ක් පරීක්ෂාවට ලක්කරනු ලැබීය. එමගින් වී, එළවළු, අතිරේක ආහාර බෝග හා ආනයනික බෝග සම්බන්ධයෙන් ගැටලු සහගත තත්ත්වයක් නිරීක්ෂණය කර තිබුණි. මේ වනවිට විශාල වශයෙන් එළවළු බීජ ආනයනය කරති.

දේශීය එළවළු බීජ සම්බන්ධයෙන් ඇති ගැටලුවට විසඳුම් වශයෙන් අනායනික එළවළු බීජ සමඟ තරග කළ හැකි දේශීය එළවළු බීජ හඳුන්වා දීම, සිදුකරන පර්යේෂණ ප්‍රමාණය වැඩිකිරීම, රටේ අවශ්‍යතා මත ආරක්ෂිත බීජ තොග පවත්වාගෙන යාම විගණනය මගින් නිර්දේශකොට ඇත. එමෙන්ම බීජ ගොවිපොළවල් සඳහා අවශ්‍ය පුහුණු ශ්‍රමය දිගු කාලීනව පවත්වාගෙන යාම, ජල ගැටලුවට විසඳුම් ලබාදීම, බීජ ගොවිපොළවල් සතු පහසුකම් පුළුල් කිරීම, විගණනය මගින් නිර්දේශ කොට ඇත. වත්මන් කෘෂිකර්ම ඇමති මහින්දානන්ද අලුත්ගමගේ සඳහන් කර ඇත්තේ දේශීය වශයෙන් නිෂ්පාදනය කළ හැකි බීජ දේශියව නිෂ්පාදනය කිරීමේ වැඩපිළිවෙළක් ආරම්භකොට ඇති බවය. එය සාර්ථක වුවහොත් එළවළු බීජ ආනායනය කිරීම සඳහා වැයවන විශාල මුදලක් ඉතිරි කරගැනීමට හැකිවනු ඇත.

මේජර් ජනරාල් ප්‍රියංක ප්‍රනාන්දුට නඩු ගාස්තු ගෙවන්න බ්‍රිතාන්‍ය මහාධිකරණය නියෝග කරයි

● ටිරෝනි වෑවලගේ

රාජ්‍ය තාන්ත්‍රික සබඳතා ක්ෂේත්‍රයේ ශ්‍රී ලංකාවට මුහුණ දීමට සිදුවූ තවත් ගැටලුවක් පසුගියදා බ්‍රිතාන්‍ය මහාධිකරණය විසින් ලිහා දැමීය. එම ගැටලුව වූයේ ශ්‍රී ලංකා තානාපති සේවයේ රාජ්‍ය සේවාවේ යෙදී සිටියදී සිදුවූ යම් සිදුවූමක් සම්බන්ධව (එවක) බ්‍රිගේඩියර් ප්‍රියංක ප්‍රනාන්දු මහතාට චෝදනා එල්ල වීමය.

මේ සිදුවීම සිදුවන්නේ 2018 වසරේ පෙබරවාරි 4වැනි දාය. එදින ශ්‍රී ලංකාවේ 70වැනි නිදහස උත්සවය පැවැත්වුණු අතර බ්‍රිතාන්‍යයේදීද එයට සමගාමීම එම අවස්ථාව සමරනු ලැබීය.

එම අවස්ථාවේදී ලන්ඩනයේ බ්‍රිතාන්‍ය මහකොමසාරිස් කාර්යාලය ඉදිරිපිටට රැස්වූ එල්ටීටීඊ හිතවාදී කණ්ඩායමක් ශ්‍රී ලංකාවට විරුද්ධව උද්ඝෝෂණයක් පැවැත්වූහ. එම අවස්ථාවේදී විරෝධතාකරුවන් මුවේ ප්‍රදර්ශනය කළ යම් හැසිරීමක් අරඹයා බ්‍රිගේඩියර්වරයාට නඩු පැවරීමට එම එල්ටීටීඊ හිතවාදී විරෝධතාකරුවන් කටයුතු යෙදීය. එම නඩුව විභාග කළ වෙස්ට්මිනිස්ටර් මහේස්ත්‍රාත් අධිකරණය බ්‍රිගේඩියර්වරයා වරදකරු ලෙස ප්‍රකාශ කරමින් තීන්දුවක් ලබා දුන්නේය. ඒ 2019 වසරේ දෙසැම්බර් 6 වැනිදාය.

ශ්‍රී ලංකාවේ පාර්ශ්වයෙන් බ්‍රිගෙඩියර් ප්‍රියංක ප්‍රනාන්දු මහතා මේ නඩු තීන්දුවට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කළ අතර එම අභියාචනය ඉදිරිපත් කරනු ලැබුවේ එක්සත් රාජධානියේ මහාධිකරණයටය. එම අභියාචනය විභාග කිරීම සඳහා 2021 මාර්තු 19වැනි දින අවසර හිමිවූ අතර, පසුගියදා ප්‍රකාශයට පත් කරනු ලැබුවේ එම අභියාචනයේ තීන්දුවයි.

එහිදී බ්‍රිතාන්‍ය මහාධිකරණය විත්තිකරුවන්ගේ තර්ක තරයේම ප්‍රතික්ෂේප කළ අතර මේජර් ජනරාල් ප්‍රාන්නදු මහතා වෙනුවෙන් ඉදිරිපත් කළ තර්ක පිළිගැනීමටද කටයුතු කර තිබිණි.

එහිදී මහාධිකරණයේ අවධානය යොමු වී තිබුණේ ශ්‍රී ලංකාව සහ එක්සත් රාජධානිය යන රටවල් දෙකම රාජ්‍ය පාර්ශ්වයන් වන 1961 අත්සන් තැබූ ව්‍යාජ්‍ය සම්මුතිය කෙරෙහිය.

එහිදී බ්‍රිතාන්‍ය මහාධිකරණය විසින් අවධානය යොමු කර තිබුණේ රාජ්‍ය තාන්ත්‍රික සබඳතා පිළිබඳ ව්‍යාජ්‍ය සම්මුතියේ අඩංගුවන රාජ්‍ය තාන්ත්‍රික මුක්තිය පිළිබඳ සාම්ප්‍රදායික අදහස් කෙරෙහිය.

මහාධිකරණ තීන්දුව මගින් ප්‍රකාශ කර තිබුණේ “මෙම ගිවිසුම පිළිබඳ අර්ථ නිරූපනය ‘හුදෙක් වචනාර්ථය’ පිළිබඳ අභ්‍යාසයක් නොවිය යුතු බවයි. එය කියවිය යුත්තේ එහි ‘වස්තුව හා අරමුණ’ යන සන්දර්භය තුළ සිටිමින් බව බ්‍රිතාන්‍ය මහාධිකරණයේ විනිශ්චය විය. මහාධිකරණය වැඩිදුරටත් පවසා තිබුණේ බොහෝ ගිවිසුම්වලට වඩා ව්‍යාජ්‍ය සම්මුතියේ කාර්යක්ෂමතාව රඳා පවතින්නේ එහි පරස්පර ක්‍රියාකාරීත්වය මත බවයි. රාජ්‍යයේම දූත මණ්ඩලයට අදාළ වන පරිදි එම ප්‍රතිපාදනයන්හි සීමා කිරීමක් එම රජය විසින් සිදු කරන්නේ නම් යැවුම්කාර රාජ්‍යයක රාජ්‍යතාන්ත්‍රික නියෝජිතයන් සඳහා ලබා දෙන ප්‍රතිපාදන සීමා කිරීමට ව්‍යාජ්‍ය සම්මුතියේ 47.2 වගන්තිය මඟින් ඕනෑම ලැබුම්කාර රාජ්‍යයකට බලය පැවරෙයි.

එමෙන්ම බ්‍රිතාන්‍ය මහාධිකරණය ප්‍රකාශ කර සිටියේ අසත්‍ය ප්‍රකාශ හෝ පදනම් විරහිත චෝදනා සහ අසතුටුදායක විනිශ්චය සහා පිළිබඳ අවධානම හේතුවෙන් පැන නගින රාජ්‍යතාන්ත්‍රික කටයුතුවල කාර්යක්ෂම ක්‍රියාකාරීත්වය කෙරෙහි එල්ල වන තර්ජනය පිළිබඳව තමන්ගේ අවධානය යොමු වූ බවයි.

සියලු චෝදනාවලින් නිදොස් කොට නිදහස්

එයින් අදහස් කෙරෙන්නේ එක්සත් රාජධානියේ දෘෂ්ටි කෝණයෙන් බලන කළ, බ්‍රිතාන්‍යයේ විදේශ රාජ්‍ය තාන්ත්‍රික නිලධාරීන්ගේ රාජ්‍යතාන්ත්‍රික මුක්තිය ප්‍රදානය කිරීමේ වැදගත් අරමුණ, බ්‍රිතාන්‍ය රාජ්‍යතාන්ත්‍රික නිලධාරීන් වෙනත් ස්ථානවලදී ඊට අනුරූප ලෙස මුක්තිය භුක්ති විඳීම සහතික කිරීම බවයි.

බ්‍රිතාන්‍ය මහාධිකරණය තම තීන්දුව තවදුරටත් පැහැදිලි කරමින් ප්‍රකාශයට පත් කර සිටියේ එක්සත් රාජධානියේ විදේශ තානාපති කාර්ය මණ්ඩලවලට ලබා දී ඇති සමාන රැකවරණය වෙනුවෙන් එක්සත් රාජධානියේ සිටින සියලුම රාජ්‍ය තාන්ත්‍රික කාර්ය මණ්ඩලවලට රාජ්‍ය තාන්ත්‍රික මුක්තිය පිළිබඳ මූලධර්මය මඟින් රාජක්ෂාව සපයන බවයි.

එම මුක්තිය ප්‍රදානය කිරීම අමාත්‍ය ධූරය මත රඳා නොපවතින අතර (බ්‍රිගේඩියර් ප්‍රියංක ප්‍රනාන්දු මහතා මේ සිදුවීම වන විට හොබවමින් සිටියේ බ්‍රිතාන්‍යයේ ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලයේ අමාත්‍ය (ආරක්ෂක) ධූරයයි) එය පවතින්නේ එම ආඥා පනතේ බලය හා රාජ්‍ය තාන්ත්‍රික සබඳතා පිළිබඳ ව්‍යාජ්‍ය සම්මුතිය මත බවද බ්‍රිතාන්‍ය මහාධිකරණය ස්වකීය තීන්දුව මගින් පැහැදිලිව ප්‍රකාශයට පත් කර සිටියේය. ඒ අනුව සියලුම චෝදනාවලින් බ්‍රිගේඩියර් ප්‍රියංක ප්‍රනාන්දු මහතා නිදොස් කර නිදහස් කරනු ලැබූ අතර ප්‍රාන්නදු මහතාට නඩු ගාස්තු ගෙවන ලෙස ද එල්ටීටීඊ හිතවාදී උද්ඝෝෂකයන් වන විත්තිකාර පාර්ශ්වයට නියෝග කර තිබේ.

අවසන් ගමන් ගිය අවසන් ගම්මුලාදැනියා

සිය 106 වැනි උපන්දිනය සැමරූ දිනයේ

● කරාපිටිය සමූහ - **එස්. ලොකුකරවිට**

අතීතයේ ගම පාලනය කළේ ගම්මුලාදැනියා විසිනි. 1802 වර්ෂයේ දී ලංකා සිවිල් සේවය ආරම්භ වූ අතර 1963 දී එය ශ්‍රී ලංකා රාජ්‍ය පරිපාලන සේවය ලෙස නම් කරනතුරු මෙරට ගමේ පරිපාලනය කරගනෙ ගියේ ගම්මුලාදැනියා විසිනි.

1963 දී ගම්මුලාදැනි ක්‍රමය අහෝසිකර එය ග්‍රාම සේවක වෘත්තිය බවට පත්කෙරිණි. ගම්මුලාදැනි ක්‍රමය ඉතිහාසයට එක්ව තිබුණ ද පසුගිය සතිය වනතුරුම ගම්මුලාදැනියකු මෙරට ජීවත් වූයේය. නමුත් ඔහු පසුගිය 20 වැනි දා ඔහු ජීවිතයෙන් සමුගැනීමත් සමඟ මෙරට සිටි සියලු ගම්මුලාදැනිවරු දැන් ජීවිතයෙන් සමුගෙන ගොසිනි.

මේ අවසන් ගම්මුලාදැනියා ජීවත් වූයේ ගාල්ලේය. ගාල්ලේ වංචාවල යටගල පාරේ පියසිරි නිවසේ ජීවත් වූ සැමී යාපා සිරිවර්ධන ශ්‍රී ලංකාවේ ජීවත් වූ අවසාන ගම්මුලාදැනියා ය. මියයන විට වයස අවුරුදු 106 ක් වූ හෙතෙම හබරාදුව මීපේ ගම්මානයේ දී 1915 ජුනි මස 18 වැනි දා උපත ලැබුවේය.

දරුවන් අට දෙනකුගෙන් යුතු පවුලේ බාලයා වූ ඔහු මීපේ අමතයන බෞද්ධ මිශ්‍ර පාඨශාලාවෙන් මූලික අධ්‍යාපන ලැබුවේය. ඉන් පසු මීගොඩ පාසලෙන් හා කළනේ මහා විද්‍යාලයෙන් අධ්‍යාපනය ලැබූ හෙතෙම පළමුව උණවටුන බොනවිස්ටා විද්‍යාලයේ ගුරුවරයකු වශයෙන් සේවය කළේය. නමුත් ටික කලකින් ගුරු වෘත්තිය එපා වීම හේතුවෙන් එය හැරදමා පැමිණි ඔහු 1944 සැප්තැම්බර් 06 වැනි දා වයස අවුරුදු 29ක්ව සිටිය දී ගම්මුලාදැනි තනතුරට පත්වූයේය.

සැමී යාපා සිරිවර්ධන ගම්මුලාදැනි තනතුර සඳහා ඉල්ලුම් කළ විට සම්මුඛ පරීක්ෂණය පවත්වා ඇත්තේ උණවටුනේ ඊ. ඩී. සේරම් මුදලිතුමා විසිනි. ඔහුට 134 කලහෙ වසමේ ගම්මුලාදැනි තනතුර ලැබිණි.

ගම්මුලාදැනි සැමී මහතා හබරාදුව, පිටිදුව, ගමේ කංකානම්ගේ අමේරියා පියසීලි තරුණිය සමඟ 1951 වර්ෂයේදී දී විවාහ දිවියට පිවිසි අතර ඔවුන් දෙපළ චන්ද්‍රා පද්මිණි, හද්‍රා රංජනී, පියසිරි, හේමකාන්ති යන දරුවන් සිවු දෙනකුට උපත ලබාදුන්නේය. ඔහුගේ බිරිඳ වසර 92ක් ආයු වලඳා 2015 වර්ෂයේ දී මෙලොව හැර ගියාය.

මියයන තුරුම ඉතාමත් නිරෝගී ජීවිතයක් ගත කරමින් සිටි සැමී යාපා සිරිවර්ධන වයස අවුරුදු 106ක් වුව ද නිවසේ අපහසුවෙන් නමුත් තනිව ඇවිද්දේය. උපැස් යුවළක් නොමැතිව පත්තර බැලුවේය. කොතරම් වයස්ගත වුව ද මෙරට පැවැති සෑම මැතිවරණයක දී උදැසනම ඡන්ද පොළට ගොස් ඡන්දය දමන්නට අමතක කළේ නැත. අවසන් වරට පසුගිය මහ මැතිවරණයේදී ද සැමී සිය ඡන්දය ප්‍රකාශ කළේය. තුන්වේලටම ගමේ වැවෙන එළවළුවක් සමඟ බත් හෝ වෙනත් දේශීය ආහාරයක් ගත් ඔහු දීර්ඝායුෂ වැලඳීමේ රහස කෑමට ගන්නා පිරිසිදු දේශීය ආහාර යැයි තරයේ විශ්වාස කළේය.

වයස අවුරුදු 106ක් වූ ගම්මුලාදැනිවරයා තවත් අසමසම වාර්තා දෙකකට හිමිකම් කිවේය. ඒ 1963 දී ගම්මුලාදැනි සේවය ග්‍රාම සේවක වෘත්තිය බවට පත්කරන අවස්ථාවේ දී විශ්‍රාම යාමෙනි. විශ්‍රාම යනවිට 48 වැනි වියේ පසුවූ ඔහුට තවත් වසර 12ක් සේවය කිරීමට අවස්ථාව තිබුණ ද එය ප්‍රතික්ෂේප කරමින් කැමැත්තෙන් විශ්‍රාම ගියේ ග්‍රාම සේවක තනතුර ගම්මුලාදැනි තනතුර තරම් නොවන බව පවසමින් යැයි ඔහුගේ එකම පුතු වන පියසිරි යාපා සිරිවර්ධන මහතා පවසයි.

“ඒ කාලේ අපි පොඩියි. ඔව තේරෙන්නේ නැහැ. නමුත් තාත්තා පස්සේ අපිට කිව්වා විශ්‍රාම ගියේ ග්‍රාම සේවක තනතුර ගම්මුලාදැනි කෙනෙකුට ගැළපෙන්නේ නැති නිසා කියලා. ඒ කාලේ ගම්මුලාදැනි කෙනෙකුට රාජකාරි කරන්න ලොකු ප්‍රදේශයක් තිබුණා. නමුත් ග්‍රාම සේවක වෘත්තිය ආවට පස්සේ බලප්‍රදේශය කුඩා වුණා. ඉස්සර තාත්තා කියනවා ගම්මුලාදැනි ක්‍රමය නැති කරන්න කියලා රටේ ලොකු විවාදයක් තිබුණා කියලා. තාත්තා හිටියේ ඒ ක්‍රමය තියෙන්න ඕන කියන මතයේ නිසා වෙන්න ඇති විශ්‍රාම යන්න ඇත්තේ.”

ඔහු විශ්‍රාම යාමත් සමඟ මෙරට මුලින්ම විශ්‍රාම ගිය සහ විශ්‍රාම වැටුපකට හිමිකම් කියූ ගම්මුලාදැනියා බවට හෙතෙම පත්වූයේය. එපමණක් නොව 1963 සිට 2021 මාර්තු මාසය දක්වාම විශ්‍රාම වැටුප් ලබාගත් ඔහු වසර 58ක් විශ්‍රාම වැටුප ලැබූ පුද්ගලයකු ලෙස ද වාර්තාගත වී ඇත. ඔහුගේ එම වාර්තාව බිඳ දැමීමට නම් දැන් වයස අවුරුදු 60 දී විශ්‍රාම යන පුද්ගලයකු වයස අවුරුදු 118ක් වන තුරු ජීවත්විය යුතුය. එය යමකුට පහසු කාර්යයක් නොවනු ඇත.

ඔහු සෑම අවස්ථාවක දී ම රාජකාරී කර ඇත්තේ සුදු සරමක් සහ උඩට අඳන බොත්තම් පහක් සහිත කෝට් එකක් පලඳිමිනි. ඔහුගේ කලහේ බලප්‍රදේශයේ අංකය වූ 134 සටහන් කළ පලඳනාවක් ද මේ නිල ඇඳුමේ එල්ලා තිබිණි. එමෙන්ම එම නිල ඇඳුමට බෙරේ තොප්පියක් සහ බැටින් පොල්ලක් ද තිබිණි.

“ඒ කාලේ රාජකාරිය අදට වඩා ගොඩක් අමාරුයි කියලා තාත්තා අපිත් එක්ක කියල තියෙනවා. මේ වගේ පාරවල් නෑ; වාහන නෑ; කැලෑවල්වලින් රිංගගෙන, ඇළ දොළ උඩින් තමයි යන්න වෙන්නේ. බඩු ප්‍රවාහනය කරන්න තියෙන්නෙත් කරත්ත. කරත්තවලින් කරන ලොකුම දෙයක් තමයි දර ගෙනියන එක. මේ දර ගෙනියනවාට ගම්මුලාදැනිගෙන් බලපත්‍රයක් ගන්නත් ඕනලු. මිනී මැරුමක් වුණොත් ඒ නිතිමය කටයුතු කරනකන් මැසි මදුරුවෝ තල තලා මිනිය මුරකරන්නත් වෙනවා කියලා තාත්තා ඉස්සර කියනවා. තාත්තා ගාව කෙටෙරියක් තියෙනවා. ඒක කෙනෙක් මිනී මැරුමකට පාවිච්චි කළ එකක්. නඩු භාණ්ඩ පවා ගම්මුලාදැනිවරු භාරයේ තිබුණු බවට ඒක හොඳ සාක්කියක්.”

පියසිරි පවසන්නේ ගමේ ගම්මුලාදැනියා වූ තම පියාට කවුරුත් ඇමතුවේ සිරිවර්ධන රාලහාමි යනුවෙන් බවයි. කාගේත් රාලහාමි වූ ඔහු ගමේ සිටි ජ්‍යෙෂ්ඨතම පුරවැසියා වූයේය. තම පැරණි ඥාති හිතමිතුරන් හමු වූ විට අතීතයේ කළ කී දේ සිහිපත් කරමින් පැරණි රස කතා කීම සිරිවර්ධන රාලහාමිගේ සිරිත වී තිබිණි. ඔහු නිතරම පවසන්නේ තමන් රාජකාරී කරන කාලයේ එම රාජකාරීවල තිබූ වගකීම් සහගත බවයි. අකුරටම රාජකාරී කළ ආකාරයත් වර්තමාන පරපුර තම වගකීම නිසි පරිදි ඉටු නොකරන බවත් ඔහු තම අත්දැකීම් ඇසුරෙන් නිතරම පවසා ඇත.

සැමී යාපා සිරිවර්ධන භාවිත කළ තොප්පිය, බැටින් පොල්ල සහ රාජකාරී දින පොතක්

එකල ගම්මුලාදැනිවරුන්ගේ ප්‍රධාන රාජකාරියක් වූයේ රජයට වී එකතු කරදීමයි. තම පියා වී බුසල මනින උපකරණත් රැගෙන නිවසින් පිටවන බව පුතා සිහිපත් කරයි. රජයට බදු අයකර දෙන අතරම ජනතාවට රජයේ සහන ලබා දීම ද සිදුවූයේ මේ ගම්මුලාදැනින් මඟිනි. රජයෙන් වර්ග හතරක හාල් පොත් හඳුන්වා දී තිබිණි. කම්කරු, සාමාන්‍ය, ළමා හා ළදරු හාල්පොත් ලෙස හැඳින්වූ මේ හාල්පොත් වර්ග අතරින් ළමා හාල්පොතට විටා මිල්ක් හා කවුඇන්ඩ්ගේට් වැනි පිටිකිරි වර්ග ද ලබා දීම විශේෂත්වයකි.

“තාත්තා නිතරම මතක් කරන කතාවක් තමයි එයාට දඩයක් ගෙවන්න වූ සිදුවීමක්. ගම්මුලාදැනිවරු හැමදාම තමන්ගේ දිනපොතේ සටහනක් තැබීම අනිවාර්යය වෙලා තිබුණාලු. ඉතින් දවසක් තාත්තට මේ සටහන තියන්න අමතක වෙලා. ඒකට දඬුවමක් හැටියට රුපියල් දහයක දඩයක් නියම කරලා. ඉතින් 1963ට ඉස්සෙල්ලා රුපියල් දහයක් කියන්නේ ලොකු ගණනක්.”

මියයන තුරුම තම පියාගේ අවශ්‍යතා ඉටු කළ දුව හේමකාන්ති සිරිවර්ධන මෙසේ කිව්වාය.

“තාත්තා අවසන් මොහොත වෙනකන්ම හොඳින් නිරෝගීව හිටියා. කවදාවත් ඉස්පිරිතාලෙකට ගිහින් නැහැ. බෙහෙත් පෙත්තක්වත් බොන්න කැමැති නැහැ. කවදාවත් අරක්කු සිගරට් කටේ තියලා නැහැ. කසාය වර්ග, තෙල් බෙහෙත් වර්ගවලට නම් කැමතියි. වේදනාවක් ආවත් කියන්නේ තෙල් ටිකක් ගාන්න කියලා. අල, බතල, කොස්, දෙල්, මඤ්ඤොක්කා තමයි කෑවේ. අවසන් මොහොත දක්වාම හොඳ කල්පනාවෙන් සිටියා. තාත්තා බලාපොරොත්තු වුණෙත් දුකක් නැති මරණයක්.”

ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලන කාලයේ දී පත්වීම් ලැබ මෙරට සිටි ගම්මුලාදැනිවරු අතර අවසන් පුරුක වූ සැමී යාපා සිරිවර්ධන දැන් අතීතයට එකතුවී සිටියි. ඔහු ඉතිරිකර ගිය මතකයන් බොහොමයකි. ඒ සියල්ල ඓතිහාසික කරුණු බවට පත්ව ඇත.

වමේ සිට, සැමී යාපා සිරිවර්ධනගේ බිරිය ගමේ කංකානම්ගේ අමේරියා පියසීලි, පුතු පියසිරි සහ දියණිය හේමකාන්ති

ගම්මුලාදැනි සිරිවර්ධන වාසය කළ නිවස

පන්සල් 100 ක් හදන්න උදව් කළ ද්‍රවිඩ ව්‍යාපාරිකයා

සිංහල - දෙමළ මිත්‍රත්වය ගොඩ-නැඟීම උදෙසා අතීතයේ මහ මෙහෙයක් කළ අපේ රටේ ආගමික සහජීවනය අගය කළ එස්. ටී. සින්නදොරේ මහතා ශ්‍රී ලංකාව එක්සත් දේශයක් ලෙස පවත්වා ගන්නට නිහඬ සේවයක් කළ පුද්ගලයෙකි.

එස්.ටී. සින්නදොරේ සූරීන්ගේ 41 වැනි සමරුව වෙනුවෙනි.

මහව ශ්‍රී මංගලාරාමය ඇතුළු මෙරට බෞද්ධ සිද්ධස්ථාන 100 කට පමණ උදව් උපකාර කර සින්නදොරේ මහතා සිය දරු පරපුර ද බෞද්ධ සිද්ධස්ථානවල කටයුතුවලට යොමු කළේ ය.

20 වැනි සියවසේ අගභාගයේදී එනම් 1903 උතුරේ යාපනය අර්ධද්වීපයේ කන්කසන්තුරේදී උපත ලැබූ සින්නදුරේ යොවුන් වියේදී කොළඹට පැමිණ ව්‍යාපාරික කටයුතුවල යෙදෙන අතරේ මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි, ටිබෙට් ජාතික ඇස්. මහින්ද හිමි, සාගර පලන්සූරිය, පී.වී. ලැනරෝල්, මීමන ප්‍රේමතිලක, පියදාස පලන්සූරිය, ඇල්.පී. දේශබන්දු, චන්ද්‍රරත්න මානවසිංහ සහ කුමාරතුංග මුණිදාස වැනි සිංහල සාහිත්‍යධරයන් සමඟ එකට එක්ව සිංහලයෙකු මෙන් ශ්‍රී ලංකාවේ නිදහස් අරගලයට දායක විය.

පසුකාලීනව 1980 මාර්තු 22 වැනි දින ඔහු මියයන තෙක් අවුරුදු 60 ක් පමණ වූ කාල පරාසය තුළ මෙතුමා සිදු කළ ජාතික, ආගමික, සාමාජයීය කටයුතු අතිවිශාලය.

ශ්‍රී ලංකාවේ උතුරින් දකුණට සංක්‍රමණය වූ මොනු කොළඹ පිටකොටුවේ බෝගහ හන්දියේ ලීලා ස්ටෝස් නමින් වෙළෙඳ ව්‍යාපාරයක් ආරම්භ කළේය. බුදු පියාණන් වහන්සේට සම්මා සම්බුද්ධත්වය ලබාගන්නට සෙවණ සලසා දුන් බෝධීන් වහන්සේගේ සිසිලස විඳිමින් තම ව්‍යාපාරය පවත්වාගෙන යෑමට ලැබීම මහත් වාසනාවක් බව මෙම හින්දු බැතිමතා සැලකුහ. එකල අනාරක්ෂිතව පැවැති මෙම බෝධි වෘක්ෂය ඉංග්‍රීසි ආණ්ඩුව මගින් අවස්ථා දෙකකදීම කපා ඉවත් කිරීමට සූදානම් වූ අතර මෙම හින්දු බැතිමතා සහ මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන් ඊට විරෝධය ප්‍රකාශ කිරීම නිසා එය වළක්වා ගත හැකි විය. සෑම දිනකම උදැසන මෙම බෝධීන් වහන්සේට පුද පූජා පැවැත්වීමට පුරුදුව සිටි සින්නදුරේ බෝධිය වටා ආරක්ෂිත වැටක් ඉදිකොට ගේට්ටුවක් ද දැමීය. පසුව බුදු කුටියක් ඉදිකොට බුද්ධ ප්‍රතිමාව තැන්පත් කරන ලදී. එසේම ඔහුගේ බලවත් උත්සාහය නිසා එක්සත් බෝධිරාජ සමිතිය ආරම්භ කොට පිටකොටුවේ සෙසු ව්‍යාපාරික ප්‍රජාවගේ සහාය ද ලබාගෙන විහාර මන්දිරයක්, චෛත්‍ය රාජයාණන් වහන්සේ සහ දේවාල ආදී සියලු අංගෝපාංගයන්ගෙන් සමන්විතව බෝධිරාජ විහාරය සංවර්ධනය කරන ලදී.

උපතින් හින්දු බැතිමතෙකු වුවත් බෞද්ධ සිද්ධස්ථාන සංවර්ධනය කරන්නට විශාල පරිශ්‍රමයක් දැරූ මෙතුමා වැල්ලවත්තේ ශ්‍රී ධර්මෝදය පිරිවෙන, මහව පළමුගෙදර ශ්‍රී මංගලාරාමය, අනුරාධපුර කුරුන්දන්කුලම සද්ධර්ම විවේකාශ්‍රමය සහ ඇහැලියගොඩ සාම මහා විහාරය ආදී විහාරස්ථාන රැසක දියුණුව උදෙසා සින්නදුරේ පවුලේ සෘජු දායකත්වය ලබාදී ඇත. සිංහරාජ වන පෙදෙස් සුමංගල ජන විජය චෛත්‍ය ඇතුළු ශ්‍රී ලංකාව පුරා තවත් විහාරස්ථාන 100 කට අධික ගණනකට සංවර්ධනය උදෙසා ද මොනු අනුග්‍රහය ලබාදී ඇත.

එසේම ශ්‍රී ලංකාවේ ප්‍රථම සිංහල සිතුවම සහිත දින දර්ශනය වන ලීලා පංචාඞ්ග දින දර්ශනය මොනුගේ සුවිශේෂතම සේවාවකි. තවද ශ්‍රී ලංකාවේ විද්වතුන්ට, ලේඛකයින්ට සහ කවියන්ට තම නිර්මාණ සහ ග්‍රන්ථ ඉතා පහසු මුද්‍රණයට මුද්‍රණය කර එළිදැක්වීමට අනුග්‍රහය දැක්වීමෙන් ද සිංහල භාෂාව හා සාහිත්‍යයට මොනු කළ සේවාව අගය කළ යුතු ය.

ඒ මහතාගේ 41 වැනි සමරුව වෙනුවෙන් පසුගිය 21 වැනිදා මහව පළමුගෙදර මංගලාරාම විහාරස්ථානයේදී පින්කම් මාලාවක් පැවැත්විණි.

● **නිහාල් පී. අබේසිංහ**

● සිගිරිය විශේෂ

මොකද්ද මේ පොල්තෙල් හුටපටේ

ඇෆ්ලටොක්සින් නමැති ප්‍රබල පිළිකා කාරකය අඩංගු බවට සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආහාර ආරක්ෂණ ඒකකය විසින් තහවුරු කළ ආනයනික පොල් තෙල් සහිත බහාලුම් 13ක් වෙළෙඳපොළට නිකුත් වී ඇතැයි සමස්ත ලංකා පාරම්පරික පොල්තෙල් නිෂ්පාදකවරුන්ගේ සංගමය පසුගියදා දඹුල්ලේදී හෙළිදරව් කළේය. ඒ සමඟම නැවත වරක් පොල් තෙල් ගැන ජනතා අවධානය යොමුවී තිබේ. එම තෙල් තොග පරිභෝජනයට නුසුදුසු බැවින් වහාම ප්‍රතිඅපනයනය කරන්නැයි ආහාර ආරක්ෂණ ඒකකය දැනුම් දී තිබියදීත් මෙලෙස වෙළෙඳපොළට නිකුත් වීම සම්බන්ධයෙන් වහාම පරීක්ෂණයක් සිදුකළ යුතු බව ජාතික සංවිධාන එකමුතුව මාධ්‍ය හමුවක් ද පැවැත්විය.

සමස්ත ලංකා පාරම්පරික පොල්තෙල් නිෂ්පාදකවරුන්ගේ සංගමයේ, ප්‍රධාන කැඳවුම්කරු, බුද්ධික ද සිල්වා පවසා සිටියේ මෙවන් අදහසකි.

“අද කන්ටේනර් 20 -30කට වැඩි ප්‍රමාණයක් මුදාහැරීමට රේගු අධිකාරියට ලිපි ගොනු බාර නොදී දැන් තියාගෙන ඉන්නවා. ඒකෙන් ඔවුන් බලාපොරොත්තු වෙන්නේ මේ කලබලය නිම වූ පසු පස්ස දොරෙන් මේ කන්ටේනර්ස් ටික මුදා හැරීමට. අපි කියන්නේ ඇෆ්ලටොක්සින් තියෙන තෙල් දැනට ආනයනකරුවන් 4දෙනෙකුගේ කන්ටේනර් 13ක් එළියට ගිහින් තියෙනවා. මේවගේ ඇෆ්ලටොක්සින් තියෙනවා ද කියලා කවුද බලන්නේ ? කැවුම්, කොකිස් බදින්න ගේන තෙල්වල මේ මාරකයා ඉන්නවා නේද ? ප්‍රමිති ආයතනය හා සෞඛ්‍ය අමාත්‍යාංශය එක්ව පාරිභෝගික ජනතාවට මේවගේ අඩංගු ද්‍රව්‍ය කුමක් ද යන්න අනිවාර්යයෙන් දැනුම් දිය යුතුයි. “

මේ සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආහාර ආරක්ෂණ ඒකකයෙන් විමසීමක් කළවිට ඔවුන් සඳහන් කළේ මතභේදයට තුඩුදී ඇති එම ආනයනික තෙල් තොග සාම්පල ආශ්‍රයෙන් සිදුකළ පර්යේෂණවලදී ඇෆ්ලටොක්සින් නමැති ප්‍රබල පිළිකා කාරකය අඩංගුව ඇතැයි තහවුරු වූ බවය.

ඒ අනුව එම තොගයේ කිසිදු තෙල් ප්‍රමාණයක් මහජන පරිභෝජනය සඳහා වෙළෙඳපොළට නිකුත් නොවිය යුතු බැවින් වහාම එම බහාලුම් ප්‍රතිඅපනයනය කරන ලෙස ශ්‍රී ලංකා රේගුව හා අදාළ සමාගම් වෙත ලිඛිතව දැනුම් දුන් බවද සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආහාර ආරක්ෂණ ඒකකය දැනුම් දී තිබේ. මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය කියා සිටියේ, එම තෙල් සාම්පල පිළිබඳ තම ආයතනයෙන් ද පරීක්ෂා කිරීමක් සිදුකළ ද පිළිකා කාරක අඩංගු යැයි වාර්තා නොවූ බවය.

එම තෙල් සාම්පල පිළිබඳ සිදුකෙරුණු පර්යේෂණයේ වාර්තා යළි විමර්ශනය කරන බව ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය සිද්දිකා සේනාරත්න සඳහන් කළාය.

මේ අතර ඇමති බන්දුල ගුණවර්ධන පවසා සිටියේ මෙම මාධ්‍ය හමු පවත්වා ඇති කණ්ඩායම් හමුවී පිළිකා රෝග කාරක ඇති පොල් තෙල් ඇති ස්ථාන සොයා ගන්නා බවය. එමෙන්ම ජනතාවටද සොයා බලා මිලදී ගැනීමට වගකීමක් ඇති බවය.

කෙසේ වෙතත් එම තෙල් තොගය ප්‍රතිඅපනයනය කළ යුතු බවට සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආහාර ආරක්ෂණ ඒකකය නිර්දේශ කර තිබියදී එය වෙළෙඳපොළට නිකුත් වූයේ කෙසේද යන්න සම්බන්ධයෙන් වහාම රජය පරීක්ෂණයක් සිදුකළ යුතු බව ජාතික සංවිධාන එකමුතුව මාධ්‍ය හමුවක් පවත්වමින් රජයට අවධාරණය කර සිටිති.

රටින් ගෙනා පොල්තෙල්(වම) එම පොල්තෙල් පිරිසිදු කර වෙළඳාමට නිදහස් කර ඇති අයුරු(දකුණ)

මෙරට වාර්ෂික පොල්තෙල් අවශ්‍යතාව මෙට්‍රික් ටොන් 180,000ක් පමණ වේ. ඉන් දේශීය පොල් තෙල් නිෂ්පාදකයන් විසින් සපුරනු ලබන්නේ මෙට්‍රික් ටොන් 25,000ක පමණ ප්‍රමාණයකි. ඉතිරි මෙට්‍රික් ටොන් 155,000ක තෙල් අවශ්‍යතාව සම්පූර්ණ කෙරෙන්නේ ආනයනකරුවන් විසිනි. එම ආනයනකරුවන් පිරිපහදු නොකළ පොල්තෙල් මෙන්ම ෆාම් ඔයිල් වැනි වෙනත් ආදේශක තෙල් වර්ග ද මහා පරිමාණයෙන් ආනයනය කොට මෙරටදී පිරිපහදු කොට වෙළඳපළට නිකුත් කරති.

මේ අතර මාතලේ පාරිභෝගික අධිකාරියේ ප්‍රධානියා රේණුක කුමාර දඹුල්ලේ කළ පොල්තෙල් වැටලීමකදී විදේශ රටවලින් ගෙන්වා ගබඩා කොට පොල් තෙල් සහ ෆාම් තෙල් තොග අලෙවි කරන ස්ථාන දෙකක් සීල් තැබීමට ක්‍රියා කළේය. එම ස්ථාන වලින් තෙල් කොටස් පරීක්ෂා කිරීම සඳහාද ලබාගත්තේය.

මාතලේ පාරිභෝගික අධිකාරියේ ප්‍රධානී රේණුක කුමාර ඇතුළු කණ්ඩායමක් දඹුල්ල ප්‍රදේශයේ මහා පරිමාණ පොල් තෙල් තොග අලෙවි කරන ස්ථාන කිහිපයක් පරීක්ෂාවට ලක්කළේය. දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය ආසන්නයේ මහා පරිමාණයෙන් පොල් තෙල් අලෙවි කරන ස්ථානයකට ගොස් පරීක්ෂා කර බැලීමේදී එම ස්ථානයේ ගෙන්වූ ආයතනයක නමක් හෝ ලියකියවිල්ලක් නැතිව අලෙවි කළ රුපියල් ලක්ෂ තිහකට ආසන්න පොල්තෙල් සහ ෆාම් ඔයිල් තොගයකට මුද්‍රා තැබීමට පියවර ගනු ලැබිය.

මෙම ස්ථානයේ භූගත සහ ඉහළ සවිකොට තිබූ පොල්තෙල් හා ෆාම් තෙල් ගබඩා ටැංකි පරීක්ෂා කොට බැලීමේදී ඒවායේ විවිධ මියගිය කෘමීන් ගේ කොටස් මෙන්ම මිනිස් පරිභෝජනයට නුසුදුසු තත්ත්වයේ තිබීම විශේෂත්වයකි.

සම්පූර්ණයෙන්ම එම ස්ථානයේ තෙල් අලෙවිය තාවකාලිකව නවතා දමා මුද්‍රා තැබීමට මාතලේ පාරිභෝගික සේවා අධිකාරියේ ප්‍රධානී රේණුක කුමාර ඇතුළු පිරිස පියවර ගනු ලැබූහ.

එමෙන්ම දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය ආසන්නයේ තවත් පොල් තෙල් තොග අලෙවි කරන ස්ථානයක් පරීක්ෂා කිරීමේදී එම ස්ථානයේ පොල් තෙල් මිලදී ගැනීම සිදුකළ බිල්පත් සහ අදාළ පුද්ගලයන් පිළිබඳව තොරතුරු අනාවරණය වුවද එම ස්ථානයේ ගබඩා කිරීමේ දී ෆාම් තෙල් සහ පොල්තෙල් යම් මට්ටමකින් කළවම් වන බව අනාවරණය කර ගත්තේය. ඒ අනුව එම ස්ථානයේ අලෙවිය ද තාවකාලිකව නවතා මුද්‍රා තබා එහි පොල්තෙල් සහ ෆාම් තෙල් කොටස් ලබා ගැනීමට සියවර ගැණිනි. මෙසේ ලබාගත් තෙල් සාම්පල් කොටස් කොළඹ පාරිභෝගික අධිකාරියට ලබා දී සුදුසු ස්ථානයකින් ඒවා මිනිස් පරිභෝජනයට සුදුසු ඒවා ද නැද්ද යන්න පරීක්ෂා කිරීම සිදුකරන බව පාරිභෝගික සේවා අධිකාරියේ නිලධාරීහු පවසති.

පාරිභෝගික සේවා අධිකාරියේ මාතලේ ප්‍රධානී රේණුක කුමාර ප්‍රමඛ නිලධාරීන් තෙල් පරීක්ෂා කරමින්

සමස්ත ලංකා පාරම්පරික පොල් පීල් නිෂ්පාදකවරුන්ගේ සංගමයේ සම කැඳවුම්කරු තුෂාර විජේසිංහ සහ කැඳවුම්කරු බුද්ධිකද සිල්වා

මෙරට සිංහල දමිල අලුත් අවුරුදු සමය වෙළෙන්දන්ගේ අවුරුද්ද බවට පත්වී හමාරය. ඒ සඳහා ජනතා මුදලින් වැටුප් ලබන රාජ්‍ය සේවකයෝ බහුතරයක් උදව් උපකාර කරනු ලබන්නේ ඔවුන්ටද අවුරුදු උදා වන නිසාවෙනි.

සමස්ත ලංකා පාරම්පරික පොල් පීල් නිෂ්පාදකවරුන්ගේ සංගමයේ සම කැඳවුම්කරු තුෂාර විජේසිංහ මෙකී ගැටලුව ගැන මෙසේ පැවසීය.

"මේ සිංහල අලුත් අවුරුද්දට ගෙදර ළිප තියන තෙල් තාච්චිය මාරයා එක්ක තමයි ලිප තියන්න වෙලා තියන්න."

"අපි ඉල්ලීමක් කරනවා; මේ සිංහල අලුත් අවුරුද්ද ඉලක්ක කරගෙන අපේ අහිංසක ජනතාවගේ ජීවිත පරදුවට තියලා සිදුකරන මේ තෙල් මාෆියාව වහාම රටේ ජනතාවට හෙළිදරව් කරන්න."

"මෙරටට අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයක් ගෙන්වන්නේ ඇයි මේවා ගෙන්වන්නේ වෙන කිසිවක් නිසා නෙවෙයි; රජය මහ ජනතාවට ලබාදෙන බදු මුදල් වලට මුවා වෙලා අපේ ජනාධිපතිතුමාගේ එක සංකල්පයක් තමයි ෆාම් ඔයිල් සීමා කිරීම. ඒ යටතේ රටට අවශ්‍ය පොල්තෙල් නිෂ්පාදනය කිරීම සඳහා බදු සහනයක් ලබා දුන්නා. ඒ අනුව රුපියල් දෙසිය හැත්තෑ පහකට තිබුණු බද්ද රුපියල් 150කින් අඩු කරල තියෙනවා ඒ රුපියල් එකසිය පනහේ බදුසහනය මෙම ජාවාරම්කරුවන් ලබාගෙන තමයි ජනතාවට වස විස කවන්නෙ."

පෙර පාසල් යළි ඇරඹේ

● ධම්මික සෙනෙවිරත්න

කොවිඩ් - 19 ගෝලීය වසංගතයක් ලෙස මනුෂ්‍ය වර්ගයා හමුවේ තැබූ අභියෝගය සුළුපටු නැත. ආර්ථික, සෞඛ්‍ය, අධ්‍යාපනික ආදී සෑම ක්ෂේත්‍රයක්ම ඉන් බරපතළ පසුබෑමකට ලක්වූ අතර, සියවසක පමණ ඉතිහාසයේ ලෝකය මේ තරම් පීඩාවට පත් කළ අන් අර්බුදයක් ද නැත. කොරෝනා වයිරසය මර්දනය කිරීම සඳහා ලොව රටවල් ගණනාවක එන්නත් වැඩසටහන් ක්‍රියාත්මකය. වසංගතයත් සමඟ සටන් කරන අතරම යළි හිස එසවීමට රටවල් වෑයම් කරමින් සිටිති. ඉන් බලපෑමට ලක්වූ ක්ෂේත්‍ර ඉදිරියට ගෙනයාම සඳහා පියවර ද ගනිමින් ඇත. මේ ක්ෂේත්‍ර අතරින් අධ්‍යාපනයට ඉන් ඇති කළ බලපෑම විශාලය. අඩු වැඩි වශයෙන් ශ්‍රී ලංකාව ද එම බලපෑම්වලට ලක්ව පවතී. එමෙන්ම, ඒවා පාලනය කරමින් පෙරට යාමට වෙහෙසෙමින් සිටී. කොවිඩ් - 19 ව්‍යාප්තිය හමුවේ පෙර පාසල් ද වසරකට ආසන්න කාලයක් වසා දැමීමට සිදුවිය. එම කාලසීමාව තුළ ඒවා විවෘත කිරීමට හැකිවූයේ මසක් වැනි කෙටි කාලසීමාවක් සඳහා පමණි. මාස ගණනාවක් තිස්සේ වසා දැමූ බස්නාහිර පළාතේ පෙර පාසල් මාර්තු 29 යළි විවෘත වේ.

කොවිඩ් නිසා වැහුණු පෙරපාසල් 29 දා සිට නැවත ඇරඹේ

පසුගිය වසර සඳහා පෙර පාසල්වලට ඇතුළත් කළ දරුවන්ට මුළුමනින්ම පාහේ එම අධ්‍යාපනය ලැබීමේ අවස්ථාව අහිමි විය. මේ වසරේ ද මේ වන විට තුන් මසක් පමණ ගතවී තිබේ. දෙමවුපියන් ද පවසන පරිදි දරුවන්ට නිවසටම සීමාවීමට සිදුවූ අතර, එය හිතකර තත්වයක් නොවේ. මෙවැනි පසුබිමක බොහෝ දරුවෝ රූපවාහිනී කාටුන් ආදී නැරඹීම සඳහා විශාල වශයෙන් යොමුවූහ.

දෙමවුපියන් නැවතත් රැකියා සඳහා යාමට පටන් ගැනීමත් සමඟ මේ දරුවන් රැක බලා ගැනීම පිළිබඳ ගැටලුවක් ද ඇතිවිය. දිවා සුරැකුම් මධ්‍යස්ථාන ද විවෘතව නොතිබිණි. එක්කෝ දරුවන් ගෘහ සේවිකාවකගේ බාරයට පත්වූ අතර ඇතැම් අවස්ථාවල දන්නා හඳුනන නිවෙස්වල දරුවන් තබා රැකියාවට යාමට දෙමවුපියන්ට සිදුවිය. එවැනි අවස්ථාවල දරුවන් සිටින පරිසරය අනුව ඔවුන්ට ඇතිවන බලපෑම් ගැන දැන ගැනීමට සිදුවන්නේ තවත් වසර 2, 3 කින් වුවද විය හැකිය.

දරුවන්ගේ බුද්ධි වර්ධනය සිදුවීමේදී වයස අවුරුදු 5 පමණ දක්වා මෙම අවදිය ඉතාමත් වැදගත්ය. ඒ කාලයේදී දරුවන් දැනුම හා ක්‍රියාකාරකම් ඔස්සේ බුද්ධි වර්ධනය සඳහා යොමු කිරීම ගෙදර දොරදී දෙමවුපියන්ටම කළ හැකි කාර්යයක් ද නොවේ. විදේශ රටවල් ද මේ තත්වය ගැන දැඩි අවධානයක් යොමු කර ඇති අතර ඇතැම් රටවල පෙර පාසල් විවෘතව පවතී. එලෙස ඒවා පවත්වා ගෙන යාමට නම් මනා ප්‍රමිතීන් යටතේ සෞඛ්‍යාරක්ෂිතව ඒවා ගෙනයාමට හැකිවිය යුතු වුවද අප වැනි රටවල හැම පෙර පාසලක්ම එවැනි මට්ටමක පවතින්නේ යැයි කිව නොහැකිය. කොවිඩ් - 19 යටතේ දරුවන්ගේ උණ පරීක්ෂා කිරීම ආදී කටයුතු සඳහා එම උපකරණ පවා නොමැති අවස්ථා තිබේ. එහෙත්, දෙමවුපියන් එකතු වූ විට එවැනි පහසුකම් සපුරාලීම අපහසු නැත.

පෙර පාසල් ගුරුභවතුන්ට ද කොවිඩ් - 19 තත්ත්වය යටතේ රජය මඟින් ලබාදුන් රුපියල් 5000/- ලබාගත හැකි විය. සතුටුදායක චේතනයක් ලබන ඇතැම් ඉහළ මට්ටමේ පෙර පාසල්වල එම දීමනාව ලබාගැනීම සඳහා ගුරුවරියන් යොමු නොකළ බව දැනගැනීමට ලැබිණි. එම අවස්ථාව වෙනත් අයකු වෙනුවෙන් පිරිනැමීම වඩාත් සාධාරණ හා සුදුසු බව එම පාසල් මඟින් පෙන්වා දී තිබිණි. එහිදී කල්පනා කළේ රට පැත්තෙන් බව හා රටක් වශයෙන් මේ අභියෝගයට සාර්ථකව මුහුණ දීම බව අප සමඟ පැවසුවේ, එවැනි ඇතැම් පෙර පාසල් පාලිකාවන්ය. ඉනුත් ඉදිරියට යමින් මෙම වසංගතය පාලනය කිරීම සඳහා දැඩි කැපවීමකින් කටයුතු කරන වෛද්‍යවරුන්ගේ දරුවන් මේ තත්වය යටතේ බලපෑමට ලක්ව ඇත්නම් ඔවුන් රැකබලා ගැනීම වෙනුවෙන් මේ පාසල් මුදල් අය නොකර පවත්වා ගැනීමට පවා ඇතැම් පෙරපාසල් සූදානම්ව සිටි බව දැන ගැනීමට ලැබිණි. බස්නාහිර පළාත තුළ පෙර පාසල් විවෘතව නොතිබූ පසුබිමක ඇතැම් ගුරුවරියන් වෙනත් ව්‍යාත්තියමය ක්ෂේත්‍ර සඳහා යොමු වීමද සිදුව තිබේ.

කොළඹ හා තදාසන්න ප්‍රදේශවල ඉහළම මට්ටමින් පවත්වාගෙන යන පෙර පාසල්වල ගුරුවරියන් 10 - 15 තරම් සිටින අවස්ථා තිබේ. ඔවුන්ගේ වැටුප් රු. 25,000/= - රු. 40,000/= අතර වේ. පෙර පාසල් වසා දැමූ කාලසීමාව තුළ වසංගතයේ බලපෑම් නිසා තාවකාලිකව හෝ වැසී ගිය පෙර පාසල් ද තිබේ.

චන්‍ද්‍රා හෙට්ටිගම

සාරා කෝදාගොඩගේ

ඇතැම් පෙර පාසල් වසා දැමූ කාලය සඳහා ද දරුවන්ගෙන් මුදල් අය කළ බවද දෙමවුපියන්ගෙන් දැන ගැනීමට ලැබිණි. එහිදී අපහසුවට පත්ව සිටියේ දෙමවුපියන්ය. එවැනි පාසල් දිනකට පැය 1/2ක් වැනි කාලසීමාවක් 'ඔන්ලයින්' මඟින් දරුවන්ට අධ්‍යාපනය ලබාදීමට කටයුතු කර තිබිණි.

පූර්ව ළමාවිය අධ්‍යාපන ක්‍රියාවලියේදී දරුවන් ඔන්ලයින් අධ්‍යාපනයට යොමු කිරීම අනුමත කළ නොහැකි බව එම අධ්‍යාපනය පිළිබඳ ප්‍රවීණත්වයක් මෙන්ම පළපුරුදු අත්දැකීම් ද ඇති අයගේ අදහසය. අප සමඟ අදහස් දක්වමින් ප්‍රවීණ පෙර පාසල් පාලිකාවක වන චන්‍ද්‍රා හෙට්ටිගම කියා සිටියේ, පෙර පාසල් වියේ දරුවන් ඔන්ලයින් අධ්‍යාපනයට යොමු කිරීම ගැන එකඟ විය නොහැකි බවය. “මොන්ටිසෝරි දරුවන්ට ඔන්ලයින් උගන්වනවා කියන්නෙම බොරු වැඩක්. මේ වයසෙ දරුවො එකතැනක පැයක්වත් තියන්න බෑ. අපි දෙමවුපියන්ට නිතර උපදෙස් දෙන්නේ පමණ ඉක්මවා රූපවාහිනිය නැරඹීමට ඉඩ දෙන්න එපා, දැන්මම ජංගම දුරකතනය දෙන්න එපා කියලා. දැන් ඉන්න දරුවො හොඳ බුද්ධියක් තියෙන අය. ඒ නිසා මේවා භාවිතය ගැන ඔවුන් ඉක්මනින්ම දැනගන්නවා. ඊළඟට මේවා පරිහරණය කරද්දි අවශ්‍ය - අනවශ්‍ය හැම දේටම ඒ අය නැඹුරු වෙන්න පුළුවන්. අපි අවුරුදු 2 - 5 ත් අතර වයසෙ දරුවන්ගේ බුද්ධි වර්ධනය වෙනුවෙන් කරන දේවල් ඉතාමත් ඵලදායකයි. ඒ නිසා මේ වයස හරිම වැදගත්‘

ඒ අතරම චන්‍ද්‍රා හෙට්ටිගම පෙන්වා දෙන්නේ, පෙර පාසල් වසා තැබීමට සිදුවීම නිසා ගුරුවරුන්ගේ වැටුපේ ආදිය ද ගෙවමින් එම වියදම් දරා ගැනීම අසීරු බවය. කාලයක් තිස්සෙ සේවය කළ ගුරුවරියන්ගේ සේවය පවා එම පසුබිම තුළ අහිමි වී තිබේ. වෙනත් වසරවල නව වර්ෂය සඳහා දරුවන් 25 - 30 ක් ඇතුළත් වන්නේ නම් මේ වර්ෂය සඳහා ඊට ඇතුළත් වන්නේ 5කටත් අඩු සංඛ්‍යාවකි. පාසල් වසා දමා තිබියදී දෙමවුපියන්ගෙන් මුදල් අය නොකරන ප්‍රතිපත්තියක කටයුතු කරනවිට මෙය අභියෝගාත්මක තත්ත්වයකි. ‘කොහොම වුණත් අපි ඉස්සෙල්ලාම නීතියට ගරු කළ යුතුයි. ඒ නිසා මේ උපදෙස් පිළිපදින්න වෙනවා. “ ඇය අවධාරනය කරන්නීය.

හෙට සිට පෙර පාසල් විවෘත වීමත් සමඟ ඒ ඉල්ලීම ඉටු වේ. පෙර පාසල් පවත්වාගෙන යමින් සිදුකරන්නේ සේවා ලබාදීමකි. දවසට පැය 11ක් පමණ තිස්සේ එම සේවාව ලබාදෙන පෙර පාසල් ද තිබේ. ඒ දිවා සුරැකුම් මධ්‍යස්ථාන පහසුකම් ද සමඟය. මේ ඇතැම් පාලිකාවන් දශක 2 කට අධික කාලයක් තිස්සේ පෙර පාසල් පවත්වාගෙන යමින් සිටී. එම පළමු ශිෂ්‍ය කණ්ඩායම් මේ වන විට විශ්වවිද්‍යාල අධ්‍යාපනය ද ලබා සිටිති.

මේ, ජ්‍යේෂ්ඨ පෙර පාසල් ගුරුවරියක වන සාරා කෝදාගොඩගේ අප සමඟ පැවසූ අදහස් මෙසේය. “මේ අභියෝගාත්මක අවස්ථාවක් බව අපි දන්නවා. අපි එයට මුහුණ දෙමින් සිටින්නේ අසීරුතා මැද. ඉතින් අපි ඉල්ලන්නේ ඒ, සෞඛ්‍ය මාර්ගෝපදේශ, රෙගුලාසි ආදියට යටත්ව අපට මේවා පවත්වාගෙන යන්න ඉඩ දෙන්න කියලා. අපේ මෝන්ටිසෝරිය ඉහළම මට්ටමෙන් සෞඛ්‍යාරක්ෂක පියවර අනුගමනය කරනවා. “

කුඩා දරුවන් නිසි ලෙස මුඛ ආවරණ පැලඳ ආරක්ෂක පියවර අනුගමනය කරනු ඇතිද යන ප්‍රශ්නය ද මෙහිදී අපි මතු කළෙමු.

“ඇත්තටම මේ දරුවො මුඛ ආවරණ පලඳිනවා පමණක් නෙවෙයි, යම් හෙයකින් දෙමවුපියන් අතින් අතපසුවීමක් වුවහොත් එය පවා පෙන්වාදීමට තරම් කල්පනාකාරී. වැඩිහිටියන්ටත් වඩා දරුවන් දැන් මේ ගැන අවධානයෙන් කටයුතු කරනවා. අත් සේදීම වගේ දේවල් කරනවා. ඒ නිසා යම් ප්‍රශ්නයක් ඇති වීමට තියෙන අවදානම අවමයි.“

සියලුම පහසුකම් සෑම පෙර පාසලකම නොමැති බව සත්‍යකි. එසේ වුවද අවශ්‍යම මූලික පහසුකම් සැලැස්වීමේ හැකියාව තිබේ. දෙමවුපියන් ද ඊට උපකාරී වනු ඇත. රජය මඟින් සැලැස්විය හැකි සහනයන් හා පහසුකම් ද තිබේ.

කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන යටිතල පහසුකම් පිළිබඳ රාජ්‍ය අමාත්‍ය පියල් නිශාන්ත පවසන්නේ පෙර පාසල් ද 29 වැනිදා (හෙට) සිට විවෘත කිරීමට කටයුතු කර ඇති බවය. ඒ පිළිබඳව ලැබී ඇති සෞඛ්‍ය මාර්ගෝපදේශ වලට අනුව ඒවා ක්‍රියාත්මකවීමට නියමිතය. එය අසීරුතා මැද වුවද කැපවීමෙන් යුතුව ඒවා පවත්වාගෙන යමින් සිටින පෙර පාසල් ක්ෂේත්‍රයේ නියුතු සැමගේ මෙන්ම දෙමවුපියන්ගේ ද, දරුවන්ගේද සතුටට හේතුවන පණිවිඩයක් වනු නොඅනුමානය.

සිළුමිණ The Silumina

සිප්සයුර

අධ්‍යාපන අතිරේකය

silumina.advt@lakehouse.lk - 011 242 9351 - 071 782 9018

HCL TechBee - උසස්පෙළ සම්පූර්ණ කළ සිසුන් සඳහා පූර්ව වෘත්තීය වැඩසටහන

මූල්‍ය ස්වාධීනත්වය, සහතික කළ රැකියා අවස්ථා සමග Horizon Campusහී උසස් අධ්‍යාපනය පිරිනමනන පෙරළිකාර නිපුනතා වැඩසටහන සෑම වසරකම පාහේ ශ්‍රී ලංකාවේ ලක්ෂ සංඛ්‍යාත සිසුන් පිරිසක් උසස් පෙළ සමතුන් බවට පත්වේ. මේ අතරින් බොහෝ සිසුන් සිය උසස් අධ්‍යාපනය කීර්තිමත් අධ්‍යාපනායතන මගින් ලබාගැනීමට කැමති වේ. කීර්තිමත් උසස් අධ්‍යාපනායතනයක් තෝරාගැනීම යනු ස්ථාවර සහ ඉදිරි ගමනක් සහිත රැකියාවක් හිමිකරගැනීමට මෙන්ම වෘත්තීය සාර්ථකත්වය උදෙසාද ශක්තිමත් අඩිතාලමකි.

දත්ත විශ්ලේෂණය හා කෘත්‍රිම බුද්ධියේ දියුණුවත් සමග වර්තමානය වන විට මූලික රැකියා බොහොමයක් තාක්ෂණය විසින් පවරාගනු ලබයි. එවැනි වටපිටාවක, වෘත්තීය අනාගතයක් සහිත හොඳ රැකියාවක් අත්කරගැනීමේ අවස්ථාව ඇත්තේ වේගයෙන් පරිනාමය වෙමින් පවතින තාක්ෂණයේ ඉල්ලුමට මුහුණදිය හැකි සිසුනට පමණි.

මේ බැව් පසක්කර ගනිමින්, 159,000කට අධික සේවක පිරිසක් සහිත ඇමෙරිකානු ඩොලර් බිලියන 10කට අධික ඉපැයුම් සහිත ගෝලීය තාක්ෂණ සමාගමක් වන HCL විසින් මෙරට උසස් පෙළ අවසන් කළ සිසුන් සඳහා HCL TechBee නමින් පූර්ව වෘත්තීය වැඩසටහනක් ඉකුත්දා දියත්කරන ලදි.

අදාළ පාඨමාලා ලාභීන් හට මේ යටතේ මාස 12ක පන්ති කාමර ආශ්‍රිත පුහුණුවක් සහ රැකියා ස්ථාන අනුබද්ධිත (ආධුනිකත්ව) පුහුණුවක් පිරිනැමේ. මෙය සාර්ථකව හදාරා අවසන් කරන සිසුන් වෙනුවෙන්, ගෝලීය තාක්ෂණික සේවා දැවැන්තයකු වන HCL යටතේ, කර්මාන්ත ප්‍රමිතීන්ට අනුකූල ආරම්භක වැටුපක් සමගින් තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ වෘත්තීන් ඇරැඹිය හැකිවේ.

එසේම HCL හි සේවයේ නියුතුව සිටින අතරතුර ඔවුනට Horizon Campus වෙතින් සිය උසස් අධ්‍යාපනය (විද්‍යාවේදී උපාධිය (BSc) /BIT) හැදෑරීමේ මහඟු අවස්ථාවද හිමිවේ. මෙම, රැකියා අනුබද්ධ අධ්‍යාපන වැඩසටහන මගින්, තමන් රැකියාවක නියුතුව සිටියදී අධ්‍යාපනය ලැබීමේ සංකල්පය ක්‍රියාවට නැංවීමට අවස්ථාව හිමිවන අතර එමගින් ඔවුන් සිය රැකියාවේ භූමිකාව සම්බන්ධයෙන් විශේෂඥයන් බවට පත්වීමේ අවස්ථාවද ලබයි.

නිසි මාර්ගෝපදේශනය හා පුහුණුව සහිත උසස් පෙළ සිසුවකුට ඉංජිනේරුවකු විසින් කරනු ලබන කාර්යය ඉටුකළ හැකිය යන චින්තනයේ පිහිටා මෙම වැඩසටහන පදනම් වී ඇත. 'සම්ප්‍රදාය අතික්‍රමණය කළ' මෙම පෙරළිකාර දෘෂ්ඨිය අනෙකුත් රටවල සාර්ථකව අත්හදා බැලූවකි.

මෙය සම්ප්‍රදායෙන් වෙනස් වන්නේ කෙසේද?

මූලික වශයෙන්ම HCL TechBee පූර්ව වෘත්තීය වැඩසටහන, සිසුනට තොරතුරු තාක්ෂණ වෘත්තීය ගමන් මගේ ජවාධික ආරම්භයක් පිරිනමයි. උසස් පෙළ සිසුවකු සාම්ප්‍රදායික මග ඔස්සේ උපාධිය සම්පූර්ණ කරන විට, TechBee සිසුන් තොරතුරු තාක්ෂණයේ වසර 3ක අත්දැකීම් සමග විද්‍යාවේදී (BSc) /BIT උපාධි වැඩසටහන්වලද නිරතවෙමින් සිටිනු ඇත. දෙවනුව, අදාළ පුහුණු කාලය සිසුන් මූල්‍යමය වශයෙන් ස්වාධීන වනු ඇත. සිය ආධුනිකත්ව කාලය තුළ ආකර්ෂණීය මාසික දීමනාවක් නිවසට රැගෙන යෑමට ඔවුනට අවස්ථාව ලැබේ. පුහුණුව සම්පූර්ණ වීමෙන් අනතුරුව ඔවුනට වයස අවුරුදු 18-19 අවධිය වන විටම කර්මාන්ත ප්‍රමිතීන්ට අනකූල වූ ආරම්භක වැටුපකට හිමිකම් කීමේ අවස්ථාව ලැබේ. ඔවුන් ඒ වන විටත් ඔවුන්ගේ සමකාලීනයන්ට වඩා ඉදිරියෙන් සිටින අතර කල් ඇතිව සිදුකළ ආරම්භයක් සමග දැවැන්ත වෘත්තීය පිම්මක් වෙනුවෙන් මුල් පියවර තබා සිටිනු ඇත.

HCL යනු -

HCL Technologies යනු ඩිජිටල් යුගයට ඔබින සේ තම ව්‍යාපාර ස්ථානගත කරන සමාගම් සඳහා සහය සලසන මිළඟ පරම්පරාවේ ගෝලීය තාක්ෂණ ආයතනයකි. පර්යේෂණ සංවර්ධන පහසුකම් සහ සම-නවොත්පාදන පර්යේෂණාගාර, ගෝලීය බෙදාහැරීමේ හැකියාවන් සමග රටවල් 50ක 159,000 ඉක්මවූ නව්‍ය චින්තනයෙන් යුත් සේවක සමූහයක් සමගින් ඔවුන්ගේ ලෝක ව්‍යාප්ත ජාලය සමන්විත වේ. Fortune 500 හී ඇතුළත් ව්‍යාපාර 250ක් සහ Global 2000හී ඇතුළත් ව්‍යාපාර 650ක් වෙන HCL සිය විශිෂ්ට සේවාවන් සපයනු ලබයි.

Forbes හී 2020 ලොව හොඳම සේවායෝජකයන් අතර 30 වැනි ස්ථානයේ ශ්‍රේණිගත වීමට ඉකුත්දා HCL වෙත හැකියාව ලැබුණි. HCL හී ගෝලීය සංවර්ධන මධ්‍යස්ථානය කොළඹදී නිල වශයෙන් විවෘත කරනු ලැබුවේ අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා සහ ශ්‍රී ලංකාවේ ඉන්දීය මහකොමසාරිස් ගෝපාල් බග්ලේ විසිනි. HCL Technologies හී නිර්මාතෘ, කළමනාකාර අධ්‍යක්ෂ සහ ප්‍රධාන උපායමාර්ග නිලධාරී ශිව් නාඩාර් සහ HCL Technologies හී සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී සී. විජේකුමාර් ද මේ අවස්ථාවට වර්චුවල් ක්‍රමවේදයට පැවැති මෙම විවෘත කිරීමේ උත්සවයට එක්වූහ. මෙරට පිහිටි මෙම HCL කාර්යාලය, එහි ගෝලීය පාරිභෝගික පදනමට සහය වීම සඳහා ලෝක මට්ටමේ යටිතල පහසුකම්, බහු ස්ථර දත්ත හෙවත් multi-layered data සහ භෞතික ආරක්ෂණ ප්‍රටෝකෝල හෙවත් physical security protocols සහ ඉහළම මට්ටමේ පද්ධතිවලින් සමන්විත වේ. HCL සිය අති නවීන මට්ටමේ කාර්යාලයේ සිට මූලික වශයෙන් අවධානය යොමුකරනුයේ, ඉහළම මට්ටමේ ප්‍රධානතම සමාගම් වෙත මිළඟ පරම්පරාවේ විසඳුම් ලබාදීම පිණිසය. TechBee සම්පූර්ණ කරනු ලබන සියලු සිසුන්, ශ්‍රී ලංකාවේ පිහිටි HCL හී ගෝලීය සැපයුම් මධ්‍යස්ථානයෙන්, ඔවුන්ගේ වෘත්තීය ගමන අරඹනු ඇත

මෙම වැඩසටහනට අයැදුම් කළ හැක්කේ කාටද?

2010 හෝ ඊට පසු උසස් පෙළ හදාරා, අවම වශයෙන් මූලික විෂයන් 3 සඳහා සහ ඉංග්‍රීසියි භාෂාව විෂයට 'එස්' (S) සාමාර්ථ සහිතව සමත්වූ අපේක්ෂකයන්ට මේ සඳහා අයැදුම් කළ හැකි අතර ඔවුන් ශ්‍රී ලංකිවේ පුරවැසියන් විය යුතුය. අයැදුම්කරුවන්, HCL CAT නමැති පොදු යෝග්‍යතා පරීක්ෂණයට සහ TechBee වැඩසටහන සඳහා සම්බන්ධ කරගැනීම පිණිස වන ස්ථාවර සම්මුඛ පරීක්ෂණයකට සහභාගී විය යුතුය. වැඩි විස්තර සඳහා www.hclsrilanka.com/techbee වෙබ් අඩවියට පිවිසෙන්න

HCL

උසස් පෙළින් උසස්වීමක්

ඩොලර් බිලියන 10 ක ගෝලීය තාක්ෂණ සමාගමක් සමග IT Engineer කෙනෙක් වෙන්න.

HCL TechBee සමග එක්වන්න.

මොන දේ අවිනිශ්චිත වුණත් ඔබේ අනාගතය අවිනිශ්චිත වෙන්න බැහැ. මේ නිසයි ඔබ A/L වලින් පසුව HCL TechBee මෙහෙයවන පූර්ව වෘත්තීය වැඩසටහන සමග එක්විය යුත්තේ. 159,000 කට අධික සේවක පිරිසකින් සමන්විත ගෝලීය තාක්ෂණ ආයතනයක් මෙන්ම ෆෝබ්ස් මගින් හොඳම සමාගම් 30 අතරට තෝරාගත් සමාගමක් වන HCL සමග සම්බන්ධ වී තොරතුරු තාක්ෂණය ඉගෙනීමට වටිනා අවස්ථාවක් උදාකර ගන්න. Analyst / Software Developer / Test Engineer ලෙස ඔබේ පූර්ණ කාලීන IT වෘත්තිය ශ්‍රී ලංකාව තුළදීම අරඹන්න. HCL සමග ඔබේ වෘත්තිය සාර්ථකව කරගෙන යන අතරතුර මූල්‍යමය ස්වාධීන බව ගොඩනගා ගනිමින් උපාධියද සම්පූර්ණ කරගන්න.

වැඩසටහන් තොරතුරු

- රැකියාව අරමුණු කරගත් පුහුණුවක් සමග 100% ක ශිෂ්‍යත්වයක්
- ආධුනික කාලයේ මාසික දීමනාවක් උපයන්න
- පුහුණුව සම්පූර්ණ කිරීමෙන් පසු පූර්ණ කාලීන IT රැකියාවක් සමග IT රැකියාවක ආරම්භක වැටුපකට සමාන වැටුපක්
- HCL සමග සේවය කරන අතරතුර Horizon Campus සමග BSc(Hons) / BIT (University of Moratuwa) උපාධිය හැදෑරීමට අවශ්‍ය මූල්‍ය පහසුකම HCL සමාගමෙන් ලබාගන්න.

සුදුසුකම්

- 2010 හෝ ඊට පසු වසරක උසස් පෙළ සමත්ව තිබිය යුතුය.
- ප්‍රධාන විෂයයන් සහ ඉංග්‍රීසි සඳහා අවම වශයෙන් S සාමාර්ථ තිබිය යුතුය.
- ශ්‍රී ලාංකික පුරවැසියෙක් විය යුතුය.

TECH BEE™
EARLY CAREER PROGRAM

අවස්ථාව හිමිවන්නේ 150 දෙනෙකුට පමණයි. ඉක්මන් කරන්න. උපදේශන සඳහා අදම ලියාපදිංචි වෙන්න.

අදම ලියාපදිංචි වෙන්න

වැඩි විස්තර දැනගැනීමට අපගේ වෙබ් අඩවියට පිවිසෙන්න. නැතහොත් ඊ මේල් කරන්න.

website: www.hclsrilanka.com/techbee
email: RiseSL@hcl.com
Address: HCL Technologies, Level 2, Alnitak Building, Orion City - IT Park, Colombo - 09

SCAN HERE

USD 10.02 BILLION REVENUE COMPANY

OPERATING IN 50 COUNTRIES

159,000+ IDEAPRENEURS

සිළුමිණ The Silumina

සිප්සයුර

අධ්‍යාපන අතිරේකය

silumina.advt@lakehouse.lk - 011 242 9351 - 071 782 9018

HCL Technologies සිය සය මසක ශ්‍රී ලංකාවේ මෙහෙයුම් අතර කාර්ය මණ්ඩලය 500 සන්ධිෂ්ඨානය සනිටුහන් කරයි

ඇමෙරිකානු ඩොලර් බිලියන 10ක ඉපැයුම් සහිත ගෝලීය තාක්ෂණ සමාගමක් වන එච්.සී. එල් ටෙක්නොලොජීස් (HCL Technologies **හෙවත්** HCL**) සිය ගෝලීය සංවර්ධන මධ්‍යස්ථානය 2020 සැප්තැම්බර් මස ශ්‍රී ලංකාවේදී අරඹන ලද්දේ වසර 3-5ත් අතර කාලයේදී රැකියා 3000ක් නිර්මාණය කිරීම සිය ඉලක්කය බවට නිවේදනය කරමිනි. ඒ උදෙසා සිය කැපවීම පෙරට රැගෙන ගිය** HCL Sri Lanka **ආයතනය අභියෝගාත්මක වූ වසංගත තත්ත්වය මධ්‍යයේ වුව අදාළ පළමු කාර්තු 2 තුළ 500ක් ඉක්මවූ කාර්ය මණ්ඩලයක් සේවයේ පිහිටුවීමට සමත්විය. මෙම රැකියා බහුතරය, යෙදුම් සහ නිෂ්පාදන සංවර්ධනය** (Application & Product Development) **, ඩිජිටල් තාක්ෂණය** (Digital Technologies), **ජාලකරණය සහ ක්ලවුඩ් විසඳුම්** (Networking & Cloud Solutions) **මෙන්ම යටිතල පහසුකම් සේවා ආදී ක්ෂේත්‍රවලට අයත් වේ.**

ලොව විශිෂ්තම සේවායෝජකයන් අතර රැඳීමේ ගෞරවයට පාත්‍ර වූ HCL ඉකුත් දා Forbes විසින් නිකුත් කළ 2020 වසරේ ලොව හොඳම සේවායෝජකයිගේ ලැයිස්තුවේ 30 වැනි තැනට පත්විය.මනා දැක්මකින් යුතුව ක්‍රියාත්මකවන HCL සමාගම විසින් නිපුණතා සංවර්ධනය සඳහා රජයේ දැක්ම වෙනුවෙන් සිය සහය දැක්වීමේ එක් අංශයක් ලෙසින් HCL TechBee නමින් උසස් පෙළ අවසන් කළ සිසුන් වෙනුවෙන් පූර්ව වෘත්තීය වැඩසටහනක් දියත් කරනු ලබයි. මෙම වැඩසටහනේදී තොරාගත් අපේක්ෂකයින්ව තොරතුරු තාක්ෂණ උපාධිධාරීන් වීමට සුදුසු අනාගතයට ඔබින තොරතුරු තාක්ෂණ දැනුමකින් සන්නද්ධ කරනු ලැබේ. මෙම එක් අවුරුදු පාඨමාලාවේදී අදාළ අපේක්ෂකයන් විසින් මෘදුකාංග ඉංජිනේරුවකු/ විශ්ලේෂකයකු වීම පිණිස ආධුනිකත්ව පුහුණුවක් ලබාගනු ඇත.

TechBee වැඩසටහනේ විශේෂ කරුණු

- මෙම වැඩසටහන සඳහා ඇතුළත් වීමට මූලික සුදුසුකම් සපුරනු ලබන සිසුන් ඔන්ලයින් හෙවත් මාර්ගගත ක්‍රමවේදයට පවත්වනු ලබන HCL CAT නමැති වෘත්තීය යෝග්‍යතා පරීක්ෂණයකට මුහුණ දිය යුතු වේ. HCL CAT යනු ගණිතමය සංඛ්‍යාත්මක අපෝහණය (Quantitative Reasoning -Mathematics), තර්කානුකූල අපෝහණය (Logical Reasoning) සහ ඉංග්‍රීසි භාෂාව යන විෂයන්හි ඔබගේ යෝග්‍යතාව මැන බැලීම උදෙසා නිර්මාණය කර ඇති මාර්ගගත තරු පරීක්ෂණයකි (online assessment test).
- TechBee සඳහා තෝරාගන්නා සිසුන් හට සජීවී HCL ව්‍යාපෘති සඳහා වන තම සීමාවාසික පුහුණුව තුළ දීමනාවක් පිරිනැමෙනු ඇත.
- TechBee වැඩසටහන සම්පූර්ණ කරන අපේක්ෂකයන් HCL හි පූර්ණකාලීන සේවකයන් බවට පත්වනු ඇති අතර, උසස් අධ්‍යාපන, සෞඛ්‍ය මෙන්ම සේවක සුබසාධන වැඩසටහන් මාලාවක ප්‍රතිලාභ සහ වෘත්තීය ප්‍රගතියක් අත්විඳීමේ අවස්ථාව ඔවුන් වෙත හිමිවේ.
- අදාළ අපේක්ෂකයා HCL හී පූර්ණකාලීන සේවකයකු බවට පත්වීමෙන් අනතුරුව ඔහුට හෝ ඇයට Horizon Campus හි සිය උපාධි අධ්‍යාපනය පෙරට රැගෙන යා හැකිය.
- https://hclsrilanka.com/techbee/ වෙබ් අඩවිය මගින් සිසුනට TechBee වැඩසටහන සඳහා ඉල්ලුම් කළ හැකිය.

“තරුණ සිසුන් පුහුණු කිරීමට සහ බඳවා ගැනීම වෙනුවෙන් HCL හි TechBee පූර්ව වෘත්තීය වැඩසටහන දියත් කිරීමට හැකිවීම ගැන අතිශයින් සතුටට පත්වෙනවා' යැයි පවසන HCL Technologies හි සමූහ උප සභාපති සිරිමතී ශිවශංකර් 'අනාගතය නියෝජනය කරන්නේත් තාරුණ්‍යය විසිනුයි. තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණයේ තනතුරු වෙනුවෙන් ඇති ගෝලීය ඉල්ලුම සපුරාලිය හැකි හොඳම ක්‍රමවේදය නිපුනත්වයයි. TechBee යනු පෙරළිකාර නිපුනතා වැඩසටහනක් වගේම, මෙම නිපුනතා වැඩසටහන්, ශ්‍රී ලංකාව තුළ නිපුනත්වයෙන් හෙබි සහ වෘත්තීය හැකියාවන්ගෙන් යුත් කුසලතා සංචිතයක් බිහි කිරීමේ අප අපේක්ෂාවේ පොරොන්දු පත්‍රයක්. TechBee වලට අමතරව, HCL හි ශ්‍රී ලංකාවේ බෙදාහැරීමේ මධ්‍යස්ථානය සඳහත් මෙරටින් බඳවාගැනීම් සිදුකරනවා. මේ වන විට අපි 500කට අධික පිරිසක් බඳවාගෙන සිටිනවා. ඉදිරි වසරවලදී අපගේ ව්‍යාපාර මෙහෙයුම්වල නිපුනත්වය සහ පරිමාණය වර්ධනය කරමින් රටට පිරිනැමීමට නියමිත අවස්ථා පිළිබඳව අතිශයින් සතුටට පත්වෙනවා වගේම මෙය මැනවින් වර්ධනනය වනු ඇතැයි අපි බලාපොරොත්තුවෙනවා.

ශ්‍රී ලංකාවේ ජාතිය ගොඩනැගීමේ ක්‍රියාකාරම්වලට දායකවීමට අපි බලාපොරොත්තු වනවා වගේම ඉදිරි වසරවලදී Horizon Campus සමග එක්ව කටයුතු කිරීමටත් බලාපොරොත්තුවෙනවා' යිද පැවසුවාය.

ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන් උදෙසා සුදුසු වෘත්තීය පරිසරයක් බිහිකිරීමේ කටයුත්තේ දී HCL විසින් දක්වන ලද කැපවීම දැකගැනීමට ලැබීම මට මහත් ආඩම්බරයක්. HCL වැනි ගෝලීය සන්නාමයක්, කලාපයේ ශක්තිමත් මානව ප්‍රාග්ධනයක් බිහි කිරීමේ අප රජයේ දැක්ම හා අනුගත කරමින් ඔවුන්ගේ වැඩසටහන් පෙළගැස්වීම සතුටට කරුණක්” යනුවෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සභාපති සංජය මොහොට්ටාල මහතා පැවසීය.

ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය

ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය 1979 වසරේ සිට ක්‍රීඩා අධ්‍යාපන ක්ෂේත්‍රයේ පාඨමාලා පවත්වනු ලබන ප්‍රමුඛ ආයතනය වේ.

ක්‍රීඩා අධ්‍යාපන පාඨමාලා සඳහා අයදුම්පත් කැඳවීම - 2021

ශාරීරික යෝග්‍යතා උපදේශක පාඨමාලාව - (NVQ - 04)

වර්තමානයේ ශ්‍රී ලාංකික ජනතාව අතර උද්ගත වී ඇති ඛෝනොවන රෝග පාලනය කිරීම පිණිස ව්‍යායාම් කිරීම් සඳහා නිවැරදි උපදෙස් ලබාදිය හැකි විද්‍යාත්මක දැනුම් හා ප්‍රායෝගික කුසලතා සහිත ශාරීරික යෝග්‍යතා උපදේශකයින් පුහුණු කිරීමේ අරමුණින් මෙම පාඨමාලාව පැවැත්වේ.

මෙම පාඨමාලාව ජාතික වෘත්තීය සුදුසුකම් 04 මට්ටමට (NVQ - 04) අනුකූලව පවත්වනු ලබන අතර පාඨමාලාව හැදෑරීම තුලින් ව්‍යායාම් මධ්‍යස්ථානයන හි ශාරීරික යෝග්‍යතා උපදේශකවරයකු ලෙස සිය වෘත්තීය කටයුතු ආරම්භ කිරීමට හැකිවේ .

පාඨමාලා කාලය : මාස 12 සෙනසුරාදා හෝ ඉරිදා දිනවලදී ප.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා පාඨමාලාව පැවැත්වේ.)

පාඨමාලා ගාස්තු : රු. 20,000 .00

පාඨමාලා මාධ්‍ය : සිංහල / ඉංග්‍රීසි

පාඨමාලාව සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් : අ.පොස.ස. සාමාන්‍ය පෙළ විභාගය සමත්වීම සහ ක්‍රීඩා පසුබිමක් තිබීම.

වැඩිදුර තොරතුරු : පාඨමාලා සම්බන්ධීකාරක 011 2684921 දිගුව 234

පුහුණුකරු කුසලතා සංවර්ධන පාඨමාලාව

ශ්‍රී ලංකාවේ පුහුණුකරුවන්ගේ ක්‍රීඩා දැනුම සහ කුසලතා සංවර්ධනය කිරීම සඳහා මෙම පාඨමාලාව පවත්වනු ලබන අතර මෙම වසරේදී **අත්පන්දු, පාපැදි ක්‍රීඩාව, සවාට් නික් බොක්සිං (Savate kick Boxing)** පාපන්දු, දැල්පන්දු, වොලිබෝල් සහ ගොනී යන ක්‍රීඩා සඳහා වන පාඨමාලාවන්ට අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම පාඨමාලාව සාර්ථකව හදාරා අවසන් කරන පුහුණුකරුවන් ශ්‍රී ලංකාවේ අදාළ ක්‍රීඩාවේ පුහුණුකිරීම් සඳහා සුදුසුකම්ලත් ක්‍රීඩා පුහුණුකරුවන් ලෙස සළකනු ලබන අතර එම පුහුණුකරුවන් මෙම අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි කර **“පුහුණුකරු ලියාපදිංචි සහතිකය” නිකුත් කිරීමටද කටයුතු කෙරේ.**

පාඨමාලා කාලය : මාස 03 (සෙනසුරාදා හෝ ඉරිදා දිනවලදී ප.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා පාඨමාලාව පැවැත්වේ.)

පාඨමාලා ගාස්තු : රු. 5,000 .00

පාඨමාලා මාධ්‍ය : සිංහල / ඉංග්‍රීසි

පාඨමාලාව සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් :

1. පුහුණු කරනු ලබන ක්‍රීඩාවට අදාලව අදියර පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම.
2. පුහුණුකරුවෙක් ලෙස වසර 05ක පළපුරුද්ද.
3. ජාතික/ජාත්‍යන්තර/පළාත්/දිස්ත්‍රික් මට්ටමේ ජයග්‍රහණ අත්කරගත් ක්‍රීඩකයින් පුහුණුකර තිබීම.

වැඩිදුර තොරතුරු : පාඨමාලා සම්බන්ධීකාරක 011 2684921 දිගුව 241

ක්‍රීඩා විද්‍යා සහතික පත්‍ර පාඨමාලාව - අදියර I

ව්‍යාවසායමය ක්‍රීඩා පුහුණුකරුවකු ලෙස සාර්ථකත්වය වෙත ලඟාවීමට අපේක්ෂා කරන පුහුණුකරුවන්ට (ආයතනගත හා ස්වේච්ඡා පුහුණුකරුවන්) ක්‍රීඩාවට අදාල නූතන තාක්ෂණික දැනුම ලබාදීමේ අරමුණින් මෙම පාඨමාලාව පැවැත්වෙන අතර ෆෙස්බෝල්, කබඩි සහ මල්ලවපොර යන ක්‍රීඩාවන්ට අදාල පාඨමාලා සඳහා අයදුම්පත් කැඳවේ.

පාඨමාලා කාලය : සති 06 (පැය 60කි. - සතියට දින 02 හෝ 03 බැගින් ප.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා පාඨමාලාව පැවැත්වේ.)

පාඨමාලා මාධ්‍ය : සිංහල / ඉංග්‍රීසි

පාඨමාලා ගාස්තු : රු. 7,000.00

පාඨමාලාව සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් :

1. විවාහ මට්ටමේ නම්, දිස්ත්‍රික් ප්‍රථම, දෙවන හෝ පළාත්, ජාතික තරඟයක නම් ප්‍රථම, දෙවන හෝ තෙවන ස්ථාන දිනාගත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් වීම හෝ එම ක්‍රීඩක ක්‍රීඩිකාවන් පුහුණුකර තිබීම,
   හෝ
2. පාසල් මට්ටමේ නම්, කලාප ප්‍රථම, දෙවන හෝ පළාත්, ජාතික තරඟයක නම් ප්‍රථම, දෙවන හෝ තෙවන ස්ථාන දිනාගත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් වීම හෝ එම ක්‍රීඩක ක්‍රීඩිකාවන් පුහුණුකර තිබීම,
   හෝ
3. ජාතික ක්‍රීඩා විද්‍යා ආයතන විසින් පිරිනමන ක්‍රීඩා විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව සමත්ව තිබීම.

ක්‍රීඩා විද්‍යා සහතික පත්‍ර පාඨමාලාව - අදියර II

ක්‍රීඩා පුහුණුකරුවන් සඳහා නිවැරදි නූතන තාක්ෂණික දැනුම වැඩිදුරටත් ලබාදීමේ ඉදිරි පියවරක් ලෙස ෆුට්බෝ, බැඩ්මින්ටන් සහ වොලිබෝල් යන ක්‍රීඩාවන්ට අදාලව පාඨමාලා පැවැත්වීමට නියමිතය.

පාඨමාලා කාලය : සති 12 (පැය 120 - සතියට දින 02 හෝ 03 බැගින් ප.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා පාඨමාලාව පැවැත්වේ.)

පාඨමාලා මාධ්‍ය : සිංහල / ඉංග්‍රීසි

පාඨමාලා ගාස්තු : රු. 10,000.00

පාඨමාලාව සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් :

1. ක්‍රීඩා විද්‍යා සහතික පත්‍ර පාඨමාලාව - අදියර I (ෆුට්බෝ, බැඩ්මින්ටන් සහ වොලිබෝල්) සමත්ව තිබීම,
   හෝ
2. ජාතික ක්‍රීඩා විද්‍යා ආයතන විසින් පිරිනමන ක්‍රීඩා විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව සමත්ව තිබීම.
   සහ
3. ජාතික/පළාත්/දිස්ත්‍රික්ක මට්ටමේ ජයග්‍රහණ අත් කරගත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් පුහුණුකර තිබීම.

වැඩිදුර තොරතුරු : පාඨමාලා සම්බන්ධීකාරක 011 2684921 දිගුව 236

වැදගත් : මෙම පාඨමාලාවන් සඳහා බඳවා ගැනීමේදී ඉල්ලුම් කර ඇති සුදුසුකම් වලට අමතරව ඉදිරිපත් කරනු ලබන ඉහළ දක්ෂතා සහ ක්‍රීඩා අධ්‍යාපන සුදුසුකම් සඳහා ප්‍රමුඛතාවක් හිමිවේ.

අයදුම්පත් එවියයුතු ආකාරය

සියළුම පාඨමාලා සඳහා අයදුම්පත් www.niss.gov.lk වෙබ් අඩවියෙන් හෝ සතියේ දිනවල පෙ.ව. 9.00 සිට ප.ව.4.00 දක්වා ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය වෙත පැමිණ ලබාගත හැක. **සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2021 අප්‍රේල් මස 28 දිනට හෝ ඊට පෙර, අධ්‍යක්ෂ, ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය, 100/7, නිදහස් මාවත, කොළඹ 07** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

සැලැ : අයදුම්පත බාහිරවන කවරයේ වම්පස ඉහල කෙළවරේ අයදුම්කරන පාඨමාලාව/ ක්‍රීඩාව සඳහන් කළ යුතුය.

අධ්‍යක්ෂ, ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය, 100/7, නිදහස් මාවත, කොළඹ 07.

දුරකථන : 011 2684921 ෆැක්ස් : 011 2667709 වෙබ් අඩවිය : www.niss.gov.lk

අමතන්න
ඔබගේ අධ්‍යාපනික ලිපි හා දැන්වීම් සඳහා
011-2429351
සිළුමිණ දැන්වීම් අංශය

ශ්‍රී ලංකා - ජර්මානු පුහුණු ආයතනය

නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය

german cooperation
DEUTSCHE ZUSAMMENARBEIT

2021 වර්ෂය සඳහා ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයට ඇතුලත් කර ගැනීමට පහත සඳහන් අවම සුදුසුකම් සපුරා ඇති ස්ත්‍රී / පුරුෂ දෙපක්ෂයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

1. **(අ) වයස :** 2021.04.30 වැනි දිනට අවුරුදු 16 ත් 24 ත් අතර විය යුතුය.

(ආ) අධ්‍යාපන සුදුසුකම්:
අ.පොස (සා/පෙළ) විභාගයේ දී (අධ්‍යයන මාධ්‍යය අනුව) සිංහල/දෙමළ භාෂාව සහ ගණිතය ඇතුළු විෂයයන් 06 ක් එකවර සමත්වීම

හෝ

ලන්ඩන් සාමාන්‍ය පෙළ විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය ඇතුළු විෂයයන් 06 ක් එකවර සමත්වීම

හෝ

අදාල ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 3 සහතිකය.

විශේෂ කුෂලතා:
විදුලි/විද්‍යුත්/යාන්ත්‍රික යන ක්ෂේත්‍රයකින් නව නිර්මාණ ඉදිරිපත් කර නව නිපැයුම්කරුවන්ගේ කොමිසම මගින් පවත්වන පලාත් මට්ටමේ තරග වලින් ප්‍රථම ස්ථාන 3 අතරට පැමිණ සහතික ලබා ඇති හෝ ඉහත ක්ෂේත්‍රයන්ගෙන් ජාතික මට්ටමේ තරග වලින් කුසලතා සහතිකයක් හෝ ඊට ඉහල ජයග්‍රහණයක් ලබා ඇති අය ඉහත (ආ) සුදුසුකම දෙවරකට නොවැඩි වාර ගණනකදී සම්පූර්ණ කිරීම ප්‍රමාණවත්ය .

(ඇ) සැයු. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය සමඟ වසර 02 ක් හෝ වැඩි කාලයකට දැනට ගිවිසුම්ගත අය මේ සඳහා ඉල්ලුම් නොකල යුතුය.

2. **පාඨමාලා මාධ්‍යය**
මෙහි සියලුම පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. අ.පොස. (සාමාන්‍ය පෙළ) දක්වා ඉංග්‍රීසි දැනුම පාඨමාලා හැදෑරීමට ප්‍රමාණවත් වේ. අභ්‍යාසලාභීන්ගේ ඉංග්‍රීසි දැනුම වැඩි දියුණු කිරීම සඳහා විශේෂ ඉංග්‍රීසි පන්ති පවත්වනු ලැබේ.

3. **ඇතුලත් කර ගැනීමේ පරීක්ෂණය**
අවශ්‍ය අවම සුදුසුකම් සපුරා ඇති හා අංක 04 සඳහන් විභාග ගාස්තු ගෙවා ඇති අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයක් සඳහා කැඳවනු ලැබේ.
(අ) පවත්වන මාධ්‍යය: සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි
(ආ) විභාග මධ්‍යස්ථාන:
අයදුම්පතේ දක්වා ඇති පරිදි ඇතුළත් කිරීම සඳහා ලිඛිත විභාගයක් කිලිනොච්චි, කොළඹ, මහනුවර සහ මඩකලපුව යන මධ්‍යස්ථානවල පවත්වනු ලැබේ.

විශේෂිත මධ්‍යස්ථානවල ප්‍රමාණවත් අපේක්ෂකයින් සංඛ්‍යාවක් නොමැති නම්, අපේක්ෂකයින්ගේ අභිමතය පරිදි එවැනි අයදුම්පත් ලබා දීමෙන් මධ්‍යස්ථාන වෙනස් කිරීමේ අයිතිය කළමණාකාරිත්වයට ඇති බව කරුණාවෙන් සලකන්න.

විභාගයට අදාල විෂයයන්:
විභාගය ගණිතය, සාමාන්‍ය දැනුම, බුද්ධි පරීක්ෂණය, තාක්ෂණික දැනුම, ඉංග්‍රීසි දැනුම සහ තාක්ෂණික ඇඳීම් පදනම් කරගත් ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.

4. **විභාග ගාස්තු:**
විභාග ගාස්තු වශයෙන් අයදුම්කරුවන් රුපියල් පන්සියයක් (රු.500/-) ගෙවිය යුතුය. බැංකුවේ ගෙවීම් වවුචරය අයදුම්පතට අමුණා තිබිය යුතුය. අයදුම්පත බැංකුවේ ගෙවන වවුචරය සමඟ ඉදිරිපත් කළ යුතුය.

ගෙවීම: කිලිනොච්චි ශාඛාවේ පවත්වාගෙන යනු ලබන ගිණුම් අංක 048-1-001-8-0086726 වෙත බැර කරන ශ්‍රී ලංකා ජර්මානු පුහුණු ආයතනයේ ගණකාධිකාරිවරයාට හෝ ඕනෑම මහජන බැංකු ශාඛාවකට ගෙවිය හැකිය. අඩුය හෝ මකා දැමූ වවුචර ගෙවීම් පිළිගනු නොලැබේ. වටිනාකමට ණය වවුචරයක් නොමැති අයදුම්පත ප්‍රතික්ෂේප කරනු ලැබේ. විභාගයට පෙනී නොසිටින අපේක්ෂකයින්ට හෝ වෙනත් හේතුවක් නිසා අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමෙන් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

5. **මූලික තෝරාගැනීම:**
ලිඛිත පරීක්ෂණයෙන් ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් ප්‍රමුඛතා පදනම මත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එම පරීක්ෂණයට අයදුම්කරුවන් කැඳවීමේදී අඩු පහසුකම් සහිත පළාත් සඳහා තෝරා ගැනීමේ ලකුණු මට්ටම SLGTI කළමණාකාරිත්වය විසින් තීරණය කරනු ලැබේ. වරප්‍රසාද (අඩු පහසුකම් ඇති ප්‍රදේශ ලෙස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව නිර්දේශ කරනු ලබන පළාත් පමණක් සලකනු ලැබේ)

6. **අවසන් තෝරා ගැනීම**
සම්මුඛ පරීක්ෂණයෙන් වැඩිම ලකුණු ලබාගත් අය අවසාන තේරීම සඳහා සලකා බලනු ලැබේ. විෂය බාහිර ක්‍රියාකාරකම් විශේෂයෙන් සලකා බලනු ලැබේ.

තෝරාගත් අපේක්ෂකයින්ට වෛද්‍ය පරීක්ෂණයකට යාමට සිදු වන අතර වෛද්‍ය පරීක්ෂණයෙන් අසමත් වන අය අත්හිටවනු ලැබේ.

7. **පුහුණු පාඨමාලා (NVQ මට්ටම 4)**

අනු අංකය	පාඨමාලා	කාලසීමාව
1.	මෝටර් කාර්මික ශිල්පය	අවුරුදු 02
2.	ස්වයංක්‍රීය විදුලි ශිල්පය	අවුරුදු 02
3.	බල විදුලි ශිල්පය	අවුරුදු 02
4.	වායු සමීකරණ /ශීතකරණ ශිල්පය	අවුරුදු 02
5.	ඉලෙක්ට්‍රොනික් ශිල්පය	අවුරුදු 02
6.	යාන්ත්‍රණ ශිල්පය	අවුරුදු 02
7.	පෑස්සුම් ශිල්පය	අවුරුදු 02
8.	බේකරි	අවුරුදු 02
9.	රසායනාගාර තාක්ෂණ ශිල්පය	අවුරුදු 02
10.	සහකාර ප්‍රමාණ සමීක්ෂක	අවුරුදු 02
11.	කොටුම්පත්කරු	අවුරුදු 02
12.	ඉදිකිරීම් සුපරීක්ෂක	අවුරුදු 02
13.	මැනුම් ක්ෂේත්‍ර සහකාර	අවුරුදු 02
14.	තොරතුරු සන්නිවේදන තාක්ෂණ ශිල්පය	අවුරුදු 02
15.	පරිගණක දාඩාංග සහ ජාල තාක්ෂණ ශිල්පය	අවුරුදු 02

මෙම පුහුණු පාඨමාලා හැදෑරීමට අවස්ථාව ලබා දෙනුයේ මූලික පුහුණු පාඨමාලාව අවසානයේ පැවැත්වෙන වෘත්තීය තෝරා ගැනීමේ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවයන් අනුවය.

8. **ගිවිසුම් අත්සන් කිරීම:**
ආයතනය පුහුණුවට තෝරා ගනු ලබන සියලුම අයදුම්කරුවන් ලැබෙන වෘත්තීන්ට අදාලව අවුරුදු දෙකක් (02) හෝ පාඨමාලාව සාර්ථකව හදාරන බවට මෙම ආයතනය සහ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය සමඟ ගිවිසුමකට එළඹිය යුතුය.

9. **අයදුම්පත්**
www.slgti.com වෙබ් අඩවියේ දක්වා ඇති ආදර්ශ අයදුම්පතට අනුව තම අයදුම්පත්‍රය පිළියෙල කර ගත යුතු අතර මගින් අයදුම්පත්‍රය සමඟ පහත දැක්වෙන සහතික වල ඡායා පිටපත් ද අමුණා එවීම අනිවාර්ය වේ.
(අ) උප්පැන්න සහතිකය
(ආ) අධ්‍යාපන සහතික
(ඇ) විශේෂ කුසලතා යටතේ අයදුම් කරන අයදුම්කරුවන් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන පළාත් / ජාතික මට්ටමේ තරඟ සහතිකය ඉදිරිපත් කළ යුතුය.

අයදුම්පත් එවීමේදී ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ පූර්ණ කාලීන ආධුනිකයින් බඳවා ගැනීම - 2021 යනුවෙන් සඳහන් කල යුතුය.

අයදුම්පත් ලබා ගැනීම
- අයදුම්පත් www.slgti.com දරන ආයතනීය වෙබ් අඩවියෙන්
- ආයතනයට පැමිණීමෙන්

10. **අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය:**
අයදුම්පත් 2021.04.30 වන දින හෝ එදිනට ප්‍රථම ලැබෙන සේ කළමණාකාර පරිපාලන හා මානව සම්පත් වෙත ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට එවිය යුතුය.
අධ්‍යක්ෂක / විදුහල්පති, ලංකා ජර්මානු පුහුණු ආයතනය, අරිවියල් නගර්, කිලිනොච්චි.

11. **විභාග ප්‍රවේශපත්‍ර**
සුදුසුකම්ලත් අයදුම්කරුවන් සඳහා ලිඛිත විභාගයට අදාල විභාග ප්‍රවේශපත්‍ර **2021.05.17** දින වනවිට ලැබීමට සලස්වන අතර ඒ වනවිටත් ප්‍රවේශපත්‍ර නොලැබුණු අයදුම්කරුවන් වේනම් එදින සිට දින 14 ක් ඇතුලත පහත දුරකථන අංකයෙන් විමසිය යුතුය.

"නිපුණතා සිසු සවිය" යෝජනා ක්‍රමය යටතේ පුහුණුවත්තන්ගේ පැමිණීම අනුව මසකට රුපියල් හාරදහසක දීමනාවක් ගෙවනු ලැබේ.
වෙනත් පළාත්වලින් පැමිණෙන අභ්‍යාසලාභීන්ට නවාතැන් පහසුකම් සපයනු ලැබේ.

අධ්‍යක්ෂක / විදුහල්පති,
ශ්‍රී ලංකා - ජර්මානු පුහුණු ආයතන,
අරිවියල් නගර්, කිලිනොච්චි
දුරකථන - 0214927799

SLGTI SRI LANKA GERMAN TRAINING INSTITUTE KILINOCHCHI

giz Deutsche Gesellschaft für Internationale Zusammenarbeit (GIZ) GmbH

සිළුමිණ The Silumina

සිප්සයුර

අධ්‍යාපන අතිරේකය

silumina.advt@lakehouse.lk - 011 242 9351 - 071 782 9018

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ රාජ්‍ය අංශය (APFASL) මගින් රාජ්‍ය මූල්‍ය කළමනාකරණය ශක්තිමත් කිරීම සඳහා තබා ඇති ආරම්භය

රාජ්‍ය මූල්‍ය කළමනාකරණය යනු විනිවිධභාවය හා වගකීම සාක්ෂාත් කිරීම සඳහා ආර්ථිකමය වශයෙන් ද, කාර්යක්ෂමව හා ඵලදායි ලෙස ද මූල්‍ය සම්පත් කළමනාකරණය කරන පද්ධතියකි. පාර්ලිමේන්තුව විසින් පවරා දෙනු ලබන අධිකාරී බලය අනුව රාජ්‍ය අංශය රාජ්‍ය නිලධාරීන් මගින් මෙහෙයවනු ලබයි. රාජ්‍ය මූල්‍ය කළමනාකරණය කරමින් වගවීම මුදාහැරීමේ වගකීම අවසානයේ පැවරෙන්නේ එම රාජ්‍ය නිලධාරීන්ටය. ආයෝජන කාර්යයන්ගෙන් ප්‍රමාණවත් පරිදි හා නිසි ලෙස ජනතාවට ප්‍රයෝජනයක් ලබාදීම සඳහා අභ්‍යන්තර පාලනය සහිත පරිසරයක් තුළ නිසි සැලසුම්කරණය, අය – වැය සම්පාදනය, ගිණුම් තැබීම හා වාර්තාකරණය මගින් කාර්යක්ෂමව හා ක්‍රමවත්ව මූල්‍ය සම්පත් මෙහෙයවීම සඳහා මූල්‍ය කළමනාකරණ ශ්‍රිතයන් සම්බන්ධ වේ.

ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශය විවිධ මෙන්ම ඉතා සංකීර්ණ ස්වරූපයක් ගනී.ජාතික ආදායමින් සියයට 60කට තරම් දායකත්වය සපයමින් ජාතික ආර්ථිකය තුළ ප්‍රමුඛ කාර්යභාරයක් මෙම අංශය මගින් ඉටු කරයි. අධ්‍යාපනය, සෞඛ්‍ය, ජල හා විදුලි සම්පාදනය හා වෙනත් අත්‍යවශ්‍ය සුභ සාධක සේවා මහජනතාව වෙත සැපයීමේ දී සෘජුවම සම්බන්ධ වන්නේ රාජ්‍ය අංශයයි. අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා පළාත් පාලන ආයතන, ව්‍යවස්ථාපිත මණ්ඩල, රජය සතු ව්‍යාපාර ආයතන ආදිය එය සතු අස්ථිත්වයන් වේ. රාජ්‍ය වියදම් සඳහා ඇති ඉල්ලුම ඉහළ යන අතර, ලබා ගත හැකි සම්පත් සීමාකාරී වීම නිසා මෙම දෙඅංශය සම්මුඛ වන ලෙස කටයුතු කිරීම ඉතා දුෂ්කර රාජකාරියක් වේ. මේ කරුණු මත රාජ්‍ය අංශය මහජන සේවා සැපයීම සඳහා පොදු සම්පත් කළමනාකරණය කිරීමට ඉතා දුෂ්කර වැයමක නිරතව සිටී.

රාජ්‍ය මූල්‍ය කළමනාකරණය ශක්තිමත් කිරීමේ අවශ්‍යතාව

රාජ්‍ය මූල්‍ය කළමනාකරණය ආර්ථික සංවර්ධනයේ ප්‍රමුඛ අවශ්‍යතාවයකි. එසේ වුවද රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය ඉතා දුර්වල තත්ත්වයක පවතී. මෙම තත්වය හා මුහුණ දී ඇති විවිධ අඩු පාඩු නිසා විශේෂයෙන් නැගී එන ආර්ථික සංවර්ධනය දුර්මුඛව ඇත. රාජ්‍ය අංශය තුළ ඉතා සුළු වෘත්තිකයන් පිරිසක් සේවයේ නියැළීම එයට හේතුවකි. ආයතන මූල්‍ය පද්ධතින්ගෙන් හෙළිවී ඇති පරිදි උපචිත පදනම් ගිණුම් ක්‍රමය මූල්‍ය තත්වයේ හා කාර්ය සාධනයේ ප්‍රශස්ත කළමනාකරණයට ඉවහල් වන අතර, ඒ නිසාම සමහර රටවල් මූල්‍ය පදනම් ගිණුම්කරණයෙන් උපචිත පදනම් ගිණුම්කරණයට මේ වන විටත් සංක්‍රමණය වෙමින් පවතී. රාජ්‍ය අංශය තුළ උපචිත ක්‍රමයට සකස් කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ ඉතා විරලය.ප්‍රගතිශීලී රටවල් යෙදවුම් පාලනය කරන සාම්ප්‍රදායික පාලන ක්‍රමයගෙන් බැහැරව ප්‍රතිඵල හා නිමැවුම් පාලනය කරන ක්‍රමවේදයන් ගැන සැලකිල්ල දක්වයි. තොරතුරු තාක්ෂණය, අභ්‍යන්තර පාලනයේ නව අවශ්‍යතාවයන් හා විගණන හා අවදානම් කළමනාකරණ පරිවයන් රාජ්‍ය විගණකයන් හා ගණකාධිකාරීන් මුහුණ දී ඇති අභියෝගයන් වේ. නවසීලන්තය වැනි ප්‍රතිසංවිධානය අඟය කරන රටවල් මූල්‍ය කළමනාකරණ ප්‍රතිසංවිධාන ආර්ථික සංවර්ධනය ඉහළ නැංවීමට හේතුවන බව මුළු ලොවටම පෙන්වා දී ඇත.

තවදුරටත් කොවිඩ් 19 වසංගතය අපගේ ආර්ථිකය කෙරෙහි ඉමහත් බලපෑමක් කර ඇති අතර, එම අභියෝගයන් ඉසිලිය නොහැකි ලෙස වර්ධනය වී ඇත. රජය විසින් ඇති කරන ලද සහන වැඩපිළිවෙළවල් නිසා රජයේ මූල්‍ය ශ්‍රීතයන්ට ඉහළ ඉල්ලුමක් හටගෙන ඇත. එයට අමතරව ආදායම පහළ ගොස් ඇත. ණය ආපසු ගෙවීමේ කාලයන් පරිණත තත්වයට පත්ව ඇත. සංචාරක හා අපනයන කර්මාන්තය භයානක ලෙස පිරිහීමේ තත්ත්වයට පත්ව ඇත. රුපියලේ අගය ද ක්‍රමයෙන් හීනවී යන අතර, රාජ්‍ය මූල්‍ය ප්‍රදාන රජයටම අභියෝගයක් වී ඇත. මෙම තත්වයන්ට මුහුණ දීමට මූල්‍ය වෘත්තිකයන්ගේ සේවය වඩ වඩාත් මෙම අංශයට අවශ්‍ය වේ.

මෙම පැයේ අවශ්‍යතාව වන්නේ ජාතික සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීමත් එහි ප්‍රතිලාභ උපක්‍රමිකව ග්‍රාමීය හා දුප්පත් ජනතාවගේ බලාපොරොත්තු ඉටුවන ලෙස හැසිරවීමය. ජාතික ගණකාධිකාරී ආයතනයක් ලෙස වර්තමාන තත්වයෙන් රට ගොඩ ගැනීම සඳහා රජය සමඟ ආසන්නව කටයුතු කිරීම අප සතු ප්‍රමුඛ කාර්යයක් ව පවතී.

ජීඩාකාරී ක්‍රමවේදයන් සරල කරමින් ආර්ථික සංවර්ධනය කඩිනම් කිරීම සඳහා රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පද්ධතිවලට ජාත්‍යන්තර පරිවයන්ට අනුව පුනර්ජීවයක් ලබාදීම යුගයේ අවශ්‍යතාවයක් ද වේ. රාජ්‍ය මූල්‍ය පණනක් හඳුන්වාදීම හා රාජ්‍ය මූල්‍ය රෙගුලාසි සංශෝධනය කිරීම මගින් මූල්‍ය කළමනාකරණය යාවත්කාලීන කිරීම දිගුකාලයක සිට අවශ්‍යව පැවති දෙයකි.

රාජ්‍ය අංශයේ අවශ්‍යතා සඳහා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ඇති කරන ලද මූලාරම්භයන්

මෑත කාලය දක්වාම ලෝකයේ වෘත්තිය ගණකාධිකාරී ආයතනයන් සේවය කර ඇත්තේ පෞද්ගලික අංශයේ අවශ්‍යතාවයන් සඳහාය. ජාත්‍යන්තර ගණකාධිකාරී සම්මේලනය (IFAC) හා ආසියා පැසිපික් ගණකාධිකාරී සම්මේලනය (CAPA) ඉහළ ගුණාත්මකභාවයෙන් යුතු මූල්‍ය කළමනාකරණයක් රාජ්‍ය අංශය තුළ ඇති කිරීමේ පරමාර්ථයෙන් වෘත්තිය ගණකාධිකාරී ආයතනවල සම්බන්ධතාවයන් රාජ්‍ය අංශය තුළට ව්‍යාප්ත කිරීමට වගකීමකින් යුතුව කටයුතු කරයි. ගෝලීය වශයෙන් රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් කැපවී වැඩ කරන ලොව ඇති එකම ජාත්‍යන්තර වෘත්තිය ගණකාධිකාරී ආයතනය වන ලන්ඩන්හි වරලත් රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී ආයතනය (CIPFA) රාජ්‍ය අංශය තුළ වෘත්තියභාවය ඇති කිරීම සඳහා වෘත්තිය ගණකාධිකාරී ආයතන සමඟ අතිනත ගෙන කටයුතු කරයි. අප රටේ ප්‍රමුඛතම ගණකාධිකාරී ආයතනය වන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය ද ඔවුන් සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කරමින් රාජ්‍ය මූල්‍ය නිලධාරීන් වෘත්තිකයන් බවට පත් කිරීමට කටයුතු කර ඇත.

මෙම අවබෝධය අනුව වරලත් ගණකාධිකාරී ආයතනය තුළ රාජ්‍ය අංශයක් බිහි කිරීමෙන් ලොවට ආදර්ශයක් ද සපයා ඇත.

රාජ්‍ය අංශය(APFASL) ස්ථාපිත කිරීම

ශ්‍රීලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී සංගමය(APFASL) වරලත් ගණකාධිකාරී ආයතනයේ රාජ්‍ය අංශය වශයෙන් 2012 දී ස්ථාපිත කරන ලදී. එහි දර්ශනය වන්නේ රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේ විශිෂ්ටත්වය සඳහා නායකත්වයක් සැපයීමයි. එහි සාමාජික සාමාජිකාවන් අමාත්‍යාංශ , දෙපාර්තමේන්තු,පළාත් සභා, පළාත් පාලන ආයතන, ව්‍යවස්ථාපිත මණ්ඩල හා රාජ්‍ය ව්‍යාපාර ආදී ආයතනවල මූල්‍ය හා ගිණුම් ශ්‍රීතයන් හි නියැළෙන රාජ්‍ය නිලධාරීන් වේ.15 දෙනකුගෙන් යුතු කළමනාකරණ සභාවක් මගින් එය පාලනය කරයි. එයින් 7 දෙනකු නිල බලයෙන් පත්වන අතර 8 දෙනකු වරලත් ගණකාධිකාරී ආයතනයේ පාලක සභාව විසින් පත් කරන සංගමයේ සාමාජික සාමාජිකාවන් වේ. වරලත් ගණකාධිකාරී ආයතනයේ සභාපති හා උප සභාපති, විගණකාධිපති, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් ,රාජ්‍ය මූල්‍ය අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් හා රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල් නිල බලයෙන් පත්වන සාමාජික සාමාජිකාවන් වේ.

රාජ්‍ය අංශයේ (APFASL) පරමාර්ථ

අ. වෘත්තිය සුදුසුකම් රාජ්‍ය අංශය තුළට දියත් කිරීම

ආ. රාජ්‍ය අංශයට ගිණුම් ප්‍රමිතීන් හඳුන්වාදීම හා මූල්‍ය වාර්තාකරණය දියුණු කිරීම

ඇ. සම්මන්ත්‍රණ, වැඩමුළු,සම්මේලන හා පුහුණු වැඩසටහන් දිවයින පුරා පවත්වමින් ධාරිතා සංවර්ධනය කිරීම

ඈ. රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීන් වෙත නායකත්වය දියුණු කර ගැනීම සඳහා වේදිකාවක් නිර්මාණය කිරීම

ඉ. සාමාජිකත්වය සඳහා අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් පැවැත්වීම

ඊ. රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පරිවයන් වෘත්තියකරණය කිරීමට හා ශක්තිමත් කිරීමට සහයවීම

සාමාජිකත්වය

රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී ආයතනයේ ත්‍රිවිධ සාමාජිකත්වයක් පවතී.

අ. ආශ්‍රීත රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී (APFA)- අවම වශයෙන් වසර දෙකක පළපුරුද්දක් ඇති රාජ්‍ය ගණකාධිකාරීන්, විගණන නිලධාරීන් ,දේශීය ආදායම් නිලධාරීන් හා වෙනත් අනුමත සුදුසුකම් හා පළපුරුද්ද ඇති මූල්‍ය ක්ෂේත්‍රයේ රාජ්‍ය හා අර්ධ රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් මෙයට අයත් වේ.

ආ. අධි සාමාජිකත්ව රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීන් (FPFA)- වසර 10 ක පළපුරුද්ද ඇති ආශ්‍රීත රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීන් මෙයට අයත් වේ.

ඇ. වරලත් රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීන් (CPFA)- මෙම සුදුසුකම කුසලතා පදනම මත හා වරලත් ගණකාධිකාරී ආයතනයේ විශේෂිත විභාග පටිපාටිය අනුව ලබා ගත හැකිය. ආරම්භයේදී වසර 10 ක රාජ්‍ය සේවා පළපුරුද්ද ඇති විෂයානුබද්ධ පශ්චාත් උපාධිලාභී ඉහත අ. හා ආ. හි සඳහන් සාමාජිකයන්ට කුසලතා මත මෙම සුදුසුකම ලබා දී ඇති අතර, මේ වන විට එය විභාග පටිපාටියට සීමා කොට ඇත.

ආයතනික දර්ශනය තුල පරමාර්ථ ඉටු කර ගැනීමට මෙම සංගමය (රාජ්‍ය අංශය) මූලාරම්භ කර ඇති කාර්යයන්:

- ලන්ඩන් වරලත් රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී ආයතනය හා ඒකාබද්ධව ශ්‍රී ලංකාවට වරලත් රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී සුදුසුකම, වරලත් ගණකාධිකාරී ආයතනය මගින් ලබා ගැනීමට කටයුතු කිරීම – මෙය රාජ්‍ය නිලධාරීන්ගේ දැනුම කුසලතාවය හා වෘත්තියභාවය ඉහළ නංවා ගැනීමට හේතුවක් වන අතර, මෙම සුදුසුකම ලබා ගන්නා සාමාජිකත්වයට ලන්ඩන් වරලත් රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීන්ගේ ආයතනයේ සාමාජිකත්වය ද ද්විතිය සුදුසුකමක් වශයෙන් ලබා ගැනීමේ හැකියාව ඇත.
- ජාත්‍යන්තර රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිතීන් (IPSAS) අනුව යමින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිතීන් (SLPSAS) හඳුන්වාදීම හා මූල්‍ය වාර්තාකරණය දියුණු කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම . මේ අනුව ප්‍රමිතීන් 20ක්, වෙළුම් තුනකින් සැකසීම, අනුමත කිරීම හා ප්‍රසිද්ධ කිරීම මුදල් අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධව ඉටුකර ඇත.
- වාර්ෂිකව, වාර්ෂික වාර්තා හා ගිණුම් තරඟාවලියක් පවත්වමින් ජයග්‍රාහක වාර්තා තෝරාගැනීම හා ජයග්‍රාහී ආයතනයන් වෙත ජය සංකේත ප්‍රදානය කිරීම
- දිවයින පුරා ධාරිතා සංවර්ධන වැඩසටහන් පවත්වමින් රාජ්‍ය නිලධාරීන්ගේ ප්‍රමිත්‍යානුකූල දැනුම හා විවිධ මූල්‍ය විෂයයන් පිළිබඳ කුසලතාවය වර්ධනය කිරීම
- අර්ධ වාර්ෂික පුවත් හසුනක් මගින් වැදගත් හා පර්යෂණාත්මක ලිපි පළ කිරීමේ අවස්ථාව රාජ්‍ය සේවකයන්ට ලබාදීම
- රේඛීය අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි පළාත් පාලන ආයතන සඳහා සරල කරන ලද ගිණුම් ප්‍රමිතියක් හා ගිණුම් ක්‍රමයක් සකසා දීම හා ඒ සඳහා පුහුණු කරන්නන් පුහුණු කිරීම
- වර්තමානයේ රාජ්‍ය මූල්‍ය උසස් අධ්‍යාපනයේ ඇති අඩුව පිරිමැසීම සඳහා රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සම්බන්ධ පශ්චාත් උපාධියක් ලබාදීමට අවශ්‍ය සංකීර්ණ යෝජනාවක් අනුමැතිය සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීම

මෙවැනි අඛණ්ඩ සේවාවන් සනිටුහන් කරමින් සිව්වැනි වරටත් රාජ්‍ය අංශයේ වාර්ෂික වාර්තා හා ගිණුම් තරඟාවලියක් පැවැත්වූ අතර, එහි ත්‍යාග ප්‍රදානෝත්සවය 2021 පෙබරවාරි 22 වැනි දින බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්විණි. ලන්ඩන් වරලත් රාජ්‍ය මූල්‍ය ආයතනයේ සාමාජිකත්වය ලැබූ රාජ්‍ය නිලධාරීන්ට එම සහනික පිරිනැමීම ද මෙහිදී සිදුවිය.

වාර්ෂික වාර්තා හා ගිණුම් තරඟාවලිය ආරම්භ කරන ලද්දේ ප්‍රශස්ත මූල්‍ය වාර්තාකරණය රාජ්‍ය අංශය තුළ ප්‍රචලිත කිරීම සඳහා වන අතර, විවිධ රාජ්‍ය ආයතනයන්ගේ එම වාර්තාවල ගුණාත්මය ඉහළ නැංවීමට එය ඉවහල් වී ඇත.

මෙම තරඟාවලියේ ජයග්‍රාහක ආයතනයන් වෙත හා ලන්ඩන්හි රවලත් රාජ්‍ය මූල්‍ය ආයතනයේ සාමාජිකත්වය ලද නිලධාරීන්ට සුභ ප්‍රාර්ථනා කරත අතර, මෙවැනි සේවාන්ගෙන් උපරිම ප්‍රයෝජන ගන්නා ලෙස සියලු රාජ්‍ය ආයතනයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

එක්සත් රාජධානියේ ශ්‍රී ලාංකික සිසුන්ට COVID-19 එන්නත ලබා දෙන බව Study Group සහතික වේ

බ්‍රිතාන්‍ය පුරා මේ වන විට ලබා දෙමින් පවතින COVID-19 වැළැක්වීමේ Pfizer/BioNTech එන්නත් එක්සත් රාජධානියේ උසස් අධ්‍යාපනය හදාරන ශ්‍රී ලාංකික සිසුන්ට ද ලබා ගැනීමේ අවස්ථාව උදා කර දී තිබේ.

COVID-19 වසංගත තත්ත්වය තුළ අන්තර්ජාතික සිසුන්ට සහයෝගය දැක්වීමට සිය කැපවීම ප්‍රකාශ කර ඇති එක්සත් රාජධානි රජය ඒ සඳහා වූ කැපවීම මෙලෙස ප්‍රකාශයට පත් කර ඇත. ඒ අනුව විශ්වවිද්‍යාල අමාත්‍ය මිෂෙල් ඩොනෙලන් වෛරසය පැතිරීම වැළැක්වීම සඳහා හඳුන්වා දී ඇති ප්‍රතිපාදන පිළිබඳව ඉවසීමෙන් කටයුතු කිරීම සම්බන්ධව ලිපියක් මගින් සිසුන්ට ස්තූතිය පළ කර තිබේ. එම ලිපියට අනුව COVID-19 සඳහා වන පරීක්ෂණ හෝ ප්‍රතිකාර සඳහා අයදුම් කිරීමට සිසුන්ගෙන් අය කිරීමක් නොකරන බව ඇය තහවුරු කර ඇත.

බ්‍රිතාන්‍ය රජය විසින් මෙම සමස්ත එන්නත් මාත්‍රාව මිලියන 40 ක් ඇණවුම් කර ඇති අතර එය එරට ජනගහනයෙන් තුනෙන් එකක පිරිසකගේ ප්‍රතිශක්තිකරණය සඳහා ප්‍රමාණවත් වේ. එසේම බ්‍රිතාන්‍ය රජය එන්නත් නිෂ්පාදකයින් කිහිප දෙනෙකු හරහා එන්නත් මාත්‍රා මිලියන 357 කට වැඩි ප්‍රමාණයක් කඩිනමින් ලබා ගැනීමට නියමිතය. මේ අනුව වැඩිහිටි සිසුන් සහ සෞඛ්‍ය අවශ්‍යතා ඇතිව ප්‍රමුඛතා කාණ්ඩවල රැඳි සිටින අයට මෙන්ම එරට රැඳි සිටින අන්තර්ජාතික සිසුන්ට ද සාමාන්‍ය සෞඛ්‍ය සේවාවෙන් මෙම එන්නත ලබා ගැනීමට අවස්ථාව සැලසේ.

එක්සත් රාජධානියේ සහ Study Group හි යුරෝපා සංගම් කළමණාකාර අධ්‍යක්ෂ ජේමිස් පිට්මන් මහතා එන්නත පිළිබඳව නිවේදනය කරමින් මෙසේ අදහස් දැක්වීය. “එළැඹෙන අධ්‍යයන වර්ෂය පිළිබඳව අප ධනාත්මක අපේක්ෂාවක් තබන අතර මෙම ගෝලීය වසංගත තත්ත්වය මනාව අවබෝධ කරගෙන ඉවසීමෙන් කටයුතු කල අපගේ සිසුන්ට ස්තුති කිරීමට මෙය අවස්ථාවක් කරගන්නවා. COVID-19 පාලනය කළ හැකි රෝගයක් බවට පත්කිරීමේ දී ඵලදායී ප්‍රතිකාරයන් සමඟ ඒකාබද්ධව මෙම එන්නත වැදගත් කාර්යය භාරයක් ඉටු කරන අතර එමගින් අපට යථාතත්වයට පත්වීම සඳහා අවකාශය සලසනු ඇත. එලෙස ඉදිරියට ගමන් කිරීමේදී ශ්‍රී ලාංකික සිසුන් විශාල පිරිසකට බ්‍රිතාන්‍ය තුළ අවකාශය සලසා දීමට අපට හැකි වනු ඇත.

බ්‍රිතාන්‍ය සිය අන්තර්ජාතික සිසුන්ට බ්‍රිතාන්‍ය කෙරෙහි පවත්නා ජනප්‍රියත්වය වර්ධනය කරමින් ඇති අතර සිය සුදුසුකම් සපුරා ගැනීමේ අභිලාෂයෙන් යුතුව සිසුන් දහස් ගණනක් ජාත්‍යන්තර මට්ටමේ බ්‍රිතාන්‍ය විශ්වවිද්‍යාල බොහෝ ප්‍රමාණයක් තෝරා ගෙන සිටී. උසස් අධ්‍යාපන සංඛ්‍යාලේඛන ඒජන්සියේ (HESA) 2018/2019 සංඛ්‍යාලේඛනවලට අනුව දැනට එක්සත් රාජධානියේ උපාධි හදාරන විදේශීය සිසුන් ප්‍රමාණය 485,645 කි. ගෝලීය වසංගත තත්ත්වය හමුවේ දේශ සීමා අගුළු දැමිණි. නමුත් එක්සත් රාජධානියේ විශ්වවිද්‍යාල සහ ඔවුන්ගේ ජාත්‍යන්තර අධ්‍යයන මධ්‍යස්ථාන මේ වසරේදී සිසුන්ට මුහුණට මුහුණ ඉගැන්වීම සහ virtual teacher ඉගැන්වීම්වල සම්මිශ්‍රණයක් මගින් ඉගෙනීම් අවස්ථා ලබා දෙන ලදී. ඉදිරියේදී Pfizer/BioNTech එන්නත් ලබා ගැනීමත් සමඟ ශ්‍රී ලාංකික සිසුන්ට ලබන වසර මුලදී නැවත විශ්වවිද්‍යාල වෙත පැමිණීමට ඇති හැකියාව සහතික කිරීම ද අපේක්ෂා කෙරේ.

Red Bull - කැම්පස් ක්‍රිකට් ශ්‍රී ලංකා අවසන් සටනින් කොළඹ සෙන්ට්‍රල් කැම්පස් පිල පරදා ඉම්පීරියල් කොලේජ් පිල ජය වාර්තා කරයි!

covid 19 අභියෝගය හමුවේ නියමිත සෞඛ්‍යාරක්ෂිත උපදෙස් පිළිපදිමින් Red Bull – කැම්පස් ක්‍රිකට් 9 වැනි වරටත් පැවැත්වීමට Red Bull සමත් වුණා. නවක ක්‍රීඩකයන්ට තම සරසවියේ මෙන්ම ජාත්‍යන්තර පිටිය තුළදී තම රට නියෝජනය කිරීමට මෙමගින් අවස්ථාව උදාවනු ඇත.

BRC ක්‍රීඩාංගණයේදී පැවැති Red Bull – කැම්පස් ක්‍රිකට් අවසන් මහා තරගය Central Campus Colombo (CCC) පිල හා Imperial College of Sri Lanka පිල අතර පැවතුණා.

මෙහිදී තියුණු තරගයකින් පසු ඉම්පීරියල් කොලේජ් පිල කඩුලු එකකින් ජය වාර්තා කළා. CCC පිලේ චමින්දු විජේසිංහ තරඟාවලියේ වීරයා ලෙස නම් කෙරුණා. ඔහු තරඟාවලිය පුරා ලකුණු 42 ක් හා කඩුලු 9 ක් ලබාගත්තා.

ඉම්පීරියල් කොලේජ් පිලේ අයේෂ් හර්ෂණ ලකුණු 11 ක් හා කඩුලු 9 ක් ලබාගනිමින් දස්කම් දැක්වූවා.

CCC පිලේ නිපුන් මාලිංග ලකුණු 35 ක් හා කඩුලු 8 ක් ලබාගනිමින් ප්‍රේක්ෂකයන්ගේ අවධානය දිනාගත්තා.

තරුණ ක්‍රීඩකයන්ට ජාත්‍යන්තර තලයේ අත්දැකීම් ලබාගැනීමට Red Bull–කැම්පස් ක්‍රිකට් හොඳ පදනමකි. මේ ඔස්සේ යමින් නුදුරේදීම Red Bull – කැම්පස් ක්‍රිකට් කාන්තා තරඟාවලියක් සංවිධානය කිරීමට රෙඩ්බුල් සැලසුම් සකස් කරමින් සිටී. මෙය මැතකදී ශ්‍රී ලංකා කාන්තා ක්‍රිකට් කණ්ඩායමේ නායිකා චමරි අතපත්තුගේ සංකල්පයක් වන #BigGirlsCan සංකල්පයට සමගාමීව සංවිධානය වන තරඟාවලියකි.

මේ තුළින් අපගේ කාන්තා ක්‍රීඩිකාවන්ට ජාත්‍යන්තර තලයේ බැබළීමට ළඟදීම අවස්ථාව උදාවනු ඇත.

මෙහි පළමු වටයේ තරග කොළඹ බී ආර් සී පිටියේ සහ තර්ස්ටන් පිටියේ පැවති අතර උද්වේගකර අවසන් පූර්ව තරග මාර්තු 13 වැනිදා බී ආර් සී පිටියේ පැවැත්වුණි.

අර්ධ අවසන් පූර්ව වටයේදී Central Campus Colombo (CCC)පිල SAEGIS පිල පරාජය කර ලකුණු 9ක ජයක් ලැබුවා. අවසන් පූර්ව වටයේදී ඔවුන් SLIM පිල හා තරග වැදුණා. SLIM පිල අර්ධ අවසන් පූර්ව වටයට පිවිසියේය SLIT පිල කඩුලු 5 කින් පරාජය කරමිනි. අවසන් පූර්ව වටයේදී CCC පිල SLIM පිල කඩුලු 8 කින් පරාජය කරමින් අවසන් මහා තරගයට පිවිසුණා.

හේෂාන් ධනුෂ්ක CCC පිලේ කැපී පෙනෙන පිතිකරුවා වූ අතර ඔහු ලකුණු 55 ක් ලබා ගත්තා. චමින්ද විජේසිරි හා දේශාන් ප්‍රනාන්දු පන්දු 17 ක් තුළ දී කඩුලු 2 බැගින් බිඳ හෙලූවා. අනෙක් අවසන් පූර්ව තරගය පැවැත්තියේ Imperial College හා ESOFT අතරයි. ACBT පිල පරාජය කරමින් අවසන් පූර්ව වටයට Imperial College පිල තේරුණා. අර්ධ අවසන් පූර්ව වටයේදී KDU පිල ඔවුන් අතින් කඩුලු දෙකකින් පරාජයට පත්වුණා.

ESOFT පිල SLTC පිල පරාජය කරමින් අවසන් පූර්ව වටයට පිවිසුණා. අර්ධ අවසන් පූර්ව වටයේදී ICBT පිලට එරෙහිව ESOFT පිලට ජයග්‍රහණය ප්‍රදානය කෙරුණා.

දෙවැනි අවසන් පූර්ව වටයේ දී Imperial College පිල කඩුලු 5 කින් ජය ගත්තේ ESOFT පිල ඕවර 19.5 කදී දවාලමින්.

Imperial College වෙනුවෙන් සජීත් ප්‍රියාල් ලකුණු 53 ක් හා පවන්ත වීරසිංහ ලකුණු 32ක් රැස් කළා. නෙරංජන වත්තිආරච්චි පන්දු 22 කදී කඩුලු දෙකක් දවා ගත්තා.

ESOFT පිල වෙනුවෙන් රමින්ද විජේසූරිය හා කවිදු ඉරෝෂ් ලකුණු 31 බැගින් ලබාගත්තා. පවන්ත වීරසිංහ හා අයේෂ් හර්ෂණ කඩුලු 3 බැගින් ලබාගත්තා.

මේ අනුව CCC පිල පරාජය කළ ඉම්පීරියල් කොලේජ් පිල මේ වසරේදී ඕමාන් හි පැවැත්වෙන Red Bull – කැම්පස් ක්‍රිකට් ලෝක ශූරතා තරඟාවලිය සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කිරීමට වරම් හිමි වෙනවා.

දේශීය වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනය

කොළඹ විශ්වවිද්‍යාලය

යුනානි මොආලජ්ටි පිළිබඳ එම්ඩී උපාධිය සහ මණ්ඩල සහතිකකරණ තෝරාගැනීමේ පරීක්ෂණය සඳහා අයදුම්පත් කැඳවීම - 2021

1. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2021-05-03
2. විභාගය පැවැත්වෙන දිනය : 2021-06-03
3. (අ) ලියාපදිංචි ගාස්තුව - රු. 1000.00

   (ආ) විභාග ගාස්තුව - රු. 10,000.00

   (රාජ්‍ය නොවන අංශයේ අයදුම්කරුවන්ගෙන් ඉහත ගාස්තුවලට අමතරව 50% ක් අයකරනු ලැබේ.)
4. ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකින් ගිණුම් අංක 84061028 වෙත ලියාපදිංචි ගාස්තුව ගෙවා ගෙවීම් ලදුපත ඉදිරිපත් කිරීමෙන් 2021-03-29 වන දින සිට 2021-05-03 වන දින දක්වා රාජකාරී වේලාවන් තුළ (පෙ.ව. 9.00 - ප.ව. 4.00) බොරැල්ල ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහලේ 5 වන මහලේ දේශීය වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී වෙතින් අයදුම්පත සහ අදාළ අනෙකුත් විස්තර ලබාගත හැකිය.

අධ්‍යක්ෂ,

දේශීය වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනය.

වැලිබල් ෆිනෑන්ස් රන් කාසි ජයග්‍රාහකයෝ

වැලිබල් ෆිනෑන්ස් දියත් කළ රන් ණය ගනුදෙනුකරුවන් සඳහා රන් කාසි පිරිනැමීමේ වැඩසටහනේ පෙබරවාරි මාසයේ ජයග්‍රාහිකාවන්ට ත්‍යාග පිරිනැමීම පසුගියදා පැවැත්විණි.

රන් පවුමක් සඳහා ශ්‍රී ලංකාව තුළ වැඩිම අත්තිකාරම් මුදල ලබා දෙන අතරේම ගනුදෙනුකරුවන්ට මෙලෙස රන් කාසි දිනා ගැනීමට අවස්ථාව උදාකර දී ඇත.

මෙම වැඩසටහනේ මුල්ම රන් කාසි දිනාගැනීමේ වාසනාව උදාවූයේ වැලිබල් ෆිනෑන්ස් කදුරුවෙල ශාඛාවෙන් ගනුදෙනු කළ ඒ.එම්. ෆවුසුල් මසායාට හා ගාල්ල ශාඛාවෙන් ගනුදෙනු කළ කේ.ඩී. මංගලිකා ද සිල්වාටයි.

"අපි සෑමවිටම අපේ ගනුදෙනුකරුවන් වෙනුවෙන් ඉහළම ප්‍රතිලාභයක් ලැබෙන අන්දමේ නවතම මූල්‍ය ක්‍රමවේදයන් අනුගමනය කරනවා වගේම සෑමවිටම ඔවුන්ට උපරිම පහසුකම් සමග ප්‍රසාද තිළිණ ලබාදීමට කටයුතු කරනවා. රන් ණය සඳහා ඉහළ අත්තිකාරම් මුදලක් ලබාදීමත් දිනුම් ඇදීමකින් රන් පවුම් පිරිනැමීමට කටයුතු කිරීමත් මෙයට හොඳම උදාහරණයක්.

වැලිබල් ෆිනෑන්ස් කළමනාකාර අධ්‍යක්ෂ ජයන්ත රන්ගමුව අතින් ජයග්‍රාහිකාවන් රන් කාසි ලබාගත් අවස්ථාව

ගනුදෙනුකරුවන්ගේ විශ්වාසය හා බැඳීම අඛණ්ඩව පවත්වා ගැනීම අත්‍යාවශ්‍ය සාධකයක්. ව්‍යාපාරයක සමබරතාවය පවත්වා ගැනීමට හැකිවන්නේ එවිටයි. " මේ සම්බන්ධව අදහස් දක්වමින් වැලිබල් ෆිනෑන්ස් සමාගමෙහි ප්‍රකාශකයකු පැවසීය.

ෆෙයාෆස්ට් වෙතින් විශේෂ ප්‍රවර්ධන වැඩසටහනක්

ජනතාව දැනුවත් කරමින් ප්‍රජාවේ යහපත වෙනුවෙන් දායක වන ෆෙයාෆස්ට් කණ්ඩායම

මහජනතාවගේ යහපත උදාකර දීම අරමුණු කරගත් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ෆෙයාෆස්ට් ඉන්ෂුවරන්ස් සමාගම කවදත් ප්‍රමුඛත්වය ලබාදෙයි. ෆෙයාෆස්ට් මේ වනවිට නවතම දැනුවත් කිරීමේ වැඩසටහනක් බිම් මට්ටමේ සිට දියත් කර ඇති අතර, මෙය ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට ස්පර්ශ-විරහිත (Contactless) මාධ්‍ය ඔස්සේ ක්‍රියාවට නැංවේ.

ෆෙයාෆස්ට් සමාගමට ආවේණික වූ 'The Fairfirst Way' සංකල්පයේ මූලධර්ම අනුව යමින් සහ සෞඛ්‍ය හා සුරක්ෂිතතාව සම්බන්ධ බලධාරීන්ගේ උපදෙස් පිළිපදිමින්, ජනතාව දැනුවත් කිරීම සඳහා බිම් මට්ටමින් වැඩසටහන් ක්‍රියාවට නැංවීමට ෆෙයාෆස්ට් සමාගම කටයුතු කර තිබේ.

මෙහිදී සෞඛ්‍ය හා සුරක්ෂිතතාවයේ වැදගත්කම, දියුණුව සඳහා තමන්ට වඩාත්ම වැදගත් වන්නා වූ දේවල්වලට රැකවරණය සැලසීමේ වැදගත්කම සහ අභියෝග හමුවේ සුබවාදීව සිතන ආකාරය යනාදිය සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කෙරෙනු ඇත. මීට අමතරව, සමාජයට යහපත සැලසීම සඳහා ෆෙයාෆස්ට් සමාගම දක්වන උනන්දුවෙහි තවත් පියවරක් ලෙස, ශ්‍රී ලාංකිකයන්ගේ ඉදිරිගාමී ජීවිතවලට රැකවරණය සැලසීම සඳහා මාසයක කාලයක් වලංගු පුද්ගල හදිසි අනතුරු රක්ෂණාවරණයක් නොමිලේ ලබාදීමද සිදුකෙරේ. මෙම ප්‍රවර්ධන වැඩසටහන සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබඳව දැනුවත් කිරීම, රථවාහන පරීක්ෂාවන්, ව්‍යාපාර ප්‍රජාවන් සඳහා වන වැඩසටහන් සහ රක්ෂණය පිළිබඳව දැනුවත් කිරීම් යනාදී අංගවලින් සමන්විත වන අතර, දිවයිනේ ප්‍රධාන නගර 24 ක් ආවරණය වන පරිදි දින 30 ක් පුරා එය පැවැත්වෙනු ඇත.

යුනියන් ඇෂුවරන්ස් වෙත ජාත්‍යන්තර සම්මානයක්

යුනියන් ඇෂුවරන්ස්, මෙරට වඩාත්ම නිර්මාණශීලී ඩිජිටල් රක්ෂණ සමාගම සඳහා වූ සම්මානයෙන් පිදුම් ලැබීමට සමත් විය. මීට අමතරව 2021 වසරේ මෙරට වඩාත්ම නිර්මාණශීලී ඩිජිටල් වැඩසටහන සඳහා වූ සම්මානයද යුනියන් ඇෂුවරන්ස් වෙත හිමි වූ අතර, මෙම සම්මාන පිරිනමන ලද්දේ ලොව ප්‍රකට ව්‍යාපාරික හා මූල්‍ය සඟරාවක් වන International Business Magazine මගිනි.

ව්‍යාපාරික මෙහෙයුම් කටයුතු ඩිජිටල්කරණය කිරීම, හැකියාවන් පුළුල් කිරීම සහ පෙරළිකාරී තාක්ෂණයන් භාවිතයට ගැනීම යනාදිය ඔස්සේ රක්ෂණ ක්ෂේත්‍රයේ පූර්ණ ඩිජිටල් පරිවර්තනයේ පෙරමුණ ගැනීම උදෙසා යුනියන් ඇෂුවරන්ස් විසින් ක්‍රියාවට නංවන ලද විවිධාකාර වූ වැඩසටහන් සැලකිල්ලට ගනිමින් මෙම සම්මාන පිරිනමා තිබේ.

යුනියන් ඇෂුවරන්ස් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරි ජූඩ් ගෝමස් මහතා මේ සම්බන්ධයෙන් මෙසේ අදහස් දැක්වීය. "නවීන තාක්ෂණයන් වෙනුවෙන් අප කළ, දූරදර්ශී ආයෝජනයන් මේ වනවිට ඵලදරමින් තිබෙනවා. ඩිජිටල් මෙහෙයුම් ආකෘතියක් වෙත මාරුවීම ඉතාමත් ඉක්මනින් සිදුකිරීමට අපට හැකිවුණා. ඒ ඔස්සේ 500 කට අධික සාමාජික සාමාජිකාවන් පිරිසකට දුරස්ථ ලෙස රාජකාරි කිරීමට අවස්ථාව සැලසීමටත්, ගනුදෙනුකරුවන්ට විශිෂ්ටතම මට්ටමේ මාර්ගගත සේවාවන් පිරිනැමීමට අපට හැකියාව ලැබී තිබෙනවා."

ජූඩ් ගෝමස්
යුනියන් ඇෂුවරන්ස්
ප්‍රධාන විධායක නිලධාරි

නිෂ්පාදන නව්‍යකරණය, සේවා හැකියාවන් සහ බෙදාහැරීම් යනාදී අංශ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව මෙතෙක් යම්තාක් දුරකට පසුපසින් සිටියද යුනියන් ඇෂුවරන්ස් මේ වන විට සාම්ප්‍රදායිකත්වයෙන් මිදී නව්‍යකරණය ඔස්සේ ඉදිරියට යමින් සිටී. තාක්ෂණය සම්බන්ධයෙන් වැඩි උනන්දුවක් දක්වන ගනුදෙනුකරුවන් සහ තාක්ෂණය අතින් තවමත් ප්‍රමාණවත් තරම් දියුණු වී නොමැති රක්ෂණ ක්ෂේත්‍රය අතර පරතරය පියවීම මෙම උත්සාහයේ මූලික ඉලක්කය වී තිබේ.

LMD ශ්‍රේණිගත කිරීම්වලදී මෙරට වැඩිම සම්මාන දිනූ රක්ෂණ සමාගම් අතර අංක 01 ස්ථානයට පැමිණීමට යුනියන් ඇෂුවරන්ස් සමාගම පසුගියදා සමත් විය. එමෙන්ම 2020 වසරේදී වැඩිම MDRT සාමාජිකයන් (Mileion Dollar Round Table achievers) සංඛ්‍යාවක් වාර්තා කරමින් මූල්‍ය උපදේශකවරුන් සඳහා වන වඩාත්ම ගෞරවනීය ජාත්‍යන්තර ඇගයුමට පාත්‍ර වීමටද එම සමාගමට හැකියාව ලැබිණි. ශ්‍රී ලංකාවේ විශාලතම ලැයිස්තුගත සමූහ ව්‍යාපාරය වන ජෝන් කීල්ස් සමූහයේ සාමාජිකයකු වන යුනියන් ඇෂුවරන්ස් සමාගම, බිලියන 18 ක වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණයක්, රු. බිලියන 42 ක ජීවිත රක්ෂණ අරමුදලක් සහ, 2020 දෙසැම්බර් මාසය වන විට 341% ක ප්‍රාග්ධන සප්‍රමාණතා අනුපාතයක් (Capital Adequacy Ratio - CAR) වාර්තා කරගෙන ඇත.

මොරටුව MJF සෙන්ටර් හිදී 27 වැනිදා රාත්‍රී වෙළෙඳපොළක්

මාර්තු 27 වැනි සෙතසුරාදා, පස්වරු 5.30 සිට රාත්‍රී 10 දක්වා මොරටුව කටුබැද්දේ K Zone යාබද, MJF සෙන්ටර් (මෙරිල් ජේ. ප්‍රනාන්දු මධ්‍යස්ථානය), හිදී රාත්‍රී වෙළෙඳපොළක් සහ විවී ආහාර උළෙලක් පැවැත්වීමට ඩිල්මා සමාගම කටයුතු සංවිධානය කර තිබේ.

මෙම රාත්‍රී වෙළෙඳපොළේ පරමාර්ථය වන්නේ, වසංගතයෙන් පීඩාවට පත් වෙළෙඳුන් සඳහා වේදිකාවක් සැපයීම,ඔවුන්ගේ පැරණි ව්‍යාපාරයක් නැවත ආරම්භ කිරීම හෝ චිනෝදාංශයක් එක වර ආදායමක් උපයා ගත හැකි ව්‍යාපාරයක් බවට පත් කිරීමට හෝ අවස්ථාව සලසා දීමයි.

මෙම රාත්‍රී වෙළෙඳපොළට සෑම තරාතිරමකම වෙළෙඳුන් ඇතුළත් වන අතර, ඇතැම් වෙළෙඳුන් වෙනස් හැකියා ඇති අය වන අතර, බිත්තර විකුණන එක් වෙළෙන්දකු රෝද පුටුවේ සිටින අයකු වේ.

උණු උණු කැවුම්, කොකිස් සහ කැවිලි, ආප්ප සහ බාබකියු, වඩේ කරත්ත සහ ඩිල්මා තේ රස විඳීමට මෙහි පැමිණෙන සෑම දෙනාටම අවස්ථාව උදා වේ.

ජාත්‍යන්තර කාන්තා මාසයට සමගාමීව පවත්වන මෙම රාත්‍රී වෙළෙඳපොළේ වෙළෙඳුන්ගෙන් සියයට අනූ පහක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් කාන්තාවන් ය. ඔවුන්ගෙන් ඇතැමකු රැකියා අහිමි වූ අය වන අතර, ඇතැමකු නැවත මෙරටට ගෙන්වා ගැනීමෙන් පසු රැකියා අහිමි වූවන් වේ.

මෙහි වෙළෙඳාමේ එන මවුවරුන් බලාපොරොත්තු වනුයේ කුඩා ව්‍යාපාරයක් අරඹා, ඔවුන්ට අමතර ආදායමක් උපයා ගැනීමට අවස්ථාවක් නිර්මාණය කර ගැනීමටයි. එමෙන්ම, සංගීතය රස විඳීමට සුදුසු යහපත් පරිසරයක් ද එදිනට නිර්මාණය කර තිබේ.

HNBA සහ HNBGI ඇගැයුම් ලබයි

දිනුක පැටිකිරිආරච්චි
HNBA සහ HNBGI ප්‍රධාන මානව සම්පත් නිලධාරි

ප්‍රසන්ත ප්‍රනාන්දු
HNBA සහ HNBGI ප්‍රධාන විධායක නිලධාරි

HNB ඇෂුවරන්ස් PLC (HNBA) සහ එහි පූර්ණ අනුබද්ධිත ආයතනයක් වන HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් (HNBGI) 2020 වසරට අදාළව 'සේවය කිරීම සඳහා හොඳම රැකියා ස්ථානයක් ලෙස සහතික ලැබූ ශ්‍රී ලංකාවේ මුල්පෙළේ ආයතන 40 අතරට එක්වීමට අවස්ථාව හිමිකරගත්තේය. " ' සේවය කිරීම සඳහා හොඳම රැකියා ස්ථානයක්' ලෙස තේරී පත්වීම අපගේ සමාගම් දෙක සඳහාම ලැබුණු ඉතා සුවිශේෂ ඇගැයීමක්.

අපි එකම පවුලක් විදියට එකිනෙකාගේ සිතුම් පැතුම් සහ අවශ්‍යතා පිළිබඳ ඉතාමත් හොඳින් අවධානය යොමු කරන ආයතන සමූහයක්. මෙම ඇගයීම මගින් අපගේ ආයතනික දැක්ම හා මූලික සාරධර්ම සාක්ෂාත් කිරීම පිළිබඳ උදාහරණ සපයනවා වගේම, අපගේ කාර්යමණ්ඩලයේ සියලුම දෙනා ගේ ශුභසිද්ධිය උදෙසා අප ගත්තා උත්සාහය සාර්ථක බවත් සනාථ වෙනවා.

වසංගත සමයේ අපගේ සේවක සේවිකාවන්ගේ අවශ්‍යතාවන් සපුරාලීමටත් අපි කටයුතු කළා.

HNBA සහ HNBGI ආයතනවලට සමෘද්ධිමත් අනාගතයක් ඇති බව මට විශ්වාසයි. අප සමාගම කෙරෙහි විශ්වාසය තැබීම පිළිබඳව සමස්ත සේවක මණ්ඩලයට ස්තුතිවන්ත වීමට මම මෙය අවස්ථාවක් කරගන්නවා." යනුවෙන් HNBA සහ HNBGI යන ආයතන දෙකෙහි ප්‍රධාන විධායක නිලධාරි ප්‍රසන්ත ප්‍රනාන්දු ප්‍රකාශ කළේය. HNBA සහ HNBGI ආයතන වල ප්‍රධාන මානව සම්පත් නිලධාරි දිනුක පැටිකිරිආරච්චි අදහස් දක්වමින් මෙසේ පැවසීය.

"විශිෂ්ට සේවා ස්ථානයක් කියන සංකල්පය ආයතනයක් තුළ එක් රැයකින් ගොඩනැගෙන්නක් නොවේ.

එය ඉතා හොඳ නායකත්වය, දිගුකාලීන සැලසුම්කරණය සහ එම සැලසුම් තිරසාර ලෙස ක්‍රියාත්මක කිරීම කියන කරුණුවල ප්‍රතිඵලයක්. මෙම ඇගැයීම අපගේ ආයතනික ක්‍රියාවලීන් තව තවත් සාර්ථකව ඉදිරියට ගෙනයාමට අපට ශක්තිය ලබා දෙනවා. කෙසේ වෙතත්, මෙතැනින් අපි නවතින්නේ නැහැ. සෑම පුද්ගලයකුම සේවය කිරීම සඳහා සිහින දකින ආයතනයක් බවට අපගේ ආයතනය පත් කිරීමට අපි නිරන්තරයෙන් උත්සාහ කරනවා වගේම, ඒ වෙනුවෙන් අවශ්‍ය සියලුම ආයෝජනයන් කිරීමට අපි පැකිලෙන්නේ නැහැ. HNBA සහ HNBGI ආයතනවල සියලුම කාර්යමණ්ඩල සාමාජිකයින්ට මම මේ අවස්ථාවේදී සුබ පතන්න කැමතියි. මෙය ඔවුන්ගේ සම්මානයයි."

HNBA යනු ශාඛා 63 ක ජාලයක් සහිත ශ්‍රී ලංකාවේ වේගයෙන් වර්ධනය වන රක්ෂණ සමාගමකි. එය ෆිච් රේටින්ග්ස් ලංකා මගින් ජාතික රක්ෂණ මූල්‍ය ශක්තිය මත සිදුකරන ශ්‍රේණිගත කිරීම යටතේ 'A (lka) ශ්‍රේණිගත කිරීම ලබා ඇති රක්ෂණ සමාගමකි. මෙරට රක්ෂණ නියාමනයන්ට අනුකූල වෙමින් 2015 ජනවාරි මාසයේ සිට HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් (HNBGI) ආයතනය නිර්මාණය කර එහි මෙහෙයුම් කටයුතු ආරම්භ කෙරිණි.

HNBGI ආයතනය HNB ඇෂුවරන්ස් PLC (HNBA) හි පූර්ණ හිමිකාරිත්වය යටතේ ක්‍රියාත්මක වන අතර මෝටර් රථ, මෝටර් රථ නොවන සහ තකාෆුල් යන රක්ෂණ විසඳුම් පිළිබඳ විශේෂඥතාවක් දක්වන ආයතනයකි. HNBGI ආයතනය ද ෆිච් රේටින්හි හි ජාතික රක්ෂණ මූල්‍ය ශක්තිය මත ශ්‍රේණිගත කිරීම යටතේ 'A' (lka) ශ්‍රේණිගත කිරීම ලබා ඇත.

අලියාන්ස් ලංකා සිය කාන්තා සේවා නියුක්තිකයන් අගයයි

උත්සව අවස්ථාව සඳහා සහභාගී වූ අලියාන්ස් සාමාජිකාවන්

අලියාන්ස් ලංකා සමාගම ජාත්‍යන්තර කාන්තා දිනය නිමිත්තෙන් ප්‍රධාන කාර්යාලීය පරිශ්‍රයේදී පැවති විශේෂ උත්සවයකදී සමාගමේ සේවක සාමාජිකාවන් කිහිපදෙනකු ඇගැයීමට ලක් කළේය.

අලියාන්ස් ශාඛා ජාලය නියෝජනය කරන සේවිකාවන්ගේ සහභාගීත්වයෙන් පැවැත්වුණු මෙම උත්සවයේදී සායනික මනෝ වෛද්‍ය ප්‍රියන්ජලී ද සොයිසා සහ ප්‍රවීණ ඔලිම්පික් ක්‍රීඩිකාවක වන හා ශ්‍රී ලංකාවේ කඩුලු පැනීමේ ශූරිය වන ශ්‍රියාණී කුලවංශ විසින් ඔවුන් ජීවිතයේ මුහුණ දුන් අභියෝග, ධනාත්මකව සිතමින් ඒවා ජය ගත් ආකාරය පිළිබඳ අදහස් ප්‍රකාශ කිරීම ද විශේෂත්වයකි. ඒ තුළින් තමන්ගේ සිහින හඹා යමින් ජීවිතය ජය ගැනීම වෙනුවෙන් උත්සවයට සහභාගී වූ සේවිකාවන් දිරි ගැන්වීමට ඔවුන් කටයුතු කරන ලදී. එපමණක් නොව කාන්තාව පිළිබඳ සමාජය තුළ පවතින සීමාවන් බිඳ දමමින් රැකියාව සහ පෞද්ගලික ජීවිතය සමබරව පවත්වාගෙන යාමේ වැදගත්කම පිළිබඳව ද මෙහිදී සේවිකාවන් දැනුවත් කිරීමටද පියවර ගෙන තිබිණ.

එසේම මේ වන විට කාන්තා විකුණුම් බලකායක් පිහිටුවීමට කටයුතු කර ඇති අලියාන්ස් ලංකා සමාගම නිරන්තර පුනුණුව හා හැකියා සංවර්ධනය තුළින් ඔවුන් සවිබල ගැන්වීමටත් ඔවුන්ගේ විශිෂ්ට ජයග්‍රහණයන් ඇගැයීමට ලක් කිරීමටත් කටයුතු කර ඇත. විශේෂයෙන් පිරිමි පාර්ශ්වයට පමණක් සීමා වී තිබූ විකුණුම් ක්ෂේත්‍රය තුළ කාන්තා නියෝජනය ඉහළ නැංවීම මෙම වැඩසටහනෙහි සාර්ථකත්වය ලෙස පෙන්වා දිය හැකිය.

මෙහිදී අදහස් දැක්වූ අලියාන්ස් ලංකාහි ප්‍රධාන මානව සම්පත් කළමනාකාරිණී ඉෂාණී සේනවිර මහත්මිය සඳහන් කර සිටියේ

වමේ සිට - හිටපු ඔලිම්පික් ක්‍රීඩිකා හා ශ්‍රී ලංකාවේ කඩුලු පැනීමේ ශූරිය ශ්‍රියාණී කුලවංශ සහ සායනික මනෝ වෛද්‍ය ප්‍රියන්ජලී ද සොයිසා සමඟ අලියාන්ස් සේවිකාවන් විසින් සම්මුඛ සාකච්ඡාවන් සිදුකළ අවස්ථාව

"අලියාන්ස් සමාගම ලෙස අපි නිරන්තරයෙන් සේවක සේවිකාවන් වෙත සමාන අවස්ථාවන් හිමිකර දීමට කටයුතු කරනවා. අපගේ සේවක ප්‍රජාව තුළ සුහදතාවය සහ කණ්ඩායම් හැඟීම ඉහළ යාමට මෙය විශේෂ හේතුවක් වී තිබෙනවා.

ඒ වගේම එය ආයතනයේ වර්ධනයටත් හේතු වී තිබෙනවා. මේ වන විට අපි ආයතනික සේවකයන් මෙන්ම ආයතනික කාර්ය සාධනයද නගා සිටුවීමේ සංස්කෘතියක් ආයතනය තුළ ඇති කර තිබෙන නිසා සේවක සේවිකාවන්ට එකාවන්ව සම්පූර්ණ ශක්තියම රාජකාරිය වෙනුවෙන් ලබා දීමට හැකියාව උදා වෙනවා. සෑම දිනකම වෙහෙස මහන්සි වී සිය රාජකාරි කටයුතු සිදුකරන අපගේ සේවිකාවන් අගය කරමින් මෙවර ජාත්‍යන්තර කාන්තා දිනය සැමරීමට අප කටයුතු කළා." යනුවෙනි.

අලියාන්ස් ලංකාහි කාන්තා විකුණුම් බලකායට අමතරව සමාගම විසින් රට පුරා කාන්තා නායකත්ව සේවක සම්පත් සමූහයද පිහිටුවනු ලැබුවේ රාජකාරී පරිසරයේදී මෙන්ම ඉන් පිටතදීත් අලියාන්ස් ලංකාහි කාන්තා නායකත්වය සවිබල ගැන්වීම වෙනුවෙනි. එය සමාගමේ සියලු නායකත්ව තනතුරු සඳහා කාන්තාවන්ගේ ක්‍රියාකාරී සහභාගීත්වය ඉහළ නැංවීම වෙනුවෙන් ඔවුන් ශක්තිමත් කිරීමට ද කාන්තාවන්ගේ ආර්ථිකය, සමාජ සාධාරණත්වය, සමානාත්මතාව සහ සේවක එකමුතු බව ඉහළ නැංවීමටද සුවිසල් දායකත්වයක් දක්වනු ඇත.

තව ද කාන්තා නායකත්ව වැඩසටහන සේවිකාවන්ගේ සංවර්ධනයට හා නායකත්වයට අවශ්‍ය මග පෙන්වීම් ලබා දෙන සමාගමේ සුවිශේෂී සම්පතක් ලෙසද සලකනු ලබන අතර, එය සමාගමේ මේ විවිධත්වය හා අරමුණු සාක්ෂාත් කර ගැනීමටද පිටිවහලක් වනු නිසැකය.

සිළුමිණ சிழுமின The Silumina **Tender/OTHER ADVERTISEMENTS**
silumina.advt@lakehouse.lk 011 242 9351 - 071 782 9018

ආරක්ෂක අමාත්‍යාංශය
ශ්‍රීමත් ජෙනරාල් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය

ලංසු කැඳවීමයි

ශ්‍රීමත් ජෙනරාල් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ, සෙවනගල නුගේගලයාය එඩිසන් හිල් හි දක්ෂිණ මණ්ඩපයේ යෝජිත නාන තටාක සංකීර්ණය සැලසුම් කර ඉදිකිරීමේ කටයුතු

ශ්‍රීමත් ජෙනරාල් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය
කොන්ත්‍රාත් අංකය: KDU/PRO/RP&SERVICE/2449/2021

1. රත්මලාන ශ්‍රීමත් ජෙනරාල් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ උප කුලපතිවරයා, විශ්ව විද්‍යාලයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපතිවරයා ලෙස, ශ්‍රීමත් ජෙනරාල් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ සෙවනගල නුගේගලයාය එඩිසන් හිල් හි දක්ෂිණ මණ්ඩපයේ යෝජිත නාන තටාක සංකීර්ණය සැලසුම් කර ඉදිකිරීමේ කටයුතු සඳහා සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවා සිටී. ලංසු කැඳවීම් ජාතික තරඟකාරීත්ව ලංසු පරිපාටිය අනුව සිදු කෙරෙනු ඇත.

2. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට **2021 මාර්තු 29** සිට **2021 මැයි 10** තෙක් **පැය 0900** සහ **පැය 1500** අතර කාලයේදී **රු.2,500.00ක** නැවත නොවනු නොලබන ගාස්තුවක් ශ්‍රීමත් ජෙනරාල් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ මුල්‍යාධිකාරී වෙත මුදලින් ගෙවා **අධ්‍යක්ෂ සැපයුම්, ශ්‍රීමත් ජෙනරාල් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය, රත්මලාන** වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන්, ඉංග්‍රීසි භාෂාවෙන් සකසුණු සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලය මිල දී ගත හැකි ය.

3. ඉහත ලිපිනයේදී **2021 මාර්තු 29** සිට **2021 මැයි 10** දක්වා වැඩ කරන දිනවල දී **පැය 0900** සිට **පැය 1500** අතර කාලයේදී ගාස්තුවක් ගෙවීමකින් තොරව ලංසු ලේඛන පරීක්ෂා කළ හැකි ය (දුරකථනය **0710219449/ 0710219384** ෆැක්ස් **011-2632430**)

4. මුද්‍රා තබන ලද ලංසු, භාරගැනීමේ අවසන් දිනයට හා වේලාවට පෙර පහත දක්වා ඇති ලිපිනයට ලැබෙන්නට සැලැස්විය යුතු ය. නැතහොත් එම ලිපිනයේ තබා ඇති ලංසු පෙට්ටියට බහාලිය යුතු ය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම විවෘත කරනු ලැබේ.

5. **2021 මැයි 11** දින **පෙ.ව. 10.00 ට** රත්මලාන ශ්‍රීමත් ජෙනරාල් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේදී ටෙන්ඩර් භාරගැනීම අවසන් කර විවෘත කරනු ලැබේ.

6. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට අධ්‍යක්ෂ සැපයුම්, රත්මලාන ශ්‍රීමත් ජෙනරාල් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය වෙතින් වැඩි විස්තර ලබාගත හැකි ය. (දුරකථනය **011-2632430/0710219384** ෆැක්ස් **011-2632430**, සහ **www.kdu.ac.lk/ocls/tender-notices** හි පළ කර ඇති "**ලංසු ආරාධනය**")

සභාපති
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ශ්‍රීමත් ජෙනරාල් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය
රත්මලාන, ශ්‍රී ලංකාව.

Uva Wellassa University

ජාතික සංවර්ධනයේ සාඩම්බර දායකයකු වන්න

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය සම්පත් ක්ෂේත්‍ර ඉලක්ක කොට ඊට වැඩි වටිනාකමක් ලබාදෙන නව ප්‍රවණතා නිර්මාණය කරයි. මෙම විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනික පාඨමාලා පළමු උපාධි, ආයතනික පුහුණු සහ වැඩිදුර අධ්‍යාපන ආදී ධාරා ඔස්සේ සේවා යෝජකයින්ගේ නිෂ්පාදනවල අගයන් පුළුල් කර කාර්යක්ෂම උපාධිධාරී පරපුරක් බිහි කරනු ඇත. ජාතික සංවර්ධනයට සහභාගී වන සාඩම්බර දායකයකු වීමට ඔබට කරන ඇරයුමයි.

ප්‍රසම්පාදන දැන්වීමයි

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ප්‍රසම්පාදන මණ්ඩලයේ සභාපති විසින් විශ්වවිද්‍යාලය සඳහා පහත සේවාව සැපයීමට සුදුසුකම්ලත් සැපයුම්කරුවන්ගෙන් ටෙන්ඩර් පත්‍රයට අනුව මිල ගණන් කැඳවනු ලැබේ.

විස්තරය	වාහන ගණන	ටෙන්ඩර් අංකය	ටෙන්ඩර් මිලදී ගැනීම සඳහා මුදල
මාසික කුලී පදනම මත වාහන ලබා ගැනීම (අවුරුදු තුනක් (03) සඳහා) 01. මෝටර් කාර් රථ සෙඩාන් මාදිලිය (1490 සීසී - 1600 සීසී/ පෙට්‍රල් / වායු සමනය සහිත/ ටොයෝටා, නිසාන් හෝ සමාන/ හයිබ්‍රිඩ් නොවන (උපකුලපතිතුමාගේ පරිහරණය සඳහා)	01	යුඩබ්ලියු/ ජීඒ/ ටී/21/01	රු. 2,000.00
02. මෝටර් කාර් රථ සෙඩාන් මාදිලිය (1490 සීසී - 1600 සීසී/ පෙට්‍රල් / හයිබ්‍රිඩ් හෝ හයිබ්‍රිඩ් නොවන/ වායු සමනය සහිත / ටොයෝටා නිසාන් හෝ සමාන (ලේඛකාධිකාරීතුමාගේ පීඨාධිපතිවරුන්ගේ හා පුස්තකාලාධිපතිගේ පරිහරණය සඳහා)	04		

ඉල්ලුම්කරුවන් පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කාර්යාල වේලාවන් තුළ ටෙන්ඩර් පත්‍ර මිලදී ගැනීම සඳහා ලිඛිත අයදුම්පත සමග එක් ටෙන්ඩර්පතක් සඳහා ආපසු නොගෙවනු ලබන ඉහත සඳහන් කර ඇති මුදල ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ සරප් වෙත ගෙවා ලබාගත් රිසිට්පත හෝ විශ්වවිද්‍යාලයේ ගිණුම් අංක 31148200ට ලැබෙන සේ ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් මුදල් ගෙවා ලබාගත් රිසිට්පත නියෝජ්‍ය ලේඛකාධිකාරී (සාමාන්‍ය පාලන) වෙත ඉදිරිපත් කිරීමෙන් 2021.03.28 දින සිට 2021.04.19 දින දක්වා අවශ්‍ය ටෙන්ඩර්පත්‍ර ලබාගත හැකිය. ටෙන්ඩර්පත් http://www.uwu.ac.lk/procurement/ යන විශ්වවිද්‍යාලයේ වෙබ් පිටුව මගින්ද ලබාගත හැකිය. විශ්වවිද්‍යාලයේ වෙබ් පිටුව මගින් ටෙන්ඩර්පත් ලබාගන්නා ඉල්ලුම්කරුවන් "ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය" නමින් නිකුත් කළ ඉහත සඳහන් මුදලට වටිනා බැංකු ඇපකරයක් සමග හෝ විශ්වවිද්‍යාලයේ ගිණුම් අංක 3114820 ට ලැබෙන සේ මුදල් ගෙවා ලබාගත් රිසිට්පත ටෙන්ඩර්පත් සමග අමුණා එවිය යුතුය. ටෙන්ඩර්පත් මිලදී ගැනීමට පෙර ඉල්ලුම්කරුවන් හට නොමිලයේ ටෙන්ඩර්පත් පරීක්ෂා කළ හැකිය.

මිල ගණන් ඉදිරිපත් කිරීම 2021.04.20 වෙනි දින ප.ව. 2.00 ට හෝ ඊට පෙර සිදුකළ යුතු අතර, මිල ගණන් 2021.04.20 දින ප.ව. 2.00 පසු වූ වහාම විවෘත කරනු ලැබේ. විවෘත කිරීමේ අවස්ථාවට ඉල්ලුම්කරුට හෝ ඔහුගේ නියෝජිතයෙකුට (බලයලත් ලිපියක් සමග) සහභාගි විය හැක. ටෙන්ඩර්පත්‍රය බහාලන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ අදාළ ටෙන්ඩර් අංකය සඳහන් කළ යුතු අතර, මිලගණන් ඉදිරිපත් කිරීම ලියාපදිංචි තැපෑලෙන් සභාපති, ප්‍රසම්පාදන මණ්ඩලය, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය, පස්සර පාර, බදුල්ල යන ලිපිනයට එවිය යුතුය. නැතහොත් මෙම ලිපිනයට ගෙනවිත් ලේඛකාධිකාරී කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැකිය.

වැඩි විස්තර නියෝජ්‍ය ලේඛකාධිකාරී (සාමාන්‍ය පාලන) 055-2226470 දුරකථන අංකයෙන් ලබාගත හැකිය.

සභාපති, ප්‍රසම්පාදන කමිටුව,
ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය,
බදුල්ල.
2021.03.28

කොළඹ විශ්වවිද්‍යාලය
ප්‍රසම්පාදන දැන්වීම

කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ ආපනශාලාව සඳහා මිල ගණන් කැඳවීම

කොළඹ විශ්වවිද්‍යාලයීය දෙපාර්තමේන්තු සුළු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ ආපනශාලාව පවත්වාගෙන යාම සඳහා මූල්‍යමය හැකියාවක් ඇති, රාජ්‍ය හෝ පෞද්ගලික පිළිගත් ආයතනයක ආපනශාලාවක සේවය කර තිබෙන අවම වශයෙන් අවුරුදු 03 ක පළපුරුද්දක් ඇති සුදුසුකම්ලත් පුද්ගලයින්/ ආයතනවලින් ආපනශාලා සේවාව සඳහා මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවනු ලැබේ.

ලංසු ලියවිලි සහ අදාළ උපදෙස් ගාස්තුවකින් තොරව ශිෂ්‍ය හා සේවක කටයුතු අංශයේදී කාර්යාල වේලාවන් තුළ පරීක්ෂා කළ හැකිය. 2021.03.29 වන දින සිට 2021.04.21 දින පස්වරු 2.30 දක්වා කොළඹ විශ්වවිද්‍යාලයේ ප්‍රධාන රැකීරීමේ ගිණුමට බැර වන සේ ඕනෑම මහජන බැංකු ශාඛාවකින් යොමු අංක 505170600013 වෙත රු.1000/- ක (ආපසු නොගෙවනු ලබන) ලංසු ලියවිලි ගාස්තුවක් ගෙවීමෙන් ලබා ගන්නා ලදු පත ශිෂ්‍ය හා සේවක කටයුතු අංශය වෙත ඉදිරිපත් කිරීමෙන් පසුව අදාළ ලංසු ලියවිලි ලබාගත හැකිය.

කවරයේ වම් පස ඉහළ කෙළවරේ "**කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ ආපනශාලා සේවාව සඳහා මිල ගණන් කැඳවීම**" යනුවෙන් සඳහන් කර මුද්‍රා තබන ලද ලංසු ලියවිලි, පිටපතක්ද සහිතව "**සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, කොළඹ විශ්වවිද්‍යාලය, අංක 94, කුමාරතුංග මුනිදාස මාවත, කොළඹ 03**" යන ලිපිනයට ලැබෙන සේ 2021.04.22 වන දින පස්වරු 2.30ට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ ලේඛකාධිකාරී කාර්යාලයේ තබා ඇති ලංසු බහාලනයට දැමිය හැක. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසුකරුවන් හෝ ඔවුන් විසින් නම් කරනු ලබන නියෝජිතයන් ඉදිරියේ 2021.04.22 වන දින පස්වරු 2.30 ට කොළඹ විශ්වවිද්‍යාලයීය විද්‍යා මන්දිර මාණ්ඩලික රැස්වීම් ශාලාවේදී ලංසු විවෘත කිරීම සිදු කරනු ලැබේ.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
කොළඹ විශ්වවිද්‍යාලය,
94, කුමාරතුංග මුනිදාස මාවත, කොළඹ 03.

පේරාදෙණිය විශ්වවිද්‍යාලය
ලංසු කැඳවීමයි
සනීපාරක්ෂක සේවකයින් සැපයීම - 2021/2022

01. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් වර්ෂයක කාලයක් සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලය වෙත සනීපාරක්ෂක සේවකයින් සැපයීමට හැකි පිළිගත් ආයතන වෙතින් මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවනු ලැබේ.

සේවක කාණ්ඩය	දෛනික සේවක සංඛ්‍යාව	
සනීපාරක්ෂක කම්කරු	පිරිමි	53
	ගැහැණු	53
වැඩ පරීක්ෂක	04	

02. ජාතික තරගකාරී ලංසු කැඳවීමේ ක්‍රමය මත මිල ගණන් කැඳවනු ලැබේ.

03. ආපසු නොගෙවනු ලබන රු. 5,000.00 ක ලංසු ගාස්තුවක් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සරප් අංශය වෙත ගෙවා 2021.03.29 දින සිට 2021.04.19 දින දක්වා වැඩ කරන දිනයන්හි පෙ.ව. 9.00 සිට ප.ව 3.00 දක්වා එම අංශයෙන් අදාළ ලංසුපත් ලබා ගත හැකිය.

04. සම්පූර්ණ කර මුද්‍රා තබන ලද ලංසුපත් 2021.04.20 වන දින ප.ව. 1.00 ට හෝ ඊට පෙර ලැබෙන සේ ලේඛකාධිකාරී කාර්යාලයේ තබා ඇති ලංසු බහාලුමට යොමු කිරීම හෝ **සභාපති, විශ්වවිද්‍යාල ප්‍රසම්පාදන කමිටුව, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ කළ යුතුය. ලංසු අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **සනීපාරක්ෂක සේවකයින් සැපයීම 2021/2022**" යනුවෙන් සඳහන් කිරීම අනිවාර්ය වේ.

05. ප්‍රමාද වූ හා අසම්පූර්ණ ලදුපත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06. මෙම ලංසුපත් 2021.04.20 දින ප.ව 1.30ට පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සනාථන මන්දිර කමිටු කාමර අංක II දී විවෘත කරනු ලැබේ. ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් එක් නියෝජිතයෙකුට මේ සඳහා සහභාගි විය හැක.

07. සියලුම ලංසුපත් සමග රු: 500,000.00 ක (රුපියල් ලක්ෂ පහක) වටිනාකමකින් යුත් 2021.04.20 දින සිට 2021.07.18 දින දක්වා වලංගු වන ලංසු ඇපකරයක් "උපකුලපති, පේරාදෙණිය විශ්වවිද්‍යාලය" නමින් අදාළ ලංසුපත් සමග ලබා දිය යුතු අතර, එය ශ්‍රී ලංකා මහ බැංකුව මගින් අනුමත කර ඇති රාජ්‍ය හෝ වාණිජ බැංකුවකින් ලබා ගන්නා ලද ලංසු ඇපකරයක් විය යුතුය. නැතහොත් ඒ හා සමාන මුදලක් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සරප් වෙත ගෙවා ලබාගත් ලදුපත, ලංසුපත සමග යොමු කළ යුතුවේ.

08. රක්ෂණ සමාගම් මගින් ඉදිරිපත් කරනු ලබන ලංසු ඇපකර, චෙක්පත් හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ. එසේ භාරනොගනු ලබන අවස්ථා වලදී අදාළ ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

09. මේ පිළිබඳව උනන්දුවක් දක්වන සුදුසුකම් සහිත ලංසුකරුවන් හට දුරකථන අංක 081-2392438 සහ 081-2392436 මගින් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ජ්‍යෝෂ්ඨ සහකාර ලේඛකාධිකාරී සාමාන්‍ය සේවා අංශය ඇමතීමෙන් වැඩිදුර තොරතුරු ලබා ගත හැක.

සභාපති
විශ්වවිද්‍යාල ප්‍රසම්පාදන කමිටුව
පේරාදෙණිය විශ්වවිද්‍යාලය,
පේරාදෙණිය

තරුණියන්ගේ
කාන්තාවන්ගේ
මවුවරුන්ගේ
හද බැඳි කාන්තා පත්තරය
තරුණී
සැම බදාදාවකම

සත වෙත සිරිසෙත සලසන සතිපත
දෝ සතර
වෙද සතර
දත් නොදත්
කාටත්
මහඟු මිණකි
සුබසෙත
සත වෙත සිරිසෙත සලසන සතිපත



21 වැනි
සියවසට
එළඹෙන
යෞවනයට
නිරවුල් ගමන් මග
බුදුසරණ

1950 සිට දිනපතා සහ සතිපතා පත්‍රවල පළවූ හා පළනොවු ඡායාරූපවල දළ සේයාපට පුස්තකාලයේ තැන්පත් කර ඇත. ඔබටත් ඡායාරූප ලබාගැනීමට අවශ්‍ය නම් පුවත්පතේ නම, දිනය සහ ඡායාරූපයේ විස්තර සඳහන් කොට ලියා හෝ පැමිණ විමසන්න.

පුස්තකාලයාධිපති
දුරකථන
(011) 2 242 9491

LAKE HOUSE

අනාගත සිහින සැබෑකර ගැනීමේ එකම මග
සිළුමිණ මටසිට මංගල යෝජනා තීරයයි..
දශක ගණනාවක විශ්වසනීය සේවාව...
ඔබේ මංගල යෝජනා දැන්වීම අප වෙත ඊ-මේල් කරන්න. classified@lakehouse.lk
පියුමි - 011 2 429 383 , රමණි - 011 2 429 347 , ශයනි - 011 2 429 343 / 342
වචන 15 සඳහා රු. 560/-
වැඩිවන සෑම වචනයක් සඳහාම රු 23/-

සිළුමිණ
சிழுமின
The Silumina
Tender/OTHER ADVERTISEMENTS
silumina.advt@lakehouse.lk
011 242 9351 - 071 782 9018



21 වැනි සියවසට එළඹෙන යෞවනයට

නිරවුල් ගමන් මග

බුදුසරණ

මල්වත්ත වැළි වැවිළි සමාගමට අයත් ඩයිරාබා වත්තේ මෙම වසරේ ජමනාරන් එළදාව බදු දීම සඳහා මිල ගණන් කැඳවනු ලැබේ.

මිල ගණන් බාරගන්නා අවසාන දිනය 2021 අප්‍රේල් මස 5 වන දින ප.ව. 2.30 දක්වා පමණි

විමසීම් : බන්දුල 0718211770, සෙනුර 0774022443

වගාවන් පරීක්ෂා කිරීමෙන් පසුව මිල ගණන් පහත සඳහන් ලිපිනයට ගෙනැවිත් භාරදීම හෝ තැපෑලෙන් එවිය හැකිය.

ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී
මල්වත්ත වැළි වැවිළි සමාගම,
සාර්නියා වත්ත, කන්දෙගෙදර.

කොළඹ අපනයන ආයතනයකට උසස් වර්ගයේ පිරිසිදු තලතෙල් අවශ්‍යයි.

අමතන්න
0727332246

සිල්මෑණි කෙනෙක් දිරාපත් කාමර දෙක (2) සාදාගැනීමට පිංතකා ආධාරයක් පතයි.

රදාවානේ නන්දා ධම්මසාරි
61/D, ඉස්කෝලවත්ත, කිරිඳිවැල.
033-2268680

සම්පත් බැංකුව පි එල් සි සතු වටිනා දේපල විකිණීමට

ස්ථානය	ප්‍රමාණය	දේපල වර්ගය
සාංචි ආරච්චි ගාඩින්ස්, කොළඹ 12	ඉඩම - 5.01 පර්. ගොඩනැගිල්ල: 1 වන මහළ වි.අඩි 562 බිම් මහළ වි.අඩි 358	වාණිජ දේපල

මිල ගණන් 2021.04.09 දිනට පෙර ලැබීමට සලස්වන්න.

සම්පත් බැංකුව
සම්පත් බැංකුව පීඑල්සී.
110, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, කොළඹ 02.
දුරකථන 0114730231 / 0766545560 / 0761154870
Email : rec.ofc3@sampath.lk

පාරිභෝගික සියලු දෙනා වෙත දැනුම්දීමයි

2003 වසරේ අප්‍රේල් මස රුකඩගේන වැවිලි පුද්ගලික සමාගමට දළු සැපයූ පාරිභෝගිකයින් සඳහා හිඟ දළු මුදල් 2021 මාර්තු මස 31 දින පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා ආයතන පරිශ්‍රය තුළදී ගෙවීම් සිදුකරන බැවි පාරිභෝගික ඔබ මෙයින් දැනුවත් කරමු.

★ **සැ. යු.** ඔබගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජා.හැ. පත (NIC) හා දළු පොත රැගෙන ඒම අනිවාර්ය වේ.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ නිදහස් විහාරස්ථානයක වස් සමාදන් වීමට ආරාධනා කරමි.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටි විහාරස්ථානයක් සාමනේර භික්ෂු පුහුණු ආයතනයකට පවරා දෙමි.

0704235102,
0770548376

මිල ගණන් කැඳවීම

ප්ලෙන්ටි ෆුඩ්ස් (පුද්) සමාගම මගින් ක්‍රියාත්මක කරනු ලබන කෘෂි ව්‍යාපාර වටිනාකම් දම සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා යන්ත්‍රෝපකරණ හා උපකරණ සැපයීම සඳහා මිල ගණන් කැඳවනු ලැබේ. මෙම ව්‍යාපෘතිය රජයේ අනුග්‍රහය ද ඇතිව අප ආයතනය මගින් ක්‍රියාත්මක කරනු ලබයි.

අනු අංකය	අයිතම විස්තර	අවශ්‍ය ප්‍රමාණය
01	බහු කාර්ය අතුරුයන් ගෑමේ උපකරණ (Multi Functional Machine)	2750
02	බීජ සිටුවීමේ සහ පොහොර යෙදීමේ උපකරණ (Manual Seeder Cum Fertilizer Applicator)	2750

මේ සඳහා උනන්දුවක් දක්වන සුදුසුකම් සපුරා ඇති ලංසුකරුවන් විසින් කාර්යාල වේලාව තුළදී ආපසු නොගෙවන රු.500ක ලංසු ගාස්තුවක් ගෙවා පිරිවිතර හා අදාළ ලේඛන (ටෙන්ඩර් ලියවිලි) ලබා ගත හැකිය.

මිල ගණන් භාර ගන්නා අවසන් දිනය 2021 අප්‍රේල් මස 08 දින පෙ.ව10.00 දක්වා පමණක් බවත් මුද්‍රා තැබූ සියලු මිල කැඳවුම්පත් පහත ලිපිනයට යොමු කිරීමට හෝ ආයතන පරිශ්‍රයේ පිහිටි මිල ගණන් කැඳවුම් පෙට්ටිය වෙත යොමු කිරීමට කටයුතු කළ යුතුය. මිල ගණන් විවෘත කිරීම 2021 අප්‍රේල් මස 20දින පෙ.ව10.00 ට සිදු කරන බැවින් සියලුම සැපයුම්කරුවන් අදාල සාම්පල් ද රැගෙන එදිනට පැමිණීම අනිවාර්ය වේ. ප්‍රමාදව ලැබෙන ටෙන්ඩර්පත් (මිල ගණන්) ප්‍රතික්ෂේප කිරීමට සිදුවන බව කරුණාවෙන් සලකන්න.

වැඩි විස්තර දුරකථන අංක 081 500 44 00/081 24 20 230 මගින් විමසා දැන ගත හැකිය.

අධ්‍යක්ෂක
ප්ලෙන්ටි ෆුඩ්ස් (පුද්) සමාගම
ජනසවිගම,
පල්ලෙකැලේ.

රත්මලාන කාර්මික දේපළක් විකිණීමට

01. කර්මාන්තශාලාවකට/ කාර්යාල සංකීර්ණයකට ඉහළ පරිමාණයේ දේපළ සංවර්ධනයකට යෝග්‍යයි.
02. දේපළ ගාලු පාරට මීටර් 500 දුරින් තෙලවල පාරට මායිම්ව පිහිටි පර්චස් 738 ක ඉඩමකි.
03. ඉඩමේ ව. අඩි. 58469 එකතුවක කාර්යාල ගොඩනැගිලි හා ගබඩා පහසුකම් ඇත.
04. මිල සාකච්ඡා කරගත හැක.

අමතන්න - ධනුෂ්ක
ජංගම දුරකථනය : 0766714333

සංචාරක අමාත්‍යාංශය

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය

ලංසු කැඳවීම

නියමුවන් රහිත ගුවන්යානා සඳහා පූර්ණ ස්වයංක්‍රීය පද්ධතියක් ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම

ලංසු අංකය : SP/2021-4

1. සිවිල් ගුවන් සේවා අධිකාරිය වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (DPC) සභාපති විසින් නියමුවන් රහිත ගුවන් යානා සඳහා පූර්ණ ස්වයංක්‍රීය පද්ධතියක් ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම සඳහා සුදුසුකම් ලත් යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ගෙන් මුද්‍ර, තැබූ ලංසු කැඳවනු ලැබේ.
2. ලංසුකරණය ජාතික තරගකාරී ක්‍රියාපටිපාටියට අනුව සිදුකෙරේ
3. මේ පිළිබඳ උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට කටුනායක, මිනුවන්ගොඩ පාර, නො 152/1 , සිවිල් ගුවන්සේවා අධිකාරියේ පරිසර, පර්යේෂණ හා ව්‍යාපෘති අංශය වෙතින් දුරකථන 0112358824 ඔස්සේ ඇමතීමෙන් වැඩිමනත් තොරතුරු ලබා ගත හැකිය. ලංසු ලියකියවිලි ගාස්තුවක් ගෙවීමෙන් තොරව පරීක්ෂා කළ හැකිය.
4. 2021මාර්තු මස 30වන දින සිට 2021අප්‍රේල් මස 20 වන දින දක්වා ඕනෑම රාජකාරි දිනයක පෙ.ව 09.00 සිට ප. ව 03.00 දක්වා කාලය තුළ,ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ආපසු නොගෙවන රු. දෙදහස් පන්සීයක (2500.00) (වැට් රහිත) ගාස්තුවක් සිවිල් ගුවන් සේවා අධිකාරිය වෙත මුදලින් ගෙවීමෙන් ලංසු ලේඛන කට්ටලයක් මිලදී ගත හැකිය.
5. සියලුම ලංසු සමග ශ්‍රී ලංකා මුදලින් රුපියල් ලක්ෂයක(රු 100,000.00/=)වටිනාකමින් යුත් ලංසු බැඳුම්කරයක් ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතිය ලත් පිළිගත් බැංකුවක් මගින් ඉදිරිපත් කළ යුතුය. ලංසු බැඳුම්කරණය ලංසු විවෘත කරන දින සිට දින 120 ක් වලංගු විය යුතු අතර, එය තාක්ෂණික යෝජනා සමග ඉදිරිපත් කළ යුතුය.
6. 2021අප්‍රේල් මස 21වන දින ප.ව 02.00 ට පෙර කටුනායක, මිනුවන්ගොඩ පාර, නො 152/1ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වෙත මුද්‍ර, තබන ලද ලංසු ලැබීමට සැලැස්විය යුතුය. නිවැරදි ලෙස සම්පූර්ණ කළ ලංසු, තාක්ෂණික හා මූල්‍ය ලෙස වෙන් වෙන් වශයෙන් යෝජනා දෙකක් වන පරිදි බලයලත් පුද්ගලයින්ගේ තිලමුද්‍රුව සහිතව අත්සන් තබා, මුද්‍ර, තබන ලද කවරවල බහා අදාළ කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"තාක්ෂණික" සහ "මූල්‍ය" ලෙස සහ "පූර්ණ ස්වයංක්‍රීය පද්ධතියක් හඳුන්වාදී පවත්වාගෙන යාම"** ලෙස සටහන් කොට ගෙනැවිත් භාරදීම හෝ පහත ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් යොමුකිරීම සිදුකළ හැකිය.
7. 2021අප්‍රේල් මස 21වන දින ප.ව 02.00 ට ලංසු ඉදිරිපත් කිරීමේ කාලසීමාව අවසන් වූ විගස ලංසු විවෘත කිරීම සිදුකෙරේ. ප්‍රමාද වී ලැබෙන ලංසු භාරගනු නොලැබේ.
8. පූර්ව ලංසු රැස්වීමක් 2021 අප්‍රේල් මස 08 වනදින පෙ.ව 10.00ට, කටුනායක, මිනුවන්ගොඩ පාර, නො 152/1, ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේදී පවත්වනු ඇත.
9. ලංසුව පිරිනැමීම සඳහා සුදුසුකම් ලබන ආයතනය විසින් මුළු කොන්ත්‍රාත් වටිනාකමින් 10% ක්වූ, ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය නමින් ලබාගත් කොන්දේසි විරහිත කාර්ය සාධන බැඳුම්කරයක් ලබා දිය යුතුය. අපේක්ෂිත කාර්යසාධන මට්ටමක සේවාවක් නොලැබුනහොත් එය අයකර ගැනීමේ අයිතිය ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය සතු වේ.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය,
නො. 152/1, මිනුවන්ගොඩ පාර, කටුනායක.

සංචාරක අමාත්‍යාංශය

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් කාමරයෙහි ශබ්ද පාලනය (Acoustic control and sound proofing) සඳහා යෝජනා කැඳවීම

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියෙහි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් කාමරය ශබ්ද පාලනය (Acoustic control and sound proofing) සඳහා මුද්‍ර, තබන ලද ලංසු කැඳවනු ලැබේ. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් සඳහා සැළසුම් හා මිල යෝජනා ඉදිරිපත් කළ යුතුය.

ඉහත කරුණු පිළිබඳව ඔබට කිසියම් විමසීමක් ඇත්නම් 0112358824 දුරකථන අංකයෙන් හෝ mgrrdp@caa.lk යන විද්‍යුත් තැපෑලෙන් ප්‍රධාන ප්‍රසම්පාදන නිලධාරී සම්බන්ධ කර ගත හැකිය.

ලියුම්කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් කාමරය ශබ්ද පාලනය සඳහා යෝජනා"** යනුවෙන් සඳහන් කළ යුතුය. මුද්‍ර, තබන ලද එම ලංසු **සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය අංක152/1, මිනුවන්ගොඩ පාර කටුනායක** යන ලිපිනයට යොමු කළ යුතුය. ලංසු භාර ගැනීම 2021. 04. 28 දින පස්වරු 2.00 ට අවසන් කෙරේ. ඒ සමගම ඉදිරිපත් කර ඇති ලංසු විවෘත කිරීමට කටයුතු කරනු ලබන අතර, ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මේ සඳහා ස්ථානීය පරීක්ෂාවක් 2020.04.05 දින පෙරවරු 10.00 ට ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ දී පැවැත්වෙන අතර, යෝජනා ඉදිරිපත් කරන ලංසුකරුවන් මෙම පරීක්ෂාව සඳහා සහභාගී වීම අනිවාර්ය වේ.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය,
අංක 152/1, මිනුවන්ගොඩ පාර, කටුනායක.

1950 සිට
දිනපතා සහ සතිපතා පත්‍රවල පළවූ හා පළනොව ඡායාරූපවල දළ සේයාපට පුස්තකාලයේ තැන්පත් කර ඇත. ඔබටත් ඡායාරූප ලබාගැනීමට අවශ්‍ය නම් පුවත්පතේ නම, දිනය සහ ඡායාරූපයේ විස්තර සඳහන් කොට ලියා හෝ පැමිණ විමසන්න.

පුස්තකාලයාධිපති
දුරකථන
(011)2 242 9491

LAKE HOUSE

SriLankan Catering

ලංසු ඉදිරිපත් කිරීමේ ආරාධනය

ශ්‍රීලංකන් කේටරින් සමාගම විසින් පහත සඳහන් පාරිභෝගික භාණ්ඩ සැපයීම සඳහා සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු මෙයින් කැඳවනු ලැබේ.

වෙළඳ ද්‍රව්‍ය	යොමු අංකය	අවසන් දිනය හා වේලාව
කුකුල් මස් (Chicken Thigh and Breast)	SLC/DPC/GOODS/002/2021	2021 මැයි 11 දින පෙ.ව. 10.30
හැපි කව් චීස් 25ග්‍රෑ/ග්‍රෑ 17.5 හෝ සමාන නිෂ්පාදන (Cheese Happy Cow 25g/ 17.5g portion or Equivalent)	SLC/CEO/GOODS/006/2021	2021 මැයි 11 දින පෙ.ව. 11.00
Jam Strawberry 15g portion	SLC/CEO/GOODS/007/2021	2021 මැයි 11 දින පෙ.ව. 11.30
මැක්සි රෝල් (Maxi Roll)	SLC/CEO/GOODS/005/2021	2021 මැයි 11 දින ප.ව. 12.00
Channa pea Whole, Egg Noodles Chinese Dry, Egg Plant Grilled Roasted Frozen, Wine Leaves Stuffed	SLC/CEO/GOODS/002/2021	2021 මැයි 11 දින ප.ව. 12.30

පිළිගත් ලංසුකරුවන්ට ඔවුන්ගේ පළපුරුද්ද තහවුරු කරමින් මිලගණන් ඉදිරිපත් කරන මෙන් ආරාධනය කර සිටිමු.

උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට ලංසු ලියවිලි සහ වැඩිදුර විස්තර 2021 මාර්තු 30 වන දිනයෙන් පසු http://www.srilankancatering.com/procurement-notices යන වෙබ් අඩවියෙන් ලබාගත හැකිය.

මුද්‍රා තබන ලද ලංසු ලියවිලි අදාළ ලංසු ලියවිල්ලේ සඳහන් අවසාන දිනයට පෙර, ශ්‍රීලංකන් කේටරින් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී කාර්යාලය වෙත භාර දිය යුතුය.

උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට ලංසු ලියවිලි සම්බන්ධයෙන් වැඩිදුර විස්තර,
තිළිණ සිරිවර්ධනගේ විද්‍යුත් ලිපිනය - thilina.siriwardana@srilankancatering.com හෝ (+94)197334241 දුරකථනයෙන් ලබාගත හැකිය.

ප්‍රධාන විධායක නිලධාරී,
ශ්‍රීලංකන් කේටරින් සමාගම,
ගුවන්සේවා මධ්‍යස්ථානය,
බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ, කටුනායක, ශ්‍රී ලංකාව

Uva Wellassa University

නව ලොවින් දැනුම ලබන්න නව ලොවට සේවය කරන්න

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය සම්පත් ක්ෂේත්‍ර ඉලක්ක කොට ඊට වැඩි වටිනාකමක් ලබාදෙන නව ප්‍රවණතා නිර්මාණය කරයි. මෙම විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනික පාඨමාලා පළමු උපාධි, ආයතනික පුහුණු සහ වැඩිදුර අධ්‍යාපන ආදී ධාරා ඔස්සේ සේවා යෝජකයින්ගේ නිෂ්පාදනවල අගයන් පුළුල් කරන කාර්යක්ෂම උපාධිධාරී පරපුරක් බිහි කරනු ඇත. ජාතික සංවර්ධනයට සහභාගී වන සාඩම්බර දායකයකු වීමට ඔබට කරන ඇරයුමයි.

ප්‍රසම්පාදන දැන්වීමයි

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් විශ්වවිද්‍යාලය සඳහා පහත සේවාව සැපයීමට සුදුසුකම්ලත් සැපයුම්කරුවන්ගෙන් ටෙන්ඩර් පත්‍රයට අනුව මිල ගණන් කැඳවනු ලැබේ.

අංකය	විස්තරය	ටෙන්ඩර් අංකය
01	ශිෂ්‍ය නේවාසිකාගාර සඳහා නිවාස කුලියට/ බද්දට ලබාගැනීම – විශ්වවිද්‍යාලය අවට බදුල්ල විශ්වවිද්‍යාලීය සම්බන්ධීකරණ කාර්යාලයක් පවත්වාගෙන යාමට හා ශිෂ්‍ය නවාතැන් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාමට – කොළඹ නුගේගොඩ ප්‍රදේශය අවට	යූඩබ්යූ/පීඑ/ එල්එච්/2021/01

ඉල්ලුම්කරුවන් පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කාර්යාල වේලාවන් තුළ 2021-03-28 දින සිට 2021-04-20 දින දක්වා අවශ්‍ය ඉල්ලුම්පත් ලබා ගත හැකිය. අයදුම්පත් http://www.uwu.ac.lk/procurement/ යන විශ්වවිද්‍යාලයේ වෙබ් පිටුව මගින්ද ලබාගත හැකිය.

මිල ගණන් ඉදිරිපත් කිරීම 2021.04.19 වෙනි දින ප.ව. 3.00 ට හෝ ඊට පෙර සිදුකළ යුතු අතර, මිල ගණන් 2021.04.20 දින ප.ව. 3.00 පසු වූ වහාම විවෘත කරනු ලැබේ. විවෘත කිරීමේ අවස්ථාවට ඉල්ලුම්කරුට හෝ ඔහුගේ නියෝජිතයෙකුට (බලයලත් ලිපියක් සමග) සහභාගී විය හැක. ටෙන්ඩර්පත්‍රය බහාලන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ අදළ ටෙන්ඩර් අංකය සඳහන් කළ යුතු අතර, මිලගණන් ඉදිරිපත් කිරීම ලියාපදිංචි තැපෑලෙන් සභාපති, ප්‍රසම්පාදන කමිටුව, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය, පස්සර පාර, බදුල්ල යන ලිපිනයට එවිය යුතුය. නැතහොත් මෙම ලිපිනයට ගෙනවිත් ලේඛකාධිකාරී කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැකිය.

වැඩි විස්තර නියෝජ්‍ය ලේඛකාධිකාරී (පාලන) 055-2226470 දුරකථන අංකයෙන් ලබාගත හැකිය.

සභාපති,
ප්‍රසම්පාදන කමිටුව,
ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය,
බදුල්ල.

දිවයින

වෙළඳ

වෙළඳ

දියසිඳි පොල් කර්මාන්තශාලාවක්
කුරුණෑගල දිස්ත්‍රික්කයේ
බදු දීමට ඇත.
(කෙටිකාලීනව හෝ දීර්ඝකාලීනව).
Email: moreinformation19@gmail.com

ආහාර නිෂ්පාදනය සඳහා
මධ්‍යම ප්‍රමාණයේ
කර්මාන්තශාලාවක්
බද්දට ගැනීමට
(ගම්පහ දිස්ත්‍රික්කයෙන්)
දු.ක.
071 4183290
011 2245159

විකිණීමට
භාවිතයෙන් ඉවත් කළ
කාර්යාලීය උපකරණ
මෝටර් සයිකලයක් සහ
අබලි යකඩ වැඩිම ඉල්ලුමට.
භාණ්ඩ පරීක්ෂාව :
නො.186, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.
කාර්යාලීය උපකරණ, යකඩ කබඩ්, යකඩ ඇඳන්, කොළ දැල් රෝල්, පුටු, ඩස්ට් කලෙක්ටර්, සිවිලිම් ෂීට් සහ යකඩ කොටස්
නො.309/6, මීගමු පාර, වැලිසර
Susuki GN 125 යතුරුපැදිය, යකඩ ලොකර් සහ කබඩ්, බැටරි, ඇලුමිනියම් සහ ලී දෙරවල්. ඇලුමිනියම් සෙවිලි තහඩු, සිවිලිම් ලයිට් හෝල්ඩර්, ඉලෙට්‍රික් පැනල් බෝඩ්, ස්විපර් යන්ත්‍ර සහ යකඩ කොටස්
ඉල්ලුම්පත් ආපසු නොගෙවන රු. 500/- ක ආකෘති පත්‍ර මත 2021/04/07 ට හෝ පෙර සතියේ දිනවල
විමසීම් : 0761-558895/ 0773-187754/ 0777-585005
ෆින්ලේස් කලම්බු ලිමිටඩ්,
නො.309/6, මීගමු පාර,
වැලිසර.

පත්‍රය බාරේ පළවන
දැන්වීම් සඳහා එවන පිළිතුරු
සාමාන්‍ය තැපෑලෙන් එවිය යුතුයි



නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම් හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය
නාගරික සංවර්ධන අධිකාරිය
යෝජනා කැඳවීමයි (RFP)

දෙමටගොඩ අධි උස මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය

නාගරික සංවර්ධන අධිකාරිය විසින් දේශීය හෝ විදේශීය ලංසුකරුවන් (ආයෝජකයින්, සංවර්ධනකරුවන්) වෙතින් නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩමක් තුල අධි උස මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් නිර්මාණය - ඉදිකිරීම - මූල්‍යනය- අයිතිය - ක්‍රියාත්මක කිරීම (DFBOO) යන පදනම මත ක්‍රියාත්මක කිරීම සඳහා ආයෝජන යෝජනා (RFP) කැඳවනු ලැබේ.යෝජිත සංවර්ධනය නාගරික සංවර්ධන අධිකාරිය මඟින් නිකුත් කරන මාර්ගෝපදේශයන්ට අනුකූල විය යුතුය.

මේ සඳහා උනන්දුවක් දක්වන අයදුම්කරුවන්හට අදාළ විස්තර ඇතුලත් යෝජනා කැඳවීමේ ලේඛණය ආපසු නොගෙවනු ලබන රු.25,000/- ක මුදල (ඊට අදාළ එකතුකළ වටිනාකම් මත බදු (VAT) ඇතුලත්ව) ගෙවීමෙන් අනතුරුව බත්තරමුල්ල, සෙත්සිරිපාය- අදියර I, 8 වන මහලේ පිහිටි එම අධිකාරියේ දේපල කළමනාකරණ හා සංවර්ධන අංශය වෙතින් 2021.04.01 දින සිට 2021.04.30 දක්වා සතියේ වැඩකරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව.2.30 දක්වා කාලය තුළ ලබාගත හැකිය.

සංවර්ධන යෝජනා භාරගැනීම 2021.05.07 දින ප.ව. 02.00 ට අවසන් වේ. ලැබී ඇති තාක්ෂණික යෝජනා එසැණින් විවෘත කිරීම බත්තරමුල්ල "සුභුරුපාය", 17 වන මහලේ පිහිටි නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම් හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන) කාර්යාලයේදී සිදු කරනු ලැබේ.

පූර්ව ලංසු රැස්වීම 2021.04.25 දින ප.ව. 2.00 ට සෙත්සිරිපාය, අදියර I, 9 වන මහල පිහිටි නාගරික සංවර්ධන අධිකාරියේ ශ්‍රවණාගාරයේදී පැවැත්වේ.

වැඩිදුර විස්තර :
අධ්‍යක්ෂ (දේපල සංවර්ධන),
දේපල සංවර්ධන හා කළමනාකරණ අංශය,
නාගරික සංවර්ධන අධිකාරිය,
8 වන මහල, සෙත්සිරිපාය, අදියර I, බත්තරමුල්ල.
දුරකථන අංක : 011 2875921, 011-3611950, හෝ 011-2875916-20 දිගුව : 2965-2967.
ෆැක්ස් : 011-2875900.
විද්‍යුත්තැපෑල : realestatedivisionuda@gmail.com,
වෙබ් අඩවිය : www.uda.gov.lk

සභාපති, අමාත්‍ය මණ්ඩලය පත්කරන ලද ස්ථාවර සාකච්ඡා සම්මුති කමිටුව ,17 වන මහල,
නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම් හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය
"සුභුරුපාය", බත්තරමුල්ල.

පිහිටීම	විකල්ප	කැබලි අංක	සැලසුම් අංක	ප්‍රමාණය	බදු පදනම් මිල (රු. මිලියන)	ඇප බැඳුම්කරය (රු. මිලියන)	බදු කාලය (අවුරුදු)
දෙමටගොඩ	01 – එක් ඉඩම් කොටසක් ලෙස	A	4392A	3A 2R 24.59P(හෙක්ටයාර් 1.4786)	3,086.00	31.00	99
දෙමටගොඩ	02 – වෙන්වූ ඉඩම් කොටස් දෙකක් ලෙස	A1	5661	1A 3R 07.59P(හෙක්ටයාර් 0.7274)	1,411.00	15.00	99
		A2	5661	1A 3R 17.00P(හෙක්ටයාර් 0.7512)	1,581.00	16.00	99

වෂී 2021ක් වූ මාර්තු මස 28 වැනි ඉරිදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.